# නමින්ම සියලු තතු පැවසේ!

ජනහද හඳුනන

මහජන බැංකුව

වාර්ෂික වාර්තාව - 2012

# ශ්‍රී ලංකාවේ ජනතාවට අඩ සියවසක් මුළුල්ලේ සේවය සැපයීමේදී ඇතැම් දේ වෙනස් වී නොමැත...

මහජන බැංකුව මහජනතාවගේ බැංකුව ලෙසම පැවතී ඇත.
අප නිර්මාණය කරනු ලැබීමට පාදක වූ හේතුව, ජනතාවට
සේවය සැපයීම, මේ දක්වාම නොවෙනස්ව පවතී. අප
පිහිටුවනු ලැබුවේ සේවය කිරීමටයි.
සැබැවින්ම වසරින් වසර අපි දියුණුවට පත් වී සිටින්නෙමු.
අප ජනතාව කරා සමීප වන ප්‍රමාණය හා අපගේ නිපැයුම්
කළඹ පුළුල් වී ඇත. අපගේ ගනුදෙනුකාර භවතුන්ගේ
සමෘද්ධිය සමගම අපගේ සමෘද්ධිය ද වර්ධනය වී ඇත.

*එසේ වුවද, නමින් හා ශෛලියෙන් අපි... **මහජන බැංකුවම** වන්නෙමු.*

# වාර්තාවේ අන්තර්ගතය


පිටුව 6
වැදගත් මෙහෙයුම් තොරතුරු

පිටුව 7
වැදගත් මූල්‍ය තොරතුරු

පිටුව 8
සභාපතිතුමාගේ පණිවුඩය

පිටුව 14
ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය

පිටුව 22
අධ්‍යක්ෂ මණ්ඩලය

පිටුව 26
ආයතනික කළමනාකාරිත්වය

පිටුව 32
විධායක කළමනාකාරිත්වය

පිටුව 34
කලාප කළමනාකාරිත්වය

පිටුව 35
ව්‍යාපාර සමාලෝචනය

පිටුව 50
මූල්‍ය සමාලෝචනය

පිටුව 57
තිරසාර බව පිළිබඳ අතිරේකය

පිටුව 81
සේයා රූ තුළින් 2012 දෙස බැලීමක්

පිටුව 85
අනුකූලතා වාර්තාව

පිටුව 87
ආයතනික පාලනය

පිටුව 96
අවදානම් කළමනාකරණය

පිටුව 108
ප්‍රධාන කාර්යසාධන දර්ශක

පිටුව 115
මූල්‍ය වාර්තා

පිටුව 243
ඇමුණුම්



# බැංකුව පිළිබඳ තතු

**ග්‍රාමීය ඉතුරුම් ඒකරාශී කර එය සංවර්ධන ක්‍රියාවලිය කරා යොමු කිරීම පිණිස 1961 දී මහජන බැංකුව පිහිටුවන ලදී. එයට පෙර මූල්‍ය සේවා කර්මාන්තයෙන් බැහැර කරනු ලැබ සිටි ජන කණ්ඩායම්වලට බැංකු සේවාවන් සැපයීම සඳහා එය ස්ථාපනය කරනු ලැබිණි. මෙලෙස වසර පනහකට වැඩි ප්‍රමාණයක් මුළුල්ලේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල සංවර්ධනය උත්ප්‍රේරණය කිරීමට හා පරිවර්තනයට භාජනය වෙමින් පවතින ආර්ථිකයකට සහාය වීමට අප මූල්‍ය නිපැයුම් භාවිතා කර ඇත.**

බැංකුව ව්‍යාපාර කටයුතු ආරම්භ කළේ ඉතාමත් වෙනස් ආර්ථික පරිසරයක් තුළදී ය. ඒ වන විට රට ට නිදහස ලැබී වසර 13 ක් පමණක් ගත වී තිබූ අතර මූල්‍ය සේවා කර්මාන්තයෙ හි බොහෝ කොටස් සංවර්ධනයෙ හි මුල් අදියරක පැවතිණි. රාජ්‍යය විසින් මූලිකත්වය ගත් ආර්ථික වර්ධනය අවධාරණය කිරීමක් පැවති අතර රජය සතු ව්‍යාපාර ආර්ථිකයෙ හි ගාමක බලය ලෙස දක්නා ලදී.

අද අප ක්‍රියාත්මක වන්නේ අතිශයින් ම වෙනස් පරිසරයක් තුළ වේ. රටේ ඒක පුද්ගල ආදායම ඇ.එ.ජ.ඩො. 2,500 සීමාව ඉක්මවා ගොස් ඇති අතර සංවර්ධනය පෙරට ගෙන යාම සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකම එක්ව කටයුතු කරයි. ඉදිරි වසර පහ තුළ දී ඒක පුද්ගල ආදායම දෙගුණ කරගනිමින් ලෝකයේ නැගී එන ආර්ථිකයන් අතරට එක්වීමට අපි අරමුණු කරගෙන සිටින්නෙමු.

රටේ වර්තමාන වර්ධන වේගය තිරසාර ව පවත්වා ගැනීමට නම් එය ට අති නවීන මූල්‍ය සේවා කර්මාන්තයක් තීරණාත්මක වේ. මේ මොහොතේ අවශ්‍ය වන්නේ නවීකරණය, නව වෙළඳපොළ අංශ සමග සක්‍රිය මූල්‍ය සේවාවන් හි නිරත වීම හා අවබෝධයෙන් යුතුව අවදානම් බාර ගැනීම යි. මෙම නව භූමිකාව තුළ සිය කාර්යභාරය ඉටු කිරීමට මහජන බැංකුව අද සූදානමින් සිටී. හොඳින් අභිප්‍රේරණය වූ සේවක සමූහයක්, ශක්තිමත් අවදානම් කළමනාකරණ උපායමාර්ගයක්, මිලියන 14 ඉක්ම වූ ගනුදෙනුකාර භවතුන්ගෙන් සැදි පදනමක්, ශාඛා හා සේවා මධ්‍යස්ථාන 728 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 420 ක් හා රුපියල් බිලියන 873 ක වත්කම් පදනමක් එය සතුව ඇත. අපි නිරන්තරයෙන් ම අපගේ සේවා කළඹ ශක්තිමත් කිරීමෙ හි හා ගනුදෙනකාර සේවා වැඩි දියුණු කිරීමේ යෙදී සිටින්නෙමු. 2012 වසරේ අප ගේ බදුවල ට පෙර ලාභය වූ රුපියල් බිලියන 15.2 සහ බදුවලට පසු ලාභය වූ රුපියල් බිලියන 10.9 හා සමගම 2.8% ක් තරම් මට්ටමක පවතින අඩු අක්‍රිය ණය අනුපාතයක් පවතින ඉදිරි වසරවලදී ශ්‍රී ලංකාවේ වර්ධන පරිශ්‍රමයට සහාය වීම සඳහා ඉතා යෝග්‍ය තත්ත්වයක අප ව පිහිටුවනු ලැබ තිබේ.

# අපගේ දැක්ම

අගය නිර්මාණය කරන්නා වූ, තරගකාරී හා ස්වශක්තිය කෙරෙහි විශ්වාසය තබා කටයුතු කරන්නා වූ ස්වභාවයෙන් යුතුවීම පිණිස ජනතාව සවිබල ගන්වමින් ශ්‍රී ලංකාවේ උන්නතිකාමී ජනතාවගේ බැංකුව බවට පත්වීම.

# අපගේ මෙහෙවර

**අපගේ ගනුදෙනුකාර භවතුන් වෙනුවෙන්**

වඩාත්ම මානුෂික, සංවේදී හා වෘත්තීයමය ආකාරයෙන් අති විශිෂ්ට සේවාවක් සැපයීමේ අභිමානය අත්කර ගැනීම

**අපගේ හිමිකරුවන් වෙනුවෙන්**

ස්වාධීනව ක්‍රියාත්මක වෙමින් වාණිජමය වශයෙන් ශක්‍යතාවයෙන් යුතුවන අතරම ජාතික ආර්ථිකය උදෙසා ප්‍රතිලාභ ජනිත කරවීම



# අපගේ වටිනාකම්

**අපගේ සේවකයන් වෙනුවෙන්**

කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියා කිරීමේ හැකියාව ද සහිත, අප අගය කරන්නා වූ කුසලතාවන්ගෙන් පිරිපුන්, ආත්ම විශ්වාසයෙන් යුතු, වෘත්තීයමය දක්ෂතා දක්වන තැනැත්තන් බවට පත්වීම මගින් ඔවුන්ගේ උසස් කාර්යසාධනයෙන් ප්‍රතිලාභ අත්කරගැනීම පිණිස අපගේ සේවකයන් වෙනුවෙන් අවස්ථා නිර්මාණය කිරීම.

**අපගේ සමාජය වෙනුවෙන්**

දීප ව්‍යාප්ත වශයෙන් අධ්‍යාපනයේ, සංස්කෘතියේ හා පරිසරයේ අභිවෘද්ධිය වෙනුවෙන් දායක වීම තුළින් සමාජය සවිබල ගැන්වීමට හා තිරසාර සංවර්ධනයට සහාය ලබාදීම.

- අපගේ පැවැත්ම සඳහා පාදක හේතුව ජාතියේ ජනතාව වෙනුවෙන් වටිනාකම් ජනිත කරවීම බව අප පිළිගන්නෙමු.
- අපගේ සියළු කාර්යයන්හි දී අපගේ තැන්පතුකරුවන්ගේ සුබසෙත සැලසීම පිණිස අතිශය සැලකිලිමත් ආකාරයෙන් අපි අපගේ වගකීම ඉටු කරන්නෙමු.
- සත්‍ය හා සාධාරණ ගනුදෙනු හරහා අපි අපගේ ගනුදෙනුකාර භවතුන් සමග දිගුකාලීන සදාචාරවත් සබඳතා ප්‍රවර්ධනය කරන්නෙමු.
- නිලධාරිවාදය අවම කිරීම මගින් හා කාර්යක්ෂම කළමනාකාරිත්වය, කඩිනම් තීරණ ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීම අනිවාර්ය අවශ්‍යතා බවට පත්කිරීම මගින් අපි සියළු කාර්යයන්හි දී අපගේ ගනුදෙනුකාර භවතුන්ට මුල්තැන දෙන්නෙමු.
- අපි අපගේ කාර්ය මණ්ඩලය සවිබල ගන්වන අතර ඔවුන්ගෙන් වගවීම අපේක්ෂා කරන්නෙමු.
- පුද්ගල අවශ්‍යතා අභිබවා බැංකුවේ යහසාධනයට මුල්තැන දෙමින් විවිධ තරාතිරම්වල සේවකයන් වෙතින් සියළු මට්ටම්වල දී අපි ඉහළම අවංකභාවය අපේක්ෂා කරන්නෙමු.
- සේවකයන්ට සිය කාර්යසාධනය ප්‍රදර්ශනය කරමින් සිය පූර්ණ විභවය සාක්ෂාත් කරගැනීමේ හැකියාව ලබා දෙන්නා වූ අන්‍යොන්‍ය ගෞරවය හා විශ්වාසය රජයන පරිසරයක් අපි නිර්මාණය කරන්නෙමු.
- සෑම සේවකයෙකුගේම කුසලතා, කැපවීම හා ප්‍රජාව සමග ඇති සබඳතා පිළිගන්නා හා ඒවාට සහාය වන ඉහළ කාර්යසාධනයෙන් යුත් කණ්ඩායම් දිරිගැන්වීම මගින් අපි අපේ ව්‍යාපාරය සංවර්ධනය කරන්නෙමු.
- සියළුම නීති හා නියමයන්ට මෙන්ම ඒවායේ හරයන්ට ද අනුකූල වීමටත් ආයතනික පාලනය, විනිවිදභාවය, හෙළිදරව් කිරීම හා සදාචාර සම්පන්න චර්යාව යන කරුණුවලට අදාළ ඉහළම ප්‍රමිතීන් ස්ථිරසාරව පවත්වා ගැනීමට ද අපි කැපවී සිටින්නෙමු.
- පරිසරය සුරැකීම හා තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කරමින් අපි යහපත් පුරවැසියන්ට ඔබින චර්යාවෙන් යුක්ත වන්නෙමු.



# වැදගත් මෙහෙයුම් තොරතුරු



බැංකු සේවාවන් හි වසර 50 ක් ඉක්මවා ඇත.



ගනුදෙනුකාර භවතුන්ගේ ගිණුම් සංඛ්‍යාව මිලියන 14 ඉක්මවයි.



සමස්ත ශාඛා ජාලයම දැන් අන්තර්ජාලය හරහා එකිනෙක සමග සම්බන්ධ කොට ඇත.



දිවයිනේ සෑම පෙදෙසක්ම පාහේ ආවරණය කරමින් පිහිටුවා ඇති ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 420 තෙක් ඉහළ නංවන ලදී.



බදු, ලාභාංශ හා අයබදු ආකාරයෙන් ශ්‍රී ලංකා රජය වෙත රුපියල් බිලියන 12.3 ක් ගෙවන ලදී.




බැංකු තත්ත්වාගණනයන් උත්ශ්‍රේණිගත කෙරිණි. ෆිච් තත්ත්වාගණනය AA+ හා RAM තත්ත්වාගණනය AAA.



බදුවලට පසු ලාභය රුපියල් බිලියන 10.9 තෙක් ඉහළ නැංවිණි.



ශ්‍රී ලංකාවේ විශාලතම ශාඛා ජාලය ලෙස අපගේ සමස්ත ශාඛා ජාලය 728 දක්වා පුළුල් කරමින් බැංකු ශාඛා සංඛ්‍යාව 347 තෙක්ද, සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව 381 තෙක්ද ඉහළ නංවන ලදී.

# වැදගත් මූල්‍ය තොරතුරු

| | 2012 | 2011 | % |
|---|---|---|---|
| **අවසාන කාර්ය සාධනය** | | | |
| බදු ගෙවීම ට පසු ලාභය (රුපියල් මිලියන) | 10,894 | 10,446 | 4.3 |
| ප්‍රාග්ධනය හා සංචිත (රුපියල් මිලියන) | 29,205 | 23,089 | 26.5 |
| **ඵලදායිතාව** | | | |
| ශුද්ධ ආදායම (රුපියල් මිලියන) | 43,310 | 36,431 | 18.9 |
| පිරිවැය/ආදායම් අනුපාතය (%) | 55.8 | 56.1 | – |
| පිරිස් බලය (ස්ථිර) | 7,823 | 8,249 | (5.2) |
| සේවකයෙකු මත ලාභය (රුපියල් '000) | 1,393 | 1,266 | 10.0 |
| **වර්ෂ අවසාන දත්ත** | | | |
| දළ ණය හා ලැබිය යුතු (රුපියල් මිලියන) | 660,624 | 508,235 | 30.0 |
| තැන්පතු (රුපියල් මිලියන) | 683,951 | 550,226 | 24.3 |
| මුළු වත්කම් (රුපියල් මිලියන) | 873,107 | 662,077 | 31.9 |
| **ප්‍රධාන කාර්යසාධන දර්ශක** | | | |
| වත්කම් මත ප්‍රතිලාභය - බදුවලට පෙර (%) | 2.0 | 2.6 | – |
| ස්කන්ධය මත ප්‍රතිලාභය (%) | 41.7 | 49.2 | – |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (%) | 14.0 | 14.8 | – |
| අරමුදල් නොවන ආදායම/ශුද්ධ ආදායම (%) | 21.7 | 16.8 | – |

# සභාපතිතුමාගේ පණිවුඩය



පසුගිය වසර 51 මුළුල්ලේ බැංකුවේ සාර්ථකත්වය පිළිබඳ කථාව තහවුරු කරන්නා වූ, 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මා ඔබ වෙත ඉදිරිපත් කරන්නේ සොම්නසිනි. මෙම සාර්ථකත්වයෙහි කථාව ජාතියෙහි ජනතාව වෙනුවෙන් සමාජ වටිනාකම් නිර්මාණය කිරීමේදී බැංකුවේ මෙහෙයුම්වල තිරසාර භාවය විදහා දක්වයි.

**මූල්‍ය සේවා අංශය රටේ සංවර්ධනයේ ප්‍රධාන සහායක බලවේගයක් වන අතර, මුළු වත්කම් ප්‍රමාණය අනුව බැංකු අංශය රුපියල් බිලියන 5,210ක අගයක් ගැනීම මෙයට මනා සාක්ෂියක් විය. 2012 අවසානය වන විට, බැංකු අංශය සතු වූ මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 2,193ක් ද, අනෙකුත් බැංකු සේවා මධ්‍යස්ථාන 4,103ක් ද, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 2,331ක් ද, විය.**

## ආර්ථිකය සහ බැංකු අංශය

2012 වර්ෂයේ දී බැංකු කර්මාන්තය ගෝලීය වශයෙන් අර්බුද සමනය කරගනිමින් නැගී ආ අතර වඩාත් දේශීය අභියෝගවලට මුහුණ දෙමින් ක්‍රම ක්‍රමයෙන් ප්‍රතිචාරවල අදියරෙන් අදියර ඉදිරියට ගමන් කළේය. එ.ජ. හා යුරෝපය තවදුරටත් බැංකු කර්මාන්තයට සිදුවන ව්‍යුහමය වෙනස්කම් පසුපස වන ප්‍රාථමික බලවේග වශයෙන් පවතින අතර ආසියාවේ හා ජපානයේ බලධාරීන් ප්‍රධාන ප්‍රතිසංස්කරණ කිසිවක් කිරීමට තීරණය කිරීමේ ඉඩකඩ නොමැති බව පෙනී යයි. ශ්‍රී ලංකා ආර්ථිකය ද 2012 දී වඩාත් තීව්‍ර වූ ගෝලීය හා දේශීය අභියෝගවලට මුහුණ දුන්නේය. ගෝලීය වශයෙන් යුරෝපීය රාජ්‍යය ණය අර්බුදය, එ.ජ. හි රාජ්‍ය මූල්‍ය අර්බුදය හා දිගින් දිගටම ඉහළ මට්ටමක පැවති බණිජ තෙල් මිල ගණන් ආර්ථික සංවර්ධනයට අභියෝග එල්ල කළ අතර අධික ණය ඉල්ලුම හා ඉහළ ආනයනයන් මෙන් ම අහිතකර කාලගුණික තත්ත්වයන් ද දේශීය වශයෙන් අවාසිදායක බලපෑම් ඇති කළේය.

මෙම අවාසි සහගත තත්ත්වයන් මධ්‍යයෙහි, සිවිල් යුද්ධය අවසානයෙන් පසුව හා ඉන් අනතුරුව ආර්ථිකය වර්ධනය කිරීම හා වර්ධන මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම කෙරෙහි රජයේ අවධානය යොමුවීම සමග ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වර්ධන අවස්ථා වැඩි දියුණු වී ඇත. කැළඹිලි සහගත ලෝක ආර්ථිකයක් මෙන් ම වර්ෂයෙහි මුල් භාගයේ දී අත්දකින ලද බාහිර හා දේශීය අභියෝග රාශියකින් සැදුම් ලත් පසුබිම අනුව සලකා බලන කල ප්‍රශංසනීය ජයග්‍රහණයක් වන 6.5% පමණ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයක් 2012 වර්ෂයේ දී ආර්ථිකය වාර්තා කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

මූල්‍ය සේවා අංශය රටේ සංවර්ධනයේ ප්‍රධාන සහායක බලවේගයක් වන අතර මුළු වත්කම් ප්‍රමාණය අනුව බැංකු අංශය රුපියල් බිලියන 5,210 ක අගයක් ගැනීම මෙයට මනා සාක්ෂියක් විය. 2012 අවසානය වන විට, බැංකු අංශය සතු වූ මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 2,193 ක් ද අනෙකුත් බැංකු සේවා මධ්‍යස්ථාන 4,103 ක් ද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 2,331 ක් ද විය. ශාඛා ජාල පුළුල් කිරීම තුළින් බැංකු සේවා පහසුකම් ව්‍යාප්ත කිරීම සඳහා සක්‍රිය කාර්යභාරයක් ඉටු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කිරීමේ ක්‍රියාවලි හා ආරක්ෂක යාන්ත්‍රණ තාර්කීකරණය හා බැංකු ශාඛා හා සේවා මධ්‍යස්ථාන වර්ගීකරණය කිරීමේ වර්තමාන ක්‍රමය සමාලෝචනය කරන ලද අතර, නව ශාඛා හා සේවා මධ්‍යස්ථාන සඳහා අනුමැතිය ලබාදීමේ එහි කඩිනම් ක්‍රියාවලියට අඛණ්ඩ ව අධීක්ෂණය හා මාර්ගෝපදේශන ය ලබාදීම එක් කළේ ය. බාසල් 11 ප්‍රමිති ක්‍රියාත්මක කර අධීක්ෂණය කරමින් ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙ හි අනුපාතය අවම අවශ්‍යතාව වන 10% ට වඩා සැලකිය යුතු තරම් ඉහළින් පවත්වා ගන්නා බව ද සැලකිල්ලට ගැනීම වැදගත් වේ. බාසල් 11 2 ස්ථරය යටතේ, ජාත්‍යන්තර ධාරිතා ප්‍රමාණවත්

**මහජනයාගේ බැංකුව වීමේ ආකල්පය පෙරදැරි කරගනිමින්, ග්‍රාමීය ප්‍රජාවන් ට ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම ඇතුළුව සංස්ථාවල මෙන්ම පුද්ගලයන්ගේද, අවශ්‍යතාවන් වෙනුවෙන් බැංකු පහසුකම් සැපයීම සඳහා අප වෙත පැවරී ඇති කාර්යභාරය අපි ඉටු කළෙමු.**

> පසුගිය වර්ෂයට සාපේක්ෂව 2012 දී 4% ක වර්ධනයක් වූ රු. බිලියන 10.9 බදුවලට පසු ලාභයක් වාර්තා කරමින් බැංකුව එහි සමස්ත කාර්යසාධනයෙහි සාධනීය මට්ටමක් පෙන්නුම් කරන අතර සමූහයම රු. බිලියන 11.9 ක බදුවලට පසු ලාභයක් සනිටුහන් කළ බව මා වාර්තා කරන්නේ සොම්නසිනි.

බව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) සහ අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය (SRP) ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් පත්‍රිකාව ද නිකුත් කරන ලදී.

16.8% ක වර්ධනයක් හා දළ දේශීය නිෂ්පාදනයෙන් 10% ක් ලෙස දැක්වුණු ඉතා වේගවත් වර්ධනයකින් ඇ. එ. ජ. ඩොලර් බිලියන 6 තෙක් ලඟා වූ විගමනික ප්‍රේෂණ මත වැදගත් සාධක ගණනාවකින් බලපෑම් ඇති විය. ගෝලීය ජාලයෙහි හා පැවැත්මෙහි කැපී පෙනෙන ව්‍යාප්තියක් මගින් පූර්ණ ලෙස සහාය සපයන ලදුව විදේශගත ශ්‍රී ලාංකිකයන්ව අනේවාසික විදේශ මුදල් තැන්පතු ගිණුම් විවෘත කිරීමට දිරිගැන්වීම පිණිස මහජන බැංකුව ඇතුළු ආයතන ගණනාවකින් ගන්නා ලද උපාය මාර්ගික ප්‍රවර්ධනාත්මක මූලාරම්භයන් තිබිණි. මෙය මූලික වශයෙන්ම මැද පෙරදිග, ඕස්ට්‍රේලියා වේ, ප්‍රංශ යේ, කැනඩා වේ හා සිංගප්පූරු වේ විවිධ ශ්‍රී ලාංකික වාණිජ බැංකු විසින් ක්‍රියාත්මක කරන ලද මූලාරම්භයන් විය. අපගේ ම 'මහජන විද්යුත් ප්‍රේෂණ' ඇතුළුව වෙබ් - පාදක නිපැයුම් මෙම වර්ධනයට සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් සැපයුවේය. 2012 පළමු අර්ධයේදී විදේශ රැකියා සඳහා පිටත්ව යාම්වල 9.9% වර්ධනයක් වූ අතර වෘත්තීය කාණ්ඩයට අයත් විගමනික ශ්‍රමිකයන් ගේ 33% ක වර්ධනයක් දක්නා ලදී.

මහජනයා ගේ බැංකුව වීමේ ආකල්පය පෙරදැරි කරගනිමින්, ග්‍රාමීය ප්‍රජාවන් ට ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම ඇතුළුව සංස්ථාවල මෙන් ම පුද්ගලයන්ගේ ද අවශ්‍යතාවන් වෙනුවෙන් බැංකු පහසුකම් සැපයීම සඳහා අප වෙත පැවරී ඇති කාර්යභාරය අපි ඉටු කළෙමු. මහින්ද චින්තනය ක්‍රියාත්මක කිරීමේ දී මහජන බැංකුව වැදගත් උත්ප්‍රේරකයක් වී ඇති අතර, බැංකුව සැබවින්ම 'මහජන බැංකුව'ක් ව පවතින බව සහතික කරමින් අප ගේ ප්‍රතිපත්තිය රටේ ප්‍රගතියේ ගමන් මගට සමාන්තර ව පැවතිණි.

## මූල්‍යමය තත්ත්වය

පසුගිය වර්ෂයට සාපේක්ෂව 2012 දී 4% ක වර්ධනයක් වූ රුපියල් බිලියන 10.9 බදුවලට පසු ලාභයක් වාර්තා කරමින් බැංකුව එහි සමස්ත කාර්යසාධනයෙහි සාධනීය මට්ටමක් පෙන්නුම් කරන අතර සමූහයම රුපියල් බිලියන 11.9 ක බදුවලට පසු ලාභයක් සනිටුහන් කළ බව මා වාර්තා කරන්නේ සොම්නසිනි. බැංකුවේ හා සමූහයෙහි පිරිවැටුමෙහි ද මෙම ආරෝහණ රටාව සම්මතය ලෙස දිගින් දිගටම පැවති අතර බැංකුවේ හා සමූහයේ පිළිවෙලින් රුපියල් බිලියන 94.8 ක් හා රුපියල් බිලියන 110 ක් වූ අගයන් හි 39% ක හා 38% ක වර්ධනයක් දක්නා ලදී. වර්ෂය අවසානය වන විට රුපියල් බිලියන 39.4 ක රැඳී පවතින පරිදි ශුද්ධ මෙහෙයුම් ආදායම 10% කින් වර්ධනය වෙද්දී මෙම වර්ෂයේ දී අප ගේ ප්‍රාග්ධන හා සංචිත රුපියල් බිලියන 29.2 තෙක් ඉහළ නැංගේ ය. මහ භාණ්ඩාගාරය වෙත ලාභාංශ හා බදු ලෙස ගෙවන ලද රුපියල් බිලියන 12.3, රටේ ප්‍රගතිය සඳහා අතිශයින් ම අවශ්‍ය වන්නා වූ ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා අපගේ දායකත්වය බවද සැලකිල්ලට ගත යුතු වේ.

ෆිච් රේටිංස් ලංකා විසින් ලබා දෙන AA+ (ස්ථාවර) තත්ත්වාගණනයන් හා සෑම වසරකම අප දිගින් දිගටම යහපත් ඉපයීම වාර්තා කිරීමට සමත්ව තිබීම යන කරුණු මගින් පෙන්නුම් කරන ලද පරිදි මහජන බැංකුව පසුගිය වසර දෙකේ දී අඛණ්ඩ ස්ථායීතාවයක් පවත්වා ගැනීමට සමත්විය.

මහජන බැංකුව විසින් ප්‍රදර්ශනය කරන ලද සිත් බඳනා සුළු කාර්යසාධනය, සැබවින්ම මහජනයාගේ බැංකුවක් වීමේ එහි ආරම්භක දර්ශනයට එය අවංකවම විශ්වාසවන්ත ලෙස කටයුතු කරන්නේය යන සාධකය මත පදනම් වී ඇත. රටේ සියලු පෙදෙස්වල ජනතාවට අප කරා පහසුවෙන් ලගා විය හැකි පරිදි අපගේ ව්‍යාප්තිය වැඩි දියුණු කිරීම කෙරෙහි අප විශාල වශයෙන් අවධානය යොමු කරන බව, අපගේ නිපැයුම් තොටිල්ලේ සිට ඔවුන්ගේ දිවියේ සැඳෑ සමය තෙක්ම පුරවැසියන්ව ඇතුළත් කරගන්නා බව, ආයෝජන මත ලාභ හැමවිටම සාමාන්‍ය මට්ටමට වඩා ඉහළින් පවතිනු ඇති පරිදි අප තීක්ෂණ නුවණින් යුතුව හා සක්‍රිය ලෙස ආයෝජනය කරන බවට වගබලා ගනිමින් ක්ෂුද්‍ර හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට හෝ සුවිසල් සංස්ථා වලට සහාය වීම මගින් අප දිගින් දිගටම ආර්ථික සංවර්ධනයට හවුල්කරුවන්ව සිටින බව, යන සියලු කරුණු එක් කරුණක් වෙත යොමු වේ. එනම් අපගේ සාර්ථකත්වයයි.

මෙම කරුණු, 2012 දී දක්නා ලද ඉහළ පොලී අනුපාත හා අංශය තුළ පවතින දැඩි තරගකාරිත්වය අනුව ගත් කළ, අස්ථිර හා අභියෝගාත්මක පරිසරයන් තුළ ක්‍රියාත්මක වෙමින් තිබියදී ත් බැංකුව දිගින් දිගටම තරගකරුවන්ට ඉදිරියෙන් පැවතීමට හේතු වූ කරුණු වලින් සමහරකි.

## අප ලද පිළිගැනීම්

විවිධ සම්මාන විශාල සංඛ්‍යාවක් අප වෙත ප්‍රදානය කරනු ලැබ ඇත. නොකඩවා වසර හයක්, ස්ලිම් නීල්සන් ජනතා සම්මාන ප්‍රදානයේදී ශ්‍රී ලංකාවේ වඩාත්ම ජනප්‍රිය බැංකුව යන නාමය අප වෙත පිරිනැමුණු අතර ජාතියේ සැබෑ හවුල්කරුවෙකු වීම සඳහා අප ගනු ලබන ක්‍රියාමාර්ග පිළිගැනීමට ලක්වන බවට මෙය සාක්ෂි දරයි. තිරසාර කාර්යසාධනයට අදාළ දෘෂ්ටිකෝණයකින් බැලූ විටද, ෆිච් රේටිංස් ලංකා විසින් ලබා දී ඇති AA + (ස්ථාවර) තත්ත්වාගණනයන් හා පසුගිය වසර දෙකේදී ම අඛණ්ඩ ව සාධනීය ඉපයීම් වාර්තා කිරීමට අපට හැකිවී තිබීම යන කරුණු වලින් පෙනී යන පරිදි මහජන බැංකුව ස්ථාවරව පැවතී ඇත.

## ඉදිරි දැක්ම

2009-2016 උපාය මාර්ගික සැලසුම ක්‍රියාවට නැංවීම හා බැංකුවේ සියලු පාර්ශ්වකරුවන් වෙනුවෙන් තිරසාර අගයන් නිර්මාණය කරමින් ප්‍රගතිය අත් කර ගැනීම සඳහා අපි ඉතාමත් යහපත් තත්ත්වයක පසුවන්නෙමු. වර්ෂය තුළ දී, තිරසාර යළි ගොඩනැගීම හා ධාරිතා වර්ධනය මගින් සහාය ලබා 17.9% කින් පුළුල් වෙමින් ඉදිකිරීම් අංශය ආකර්ෂණීය වර්ධනයක් සනිටුහන් කර ඇත. සංවර්ධනය සඳහා අනේක අවස්ථා ලබා දෙන්නා වූ වරාය, ගුවන් සේවා, සංචාරක හා විනෝදාස්වාද, නාවුක හා බලශක්ති අංශ යන සියල්ලම කෙරෙහි යොමු වූ අවධානයට අතිරේකව කඩිනම් යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි රජයේ අවධානය කේන්ද්‍රගත වී තිබීමත් සමගම මෙම ක්ෂේත්‍රය වර්ධනය සඳහා සැලකිය යුතු අවස්ථාවන් පවතී.

මහජන බැංකුව විසින් ප්‍රදර්ශනය කරන ලද සිත් බඳනා සුළු කාර්යසාධනය, සැබවින්ම මහජනයාගේ බැංකුවක් වීමේ එහි ආරම්භක දර්ශනයට එය අවංකවම විශ්වාසවන්ත ලෙස කටයුතු කරන්නේය යන සාධකය මත පදනම් වී ඇත.

එයට අතිරේකව බැංකු ක්ෂේත්‍රය ද ඇතුළු බොහෝ ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා 2016 නිසැකවම වෙනසකට මුල පුරන කාලපරිච්ඡේදයක් වනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව 2016 දී මෙම අංශය තුළ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 9,334 ලෙස පවතිනු ඇති බවට ප්‍රක්ෂේපණය කරන අතර තැන්පතු රුපියල් බිලියන 6,500 තෙක් ළඟා වනු ඇතැයි ද ණය හා අත්තිකාරම් රුපියල් බිලියන 6,000ක අගයක් ගනු ඇතැයිද අපේක්ෂා කෙරේ. පුද්ගලික අංශය සඳහා ලබාදෙන ණය ප්‍රමාණය රුපියල් බිලියන 4,143 දක්වා ලගාවනු ඇතැයි ඇස්තමේන්තු කෙරේ. වඩාත් පුළුල් ආයෝජන අවස්ථා හා වඩා විශාල ආයෝජන සමූහයන් හඳුන්වා දීම සඳහා ප්‍රබල ප්‍රයත්නයක් පවතින හෙයින් කොටස් වෙළඳපොළ ද අමතර ජවයක් ලබනු ඇත. දීර්ඝකාලීන අරමුදල් හා වර්ධනය වන ආයතනික අංශය මගින් බලගන්වනු ලැබ ආයතනික බැඳුම්කර වෙළඳපොළ 2016 දී රුපියල් බිලියන 1,000 තෙක් ළඟා වනු ඇත. රටේ මෙම ආර්ථික අභිවෘද්ධියෙහි ප්‍රතිලාභ නෙළා ගැනීම සඳහා අපි මනා සූදානමක් සහිතව සිටින්නෙමු.

උතුර හා නැගෙනහිර වේගවත් සංවර්ධනයක් අත්දකින පසුබිමක් තුළ, එහි පවතින සුවිසල් විභවය හඳුනාගනිමින් බැංකුව මෙම ප්‍රදේශ දෙකෙහිද එහි කාර්යභාරය පුළුල් කර ඇත. ශක්තිමත් ව්‍යවසායක සංස්කෘතියක සිට කෘෂිකාර්මික ශූරභාවය දක්වා වූ පරාසයක උතුර හා නැගෙනහිර සෑම කල්හිම ශක්තිය හා ජීවගුණය අගවා ඇත. මෙම ශක්තිය හා ජීවගුණය ඵලදායක තිරසාර බව කරා යොමු කිරීමට අප අපේක්ෂා කරන්නේ එය රටේ ආර්ථික සංවර්ධනය තවදුරටත් දිරිමත් කරනු ඇති බව අප අදහන බැවිනි. සෑම අස්සක් මුල්ලක් නෑරම ජාතියේ මූල්‍ය ස්ථාවර බව වර්ධනය කිරීම මගින් සත්‍ය ලෙසම මහජනයාගේ බැංකුවක් වීමේ අපගේ අවංක කැපවීම අනුව අඛණ්ඩව කටයුතු කිරීමට අපි සැමවිටම ප්‍රයත්න දරන්නෙමු.

**උතුර හා නැගෙනහිර වේගවත් සංවර්ධනයක් අත්දකින පසුබිමක් තුළ, එහි පවතින සුවිසල් විභවය හඳුනාගනිමින් බැංකුව මෙම ප්‍රදේශ දෙකෙහිද එහි කාර්යභාරය පුළුල් කර ඇත. ශක්තිමත් ව්‍යවසායක සංස්කෘතියක සිට කෘෂිකාර්මික ශූරභාවය දක්වා වූ පරාසයක උතුර හා නැගෙනහිර සෑම කල්හිම ශක්තිය හා ජීවගුණය අගවා ඇත.**

## ඇගැයීම

ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීතුමාගේ ප්‍රධානත්වයෙන් වන බැංකුවේ කළමනාකරණ කණ්ඩායමේ බැඳීම හා කැපවීම නොවන්නට මේ සඳහන් කළ කිසිවක් සාක්ෂාත් කරගන්නට අපට නොහැකි වන්නට ඉඩ තිබූ හෙයින් බැංකුවේ 2009-2016 උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහිලා ඔවුන්ගේ අඛණ්ඩ ප්‍රයත්නයන් වෙනුවෙන් කළමනාකරණ කණ්ඩායම වෙත මාගේ හෘදයාංගම කෘතඥතාව පිරිනැමීමට මම කැමැත්තෙමි. එමෙන්ම අප රජයේ දස අවුරුදු දැක්මේ අනිවාර්ය හවුල්කරුවෙකු වන අතර අර්ථවත් කාර්යභාරයක් ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය සියල්ල ස්ථාපනය කර ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීම අපගේ වගකීම වේ. ප්‍රගතිය කරා වන මෙම ගමන්මග සැලසුම් කරනු වස්, මෙම ක්‍රියාවලියෙහි හවුල්කරුවන් වීමට අතිශයින්ම කැපවී සිටින අපගේ ගනුදෙනුකාර භවතුන් හා අපට ඉතා අගනා ව්‍යාපාරික හවුල්කරුවන් ඇතුළු විවිධ පාර්ශ්වකරුවන් විශාල සංඛ්‍යාවක් සමග සන්නිවේදන ක්‍රියාවලි වල අපි යෙදී සිටින්නෙමු. ඒ අනුව අපගේ මූලික ප්‍රතිපත්ති වලට අනුව අප සෑම කල්හි ම කටයුතු කරන බව සහතික කිරීම උදෙසා ලබාදුන් නිරන්තර ප්‍රතිපෝෂණය හා අප සමග සංවාදයෙහි හා සාකච්ඡාවෙහි යෙදීම වෙනුවෙන් අප වටා සිටින අපගේ ගනුදෙනුකාර භවතුන්ට ද, අගනා ව්‍යාපාරික හවුල්කරුවන් හා ප්‍රජාවන්ට ද මාගේ අවංක ස්තුතිය පුදකිරීමට මම කැමැත්තෙමි.

තවද, සිය දුරදක්නා නුවණින් යුතු චින්තනයෙන් හා භාරකාරත්වයෙන් බැංකුව එහි වර්තමාන සාර්ථකත්වය කරා මෙහෙයවූ බැංකුවේ හිටපු සභාපතිතුමා වන ඩබ්ලිව්. කරුණාජීව මහතාගේ අකල් වියෝව සම්බන්ධයෙන් මාගේ හදපත්ලෙන් නැගෙන ශෝකය ප්‍රකාශ කිරීමට ද මම මෙය අවස්ථාව කර ගන්නෙමි.

වේගයෙන් පරිවර්තනය වන පරිසරයන් තුළ ක්‍රියාත්මක වීම අභියෝගාත්මක විය හැකි අතර, පාලනය, චර්යාධර්ම, විනිවිදභාවය හා වගකීම හැමවිටම ඉහළ ප්‍රමුඛතාව ගන්නා බව සහතික කිරීම පිණිස ඔබ විසින් ලබාදුන් මගපෙන්වීම හා නායකත්වය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමන් හා නිලධාරීන්ට සහ මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ මණ්ඩලයට මම අතිශයින්ම කෘතඥ වන්නෙමි.

අප අනාගතයේ අභියෝගවලට මුහුණ දෙන විට, අපගේ සියලු සැලසුම් වලට පදනම වන බැංකුවේ සියලු පාර්ශ්වකරුවන්ගේ නොමසුරු සහාය ඒකාන්තයෙන්ම ලැබෙනු ඇතැයි මම උදක්ම විශ්වාස කරමි.



**ගාමිණී සෙනරත්**
සභාපති
2013 මාර්තු 27 වැනි දින

# ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය



2012 වර්ෂය තුළ දී අප ක්‍රියාත්මක වූ පරිසරය බෙහෙවින් අභියෝගාත්මක එකක් විය. ගෝලීය ආර්ථික පසුබෑම අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා මන්දගාමී වූ අතර වඩා විශාල බාහිර පරිසරය කරා ද එහි බලපෑම් ව්‍යාප්ත විය.

මෙය සිතෙහි දරා ගන්නා අතරම, ඉහළ නගින බණිජ තෙල් මිල ගණන්, අරාබි වසන්තය දිගින් දිගට ම සංකීර්ණ තත්ත්වය ට පත්වීම, නොඅඩුව ඇති වූ උග්‍ර ස්වාභාවික ව්‍යසන, යුරෝ කලාපය එහි අනවරත අරගල, ව්‍යාපාර බංකොලොත්භාවයෙන් මුදවා ගැනීමට මුදල් යෙදවීම් හා ඇතැම් රටවල බංකොලොත්භාවය ට පත්වීම සමග කටයුතු කරමින් සිටීම හා නව ආර්ථික බලවතා බව පැවසෙන ආසියානු කලාපයට ද මෙම ගැටළු සමග සටන් වැදීමට සිදු වී තිබීම හා සමග ම මෙම මන්දගාමී යථා තත්ත්වයට පැමිණීමේ බලපෑම නිරීක්ෂණය කරමින්, ශ්‍රී ලංකාව ද විචක්ෂණශීලී ලෙස සිය ප්‍රක්ෂේපිත වර්ධන ඉලක්ක යළි සලකා බැලුවා ය. මෙය 7% වඩා අඩු මට්ටමට ගෙන එන ලද අතර, රට, ලෝක සාමාන්‍යයට වඩා සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක හා කලාපයේ අනෙකුත් රටවල් සමග අනුකූල අගයක් වූ 6.5% දළ දේශීය නිෂ්පාදනයක් 2012 අවසානය වන විට අත්පත් කරගනු දක්නා ලදී.

රටේ ප්‍රා.කා.ද. තවදුරටත් ඉලක්ක අනුව කාර්ය සාධනය පෙන්නුම් කළ නමුත් රටේ රාජ්‍ය මූල්‍ය පරිසරයෙහි තිරසාර බව සහතික කිරීම පිණිස යම් යම් ගැලපීම් සිදු කිරීම අවශ්‍ය වූ අතර, අතීතය දෙස හැරී බැලීමේ දී මහජන බැංකුව ක්‍රියාත්මක වූ පරිසරය මෙබඳු විය.

එබැවින්, පොළී හා විනිමය අනුපාතවල අත්දකින ලද අභියෝගවලට අතිරේකව ඉහත සඳහන් කරන ලද අභියෝග ද තිබියදීත් බැංකුව නැවතත් වරක් ඉතා වැදගත් ජයග්‍රහණයක් සනිටුහන් කළ බව මා වාර්තා කරන්නේ ඉමහත් සොම්නසිනි. 2012-14 නව සාමූහික ගිවිසුම මගින් ස්ථිර කාර්ය මණ්ඩලයට ලබා දෙන ලද වැටුප් ගැලපීම් හේතුවෙන් මෙම වර්ෂයේ බදු වලට පෙර ලාභය 2011 මුදල් වර්ෂයට වඩා ඉතා සුළු ප්‍රමාණයකින් පහළ බැස තිබුණේ වුව ද, අතීතයේ සිදු වූ පරිදිම, පෙර වර්ෂයේ අගයන් අඛණ්ඩ ලෙස වඩා සාධනීය මට්ටමට ගෙන එමින් අපගේ ලාභ ප්‍රවණතාවය ස්ථාවර ලෙස වර්ධනය වී ඇත. කරුණු මෙසේ තිබියදී බැංකුවේ බදු බර අඩුවීම හේතුවෙන්

බැංකුවේ බදු වලට පසු ලාභය පෙර වර්ෂයට වඩා 4.3% ක ප්‍රමාණවත් වර්ධනයකින් යුතුව රු. බිලියන 10.9 ක අගයක් වාර්තා කළේ ය.

නිසැකව ම අප ගේ මෙම සාර්ථකත්වයට මූලිකව ම හේතුවන අප අපගේ ඉලක්ක සපුරා ගන්නා බව හා ඇතැම් ක්ෂේත්‍රවල දී ඉලක්ක අභිබවා යන බව සහතික කරන පෙළඹවීම හා උද්යෝගී ක්‍රියාකාරිත්වය සහිත ඉතා දක්ෂ කළමනාකරණ කණ්ඩායමක මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වූ පෙරමුණ ගත් මාගේ කණ්ඩායමට මාගේ ප්‍රශංසාව හිමි විය යුතු ය. අප දැනට අනුගමනය කරන ප්‍රධාන කළමනාකරණ සැලැස්ම වන 2009-16 උපායමාර්ගික සැලැස්මට අනුකූල හා දූරදර්ශී කළමනාකරණ උපායමාර්ගය සහ අප නිරීක්ෂණය කරන ලද නැගී එන ප්‍රවණතාවන්ට අනුකූලව අප ක්‍රියාත්මක කළ ප්‍රායෝගික වෙනස්කම් ද අපගේ සාර්ථකත්වයෙහි කථාවට පාදක විය.

## අපගේ මූල්‍යමය කාර්යසාධනය

තෘප්තිමත් විය හැකි බදුවලට පසු ලාභය මා ඉහත සඳහන් කළ අතර, සැලකිල්ලට ගත යුතු තවත් වැදගත් මූල්‍යමය කරුණු රැසක් ඇත. මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක තොරතුරු ගිණුම් ප්‍රකාශවල ඉදිරිපත් කර තිබේ.

රජයේ සංවර්ධන න්‍යායපත්‍රයේ නිරන්තර හවුල්කරු-වෙකු ව සිටි බැංකුවක් වන හෙයින් කඩිනම් සංවර්ධන වැඩසටහනක් හඹා යන වර්තමාන යුගයේ දී අපට පෙරටත් වඩා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට ඇති බව අපි දන්නෙමු. අපේ නිපැයුම් හා සේවා කළඹ වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම අප අඛණ්ඩව සිදු කරන අතර ම අප ගේ විශාලතම කොටස්හිමියා වන රජය වෙත අප ගෙවන බදු හා ලාභාංශ ජාතික දැක්මෙහි කොඳුනාරටිය සකසන්නා වූ ඉතාමත් අවශ්‍ය යටිතල හා සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමට සෘජුවම යොමු කෙරෙන්නේ ය යන කරුණ පිළිබඳව ද අපි දැනුවත් ව සිටින්නෙමු. මෙම වර්ෂයේ දී අප ශ්‍රී ලංකා රජයට රු. බිලියන 12.3 ක දායකත්වයක් ලබා දුන් අතර, එයින් රු. බිලියන 4.5 ක් ලාභාංශ විය.

> රජයේ සංවර්ධන න්‍යායපත්‍ර යේ නිරන්තර හවුල්කරුවෙකු ව සිටි බැංකුවක් වන හෙයින් කඩිනම් සංවර්ධන වැඩසටහනක් හඹා යන වර්තමාන යුගයේ දී අපට පෙරටත් වඩා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට ඇති බව අපි දන්නෙමු

පසුගිය වර්ෂයේ දී ප්‍රදර්ශනය කරන ලද රු. බිලියන 662.1 අභිබවමින් මෙම වර්ෂයේ දී අප ගේ මුළු වත්කම් රු. බිලියන 873.1 තෙක් 31.9% කින් වර්ධනය විය. ඉතිරිකිරීම් දිරිගැන්වීම සඳහා අප යොදාගත් මූලාරම්භයන් හේතුවෙන් අපගේ තැන්පතු රු. බිලියන 684 තෙක් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, එය පෙර වර්ෂයේ අගයේ සිට 24.3% ක වැඩිවීමකි. ඒ අතර, අ.ණ. අනුපාතය 2.8% තරම් අවම මට්ටමක රැඳී පවතී.

## අප සාක්ෂාත් කරගත් දේ

මෙහෙයුම් පරිසරය අභියෝගාත්මක වූ නමුදු හැමවිටම අභියෝග ජයගත හැකිය යන මහජන බැංකුවට ආවේණික ආකල්පය මෙයට විසඳුම වී ඇත. එම පරිසරය අතිශයින්ම තරගකාරී විය. සෑම වෙළඳපොළ අවකාශයක් ම ගවේෂණයට ලක් කරමින් මූල්‍ය අංශයේ නිපැයුම් හා සේවා කළඹ ඉතා විශාල වශයෙන් ව්‍යාප්ත කරන ලද අතර, දීර්ඝකාලීන තිරසාර බව නොවන්න ට මූල්‍ය තීරණ ඇතැම් ව්‍යාපාර ක්ෂේත්‍රවල වර්ධනය අසීරු කළ අතර කාලගුණයේ හදිසි අහිතකර වෙනස්කම් ක්ෂුද්‍ර සහ කුඩා හා මධ්‍ය පරිමාණ අංශවල වඩාත්

අනතුරට භාජනය විය හැකි අප ගේ ඇතැම් ගනුදෙනුකාර භවතුන්ව පීඩාවට පත් කළේය. කෙසේ වෙතත් අප ගේ නම සියළු තතු පවසයි. අප මහජනයාගේ බැංකුව වන අතර, එය අපට ආවේනික වූ ආකල්පය වේ. එබැවින් විශ්ලේෂණය කර තීක්ෂණ ලෙස අවශ්‍ය කටයුතු කළහොත් අභියෝග ජයගත හැකි වන අතර මෙම වර්ෂයේ ඵල දරා ඇත්තේ මෙම ප්‍රවේශ යයි.

අපගේ ඉලක්ක සාක්ෂාත් කරගැනෙන බව සහතික කරගැනීමට යොදා ගන්නා ලද ක්‍රම අතරට නිපැයුම් වැඩි දියුණු කිරීම හා නවීකරණය මෙන්ම අපගේ නිපැයුම් කළඹට අගය එකතු කිරීම ද ඇතුළත් විය.

ලාභ ලැබීමේ ඉඩක් නොමැති හෝ අවස්ථා අඩු ජන විකාශය සහිත ප්‍රදේශ කරා පිවිසීම කෙරෙහි අප වැඩි ලෙස අවධානය යොමු කළ අතර ශිෂ්‍ය ජනගහනය අතර ඉතිරිකිරීමේ පුරුද්ද තවදුරටත් වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ අපි, හැමවිටම අපගේ ගනුදෙනුකාරභවතුන් සමග සිටින බව ඔවුන්ට දැනගත හැකි වන පරිදි අපගේ නිපැයුම් කළඹෙහි "තොටිල්ලේ සිට දිවියේ සැඳෑ සමය දක්වා" යන අප ගේ සංකල්පය පුළුල් ලෙස ප්‍රවර්ධනය කිරීම අරඹා ශාඛා ව්‍යාප්තිය හරහා පමණක් නොව ජංගම බැංකුකරණ මූලාරම්භයන්, කෙටි පණිවුඩ හා අන්තර්ජාල බැංකුකරණය සඳහා තාක්ෂණය යෙදවීම හා අපගේ ශාඛා ජාලගත කිරීම හරහා අප කෙරෙහි ප්‍රවේශය වැඩි දියුණු කළෙමු.

රාජ්‍ය බැංකුවක් ලෙස ජනතාව අතර ඉතිරි කිරීමේ සංස්කෘතිය දිරිගැන්වීමේ වගකීම අප වෙත පැවරී ඇති නිසා පමණක් නොව ජාතික සංවර්ධනය යන වඩා පුළුල් විෂය පථය තුළ භාවිතය පිණිස එම අරමුදල් යොමු කිරීම සඳහා ඉතුරුම් සචලකරණය කිරීම අපගේ ව්‍යාපාරය තුළ ප්‍රධාන වශයෙන් අවධානයට ලක් වූ ක්ෂේත්‍රයක් විය. 24.3% වර්ධනයක් වන රු. බිලියන 684 තෙක් අපගේ ඉතුරුම් කළඹ වර්ධනය කිරීමේ දී අප මෙම වර්ෂයේ දී ඉමහත් සාර්ථකත්වයක් අත්කරගෙන ඇත. දිනුම් ඇදීමක් ද ඇතුළත්ව ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන් මත පදනම් වූ වනිතා වාසනා මස තුළ දී ඉතිරි කිරීම් දිරිගැන්වීම, අතිශයින්ම ජනප්‍රිය ජය ශ්‍රී ත්‍යාග වැඩසටහන වඩා ශක්තිමත් කිරීම සඳහා ප්‍රවර්ධනය කිරීම හා නිදහස් දින සමරු උත්සවයේ දී සිය අළුත උපන් දරුවන් වෙනුවෙන් ඉතිරි කිරීමට දෙමාපියන් දිරිගැන්වීම, අප දියත් කරන ලද ප්‍රයත්න අතරින් කිහිපයකි. විදේශ රැකියා අමාත්‍යාංශය සමග ඒකාබද්ධ ව විශේෂයෙන් නිර්මාණය කරන ලද ජාත්‍යන්තර වීසා කාඩ්පතක් නිකුත් කිරීමෙන් අපි අපගේ විගමනික ශ්‍රමිකයන් ද දිරිගැන් වූයෙමු.

මෙම වර්ෂය තුළ දී අප ගේ වඩාත්ම වැදගත් ජයග්‍රහණ අතරින් එකක් වූයේ මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩසටහන හා එකට බැඳී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය ට ගාමක බලය එක් කිරීම අරමුණු කරගනිමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) ව්‍යාපාරික මධ්‍යස්ථාන දියත් කිරීමයි. සියළු පහසුකම්වලින් සමන්විත හා සිය ව්‍යාපාර දියුණු කරගනිමින් ආර්ථිකයට අගය එක් කිරීම සඳහා අපගේ මෙම ගනුදෙනුකාර භවතුන් කොට්ඨාශයට උපකාර හා සහාය වන පුහුණු කාර්ය මණ්ඩලයක් සේවය කරනා මෙබඳු අති නවීන ව්‍යාපාර මධ්‍යස්ථාන හතරක් අපි අනුරාධපුරය, කුරුණෑගල, මාතර හා මහනුවර විවෘත කළෙමු. දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) ව්‍යාපාරික මධ්‍යස්ථාන ඉදි කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු.

> අප හැම විට ම කී දේ කර, දැක්ම ක්‍රියාව බවට පරිවර්තනය කර ප්‍රජාවන් තිරසාර බවට පත් කර ඇත්තෙමු.

බැංකුවේ සාර්ථකත්වයට එක් ප්‍රධාන හේතුවක් වන්නේ එයට පහසුවෙන් ප්‍රවේශවීමට ඇති හැකියාව යි. ප්‍රවේශ හැකියාව තිබීමයි. අප වෙත නිරන්තරයෙන් ප්‍රවේශ විය හැකි බව සහතික කිරීමේ දී තාක්ෂණය වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතරම, ප්‍රජාවන් තුළට කාවැදීම හා අපව පෙනීම අත්‍යවශ්‍ය බව ද අපි අදහන්නෙමු. එබැවින්, අපේ ශාඛා ජාලයට නව ශාඛා එක් කිරීම ජයග්‍රහණයක් වූ අතර, පෙර සඳහන් කරන ලද සාර්ව බාධක හේතුවෙන් අප සැබවින් ම අපගේ ව්‍යාප්ති සැලසුම මන්දගාමී කළ නමුත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සේවා මධ්‍යස්ථාන, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, ජංගම බැංකු මධ්‍යස්ථාන හා තාක්ෂණයෙන් මෙහෙයවෙන අන්තර්ජාල හා කෙටි පණිවුඩ බැංකුකරණය තවදුරටත් වැඩි දියුණු කරමින් නව ශාඛා හයක් එක් කර උත්ශ්‍රේණිගත කරන ලද අතර, මෙමගින් අප සේවා ලබාගත හැකි ස්ථාන සංඛ්‍යාව ආකර්ශනීය ලෙස වැඩි වී ඇත්තේ මහජන බැංකුව ලෙස අප ගේ තත්ත්වය තවදුරටත් තහවුරු කරමිනි.

බැංකුව ක්‍රියාත්මක වීමේ අක්ෂය සැදුම් ලබන්නේ තොරතුරු තාක්ෂණයෙනි. ස්වයංක්‍රීයකරණය කෙරෙහි අඛණ්ඩ අවධානයෙන් යුතුව අපි මුළු ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 420 තෙක් ගෙන එමින් තවත් යන්ත්‍ර 40 ක් එක් කළ අතර, මධ්‍යගත අන්තර්ජාල ශාඛා ජාලය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ගනුදෙනුකාර භවතුන් සඳහා සේවා මධ්‍යස්ථාන 728 ක් ද, දිනපතා ප.ව. 5.30 වන තුරු චෙක්පත් භාරගැනීමේ හැකියාව ද අප සතුව පවතී. අප භාණ්ඩාගාර කළමනාකරණ ක්‍රමය ද සාර්ථක ලෙස ක්‍රියාත්මක කර පර්යන්ත මාර්ග දක්වා සංකේත-කරණයට (TLE) අනුකූල POS යන්ත්‍ර 200 ක් හඳුන්වා දී අප ගේ කාඩ්පත් මධ්‍යස්ථානයේ ස්වයංක්‍රීය කුඩා ඇමතුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කළෙමු.

අපගේ ණයදීම වර්ධනය කිරීම සඳහා අප දක්වන අවධානය මහජනතාවගේ බැංකුව වීමට අපගේ ඇති කැමැත්ත හා අනුකූලව පවතී. තිරසාර ලෙස සංවර්ධනය වී රටේ ආර්ථිකයට දායක වන අතරම එමගින් ඔවුන් ගේ ජීවන රටාවන් උසස් කර ගැනීමට ජනතාවට සහාය වීම ශ්‍රී ලංකාවට ඇයගේ උසස් අපේක්ෂා සහිත ඉලක්ක සාක්ෂාත් කරගැනීමට උපකාර වනු ඇතැයි අපි අදහන්නෙමු. මෙම ඉලක්කය හේතුවෙන් අපගේ සිල්ලර අත්තිකාරම් කළඹ මෙම වසරේ සැලකිය යුතු ලෙස වර්ධනය විය. අපගේ ණය ප්‍රමාණය වර්ධනය කිරීම සඳහා විකල්ප හා නිර්මාණාත්මක මාර්ග යොදාගැනීමට අප පෙළඹවූ ණය දීමේ සීමාවක් පැවති පරිසරයක් තුළ මෙම කාර්යසාධනය අත් කරගත් බව මතකයේ රඳවා යුතු වේ. ඒ හා සමගාමීව ණය අය කරගැනීම් ද ආක්‍රමණශීලී ලෙස එනමුත් බැංකුව ජනතාව සමග හිටිය යුතු බව හා එබැවින් ඔවුන්ට උදව් දෙන ආයතනයක් විය යුතු බව පිළිබඳ හැඟීමෙන් යුතුව සිදු කරන ලදී.

අභියෝගාත්මක වෙළඳපොළක් තිබියදීත්, බැංකුවේ භාණ්ඩාගාරය ද අප ගේ යහපත් කාර්යසාධනය වෙනුවෙන් කැපී පෙනෙන දායකත්වයක් ලබා දුන්නේය. අතිශයින් ම දක්ෂ කණ්ඩායමක් ප්‍රවණතා ග්‍රහණයකරගෙන ඒවා අප ගේ වාසිය පිණිස යොදාගැනීම හේතුවෙන් විදේශ විනිමය ආදායම 76.0% කින් වර්ධනය විය. ප්‍රාග්ධන ලාභ හා පොළී ඉපයීම් මගින් ණය වෙළඳාම (Debt Trading) හරහා සැලකිය යුතු ආදායමක් ලබා ගන්නා අතර, ස්ථානීය හා ඉදිරි වෙළඳපොළවල දී ඇ.එ.ජ.ඩො./ශ්‍රී ලං.රු. මුදල් ඒකක යුගලයේ දී වෙළඳපොළ නිර්මාණය කරන්නා ලෙස අප ගේ කීර්තිනාමය අපි වඩාත් ශක්තිමත් කළෙමු.

මෙම වර්ෂයේ දී දියත් කරන ලද බ්ලුම්බර්ග් හි FIQ වෙළඳ පදනම මත ඉහළම වෙළඳ අගයන් සහිත මූලික වෙළඳ ඒකකය ලෙස භාණ්ඩාගාරය තවදුරටත් ගරු සම්මාන ලද අතර, මෙරිල් ලින්ච් ඇමෙරිකානු බැංකුව, බාක්ලේස් කැපිටල්, සිටිබෑන්ක් සහ HSBC හා සමග ශ්‍රී ලංකා රජයේ ඉතා සාර්ථක ඇ.එ.ජ.ඩො. බිලියන 1 ක ස්වාධීන බැඳුම්කර නිකුතුව සඳහා ආයෝජන බැංකු ඒකකය තෝරා ගන්නා ලදී.

## ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීම

උතුරු හා නැගෙනහිර පළාත්වල පවතින නව පිබිදීමක් සහිත ආර්ථිකයන් කෙරෙහි අප දැඩි ලෙස අවධානය යොමු කර ඇති අතර, සංවර්ධනයේ රඟමඬලට මෙම ප්‍රජාවන් ප්‍රවේශ කරවීම සඳහා ඔවුන් සමග ගත යුතු මුල් පියවරයන් සැලසුම් කරමින් සිටින්නෙමු. උතුරු අර්ධද්වීපයෙහි අප සජීවීව ක්‍රියාත්මක වන අතර, මෙහෙයුම් ශක්තිමත් කර ප්‍රාදේශීය ව්‍යාපාර ව්‍යාප්තිය සඳහා බලය සැපයීමට එය හේතු විය. රජයේ දස අවුරුදු සංවර්ධන සැලැස්ම සමග පෙළ ගැසෙමින් ව්‍යවසායකයන් හා විශේෂයෙන්ම කිරි නිෂ්පාදන හා කෘෂිකාර්මික නිෂ්පාදන යන දෙඅංශයෙහි ම ගොවීන් වෙත මෙහෙයුම් ශක්තිය ලබා දෙමින්, ක්ෂුද්‍ර හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය කිරීම් සඳහා බැංකුවේ යොමුවීම මෙම භූගෝලීය ප්‍රදේශ දෙක තුළ තවදුරටත් තහවුරු කරන ලදී. එයට අමතරව රටේ ආර්ථිකයෙහි කොඳු නාරටිය බවට පත්වීම සඳහා ක්ෂුද්‍ර හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ වැඩි දියුණු කිරීමේ රජයේ දැක්ම සමග පෙළගැසී, ක්ෂුද්‍ර මූල්‍යකරණ හා සංවර්ධන ණය මගින් බැංකුව ආකර්ෂණීය ණය ලබාගැනීමේ අවස්ථා රාශියක් සපයමින් ග්‍රාමීය ආර්ථිකය කෙරෙහි යොමුවීම අතිශයින් ම පැතිරී පැවතිණි.

> රාජ්‍ය බැංකුවක් ලෙස ජනතාව අතර ඉතිරි කිරීමේ සංස්කෘතිය දිරිගැන්වීමේ වගකීම අප වෙත පැවරී ඇති නිසා පමණක් නොව ජාතික සංවර්ධනය යන වඩා පුළුල් විෂය පථය තුළ භාවිතය පිණිස එම අරමුදල් යොමු කිරීම සඳහා ඉතුරුම් සවලකරණය කිරීම අපගේ ව්‍යාපාරය තුළ ප්‍රධාන වශයෙන් අවධානයට ලක් වූ ක්ෂේත්‍රයක් විය.

පිබිදෙන උතුර, පිබිදෙන නැගෙනහිර, පළාත් සංවර්ධනය, කුඩා වැව්ලි හිමි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන හා පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපනය හා සම්පත් කළමනාකරණය වෙත යොමු කරන ලද ණය, ප්‍රාදේශීය ආර්ථිකයන් වර්ධනය කිරීමේ දී පමණක් නොව මෙම ප්‍රදේශවල සම්පත් උපයෝජනය ප්‍රශස්ත මට්ටමට ගෙන ඒමේ දී රැකියා උත්පාදනය හා දිළිඳුකම තුරන් කිරීමේදී ද අතිශයින් ම සාර්ථක වී ඇත.

පසුව සඳහන් කරන ලද අරමුණ වෙනුවෙන් ප්‍රජා කණ්ඩායම් වෙත ව්‍යාප්ත කරන ලද හා ආර්ථික සවිබල ගැන්වීම සඳහා සමාජ සවලකරණය යන සංකල්පය මත පදනම් වෙමින් මූලික වශයෙන්ම කාන්තාවන් ඉලක්ක කර ගනිමින් දරිද්‍රතාව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය හා ඒ හා සබැඳි චක්‍රීය අරමුදල් ණය ක්‍රමය ද අපි හඳුන්වා දුන්නෙමු.

මූලික වශයෙන් ම ස්වාභාවික ව්‍යසනයන්ගෙන් පීඩාවට පත් කාන්තාවන් වෙනුවෙන් වන වනිතා නවෝදය ණය යෝජනා ක්‍රමය, අවතැන් වූ වැන්දඹුවන් විශාල සංඛ්‍යාවක් සවිබල ගැන්වීම සඳහා උපකාරක වී ඇත. නව මහජන ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය හා සෞභාග්‍යයා ණය යෝජනා ක්‍රමය නව කර්මාන්ත ඇරඹීම හා පවතින කර්මාන්ත වඩා යහපත් තත්ත්වයක ට වැඩි දියුණු කිරීම සඳහා පෙළඹවීම ලබා දෙන අතර, විස්කම් ණය යෝජනා ක්‍රමය කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සංවර්ධනය කරමින් කෘෂිකර්මාන්තයේ නව ක්‍රම භාවිතය සඳහා පහසුකම් සලසයි.

ප්‍රාදේශීය සංවර්ධනය ඉලක්ක කරගත් අප ගේ ප්‍රයත්න අතර, තවත් සුවිශේෂී පියවරක් වන්නේ ව්‍යවසායකත්වය හා ස්වයං සංවර්ධනය දිරිගැන්වීම සඳහා ප්‍රජා කණ්ඩායම් මත පදනම්ව ගම්මාන 245 ක් ක්ෂුද්‍ර මූල්‍ය ගම්මාන වැඩසටහන් යටතට ගෙන ඒමයි. පුනරුත්ථාපන ණය මගින් ස්වයං රැකියා ව්‍යාපෘති දිරිගැන්වෙන අතර, පොල් ආශ්‍රිත කර්මාන්ත, කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ සහාය ලබද්දී සාධාරණ වෙළඳපොළ මිල ගණන් හා නියගයෙන් සහන ලැබීම සඳහා ගොවීන්ට සහාය ද වෙයි.

## අප ගේ කණ්ඩායම සවිබල ගැන්වීම

එය සත්‍ය වශයෙන්ම අප කණ්ඩායමේ ශූරභාවය පරීක්ෂාව ට ලක් කළ වසරක් වූ අතර එම පරීක්ෂණයෙන් ඔවුන් සාර්ථකත්වය අත්කර ගනු අතර, අප මේ වසරේ වාර්තා කරන ලද ප්‍රතිඵල එම සාර්ථකත්වය පිළිබඳ නියත සාධක වේ. වසර කිහිපයකට පෙර අප කාවද්දන ලද පරිවර්තනීය සංස්කෘතිය හා සමග වෙනස කළමනාකරණය කිරීම, වැදගත් සන්ධිස්ථාන, ජයග්‍රහණ අත්කරගැනීමේ හා අරමුණු ඉටු කරගැනීමේ දී ප්‍රධාන මෙහෙයුම් බලවේගය වී ඇත. පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ දර්ශනය හා ඈඳුණු සමස්ත බැංකුව පුරා පැතිර ගිය දැනුම ලබාගැනීමේ සංස්කෘතියක් තවදුරටත් පවතී. මෙම වර්ෂයේදී ද, අපගේ කණ්ඩායම සතු තරගකාරී ස්වභාවය තවදුරටත් මුවහත් කෙරෙන බව තහවුරු කිරීම සඳහා හඳුනාගත් කුසලතාවන්ට අගය එකතු කරමින් අභ්‍යන්තර හා බාහිර යන දෙආකාරයේම පිරිස්වල විශේෂඥභාවය යොදාගත් උපායමාර්ගික පුහුණු හා සංවර්ධන වැඩසටහන්වලට අපගේ මානව සම්පත් අංශය නායකත්වය දුන්නේ ය.

## අප ගේ ප්‍රජාවන් වෙත දායකත්වය ලබාදීම

ආයතනික භාරකරුවකු යනු කී දේම කිරීම කෙරෙහි විශ්වාසය තබන්නෙකු වේ. අප හැම විටම කී දේ කර, දැක්ම ක්‍රියාව බවට පරිවර්තනය කර ප්‍රජාවන් තිරසාර බවට පත් කර ඇත. අපගේ ආවේණික ආකල්පයම ආයතනික සමාජ වගකීම ගැබ් වූවක් වන අතර, අපගේ නිමැවුම හා සේවාවන්හි සිට අප යොදාගන්නා උපාය මාර්ග ම පවා සංකල්පනය කර සැලසුම් කර ක්‍රියාත්මක කෙරෙන්නේ අපගේ පාර්ශ්වකරුවන්ගේ දිගුකාලීන තිරසාර බව උදෙසාම වේ.

මහජනයාගේ සැබෑම හවුල්කරුවෙකු වීමේ අපගේ පුළුල් දර්ශනයෙන් සංකේතවත් වන පරිදි 2012 වර්ෂය මුළුල්ලේ ම අප ප්‍රජාවෙහි නානාවිධ කොටස් විසින් ඉදිරිපත් කරන ලද විවිධ ව්‍යාපෘති හා මූලාරම්භයන්ට සහාය දැක්වීම අපි අඛණ්ඩව සිදු කළෙමු. මහජන බැංකුවේ නිර්මාතෘ ගරු ටී.බී. ඉලංගරත්න මැතිඳුන්ට උපහාර පිදීම, ශ්‍රී ලංකාවේ අපූර්ව සංස්කෘතික උරුමය නිසැකවම විදහාපාන ආසියාවේ විශාලතම සංස්කෘතික සංදර්ශනය වන ඇසල පෙරහැරට හවුල්කරුවකු වීම හා ඒ හා සමානව ම විවිධ කලා හා සංස්කෘතික අංශවල වැදගත් සිදුවීම් සඳහා අනුග්‍රාහකතක්වය ලබාදීම අපගේ දායකත්වයන් අතර විය. තව ද ශක්තිමත් හා සමබර ජාතියක් ගෙඩනැංවීම සඳහා පාපැදි ධාවනය ද, නෙට්බෝල් ඇතුළු ක්‍රීඩා ද, සංවර්ධනය කිරීම සඳහා අප ආයෝජනය කළ අතර, 8 වැනි ආසියානු කුසලාන නෙට්බෝල් ශූරතාවයේ දී බැංකුව කැපී පෙනෙන හවුල්කරුවෙකු විය. කාන්තාවන් කෙරෙහි නැඹුරු වූ විවිධ ව්‍යාපෘති හරහා අප කාන්තාවන් සවිබල ගන්වා ශ්‍රී ලංකාවේ අදහනු ලබන විවිධ ආගම්වලට අදාළ නානාවිධ ආගමික උත්සවවල ට හවුල්කරුවෙකු වීම මගින් අපගේ බහු ආගමික රටේ ජනතාව අතර ඉවසිලිවන්ත බව හා එක්සත් බව දියුණු කිරීමට දායක වුණෙමු.

> මහජනයාගේ සැබෑම හවුල්කරුවෙකු වීමේ අපගේ පුළුල් දර්ශනයෙන් සංකේතවත් වන පරිදි 2012 වර්ෂය මුළුල්ලේම ප්‍රජාවෙහි නානාවිධ කොටස් විසින් ඉදිරිපත් කරන ලද විවිධ ව්‍යාපෘති හා මූලාරම්භයන්ට සහාය දැක්වීම අපි අඛණ්ඩව සිදු කළෙමු.

## අභියෝග අතරින් පෙරට ගමන් කිරීම

ණය උපරිම සීමාව 2013 සඳහා තවදුරටත් අදාළ නොවන අතර කළමනාකරණය කළ හැකි මට්ටමින් අපගේ ණය කළඹ වර්ධනය කරගැනීම සඳහා මෙය බැංකුවට අවස්ථාව සලසයි. අප අපගේ ශාඛා ජාලය හා අපගේ සේවාවන් ලබාගත හැකි අනිකුත් ස්ථාන ශක්තිමත් කිරීමට සැලසුම් කරන අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, ක්ෂුද්‍ර මූල්‍ය හා සිල්ලර අංශ ව්‍යාප්ත කිරීම කෙරෙහි ද අපගේ අවධානය යොමුවනු ඇත.

කෙසේ වෙතත් විනිමය අනුපාත හා පොළී අනුපාත ක්ෂේත්‍රවල පවතින අස්ථිර පරිසරය, 2009 සිට 2016 සඳහා උපායමාර්ගික සැලැස්මෙහි සවිස්තරාත්මකව දක්වා ඇති අපගේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අභියෝගයක් ලෙස අපි නිරීක්ෂණය කරන්නෙමු. වැඩි වශයෙන්ම අභියෝගාත්මක වූ දශක පහක් පුරා දිවෙන ඉතිහාසයක් ඇති බැංකුවක් වශයෙන් අප නිරන්තරයෙන්ම අපගේ උපායමාර්ගික සැලැස්මට සහායක වන ප්‍රායෝගික අභිප්‍රායන් හා මූලාරම්භයන් ඒකාබද්ධ කරමින් සිටින්නෙමු. අපගේ අනාගත සැලසුම්වලට සහායක වීම උදෙසා අපගේ සදාතන නොවන, ආදායම් මාර්ග වර්ධනය කිරීමේ අවශ්‍යතාව මේ අතර වේ.

අපගේ අනුකූලතා උපාය මාර්ග, ශ්‍රී ලංකා මහ බැංකුවේ හා අනෙකුත් නියාමන අධිකාරිවල නියමයන්ට ද 2012 දී බලාත්මක වූ නව ගිණුම්කරණ ප්‍රමිති සමග ද අනුකූලව පවතී. මේ සියල්ලම මූල්‍ය සේවා අංශය තුළ වඩාත් යහපත් පාලනය හා අනුකූලතාව සහතික කරයි.

රාජ්‍ය මූල්‍ය දෘෂ්ටිකෝණයකින් සැලකූ කල නියත වශයෙන් ම බැංකු කර්මාන්තයේ හා ආයතනික අංශයේ සමෘද්ධිමත් වර්ධනය සඳහා ගෝචර වන පසුබිමක් රටේ සැකසෙමින් පවතී. ආයතනික බදු 28% දක්වා හා මූල්‍ය එකතු කළ අගය මත බදු (වැට්) 12% දක්වා තවදුරටත් අඩු කරනු ලැබීමෙන් මෙය ප්‍රදර්ශනය වන අතර, හර බද්ද අහෝසි කිරීම ව්‍යාපාරික අංශයේ වැඩි දියුණුව සඳහා නියත වශයෙන් ම සාධනීය පියවරක් ලෙස අපි දකින්නෙමු. පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රයෝජනවත් ලෙස යොදවා ගැනීම හා උතුර හා නැගෙනහිර කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව රට පුරා යටිතල පහසුකම් හා සංවර්ධන ව්‍යාපෘතිවල ට රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය ලබාදීම සඳහා ද ඒකාබද්ධව සැලසුම් කරන ලද ප්‍රයත්නයක් ගනු ලැබෙන අතර, මේ සියල්ලම 2015 දී දකුණු ආසියාවේ ආර්ථික කේන්ද්‍රස්ථානය බවට පත්වීමේ දැක්ම සැබෑවක් කර ගනු පිණිස රටට අමතර ජවයක් ලබා දෙනු ඇත.

රාජ්‍ය මූල්‍ය දෘෂ්ටිකෝණයකින් සැලකූ කල නියත වශයෙන් ම බැංකු කර්මාන්තයේ හා ආයතනික අංශයේ සමෘද්ධිමත් වර්ධනය සඳහා ගෝචර වන පසුබිමක් රටේ සැකසෙමින් පවතී.

## ඇගයීම්

2013 වර්ෂය තවත් ජයග්‍රහණ අත්කරගන්නා හා කඩිනම් වර්ධනයක් සඳහා ගෝචර වර්ෂයක් වනු ඇතැ යි අපි බලාපොරොත්තු සහගතව සිටිමු. මෙය ඉටු කරගැනීම පිණිස 2012 වසරේ දී හිටපු සභාපතිතුමන් හා අධ්‍යක්ෂ මණ්ඩලය නොමසුරුව මා වෙත ලබා දෙන ලද උපදෙස් හා මගපෙන්වීම මම ආධාර කර ගන්නෙමි. මේ සම්බන්ධයෙන්, බැංකුව අද පවතින තත්ත්වය ට පරිවර්තනය කිරීමට උපකාරී වූ අප ගේ හිටපු සභාපති ඩබ්ලිව්. කරුණාජීව මහතා වෙහෙස නොබලා ගත් ප්‍රයත්නයන් මෙහි සනිටුහන් කිරීම ට මම කැමැත්තෙමි. 10,500 ඉක්ම වූ කණ්ඩායමක් සහිතව රටේ තීරණාත්මක ප්‍රදේශ පුරා විසිරී පවතින බැංකුවකට උපකාර වීම සඳහා ශ්‍රේෂ්ඨ දැක්මක්, උපායමාර්ගයක් හා නායකත්වය අවශ්‍ය වේ. ඊට අමතරව අස්ථිරභාවය හා අභියෝග මධ්‍යයේ අප මේ වර්ෂයේ ලබා ඇති ප්‍රතිඵල සාක්ෂාත් කරගැනීම නිසැකව ම ඒ දැක්මේ, උපායමාර්ගයේ හා නායකත්වයේ ප්‍රතිඵලයකි.

අප ගේ සියළුම සේවකයන් ප්‍රදර්ශනය කරන ලද ගතිකත්වය හා කැපවීම වෙනුවෙන් ඔවුන්ට මාගේ ස්තුතිය පිරිනමමි.

මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාට ද, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ට ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාට ද, මහ බැංකු නිලධාරීන්ට ද, මුදල් හා නියාමන මණ්ඩලවලට ද, විගණකාධිපතිතුමාට හා එතුමාගේ කාර්ය මණ්ඩලයට ද, මහජන බැංකුව වෙත ඔවුන් ලබාදුන් මගපෙන්වීම හා සහාය වෙනුවෙන් මාගේ ස්තුතිය පල කරන්නෙමි.

අපගේ ප්‍රයත්නයන්හි දී අචල විශ්වාසවන්ත බව හා සහාය ප්‍රදර්ශනය කරමින් දිගින් දිගට ම අප කෙරෙහි විශ්වාසය තබන අපගේ ගනුදෙනුකාර භවතුන්ට ද අගනා ව්‍යාපාරික හවුල්කරුවන්ට ද මම කෘතඥ වෙමි. අපගේ සැලසුම් සැම විටම දිගුකාලීන තිරසාර බව සඳහා සකස් කර ඇති බව දනිමින් ඔවුන් වෙනුවෙන් මංපෙත් තැනීමට අප කෙරෙහි විශ්වාසය රඳවන පාර්ශ්වකරුවන් වන බැවින් අප ක්‍රියාත්මක වන ප්‍රජාවන් වෙතින් අපි සුවිසල් ශක්තියක් උකහා ගන්නෙමු.

මහජනයා සමග, මහජනයා වෙනුවෙන්, මහජනයා විසින් ක්‍රියාත්මක කෙරෙන, මහජන බැංකුව ලෙස අප සැමකල්හි ම පවතින බවත් එහිදී අපගේ දැක්ම, ඉලක්ක හා අරමුණු රටේ දැක්ම හා පෙළගැස්වෙනු ඇති බවත් එමගින් දියුණුව අත් කර ගැනීම සඳහා ජාතියට අත්‍යවශ්‍ය වන්නා වූ ආධාරක සපයන ප්‍රමුඛ බලවේගය වන බවත් ප්‍රකාශ කිරීම සෑහේ.



**එන්. වසන්ත කුමාර්**
*ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී*

2013 මාර්තු 27 වැනි දින



# ගනුදෙනුකාර භවතුන්

මහජන බැංකුව ලෙස අපි අපගේ සැපයුම් ස්ථාන, සේවා ප්‍රමිති හා අභ්‍යන්තර ක්‍රියාවලි මගින් ප්‍රදර්ශනය වන පරිදි ඉහළ මට්ටමේ පහසුව සහිත, ගනුදෙනුකාර භවතුන්ට හිතකාමී සේවයක් සැපයීම සඳහා පවතින්නෙමු.

2011 ට වඩා ණය හා ලැබිය යුතු 30% කින් වර්ධනය වූ අතර පස් අවුරුදු සංයුක්ත වාර්ෂික වර්ධන වේගය CAGR 21% ක් විය.








## අපගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය...

මේ වසරේ නව යන්ත්‍ර 40 ක් එක් කරන ලදුව අපි සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් සිටින්නෙමු. අපි රට පුරා සෑම තැනකම සිටින්නෙමු.

**ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර**

# 420

**ගනුදෙනුකාර හවතුන්ගේ ගිණුම් සංඛ්‍යාව**

**මිලියන 14.3**

**තැන්පතුවල වටිනාකම**

**රු. බිලියන 684**

**ශාඛා හා සේවා මධ්‍යස්ථාන**

**728**

# අධ්‍යක්ෂ මණ්ඩලය



## ගාමිණී එස්. සෙනරත් මහතා

*සභාපති*

ගාමිණී එස්. සෙනරත් මහතා 2013 පෙබරවාරි 14 වැනි දින මහජන බැංකුවේ සභාපතිවරයා ලෙස වැඩ භාර ගත්තේය. ඔහු, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම, සී/ස පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට්, සී/ස පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවලප්මන්ට්, සී/ස පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටීස් හා සී/ස පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් යන ආයතනවල ද සභාපතිවරයා වේ.

සෙනරත් මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කීර්තිමත් නිලධාරියෙකු වන අතර දැනට අතිගරු ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩල ප්‍රධානී ලෙස කටයුතු කරයි. එයට අමතරව ඔහු රජය සතු සී/ස ලිට්රෝ ගෑස් ලංකා, සී/ස ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සහ සී/ස ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රිසෝට්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) ආයතනවල සභාපතිවරයා හා සී/ස ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් හි හිටපු සභාපතිවරයා වේ.

කොළඹ විශ්ව විද්‍යාලයෙන් පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද කැළණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ද ඔහු ලබා ඇත.

සෙනරත් මහතා උප දිසාපතිවරයෙකු හා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක හා නියෝජ්‍ය පාලක ලෙස කටයුතු කර ඇති අතර ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයෙහි ලේකම් සහ මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල් යන ධුරයන්ද හොබවා ඇත.



## ඩබ්ලිව්. කරුණාජීව මහතා

*2013 ජනවාරි දක්වා සභාපති*

අභාවප්‍රාප්ත ඩබ්ලිව්. කරුණාජීව මහතා 2007 මැයි මස සිට 2013 ජනවාරි මස ඔහුගේ අකල් වියෝව දක්වා මහජන බැංකු සමූහයේ සභාපති ධුරය හෙබවූයේය. ඔහු, පීපල්ස් ලීසිං පොදු සමාගම, පීපල්ස් ෆයිනෑන්ස් පොදු සමාගම, සී/ස පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට්, සී/ස පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවලප්මන්ට් හා සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස් ආයතනවලද සභාපතිවරයා විය.

මෙයට ප්‍රථමයෙන් සේවක භාරකාර අරමුදලේ සහ ලංකා ධීවර සංස්ථාවේ සභාපති සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ධූර හොබවා ඇත.

ශ්‍රී ලංකා බැංකු කර්මාන්තය කෙරෙහි ඔහුගේ දායකත්වය, කැපවීම හා එයට සපයන ලද සුවිශේෂී සේවාවන් වෙනුවෙන් ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) විසින් ඔහුට අධි සාමාජිකත්වයක් ප්‍රදානය කරන ලදී.

ඔහු ජ්‍යෙෂ්ඨ හා කීර්තිමත් නීතිඥයෙකු වූ අතර ලංකා විශ්ව විද්‍යාලයේ වාණිජවේදී උපාධිධරයෙකුද විය.



## ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි මහතා

*අධ්‍යක්ෂ*

ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි මහතා 2007 දී මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබිණි. ඔහු පීපල්ස් ලීසිං පොදු සමාගම හා පීපල්ස් ෆයිනෑන්ස් පොදු සමාගම ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවල ද සාමාජිකයෙකි.

ඇමෙරිකානු ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධිය ලබා ඇති ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය ද එම විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ද ලබා ඇත. IPFDA හි ආශ්‍රිත සාමාජිකයෙකු හා ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයෙහි හා අභ්‍යන්තර විගණක ආයතනයෙහි සාමාජිකයෙකු වන ඔහු ගණකාධිකාරීවරයෙකු, ප්‍රධාන අභ්‍යන්තර විගණක, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකු ලෙස කටයුතු කර ඇත. වයඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයෙහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු වූ ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය සහ උපාධි අධ්‍යයන පීඨවල බාහිර කථිකාචාර්යවරයෙකු ද විය. ඔහු ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු හා කම්කරු අමාත්‍යාංශයේ ජාතික කම්කරු උපදේශක සභාවේ සාමාජිකයෙකුද විය. ජයකොඩි මහතා උපසේවා සහකාර පොලිස් අධිකාරිවරයෙකු ලෙස ද සේවය කර ඇත.



## ජෙහාන් පී. අමරතුංග මහතා

*අධ්‍යක්ෂ*

ජෙහාන් අමරතුංග මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු හා ආශ්‍රිත වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරයෙකු ද වේ. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන මට්ටමේ විභාගයේ දී ඉහළම දක්ෂතාව වෙනුවෙන් වන ත්‍යාගය ලබා ඇත. අමරතුංග මහතා දැනට කොළඹ කොටස් වෙළෙඳපොළේ ප්‍රධාන පුවරුවෙහි ලැයිස්තුගත මුල් පෙලේ යටිතල පහසුකම් සංවර්ධන සමාගමක් වන MTD වෝකර්ස් ශ්‍රී ලංකා පොදු සමාගමෙ හි විධායක නියෝජ්‍ය සභාපතිවරයා ලෙස සේවය කරයි. ඔහු පීපල්ස් ඉන්ෂුවරන්ස් පොදු සමාග මෙහි වර්තමාන සභාපතිවරයා මෙන්ම පීපල්ස් මර්චන්ට් බෑන්ක් පොදු සමාග මෙ හි අධ්‍යක්ෂවරයෙකු ද වේ. මූල්‍ය හා කළමනාකරණ ක්ෂේත්‍රයෙහි වසර 25 කට වැඩි පුළුල් පළපුරුද්ද ඔහු සතු වන අතර සංස්ථා හා පෞද්ගලික ආයතන විශාල සංඛ්‍යාවක උපදේශකවරයෙකු හා අධ්‍යක්ෂවරයෙකුව සිට ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි ජාතික සමුළුවේ දී 'මුදල ට අගය ගණකාධිකරණය' යන මැයෙන් ලේඛනයක් ඉදිරිපත් කිරීම ඔහුගේ බොහෝ ජයග්‍රහණ අතරින් එකකි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි පාලන සභාවෙහි ද ඔහු සාමාජිකයෙකු වේ.



## අජිත් පණ්ඩිතරත්න මහතා

*අධ්‍යක්ෂ*

පණ්ඩිතරත්න මහතා අධ්‍යක්ෂ මණ්ඩලයට ද බැංකුවේ ආශ්‍රිත සමාගමක් වන පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගමෙහි සභාපතිවරයා ලෙස ද 2010 ජූනි මසදී පත් කරනු ලැබිණි. ඔහු ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරයා හා ග්ලෝබ්/මොන්ටා සමාගම් සමූහයේ උපදේශක/අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති) වේ. ඔහු, ජාතික කඩදාසි සංස්ථාවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ හා ඉන් අනතුරුව 2001 වර්ෂයෙහි දී එහි සභාපතිවරයා ලෙස ද, 2002 ජනවාරි මස සිට 2004 අප්‍රේල් මස දක්වා සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස ද 2003 ඔක්තෝබර් මස සිට 2004 අප්‍රේල් මස දක්වා පරන්තන් කෙමිකල් සංස්ථාවේ සභාපතිවරයා ලෙස ද අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වල සේවය කිරීමේ දී ඔහු සතු පළපුරුද්ද වසර 10 ඉක්මවයි.

පීපල්ස් මර්චන්ට් පොදු සමාගමෙ හි පරිපාලිත සමාගමක් වන සී/ස පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් හි සභාපතිවරයාද වන ඔහු පීපල්ස් ලීසිං පොදු සමාගමෙහි පරිපාලිත සමාගමක් වන සී/ස පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවලොප්මන්ට් හි අධ්‍යක්ෂවරයෙකු වේ.



## ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය

*අධ්‍යක්ෂිකා*

2010 මැයි මස දී එල්. කේ. සංගක්කාර මහත්මිය මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබුවාය. ඇය මහජන බැංකුවේ පරිපාලිත සමාගමක් වන සී/ස පීපල්ස් ට්‍රැවල්ස් පුද්ගලික සමාමෙහි වර්තමාන සභාපතිනියද වන අතර සී/ස පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් හා ශ්‍රී ලංකන් එයාලයින්ස් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස ද සේවය කරන්නීය. ඇය නීතිඥවරියකි.

සංගක්කාර මහත්මිය, සෙලර්ස් ස්පෝට්ස් වෙයාර් ගාමන්ට්ස්, රොන්බ්‍රෝ ඉන්ටර්නැෂනල් ගාමන්ට්ස් හා සන් අයිලන්ඩ් විලේජ් හොලිඩෙ රිසෝට් ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කළාය. නීතිය, කළමනාකරණය, අලෙවිකරණය, සත්කාරක කර්මාන්තය හා ඇඟලුම් යන ක්ෂේත්‍රවල වසර 31 ක පමණ සුවිසල් අත්දැකීම් සම්භාරයක් සංගක්කාර මහත්මිය සතුය.



## ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය

*අධ්‍යක්ෂිකා*

ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය 2010 මැයි මසදී විධායක නොවන අධ්‍යක්ෂවරියක ලෙස මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබුවාය. ඇය සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස් හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ද වන්නීය.

ගම්මන්පිල මහත්මිය නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්වරියක් හා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගම් ලේකම්වරියක් ද එංගලන්තයේ හා වේල්සයේ සොලිසිටර්වරියක් ද වන්නීය. එංගලන්තයේ හා ශ්‍රී ලංකාවේ වසර 35 කට වැඩි පළපුරුද්දක් ඈ සතුය. ෆෝබ්ස් ඇන්ඩ් වෝකර් ලිමිටඩ්හි සමාගම් ලේකම් ධූරය දරා ඇති ඇය වසර දහතුනක කාලපරිච්ඡේදයක් මුළුල්ලේ ෆෝබ්ස් ඇන්ඩ් වෝකර් සමූහයේ පරිපාලිත සමාගම්වල නීති හා මානව සම්පත් අධ්‍යක්‍ෂවරිය ලෙස කටයුතු කර ඇත. දැනට ඇය වැවිලි, සංචාර, සංචාරක හා සත්කාරක ක්ෂේත්‍රවලට සම්බන්ධ පුද්ගලික ආයතන රැසක අධ්‍යක්ෂ මණ්ඩල වල සේවය කරන්නීය. ආයතනික නීතිය, රැකියා නීතිය හා හිමිකරකරණය යන ක්ෂේත්‍රවල ගම්මන්පිල මහත්මිය නීතිඥවරියක ලෙස සක්‍රියව කටයුතු කරන්නීය.



## විශාඛා අමරසේකර මහත්මිය

*අධ්‍යක්ෂිකා*

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මහ භාණ්ඩාගාර නියෝජිතවරිය ලෙස අමරසේකර මහත්මිය 2010 ජූනි මසදී මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලැබුවාය. ඇය ඇ. එ. ජ. වැන්ඩර්බිල්ට් විශ්ව විද්‍යාලයෙන් සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (2007) හා ආර්ථික විද්‍යාව හා කළනාකරණය (ISE) (2002) පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිධාරිනියක් වන්නීය. ඇය එ.රා. කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයෙහි අවසන් විභාගය (CIMA) (1999) සමත්ව සිටින අතර රාජ්‍ය මූල්‍ය සංවර්ධන ගණකාධිකරණ ආයතනයේ (ශ්‍රී ලංකාව) සාමාජිකාවක් වන්නීය.

ඇය දැනට නියෝජ්‍ය අධ්‍යක්ෂවරියක ලෙස රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටින අතර රජය සතු ව්‍යාපාර ගණනාවක අධ්‍යක්ෂ මණ්ඩලවල ඇය මහ භාණ්ඩාගාරය නියෝජනය කරන්නීය.



## ප්‍රියන්ත මායාදුන්නේ මහතා

*අධ්‍යක්ෂ*

ප්‍රියන්ත මායාදුන්නේ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් පිරිනැමෙන විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලනය) උපාධියක් හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. නීතිඥවරයෙකු වන ඔහු ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධිය (LLB) ලබා ගත් අතර බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයෙන් ලබාගත් වෘත්තීය රාජ්‍ය තාන්ත්‍රිකභාවය හා ලෝක කටයුතු පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු වේ.

ශ්‍රී. ලං. ප. සේ. නිලධාරියෙකු ලෙස ඔහු ප්‍රාදේශීය පරිපාලනයෙහි මෙන්ම දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ මට්ටමේ පරිපාලනයෙහි පළපුරුද්ද ලබා ඇත. ඔහු අනුයුක්ත පදනමින් ව්‍යවස්ථාපිත ආයතනවල ද සේවය කර ඇත. රාජ්‍ය අංශයෙහි ඵලදායිතාව හා ගුණාත්මක බව සහතික කිරීම වැඩි දියුණු කිරීමේ කටයුතුවලට මායාදුන්නේ මහතා සම්බන්ධව සිට ඇත.



## පවර දසනායක මහතා

*අධ්‍යක්ෂ*

පවර දසනායක මහතා 2011 පෙබරවාරි 21 වැනි දින මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු ව්‍යාපාර ක්ෂේත්‍රයේ වසර 15 ට වැඩි පළපුරුද්දක් සහිත සුප්‍රකට ව්‍යවසායකයෙකි. දසනායක මහතා සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ සභාපතිවරයා ද වෙයි.

*This page is intentionally left blank*

# ආයතනික කළමනාකාරිත්වය



## එන්. වසන්ත කුමාර් මහතා

*ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී*

එන්. වසන්ත කුමාර් මහතා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධරයෙකු වන අතර, භාණ්ඩාගාර කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් වසර 32 ක පළපුරුද්ද ඔහු සතුය. ඔහු 2001 මාර්තු මස දී මහජන බැංකුවේ සේවයට බැඳුණු අතර, එයට පෙර වසර ගණනාවක් කොළඹ ඒඑන්ඉසෙඩ් ග්‍රින්ඩ්ලේස් බැංකුවේ භාණ්ඩාගාරික ලෙස සේවය කළේය.

2011 පෙබරවාරි 22 වන දින ඔහු මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී තනතුරට පත් වූයේය.

ඔහු පීපල්ස් ලීසිං පොදු සමාගම, සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස්, සී/ස පීපල්ස් ට්‍රැවල්ස් යන සමාගම්වල ද ණය තොරතුරු කාර්යාංශයේ, ජාතික ගෙවීම් සභාවේ හා සී/ස ෆයිනෑන්ෂල් ඔම්බුඩ්ස්මන් ශ්‍රී ලංකා (ඇපයෙන් සීමිත) යන ආයතනවල ද අධ්‍යක්ෂවරයෙකි. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි පාලන මණ්ඩලයෙහි ඔහු සාමාජිකයෙකි. වර්තමානයේ ඔහු ලංකා මූල්‍ය සේවා කාර්යාංශයේ සභාපතිවරයා වේ.

ඔහු ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ හිටපු සභාපතිවරයෙකු වේ.



## අහමඩ් සබ්රි ඉබ්‍රාහිම් මහතා

*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් හා අනුකූලතා*

දේශීය හා විදේශීය වශයෙන් මූලික වශයෙන්ම ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර කළමනාකරණය හා අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍රවල වසර 29 කට වැඩි බැංකු සේවා පළපුරුද්දක් ඉබ්‍රාහිම් මහතා සතුය. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී ගෞරව උපාධිධාරියෙකු වන අතර, එක්සත් රාජධානියේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ (FCIB) අධි සාමාජිකයෙකු වේ.



## දීපාල් අබේසේකර මහතා

*අලෙවි, මහජන කටයුතු හා ආයතනික සමාජ වගකීම් අංශ ප්‍රධානී*

අලෙවි, මහජන කටයුතු හා ආයතනික සමාජ වගකීම් අංශ ප්‍රධානී මහජන බැංකුවේ අලෙවි හා මහජන කටයුතු භාර ප්‍රධානියා වඩාත් ප්‍රසිද්ධව සිටින්නේ සන්නම් ගොඩනැගීම හා උපායමාර්ගික ව්‍යාපාරය සංවර්ධනය සඳහා ඔහු සතු හැකියාව සම්බන්ධයෙනි. මූල්‍ය අංශයේ ආයතනවල අලෙවි කිරීම් සංවිධානය කිරීම් හා අලෙවි ප්‍රවර්ධන හා උපායමාර්ගික ව්‍යාපාර සංවර්ධන මෙහෙයුම්වල වගකීම ඔහු දරා ඇති අතර, ආයතනික සන්නාම අගයෙන් ඒවායේ ඉහළම තත්ත්වයට සාර්ථක ලෙස මෙහෙයවා ඇත. ඔහු වරලත් අලෙවි ප්‍රවර්ධන නිලධාරියෙකු මෙන්ම එ. ජ. වරලත් අලෙවිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු සහ වරලත් කළමනාකරණ අධ්‍යයන ආයතනයේ (CMI - UK) සහ සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CMA) සාමාජිකයෙකුද වේ.

ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වින්ස්ලන්ත විශ්වවිද්‍යාලයෙන් ඔහු ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගෙන ඇත.

දැනට ඔහු කළමනාකරණ සංගමයේ (TMC) කළමනාකරණ මණ්ඩලයේ සභාපති ධූරය හොබවන අතර, වෘත්තිය බැංකුකරුවන්ගේ සංගමයේ සභා සාමාජිකයෙකු හා එක්සත් රාජධානියේ ගෝලීය අලෙවිකරණ ජාලයෙහි මෙරට උපදේශක හා සභා සාමාජිකයෙකු වෙයි.



## යොහාන් ඒ. සෝසා මහතා

*මූල්‍ය අංශයේ ප්‍රධානී*

2007 මැයි මස සිට බැංකුවේ මූල්‍ය අංශයේ ප්‍රධානියා ලෙස සෝසා මහතා පත්වීම ලැබුවේය.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන අතර, ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වින්ස්ලන්ත විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකි. මූල්‍ය, කළමනාකරණ තොරතුරු, උපායමාර්ගික සැලසුම් කිරීම සහ හිමිකරු ප්‍රාග්ධනය පිළිබඳ පර්යේෂණ යන විෂය ක්ෂේත්‍රයන්හි පලපුරුද්ද ඔහු සතුය. LOLC සමූහ ව්‍යාපාරයට එක් වීමට පෙර අර්නස්ට් ඇන්ඩ් යංග් වෙතින් ඔහු මෙම වෘත්තිය පුහුණුව ලැබූ අතර, මහජන බැංකුවට එක් වීමට පෙර සී/ස AMBA රිසර්ච් ලංකා සමාගමේ උපසභාපතිවරයා ලෙස සේවය කළේය.



## චාන්දනී වේරපිටිය මහත්මිය

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ආයතනික බැංකුකරණය*

අක්වෙරළ බැංකු කටයුතු ඒකකය ද ඇතුළුව සමස්ත බැංකුවේ ආයතනික ණය අංශ, චාන්දනී වේරපිටිය මහත්මිය යටතේ පවතී.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් ද කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද ඇය ලබා ඇති අතර, AIB ශ්‍රී ලංකා වෘත්තිය බැංකුකරණ සුදුසුකම්ද ඈ සතුය.

1987 ජූනි මස දී කළමනාකරණ පුහුණුව ලබන්නෙකු ලෙස බැංකුවට එක් වූ ඇය සතුව ගනුදෙනුකාර සේවා, සුළු හා මධ්‍ය පරිමාණ/ව්‍යාපෘති ණයදීම්,ශාඛා මෙහෙයුම්, ආයතනික බැංකුකරණය හා ණය කළමනාකරණය යන ක්ෂේත්‍රවල වසර 25 කට ආසන්න පළපුරුද්ද ඇත.

ඇය දැනට බැංකුවෙහි ආයතනික බැංකුකරණයට නායකත්වය දෙන්නීය.



## කේ. බී. රාජපක්ෂ මහතා

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දේශීය ණය*

රාජපක්ෂ මහතා දේශීය ණය දෙපාර්තමේන්තුව භාරව සිටී. 1987 දී කළමනාකරණ පුහුණුව ලබන්නෙකු ලෙස ඔහු බැංකුවේ සේවයට එක්වූ අතර, මහජන බැංකුවේ වසර 25 ක පලපුරුද්ද ඔහු සතුය.

රාජ්‍ය පරිපාලනය පිළිබඳ දෙවන පෙළ ගෞරව (විද්‍යාවේදී) උපාධිධරයකු වන ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි අධි සාමාජිකයෙකු ද, ශ්‍රී ලංකාවේ නීතිඥවරයෙකු ද, ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමා ධාරියෙකු ද වේ.

බැංකුවේ කළමනාකරණ මට්ටමේ විවිධ තනතුරුවල පුළුල් පලපුරුද්දක් ලබා ඇති ඔහු වර්තමානයේ බැංකුවේ දේශීය ණය හා ණය කාඩ්පත් කටයුතු අංශයේ ප්‍රධානියා ලෙස සේවය කරයි. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි අධ්‍යක්ෂ වරයෙකු හා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙහි ප්‍රත්‍යාවර්ථ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි.



## එස්. ඒ. ආර්. එස්. සමරවීර මහතා

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත්*

සමරවීර මහතා මානව සම්පත් අංශය භාරව සිටියි. කළමනාකරණ පුහුණු නිලධාරියෙකු ලෙස බැංකුවට බැඳුණු ඔහුගේ 25 වසරකට වැඩි සේවා පළපුරුද්ද ශාඛා බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන බැංකුකරණය හා ණය ආපසු අය කරගැනීම යන ක්ෂේත්‍ර ආවරණය කරයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී උපාධිය ලබා ඇති ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකයෙකු ද වෙයි.

දේශීය හා විදේශීය වශයෙන් ඔහු ලබා ඇති විවිධ නිරාවරණ අවස්ථා අතර, කළමනාකරණ සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කළමනාකරණය, දුර්වල ව්‍යාපෘති පුනරුත්ථාපනය කිරීම හා උපායමාර්ගික මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ අවස්ථා වේ.



## ටී. ඒ. ආරියපාල මහතා

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සංවර්ධන සමුපකාර හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර*

ආරියපාල මහතා 2010 සිට සංවර්ධන සමුපකාර හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බැංකුකරණය භාරව සිටී. ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී හා නීතිවේදී උපාධිධරයෙකු වන ඔහු නීතිඥවරයෙකු ද වේ.

ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (FIBSL) සම සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ තාක්ෂණවේදීන්ගේ ආයතනයේ (MAAT) ආශ්‍රිත සාමාජිකයෙකු වේ. මහජන බැංකුවේ වසර 34කට වැඩි පලපුරුද්ද ඔහු සතුය. සමුපකාර, ව්‍යාපෘති ණය, ක්ෂුද්‍ර මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය සහ ශාඛා ව්‍යාපාර/බැංකුකරණය යන ක්ෂේත්‍රවල පුළුල් පුහුණුව හා ඊට නිරාවරණයවීම ඔහු දේශීය හා විදේශීය වශයෙන් පුළුල් ලෙස ලබා ඇත.

මහජන බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ බැංකුකරණය හා සංවර්ධන ණයදීම් යළි ප්‍රාණවත් කිරීමේ වගකීම ඔහු විසින් ඉටු කර ඇත.

ඔහු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ වරයෙකුද වෙයි.



## රොහාන් පතිරගේ මහතා

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/*
*අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්*

පතිරගේ මහතා 2010 අගෝස්තු මස දී අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පත් කරන ලදී. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ නීති උපාධිධාරියෙකුද (LL.B.) නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලයෙන් බැංකුකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාධාරියෙකු හා බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිධරයෙකු ද වේ. ඔහු නීතිඥවරයෙකි.

සී/ස පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම, සී/ස පීපල්ස් ෆ්ලීට් මැනේජ්මන්ට්, සී/ස පීපල්ස් ප්‍රොපටි ඩිවලප්මන්ට්, සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස් හා සී/ස පීපල්ස් ට්‍රැවල්ස් යන සමාගම්වල සමාගම් ලේකම් ද වේ.

බැංකුවේ වසර 17ක සේවා පළපුරුද්ද ඔහු සතුව ඇත.



## ශ්‍රීමා අර්සකුලරත්න මහත්මිය

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අනුකූලතාව*

අර්සකුලරත්න මහත්මිය දෙවැනි ශ්‍රේණියේ මූල්‍ය නිලධාරිනියක වශයෙන් බැංකුවේ සේවයට එක්වී එහි වසර 27 කට වැඩි සේවා කාලයක් සපුරා ඇත.

පසුගිය වසර 31 මුළුල්ලේ ඇය එක්සත් රාජ්‍ය කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ වරලත් ආයතනයේ සම සාමාජිකාවක්ව සිට ඇති අතර, ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ බලපත්‍රලාභිනියකද වන්නීය. ඇය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධිය ලබා සිටින්නීය.

කළමනාකරණ/මූල්‍ය ගිණුම්කරණය, කළමනාකරණ, තොරතුරු, පරිපාලනය හා මෙහෙයුම් යන ක්ෂේත්‍රවල ඇය පුළුල් අත්දැකීම් ලබා ඇත. බැංකුවේ සේවයට එක්වීමට පෙර ලංකා පිඟන් සංස්ථාවේ දී ඇය වෘත්තිය පුහුණුව ලැබූ අතර, ගණකාධිකාරිනියක ලෙස රාජ්‍ය ආයතන තුනක සේවය කර ඇත.



## ජී. පී. ආර්. ජයසිංහ මහත්මිය

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සිල්ලර*
*බැංකුකරණ බැංකු කටයුතු*

රේණුකා ජයසිංහ මහත්මිය 1987 දී කළමනාකරණ පුහුණුවන්නියක ලෙස බැංකුවේ සේවයට එක් වූ අතර මහජන බැංකුවේ වසර 25 කට වැඩි සේවා පලපුරුද්දක් ඇය සතුව ඇත.

ඇයගේ සේවා කාලයේ දී ඇය ශාඛා කළමනාකරු, කලාපීය ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ප්‍රාදේශීය කළමනාකරු හා සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු සහායක සේවා) මට්ටම් වල සේවය කළාය. 2011 සිට ඇය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සිල්ලර බැංකු කටයුතු) ලෙස කටයුතු කර ඇත.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පළමු පෙළ ගෞරව වාණිජ උපාධිධාරිනියක වන අතර, ශ්‍රී ලංකා AIB වෘත්තීය බැංකුකරණ සුදුසුකම් ඈ සතුය. ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ඇය යාවජීව සාමාජිකාවකද වන්නීය.

ඇගේ බැංකු සේවය අතරතුර දී ඇය විවිධ දේශීය හා විදේශීය වැඩසටහන්වලට සහභාගී වී ඇත.



## ක්ලයිව් ෆොන්සේකා මහතා

*භාණ්ඩාගාර හා ආයෝජන*
*බැංකුකරණ ප්‍රධානී*

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි සාමාජිකයෙකු වන ෆොන්සේකා මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත.

තවද ACI ගනුදෙනු සහතිකය වෙනුවෙන් විශිෂ්ට සාමාර්ථයක් ලබා ඇති ඔහු සතුව භාණ්ඩාගාර කළමනාකරණය පිළිබඳව වසර 20 කට ආසන්න පළපුරුද්දක් ඇත.

ඔහු 2002 දී මහජන බැංකුවේ සේවයට බැඳුණු අතර, එයට පෙර අමෙරිකන් එක්ස්ප්‍රස් හා ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ සේවය කළේය.



## එම්. ඒ. බොනිෆස් සිල්වා මහතා

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්*

සිල්වා මහතා 1987 දී කළමනාකරණ පුහුණුවන්නෙකු ලෙස බැංකුවට බැඳුණු අතර මහජන බැංකුවේ වසර 25 කට වැඩි කාලයක් සේවය කර ඇත. ඔහුගේ වසර 25 කට වැඩි පළපුරුද්ද ශාඛා කළමනාකරු, ප්‍රාදේශීය කළමනාකරු, කලාපීය සහකාර සාමාන්‍යාධිකාරී යන මට්ටම්වලින් ශාඛා ව්‍යාපාර බංකුකරණ ක්ෂේත්‍ර ආවරණය කරන අතර, දැනට ඔහු වඩා ඉහළ මට්ටමේ ව්‍යාපාර පරිමාවක් සහිත කලාප 08 ක් යටතේ කාණ්ඩගත කරනු ලැබ ඇති ශාඛා 150 කට වැඩි සංඛ්‍යාවක් භාරව සිටී. ඔහු පේරාදෙනිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියක් හා AIB - ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරණ සුදුසුකම් ද ලබා ඇති අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ සම සාමාජිකයෙකු ද වෙයි. ඔහුගේ සේවා කාලය තුළ දී ඔහු ශාඛා ව්‍යාපාර/බැංකුකරණය පිළිබඳව පුළුල් වශයෙන් දේශීය හා විදේශීය පුහුණුව හා නිරාවරණ අවස්ථා ලබා ඇත.



## බී. එම්. ප්‍රේමනාත් මහතා

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - බැංකු සහායක සේවා*

බී. එම්. ප්‍රේමනාත් මහතා මහජන බැංකුවේ වසර 25 කට අධික කාලයක් සේවය කර ඇත. පුහුණු වන කළමනාකරණ පුහුණුවන්නෙකු ලෙස ඔහු 1987 දී බැංකුවට බැඳුණු අතර, කළමනාකරු වශයෙන් තණමල්විල, හසලක, අකුරණ, පිළිමතලාව හා පේරාදෙනිය ශාඛාවල ද, සහකාර ප්‍රාදේශීය කළමනාකරු ලෙස මාතලේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ද, ප්‍රාදේශීය කළමනාකරු ලෙස පොළොන්නරුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ද, සහකාර සාමාන්‍යාධිකාරී (මධ්‍යම කලාපය) ලෙස ද බැංකුවට සේවය කර ඇත. 2011 නොවැම්බර් 16 වැනි දින සිට ඔහු වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු සහායක සේවා) ලෙස උසස් කරන ලදී.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් දෙවැනි පෙළ ඉහළ පංති සාමාර්ථයක් සහිතව වාණිජවේදී උපාධිය ලබා ඇති අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අන්තර් පරීක්ෂණයෙන් ද සමත්ව සිටී.

ඔහුගේ බැංකු වෘත්තීය කාලසීමාව තුළ දී දේශීය හා විදේශීය යන දෙවර්ගයේම විවිධ නිරාවරණ වැඩසටහන්වලට සහභාගිවී ඇත.



## එන්. එස්. තිලකරත්න මහත්මිය

*ප්‍රධාන අභ්‍යන්තර විගණන*

2012 ජුනි 15 දින සිට නන්දනී තිලකරත්න මහත්මිය ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස පත් කරනු ලැබුවාය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සම සාමාජිකාවක වන ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දෙවන පෙළ ගෞරව (විද්‍යාවේදී කළමනාකරණ) උපාධිධාරිනියකි. ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සම සාමාජිකාවක වන්නීය. ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ තාක්ෂණික සහයෝගිතාව ඇතිව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පිරිනැමෙන තොරතුරු පද්ධති ආරක්ෂක පාලන හා විගණන ඩිප්ලෝමාව ලබා 1990 මාර්තු මස දී සහකාර මූල්‍ය නිලධාරිනියක ලෙස ඇය බැංකුවේ සේවයට එක්වූ අතර, ව්‍යාපෘති ණයදීම් හා විගණන ක්ෂේත්‍රයේ ආසන්න වශයෙන් වසර 23 ක පළපුරුද්දක් ලබා සිටින්නීය.



## ජයන්ත නිවුන්හැල්ල මහතා

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ජාත්‍යන්තර බැංකුකරණ)*

නිවුන්හැල්ල මහතා බැංකුවේ විවිධාකාර අත්දැකීම් ලබා ඇති අතර, ව්‍යාපාර හා වෘත්තිය සංවර්ධනයට අදාළව විවිධ රටවල්වල නිරාවරණ සැසිවලට සහභාගි වී ඇත. ඔහු දැනට බැංකුවේ වෙළඳ සේවා මූල්‍ය ආයතන අංශය, විදේශීය ගනුදෙනුකාර භවතුන් සඳහා සේවා සහ භාණ්ඩාගාර පසුපෙල කාර්යාලය භාරව සිටී. කළමනාකරණ විද්‍යාවේදී උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් අධ්‍යයන ආයතනයෙන් ලැබූ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ඔහු සතුය.

ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි සාමාජිකයෙකු ද වේ. නිවුන්හැල්ල මහතා දැනට ශ්‍රී ලංකාවේ වෙළඳ මූල්‍ය සංගමයේ සභාපතිවරයා වෙයි. ඊට අමතරව ඔහු ජාත්‍යන්තර වෙළඳාම සහ මානව සම්පත් පිළිබඳව ආයතන ගණනාවක කථිකාචාර්යවරයෙකු හැටියද සේවය කරයි.



## ජී. ඒකනායක මහත්මිය

*ප්‍රධාන නීති නිලධාරිනී*

ශ්‍රද්ධා ඒකනායක මහත්මිය නීතිඥවරියක වන අතර, ඇය කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය (LLB) ලබා ඇත. වේල්ස් විශ්වවිද්‍යාලයෙන් ලද (LLM) උපාධිය ද, ජාත්‍යන්තර වෙළඳ නීතිය, බැංකුකරණය හා රක්ෂණය පිළිබඳව ඩිප්ලෝමා දෙකක් හා එක්සත් රාජධානියේ සොලිසිටර් අවසාන පරීක්ෂණ සාමාර්ථය ද ඇය සතුය.

විජේසිංහ සහ ජයසේකර හා ද සිල්වා සහ ගුරුසිංහ නීතිඥ සමාගම්වල වෘත්තීය සහායිකාවක ලෙස ඇය ඇගේ වෘත්තීය දිවිය ඇරඹුවාය. නීති නිලධාරිනියක ලෙස ඇය ශ්‍රී ලංකා සීනි සංස්ථාවට එක් වූවාය. ඉන් අනතුරුව 1985 දී මහජන බැංකුවට එක් වූ ඇය ගාල්ල, මාතර හා කොළඹ බාහිර කලාපවල ආයතනික බැංකු අංශයෙහි සේවයකර දැනට ප්‍රධාන කාර්යාලයට අනුයුක්තව සිටින්නීය.

ඇගේ පළපුරුද්ද, බැංකුකරණ නීතිය, ණය ආපසු අය කරගැනීම්, ආයතනික නීතිය හා කම්කරු නීතිය යන සහ වාණිජ ගිවිසුම් ක්ෂේත්‍ර ආවරණය කරයි.



## සෝභිත වීරසේකර මහතා

*වැඩබලන ප්‍රධානි - තොරතුරු තාක්ෂණ*

2007 වර්ෂයේ දී සෝභිත වීරසේකර මහතා මහජන බැංකුවේ සේවයට එක්වූ අතර 2010 සැප්තැම්බර් මාසයේ දී ඔහු තොරතුරු තාක්ෂණ අංශයේ වැඩබලන ප්‍රධානී තනතුරට පත් විය.

වීරසේකර මහතාට බැංකු අංශයේ වසර 25 ක පළපුරුද්දක් ඇත. බැංකු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට ඔහු ලද පුළුල් නිරාවරණ අවස්ථා හැරුණුකොට ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ද, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ විද්‍යා ආයතනයෙන් තොරතුරු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය ද, MACS හා වෘත්තීය බැංකුකරණය (ACBF) උපාධිය ද ලබා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාතික ගෙවීම් සභාව, කොමන් ඒ.ටී.එම්. ස්විච් ටෙක්, බැංකු තාක්ෂණික උපදේශක කමිටුව ඇතුළු විවිධ තාක්ෂණික ඇගයීම් කමිටුවල වීරසේකර මහතා මහජන බැංකුව නියෝජනය කරන අතර, SWIFT භාවිතා කරන්නන්ගේ කණ්ඩායමේ උප සභාපති ලෙස කටයුතු කරයි.



## ජී. බී. ආර්. පී. ගුණවර්ධන මහතා

*වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ණය පාලන/අවදානම්*

රසිත ගුණවර්ධන මහතා වසර 25 කට වැඩිකාලයක් බැංකුවේ සේවය කර ඇත. ඔහු 1987 දී ජ්‍යෙෂ්ඨ මූල්‍ය නිලධාරියෙකු ලෙස බැංකුවේ සේවයට බැඳුනේය.

ඔහු බැංකුවේ කටයුතුවල දී ඔහු අත්දැකීම් ලත් ක්ෂේත්‍ර අතරට මූල්‍ය කාර්යසාධන කළමනාකරණය, ආයතනික සහ වාණිජ ණය භාණ්ඩාගාර මෙහෙයුම් සහ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අයත් වේ.

මහජන බැංකුවේ සේවයට බැඳීමට ප්‍රථමයෙන් ඔහු පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයේම සංචාරක සහ හෝටල්, වැවිලි කළමනාකරණ සහ ඉදිකිරීම් යන ක්ෂේත්‍ර ආවරණය කරමින් පළපුරුද්ද ලබා ඇත.

ඔහු එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වේ. ඔහු ACT භාණ්ඩාගාර මෙහෙයුම් සහතිකයෙන් විශිෂ්ට සාමාර්ථ ලබා ඇත.



## ලයනල් ගලගෙදර මහතා

*වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ණය අය කරගැනීම්*

ලයනල් ගලගෙදර මහතා බැංකුවේ ණය අය කර ගැනීම් අංශය භාරව සිටී.

ඔහු කළමනාකරණ පුහුණුවන්නෙකු ලෙස බැංකුවේ සේවයට බැඳුණු අතර වසර 25 කට අධික කාලයක් සේවය කර ඇත. ඔහු පළපුරුද්ද ලැබූ විවිධාකාර ක්ෂේත්‍ර අතරට පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය, වෙළඳ මූල්‍ය, ණය දීම්, ණය පාලන සහ අය කරගැනීම් අයත් වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී විශේෂ උපාධියක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීති උපාධියක් ඔහු ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකයෙකු මෙන්ම නීතිඥවරයෙකු ද වේ.

*This page is intentionally left blank*

# විධායක කළමනාකාරිත්වය



**එස්. වන්නිආරච්චි මහතා**

සහකාර සාමාන්‍යාධිකාරි -
අක් වෙරළ බැංකු කටයුතු



**එස්. ප්‍රතාපසිංහ මහත්මිය**

සහකාර සාමාන්‍යාධිකාරි - ණය



**එස්. ඩබ්ලිව්. ඒ. ඩී. එස්. කල්‍යාණි මහත්මිය**

සහකාර සාමාන්‍යාධිකාරි -
මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය



**එච්. සී. ප්‍රනාන්දු මහතා**

සහකාර සාමාන්‍යාධිකාරි -
අලෙවි හා නිපැයුම් සංවර්ධන



**ඩබ්ලිව්. කේ. එස්. බී. නන්දන මහතා**

නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරි -
අය කර ගැනීම්



**ඒ. ඩබ්ලිව්. විපුලගුණ මහතා**

නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරි -
මානව සම්පත් හා මෙහෙයුම්



**ඊ. ඒ. ඩී. ජේ. ප්‍රියශාන්ත මහතා**

නියෝජ්‍ය ප්‍රධාන අභ්‍යන්තර විගණක



**පී.ආර්. මදුරාවල මහත්මිය**

සහකාර සාමාන්‍යාධිකාරි -
ණය පාලන



**එන්. සී. මුදලිගේ මහත්මිය**

සහකාර සාමාන්‍යාධිකාරි -
ශාඛා මෙහෙයුම්



**වී. කේ. නාරංගොඩ මහත්මිය**

සහකාර සාමාන්‍යාධිකාරි - ණය ඒකක 1 -
ආයතනික බැංකු කටයුතු



**ඒ. එස්. ලියනආරච්චි මහත්මිය**

සහකාර සාමාන්‍යාධිකාරි - ණය ඒකක 111 -
ආයතනික බැංකු කටයුතු අංශය



**එස්. ජේ. කරුණාරත්න මහතා**

සහකාර සාමාන්‍යාධිකාරි -
බැංකු කටයුතු සහායක සේවා



**එම්. පී. ඩී. කුලරත්න මහතා**

සහකාර සාමාන්‍යාධිකාරි - අයකර ගැනීම් - ශාඛා



**ඩී. වයි. එස්. මෙන්ඩිස් මහත්මිය**

සහකාර සාමාන්‍යාධිකාරි - මෙහෙයුම්



**කේ. එන්. සේනාරත්න මහත්මිය**

සහකාර සාමාන්‍යාධිකාරි - වත්කම් නිපැයුම්



**ඒ. එන්. ලියනපතිරණ මහතා**

සහකාර සාමාන්‍යාධිකාරි - සමූපකාර හා සංවර්ධන



**එල්. එල්. රණසිංහ මහතා**

සහකාර සාමාන්‍යාධිකාරි - බැරකම් නිපැයුම්



**පී. ආර්. එස්. ජයතිස්ස මහතා**

සහකාර සාමාන්‍යාධිකාරි - මානව සම්පත් - පරිපාලන



**පී. එස්. ජේ. කුරුකුලසූරිය මහත්මිය**

සහකාර සාමාන්‍යාධිකාරි - මානව සම්පත් සංවර්ධන



**ආර්. එම්. ඒ. කේ. බණ්ඩාර මහතා**

සහකාර සාමාන්‍යාධිකාරි - මෙහෙයුම්



**ජී. එම්. ආර්. පී. විජේරත්න මහත්මිය**

ප්‍රාථමික වෙළඳ ඒකකයේ ප්‍රධානි - භාණ්ඩාගාරය



**ඒ. කේ. ආතර් මහතා**

වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරි - භාණ්ඩාගාර පසුපෙළ කාර්යාලය



**එල්. විතාන මහතා**

වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරි - විමර්ශන හා විමසීම්

# කලාප කළමනාකාරිත්වය



**ආර්. එම්. එස්. බී. රත්නායක මහතා**

කලාප සහකාර සාමාන්‍යාධිකාරි - මධ්‍යම



**ආර්. රණතුංග මහතා**

කලාප සහකාර සාමාන්‍යාධිකාරි - බස්නාහිර කලාප - 1



**ඩබ්ලිව්. එම්. එස්. වීරකෝන් මහතා**

කලාප සහකාර සාමාන්‍යාධිකාරි - උතුරු මැද කලාපය



**ටී. ඩී. ද ඉසෙඩ් ගුණවර්ධන මහතා**

කලාප සහකාර සාමාන්‍යාධිකාරි - බස්නාහිර කලාප 11



**එන්. ජී. දිසානායක මහතා**

කලාප සහකාර සාමාන්‍යාධිකාරි - වයඹ කලාපය

# ව්‍යාපාර සමාලෝචනය

**අපි අපගේ මෙහෙයුම් තුළට ප්‍රගතිශීලී, සක්‍රියව සාධනීය තත්ත්වයන් නිර්මාණය කිරීමේ ස්වභාවයක් කාවද්දා ඇති එනමුත් සමාජයෙහි සියල්ලන් ඇතුළත් කර ගැනීමේ පුළුල් දර්ශනය ජාතික සංවර්ධනය සඳහා පදනමය යන මතයෙහි නිරන්තරයෙන් එල්බගෙන සිටින, රජය සතු බැංකුවක් වන්නෙමු.**

අපි සැබැවින්ම විවේචකයන්ව හා උද්යෝගිමත්ව සිටින්නන්ව එක හා සමානව මවිතයට පත් කළ ජාතියක් වන්නෙමු. ලෝකය අවරෝහණ සර්පිලයකට පත්ව සිටියදීත් ශ්‍රී ලංකාව ගෝලීය සංසන්දනාත්මක දර්ශක අනුව වැඩි දියුණු වෙමින්, මැද ආදායම් ලබන රටක තත්ත්වය අත්පත් කර ගනිමින් හා 2015 වන විට දකුණු ආසියාවේ ආර්ථික කේන්ද්‍රස්ථානය බවට පත්වීමේ ඇය ගේ දර්ශනය සාක්ෂාත් කරගැනීම සඳහා මනා පිහිටීමක ට පත්වෙමින් අඛණ්ඩ ලෙස වර්ධනය වී ඇත. ශක්තිමත් හා සුරක්ෂිත රටක් පවත්වාගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ මූලික කරුණු ඉටුවන බව සහතික කිරීම කෙරෙහි අපි අපගේ අවධානය කේන්ද්‍රගත කර සිටින්නෙමු. ජනතාව විසින් ජනතාව සඳහා වූ බැංකුවක් වීම, ඉතා පැහැදිලිව ම මෙම ප්‍රගතියෙහි මූලික හේතුවක් වී ඇත. අපි අපගේ මෙහෙයුම් තුළට ප්‍රගතිශීලීලසක්‍රියව සාධනීය තත්ත්වයන් නිර්මාණය කිරීමේ ස්වභාවයක් කාවැද්දා ඇති එනමුත් සමාජයෙහි සියල්ලන් ඇතුළත් කර ගැනීමේ පුළුල් දර්ශනය ජාතික සංවර්ධනය සඳහා පදනමය යන මතයෙහි නිරන්තරයෙන් එල්බගෙන සිටින, රජය සතු බැංකුවක් වන්නෙමු. එබැවින්, නිසැකවම 'මහජන බැංකුව' යන නාමය අප නියෝජනය කරන, අප විශ්වාස කරන හා අප මුදුන් පමුණුවා ගැනීමට අභිලාෂයෙන් සිටින සියළු දෙයෙහි සාරය අඟවයි.

මහජන බැංකුව වීම හේතුවෙන් අපට සුවිසල් වගකීමක් පැවරී ඇති බව අපි දනිමු. එම වගකීම අපගේ ප්‍රමුඛතාව වන අපගේ ජාතිය කෙරෙහි කේන්ද්‍රගත වූ වගකීමක් හා බැඳීමක් වේ. එමෙන්ම අප කරන්නා වූ සියළු කාර්යයන්හි දී අපගේ පදනම් මූලධර්මය ලෙස අප දිගින් දිගටම භාවිතා කරන්නේ ජාතිය කෙරෙහි වන මෙම වගකීමයි. ඉදිරි පිටු කිහිපයෙහි ඉදිරිපත් කෙරෙන ව්‍යාපාර සමලෝචනය, ශ්‍රී ලංකාවේ ජනතාව පිහිට අපේක්ෂා කරන, විශ්වාසය තබන හා හැමවිටම පක්ෂපාතීව සිටිනු ඇත්තා වූ නමක් වීමේ අපගේ සැබෑ පෞරුෂත්වය පිළිබිඹු කිරීම සඳහා සංකල්පනය කර, සැලසුම් කර, සකස් කර ව්‍යාප්ත කරන ලද අපගේ එක් එක් මූලාරම්භයන්, නව තත්ත්වයන් හා ඇතුළත් කර ගන්නා ප්‍රවේශයන් සවිස්තරාත්මක ව ගෙන හැර දක්වයි.

## පුද්ගලික බැංකුකරණය

වයස, වාසස්ථානය, දැනුම මට්ටම හෝ සමාජ ආර්ථික යථාදර්ශන යන කවර හෝ ආකාරයකින් ජනගහනයේ සියළු කොටස් ඇතුළත් කරගන්නා පුළුල් හා නානාංගකෘත නිපැයුම් කළඹ සමග එක්වූ අසම සේවා විශිෂ්ටත්වය බැංකුවේ දශක පහක පැවැත්ම මුළුල්ලේ එය අඛණ්ඩව වැඩි දියුණු කරගත් තරඟකාරී තියුණු බව ට අයත්ව ඇත. මහජනයා සමග සිටින මහජනයා සඳහා වන බැංකුවක් වීමේ ආකල්පයට අවංක වෙමින්, පුද්ගලයෙකුගේ ළදරු වියේ සිට අතිශයින් ම මහළු විය දක්වා, ග්‍රාමීය වටපිටාවක හෝ නාගරික පරිසරයක වේවා, කවර සමාජ තලයකට අයත් වූවෙකුට හෝ වේවා ඔවුන්ගේ අවශ්‍යතා හා අභිලාෂයන්ට අනුකූලව ගනුදෙනුකාර භවතුන්ට හවුල්කාරිත්වය සැපයීම සඳහා කීර්තිමත් නිපැයුම් රාශියකින් අපගේ පුද්ගලික බැංකුකරණ නිපැයුම් කළඹ පොහොසත්ය.

අපගේ කළඹ ණය කාඩ්පත්වල සිට පුද්ගලික ණය දක්වා, ඉතුරුම් තැන්පතුවල සිට ස්ථිර තැන්පතු දක්වා හා බාලවයස් ඉතිරිකරන්නන්ගේ ගිණුම්වල සිට විශ්‍රාම වැටුප් සැලසුම් දක්වා පරාසයක විහිදෙන අතර දශක ගණනක් තිස්සේ බැංකුවේ විශිෂ්ටත්වයේ සලකුණ බව ට පත්ව ඇති ගනුදෙනුකාර භවතුන් සඳහා වන සේවාවන් මගින් මෙම කළඹ ට ශක්තිමත් සහාය ලැබේ. අපගේ අවධානය කේන්ද්‍රගතව පැවතී ඇත්තේ අපගේ ගනුදෙනුකාර භවතුන් සමග දිගුකාලීන සබඳතා වර්ධනය කරගැනීම කෙරෙහි හා ඔවුන් ගේ විවිධ අවශ්‍යතා දුරදක්නා නුවණින් සක්‍රියව ඉටු කිරීම කෙරෙහිය.

වසර ගණනාවක් තිස්සේ තීක්ෂණ නුවණින් යුතුව අප තාක්ෂණයෙ හි කරන ලද ආයෝජන හේතුවෙන් ඕනෑම වේලාවක ඕනෑම ස්ථානයක දී පහසු, කාර්යක්ෂම, සියුම් හා කරදරයෙන් තොර බැංකුකරණය සඳහා අපගේ ගනුදෙනුකාර භවතුන්ට තාක්ෂණයෙන් පිරිපුන් නිපැයුම් ඉදිරිපත් කිරීමට අපට හැකියාව ලබා දෙයි. අන්තර්ජාල බැංකුකරණය, අත්ල මත බැංකුකරණය, වීසා හර කාඩ්පත්, ජංගම බැංකුකරණය හා කෙටි පණිවුඩ (SMS) බැංකුකරණය මේ අතර වේ. පසුගිය වසරේ දී 'විගමනික හර කාඩ්පත' ක් නිකුත් කිරීම සඳහා බැංකුව විදේශ රැකියා කාර්යාංශය ට හවුල් වූ අතර එය විදේශගත ශ්‍රමිකයන්ට මහත් වාසියක් බව ට ඔප්පු වී ඇත.

## අප ගේ නිපැයුම්

**ඉසුරු උදාන**

අළුත උපන් බිළිඳුන් ඉලක්ක කරගත් ඉසුරු උදාන ඉතිරි කිරීමේ ගිණුම රු. 100/- ක් වැනි සුළු මුදලකින් විවෘත කළ හැකි අතර සම්මත ප්‍රමාණයට වැඩි පොළී අනුපාත හා චමත්කාරජනක ත්‍යාග ලබා දෙයි. ඉසුරු උදාන ත්‍යාග සහතිකපත් ද සුවිශේෂී වන අතර, නව ගිණුමක් විවෘත කිරීමට හෝ පවත්නා ගිණුමකට බැර කිරීමට මේවා භාවිතා කළ හැකිය. ගිණුම්හිමියාට අවුරුදු පහක් වයස සම්පූර්ණ වූ පසු, ගිණුම ස්වයංක්‍රීයව ම "සිසු උදාන" ගිණුමක් බවට පරිවර්තනය වේ.

**සිසු උදාන**

අවු 6-18 අතර, ගිණුම්හිමියන් වෙනුවෙන් රු. 100/- වැනි සුළු මුදලකින් මෙම ගිණුම ආරම්භ කළ හැකිය. පහ වසර ශිෂ්‍යත්වයේ දී හා සාමාන්‍ය පෙළ විභාගයේ දී දස්කම් දක්වන සිසුන්ට චමත්කාරජනක ත්‍යාග, විශේෂ මුදල් ප්‍රදාන හා ත්‍යාග ලබාදීම, මෙම ගිණුම වඩාත් ආකර්ශනීය කරයි. වයස 18 දී ගිණුම් හිමියා ගේ සිසු උදාන ගිණුම ස්වයංක්‍රීයව 'ඉයස්' (Yes) ගිණුමක් බවට පත් වේ.

*Yes*

Yes ගිණුම සැබෑ ලෝකයට පය තැබීමට සූදානමින් සිටින තරුණ තරුණියන් වෙනුවෙන්ම විශේෂයෙන් සැලසුම් කරන ලද්දකි. රු. 2000/- ක තැන්පතුවකින් විවෘත කෙරෙන ගිණුම නොමිලේ ස්ථාවර නියෝග ණය කාඩ්පත් පහසුකම් මෙන්ම නිවාස, වාහන මිලදී ගැනීම් හා උසස් අධ්‍යාපනය වෙනුවෙන් ණය පහසුකම් ලබා දෙයි. ශේෂය රු. 27,000/- ඉක්මවූ විට, මෙම ගිණුමට 1% ක ප්‍රසාද පොළියක් හිමි වේ.

**ස්වර්ණ ප්‍රදීප**

මෙය හදිසි මුදල් අවශ්‍යතා ඉටු කිරීම ඉලක්ක කරගත් රන් උකස් නිපැයුම වන අතර, එය අතිශයින් ම ආකර්ශනීය පොළී අනුපාත සහිත ය.

**අස්වැන්න**

නමින් හැඟවෙන පරිදි 'අස්වැන්න' යනු විශේෂයෙන්ම කන්න අනුව ආදායම් ලබන ගොවීන් ඉලක්ක කරගත් නිපැයුමක් වන අතර, රු. 1,000/- ක මූලික තැන්පතුවකින් මෙම ගිණුමක් විවෘත කළ හැකිය. ශේෂය රු. 10,000/- ඉක්මවූ විට 1% ක ප්‍රසාද පොළී අනුපාතයක ට හිමිකම් කියන මෙම ගිණුම් හිමියන් ට සහනදායක පොළී අනුපාත හා කෘෂිකාර්මික ණය ප්‍රදානය කරනු ලැබේ.

**මහජන බැංකු තෑගි වවුචර**

රු. 500/- හා රු. 1000/- යන අගයන්ගෙන් ලබාගත හැකි මහජන බැංකු තෑගි වවුචර ඕනෑම ශාඛාවක ඕනෑම ගිණුමක තැන්පත් කළ හැකි වන අතර, නිකුත් කළ දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු ය.

**වනිතා වාසනා**

රටේ කාන්තාවන් විසින් ඉටු කරනු ලබන බහුවිධ කාර්යභාරයන් පසසමින් වනිතා වාසනා ගිණුම සාමාන්‍ය පොළී අනුපාතයට වඩා ඉහළ අනුපාතයක් ලබා දෙන අතර, රු. 500/- ක මූලික තැන්පතුවකින් ඇරඹීමේ හැකියාව ඇත. කුඩා ව්‍යවසාය, දේපළ මිලදී ගැනීම්, නිවාස හෝ උසස් අධ්‍යාපනය වෙනුවෙන් ණය පහසුකම් ප්‍රදානය කිරීමේ අතිරේක වාසිය එය සතු ය.

**පරිණත**

රු. 500/- කින් විවෘත කළ හැකි 'පරිණත ගිණුම' ආකර්ශනීය පොළී අනුපාත ලබා දෙන අතර, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන්ම විශේෂයෙන් නිර්මාණය කරන ලද මෙයට තෝරාගත් ගනුදෙනුකාර භවතුන් 25 දෙනෙකු වෙනුවෙන් දඹදිව වන්දනා ගමනක් ඇතුළු පුළුල් පරාසයක වන ආකර්ශනීය ප්‍රතිලාභ ඇතුළත්ව ඇත.

**ජනජය**

ස්ථිර මාසික ආදායමක් ලබන්නවුන් වෙනුවෙන් වන රු. 2,000/- ක අවම තැන්පතුවකින් ඇරඹිය හැකි මෙම ගිණුම විශේෂ ණය හා කල්බදු පහසුකම්, විදේශ සංචාර සඳහා සහනදායක පොළී අනුපාත මත ණය හා ආකර්ශනීය පොළී අනුපාත ලබා දෙයි.

**ජය නිවස**

ඔබගේ සුවිශේෂී අවශ්‍යතාවන් ට ගැලපෙන පරිදි තරගකාරී පොළී අනුපාත සහිත නම්‍යශීලි ණය පහසුකම් සැපයීමෙන් ජය නිවස නිවාස ණය, ඔබේ සිහින නිවස පහසුවෙන් ඉදි කර ගැනීමට ඔබට උපකාරී වෙයි.

**එතෙර ඉසුර**

'එතෙර ඉසුර' අනේවාසික විදේශ මුදල් ගිණුම ඔබේ විදේශ ඉපයීම් වෙනුවෙන් ඉහළ පොළී අනුපාත සහතික කරන අතර, මහජන බැංකුවේ ශාඛා හා සේවා මධ්‍යස්ථාන 728 කින් සැදි දීප ව්‍යාප්ත ජාලය හරහා විදේශයන්ගෙන් මුදල් ලබාගත හැකි වේගවත් ම ක්‍රමය වේ.

**දූ දරු එතෙර ඉසුර**

විදේශ රටවල රැකියා කරන දෙමවුපියන්ගේ/භාරකරුවන්ගේ දරුවන් වෙනුවෙන් විශේෂයෙන් සැලසුම් කරන ලද දූ දරු එතෙර ඉසුර බාල වයස්කාර ගිණුම්වලට, අනේවාසික විදේශ මුදල් නේවාසික විදේශ මුදල් ගිණුම් සඳහා පවතින පොළී අනුපාතයට අමතර 1% එක් කරන ලද පොළී අනුපාතයක් හිමි වේ. ඇ.එ.ජ.ඩො. 25 ක් හෝ කවර හෝ විදේශ මුදල් ඒකක වලින් එයට සමාන අගයක් අවම තැන්පතුව ලෙස යෙදවීමෙන් මෙම ඉතිරි කිරීමේ ගිණුම් ඇරඹිය හැකි අතර, ඇ.එ.ජ.ඩො. 1,000 ක් හෝ කවර හෝ විදේශ මුදල් ඒකකයකින් එයට සමාන අගයක් ගන්නා අවම ශේෂයක් සහිතව ස්ථිර තැන්පතු ගිණුමක් විවෘත කළ හැකිය.

**කෙටි පණිවුඩ බැංකුකරණය**

ශේෂය පරීක්ෂා කිරීම්, ගනුදෙනු ඉතිහාසය විමසීම්, චෙක්පොත් ඇණවුම් කිරීම් හා මුදල් වෙනත් ගිණුමක ට මාරු කිරීම් අප ගේ කෙටි පණිවුඩ බැංකුකරණ සේවාව මගින් ලබාදෙන අගය එකතු කිරීම් අතරින් කිහිපයක් පමණි.

**මහජන ජාලය**

අන්තර්ජාල බැංකුකරණයේ මූලික අංශ එක් කරමින්, බැංකු ගණනාවක් කළමනාකරණය කිරීමේ හා විවිධ බැංකු ගනුදෙනු සිදු කිරීමේ පහසුව සලසන මහජන ජාලය ඕනෑම වේලාවක ඕනෑම තැනක දී බැංකු කටයුතු සිදුකිරීමට සැබවින්ම හැකියාව ලබා දෙයි.

**ජංගම බැංකුකරණය**

දින 7 ම පැය 24 මුළුල්ලේ ම බැංකු පරිසරයක් සඳහා අතිශයින්ම බහුකාර්ය ජංගම දුරකථනය මවිත කරවනසුළු පහසුවක් එක් කරයි. උපයෝගිතා බිල්පත් ගෙවීම ට මෙන්ම තෙවන පාර්ශ්ව ගනුදෙනු සිදු කිරීමට ද මිලියන 13 වැඩි ගනුදෙනුකාර භවතුන් සංඛ්‍යාවක් දැන් ජංගම බැංකුකරණය භාවිතා කරති.



**පීපල්ස් වීසා ජාත්‍යන්තර හර කාඩ්පත**

සුරක්ෂිත මූල්‍ය සේවා පිළිබඳ අමතර විශ්වාසය සමග විවිධාකාර කාර්යයන් ගණනාවකට පහසුව එක් කරන මෙම හර කාඩ්පත, මිලියන 30 අධික වෙළඳ මධ්‍යස්ථානවල දී හා ගෝලීය වශයෙන් පිපිරුණු මිලියන 1.5 ක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය මගින් භාවිතා කළ හැකි ය.

> වයස, වාසස්ථානය, දැනුම මට්ටම හෝ සමාජ ආර්ථික යථාදර්ශන යන කවර හෝ ආකාරයකින් ජනගහනයේ සියළු කොටස් ඇතුළත්කර ගන්නා පුළුල් හා නානාංගකෘත නිපැයුම් කළඹ සමග එක්වූ අසම සේවා විශිෂ්ටත්වය බැංකුවේ දශක පහක පැවැත්ම මුළුල්ලේ එය අඛණ්ඩව වැඩි දියුණු කරගත් තරඟකාරී තියුණු බවට අයත්ව ඇත.

### කාඩ්පත් ව්‍යාපාරය

දේශීය ගෙවීම් කාඩ්පත් කර්මාන්තයේ පුරෝගාමියෙකු වන අප, දශක දෙකක පමණ කාලයක් කාඩ්පත් නිකුත් කිරීම් හා අත්කරගැනීම් සඳහා පහසුකම් සැපයීමේ දී අතිශයින් ම සක්‍රියව කටයුතු කර ඇත. පාරිභෝගික වියදම් කිරීම් සඳහා පහසුව සැලසීම පිණිස කර්මාන්තය තිරසාර කරවන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම අප දිගින් දිගට ම සිදුකරන අතර, මේ වසරේ දී 750,000 ක මුළු කාඩ් පත් පදනමක් අත් කරගනිමින් වඩාත් ප්‍රබල ලෙස දේශීය කාඩ්පත් කර්මාන්තයේ අප ගේ පිය සටහන සලකුණු කළ අතර, මෙම සංඛ්‍යාව ඉදිරි වර්ෂ වල දී ආක්‍රමණශීලී ලෙස වර්ධනය කරගැනීමට අපේක්ෂිතය. ගනුදෙනුකාර හවතුන් වෙනුවෙන් තවදුරටත් අගය එකතු කිරීම පිණිස බැංකුව දැනට සිය පුළුල් හිමිකම් කාඩ්පත් පදනම වීසා හර කාඩ්පත් බවට පරිවර්තනය කරමින් සිටී.

වර්තමාන කළඹ යටතේ, පුළුල් පරාසයකට අයත් ගනුදෙනුකාර හවතුන් ඇතුළත් කරගනිමින් දැරිය හැකි මිල ගණන්වලට සුපරි පිල් සලකුණක් සහිත නිපැයුම් සපයන ලක්ෂණ වීසා ක්ලැසික් හා ගෝල්ඩ් ණය කාඩ් පත් බැංකුව ලබා දෙයි. එයට අනුරූපව, අපගේ කාඩ්පත් පරාසය විවිධ ආදායම් මට්ටම්වල ජනතාව ඉලක්ක කරගන්නා අතර අපගේ වෙළඳපොළ විනිවිද යාමේ දී කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ රටේ ණය කාඩ්පත් නිකුත් කරන්නන් අතර අවම අනුපාත හා අයකිරීම් ව්‍යුහය අප සතු වීම යි. තවත් වාසියක් වන්නේ අයදුම්කරුවෙකු ගේ ඉල්ලීම මත කිසිදු අමතර අයකිරීමකින් තොරව එක් ව්‍යාපාර දිනයක් තුළ අප ගේ කාඩ්පත් නිකුත් කරනු ලැබීම වන අතර, පීපල්ස් වීසා ජාත්‍යන්තර හර කාඩ්පත් හා පෙර සකසන ලද හර කාඩ්පත් ඕනෑම මහජන බැංකු ශාඛාවක කවුන්ටරයෙන් පහසුවෙන් ලබාගත හැකිය.

ගෝලීය වශයෙන් වීසා ප්‍රතීතනය ලත් වෙළඳුන් මිලියන 24 ට අධික සංඛ්‍යාවක් වෙත ප්‍රවේශය හා මිලියන 1.96 ක් වන ලොව පුරා විසිරුණු වීසා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයෙන් මුදල් ගැනීමේ හැකියාව මෙම කාඩ්පත් ලබා දෙයි. ශ්‍රී ලංකාවේ දී 2800 ට අධික වීසා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල දී හා 18,000 ක් වීසා වෙළඳසල්වල දී මහජන බැංකු ණයවර හා හර කාඩ්පත් භාවිතා කළ හැකිය.

බැංකුවේ සිය වීසා ණයවර හා හර කාඩ්පත් සඳහා ප්‍රතීතනය ලත් වෙළඳ ජාලය ප්‍රමාණවත් ලෙස වර්ධනය කරගෙන ඇත. අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක වන අනුපාතයන්ට අනුව වීසා ණයවර හා හර කාඩ්පත් සඳහා ප්‍රතීතනය ලබාගැනීමට ශ්‍රී ලංකාවේ උන්නතිකාමී වෙළඳුන්ට පහසුකම් සැලසීම මගින් මෙම ජාලය වර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයක් ගැනෙමින් පවතී. බැංකුවේ පුළුල් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය ද වීසා භුවමාරුවට සම්බන්ධ කර ඇති අතර, එමගින් සියළු වීසා කාඩ්පත් හිමියන්ට සේවය සැපයීම සිදු වේ.

වංචා හේතුවෙන් සිදුවන සැලකිය යුතු පාඩුවලට මෙම කර්මාන්තය පොදුවේ මුහුණපාන තත්ත්වයන් තුළ කාඩ්පත් ව්‍යාපාරයේ අවදානමට නිරාවරණය ද සාර්ථක ලෙස කළමනාකරණය කරගනු ලැබිණි. අප විසින් ගනු ලැබූ විචක්ෂණශීලී මූලාරම්භයන් හි ප්‍රතිඵලයක් ලෙස බැංකුවට හා කාඩ්පත් හිමියන්ට සිදුවන පාඩු හා බලපෑම අවම කර ගත හැකි විය.

## විදේශ ගනුදෙනුකාර හවතුන් වෙනුවෙන් සේවා

අපගේ ප්‍රේෂණ ව්‍යාපාරය හා විදේශ මුදල් තැන්පතු ක්‍රියාත්මක වන්නේ මෙය වටා වන බැවින් අපගේ සේවා මට්ටම් වැඩි දියුණු කිරීම අප අඛණ්ඩව සිදු කරන අතර, එමගින් ව්‍යාපාර කළඹෙහි ලාභදායක බව හා වර්ධනය මත විශිෂ්ට බලපෑමක් ඇති කර ඇත.

### ප්‍රේෂණ

2011 වර්ෂයේ දී රට තුළට ආමුඛ ප්‍රේෂණ ප්‍රමාණය 34.4% ක විශිෂ්ට වර්ධනයක් පෙන්නුම් කරමින්, පසුගිය වසර කිහිපයේ දී දක්වන ලද අති විශේෂ වර්ධනය බැංකුව අඛණ්ඩව පවත්වාගෙන ඇත. තාක්ෂණය වැඩි දියුණු කිරීම, නිර්මාණාත්මක අලෙවි උපාය මාර්ග හා නිරන්තරව ම නිපැයුම් වැඩි දියුණු කිරීම ඇතුළුව වසර ගණනක් මුළුල්ලේ එක් කරන ලද අගය එකතු කිරීම් මෙම වර්ධනයට හේතු විය.

### විදේශ මුදල් තැන්පතු

අපගේ විදේශ මුදල් නිපැයුම වන එතෙර ඉසුර මගින් අත්කරගත් සාර්ථකත්වය සමග ඉදිරියට යමින් 2012 - අනේවාසික විදේශ මුදල් වාසනා ප්‍රවර්ධනාත්මක ව්‍යාපාරය හා රක්ෂණ යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද්දේ විදේශයන් හි

වෙසෙන ශ්‍රී ලාංකිකයන් අතර අපගේ අනේවාසික විදේශ තැන්පතු නිපැයුම් පිළිබඳ දැනුවත් බව තවදුරටත් වැඩි කරමින් හා අප ගේ විදේශ මුදල් ඉතුරුම් තැන්පතු පදනමෙහි වර්ධනයක් අත්කර ගනිමිනි.

### ලොව පුරා හවුල්කරුවන් හා නියෝජිතයන්

විදේශයන්හි වැදගත් ස්ථානවල, මූලික වශයෙන්ම මැද පෙරදිග කලාපයේ, කුසලතා පූර්ණ හා පළපුරුදු කණ්ඩායම් සාමාජිකයන් වැඩි වැඩියෙන් යෙදවීම අපි අඛණ්ඩව සිදු කළෙමු. ජාත්‍යන්තර බැංකු හා විදේශ විනිමය සමාගම් සමග නව ගනුදෙනු වැඩපිළිවෙලවල් ඇතිකර ගැනීමට ද පියවර ගැනෙමින් පවතින අතර එමගින් ලොව පුරා අපගේ හවුල්කරුවන් සමග සබඳතා ශක්තිමත් කෙරෙන අතරම, බැංකුවේ විදේශ ජාලය තවදුරටත් ව්‍යාප්ත වී පුළුල් වනු ඇත.

### වෙස්ටර්න් යුනියන්

පුරෝගාමී තාක්ෂණයන් හා අලෙවි උපායමාර්ග යොදාගැනීමෙන් අපි ගනුදෙනුකාර භවතුන්ට විශිෂ්ට සේවය ලබාදීමේ අපේ දර්ශනය නිරන්තරයෙන් තහවුරු කරන්නෙමු. ග්‍රාමීය හා නාගරික යන දෙවර්ග යේම ප්‍රදේශ කරා ව්‍යාප්ත වෙමින්, වඩාත් ප්‍රවේශය සහිත බව හා කාර්යක්ෂම බව අතිශයින් ම විහිදුනු ශාඛා ජාලය මගින් තවදුරටත් තහවුරු කරන ලද, පුළුල් වෙස්ටර්න් යුනියන් ගෙවීම් හා ගෙවීම් මධ්‍යස්ථාන ජලාය සමග වර්ධනය කර ගෙන ඇති අප ගේ සබඳතාව මගින් මෙය පැහදිලිව නිරීක්ෂණය කළ හැකිය. පසුගිය වසර හා සැසඳූ කල වෙස්ටර්න් යුනියන් ගෙවීම් කළඹෙහි සුවිශාල වර්ධනයක් මෙහි ප්‍රතිඵලය වී ඇත.

## දේශීය ණය

### තිරසාර වර්ධනය වෙනුවෙන් විශේෂ ප්‍රයත්නයක් දැරීම

බැංකුවේ ලාභදායක බවට දායකවන අතර හා ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර අපගේ උපාය මාර්ගික දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා පෙරට යන අතිශයින්ම විවිධාංග කෘත අපගේ ණය කළඹ කෘෂිකර්ම, නිෂ්පාදන සේවා හා අනෙකුත් සම්ප්‍රදායික නොවන අංශ ඇතුළත් විවිධ ක්ෂේත්‍ර වෙත ව්‍යාප්ත වූ ගුණාත්මක ඉදිරි පියවර ප්‍රදර්ශනය කරයි. කර්මාන්තයෙ හි සම්මතයන් ට වඩා සැලකිය යුතු ලෙස පහත මට්ටමක වන අඩු අක්‍රිය ණය අනුපාතයක් රඳවාගැනීම ට හා බැංකුවේ ණය අවදානම් නිරාවරණය අඩු කිරීමට මෙය අපට හැකියාව ලබා දී ඇත.

ලාභ ලැබීම ට පමණක් නොව රාජ්‍ය බැංකුවක් ලෙස අපගේ බරපතල වගකීමක් ලෙස සලකන සමාජ සංවර්ධනයද ඉලක්ක කරමින් වෙනස්වීමට භාජනය වන ගනුදෙනුකාර භවතුන්ගේ අවශ්‍යතා හා ව්‍යාපාරික පරිසරයට ඔබින පරිදි අපි වර්ෂය තුළ දී නව ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර පවතින යෝජනා ක්‍රම සංශෝධනය කළෙමු. සමාජ අභිවෘද්ධිය සඳහා රජයේ අභිලාෂයන් ඉටු කිරීමේ වගකීම අප වෙත පැවරී ඇති අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව රජයේ සේවකයන් වෙනුවෙන් සහනදායක කොන්දේසි යටතේ නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම මෙන්ම මාධ්‍යවේදීන් හා සංස්කෘතික හා කලා ක්ෂේත්‍රයන්හි නියැලී සිටින්නන් වෙනුවෙන් වාහන ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ද මගින් අප මෙහිලා අප ගේ උනන්දුව තවදුරටත් ප්‍රදර්ශනය කර ඇත.

අපනයනකරුවන්ට මෙන් ම අමුද්‍රව්‍ය හා යන්ත්‍රසූත්‍ර ආනයනය සඳහා සහාය වීම පිණිස වෙළඳ මූල්‍ය සම්පාදන පහසුකම් සැපයීමේ අවශ්‍යතාව, අපගේ ගාස්තු පාදක ආදායම වැඩිදියුණු කිරීම සඳහා ශක්තිමත් ක්‍රියාමාර්ගයක් වේ. ගනුදෙනුකාර භවතුන් ගේ අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි වෙළඳ මූල්‍ය පහසුකම් ව්‍යුහගත කිරීම ද ඇතුළත්වන සේවා මට්ටම වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් දැනුම හා මගපෙන්වීම සපයන පුහුණුවීම් අපි අඛණ්ඩවම අපගේ ශාඛා ජාලය කරා ව්‍යාප්ත කර ඇත. ඉදිකිරීම් වැනි වර්ධන කර්මාන්තවල දියුණුව සැලකූ කල සුරැකුම් ලිපි ඇතුළුව අනෙකුත් වක්‍ර පහසුකම්, අපගේ තැන්පතු පාදක ආදායම වැඩි කරගැනීමට සහාය වී ඇත.

කෙසේ වෙතත්, මූල්‍ය වෙළඳපල තුළ ඉහළ නගින පොලී අනුපාත හා අධික තරඟකාරිත්වය ඇතුළුව වර්ෂය මුළුල්ලේ විවිධ අභියෝග පැවතුණි.මෙහි ප්‍රතිඵලයක් ලෙස මිල සංවේදී ගනුදෙනුකාර භවුන්ට අසීරු තීරණ ගැනීමට සිදුවූ නමුත් පාර්ශ්වකරුවන් සමග අපගේ සබඳතා නිරන්තරයෙන්ම පෝෂණය කිරීම සහතික කිරීම කෙරෙහි අපගේ දැඩි අවධානය හේතුවෙන් ළඇති විය හැකිව තිබූ කවර හෝ නිෂේධාත්මක බලපෑම් සමනය කර ගැනීමට බැංකුවට හැකි විය. කළමනාකරණ තොරතුරු පද්ධතිය මගින් වඩාත් කලට වේලාවට තොරතුරු ලබාගැනීමට පෙළගස්වන ලද ණය නිර්මාණ හා නඩත්තු ක්‍රියාවලිය උත්ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලියෙහි අපි යෙදී සිටින අතර, එය නිසැකවම අපගේ තීරණ ගැනීමේදී වැඩි පැහැදිලිබව, නිරවද්‍යතාව හා වේගය අත්කර දෙනු ඇත.

> 2011 තුළදී රට තුළට ආමුඛ ප්‍රේෂණ ප්‍රමාණය 34.4% ක සුවිශේෂී වර්ධනයක් පෙන්නුම් කළේය.

සමස්ත බැංකුව තුළ දැනුම ලබාගැනීමේ සංස්කෘතියක් ජනප්‍රිය කරවීමේ අපගේ ප්‍රයත්නයට අනුව ජ්‍යෙෂ්ඨ ණය නිලධාරීහු හා සබැඳි කණ්ඩායම් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂඥයන්ද ඇතුළුව බාහිර විශේෂඥයන් විසින් මෙහෙයවනු ලබන පුහුණු හා සංවර්ධන වැඩසටහන් තුළට නිරන්තරයෙන් සහභාගි වෙති. ගුණාත්මක අත්තිකාරම් ප්‍රදානය මගින් ණය කළඹ වර්ධනය කිරීමේ අපගේ උපායමාර්ගික අරමුණ සාක්ෂාත් කරගන්නා අතරම මනා විවිධාංගකෘත කළඹක් හරහා අවම අවදානමක් සහිතව බැංකුවේ වත්කම් ශක්තිමත් කිරීම පිණිස ගනු ලබන ප්‍රයත්නයන්ට මෙය පහසුකම් සලසා ඇත.

## ආයතනික බැංකුකරණය

රටේ සෑම කාණ්ඩයකටම අයත් ගනුදෙනුකාර හවතුන් සැබවින්ම ඇතුළත් කරගන්නා බැංකුවු වීමේ මූලධර්මය සමග, රජය සතු වාණිජ බැංකුවක් ලෙස ආයතනික හා වාණිජමය වශයෙන් ශක්‍ය රජයේ ආයතන යන දෙවර්ගයම වෙනුවෙන්ම සැලසුම් කරන ලද පුළුල් පරාසයක වන නිපැයුම් හා සේවා විශාල සංඛ්‍යාවක් අප හැමවිටම සපයා ඇත. ප්‍රමුඛ පෙළේ සමාගම් වල සිට බහු ජාතික සමාගම්ද විශාල හා මධ්‍ය පරිමාණ පෞද්ගලික අංශ ආයතනද දක්වා, ආයතනික බැංකුකරණය බැංකුවක අරමුදල් සාධාරණ ලෙස බෙදා හරින අතරම ලාභ ලැබීම සඳහා සැලකිය යුතු මට්ටමින් දායක වේ. කෙසේ වෙතත්, රජයේ කඩිනම් සංවර්ධන සැලසුම ක්‍රියාත්මක වන වර්තමාන පසුබිම තුළ, මහින්ද චින්තන ආර්ථික සංවර්ධන සැලසුම හා අනුකූල වන යටිතල පහසුකම් ව්‍යාපෘති, අපනයන, ආනයන, ආදේශක කර්මාන්ත හා විනෝදාත්මක සේවා අංශය ඇතුළත් කරගන්නා ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් වල යෙදී සිටින විශාල පෞද්ගලික අංශ සේවාදායක පිරිස් සමග හවුල්කාරිත්වය කෙරෙහි බැංකුව වැඩි අවධානය යොමු කරයි.

මෙම වර්ෂයේ ආයතනික බැංකුකරණය බැංකුවේ ලාභදායක බව කෙරෙහි රු. බිලියන 1.2 කින් දායක විය. විදේශ විනිමය (FOREX) ආදායම සමග මුළු අරමුදල් නොවන ආදායමෙන් 80% මෙයට ඇතුලත් නොවේ. අරමුදල් නොවන කළඹට අමතර ව රු. මිලියන 178 ක සමස්ත ණය කළඹ රු. බිලියන 124 ක කළඹකින් මුළු ආදායමෙන් ආසන්න වශයෙන් 80% ක් ජනනය කරයි.

ව්‍යාපෘති ණය දීම, හවුල් ණය හා භාරකාර සේවා එනම් වෙළඳ මූල්‍ය, ජාත්‍යන්තර බැංකු කටයුතු හා උපදේශක සේවා ආයතනික බැංකුකරණ, පැකේජ තුළ අඩංගු වේ. ආයතනික බැංකු ඒකකය මෙම වසරේ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇති අතර එයට ප්‍රධාන හේතුව මූලික වශයෙන් ම රජය විසින් මෙහෙයවන මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති වේ. යටිතල පහසුකම්, මාර්ග සංවර්ධන හා ජල ව්‍යාපෘතිවල ආසන්න වශයෙන් රු. බිලියන 22 ක් ආයෝජනය කරන ලදී. ජාතික සංවර්ධන ව්‍යාපෘති ඇතුළුව රාජ්‍ය අංශයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වලින් ආසන්න වශයෙන් 25% ක් වෙනුවෙන් බැංකුව අරමුදල් සැපයුවේ ය.

පිළිවෙලින් බෙල්ජියම් හා ඉන්දියානු මූල්‍ය සහාය සහිතව ක්‍රියාත්මක කෙරෙන කොලොන්න-බලංගොඩ හා මහ දඹුල්ල ජල ව්‍යාපෘති සඳහා එකම බැංකුව වීම සහ අනුරාධපුර-ත්‍රිකුණාමලය, නාරම්මල-ගිරිඋල්ල, කටුවන-අළුපොත්දෙනිය සහ ඉබ්බාගමුව-කුඹුක්ගැටේ ප්‍රධාන මාර්ග සංවර්ධනය සඳහා අරමුදල් සපයන එකම හවුල්කරුවා වීම අපට ඉමහත් ගෞරවයකි.

රජයේ පොහොර ආයතන දෙකකට මූල්‍ය සහාය සපයමින් රජයේ පොහොර සහනාධාර වැඩසටහනට දායකත්වය සපයන එකම බැංකු ආයතනය වන්නේ ආයතනික බැංකු ඒකක යි.

අරමුදල් ලෙස 50% සපයමින් රටේ ඛනිජතෙල් අවශ්‍යතාවන් කෙරෙහි දෙවැනි විශාලතම දායකත්වය සපයන්නා හා රජය සතු නැව් සේවා හා දුම්රිය සේවා වෙනුවෙන් මූල්‍ය සම්පාදනය සිදු කරන එකම ආයතනය වීමෙන් ජාතික සංවර්ධනයෙහි හවුල්කරුවෙකු ලෙස අපගේ කාර්යභාරය තවදුරටත් තහවුරු වී ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් එකම බැංකුව හා සුළං හා කුඩා ජල විදුලි බලාගාර හා ජෛව ස්කන්ධ ව්‍යාපෘති සඳහා අරමුදල් ලබාදීම ඇතුළුව බලශක්ති අංශය වෙත ප්‍රධාන දායකත්වය සපයන බැංකුවක් ලෙස අප අප ගේ සමස්ත ණය කළඹෙන් ආසන්න වශයෙන් 8% පමණ අරමුදල් සැපයීම හා වෙනත් මූල්‍ය ක්‍රියාකාකරම් සඳහා යොදවා ඇත. ගල් අඟුරු ආනයනය සඳහා වාර්ෂික ව රු. බිලියන 10 ක දායකත්වයක් දරා ඇති අතර එම සහාය ලබාදීම ඉදිරි වසරවල දී ද සිදු කෙරෙනු ඇත. අප, සෞඛ්‍ය හා ඖෂධ කර්මාන්තවලට දෙවන විශාලතම ණය ලබාදෙන්නා ලෙස පවතින බැවින් මෙම අංශ ද අප වෙතින් විශාල උත්තේජනයක් ලබයි.

## අක්වෙරළ බැංකුකරණ ඒකකය (OBU)

විශේෂයෙන් ම ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති ණයදීම් හා කාරක ප්‍රාග්ධන මූල්‍ය සම්පාදනය කෙරෙහි අවධානය කේන්ද්‍රගත කරමින් ණය ලබාදීමේ දී, මූලික වශයෙන් ම කාර්මික සංවර්ධනය කෙරෙහි දායක වෙමින් අප කරන මැදිහත්වීම් අතර ට ප්‍රතිව්‍යුහගත කිරීමට භාජනය වන සේවාදායකයන්ට ඒකාබද්ධ විදේශ සහයෝගිතා සඳහා දිරිගැන්වීම හා වෙනස් කරනු ලබන ව්‍යාපෘති හා ව්‍යාපාර වෙනුවෙන් උපදේශක සේවා ලබාදීම ඇතුළත් වේ.

අක්වෙරළ බැංකුකරණ ඒකකය මෙම වර්ෂයේ දී බැංකුවේ ලාභවල ට එ. ජ. ඩො. මිලියන 11.2 දායකත්වයක් ලබා දී ඇත.

මධ්‍ය කාලීනව ආර්ථිකය පෙරට ගෙන යාම සඳහා ප්‍රධාන කාර්මික අංශ කෙරෙහි රටේ අවධානය යොමු වී පවතිද්දී, මූලික වශයෙන්ම සංචාරක ව්‍යාපාරය හා ඒ ආශ්‍රිත කර්මාන්ත, පුනර්ජනනීය බලශක්තිය හා යටිතල පහසුකම් සංවර්ධන අංශ කෙරෙහි දැන් වැඩි අවධානය යොමු වේ. කෙසේවෙතත්, සමාජයේ සියල්ලන් ඇතුළත් කරගැනීමේ ජාතික සංකල්පය ද අවධානය ට ලක්ව පවතින අතර අප ගේ ශාඛා ජාලය හරහා අප කුඩා හා මධ්‍ය පරිමාණ අපනයන කරුවන් හා ග්‍රාමීය ආර්ථිකය නැංවීමට හේතුවන අන් කවර හෝ මූලාරම්භයන් දිරිගන්වන්නේ මෙම ව්‍යවසායකයන් අපගේ අනාගත ආයතනික සේවාදායකයින් ලෙස සංවර්ධනය කිරීමේ අභිලාෂයෙනි.

## සංවර්ධන හා ක්ෂුද්‍ර මූල්‍ය බැංකුකරණය

ඉතාමත් ආකර්ෂණීය බවට ඔප්පු වූ වර්ෂයක් තුළ මෙම ව්‍යාපාර ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ජයග්‍රහණ අත්පත් කර ගනිමින්, අතිශයින් තීව්‍ර තරඟකාරිත්වය තිබියදීත් සංවර්ධන මූල්‍ය සම්පාදනයේ දී ක්‍රියාත්මක කරන ලද උපාය මාර්ග රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයට තීරණාත්මකව දායක වන්නෙකු වීමට අපට අනුබලය සැපයුවේය.

## ප්‍රාදේශීය සංවර්ධනය

පිබිදෙන උතුර, පිබිදෙන නැගෙනහිර, පළාත් සංවර්ධන, කුඩා පරිමාණයේ වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් හා පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන හා සම්පත් කළමනාකරණ ණය යෝජනා ක්‍රම අදාළ භූගෝලීය ප්‍රදේශ ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලදී. ලිහිල් ඇප සහ සහන පොලී අනුපාත මත ණය ප්‍රදානය කරන ලද අතර, එය නියත වශයෙන්ම සාර්ථකත්වය ට හේතු විය. ප්‍රාදේශීය සම්පත් උපයෝජනය උපරිම මට්ටමට ගෙන ඒම, ග්‍රාමීය විරැකියාව අවම කිරීම හා ග්‍රාමීය දිළිඳුබව පිටුදැකීම සඳහා ද බැංකුව දායක වූ අතර වැඩිම ආර්ථික අභියෝගවලට මුහුණ දුන් පලාත් වලට ප්‍රමුඛතාව දෙමින් එම ප්‍රයත්නයන් ක්‍රියාත්මක කරන ලදී.

## දිළිඳුකම පිටුදැකීම

2012 දී ක්‍රියාත්මක කරන ලද දිළිඳුබව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය හා ඒ හා සබැඳි චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය ඔවුනොවුන් අතර ඇප මත ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා ණය බෙදා හැරීම සිදු කළේය. තම ආර්ථික සවිබල ගැන්වීම වැඩි දියුණු කරගත හැකි පරිණත දැනුම් තේරුම් ඇති කණ්ඩායම් සකසන අතර සමාජ සවලකරණය හා මූල්‍ය නොවන සේවා ලබාදීමේ විශිෂ්ට සංකල්පය කාවද්දමින් මූලික වශයෙන් ම කාන්තාවන් ඉලක්ක කරගෙන මෙම පහසුකම් ප්‍රජා කන්ඩායම් කරා ව්‍යාප්ත කරන ලදී.

## කාන්තාවන් සවිබල ගැන්වීම

කාන්තාවන් ගෘහ මූලිකයන් ලෙස සිටින පවුල්වල දිළිඳුකම පිටුදැකීමේ අරමුණින්, මූලික වශයෙන් ම ස්වාභාවික ආපදාවන්ගේ බලපෑමට ලක්වූ කාන්තාවන් වෙනුවෙන් වූ වනිතා නවෝදය ණය යෝජනා ක්‍රමය කාන්තාවන් සවිබලගැන්වීමේ සංකල්පය ව්‍යාප්ත කළේය. තමන්ගේ හා තම ලාබාල පවුල්වල තිරසාර සංවර්ධනය අත්කර ගැනීමට හැකියාව ලබාදෙමින් මෙම ණය යෝජනා ක්‍රමය හරහා අවතැන් වූ තරුණ වැන්දඹුවන් විශාල සංඛ්‍යාවකගේ ජීවන තත්ත්වය ඔසවා තැබීමට බැංකුව කටයුතු කිරීම සුවිශේෂී කරුණකි.

## කර්මාන්ත ප්‍රවර්ධනය

නව කර්මාන්ත ඇරඹීම හා දැනටත් පවතින කර්මාන්ත දියුණු කිරීම සඳහා නව මහජන කඩිනම් ණය යෝජනා ක්‍රමය සහ සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය මූල්‍ය පහසුකම් සපයන ලදී. පවත්නා ව්‍යාපෘති වලට වැඩි දියුණු කිරීම් කර ඒවා තිරසාර කරන අතරම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය නිර්මාණය මෙමගින් දිරිගන්වා ඇත. කර්මාන්තවල වර්ධනය හේතුවෙන් රැකියා උත්පාදන කිරීම හා එමගින් විරැකියාව අඩු කර ප්‍රාදේශීය මටටමේ දී ආදායම සාධාරණ ලෙස බෙදී යාම සහතික කිරීම හේතුවෙන් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමේ සුබ නිමිති හඟවන්නෙකු වන අතරම ග්‍රාමීය ආර්ථික ඉලක්ක සාක්ෂාත් කරගැනීම ද මෙය දිරිගැන්වූයේය.

## කෘෂි කර්මාන්ත සඳහා අගය එකතු කිරීම හා නවීකරණය

කෘෂි කර්මාන්ත නවීකරණය හා කිරි සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා විස්කම් ණය යෝජනා ක්‍රමය පහසුකම් සැපයුවේය. මෙම යෝජනා ක්‍රමයේ සුවිශේෂී අරමුණ වන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ගොවියා සංවර්ධනය කර එමගින් ව්‍යවසායකත්වය පිළිබඳ හැඟීම ඇති කර කෘෂි පාදක කර්මාන්ත තුළ අගය එකතු කිරීමේ මානය වැඩි දියුණු කිරීම වේ.

### ක්ෂුද්‍ර මූල්‍ය ගම්මාන වැඩසටහන

ගම්මානයේ පවතින සහජ කුසලතා හා දක්ෂතා වර්ධනය කරමින්, ව්‍යවසායකත්ව කණ්ඩායම් හා ස්වයං සංවර්ධන මූලාරම්භයන් ඇති කිරීමට හේතු පාදක වෙමින්, ප්‍රජා පාදක කණ්ඩායම් මත පදනම්ව 2012 දී ගම්මාන 245 ක් මෙම වැඩසටහනට ඇතුළත් විය.

> ප්‍රාදේශීය සම්පත් උපයෝජනය ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම, ග්‍රාමීය විරැකියාව අවම කිරීම හා ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම කෙරෙහි බැංකුව දායක වූ අතර එය ක්‍රියාත්මක කරන ලද්දේ වැඩිම ආර්ථික අභියෝගවලට මුහුණ දුන් පළාත්වලට ප්‍රමුඛතාව දෙමිනි.

### *කප්රුක නිමැවුම් දිරිය ණය යෝජනා ක්‍රමය*

2012 මැයි මස සිට පොල් සංවර්ධන අධිකාරිය සමග සහයෝගිතාවෙන් ක්‍රියාත්මක කරන ලද මෙම පහසුකම විදේශ වෙළඳපොළට ප්‍රවේශවීම සඳහා පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම ඉලක්ක කළේය. පොළී ආපසු ගෙවීමේ අංගයක් ද මෙම යෝජනා ක්‍රමයට ඇතුළත් වේ.

### පුනරුත්ථාපන ණය

ස්වයං රැකියා ව්‍යාපෘති ඇති කිරීමේ අරමුණින් ලබා දෙන මෙම මූල්‍ය පහසුකම්, පුනරුත්ථාපන අධිකාරිය මගින් මෙහෙයවෙන පුනරුත්ථාපන හා සමාජ සවලකරණය සම්පූර්ණ කිරීමෙන් පසුව සාර්ථකව පුහුණුව ලැබුවන් ගේ ජීවනෝපාය ඉහළ නැංවීම

ඉලක්ක කරයි. මෙම පහසුකම් ඉතාම සහනදායක පොළී අනුපාත සහිතව සැපයෙන අතර, ආදායම් උත්පාදනය කිරීමේ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් දියත් කිරීමේ උනන්දුව සහිත තරුණ තරුණියන්ට ආශිර්වාදයක් වී ඇත. උතුරේ හා නැගෙනහිර ශාඛා යටතට එන ප්‍රදේශවලට වැඩි වශයෙන් මෙම ණය ලබා දී තිබේ.

**වී තොග රැස් කිරීම සඳහා ගොවීන්ට පහසුකම්**

ගොවියාගේ ශ්‍රමය වෙනුවෙන් සාධාරණ හා යුක්තිසහගත මිලක් ලබාගනිමින්, ගොවීන් ගේ වී තොග වෙළඳපොළ මිල ගණන්වලට අලෙවි කෙරෙන බව සහතික කිරීම සඳහා මෙම පහසුකම ගොවීන් වෙතට ලබා දීම සිදු කෙරේ. වර්ෂය මුළුල්ලේම ප්‍රමාණවත් වී තොග ලබා ගත හැකි බව හා හිඟයක් ඇති නොවන බවද මෙයින් සහතික කෙරේ.

අප ගේ බුද්ධිමත් සැපයුම්කරුවන් විසින් වෙළඳපොළ වෙනස්වන ස්වභාවය හා ඉදිරි අඩිමිල වෙනස්කම් නිවැරදි ව අවබෝධ කරගැනීම හේතුවෙන් පසුගිය වසර තුළ විදේශ විනිමය ආදායම 76% කින් වර්ධනය විය.

**නියඟයෙන් පීඩවට පත් ගොවීන්ට සහන සැලසීම**

ඊළඟ කන්නයේ අස්වනු නෙලන තෙක් ගෙවීම් පමා කිරීමට ඉඩ සලසමින් බැංකුව 2012 නියඟය හේතුවෙන් වගාවන් හානියට පත්වූ ගොවීන්ට අත්‍යවශ්‍ය සහන ලබා දුන්නේය.

**කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම**

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පරිචයන් තුළට කාබනික, වඩාත් පරිසර හිතකාමී මූලාරම්භයන් එක් කරමින් වී වගාවේදී කාබනික පොහොර භාවිතයෙහි සක්‍රිය ලෙස යෙදී සිටින ගොවීන්ට මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදීම සිදු කෙරේ.

**දිවි නැගුම වැඩසටහන සඳහා වඩාත් පුළුල් විෂයපථයක් ඇති කිරීම**

නව කර්මාන්ත මෙන්ම සත්ව පාලනය හා ගෙවතු වගා සංවර්ධනය ඇතුළුව මෘදු කර්මාන්ත ව්‍යාපෘති පිහිටුවීම සමග මේ වර්ෂයේදී දිවි නැගුම වැඩසටහන වඩාත් පුළුල් කරනු ලැබේ. ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශවල කෘෂිකර්මය පාදක සංවර්ධනයේදී ජීවන තත්ත්ව වැඩි දියුණු කිරීම කෙරෙහි පැහැදිලිව දැකිය හැකි බලපෑමක් ඇති කරමින්, මෙය නිසැකවම රජයේ දිවිනැගුම යෝජනා ක්‍රමය යටතේ ගන්නා ලද වඩාත්ම ප්‍රවේශය ලබාදෙන හා ප්‍රායෝගික මූලාරම්භයන් අතරින් එකකි.

## සමූපකාර අංශය

අතිශය වැදගත් මෙම වාණිජ අංශය සංවර්ධනය කිරීම කෙරෙ හි වැඩි අවධානයක් යොමු කරන ලදුව මෙම වර්ෂයේ සමූපකාර ව්‍යාපාරය අතිරේක ජවයක් ලබා ගත්තේය. කෝප් සිටි ව්‍යාපෘතිය යටතේ ගනුදෙනුකාර භවතුන් වඩාත් හොඳින් දැනුවත් කිරීම ට හා ඔවුන්ට වඩා හොඳ සේවා පහසුකම් සැපයීම ට සහනදායී පොළී අනුපාත මත දිගුකාලීන හා කෙටිකාලීන මූල්‍ය පහසුකම් සමූපකාර සමිති වෙත ලබා දෙන ලදී. සමූපකාර සමිතිවල සේවය කරන කණ්ඩායම් සාමාජිකයන් පුහුණු කිරීම සඳහා අරමුදල් සම්පාදනය මගින් මෙය තවදුරටත් ශක්තිමත් කෙරිණි.

සන්නාම ප්‍රතිරූපය හා තත්ත්වය වැඩි දියුණු කිරීමට දායක වූ ජාත්‍යන්තර සමූපකාර සම්මේලනය හා ජාත්‍යන්තර සමූපකාර දිනය සඳහා බැංකුව අනුග්‍රාහකයෙකුද විය.

සමූපකාර ව්‍යාපාරය තවදුරටත් සංවර්ධනය කිරීමේදී, ව්‍යාපාරයට නවෝදයක් එක් කරමින් හා වඩාත් කාර්යක්ෂම සේවාවක් ගනුදෙනුකාර භවතුන්ට ලබා දීමට අවශ්‍ය ගතිකයන් කාවද්දමින් සමූපකාර ග්‍රාමීය බැංකු නවීකරණය සඳහා ප්‍රදාන ලබා දෙන ලදී.

**කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකුකරණය**

මෙයට පෙර ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවල දී වර්ධනය පෙරට ගෙන යන යන්ත්‍රය ලෙස අර්ථ දක්වා ඇති නැගී එන ආර්ථිකයක වඩාත් ම වැදගත් වර්ධන අංශයක් ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය දිගින් දිගටම පිහිටුවනු ලැබ සිටී. ජාතික අවශ්‍යතාවන් හා පෙළගැසී බැංකු ප්‍රධාන කාර්යාලයේ පිහිටි සම්බන්ධීකරණ ඒකකයකින් මෙහෙයවනු ලැබෙන විශේෂ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන 24 පිහිටුවීම මගින් බැංකුව උපායමාර්ගික යාන්ත්‍රණයක් සකස් කොට ඇත. අගය එකතු කිරීමේ ව්‍යවසායන් සඳහා මූල්‍ය විසඳුම් ලබා දෙනවා පමණක් නොව මූල්‍ය වශයෙන් ඇතුළත් කර නොගන්නා ව්‍යවසායකයන් වෙනුවෙන් මූල්‍ය නොවන සේවා සැපයීම ද මෙම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන ඉටු කරයි. දැනට පවතින අධික පිරිවැය ණයගැනීම් පරිසරය අනුව ගත් කළ, ප්‍රතිමූල්‍යකරණ වැඩපිළිවෙළවල් හා බැංකුවේ ම අරමුදල් යොදාගනිමින් සහනදායක ණය යෝජනා ක්‍රම ඉදිරිපත් කෙරේ. ණය තක්සේරු නිලධාරීන් හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ව්‍යාපාරය ට සම්බන්ධ නිලධාරීන් අඛණ්ඩව දේශීය හා විදේශීය පදනමින් විශේෂයෙන් ම පුහුණු කරනු ලැබේ.

මිත්‍රශීලී, පිරිවැය ඵලදායක හා අගනා මූල්‍ය විසඳුම් සපයමින් ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වඩාත් විශ්වාසය දිනූ 'මූල්‍ය සේවා සපයන්නා' ලෙස බැංකුවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය යළි ස්ථානගත කිරීම සලකා බලමින් අප දැනට අපගේ සමස්ත කු.හා.ම.ප.ව්‍ය. උපායමාර්ගය විශ්ලේෂණය කරමින් සිටින්නෙමු.

## භාණ්ඩාගාරය

වර්ෂය තුළ දී අත්දකින ලද ගෝලීය අස්ථාවරබව හා වෙනස්වන සුළු වෙළඳපොළ තත්ත්වයන් සමග අතිශයින් ම අභියෝගාත්මක පරිසරයක ක්‍රියාත්මක වෙමින් භාණ්ඩාගාර ඒකකය 2012 දී අත් කරගත් කාර්යසාධනය, විදේශ විනිමය වෙළඳාම තුළින් ලැබූ සුවිශේෂී ලාභය මගින් කැපී පෙනුණි. අපගේ බුද්ධිමත් සැපයුම්කරුවන් විසින් වෙළඳපොල වෙනස්වන ස්වභාවය හා ඉදිරි අධිමිල වෙනස්කම් නිවැරදිව අවබෝධ කරගැනීම හේතුවෙන් පසුගිය වසර තුළ විදේශ විනිමය ආදායම 76% කින් වර්ධනය විය.

ණය වර්ධනය හේතුවෙන් වූ සාධනීය වෙළඳ පරිමාව මත පදනම්ව ස්ථානීය හා ඉදිරි වෙළඳපොළවල් යන දෙකෙහි දී ම එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. මුදල් යුගලයෙහි වෙළඳපොළ තනන්නකු ලෙස අපගේ තත්ත්වය භාණ්ඩාගාරය තවදුරටත් ශක්තිමත් කළේය. තරඟකාරී මිල ගණන් ආනයනකරුවන් හා අපනයනකරුවන් වෙත ලබා දෙමින් එමගින් කැපී පෙනෙන ව්‍යාපාර පරිමාවක් ආකර්ෂණය කර ගනිමින්, පාරිභෝගික තත්ත්වයන් අත් කර ගැනීම සඳහා මිල නියම කිරීමේ වාසි පරිවර්තනය කරගැනීමට මෙය අවස්ථාව ලබා දුන්නේය.

ප්‍රාග්ධන ලාභ හා පොළී ඉපයීම් මගින් අපගේ ණය වෙලඳාම් ව්‍යාපාරය තුළින් සැලකිය හැකි ආදායමක් ලබා ගැනිණි. ස්ථාවර උද්ධමන අනුපාතය හේතුවෙන් වර්ෂය තුළ දී වෙළඳපොළේ පොළී අනුපාත ව්‍යුහය වෙනස් වූ බැවින්, වෙළඳ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර කළඹ කැපී පෙනෙන ප්‍රාග්ධන ලාභ උත්පාදනය කළේය. භාණ්ඩාගාර කාර්ය මණ්ඩලයේ විශේෂඥභාවය හා පළපුරුද්ද යොදා ගනිමින් වෙළඳපොළ තත්ත්වය නිවැරදිව අවබෝධ කරගෙන සුදුසු අවස්ථාවේ දී වෙළඳපොලට පිවිසීමට උත්පාදනය කරන ලද මෙම සුවිශේෂී ආදායමට දායක විය. ශ්‍රී ලං. රු. ඵලදා වක්‍රයේ වෙනස්වීම් මත ප්‍රශස්ථ ප්‍රතිඵල අත්කර ගැනීම පිණිස වරණීය උපාය මාර්ග යොදා ගන්නා ලදී.

2012 ජූලි මස දී දියත් කරන ලද බ්ලූම්බර්ග්ගේ FIQ වෙළඳ ප්‍රතිපත්තිය මත ඉහළ වෙළඳ පරිමාව සතු වීමෙන් අප ගේ ප්‍රාථමික වෙළඳ ඒකකය කීර්තිය අත් කරගත්තේය.

සිය ණය ව්‍යුහගත කිරීමේ ක්‍රියාකාරකම් ශක්තිමත් කරගත් ආයෝජන බැංකුකරණ ඒකකය, බැංකුව වෙත කැපී පෙනෙන ගාස්තු ආදායමක් ලබාදුන් සුරැකුම් හා වෙළඳ පත්‍රිකා මගින් 2012 දී රු. බිලියන 8 ඉපයුවේය. මෙම අවකාශය තුළ ආයෝජන බැංකුකරණ ඒකකය සැලකිය යුතු වෙළඳපොළ කොටසක් අත් කරගෙන ඇති අතර, ආයතනික ණය නිකුත් කරන්නන් හා ආයතනික ආයෝජකයන් සැලකිය යුතු සංඛ්‍යාවක් වෙනුවෙන් ගනුදෙනු අවසන් කර ඇත. තවද, 2012 ජූලි මස දී ශ්‍රී ලංකා රජයේ ඇ.එ.ජ.ඩො. බිලියන 1 ක රන් බැඳුම්කර නිකුතුවේදී මුල්පෙලේ ජාත්‍යන්තර ආයෝජන බැංකු හතරක්, එනම් මෙරිල් ලින්ච් ඇමෙරිකානු බැංකුව, බාක්ලේස් කැපිටල්, සිටිබෑන්ක් හා HSBC, සමගම ආයෝජන බැංකුකරණ ඒකකය ද සම කළමනාකරුවෙකු ලෙස කටයුතු කිරීමට තෝරා ගන්නා ලදී.

ආකර්ෂණීය මිල ගණන්, ආයෝජකයන් සංඛ්‍යාව හා පෙර නොවූ විරූ පමණ ඉක්ම වූ ඉල්ලුම හේතුවෙන් මෙම නිකුතුව මෙතෙක් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද හොඳම නිකුතුව ලෙස වාර්තා වී ඇත.

වෙළඳාම මගින් සැලකිය යුතු පොළී ආදායමක් හා ප්‍රාග්ධන ලාභ ලබාගැනීමට උපකාරී වී ඇති ණය සුරැකුම්පත් කළඹක් නිර්මාණය කිරීම සඳහා ආයෝජන බැංකුකරණ ඒකකයට අනුමැතිය ලැබී තිබේ. තැන්පතු ඒකරාශී කිරීම පමණක් බැංකුවේ වර්ධන සැලසුම් ඉදිරියට ගෙන යාම සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් එම කාර්යය සඳහා ප්‍රමාණවත් අරමුදල් සැපයීමේ දී භාණ්ඩාගාරය වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. ඉතා තරඟකාරී මිල ගණන්වලට මූල්‍ය ආයතන හරහා දේශීය හා විදේශීය අරමුදල් ලබාගැනීම බැංකුව අඛණ්ඩව සිදු කළ අතර එය සමස්ත ලාභදායක බවට සාධනීය තත්ත්වයක් විය.

අපගේ සේවාදායකයන්ට ඔවුන් ගේ අවශ්‍යතාවන්ට අනුව සැකසුණු විසඳුම් ලබාදීමේ අපගේ ශක්තිය තවදුරටත් වඩි දියුණු කරමින් අපගේ සේවා සැපයුම වර්ධනය කිරීම පිණිස අති නවීන සමෝධානික භාණ්ඩාගාර පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී.

වසර ගණනක් මුළුල්ලේ තියුණු නුවණින් යුතුව තාක්ෂණයෙහි අප කරන ලද ආයෝජන, ඕනෑම වේලාවක ඕනෑම තැනක පහසු, කාර්යක්ෂම, ප්‍රවේශය සහිත සෑම අංශයකටම විහිදුණු සහ කරදරයෙන් තොර බැංකු කටයුතුවල යෙදීමට තාක්ෂණයෙන් පිරිපුන් නිපැයුම් අපගේ ගනුදෙනුකාර භවතුන්ට ලබාදීමට අද අපට හැකියාව ලබා දෙයි.

## තොරතුරු තාක්ෂණය

මධ්‍යගත අන්තර්ජාල ශාඛා ජාලය පිළිබඳ සංකල්පය තවදුරටත් ඉදිරියට ගෙන යමින් බැංකුව සේවා මධ්‍යස්ථාන හයක් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක ශාඛා තත්ත්වයට උත්ශ්‍රේණිගත කළ අතර ඉතා වැදගත් ස්ථානවල නව සේවා මධ්‍යස්ථාන 15 විවෘත කරන ලදී. මෙසේ කරන ලද නව එක් කිරීම් සමග ගනුදෙනුකාර භවතුන් වෙනුවෙන් සේවා සපයන මුළු මධ්‍යස්ථාන සංඛ්‍යාව 728 ක් වේ.

අඛණ්ඩ ඉල්ලුම වෙනුවෙන් පහසුකම් සැලසීම උදෙසා බැංකුව මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයට යන්ත්‍ර 420 ක් අයත් වන පරිදි තවත් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හතළිහක් පමණ එක් කළ අතර ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මාරු කිරීම සහිත අති නවීන බහුකාර්ය කාඩ්පත් කළමනාකරණ පද්ධතියක් තක්සේරු කිරීමේ ක්‍රියාවලියෙහි යෙදී සිටි. 2013 දී සක්‍රිය වීමට නියමිත පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මාරුවේ නියමු අදියර ට එක් වීම ට ද අපි තීරණය කළෙමු.

මහජන බැංකු ජාත්‍යන්තර වීසා කාඩ්පතට අගය එකතු කරමින් විදේශ රැකියා අමාත්‍යාංශය හා ඒකාබද්ධ ව බැංකුව විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් ම විශේෂයෙන් පෙර සකසන ලද කාඩ්පතක් නිකුත් කළේය. අනේවාසික විදේශ මුදල් ගනුදෙනුකාර භවතුන්ට ද හර කාඩ්පතක් මගින් කවර හෝ දේශීය හෝ ජාත්‍යන්තර ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් හෝ වීසා මර්චන්ට් අවුට්ලට් භාවිතා කරමින් මුදල් ආපසු ගැනීම හෝ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සිදු කළ හැකිය.

මෙම වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද තවත් කැපී පෙනෙන ජයග්‍රහණයක් වන්නේ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) භාවිතා කරමින් ඊළඟ ව්‍යාපාර දිනයේ දී ම තැන්පත් කරන ලද සියළු චෙක්පත් මුදල් කිරීම් හැකියාව ලබා දෙන පරිදි දැන් ඕනෑම ශාඛාවකට ප.ව. 5.30 වන තෙක් චෙක්පත් තැන්පතු භාරගැනීමට හැකි වීමයි. මෙය අප විසින් හඳුන්වා දෙන ලද තවත් අගය එකතු කිරීමක් වන බහුවිධ කාණ්ඩ ක්‍රියාවලි සඳහා ද පහසුකම් සපයයි.

ශ්‍රී ලංකාවේ SWIFT භාවිතා කරන්නන්ගේ කණ්ඩායම (SWIFT User Group of Sri Lanka) වෙතින් අප ගේ කණ්ඩායම ලත් පරිපූර්ණ පුහුණුව මගින් බොහෝ සෙයින් පහසුකම් සලසන ලදුව, 2012 මාර්තු මස දී SWIFT Alliance Release 07 සන්ධානයට සංක්‍රමණය වීම ක්‍රියාත්මක කරන ලදී. මෙයට පෙර සමාන්තර ක්‍රියාකාරිත්වයෙන් ලද සාර්ථකත්වය ද සමග අපි පෙබරවාරි මාසයේ දී භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය සාර්ථකව ආරම්භ කළ අතර දැන් එය බැංකුවේ හර බැංකුකරණ පද්ධතිය (SIBS) සමග පූර්ණ ලෙස සමෝධානය කරනු ලැබ ඇත.

අපගේ කාඩ්පත් මධ්‍යස්ථානයේ ස්වයංක්‍රීය කුඩා ඇමතුම් මධ්‍යස්ථානයක් සකස් කර ක්‍රියාත්මක කිරීම, අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ කණ්ඩායමට ප්‍රශංසාව හිමි විය යුතු තවත් ජයග්‍රහණයකි. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මාරුව සහිත කාඩ්පත් කළමනාකරණ පද්ධතිය, ආයතනික ගනුදෙනුකාර භවතුන් සඳහා වන අන්තර්ජාල බැංකු පද්ධතිය හා දත්ත ගබඩා හා ව්‍යාපාර තොරතුරු පද්ධතිය, වර්ෂය තුළ ක්‍රියාත්මක කර 2013 දී පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමට නියමිත අනෙකුත් තීරණාත්මක ව්‍යාපෘති වේ.

ශ්‍රී ලංකා මහ බැංකු නියමයන්ට අනුකූලව POS යන්ත්‍ර 200 ක් දැන් පර්යන්ත රැහැන් කේතනය (Terminal Line Encryption) සහිත අතර ඉතිරිය 2013 මාර්තු වන විට සම්පූර්ණයෙන් ම සමෝධානය කෙරෙනු ඇත.

2013 වන විට, මහ බැංකුව හා සේ.අ.අ. දෙපාර්තමේන්තු ව සමග ඒකාබද්ධව සකස් කරන ලද ව්‍යාපෘතියක් මත අන්තර්ජාලය මගින සේ.අ.අ. ගෙවීම් සඳහා පහසුකම් සලසන අගය එකතු කළ සේවාවක් ආයතනික සේවාදායකයන් වෙත සැපයෙනු ඇත. මෙම අන්තර්ජාලය මගින් ගෙවීමේ පහසුකම, ශ්‍රී ලංකා රේගුව සමග ඒකාබද්ධව සකස් කරන ලද ව්‍යාපෘතියක් මගින් රේගු බදු අන්තර්ජාලය මගින් ගෙවීම තෙක් ව්‍යාප්ත කෙරෙනු ඇත. අපි අපගේ මුදල් විශුද්ධිකරණයට එරෙහි ක්‍රමය ද තෝරාගත් අතර මෙම AMS ක්‍රමය 2013 දී ද යෙදවීමට නියමිතය.

## පර්යේෂණ

පර්යේෂණ නැඹුරුවක් සහිත නවීකරණය හා තොරතුරු රැස්කිරීම, බැංකුකරණ කර්මාන්තයේ තිරසාර වර්ධනය සඳහා කැපී පෙනෙන ලෙස දායක වන කරුණු වේ.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික කළමනාකාරිත්වය සහ අනෙකුත් අභ්‍යන්තර පාර්ශ්වකරුවන් වෙත නිවැරදි, කාලීන හා කර්මාන්තයට විශේෂිත නිමැවුම් සැපයීමෙන් පර්යේෂණ අංශය ව්‍යාපාරයේ ප්‍රගතියට ඉමහත් රුකුලක් වේ. අංශ හා කර්මාන්ත විශ්ලේෂණය, වෙළඳපොළ අධ්‍යයන, ගනුදෙනුකාර භවතුන් පිළිබඳ සමීක්ෂණ, තරගකරුවන් විශ්ලේෂණය යනාදී ආකාරයෙන් ප්‍රධාන වශයෙන්ම කර්මාන්ත හා ආර්ථිකයේ අනෙකුත් උප කොටස්, ව්‍යාපාර, බැංකුකරණ නිපැයුම්, ශාඛා ජාල, ගනුදෙනුකාරභවතුන්ට සේවා හා තරගකරුවන් සම්බන්ධයෙන් මෙම අංශය මගින් මෙහෙයවනු ලබන පර්යේෂණවල ප්‍රතිඵල පර්යේෂණ වාර්තා, අධ්‍යයන පත්‍රිකා, පවත්නා තත්ත්වය පිළිබඳ ලේඛන, කළමනාකරණ දැනුවත් කිරීමේ ලේඛන හා අනෙකුත් අදාළ ලිපිලේඛන මගින් බැංකුවේ කළමනාකාරිත්වය වෙත බෙදා හරිනු ලැබේ.

### ආර්ථික සමාලෝචනය

සංවර්ධන දිශානතියක් සහිත පර්යේෂණ මත පදනම් වූ විද්‍යාත්මක හෙළිදරව් කරගැනීම්, නවීකරණයන් හා අත්දැකීම් දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ඉදිරිපත් කිරීමේදී වඩාත් වැදගත් හා ඵලදායක මෙවලම් අතරින් එකක් වන්නේ මුල් පෙළේ, සංවර්ධන දිශානතියක් සහිත, අර්ධ-අධ්‍යයන, සමාජ ආර්ථික සඟරාවක් වන ඉකොනොමික් රිවීව් (Economic Review) සඟරාවයි. 1975 සිට දශක 3 1/2 ඉක්මවූ කාල පරිච්ඡේදයක් මුළුල්ලේ පර්යේෂණ අංශය මගින් මෙය ප්‍රකාශයට පත් කර ඇති අතර ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධනය කරා බැංකුවේ දායකත්වය ලෙස මෙන්ම තිරසාර දැනුම විසුරුවා හරින ආයතනික සමාජ වගකීම් (CSR) ව්‍යාපෘතිය ලෙස මහා ස්ථාවර තත්ත්වයක පවතී.

කාලීන වැදගත්කමක් ඇති බවට සැලකෙන විවිධ ජාතික හා අන්තර්ජාතික සමාජ හා සංවර්ධන ගැටළු හා අභියෝග සම්බන්ධ තොරතුරු සහිතව අදාළ විශේෂඥයන් විසින් රචිත විශේෂඥ තීරු ලිපි, සම්මුඛ සාකච්ඡා, ග්‍රන්ථ සමාලෝචන හා සිසු පිටුවක් ඉකොනොමික් රිවීව් සඟරාවට ඇතුළත් වේ. කාලීන තේමාවක් සම්බන්ධයෙන් විශේෂ වාර්තාවක් ආකාරයට ඉදිරිපත් කෙරෙන පරිපූර්ණ විශ්ලේෂණයක් සඟරාවේ සෑම ප්‍රකාශනයකම අඩංගු වේ. 2012 අයවැය, සාධාරණත්වය සහිත වර්ධනය, විනිමය අනුපාතිකය, විද්‍යාව හා තාක්ෂණය, ආයතනික පාලනය හා ආර්ථිකයෙහි කාන්තා සහභාගිත්වය යන තේමා මත ප්‍රකාශන හයක් මෙම වර්ෂය තුළ දී එළි දක්වන ලදී.

# අලෙවි හා ප්‍රවර්ධන

## වනිතා වාසනා මාසය

ශ්‍රී ලංකාවේ කාන්තාවන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද දිරිගැන්වීම සඳහා හා ඔවුන්ගේ මූල්‍ය ධාරිතාව වඩාත් ශක්තිමත් කිරීම සඳහා මහජන බැංකුව මාර්තු 8 වැනි දින හා අප්‍රේල් 8 වැනි දින අතර කාලසීමාව, ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම අනුව පෙළගස්වා වනිතා වාසනා මාසය ලෙස හඳුන්වයි. මෙම කාලපරිච්ඡේදය තුළ සියළු වනිතා වාසනා ගිණුම්වලට ඉතිරිකිරීම් දෙගුණ වන අතර අමතර ප්‍රසාද දීමනාවක් ලෙස, විවිධ මුදල් ඒකකවලින් ඉතුරුම් රිසිට්පත් හඳුන්වා දෙනු ලැබ ඇත. මෙම රිසිට්පත් විශේෂ දිනුම් ඇදීමකට ලක් කෙරෙන අතර ජයග්‍රාහී රිසිට්පතට එහි සඳහන් මුදල ත්‍යාග මුදල ලෙස හිමි වේ. මෙම ගිණුමට වෙළඳපළ අනුපාතය ට වඩා වැඩි පොළී අනුපාතයක් ද අදාල වන අතර උපචිත පොලිය ස්වයංක්‍රීයව ගිණුමට මාරු කරනු ලැබේ. වනිතා වාසනා මාසය අතරතුරදී, මාසිකව හා වාර්ෂිකව ඉතා ආකර්ශනීය ත්‍යාග ලබා දෙන දිනුම් ඇදීමක් වන ජයශ්‍රී දිනුම් ඇදීමට ඇතුළුවීමට ද ගිණුම් හිමියන්ට අවස්ථාව උදා වේ.

## එතෙර ඉසුර අනේවාසික විදේශ මුදල් ගිණුම්හිමියන් වෙනුවෙන් නව ත්‍යාග යෝජනා ක්‍රමය

එ.ජ.ඩො. 250 ක් හෝ කවර හෝ විදේශ මුදල් ඒකකයකින් එයට සමාන අගයක් අවම ශේෂය ලෙස පවතින එතෙර ඉසුර අනේවාසික විදේශ මුදල් ඉතුරුම් ගිණුම් සඳහා මාසික හා වර්ෂ අවසාන විශේෂ ත්‍යාග දිනුම් ඇදීම් පවත්වන ලදී. රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් ත්‍යාග මුදල් අතර අයත් වූ අතර මෙම දිනුම් ඇදීමේ විශේෂ ලක්ෂණය වන්නේ මෙම කාලපරිච්ඡේදය, තුළ පවත්වා ගැනෙන එ. ජ. ඩො. 250 හෝ එයට සමාන සෑම මුදල් ප්‍රමාණයක් ම අතිරේක දිනුම් අවස්ථාවන් ට හිමිකම් ලැබීමයි.

## ජය ශ්‍රී 2012

ජය ශ්‍රී වඩාත් ම පැරණිම හා වැඩිම ත්‍යාග ප්‍රමාණයක් ප්‍රදානය කරන වැඩිම ප්‍රතිලාභ සහිත ඉතුරුම් ත්‍යාග වැඩසටහන, ජනතාව අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීමේ දී ඉතා වැදගත් මාර්ග යක් ලෙස සුවිසල් පිලිගැනීමක් අත් කරගෙන ඇත. රු. 10,000 ක අවම ශේෂයක් සහිත සියළු වැඩිහිටි ඉතිරි කිරීමේ ගිණුම් හිමියන්ට මෙම දිනුම් ඇදීමට ඇතුළු වී මාසිකව හා වාර්ෂිකව මහා දිනුම් ඇදීමේ දී ආකර්ශනීය ත්‍යාග දිනාගැනීමට මෙම දිනුම් ඇදීමේ අවස්ථාව සලසයි. ඉතිරි කිරීමේ ගිණුම් වල අවශ්‍ය අවම ශේෂය මෙන් කවර හෝ ගුණායක මුදල් පවතී නම් ඒ හා සමාන දිනුම් අවස්ථා හිමි වේ. මෝටර් රථවල සිට ට්‍රැක්ටර්, රූපවාහිනි යන්ත්‍ර හා මික්ස්චර් ග්‍රයින්ඩර් යන්ත්‍ර දක්වා පරාසයක ත්‍යාග මාසික දිනුම් ඇදීම් වලදී පිරිනැමෙන අතර වාර්ෂික මහා දිනුම් ඇදීමේ ප්‍රථම ත්‍යාගය ලෙස අළුත්ම හොණ්ඩා සිවික් මොටර් රථයක් පිරිනැමේ.

## ජාතියේ අනාගතය සමග 64 වසරක නිදහස උත්සවාකාරයෙන් සැමරීම

රටේ මෙම මංසලකුණු සංවත්සරය සැමරීමේදී, මහජන බැංකුවේ වාර්ෂික නිදහස් දින වැඩසටහන 'නිදහසේ උපත'' මේ වසරේ දී 2012 පෙබරවාරි 1 වැනි දින සිට 7 වැනි දින දක්වා උපන් සෑම බිලිඳෙකුටම ඉසුරු උදාන ත්‍යාග සහතික පතක් හා ත්‍යාග පාර්සලයක් පිරිනැමීම ආරම්භ කළේය. තම දරුවන්ගේ ඉලක්ක සපුරා ගන්නා අතර ඔවුන් ශ්‍රී ලංකාවේ සාඩම්බර පුරවැසියන් බවට පත්කිරීමට දෙමාපියන්ට හැකියාව ලබාදීමේ අරමුණින් වසර හයකට පෙර අරඹන ලද මෙම වැඩසටහනේ විශේෂ ලක්ෂණය වූයේ බැංකු කණ්ඩායම රෝහල්වල දී අළුත උපන් බිලිඳුන්ට ත්‍යාග පිරිනැමීමයි. මේ වසරේ උත්සවාකාරයෙන් මෙම ත්‍යාග පිරිනැමීම කොළඹ කාසල් වීදියේ මාතෘ රෝහලේ දී සිදු කරන ලදී.

## ශාඛා විවෘත කිරීම්

තංගල්ල මහජන බැංකු ශාඛාව විවෘත කිරීම, තංගල්ල ශාඛාවේ මෙහෙයුම් සඳහා සෙවන සැපයීම පිණිස පීපල්ස් ලීසිං සමාගම නව සිව් මහල් සංකීර්ණයක් විවෘත කළේය. මෙම ආයතන දෙක අතිගරු ජනාධිපතිතුමන් විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලද අතර, නගරයට පමණක් නොව සමස්ත ප්‍රදේශයට ම ප්‍රතිලාභ හිමි කර දෙමින් දැක්මක් සහිතව ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ආයතන දෙකටම ජනාධිපතිතුමා ගේ ප්‍රශංසාව හිමි විය. රටේ සංස්කෘතිය ඉස්මතු කර දැක්වෙන මෙම වැදගත් අවස්ථාවේ දී මහජන බැංකුව නිසැකව ම ජනතාවට ප්‍රතිලාභ පිණිස කටයුතු කරන බව සඳහන් කළ එතුමා, රටේ ශ්‍රම බලකායේ වැදගත් තැනක් අත් කරගෙන සිටිමින් රටේ ආර්ථිකය හැඩගැස්වීමේ දී බැංකුවට අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කිරීමට ඇති බව ද පැවසුවේය. පැය 24 ම ක්‍රියාත්මක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම, විවිධ කල්බදු සේවාවන් හා සමගම බැංකුවටම ආවේණික ගනුදෙනුකාරභවතුන් වෙනුවෙන් අසම සේවාව ඇතුළු ව නවීන තාක්ෂණය සමෝධානය කරන ලද කරදරයෙන් තොර බැංකු පහසුකම් මෙම ශාඛාව ලබා දෙයි.

### දෙමටගොඩ ශාඛාව වෙනත් ස්ථානයකට ගෙන යාම

වඩා හොඳ සේවාවක් ගනුදෙනුකාර භවතුන් ට සැපයීම හා වඩාත් ප්‍රවේශය සහිත වීම සඳහා ප්‍රයත්නයක් ගනිමින්, 51 වැනි සංවත්සර උත්සව සමගම දෙමටගොඩ ශාඛාව වෙනත් ස්ථානයක පිහිටුවන ලදී. නවතම තාක්ෂණය එක් කරමින්, 24/7 පෙට් (PET) පහසුකම් ඇතුළුව සියලු බැංකුකරණ සේවාවන් මෙම බැංකුවෙන් සැපයෙනු ඇත.

### කුඩා හා මහා පරිමාණ ව්‍යවසාය ව්‍යාපාර මධ්‍යස්ථාන සඳහා පුරෝගාමී වීම

මහින්ද චින්තන ඉදිරි දැක්මේ ඉලක්ක වලට දැඩිව අනුකූල වෙමින් හා කෘෂිකර්මය මත පදනම් වූ නිෂ්පාදන, පශු සම්පත්, ඇඟලුම්, ධීවර, සංචාරක, ඉදි කිරීම් හා අනෙකුත් ගාමක අංශ සඳහා ණය පහසුකම් මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින්, අනුරාධපුරයේ පළමුවැන්න හා ඉන් අනතුරුව කුරුණෑගල, මාතර හා මහනුවර වශයෙන් මහජන බැංකුව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ව්‍යාපාර මධ්‍යස්ථාන තුනක් විවෘත කළේය. අතිශයින් ම නවීකරණය කරන ලද මෙම මධ්‍යස්ථාන වල අන්තර්ජාල ප්‍රවේශය මෙන්ම ශ්‍රවණාගාර ද සහිත සම්පූර්ණ පුස්තකාල ඇති අතර උපදෙස් ලබාදීම ට සැදී පැහැදී සිටින කාර්යක්ෂම, මිත්‍රශීලී හා පුහුණු විශේෂඥ කාර්ය මණ්ඩල මෙම මධ්‍යස්ථාන මෙහෙයවති. අවසානයේ දී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ව්‍යාපාර මධ්‍යස්ථාන දිස්ත්‍රික්ක 24 තුළ පිහිටුවනු ඇත.



# සේවකයන්

මුළු සේවක සංඛ්‍යාව

**10,685**




බාහිර පාර්ශ්ව වෙතින් ලබාගත් සේවකයන් හා විශ්වවිද්‍යාලයට තේරී සිටින්නන්

ස්ථිර සේවකයන්

එක් ස්ථිර සේවකයෙකුට ආදායම (රු.'000)

**12,115**

එක් ස්ථිර සේවකයෙකුට බදුවලට පසු ලාභය (රු.'000)

**1,393**



**අපගේ නමින්ම සියලු තතු පැවසේ.** ජනතාව ප්‍රධානය. අපගේ සේවක ජනතාව බැංකුව හා පාර්ශ්වකරුවන් අතර මාහැඟි පුරුකක් වන අතර බැංකුව ඔවුන් සමග ගොඩ නගාගෙන ඇති ශක්තිමත් බැඳීම්වල වගකීම දරති. ඔවුන් ශක්තිමත් කරවන සේවා පරිසරයක සිට තරගකාරී පාරිශ්‍රමිකය, පුළුල් පරාසයක වෘත්තීය සංවර්ධනය හා තවත් බොහෝ දේ දක්වා ප්‍රතිලාභ ලබා දෙමින් අප අතිශයින්ම මනා ලෙස අප සේවක ජනතාව රැක බලාගන්නේ එබැවිනි.

**පුහුණුවීම් පැය ගණන**

**142,068**

**පුහුණු වැඩසටහන්**

**693**

වැඩසටහන්වල සංයුතිය:

- කළමනාකරණ සංවර්ධන වැඩසටහන්
- ප්‍රවිෂ්ටකරණ වැඩසටහන්
- විදේශ පුහුණු යනාදියෙන් සමන්විත වේ.






ස්ථිර සේවකයන්ගෙන්

**95%** ක්

සාමූහික ගිවිසුම මගින් ආවරණය කෙරේ

# මූල්‍ය සමාලෝචනය

ශක්තිමත් මූල්‍ය පදනම, අචල කාර්යසාධනය හා ආචාර ධර්ම, වගවීම, ස්ථාවර බව හා විනිවිද භාවය යන මූලධර්ම මත ගොඩනැගුණු කාල්පනික දෘෂ්ටිය, දශක පහක් ඉක්ම වූ අප චාරිකාවේ දී අප ගොඩනගා ගෙන ඇති ශක්තිමත් කීර්තිනාමයයි. අපගේ නාමය, මහජන බැංකුව යන නමින් ම සියලු තතු පැවසෙන අතර මහජනතාවට හා අපගේ ජාතියට අපගේ පොරොන්දුව වෙනුවෙන් සංකේතාත්මකව පවතින්නේ මෙම නාමයයි. ඉදිරි පිටු කිහිපයේ ඔබ දකින මූල්‍ය සමාලෝචනය, අපගේ කාර්යසාධනය, අප තදින්ම පිළිපදින අනුකූලතා සංස්කෘතිය හා අන් සියල්ලටම වඩා අපගේ මූල්‍ය තත්ත්වය පිළිබඳව අපගේ පාර්ශ්වකරුවන්ට සත්‍ය හා පැහැදිලි චිත්‍රයක් ඉදිරිපත් කිරීමට අප සතු වගකීම් පූර්ණ ලෙස කැටි කර දක්වා කර වගවීම, යහපත් පරිචයන් හා විනිවිද භාවය කෙරෙහි අප තුළ වන කැපවීම සවිස්තරාත්මක ව ගෙන හැර දක්වයි.

## 2012 ගෝලීය ආර්ථිකය

2008/09 පසුබෑමෙන් ගෝලීය ආර්ථිකය තවමත් යථා තත්ත්වයට පැමිණ නොමැත. 2012, 3% පමණම පහත වැටුණු ගෝලීය වර්ධනය, දිගින් දිගටම දීර්ඝ කාලීන රටාවට වඩා පහත මට්ටමක පැවතිණි. විශේෂයෙන්ම සංවර්ධිත රටවල - පිළිබිඹු වූ පරිදි නිමැවුම් වර්ධනය ද 2012 වර්ෂය තුළ දී සැලකිය යුතු තරම් මන්දගාමී විය.

ගෝලීය ආර්ථිකය හමුවේ එන ගැටළු බහුවිධ මෙන්ම එකිනෙක හා ඈඳුණු ඒවා වේ. විශේෂයෙන්ම සංවර්ධිත රටවල දක්නට ලැබෙන වඩාත් දැවෙන ප්‍රශ්න වන්නේ දිගින් දිගටම පවතින රැකියා අර්බුදය (විරැකියාව ආසන්න වශයෙන් 9% ක ඉහළ මට්ටමකම පවතී) හා ආර්ථික වර්ධනය ඇති හීන වන අවස්ථා වේ. 2010 හා 2011 දී මෙන් නොව 2012 දී නැගී එන වෙළෙඳපොළවල් වේගවත්ව වර්ධනය නොවීම තුළින් මෙම මන්දගාමී බව දක්නට ලැබේ.

## 2012 ශ්‍රී ලාංකික ආර්ථිකය

2012 දෙසැම්බර් මස දී එයට පෙර මාසයේ වූ 9.5% සිට 9.2% දක්වා උද්ධමනය අඩුවෙන් 2012 දෙසැම්බර් වන විට නොකඩවා 47 වැනි වසරටත් උද්ධමනය තවදුරටත් තනි ඉලක්කමක රැඳී තිබුණි. කෙසේ වෙතත්, වාර්ෂික සාමාන්‍යය පදනමින් ගත් කළ උද්ධමනය 2012 නොවැම්බර් මස වූ 7.2% සිට 2012 දෙසැම්බර් මස 7.6% තෙක් වර්ධනය විය.

මෑත අතීතයේ දී විනිමය පාලන නියෝග සැලකිය යුතු මට්ටමින් ලිහිල් කරනු ලැබීමත් සමග බොහෝ ප්‍රධාන කර්මාන්ත වල පිළිබිඹු වූ වාසි ඇති විය. රටේ ප්‍රධාන ආර්ථික අංශ වන්නේ සංචාරක කර්මාන්තය, තේ අපනයනය, ඇඟලුම්, රෙදිපිළි, සහල් නිෂ්පාදන හා අනෙකුත් කෘෂිකාර්මික නිපැයුම් වේ. මෙම ආර්ථික අංශවලට අමතරව, විදේශ රැකියා සැලකිය යුතු විදේශ විනිමය දායකත්වයක් සපයයි. විදේශගත ශ්‍රී ලාංකිකයන්ගෙන් 90% මැදපෙරදිග වාසය කරන බව ද සැලකිල්ලට ගැනීම වැදගත්ය.

ශ්‍රී ලංකාවේ විදේශ හා දේශීය ව්‍යවහාර මුදල් IDR BB- ලෙස තබාගනිමින් තත්ත්වාගණනයන් දෙකම ස්ථාවර බව පෙන්නුම් කරන බව ෆිච් රේටින්ස් තහවුරු කළේ ය. රටේ උපරිම සීමාව ද BB ලෙස තහවුරු කරනු ලැබ ඇති අතර කෙටි කාලීන විදේශ ව්‍යවහාර මුදල් IDR සඳහා B- තත්ත්වාගණනයක් ලැබිණි.

## 2013 ඉදිරි මග

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2013 සඳහා හා මධ්‍යකාලීන ප්‍රතිපත්ති මගපෙන්වීම සැලසුම් කර ඇත්තේ විශේෂයෙන් ම ඒ.ජ.ඩො. 4,000 ඒක පුද්ගල ආදායමින් පසු යුගයට සුමට සංක්‍රමණයක් සහතික කිරීම සඳහා වේ. 2013 වෙනුවෙන් සිය ප්‍රතිපත්තිය පිළියෙල කිරීමේ දී ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රක්ෂේපණ පහත සඳහන් පරිදි වේ.

- තථ්‍ය ද.දේ.නි. 7.5% කින් වර්ධනය වනු ඇත.
- මධ්‍ය තනි ඉලක්කම් මට්ටමේ උද්ධමනය ස්ථාවර වනු ඇත.
- වෙළඳ හිඟය ද.දේ.නි. 15.1% සිට ද.දේ.නි. 14.4% දක්වා වැඩි දියුණු වනු ඇත.
- ජංගම ගිණුම් හිඟය ද.දේ.නි. 5.5% සිට ද.දේ.නි. 4.7% දක්වා වැඩි දියුණු වනු ඇත.
- ආනයනවල සංචිත ප්‍රමාණවත් බව මාස හතරක පමණ සීමාවේ පවතිනු ඇත.
- සමස්ත අයවැය හිඟය ද.දේ.නි. 5.8% දක්වා අඩු වනු ඇත.
- ඵලදායිතා මට්ටම් වල අඛණ්ඩ දියුණුවක් ඇති වනු ඇත.

මේ වසරේ හඳුන්වා දෙන ලද නව ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLFRS හා LKAS) ආදේශ කිරීම සඳහා වූ නියමයට අතිරේකව ගෝලීය ආර්ථිකයෙන් නික්මෙන අභියෝග හා ශ්‍රී ලංකික ආර්ථිකයේ අපේක්ෂාවන් නිරීක්ෂණය කරන ලදුව පහත සවිස්තරාත්මකව දක්වා ඇති පරිද්දෙන් වන බැංකුවේ කාර්යසාධනය අප ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

# මූල්‍ය කාර්යසාධනය

## ලාභදායක බව

පසුගිය වසර හා සැසඳෙන කාලපරිච්ඡේදයේ දී වාර්තා කරන ලද ප්‍රතිඵල වලට බෙහෙවින්ම සමානව රු. බිලියන 15.2 ක බදුවලට පෙර ලාභයක් හා රු. බිලියන 10.9 ක බදුවලට පසු ලාභයක් සහිතව බැංකුව 2012 වසර අවසන් කළේය. විදේශ විනිමය අනුපාතිකයන්හි කැපී පෙනෙන චලනයන්, ඉහළ නගින වෙළෙඳපොළ පොළී අනුපාතික හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද ණය වර්ධනය මත වූ උපරිම සීමාව හේතුවෙන් වූ අහිතකර වෙළෙඳපොළ තත්ත්වයන් මෙයින් පිළිබිඹු වේ.

2012 හා 2011 වර්ෂ සඳහා බදුවලට පෙර හා පසු ලාභ පහත දක්වා ඇත.




**ලාභදායීත්වය**

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| | 5,002 | 5,664 | 6,076 | 8,771 | 15,600 | **15,249** |
| | 2,374 | 2,705 | 3,320 | 5,206 | 10,446 | **10,894** |

## ශුද්ධ පොළී ආදායම

වර්ෂය සඳහා බැංකුවේ සමස්ත ආදායම (පොළී හා වෙනත්) රු. බිලියන 94.8 ක් වූ අතර 2012 දී පැවති ඉහළ පොළී අනුපාතික පරිසරයේ ප්‍රතිඵලයක් ලෙස එය 38.8% ක වර්ධනයක් පෙන්නුම් කළේය. ශුද්ධ පොළී ආදායම රු. බිලියන 3.6 කින් වර්ධනය වූ අතර එය පෙර වර්ෂයට වඩා 11.9% ක වර්ධනයකි. වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වූ අංශ වූයේ ණය හා ලැබිය යුතු හා මිල නියම කිරීම් විය.




**ශුද්ධ පොළී ආදායම**

| 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| 16,532 | 18,962 | 23,927 | 25,898 | 30,318 | **33,918** |

## මෙහෙයුම් ආදායම

පෙර වර්ෂයට 18.9% ක වර්ධනයකින් පිළිබිඹු වූ පරිදි මෙහෙයුම් ආදායම රු. බිලියන 6.9 කින් වර්ධනය විය. ශුද්ධ පොළී ආදායම, ගාස්තු, කොමිස් මුදල්, වෙළඳ ආදායම හා ණය හානි හා අනෙකුත් පාඩු සඳහා ගැලපීම් ඇතුළත් ශුද්ධ පොළී ආදායම 2011 සාපේක්ෂව බැංකුවේ 9.5% කින් ද සමූහය මට්ටමේ දී 8.6% කින් ද ඉහළ නැගේය. විදුලි විනිමය ආදායම හා සාමාන්‍ය කොටස් වෙළෙඳාමෙන් ආදායම ඇතුළත් කරගන්නා ශුද්ධ වෙළඳාම් ආදායම 124.7% කින් වර්ධනය වූ අතර පෙර වර්ෂයට සාපේක්ෂව එය කැපී පෙනෙන වැඩි වීමක් විය. රු. මිලියන 918 ක් වූ විදේශ විනිමය ලාභ මගින් මෙය මූලික වශයෙන් මෙහෙයවනු ලැබිණි. 2011 ප්‍රතිඵල අනුව අනෙකුත් මෙහෙයුම් ආදායම රු. බිලියන 1.3 කින් වර්ධනය විය.




**සමස්ත මෙහෙයුම් ආදායම**

| 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| 21,442 | 24,456 | 30,635 | 31,897 | 36,431 | **43,310** |

## මෙහෙයුම් වියදම්

මෙහෙයුම් වියදම් 18.4% වර්ධනයක් පෙන්නුම් කළ අතර එය පසුගිය වර්ෂයට වඩා රු. බිලියන 3.8 වැඩියෙන් පැවතිණි. 2012 - 14 සාමූහික ගිවිසුම අනුව ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ලබා දුන් වැටුප් සංශෝධන හේතුවෙන් වැඩි වූ පුද්ගල පිරිවැය රු. බිලියන 3.3 මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.




**මෙහෙයුම් වියදම්**

| 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| 15,735 | 17,159 | 19,719 | 21,305 | 20,421 | **24,186** |

## ණය හානිය හා වෙනත් අලාභයන්

පෙර වර්ෂය හා සංසන්දනාත්මකව හානි ප්‍රතිපාදන රු. බිලියන 3.5 කින් වර්ධනය විය. මෙම ප්‍රතිපාදනයට කේවල තක්සේරු කරන ලද ණය මෙන්ම සාමූහිකව තක්සේරු කරන ලද ණය ද ඇතුළත් වන්නේ බැංකුව විසින් ප්‍රථම වතාවට ආදේශ කරගන්නා ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වේ.




මුළු තැන්පතු

| 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| 300,956 | 324,489 | 396,158 | 462,140 | 550,226 | 683,951 |




ණය හා ලැබිය යුතු දෑ

| 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| 253,370 | 263,462 | 299,077 | 371,804 | 508,235 | 660,624 |

## බදු

මූල්‍ය සේවාවන් මත එකතු කළ අගය මත බදු පෙර වර්ෂයට සමාන මට්ටමක පැවති අතර එය 2012 දී රු. බිලියන 2.5 ක් ද 2011 දී රු. බිලියන 2.4 ක් ද විය. නව බදු මෙහෙයුම් නිර්ණායක තවමත් ඉදිරිපත් කරනු ලැබ නොමැති හෙයින් බදු මත බලපෑම තක්සේරු කර ඇත්තේ දැනට අදාළ වන බදු නීති හා නියමයන් මත පදනම්ව වේ.

## තැන්පතු

2011 වූ රු. බිලියන 550.2 හා සැසඳූ කල 24.3% ක වර්ධනයක් පිළිබිඹු කරමින් බැංකුවේ තැන්පතු රු. බිලියන 684 ක් විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත්තේ 2011 ට සාපේක්ෂව රු. බිලියන 119 කින් ඉහළ නැගී ස්ථිර තැන්පතුය. සමස්ත අඩු පිරිවැය තැන්පතු, මුළු තැන්පතු වලින් 40% ක් විය.

## ණය හා ලැබිය යුතු දෑ

2011 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 508.2 ක් වූ දළ ණය හා ලැබිය යුතු දෑ 2012 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 660.6 ක් ලෙස 30% කින් වර්ධනය විය. මෙම සුසමාදර්ශයට දායක වූ අංශ වූයේ කෘෂිකර්ම හා ධීවර කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා නිෂ්පාදන අංශයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශිත 18% වර්ධන උඩත් සීමාව ඉක්මවා වර්ධනයට හේතු වී ඇත්තේ විදේශ ව්‍යවහාර මුදල් ණය වර්ධනය හා රජය සතු ව්‍යවසායයන් කිහිපයකට ලබා දුන් ණය වේ.

## ප්‍රාග්ධන හා සංචිත

2011 වර්ෂයේදී වූ රු. බිලියන 23.1 හා සැසඳූ කල 2012 වර්ෂය අවසානයේදී රඳවාගත් ඉපැයුම් සමග ප්‍රාග්ධන සහ සංචිත රු. බිලියන 29.2 ක් විය.




ප්‍රාග්ධන හා සංචිත

| 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| 17,780 | 15,880 | 17,800 | 20,838 | 23,089 | 29,205 |

## ප්‍රධාන කාර්යසාධන දර්ශක

2011 වූ 3.4% හා සැසඳූ කල බැංකුවේ අක්‍රිය ණය අනුපාතය (NPL) 2012 දී 2.8% ක් වූයේ ණය හා අයවිය යුතු මුදල් වල කැපී පෙනෙන වර්ධනය හා අක්‍රිය අත්තිකාරම් වල ආන්තික වර්ධනය (පෙර පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මත පදනම්ව) හේතුවෙනි.

2011 දී 56.1% ක් වූ ආදායමට පිරිවැය අනුපාතිකය 2012 දී 55.8% දක්වා මඳක් පහත බැස්සේය. මෙයට මූලිකව හේතු වූයේ විචල්‍ය පොදු කාර්ය පිරිවැය වෙනුවෙන් විචක්ෂණශීලී පිරිවැය කළමනාකරණ මූලාරම්භයන් කෙරෙහි බැංකුව අඛණ්ඩව අවධානය යොමු කිරීමයි.

වර්ෂයේ අවසාන භාගය අතරතුර දී වත්කම් වල නිරීක්ෂණය කරන ලද භෞතික වර්ධනය හේතුවෙන් 2011 දී 2.6% ක් වූ වත්කම් මත ලාභ (බදු වලට පෙර) 2012 දී 2.0% තෙක් අඩු විය. 2012 දී ප්‍රාග්ධන ප්‍රමාණවත්බව අනුපාතිකය 14.0% ලෙස වාර්තා විය. *(වඩාත් විස්තරාත්මක සමාලෝචනයක් සඳහා 108 සිට 113 දක්වා පිටු වල ඉදිරිපත් කෙරෙන ප්‍ර.කා.ද. විශ්ලේෂණය බලන්න.)*

*සැ.යු. 2011 හා 2012 වෙනුවෙන් ඉහත වාර්තා කර ඇති ප්‍රතිඵල 2012 ජනවාරි 1 වැනි දින සිට බලාත්මක වූ නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS හා LKAS) මත පදනම්ව පිළියෙල කරන ලද බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් උපුටා ගෙන ඇත. 2008 - 2010 සඳහා වාර්තා කර ඇති ප්‍රතිඵල, 2011 දෙසැම්බර් 31 වැනි දින තෙක් බලාත්මකව පැවති, පෙර පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) මත පදනම් ව සකස් කරන ලද බැංකුවේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ ප්‍රකාශන වලින් උපුටා ගෙන ඇත. නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS හා LKAS) සමග අනුකූලව බැංකුව 2011 වෙනුවෙන් සිය මූල්‍ය ප්‍රකාශන නිසි ලෙස නැවත සඳහන් කර ඇත.*

## පරිපාලිතයන්හි හා ආශ්‍රිතයන්හි කාර්ය සාධනය

### සී/ස පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම

ඉන්ධන හා මුදල් මිල ගණන්වල වෙනස්වීම් සැලකිය යුතු නිශේධාත්මක බලපෑමක් ඇති කළ අභියෝගාත්මක පරිසරයක් තුළ අප තවත් වාර්තාගත ලාභ වර්ධනයක් සහිත වර්ෂයක් වාර්තා කර ඇත. එයට අතිරේකව, ලොව පුරා භූගෝලීය සිදුවීම් හා දේශපාලන අර්බුද ද බලපෑම් වඩාත් නරක අතට හරවන ලදී. මිලියන 8.66 ලෙස දැක්වෙන (2010/11 - මිලියන 5.43) මුළු වර්ෂය සඳහා වූ මෙහෙයුම් ලාභයෙන් 60% ලාභ වර්ධනයක් අත් කර ගැනීමට හැකිවීම ගැන අප සතුට ට පත් වෙමු. බදුවලට පසු ලාභය රු. මිලියන 3.8 සිට රු. මිලියන 7.72 දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ නැංවෙන අතර එය 2010/11 සාපේක්ෂව 94% වර්ධනයක් විය. රු. මිලියන 27.11 ක් වාර්තා කරමින් අපගේ ආදායමේ ද අපි සැලකිය යුතු කාර්යසාධනයක් වාර්තා කර ඇත.

විනෝද චාරිකා, ගුවන් ටිකට්පත් අලෙවි කිරීම් හා ගුවන් ටිකට්පත් මත උපයන ලද විශේෂ කොමිස් මුදල් වල කාර්යසාධන වර්ධනය සිදු වී ඇත.

**ගුවන් ටිකට්පත් අලෙවි කිරීම**

වර්ෂය තුළ දී ආයතනික හා තනි ගුවන් ටිකට්පත් අලෙවියේ දී අප රු. මිලියන 14.28 ක බදු වලට පෙර ලාභයක් ඉපයූ අතර, එය පසුගිය වර්ෂය හා සැසඳීමේ දී 58% ක වර්ධනයක් විය. සමස්තයක් ලෙස වර්ෂය සඳහා වූ අපගේ ප්‍රතිඵල, වෙළෙඳපොළ අවබෝධ කරගෙන එයට අනුකූලව ප්‍රතිචාර දැක්වීමට දැනුම හා හැකියාව ඇති ශක්තිමත් කණ්ඩායමකින් අප සන්නද්ධව සිටින බව ප්‍රදර්ශනය කරයි. අප ධාරිතාව සක්‍රිය ලෙස කළමනාකරණය කරගෙන ඇති අතර ඉදිරි වර්ෂයේ තවදුරටත් වර්ධනය ඉලක්ක කරගනිමින් කැලඹිළි සහිත කාලපරිච්ඡේදයක් සාර්ථක ලෙස තරණය කර සිටින්නෙමු.

**දඹදිව චාරිකා**

වසර ගණනාවක් තිස්සේ අපගේ මූලික ආදායම් ප්‍රභවය වූ දඹදිව චාරිකා වල අප මේ වර්ෂයේ උපදවන ලද ආදායමේ අඩුවීමක් දක්නට ලැබුණේ ගුවන් ගමන් ගාස්තු, හෝටල් ගාස්තු හා මුදල් උච්චාවචනයන් හේතුවෙනි. 2011/12 මූල්‍ය වර්ෂය සඳහා මගීන් 514 දෙනෙකු වෙනුවෙන් චාරිකා 18 ක් සාර්ථකව මෙහෙයවීමෙන් රු. මිලියන 5.98 ක බදුවලට පෙර ලාභයක් උපදවමින් සුබෝපභෝගී දඹදිව චාරිකා මෙහෙයවීමේ දී අපි තවදුරටත් වෙළෙඳපොළ පෙරමුණ ගෙන සිටින්නෙමු.

කිසිදු හේතුවක් වෙනුවෙන් පහත නොදමන අපගේ සේවා මට්ටම් වල අප ප්‍රදර්ශනය කරන බැඳීම හා කැපවීම, අපගේ දඹදිව චාරිකා වල ජනප්‍රියත්වයට ප්‍රධාන හේතුව වේ.

**විවේක සංචාර**

අසීරු ආර්ථික පරිසරයක් තුළ අපගේ සම්ප්‍රදායික බලකොටුව වන ප්‍රධාන ප්‍රවාහ නිවාඩු වෙළෙඳපොළ යළි පිබිදීමකට ලක්ව ඇත. වඩාත් නානාංගකෘත හා සුවිශේෂී නිපැයුම් මෙන්ම කාලසීමාවේ නම්‍යශීලීබව ඇතුළත් කිරීම පිණිස ගනුදෙනුකාර භවතුන්ගේ කැමැත්තට අනුව අප ඉදිරිපත් කරන නිපැයුම් හැඩගැස්වීම අප අඛණ්ඩව සිදු කර ඇත. සංචාරකයන් ඔවුන්ගේ මුළු නිවාඩුව සඳහා වියදම් කිරීමේ දී වැඩි මූල්‍ය නිශ්චිත බව අපේක්ෂා කරන බැවින් සියලු අංග වලින් සමන්විත අපගේ නිවාඩු විශේෂයෙන්ම ජනප්‍රිය බව ඔප්පු වී ඇත. මාර්ගෝපදේශකත්වය සහිත නිවාඩු පැකේජය විවේක සංචාර වල වැදගත් කොටසක් ලෙස පවතී.

කාර්යසාධනය අනුව, ගනුදෙනුකාර භවතුන් 422 වෙනුවෙන් චීනයට කණ්ඩායම් හතරක්, සිංගප්පූරුව/මලයාසියාව වෙත සංචාර තුනක්, බැංකොක් වෙත සංචාර තුනක් හා මියන්මාරයට සංචාර දෙකක් මෙහෙයවීමෙන් මෙතෙක් ලද ඉහළම ආදායම වන රු. මිලියන 4.27 ක් අපි වාර්තා කළෙමු. අපගේ නවතම ගමනාන්තය ලෙස වියට්නාමය ඇතුළත් කරනු ලැබ ඇති අතර සුවිශේෂී නානාංගකෘත නිපැයුම් සමග අපගේ ගනුදෙනුකාර භවතුන්ට වඩා වැඩි තේරීමක් ලබා දීම සඳහා අපි තවත් ගමනාන්ත සෙවීමේ නිරතව සිටින්නෙමු. යුරෝපය, ඕස්ට්‍රේලියාව හා එක්සත් රාජධානිය ශ්‍රී ලාංකිකයන් අතර ජනප්‍රිය ගමනාන්ත වන බැවින් ඒවා බොහෝ ලෙස දියුණු කිරීමට අවකාශ ඇති සංචාර බව අපි විශ්වාස කරන්නෙමු.




**කාණ්ඩගත ආදායම**

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| බැංකුකරණය | 47,984 | 58,948 | 69,050 | 62,818 | 68,298 | **94,777** |
| කල්බදු | 4,624 | 6,063 | 7,265 | 9,094 | 13,356 | **17,882** |
| සංචාර | 19 | 21 | 21 | 23 | 27 | **31** |

## පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම

මහජන බැංකුවේ පරිපාලිත සමාගමක් වන පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම ශ්‍රී ලංකාවේ විශාලතම කල්බදු සමාගම වන අතර පෞද්ගලික සීමිත වගකීම් සමාගමක් හා මහජන බැංකුවට පූර්ණ අයිතිය ඇති පරිපාලිත සමාගමක් ලෙස 1995 අගෝස්තු 22 වන දින පිහිටුවන ලදුව දශකයක් තිස්සේ වෙළෙඳපොළ නායකත්වය රඳවා ගෙන ඇත. නව ආයතනික අනන්‍යතාවක් ලබා දෙමින් 2000 වසරේ දී එය පොදු සීමිත වගකීම් සමාගමක් බවට පරිවර්තනය කරන ලදී. වෙළෙඳපොළ කොටසින් 20% ට අධික ප්‍රමාණයක් නතු කරගනිමින් වර්තමානයේ පීපල්ස් ලීසිං සමාගම සීමාසහිත වෙළෙඳපොළ ප්‍රමුඛයා වී සිටී. කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන පුවරුවේ සාමාන්‍ය කොටස් 1,560,000,060 ක ලැයිස්තු ගත කිරීමක් සහිතව ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම IPO සමාගම වඩාත්ම සාර්ථක IPO අතරින් එකක් වීම හේතුවෙන් සමාගමේ නම සී/ස පීපල්ස් ලීසිං සමාගම වෙනුවට පීපල්ස් ලීසිං පොදු සමාගම ලෙස වෙනස් කරන ලදී. 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙතින් මූල්‍ය ව්‍යාපාර බලපත්‍රය ලැබීමෙන් අනතුරුව පීපල්ස් ලීසිං පොදු සමාගමේ සිට පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම ලෙස ආයතනික අනන්‍යතාව පරිවර්තනය කරන ලදී.

රු. මිලියන 10 ප්‍රාග්ධනයක් හා සේවකයන් තිදෙනෙකු පමණක් ඇතිව වාණිජ මෙහෙයුම් ආරම්භ කළ පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම අද මූල්‍ය කල්බදු, කුලී පිට ගැනීම් සැපයීම, වාරික ණය හා තැන්පතු යන ප්‍රධාන ක්‍රියාකාරකම් වල පෙරමුණ ගෙන සිටිනු දක්නා ලැබේ. පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වෙතින් ලද බලපත්‍ර යටතේ ආන්තික සපයන්නෙකු ලෙස ද ක්‍රියාත්මක වෙයි.

කෙටි කාලයක් තුළ, පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම, දැඩි අපේක්ෂා සහිතව රක්ෂණ, මූල්‍ය, ක්ෂුද්‍ර මූල්‍ය දේපල සංවර්ධනය හා සමුදායන් කළමනාකරණ සේවා හරහා මෙහෙයුම් විවිධාංගී-කරණය කරමින් පීපල්ස් ෆයිනෑන්ස් පොදු සමාගම, සීමාසහිත පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම, සී/ස පීපල්ස් ලීසිං සහ ෆ්ලීට් මැනේජ්මන්ට්, සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්, සීමාසහිත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් හා සී/ස පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් නම් පරිපාලිත සමාගම් හයක් නිර්මාණය කළේය. පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම පීපල්ස් ෆයිනෑන්ස් පොදු සමාගමේ 90.45% ක හිමිකාරිත්වයක් දරන අතර සඳහන් කළ අනෙකුත් සියලු පරිපාලිත සමාගම් හි පූර්ණ අයිතිය පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම සතු වේ.

## මූල්‍ය කාර්යසාධනය

ගෝලීය ප්‍රවණතාවන් හා ශ්‍රී ලංකාවේ මූල්‍ය වාර්තා කිරීම පාලනය කරන ආයතනය වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ නියෝග අනුකූලව, පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) සමග අනුකූලතාව දක්වමින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) ආදේශකර ගත්තේය. ඒ අනුව, 2011 ලිත් වර්ෂයේ සංසන්දනය කිරීම් නව ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට අනුකූලව යළි ප්‍රකාශයට පත් කර ඇත.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට ගලපන ලද මූල්‍ය වාර්තාවලට අනුව පෙර වර්ෂයට වඩා 27% ක වර්ධනයක් ප්‍රදර්ශනය කරමින් පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම 2012 වර්ෂය සඳහා රු. බිලියන 14.1 ක පොළී ආදායමක් වාර්තා කර තිබේ. පෙර වර්ෂයේ වූ රු. බිලියන 5.4 ට සාපේක්ෂව 2012 දී ශුද්ධ පොළී ආදායම රු. බිලියන 6.1 තෙක් ඉහළ නැංගේය. මෙලෙස සමාගම 2012 දෙසැම්බර් මසින් අවසන් වූ වර්ෂය සඳහා පිළිවෙළින් රු. බිලියන 3.8 ක් හා රු. බිලියන 2.6 ක් වූ සතුටුදායක බදු වලට පෙර ලාභයක් හා බදු වලට පසු ලාභයක් වාර්තා කළේය.

විවිධාංගකෘත පීපල්ස් ලීසිං සමූහය, පෙර වර්ෂයේ එහි වාර්තා වූ පොළී ආදායම වන රු. බි. 12.5 සිට 2012 දී එහි පොළී ආදායම රු. බිලියන 16.6 තෙක් වර්ධනය වීම අත්දුටුවේය.

2012 ලිත් වර්ෂයේ ආරම්භයේ සිට කල්බදු කර්මාන්තයේ ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රධාන ගාමක බලවේග අහිතකර බවට හැරීමත් සමග සමාගමට එහි ප්‍රදානයන් සීමාව ආසන්න වශයෙන් රු. බිලියන 32.1 ක් ලෙස සාක්ෂාත් කර ගත්තේය. කෙසේ වෙතත් ඔප්පු මිල ගණන් අවරෝහණාව සංශෝධනය කිරීම හා 2012 අවසානය වන විට ණය උඩත් සීමාව අහෝසි වීම හේතුවෙන් වඩා යහපත් කාලසීමාවකට පිවිසීමට කල්බදු කර්මාන්තය සූදානමින් සිටී. වෙනස් වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වල ප්‍රතිලාභ නෙලා ගැනීමට සමාගමට හැකිවනු ඇති බවටද කිසිදු සැකයක් නොමැත. සමාගමේ මුළු වත්කම් වලින් 91% ක ප්‍රමාණයක් වන පොළී දරන වත්කම් පෙර වර්ෂයේ වූ රු. මිලියන 70 සිට

2012 දෙසැම්බර් 31 වැනි දින වන විට රු. බිලියන 72.0 දක්වා වර්ධනය විය. සමූහයේ මුළු වත්කම් ප්‍රමාණයද 2011 රු. බිලියන 93.6 සිට 2012 දී රු. බිලියන 96.3 දක්වා 2.9% කින් වර්ධනය විය.

2012 දෙසැම්බර් 31 වැනි දිනට සමාගමේ අක්‍රිය ණය අනුපාතිකය 1.17% ක් වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව මෑතක දී නිකුත් කරන ලද වාර්ෂික වාර්තාවට අනුව 5% අවට චලනය වෙමින් පවතින කර්මාන්තයේ සාමාන්‍යයට වඩා මෙය බෙහෙවින් පහළ අනුපාතයක් වේ.

කොටස්හිමියන් වෙනුවෙන් අගය නිර්මාණය කරමින්, 2011/12 මූල්‍ය වර්ෂය වෙනුවෙන් කොටසකට රු. 0.50 බැගින් රු. මිලියන 780 ක මුළු අගයක් ගත් අවසාන ලාභාංශය ගෙවීම සමාගම සිදු කළේය. 2012/13 මූල්‍ය වර්ෂය සඳහා කොටසකට රු. 0.75 ක් ලෙස රු. බිලියන 1.2 ක අන්තර්වාර ලාභාංශ 2012 දෙසැම්බර් මස දී ගෙවන ලද්දේ කොටස්හිමියන්ගේ ධනය තවදුරටත් වර්ධනය කරමිනි. ලිත් වර්ෂය තුළ ගෙවන ලද රු. බිලියන 2.0 ක මුළු ලාභාංශ වලින් රු. බිලියන 1.5 ක මුදලකට මව් ආයතනය වන මහජන බැංකුව හිමිකම් කීවේය.

මව් ආයතනය වන මහජන බැංකුව රු. බිලියන 1.2 කොටස් දරමින් රු. බිලියන 15.5 ක ආයෝජන අගයකට හිමිකම් කියන බැවින් පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම බැංකුව සඳහා විශිෂ්ට ආයෝජන තේරීමක් ලෙස පවතී. 2012 දෙසැම්බර් 31 වැනි දිනට එහි රු. මිලියන 500 ක ආයෝජන පිරිවැයට සාපේක්ෂව රු. බිලියන 15 ක වර්ධනයක් පෙන්නුම් කරයි.

## උප පරිපාලිත සමාගම් පිළිබඳ සමාලෝචනය (පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගමේ පරිපාලිතයන්)

### පීපල්ස් ෆයිනෑන්ස් පොදු සමාගම

කල්බදු (43%) කුලී පිට ගැනුම් (30%) හා අනෙකුත් ණය හා අත්තිකාරම් (13%) යන ආකාරයෙන් පුළුල් ලෙස සැදුම් ලබන පීපල්ස් ෆයිනෑන්ස් හි වත්කම් සංකලනය රු. බිලියන 13 ක අගයක් ගත් අතර 2012 දෙසැම්බර් 31 දින වන විට මුළු වත්කම් ප්‍රමාණය රු. බිලියන 15 ක් විය.

වර්ෂය තුළ දී, 2012 පෙබරවාරි මස දී BBB + සිට A - (lka) හා 2012 ජුලි මස A - (lka) ස්ථාවර තත්ත්වයේ සිට A (lka) දක්වා වශයෙන් පීපල්ස් ෆයිනෑන්ස් තත්ත්වාගණනයන් ෆිච් රේටින්ස් ලංකා මගින් දෙවරක් උත්ශ්‍රේණිගත කරන ලදී.

2012/13 වර්ෂය වෙනුවෙන් 2012 ජුනි 29 වැනි දින සමාගම කොටසකට රු. 2.50/- ක අන්තර්වාර ලාභාංශයක් ප්‍රකාශයට පත් කර ගෙවීම සිදු කළේය.

### සීමාසහිත පීපල්ස් ඉන්ෂුවරන්ස්

2009 දී සංස්ථාගත කරන ලද පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගමක් වන සීමාසහිත පීපල්ස් ඉන්ෂුවරන්ස් දළ ලිඛිත කොටස් ආදායම අනුව රටේ සාමාන්‍ය රක්ෂණ අංශයේ පස් වැනි ස්ථානයට පත්වීමට අඛණ්ඩව වර්ධනය වී ඇත. 2011 දී එය හයවැනි ස්ථානයට තත්ත්වාගණනය කරන ලදී. සීමාසහිත පීපල්ස් ඉන්ෂුවරන්ස් දැනට පීපල්ස් ලීසිං සමූහයේ සේවාදායකයන් වෙනුවෙන් සාමාන්‍ය රක්ෂණ පහසුකම් සපයයි.

### සීමාසහිත පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස්

ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී ප්‍රජාවන් වෙත පීපල්ස් ලීසිං මූල්‍ය සේවාවන් ගෙන යාමේ මුඛ්‍ය පරමාර්ථය ඇතිව සී/ස පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් පිහිටුවන ලදී. රට පුරා පීපල්ස් ලීසිං පොදු සමාගමේ ශාඛා 23 ක් හරහා මෙම සමාගම ක්‍රියාත්මක වන අතර 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් රු. මිලියන 12.06 ක ලාභයක් වාර්තා කළේය.

### සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලප්මන්ට්

මෙම වර්ෂය තුළ දී සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලප්මන්ට් පීපල්ස් ලීසිං සමාගමේ ප්‍රධාන කාර්යාලයට යාබද උපයෝගිතා ගොඩනැගිල්ල ඉදිකිරීම් සාර්ථකව අවසන් කළේය. ඇමතුම් මධ්‍යස්ථානයක්, ආපන ශාලාවක් හා ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථානයක් යන අංග වලින් සමන්විත මෙම ගොඩනැගිල්ල සේවක සුබසාධනය සඳහා අගය එකතු කරමින් සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත. එයට අතිරේකව, වවුනියා ව්‍යාපෘතියේ 1 වැනි අදියර හා තංගල්ල ව්‍යාපෘතිය ද වර්ෂය තුළ දී නිම කරන ලද අතර පිළියන්දල, විල්ගමුව හා ආණමඩුව ව්‍යාපෘති ඉදිරි වසර තුළ නිම කිරීමට අපේක්ෂිතව පවතී.

### සීමාසහිත පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට්

වාහන අලෙවි ඒකකයක් ද පිහිටුවීමේ සැලසුම් සහිතව මෙම සමාගම මෙහෙයුම් කල්බදු, වාහන කුලියට ගැනීමේ පහසුකම්, වාහන සේවා හා තක්සේරු කිරීම් සැපයීමේ යෙදී සිටියි.

### සීමාසහිත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස්

2010 දී සංස්ථාගත කරන ලද සීමාසහිත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගමෙහි මූලික ඉලක්කය වන්නේ කාර්යාල සංකීර්ණයක් ඉදි කිරීමයි. සමාගම මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා ගොඩනැගිලි සැලසුමට අනුමැතිය ලැබීම බලාපොරොත්තුවෙන් සිටී.

## ත්‍යාග සහ සම්මාන

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සංවිධානය කරන ලද 2012 වාර්ෂික වාර්තා සම්මාන ප්‍රදානයේ දී කල්බදු අංශයේ හොඳම වාර්ෂික වාර්තාව ලෙස පීපල්ස් ලීසිං පිට පිට පස්වැනි වසරටත් අනගි ස්වර්ණ සම්මානය තමන් වෙත රඳවා ගත්තේය. මව් සමාගම වන පීපල්ස් ලීසිං සමාගමේ අඩිපාරේ යමින් පීපල්ස් ෆයිනෑන්ස් පොදු සමාගම මූල්‍ය අංශයේ ස්වර්ණ සම්මානය දිනා ගත්තේ එයට පිරිනමන ලද රන් හා ලෝකඩ සම්මාන වල සිට වඩාත් ඉහළ තලයකට පිවිසෙමිනි. සමාගම් ඉතිහාසයේ ප්‍රථම වතාවට පීපල්ස් ෆයිනෑන්ස් පොදු සමාගම සමස්ත කළමනාකරණ විවරණ අංශයේ ලෝකඩ සම්මානය ද දිනාගත්තේය.

ඇමෙරිකානු සන්නිවේදන වෘත්තිකයන්ගේ ලීගය (LACP) විසින් සංවිධානය කරන ලද ගෝලීය සන්නිවේදන තරඟයේදී ද සමාගම් වාර්ෂික වාර්තාව මූල්‍ය කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්ලැටිනම් සම්මාන දෙකක් දිනාගත්තේය. ලොව පුරා රටවල් ආසන්න වශයෙන් 1500 ක සංඛ්‍යාවක් අතරින් මෙම සම්මානය දිනාගැනීම සැලකූ කල මෙය නියත වශයෙන්ම ජාත්‍යන්තර ගෞරවයට පාත්‍ර වීමකි. මෙම වාර්ෂික වාර්තාව ලොව හොඳම වාර්ෂික වාර්තා 100 අතර පස්වෙනි ස්ථානයට තත්ත්වාගණනය කරන ලදී.

පීපල්ස් ලීසිං සමාගම රටේ හොඳම ආයතනික පුරවැසියන් දස දෙනා අතරින් එකක් ලෙස ලංකා වාණිජ මණ්ඩලය විසින් පිළිගන්නා ලද අතර රු. බිලියන 15 ට අඩු ආදායම් කාණ්ඩයේ තෙවන ස්ථානයට තෝරා ගන්නා ලදී.

තවද ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් හොඳම කාර්යසාධනය වෙනුවෙන් පිරිනැමෙන සම්මාන හය අතරින් එකක් වන කාර්යසාධන කළමනාකරණ පරිචයන්හි විශිෂ්ටත්වය වෙනුවෙන් වන සම්මානය සමාගම දිනා ගත්තේය. බැංකුකරණ නොවන හා මූල්‍ය අංශයේ දී සමාගම සම ජයග්‍රාහකයා බවට ද පත් විය.

වර්ෂය තුළ දී, ස්ථාවර ස්වභාවය යළි තහවුරු කරමින් ෆිච් රේටින්ස් ලංකා විසින් පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගමට ලබා දී තිබූ A+(lka) තත්ත්වාගණනය AA - (lka) දක්වා උත්ශ්‍රේණිගත කරන ලදී. ජාත්‍යන්තර තත්ත්වා-ගණනයන් දෙකක් සුරැකි කර ගැනීමට හැකි වූ ශ්‍රී ලංකාවේ එකම බැංකු නොවන මූල්‍ය ආයතනය බවට පත්වීමේ දුලබ විශිෂ්ටත්වය ද සමාගම අත් කරගත්තේය. සවරින් (‘B +/B’) හා සම ජාත්‍යන්තර තත්ත්වාගණනය ස්ටෑන්ඩර්ඩ් සහ පුවර් ලබාදෙද් දී රන් තත්ත්වාගණනයට එක් මට්ටමක් පහළින් වන (B+) තත්ත්වාගණනය ෆිච් රේටින්ස් ඉන්ටර්නැෂනල් විසින් පීපල්ස් ලීසිං පොදු සමාගම වෙත ලබා දෙන ලද අතර මෙම තත්ත්වාගණනයන් දෙකම නියත වශයෙන්ම ජයග්‍රහණ වේ.

## පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගම

පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගම, මහජන බැංකුවේ ආශ්‍රිත සමාගමකි. මහජන බැංකුව, එහි පරිපාලිත සමාගමක් වන පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම හා සමාන හා සාමූහිකව පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් හි 39.2% කොටස් වල හිමිකාරිත්වය දරයි. මෙම සමාගම 2012 අප්‍රේල් මස දී ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් එහි මූල්‍ය සමාගම් බලපත්‍රය ලබාගත්තේය. ආන්තික වෙළඳ සැපයුම්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ බලපත්‍රය ද මෙම සමාගම සතුය. දැනට එය BB+ (ස්ථාවර) ෆිච් තත්ත්වාග ණනය සහිත වන අතර කල්බදු, කුලී පිට ගැනුම්, වෙළඳ මූල්‍ය, ආයතනික මූල්‍ය දේපල, ආන්තික ණය දීම් හා රන් ණය ඇතුළු විශාල පරාසයක වන සේවාවන් එහි ආයතනික කාර්යාලය හා ශාඛා එකොළහකින් සැදුම්ලත් ජාලය හරහා සපයයි.

මූල්‍ය සමාගමක් ලෙස සිය බලපත්‍රය ලබාගැනීමෙන් පසුව පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් සමාගම මෙහෙයුම් සඳහා අරමුදල් ඒකරාශී කරගැනීම පිණිස ස්ථිර තැන්පතු හා ඉතිරි කිරීමේ ගිණුම් හඳුන්වා දුන්නේය. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවල යෙදීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ද ලබාගත් හෙයින් සමාගම විදේශගත හා විදේශීය ආයෝජකයන් ආකර්ශනය කරගැනීම උදෙසා විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් (SFIDA) හඳුන්වා දුන්නේය. විභවය ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම හා නව ව්‍යාපාරික අංශ තියුණු ලෙස කළමනාකරණය ඇති කිරීම පිණිස ව්‍යාප්ත කිරීමට ව්‍යාපාර පරිමාවන් සම්බන්ධ කටයුතු කිරීමට පළපුරුදු වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් කාර්ය මණ්ඩලයක් සහිතව නව ආයතනික ව්‍යුහයක් ද ස්ථාපනය කරන ලදී.

2011 රු. මිලියන 523 ක් වූ පොළී ආදායම 2012 දී රු. මිලියන 548 දක්වා 5% කින් වර්ධනය විය. පෙර වර්ෂයේ වූ රු. මිලියන 166 සිට 2012 වර්ෂයේ දී අනෙකුත් ආදායම් රු. මිලියන 40 දක්වා පහත වැටිණි. රු. මිලියන 137.4ක අගයකින් යුතු පරිපාලිත මූල්‍ය සමාගම විකිණීම මගින් උපදවන ලද ලාභය හේතුවෙන් පෙර වර්ෂයේ අනෙකුත් ආදායම් ඉහළ මට්ටමක පැවතිණි. මේ හේතුවෙන් පෙර වර්ෂයේ වූ රු. මිලියන 326 ක ශුද්ධ ආදායමද රු. මිලියන 232 දක්වා අඩු විය. වර්ෂය තුළ පැවති වැඩි වූ පොළී අනුපාතික හේතුවෙන් පැරණි පහසුකම් මත ආන්තිත අඩු වූයේ අරමුදල් සඳහා සමාගම කෙටිකාලීන ණයගැනීම් මත යැපුණු බැවිනි. 2012 දී පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් සමාගම දිගුකාලීනව හිඟ පැවති අක්‍රිය ණය වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදන සැලසූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදනය රු. මිලියන 132 ක් විය. මේ අනුව පෙර වර්ෂයේ රු. මිලියන 111 ක ලාභයට සාපේක්ෂව පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් සමාගම රු. මිලියන 196 ක අලාභයක් වාර්තා කළේය.

2011 අවසානය වන විට රු. බිලියන 3.2 ක අගයක පැවති සමූහයේ වත්කම් 2012 අවසානය වන විට රු. බිලියන 4.3 දක්වා 36% කින් වර්ධනය විය. මූල්‍ය කල්බදු, ආන්තික වෙළඳාම හා උකස් අත්තිකාරම් වර්ෂය තුළදී ඉහළ නැග්ගේය. මූල්‍ය සමාගමක තත්ත්වය අත්පත් කරගැනීමේ සිට සමාගමේ තැන්පතු පදනම වර්ෂය අවසානය වන විට රු. බිලියන 2.3 ළඟා විය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් මෙහෙයවනු ලබන වාර්ෂික වාර්තා සම්මාන ප්‍රදානයේ දී පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගම 14 වැනි වරටත් සිය 2011/12 වාර්ෂික වාර්තාව වෙනුවෙන් මූල්‍ය ආයතන කාණ්ඩයේ අනුකූලතාව සඳහා පැසසුම් සහතිකයක් දිනා ගත්තේය.

# තිරසාර බව පිළිබඳ අතිරේකය

**අප ව්‍යාපාර කටයුතුවල යෙදෙන ආකාරයට වටිනාකම්, ආචාර ධර්ම, විනිවිදභාවය හා වගවීම යොදා ගනිමින් මහජන බැංකුව, පරිවර්තනය වන මානසිකත්වය තුළට තිරසාර ආකල්ප එක් කරන්නේ එය සැබවින්ම අපගේ පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ දෙන්නක් බවට පත් කිරීම සඳහාය.**

සැරසී සිටින ජාතියක් වර්ධනය කිරීමට සැබවින්ම ජනතාව සමග හවුල් වන බැංකුවක් වීම පිණිස අපගේ පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ ලැබෙන පරිදි අප ව්‍යාපාර කටයුතුවලට යෙදෙන ආකාරයට වටිනාකම්, ආචාර ධර්ම, විනිවිදභාවය හා වගවීම සමෝධානය කරමින් අපගේ තිරසාර ආකල්ප මෙම පරිවර්තනය වන මානසිකත්වයට ඇතුළු කරවන පසුබිමක තිරසාර ජනතාවක් නිර්මාණය කිරීමේදී පහළ සිට ඉහළට සියල්ලන් ඇතුළත් කරගන්නා සංවර්ධනයට ප්‍රවේශයක් සාධනීය තුලනය ඇති කරන බව අපි විශ්වාස කරන්නෙමු.

## ජාතිය වර්ධනය කරවීම

දියුණුවට පත්වීමේ අභිලාෂය සහිත ඉලක්ක හඹා යන ජාතියක් සඳහා අනාගතයට වරයක් ලබාදෙන ගමනක් ශ්‍රී ලංකාව අරඹා ඇත. මෙම ඉලක්ක සපුරාගත හැකි ඒවා වන අතර, ඒවා ජාතියේ වර්ධනය සඳහා නොසෙල්විය හැකි පදනමක් ඉදි කරයි. ජාතියේ දැක්ම පදනම් වී ඇත්තේ සියල්ලන්ම ඇතුළත් කරගන්නා සංවර්ධනය මත වන අතර, මෙය අපේ ජාතිය වර්ධනය කරවීමේ දී අපගේ සියළු පාර්ශ්වකරුවන් ඔවුන්ගේ ප්‍රශස්ත දායකත්වය ලබාදීමට සැලැස්වීමේ අප අරමුණ සමග සෑම අතින්ම අනුකූල වේ.

මහජන බැංකුවට, මහජනතාව සමග, මහජනතාව වෙනුවෙන් සිටින මහජනතාව විසින් පවත්වා ගන්නා බැංකුවක් වීම, අපගේ වර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනෙන බවටත්, නව ප්‍රගතිශීලී සුසමාදර්ශයන් සැකසෙන බවටත් හා අප රට මෙම කලාපයේ පෙරමුණ ගත්තෙකු බව සහතික කිරීමටත් උපකාරීවන මහඟු සූත්‍රයක් වේ. මූලික අංග නිසි ලෙස පිහිටුවන ලද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ආර්ථිකයේ ගාමක බලවේගය වන, ආයෝජන සඳහා යෝග්‍ය පරිසරය නිමැවීමට යටිතල පහසුකම් සැපයෙන, තිරසාර සංවර්ධනයේ ප්‍රධාන නියමුවන් බවට පත්වීමට ප්‍රජාවන් එක්සත් කරවන මහජන බැංකුව වන අප, අසමාන ජයග්‍රහණ සාක්ෂාත් කරගැනීමට

## අප කවුරුන් ද ?

මහජන බැංකුවේ අපි ශ්‍රී ලංකාවේ උන්නතිකාමී ජනතාවගේ බැංකුව වීමේ, අගය නිර්මාණය කරන, තරඟකාරී හා ආත්ම විශ්වාසය ඇත්තවුන් බවට පත්වීමට ජනතාව සවිබල ගැන්වීමේ අපගේ දැක්මට කැපවී සිටින්නෙමු. අපගේ ජනතාව සංවර්ධනය කළ හැකි යැයි අප අදහන ව්‍යුහය ගොඩනැගෙන්නේ මෙම සංකල්පය මතය.

මහජන බැංකුව යනු 1961 අංක 29 දරණ මහජන බැංකු පනතින් වාණිජ බැංකුවක් ලෙස සංස්ථාපිත, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ආරම්භ කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. දැනට ශ්‍රී ලංකා රජය බැංකුවේ 92% හිමිකාරිත්වය දරන අතර, ඉතිරි 8% හිමිකාරිත්වය දරන්නේ සමූපකාර සමිති වේ. මහජන බැංකුවේ හරය වන්නේ ජාතියේ ජනතාවයි. අපි රටේ පුළුල් පරාසයක් ආවරණය කරන්නෙමු. තවද, මහජනතාව වෙනුවෙන්ම වන බැංකුවක් වන හෙයින් අපි පහත දැක්වෙන ආකාරයේ පුළුල් පරාසයක වන සමාජ කොටස්, අංශ හා වෙළඳපොළවල් ආවරණය කරන්නෙමු:

- කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය
- නිෂ්පාදනය
- සංචාරක කර්මාන්තය
- ප්‍රවාහනය
- ඉදිකිරීම්
- වෙළඳ

අපගේ පුළුල් සේවා කළඹට පහත සඳහන් සේවා අයත් වේ:

- මූල්‍ය හා ව්‍යාපාර සේවා
- යටිතල පහසුකම්
- වෙනත් සේවා
- ණය කාඩ්පත්
- උකස්

මෙම සෑම සේවාවක්ම අපගේ ප්‍රධාන අංශවල, එනම්, සිල්ලර බැංකුකරණ, කාඩ්පත් ව්‍යාපාර, ආයතනික බැංකුකරණ, භාණ්ඩාගාර කළමනාකරණ, විදේශ ගනුදෙනුකාර භවතුන් සඳහා සේවා, මූල්‍ය ආයතන (අපගේ විදේශීය බැංකුකරුවන් සමග ගනුදෙනු කිරීම) ක්ෂුද්‍ර මූල්‍ය, කුඩා හා මධ්‍ය පරිමාණ බැංකුකරණය හා සංවර්ධන මූල්‍ය සහ සමුපකාර බැංකුකරණය යන කොටස් අයත් වන සංවර්ධන බැංකුකරණය හා දේශීය ණය යන අංශවල කොටස් වේ.

අපගේ බැංකුකරණ සේවාවන් හැරුණු කොට, සෑම ජනවිද්‍යාත්මක හා භූගෝලීය අංශයක්ම පුරා විහිදෙමින්, සමාජයට හවුල්කරුවෙකු වීමේ අපගේ ඉලක්කයට අනුකූලව අපගේ ජාතියේ දියුණුවට සහාය වන බවට අප විශ්වාස කරන අනෙකුත් ක්ෂේත්‍රවලට ද අපි සම්බන්ධ වී සිටින්නෙමු.

## පරිපාලිත සමාගම්

- සීමාසහිත පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම
- සී/ස පීපල්ස් ට්‍රැවල්ස් සමාගම

## ආශ්‍රිත සමාගම්

- පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගම

## උප පරිපාලිත සමාගම් (පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගමේ පරිපාලිත සමාගම්)

- සී/ස පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට්
- සී/ස පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවලප්මන්ට්
- සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස්
- සී/ස පීපල්ස් ෆයිනෑන්ස් පොදු සමාගම
- සී/ස පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස්
- සී/ස පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටීස්

## අපගේ නිපැයුම්

අපගේ ජනතාවගේ වර්ධනය රටේ ප්‍රගතිය හා ඈඳී ඇති බව අප දන්නා හෙයින් අපගේ සියළු නිපැයුම් හා සේවා ජනතාව වඩාත් ආර්ථික වශයෙන් ස්ථාවර බවට පත් කිරීම හා වර්ධනය සඳහා ඔවුන් සවිබල ගැන්වීම ඉලක්ක කරගෙන ඇත.

අපගේ සන්නාම පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ව්‍යාපාර සමාලෝචනයේ දක්වා ඇත.

## අපගේ ප්‍රවේශය

බැංකුව දිවයින පුරා ශාඛා 347 ක් ක්‍රියාත්මක කරන අතර, සේවකයන් 10,600 වැඩි සංඛ්‍යාවක් සේවයේ යොදවයි. මෙයට අමතරව, තවත් සේවා මධ්‍යස්ථාන 381 ක් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 420 ද අපි රට පුරා ක්‍රියාත්මක කරන්නෙමු. මෙම ස්ථාන හරහා අපි මුළු එකතුව ආසන්න වශයෙන් මිලියන 14 ක් වන ගනුදෙනුකාර භවතුන්ගේ පදනමක් වෙත සේවා සපයන්නෙමු.

සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ දී මහජන බැංකුව පහත සඳහන් ස්ථානවල මුළු සංඛ්‍යාව හයක් වන ශාඛා විවෘත කිරීම/උත්ශ්‍රේණිගත කිරීම සිදු කළේය:

- රිකිල්ලගස්කඩ
- බගවන්තලාව
- වෙට්ටිකුලම්
- කොටියාකුඹුර
- මහනුවර නගර මධ්‍යය
- පූජාපිටිය

තවත් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 40 ක් හා සේවා මධ්‍යස්ථාන 16 ක් මෙම වර්ෂයේ දී පහත සඳහන් ස්ථානවල විවෘත කරන ලදී:

- දොඩන්දූව
- මැදවෙල
- කිරාන්
- රස්නායකපුර
- වැලිඔය
- කටුකුරුන්ද
- කළුබෝවිල
- මහනුවර අධිකරණ පරිශ්‍රය
- පල්ලේගම
- කිරාන්කුලම්
- තංගල්ල සේවා මධ්‍යස්ථානය
- බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය
- හම්බන්තොට පරිපාලන සංකීර්ණ සේවා මධ්‍යස්ථානය
- ශ්‍රී ලංකා රේගු පරිශ්‍රය
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල සේවා මධ්‍යස්ථානය - මහනුවර
- උතුරු මැද පළාත් සේවා මධ්‍යස්ථානය

## මහජන බැංකුවේ තිරසාර බව මෙහෙයවන මූලධර්ම

මහජන බැංකුවේ අපගේ එදිනෙදා කාර්යයන්හි දී ප්‍රමුඛස්ථානය ගන්නේ ජාතියේ වර්ධනයයි. අපගේ දැක්ම, මෙහෙවර හා අරමුණු සකසී ඇත්තේ එම පදනම මත වේ. මෙලෙස, බැංකුවේ තිරසාර බව සහතික කිරීම පවා සිදු කෙරෙන්නේ මෙම මූඛ්‍ය පරමාර්ථය ඇතිවයි. එබැවින් අපගේ මූලධර්ම සැකසී ඇත්තේ පාර්ශ්වකාර්ය කණ්ඩායම් වෙත අගය ගෙන එමින්, ඇති විය හැකි අවදානම් තක්සේරු කරමින් හා අපගේ තෝරාගැනීම් මගින් පරිසරය හා සමාජය මත ඇති කෙරෙන බලපෑම සලකා බලමින් ජාතියේ සංවර්ධනය ඇති කිරීම සඳහා වේ.

- රටට ශක්තිය සපයන අතරම, ඔවුන්ට සහාය වීමේ දෙවැදෑරුම් ප්‍රතිලාභ සහිතව හොඳම ගුණාත්මක බවින් යුතු නිපැයුම් ලබාදීමට අපි අපගේ ගනුදෙනුකාර භවතුන්ට සහතික වන්නෙමු.
- අපගේ ජනතාවගේ වර්ධනය සහතික කිරීම පිණිස අප දැනුම හා සවිබලගැන්වීම මුල්තැන ගත් සංස්කෘතියක් පෝෂණය කරනු ඇති බැවින් අපගේ ජනතාව දැනුවත්ව සිටිනු ඇත.
- අප විසින් යහපත් පරිචයන් උපයෝගී කර ගැනෙනු ඇති බවටත් පිල් සලකුණු නිර්මාණය කෙරෙනු ඇති බවටත් අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් විශ්වාසයෙන් පසු වනු ඇත.
- අප නොදැනුවත්ව විමෝචනය කිරීමට ඉඩ ඇති කචර හෝ උපද්‍රව අවම කිරීමෙන් හෝ ප්‍රතික්ෂේප කිරීමෙන් අපට හැකි උපරිම ආකාරයෙන් අපගේ පරිසරය ආරක්ෂා කෙරෙනු ඇත.
- ශ්‍රී ලංකාව බිම් මට්ටමේ සිට සංවර්ධනය කරා ගෙන යාමට අප ප්‍රයත්න දැරීමේදී අපගේ ප්‍රජාව සවිබල ගැන්වෙනු ඇත.

## මෙම වාර්තාව පිළිබඳව

අපගේ සමාරම්භක තිරසාර බව පිළිබඳ වාර්තාව වන මෙය, වර්තමාන ආයතනික පාලන සම්මතයන් හා තිරසාරබව පිළිබඳ ඉල්ලුම මත පදනම් වූ ත්‍රිත්ව යටි රේඛා සංකල්පය (Triple Bottom Line Concept) සමග අනුකූල වේ. මෙම තොරතුරු ප්‍රකාශයට පත් කිරීමේ දී අපගේ ඉලක්කය වන්නේ රටේ හොඳම බැංකුව බවට පත්වීමේ අපගේ ප්‍රයත්නයේ දී අප ලබාගත් ජයග්‍රහණ අවධාරණය කිරීම හා පවත්නා පරතරයන් පෙන්නුම් කිරීම වේ.

2012 ජනවාරි සිට 2012 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය මෙම වාර්තාව ආවරණය කරන අතර, හැකි සෑම අවස්ථාවකදීම, අප ප්‍රකාශයට පත් කරන කරුණු තහවුරු කරන ගුණාත්මක හා ප්‍රමාණාත්මක මිනුම් දක්වයි. මෙබඳු තොරතුරු වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීම අපගේ අරමුණ වේ. මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.

## වාර්තාකරණ ප්‍රමිති

නියාමන හා ප්‍රමිති ආයතන මගින් අපේක්ෂිත ප්‍රමිති මෙන්ම ගෝලීය වාර්තාකරණ මූලාරම්භ (GRI) මෙහෙයුම් නිර්ණායකද ඇතුළුව ආයතනික විෂය තුළ දැනට පවතින ප්‍රමිති හා අනුකූලව මෙම වාර්තාව නිපැයීමට අප හැකි සෑම ප්‍රයත්නයක්ම දරා ඇති අතර, එමගින් අපගේ පාර්ශ්වකරුවන්ට විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් දැක්වීමට අපි අපේක්ෂා කරන්නෙමු. මෙම වාර්තාව ගෝලීය වාර්තාකරණ මූලාරම්භ (GRI) මෙහෙයුම් නිර්ණායකවල C මට්ටමට පවත්වාගැනීමට අප උත්සුක වන අතර, වාර්තාවේ 78 සිට 79 දක්වා වන මෙම කොටසට අදාළ පිටුවල දැක්වෙන ප්‍රස්තාරවල අපගේ අනුක්‍රමණයන් ඒ අනුව සලකුණු කර ඇත.

මෙම ඇගැයීමට වැදගත් නොවන බැවින් මහජන බැංකුවේ පහත සඳහන් මෙහෙයුම් මෙම වාර්තාවේ විෂයපථයෙන් බැහැර කරනු ලැබ ඇත. ඒවා නම් එහි පරිපාලිත සමාගම් වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම් හා සී/ස පීපල්ස් ට්‍රැවල්ස් සමාගම යන ආයතනවල මෙහෙයුම් හා බැංකුවේ ආශ්‍රිතයන් වන පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගමේ මෙහෙයුම් ද වෙයි.

මෙම බැහැර කරන ලද කොටස්වල මෙහෙයුම් අදාළ වන්නේ නම්, ඉදිරි තිරසාර බව පිළිබඳ වාර්තාවල ඒවාද ඇතුළත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනෙනු ඇත.

> මහජන බැංකුවේ අපට තිරසාර බව යනු අපගේ සියලු ජනතාව වෙනුවෙන් අපට ලබාදීමට අවශ්‍ය පොදු තත්ත්වයකි

## ප්‍රතිපෝෂණය

මෙම වාර්තාව මංගල ප්‍රයත්නයක් වීම හේතුවෙන් ප්‍රතිපෝෂණය අප අගය කරන්නේ මෙම අංශය කෙරෙහි අප දැඩි උනන්දුවක් දක්වන බැවිනි. අපගේ අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ උපායමාර්ගය සඳහා පාර්ශ්වකරුවන් වෙතින් ලැබෙන බාහිර ප්‍රතිපෝෂණය ප්‍රධාන සන්නිවේදන සංරචකයක් වෙයි. අදහස් හා යෝජනා ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනෙනු ඇති අතර, හැකි සෑම අවස්ථාවකම ආදේශ කර ගැනෙනු ඇත. ජාතිය සංවර්ධනය කිරීමට අප ප්‍රයත්න දැරීමේදී ප්‍රතිපෝෂණය අපගේ ස්ථාවරයට සහායක වී අප ශක්තිමත් කරනු ඇතැයි යන්න අපගේ මතය වේ. තවද, පාර්ශ්වකරුවන් සමග වඩාත් ඵලදායක නියුක්තිකරණයට හැකියාව ලබාදෙමින්, එය ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණයකට ද මග පාදනු ඇත.

මෙම වාර්තාව පිළිබඳ පැහැදිලි කරගැනීම් හෝ විමසීම් පහත ලිපිනයට යොමු කළ යුතුය:

කළමනාකරණ තොරතුරු අංශය
මහජන බැංකුව
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02, ශ්‍රී ලංකාව

## අපගේ තිරසාර බව පිළිබඳ දර්ශනය හා උපායමාර්ගය

තිරසාරබව පිළිබඳ වාර්තාකරණය සඳහා මෙය අපගේ සමාරම්භක ප්‍රයත්නය වීම හේතුවෙන් තිරසාරබව පිළිබඳ අපගේ දර්ශනය හා උපායමාර්ග බැංකුවේ දැක්ම හා මෙහෙවර සමග පෙළගැස්වීම කෙරෙහි අප අවධානය යොමු කර සිටින්නෙමු.

තිරසාර බව යනු අපගේ සියළු පාර්ශ්වකරුවන්ට දිගුකාලීන අගය සැපයීමයි. මහජන බැංකුවේ අපට, තිරසාර බව යනු අපගේ සියළුම ජනතාව වෙනුවෙන් අපට ලබාදීමට අවශ්‍ය පොදු තත්ත්වයකි. රටේ සංවර්ධනය කරා මෙහෙයවනු ලැබීමේ දී අපගේ ගනුදෙනුකාර භවතුන් හා ජාතිය අන්‍යොන්‍ය වශයෙන් ඇතුළුවීම අවශ්‍ය නොවේ. තිරසාර වර්ධනය කරා යොමු වූ ගෝලීය නැඹුරුව සමග රැඳී සිටීමේ අවශ්‍යතාව හඳුනාගනිමින් ශ්‍රී ලංකාව සංවර්ධනය කරා ගෙනයාමේ අපේ ඉලක්කය සමග තිරසාර බව අත්කර ගැනීමේ ඉලක්කය ඒකාබද්ධ කිරීමට හැකි බව අපි විශ්වාස කරන්නෙමු. එය අත්‍යවශ්‍යයෙන්ම පාදක වී ඇත්තේ අප වෙනුවෙන් හා අපගේ ජාතිය වෙනුවෙන් හොඳම දේ අවශ්‍ය වීමේ මූලධර්මය මතයි. මෙම ඉලක්ක අන්‍යොන්‍ය වශයෙන් ඇතුළත්ව තිබේ. මෙලෙස, විශේෂිත ජාතියක වර්ධනයට ආධාරක වීම සඳහා අප ව්‍යාපාර කටයුතුවල යෙදෙන ආකාරය තුළට විනිවිදභාවය හා වගවීම වැඩි දියුණු කරන වටිනාකම් හා පරිචයන් එක් කිරීමට අපි ප්‍රයත්න දරන්නෙමු.

තිරසාර බවට පත්වීමේ අපගේ නව අභිලාෂය තුළ විනිවිදභාවය හා වගවීම යන දෙකම සහිත වීම අපගේ දර්ශනය වේ: ප්‍රගතිය (හෝ ප්‍රගතිය අත්කරගැනීමට නොහැකි වීම) පිළිබඳව වාර්තා කිරීම, නිරවද්‍යතාව තහවුරු කිරීම සහතික කිරීම හා මෙම ග්‍රහලෝකයේ සම්පත්වලට භෞතික සීමාවන් ඇති බව අප පිළිගන්නා බැවින් භෞතික ක්‍රියාකාරකම්වලදී අපට පැහැදිලි ප්‍රමුඛතා ඇති බව සහතික කිරීම. අප බැංකුවක් වුවත්, පරිසරය සුරැකීම සඳහා අප සතු කාර්යභාරය ඉටු කිරීමට අපි කැපවී සිටින්නෙමු. මෙම කාර්යභාරය අද එතරම් කැපී නොපෙනෙන්නට ඉඩ ඇති නමුත් තිරසාර බව කරා යන ගමනේ අප පෙරට ගමන් කරන විට අපට ඉටු කළ හැකි දේ වර්ධනය වනු ඇති බව අපට විශ්වාසය.

## මහජන බැංකුව දැන් තිරසාර බව පිළිබඳ වාර්තාකරණය සිදු කරන්නේ ඇයි ?

**ඔබේ සිතට නැගෙනා මෙම පැනයට සාමාන්‍යාධිකාරී එන්. වසන්ත කුමාර් මහතා මෙසේ ප්‍රතිචාර දක්වයි...**

ඔබ හැම විටම දැන සිටි පරිදි අප බැංකුවේ අතීතය, මෙම බැංකුව ජාතියේ සංවර්ධනයෙහි අත්‍යවශ්‍ය කොටසක්වීම පෙන්නුම් කර ඇත. මෙයින් අදහස් වන්නේ අපගේ පනස් එක් වසරක ඉතිහාසයේ රටේ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ එයට වැදගත් දායකත්වයක් ලබා දෙන්නන් බවට පත්වීම සඳහා අප ශ්‍රී ලංකාවේ ජනතාවට මග පෙන්වා ඔවුන්ගේ හවුල්කරුවෙකු ලෙස ක්‍රියා කර ඇති බවයි. තවත් මතකයේ රඳවා ගත යුතු කරුණක් වන්නේ මහජන බැංකුව වන අප, අපගේ සමස්ත ඉතිහාසය පුරා, මෙම ඉලක්ක සපුරාගැනීම කෙරෙහි හැම විටම යොමුවී ඇති නිපැයුම් හා සේවා කළඹක් නවීකරණය කර, සකසා ඉදිරිපත් කර ඇති බවයි. තනි තනි ගනුදෙනුකාර භවතුන් සමග තොටිල්ලේ සිට අධ්‍යාපනය ලැබීමේ දී, තරුණ වියේ දී හා පසුව ජ්‍යෙෂ්ඨ පුරවැසියන් බවට පත්වූ පසු යන සෑම කල්හිම සිටීමේ දී හෝ, ගොවීන් සමග කෙතේ හෝ ආයතනික විධායක නිලධාරීන් සමග අගනුවර දී හෝ, අසීරුවෙන් උපයාගත් ඩොලර් තියුණු නුවණින් යුතුව ආයෝජනය කිරීම අවශ්‍ය වන විගමනික ශ්‍රමිකයන්ට උපදේශකයෙකු වීමේ දී හෝ, කොටස්හිමියන්ට ලාභ ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම සඳහා ආයතනික හා ව්‍යාපාර සංස්ථා හවුල්කරුවන් සමග එක්වීමේ දී හෝ ශ්‍රී ලංකාව සිය උසස් අපේක්ෂා සහිත ඉලක්ක සපුරා ගන්නා බව සහතික කිරීම සඳහා ජාතියේ යටිතල පහසුකම් ව්‍යාපෘතිවල මෙහෙයුම් කාර්යභාරය ඉටු කිරීමේ දී එය එසේම වී ඇත.

කෙසේ වෙතත්, මෙම ක්‍රියාමාර්ග පමණක්ම ප්‍රමාණවත් නොවේ. අපගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් යුතු වීමේ හා වගවීමේ වගකීම අප සතුය. අප ගන්නා ක්‍රියාමාර්ග නිවැරදි ද, පියවීමට අවශ්‍ය පරතරයන් පවතී ද, අප නිසි ආකාරයෙන් අපගේ පාර්ශ්වකරුවන්ට සලකන්නේ ද, සියලු පෙරමුණුවලදී තිරසාර සංවර්ධනය සඳහා වන අපගේ සැලසුම් අපේක්ෂිත ප්‍රතිඵල ලබාදෙන්නේද යන කරුණු දැනගැනීමද අපට අවශ්‍යය. තිරසාරබව පිළිබඳව වාර්තා කිරීමේ පරිපූර්ණ ක්‍රියාවලියක් වැදගත් වන්නේ මෙහි දී වන අතර, මෙම ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වීමට මහජන බැංකුව තීරණය කිරීමට හේතුව එයයි. රාජ්‍ය බැංකුවක් ලෙස, අප ජාතිය කෙරෙහි වන වගකීමෙන් බැඳී සිටින අතර, අපගේ තිරසාර බව අත් කර ගැනීමේ ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තා කිරීම මගින් අපගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අප බරපතල සැලකිල්ලක් දක්වන බව අපි අපගේ පාර්ශ්වකරුවන්ට පෙන්නුම් කරන්නෙමු. අපගේ සාධනීය තත්ත්වයන්ද නිෂේධාත්මක තත්ත්වයන් පිළිබඳව කටයුතු කිරීම ද, අපේ ශක්තිය වැඩි දියුණු කිරීම ද, අපගේ දුර්වලතා ශක්තීන් බවට පරිවර්තනය කිරීම ද, අභියෝග හා තර්ජන හඳුනාගැනීම හා පැන නගින අවස්ථා ග්‍රහණය කරගැනීම ද අපි මෙම වාර්තා කිරීමේ ක්‍රියාවලිය මගින් සැබවින්ම ප්‍රදර්ශනය කරන්නෙමු.

වර්තමාන ආර්ථික පරිසරය තුළ, වංචාව, අල්ලස හා දූෂණය පිළිබඳව ප්‍රකාශ සුලබය. ශ්‍රී ලංකා රජය අපගේ ප්‍රධාන කොටස්හිමියා වන බැංකුවක් ලෙස, අපි මෙම ස්වභාවයේ චෝදනා වලට ලක් වීමෙන් වැලකීමට අරමුණු කරගෙන සිටින්නෙමු. මෙබඳු ක්‍රියාවන් සම්බන්ධයෙන් අපගේ ප්‍රතිපත්ති සෑම විටම දැඩි වූ අතර, අපගේ සේවාදායකයන් අතර හා බැංකු ප්‍රජාව තුළ අප මේ දක්වා සුබදායක ප්‍රතිරූපයක් ආරක්ෂා කරගෙන ඇත. සියලු කටයුතු වලදී විනිවිදභාවය, වගවීම හා අනෙකුත් විශිෂ්ට පරිචයන් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම වාර්තාකරණ ක්‍රමයට අප ප්‍රවිෂ්ට වූයේ මෙම සාධනීය කීර්තිනාමය තවදුරටත් ශක්තිමත් කර ගැනීම පිණිසය. වාර්තාකරණ සංකල්පයක් ලෙස තිරසාර බව අපට නව සංකල්පයක් විය හැකිය. කෙසේ වෙතත්, අපගේ ජාතිය තිරසාර කර, ප්‍රවර්ධනය කර සංවර්ධනය කිරීම සඳහා වසර ගණනාවක් වෙහෙස නොබලා කටයුතු කර ඇති අපි, පාදක මතවාදයන් යෝග්‍ය බව විශ්වාස කරන්නෙමු.

වසර ගණනාවක් තිස්සේ මහජන බැංකුව ශ්‍රී ලංකාවේ ජනතාව අතර දැඩිව මුල් බැසගෙන සිට ඇත. ඉදිරි වසරවලදී ද අඛණ්ඩව යොදාගැනීමට අපේක්ෂා කරන බිම් මට්ටමේ සිට ඉහළට යොමු වූ ප්‍රවේශයක් අප ස්ථිර ලෙස ප්‍රවර්ධනය කර ඇත්තේ මේ හේතුවෙනි. මෙය මෙතෙක් අපගේ සියළු ක්‍රියාකාරකම්වල පෙරමුණේ වූ අතර, ඉදිරියටද එය එසේම වනු ඇත. එසේවතුදු, අප මෙම ප්‍රමුඛතාව තවත් වඩා ගෝලීය ඉලක්කයක්, එනම් අනාගතය වෙනුවෙන් අපගේ පරිසරය ආරක්ෂා කිරීම වෙනුවෙන් කටයුතු කිරීම සමග සම්බන්ධ කර ඇත. දියුණු වන ජාතියකට එයට සහාය සඳහා ආධාරක අවශ්‍ය වන බව අපි පිළිගන්නෙමු - මහපොළව හා අපගේ පරිසරයට වඩා හොඳ පදනමක් එයට නොමැත. එබැවින්, අප මෙම වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉමහත් ප්‍රීතියෙනි. ඔව්, පුළුල් සන්දර්භය තුළ අපගේ ප්‍රයත්නයන් අපූර්ව නොවීමට ඉඩ ඇත. එසේ වුවත්, ඒවා වඩා යහපත් පරිසරයක් වෙනුවෙන්, වඩා යහපත් තත්ත්වයක් සඳහා වෙනසක් වෙනුවෙන් ගනු ලබන ප්‍රයත්න වේ. මෙම වැඩි දියුණු කිරීම් මෙන්ම ඉදිරියේ දී අප ගන්නා පියවර ශ්‍රී ලංකාවේ හා ඇයගේ ජනතාවගේ දියුණුවට සහාය වන බව අපට විශ්වාසය.



**එන්. වසන්ත කුමාර්**
ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

2013 මාර්තු 22

## පාලනය හා අවදානම් කළමනාකරණය

පාලන හා අවදානම් කළමනාකරණ පරිචයන්, උපාය මාර්ග හා ප්‍රතිපත්ති මෙම වාර්ෂික වාර්තාවේ 87 වැනි පිටුවේ සිට 92 වැනි පිටුව දක්වාත් 95 වැනි පිටුවේ සිට 107 වැනි පිටුව දක්වාත් සවිස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

### අවදානම්වල බලපෑම අඩු කිරීම

බැංකුව පරිපූර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් යොදවා ඇති අතර, බැංකුවේ ව්‍යාපාර ඒකක අතරින් කවරක හෝ කවර හෝ අවස්ථාවක වංචාවක් සිදුවීමට ඉඩ ඇති හෙයින් අපි නිරන්තරවම අවධානයෙන් සිටින්නෙමු. එබැවින් එබඳු අකටයුතු සිදුවීම වැළැක්වීම සඳහා ප්‍රමාණවත් පරීක්ෂාවන් හා පාලනයන් හඳුන්වාදෙනු ලැබ ඇත. අදාළ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලවලට අනුබද්ධිත බැංකුවේ විගණන නිලධාරීන්, මෙම පරීක්ෂාවන් හා පාලන ව්‍යාපාර ඒකක මගින් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම හා අවශ්‍ය අවස්ථාවන්හි දී යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සෑම ශාඛාවකම සේවයේ යොදවා ඇත. ව්‍යාපාර ඒකක, ශාඛා හා සේවා මධ්‍යස්ථානවල වරින්වර සිදුකරන අභ්‍යන්තර විගණන මගින් එබඳු අවදානම හා සබැඳි දූෂණ සිදුවීමේ හැකියාව අවම කෙරේ.

### අනුකූලතාවෙන් ඔබ්බට යාම

රාජ්‍ය බැංකුවක් ලෙස, අපගේ සියලු මෙහෙයුම් ආවරණය කරන මූලධර්මයක් ලෙස අනුකූලතාව පවතින බව සහතික කිරීමට අපි බැඳී සිටින්නෙමු. අල්ලස් හා දූෂණ නොඉවසීම, මුදල් විශුද්ධිකරණය වැලැක්වීම හා වංචා සිදුවිය හැකි හා අනවශ්‍ය අවදානම් සහිත ක්ෂේත්‍ර අධීක්ෂණය කිරීම, මේ යටතට අයත් වේ.

කවර හෝ දූෂණ සිදුවීමක් අභ්‍යන්තර විගණන අංශය මෙන්ම පරීක්ෂණ හා විමර්ශන අංශය මගින් පරීක්ෂා කර විමර්ශනය කෙරෙනු ඇත. අදාළ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල ප්‍රධානීන් හෝ ප්‍රධාන කාර්යාල අංශ ප්‍රධානීන් විසින් පළමුවෙන් මූලික පරීක්ෂණ සිදු කර බැංකුවේ චර්යාධර්ම සංග්‍රහයෙහි විධිවිධාන යටතේ විනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබේ. සිදුවීමේ ස්වභාවය හා බරපතලකම මත පදනම්ව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ද (CID) පැමිණිලි කෙරේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එබඳු අවස්ථාවල සාමාන්‍යයෙන් සිදු කරන්නේ ඔවුන් හෙළිදරව් කරගන්නා කරුණු අනුව චූදිතයාට අධිකරණයක අධිචෝදනා ගොනු කිරීම වේ.

> විනිවිදභාවය සහතික කිරීම සඳහා අපගේ කැපවීමේ අංගයක් ලෙස, සමාජයමය වශයෙන් යෝග්‍ය සබඳතා ගොඩනැගීම සඳහා අප බහු ආංශික හා අපක්ෂපාතී සංවාදය වෙනුවෙන් පහසුකම් සැපයීමට උපාය මාර්ගික සන්නිවේදන ක්‍රම යොදාගෙන ඇත.

අනුකූලතා පරිසරය තුළ අප පවත්වාගන්නා ඉතා ඉහළ ප්‍රමිති හේතුකොටගෙන, පවත්නා නීති හා නියමයන්ට අනුකූල නොවීම හේතුවෙන් 2012 වර්ෂය තුළ බැංකුවට කිසිදු දඩ මුදලක් හෝ සම්බාධකයක් පැනවීමක් සිදු නොවිණි. තවද, වෙළඳ ප්‍රචාරක, ප්‍රවර්ධන හා අනුග්‍රාහකත්ව ඇතුළුව අලෙවි සන්නිවේදනයන් සම්බන්ධයෙන් නියමයන් හා ස්වේච්ඡා නීති සංග්‍රහයන්ට අනුකූල නොවීමේ සිදුවීම් කිසිවක් නොවීය.

**අපගේ කණ්ඩායම අනුකූලතා අවශ්‍යතා සමග පෙළගැස්වීම**

අඛණ්ඩව විකාශනය වන පරිසරයක් තුළ අධීක්ෂණ හා පාලන ක්‍රියාපටිපාටි යාවත්කාලීන කළ යුතු බව සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් යුතුව, පරම අනුකූලතාව පවත්වාගැනීම සඳහා වගකීම දරන අදාළ කණ්ඩායම් සාමාජිකයන්ගේ කුසලතා හා දැනුම මුවහත් කරන පුහුණු වැඩසටහන් මෙහෙයවීම අභ්‍යන්තර විගණන අංශය නිරන්තරයෙන්ම සිදු කරයි. 2012 වර්ෂය තුළ දී, බැංකුවේ විගණන නිලධාරීන් ද ඇතුළුව කණ්ඩායම් සාමාජිකයෝ 644 දෙනෙක් අදාළ පුහුණු වැඩසටහන්වලට සහභාගි වූහ.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත හා ත්‍රස්තවාදීන්ට මූල්‍ය සම්පාදනය වැළැක්වීමේ පනත යන පනත්වල අවශ්‍යතා පිළිබඳ කණ්ඩායම් දැනුවත් කිරීම පිණිස, අනුකූලතා අංශය නිරන්තරයෙන්ම ශාඛා ජාලය හරහා මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම පිළිබඳව පුහුණු සැසි පවත්වයි.

2012 වර්ෂය තුළ දී, අනුකූලතා අංශය බැංකුවේ සේවකයන් 1,317 දෙනෙකු (18%) වෙනුවෙන් පුහුණු සැසි 16 ක් පැවැත්වූයේය. තවද කළමනාකරුවන් 191 දෙනෙකු මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා අනුකූලතා අංශය කළමනාකරුවන්ගේ සම්මේලන දහයක් ඇමතුවේය.



# සමාජය




**අප සත්‍ය වශයෙන්ම ජනතාව වෙනුවෙන් ඔවුන් සමගම සිටියි නම් පමණක් අපගේ නමෙහි අර්ථය හරවත් වෙයි.** අපි නිහතමානී අභිමානයෙන් යුතුව සියලු ප්‍රජාවන්, ප්‍රදේශ සහ සමාජ ආර්ථික තලවලට අයත් ජනතාවට එකසේ සේවය කරන්නෙමු. බැංකු ක්ෂේත්‍රයට ඇතුළත්වී නොමැති ජනතාව බැංකු ක්ෂේත්‍රයට ඇතුළත් කරගෙන අභිමානයෙන් සහ සෞභාග්‍යයෙන් ජීවත්වීම සඳහා ඔවුන්ව සවිබල ගැන්වීම පිණිස බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක වීමට හැකි වීම සම්බන්ධයෙන් අපි විශේෂයෙන්ම අභිමානවත් වන්නෙමු.

ගනුදෙනුකාර හවතුන්ගේ ගිණුම්

# 14 න් 10 ක්ම

බස්නාහිර පළාතෙන් බැහැර ඒවා වේ




රු. බිලියන **12.3**

රජයට දායකත්වය

# 68%

අපගේ සේවා සැපයුම් මධ්‍යස්ථාන වලින් 68% ක් බස්නාහිර පළාතෙන් බැහැර පිහිටා ඇත.

රු. මිලියන

# 222

කෘෂි පාදක කර්මාන්ත සඳහා ලබා දී ඇත.

| පුහුණු වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | පුද්ගල පැය |
|---|---|---|---|
| මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම පිළිබඳ පුහුණුව | 16 | 1,317 | 5,268 |
| කළමනාකරුවන්ගේ සම්මේලන | 10 | 191 | 573 |

## සේවාවන් පිළිබඳ වගකීම

මහජන බැංකුව ශ්‍රී ලංකාවේ ජනතාවගේ පළමු තේරීම බවට පත් කිරීම අපගේ ඉලක්කය වේ. එමගින් අප මූල්‍ය අංශයේ පෙරමුණේ සිටිනු ඇති අතර, ස්ථාවර සමාජයක් ප්‍රවර්ධනය කර සියළු ශ්‍රී ලාංකිකයන්ට ඉහළ ජීවන තත්ත්වයක් සහතික කිරීමේ රජයේ අභිලාෂයන්ට සහාය වීමට අපට හැකි වනු ඇත. මෙය ඉටු කිරීම සඳහා, පාර්ශ්වකරුවන්ට හානිදායක හෝ අවාසි සහගත වියහැකි සැඟවුණු ලක්ෂණ කිසිවක් නොමැතිව අපගේ නිපැයුම් හා සේවා කළඹ විවෘත හා විනිවිදභාවයෙන් යුතු බව අපගේ ගනුදෙනුකාර භවතුන් හා පාර්ශ්වකරුවන් හැම විටම දැනුවත්ව සිටින තත්ත්වයක් ඇති කරමින් සදාචාරමය වගකීම හා සබැඳි පදනමක සිට අපගේ නිපැයුම් හා සේවා හැමවිටම සංකල්පනය කර සකස් කෙරෙන බවට අපි වග බලා ගන්නෙමු.

## උපායමාර්ගික සන්නිවේදන ප්‍රවේශය

මාධ්‍ය හා ඒ හා සබැඳි පාර්ශවකරුවන් සමග කටයුතු කිරීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයට හා බාහිර නියෝජිතයන්ට මෙහෙයුම් නිර්ණායක ලබාදීම අපගේ ප්‍රතිපත්තිය වේ. අපේක්ෂිත ප්‍රතිඵලයක් අත්කර ගැනීම සඳහා ක්‍රියාකාරකම්, රූප හා වචන සම්බන්ධ කිරීම හා සමකාලිකකරණය ලෙස අපි උපායමාර්ගික සන්නිවේදනය අර්ථ දක්වන්නෙමු. මෙලෙස, අපි උපායමාර්ගික සන්නිවේදන අභිප්‍රායන් හා සබැඳිව සංවර්ධන ප්‍රතිපත්තිමය අරමුණු සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන්නෙමු. දැනුවත් බව, උනන්දුව හා විමසීමට හේතුවන ද්‍රව්‍ය හා තොරතුරු නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිය, අපගේ ප්‍රවේශය පැහැදිලිව දක්වයි.

## සන්නිවේදනය පාලනය හා මැනීම

බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වන ගනුදෙනුකාර භවතුන්ගේ ප්‍රඥප්තිය හා චර්යාධර්ම සංග්‍රහය සමග අනුකූලව සියළු ආකාරයේ සන්නිවේදන සිදුකිරීමට මහජන බැංකුව බැඳී සිටින්නේ සත්‍ය තොරතුරු, සාධාරණ බැංකුකරණ පරිචයන්හි සම්මතයන්වල මූලික අංගයක් වන බව සහතික කිරීම පිණිස වේ. එබැවින් සියලු සන්නිවේදන ක්‍රියාවලි, තේමා, ඉලක්ක හා නියුක්තිකරණ ක්‍රම රජයේ සංවර්ධන ප්‍රතිපත්ති හා උපායමාර්ගික දැක්ම අනුව සැකසීම හා යොදාගැනීම සිදු කෙරේ.

වෙළඳ ප්‍රචාරක ක්‍රම, ආයතනික සන්නාමයෙහි ඉලක්ක හා ප්‍රමුඛතා අනුව යෙදවෙනු ඇති අතර, සන්නිවේදන ආයෝජනවල අගය උපරිම මට්ටමට ගෙන ඒම සඳහා තැන්පතු ඒකරාශී කිරීමට මුලපිරීම් කලින් තීරණය කරන ලද හා කලින් අනුමත කරන ලද සන්නිවේදන අයවැයක් අනුව ක්‍රියාත්මක වනු ඇත.

## විනිවිදභාවයෙන් යුතු හා අන්තර්ක්‍රියාකාරී සන්නිවේදනය

විනිවිදභාවය සහතික කිරීම සඳහා අපගේ කැපවීමේ අංගයක් ලෙස, සමාජමය වශයෙන් යෝග්‍ය සබඳතා ගොඩනැගීම සඳහා අප බහු ආංශික හා අපක්ෂපාතී සංවාදය වෙනුවෙන් පහසුකම් සැපයීමට උපායමාර්ගික සන්නිවේදන ක්‍රම යොදා ගෙන ඇත. සීඝ්‍රයෙන් වෙනස්වන ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් සියළු සන්නිවේදන ද්‍රව්‍ය ගනුදෙනුකාර භවතුන් සම්බන්ධ කරගැනීම සඳහා අදාළ හා නැවුම් ඒවා වනු ඇත.

## කොටස්හිමියන් සමග සන්නිවේදනය

බැංකුවේ ප්‍රධාන කොටස්හිමියෙකු ලෙස ශ්‍රී ලංකා රජයේ තත්ත්වය අනුව, අපි මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සමග අඛණ්ඩ සංවාදයක් පවත්වාගන්නෙමු. නිරන්තරයෙන් රැස්වීම් පැවැත්වෙන අතර, බැංකුවේ ප්‍රාදේශීය කළමනාකාරිත්වයෙහි සාමාජිකයෝ හා සමූපකාර සමිති නියෝජිතයෝ එම රැස්වීම්වලට සහභාගි වෙති. තවද, මහා සභාවේ රැස්වීම් ද ක්‍රමානුකූලව පැවැත්වෙන අතර, කොටස්හිමියන්ගේ මත ලබාගැනීම හා ඔවුන්ට අදාළ ගැටළු විසඳීම සඳහා මහා සභාව රැස් වෙයි.

## සේවකයන් සමග සන්නිවේදනය

'බිම් මට්ටමේ සිට ඉහළට' ප්‍රවේශය බැංකුවේ සෑම අංශයක දීම, විශේෂයෙන්ම බැංකුවේ ප්‍රධාන සංරචකයන් අතරින් එකක් වන අපගේ සේවකයන්ට අදාළව උපයෝගී කර ගැනේ. බැංකුවේ සමස්ත උපායමාර්ගික දිශානතිය, ආයතනික සැලැස්ම හා වාර්ෂික අයවැය සම්බන්ධයෙන් විවිධ ගැටළු පිළිබඳව ආයතනික කළමනාකාරිත්වයෙහි සියළු සාමාජිකයන් සමග අඛණ්ඩ සංවාදයක් පවත්වාගනු ලැබේ.

විධායක කළමනාකාරිත්වයෙහි සාමාජිකයන්, ප්‍රාදේශීය කළමනාකරුවන් හා ශාඛා කළමනාකරුවන් ඉලක්ක සම්බන්ධයෙන් දැනුවත් කිරීමට හා අතීත කාර්යසාධනය ඇගැයීම සඳහා ආයතනික කළමනාකාරිත්වය ඔවුන් සමග නිරන්තර රැස්වීම් පවත්වයි. වරින්වර පැවැත්වෙන කළමනාකරුවන්ගේ සම්මේලනයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සමග ඇගැයීම සිදු කෙරේ. කළමනාකරුවන්ගේ සම්මේලනයට සහභාගිවන්නන් උනන්දුවක් දක්වන කරුණු මතුකර පැහැදිලි කිරීම් බලාපොරොත්තු විය හැකි පොදු වේදිකාවක් සපයන බැවින් එය බැංකුවට අතිශයින් වැදගත් වේ. බැංකුව එහි වෘත්තීය සමිති සමග  සමීපව කටයුතු කරන අතර, යහපාලනය සම්බන්ධ කරුණු පිළිබඳව නිරන්තරයෙන් ඔවුන්ගෙන් අදහස් විමසනු ලැබේ.

## සන්නාම අගය/ ස්ථානගත කිරීම

මෙම අංශයේදී සෑම කෙනෙකුගේම මනසෙහි ඉදිරියෙන්ම සිටීමටත් ජනතාවගේ පළමු තේරීම වීමටත් අපට අවශ්‍යව ඇත. 'සිතේ ඉහළින්ම ඇති සන්නාමය' සන්නාම ස්ථානගත කිරීමේ දී අප සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන ඉලක්කය වේ. නිර්මාණාත්මක හා නැවුම් ප්‍රවේශයන් යොදාගනිමින් මෙය ඉටු කරගැනීම අප අරඹා ඇත. තවද, සන්නිවේදන තේමාවන් අපගේ ශක්තිය, ස්ථාවරබව, විශ්වාසය හා පහසුවෙන් ළඟා විය හැකි බව යන අපගේ හර වටිනාකම් සමග අනුකූලව පවතින බව තහවුරු කිරීමට ද අප පියවර ගෙන ඇත.

## පාර්ශ්වකාර ප්‍රවේශයන්

මහජන බැංකුවේ අප පෝෂණය කරන පාර්ශ්වකාර පරිසරය සියල්ලන් ඇතුළත් කරගන්නා එකක් වන අතර, කවර හෝ සංස්කෘතික, වාර්ගික හෝ ආගමික පදනමකින් වෙනස් කොට සැලකීමක් සිදු නොකෙරේ. සමාජයේ සියළු කොටස් හා සම්බන්ධ වී ශ්‍රී ලාංකික සංස්කෘතියේ විවිධත්වය පවත්වාගැනීමට අපට අවශ්‍යය. තවද, සිවිල් සමාජය, ප්‍රජා නායකයන්, රජයේ හා ප්‍රදේශයේ තීරණ ගන්නන් යන දියුණුවේ දී අපගේ හවුල්කරුවන් සමග සම්බන්ධව කටයුතු කිරීමට අපි අරමුණු කරගෙන සිටින්නෙමු. බාධක හා අභියෝගවලට මුහුණදීමේ දී අපට අවශ්‍ය කරන අතිරේක ශක්තිය ලබාදීම සඳහා අප කාර්යක්ෂම හා අනුකූල කරන ලද ක්‍රියාවලි ආදේශ කරගෙන ඇති අතර, එමගින් ප්‍රගතිය සහතික කිරීම සඳහා අපගේ පාර්ශ්වකරුවන් සමග ඒකාබද්ධව කටයුතු කිරීමට හැකියාව ලැබේ.

අපගේ ප්‍රධාන පාර්ශවකරුවන් හා පසුගිය වර්ෂයේ අප එළඹි නියුක්තිකරණ ක්‍රියාවලි සහිත වගුවක් පහත දක්වා ඇත:

| පාර්ශවකාර වර්ගය | නියුක්තිකරණ ක්‍රමය |
|---|---|
| රජය | • පොදු වේදිකා හා සම්මේලන |
| | • රැස්වීම් |
| | • පුවත්පත් නිවේදන |
| | • වාර්ෂික වාර්තා |
| | • අන්තර්වාර මූල්‍ය වාර්තා |
| | • පුවත්පත් සාකච්ඡා හා මාධ්‍ය නිවේදන |
| | • ආයතනික වෙබ් අඩවිය |
| | • රැස්වීම් හා ටෙලි සම්මේලන |
| නියාමකයන් | • අදාළ ස්ථානවලට පැමිණීම |
| | • සාකච්ඡා හා රැස්වීම් |
| (ශ්‍රී ලං. ම. බැ, මු. අ., ශ්‍රී ලං.ව.ග.ආ. යනාදිය) | • වාරික සමාලෝචන සැසි |
| | • අනුකූලතා අංශය ශ්‍රී ලං. ම. බැ. සමග සම්බන්ධීකරණය |
| | • අන්තර්වාර මූල්‍ය ප්‍රකාශන |
| සේවකයන් හා වෘත්තීය සමිති | • කාර්ය මණ්ඩල රැස්වීම් |
| | • නිශ්චිත ප්‍රතිලාභ සැලසුම |
| | • අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ කාර්යසාධනය |
| | • අභ්‍යන්තර චක්‍රලේඛන |
| | • වෘත්තිය සමිති සමග මුහුණට මුහුණලා රැස්වීම් |
| | • සේවක සමීක්ෂණ |
| | • කාර්යසාධන සමාලෝචන පද්ධති |
| | • සේවකයන් පුහුණු කිරීමේ වැඩමුළු හා සැසි |
| | • විද්‍යුත් තැපැල් ප්‍රකාශන |
| | • ප්‍රශ්න විචාරාත්මක තරඟ, කාර්යමණ්ඩලයේ ළමුන් වෙනුවෙන් පැවැත්වෙන සාදයන්, ආගමික ක්‍රියාකාරකම් යනාදී විශේෂ අවස්ථා |
| ගනුදෙනුකාර හවතුන් | • ශාඛා හා සේවා මධ්‍යස්ථාන |
| | • වාර්ෂික වාර්තා |
| | • ආයතනික වෙබ් අඩවිය |
| | • ලිඛිත සන්නිවේදනය හා ප්‍රතිචාර |
| | • ඇමතුම් මධ්‍යස්ථානය |
| | • පුවත්පත් නිවේදන |
| | • ගනුදෙනුකාර හවතුන්ගේ රැස්වීම් |
| | • ගනුදෙනුකාර හවතුන්ගේ තෘප්තිමත් බව පිළිබඳ සමීක්ෂණ |

| පාර්ශවකාර වර්ගය | නියුක්තිකරණ ක්‍රමය |
|---|---|
| ප්‍රජාව | • ආයතනික සමාජ වගකීම් සඳහා මුලපිරීම් |
| | • ආයතනික වෙබ් අඩවිය |
| | • අනුග්‍රහය දැක්වීම් |
| | • ශිෂ්‍යත්ව |
| | • පොදු අවස්ථා |
| | • සම්මේලන |
| | • ශාඛා |
| | • මාධ්‍ය |
| | • ඇමතුම් මධ්‍යස්ථානය |
| මාධ්‍ය | • පුවත්පත් නිවේදන |
| | • වාර්ෂික වාර්තා |
| | • පුවත්පත් සාකච්ඡා |
| | • ආයතනික වෙබ් අඩවිය |
| | • අන්තර්වාර මූල්‍ය ප්‍රකාශන |
| | • මාධ්‍ය හමුවීම් |
| සැපයුම්කරුවන් | • අදාළ ස්ථාන කරා ගොස් පවත්වනු ලබන රැස්වීම් |
| | • මුද්‍රිත මාධ්‍යවල ප්‍රසිද්ධ දැන්වීම් |

## ආර්ථික කාර්යසාධනය

අප මහා භාණ්ඩාගාරයට සෘජුවම දායක වී එමගින් ශ්‍රී ලංකාවේ සංවර්ධන උපායමාර්ග හා ව්‍යාපෘති සඳහා දායක වන බැවින් අපගේ ආර්ථික කාර්යසාධනය ජාතියේ ප්‍රගතිය සමග සමීපව බැඳී ඇත. අප සමග ඇති ඔවුන්ගේ ආයෝජන ජාතියේ අභිවෘද්ධිය ඇති කිරීමේදී කාර්යභාරයක් ඉටු කරන්නේය යන දැනුම හා විශ්වාසය අපගේ ගනුදෙනුකාර භවතුන් තුළ ඇත.

අවධානයට ලක්වන වර්ෂය සඳහා, මහජන බැංකුව රු. බිලියන 94.8 ක දළ ආදායමක් ජනනය කළ අතර එය පසුගිය වසරේ දළ ආදායම වූ රු. බිලියන 68.3 ට වඩා 38.8% ක වර්ධනයකි. ජාතික භාණ්ඩාගාරයට දක්වන ලද රු. බිලියන 4.5 ක දායකත්වය සමග අපගේ කාර්යසාධනයේ ප්‍රතිලාභ රජයේ වර්ධනය විශාල ලෙස ශක්තිමත් කර ඇත.

**අපගේ ආර්ථික කාර්යසාධනය ජාතියේ ප්‍රගතිය සමග බැඳී පවතී.**

එකතු කළ අගය පිළිබඳ ප්‍රකාශනය හා ආදායම් මූලාශ්‍ර හා උපයෝජනය විශ්ලේෂණය කිරීම පිළිවෙලින් 244 හා 255 පිටු වල දක්වා ඇත.

## රජයෙන් ලද සුවිශේෂී මූල්‍ය සහාය

ශ්‍රී ලංකා රජය දැනට බැංකුවේ හිමිකාරත්වයෙන් 92% ක් උසුලයි. මෙලෙස බැංකුවේ ප්‍රගතිය හා සංවර්ධනය කෙරෙහි රජයට දැඩි බැඳියාවක් ඇත. රජයේ මූලාශ්‍ර වෙතින් මහජන බැංකුවට කැපී පෙනෙන මූල්‍යමය සහායක් සැපයෙන බව මවිතයට කරුණක් නොවේ. තිරසාර බව පිළිබඳ වාර්තා කිරීමේ විනිවිදභාවය පිළිබඳ මූලධර්ම අනුව යමින් සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ බැංකුව ලබා දුන් ණය හා ප්‍රදාන පහත දැක්වේ:

| මාතෘකාව | යෝජනා ක්‍රමයේ නම | කොන්දේසි හා ප්‍රදානය කරන්නා | හිමිකම් ලබන අංශය | 2012 දෙසැම්බර් 31 දින වන විට ප්‍රදානය කර ඇති ණය සංඛ්‍යාව | 2012 දෙසැ 31 දිනට හිඟ ණය වල සමුච්චිත මුදල රු. මිලියන |
|---|---|---|---|---|---|
| පොළී සහනාධාර යෝජනා ක්‍රමය | රජයේ සේවකයන් සඳහා විශේෂ නිවාස ණය යෝජනා ක්‍රමය | රු. 500,000 දක්වා - 10.5%<br>රු. 500,000 සිට මිලියන 1.0 දක්වා - 6.5%<br>රු. මිලියන 1.0ට වැඩි - 3.5%<br>ශ්‍රී ලංකා රජයෙන් පොළී සහනාධාරය | වසර 5 ක සේවා කාලයක් ඇති හා විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති සේවයේ ස්ථිර කරන ලද රජයේ සේවකයන් | 37,887 | 25,591.6 |
| | වි.ප්‍ර.කො. යටතේ ඇති විශ්ව විද්‍යාල වල සේවකයන් වෙනුවෙන් නිවාස ණය යෝජනා ක්‍රමය | රු. මිලියන 1.0 දක්වා - 5.5%<br>රු. මිලියන 1.0 සිට රු. මිලියන 2.0 දක්වා - 5.0%<br>ශ්‍රී ලංකා රජයෙන් පොළී සහනාධාරය | 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ ලියාපදිංචි කරන ලද විශ්වවිද්‍යාලයක වසර පහක සේවා කාලය ඇති සේවයේ ස්ථිර කරන ලද සේවකයන් | 130 | 149.9 |
| | මාධ්‍යවේදීන්ට යතුරුපැදි, පරිගණක, කැමරා හා මාධ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා සහන පදනමින් ණය යෝජනා ක්‍රමය | 9% පොළිය ශ්‍රී ලංකා රජයෙන් සහනාධාරය | ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයෙන් නිර්දේශිත මාධ්‍යවේදීන් | 152 | 8.8 |

### කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන යෝජනා ක්‍රමය

| මාතෘකාව | යෝජනා ක්‍රමයේ නම | කොන්දේසි හා ප්‍රදානය කරන්නා | හිමිකම් ලබන අංශය | 2012 දෙසැම්බර් 31 දින වන විට ප්‍රදානය කර ඇති ණය සංඛ්‍යාව | 2012 දෙසැ 31 දිනට හිඟ ණය වල සමුච්චිත මුදල රු. මිලියන |
|---|---|---|---|---|---|
| ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන පහසුකම් ව්‍යාපෘතිය | නියෝජිත - ලෝක බැංකුව<br>උපරිම ණය මුදල - මිලියන 60<br>ණයගැනීමේ පොළී අනුපාතය - මාස හයක AWDR<br>ණය දීමේ පොළී අනුපාතය - මාස හයක AWDR + 2%<br>උපරිම කාලසීමාව - වසර 10<br>සහන කාලය - වසර 2 | කෘෂිකර්ම ව්‍යාපෘති<br>අගය එකතු කිරීම සහිත කවර හෝ කර්මාන්තයක් හෝ සේවාවක්<br>ඉදි කිරීම්<br>කිරි හා ආශ්‍රිත නිෂ්පාදන<br>අධ්‍යාපනය<br>ධීවර කර්මාන්තය<br>ඇඟලුම් කර්මාන්තය<br>සෞඛ්‍ය සේවා<br>කර්මාන්ත<br>පශු සම්පත්<br>විසිතුරු මසුන්<br>මුද්‍රණ<br>සේවා<br>සංචාරක කර්මාන්තය | 31 | 264.1 |

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ඒකකය හා ක්ෂුද්‍ර මූල්‍ය අංශය ප්‍රජාවගේ අභිවෘද්ධිය ඇති කිරීමේ අපගේ සංකල්පයේ අනිවාර්ය සංරචකයන් වන බැවින් ඒවා මහජන බැංකුවේ මුඛ්‍ය අංශ වේ. සියල්ලන් ඇතුළත් කරගන්නා දියුණුව බිම් මට්ටමේ සිට ඉහළට යොමු වූ ප්‍රවේශයකින් දිරිගැන්විය යුතු බව අප විශ්වාස කරන හෙයින් සියල්ලන් ඇතුළත් කරගෙන ජාතියට සංවර්ධනය අත්කරදීමට බැංකු කාර්යභාරය ඉටු කිරීමේදී මෙම අංශ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

මෙම වගු හොඳින් පරීක්ෂා කිරීමෙන්, අපගේ ප්‍රයත්නයන් මගින් ප්‍රතිලාභ ලබන අංශ හා ආරෝහණ සචලතාව (Upward Mobility) හා ජීවනෝපාය සංවර්ධන සඳහා සහායවීම පිණිස මහජන බැංකුව මගින් ප්‍රදානය කෙරෙන ණය පිළිබඳව තොරතුරු ලබාගත හැකි වේ.

## සංවර්ධන හා ක්ෂුද්‍ර මූල්‍ය අංශය

| යෝජනා ක්‍රමයේ නම | කොන්දේසි හා ප්‍රදානය කරන්නා | | හිමිකම් ලබන අංශය | 2012 දෙසැම්බර් 31 දින වන විට ප්‍රදානය කර ඇති ණය සංඛ්‍යාව | 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ණය වල සමුච්චිත මුදල රු. මිලියන |
|---|---|---|---|---|---|
| 1. පොළී සහනාධාරය | | | | | |
| කෘෂි නවෝදය ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | | කෘෂිකර්ම | 8,108 | 17.3 |
| කෘෂි පශුසම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% & 2% | පශු සම්පත් | 3,872 | 220.7 |
| පුනරුත්ථාපනය සාර්ථකව නිම කළ සමාජය සමෝධානිත පුහුණුවන්නන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමේ ණය යෝජනා ක්‍රමය (REPPIA) | පුද්ගලයන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය | 8% | පුනරුත්ථාපන වැඩසටහන සාර්ථකව නිම කළ සමාජ සමෝධානිත පුහුණු වන්නන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම | 479 | 76.5 |
| NCRCS – වගා ණය 2012/13 - 2012/13 මහ | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% | කෘෂිකර්මය | 9,754 | 786.5 |
| NCRCS – වගා ණය 2011/12 - 2012/13 මහ | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% | | 7,254 | 334.5 |
| NCRCS – වගා ණය 2011 යල | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% | | 15,125 | 293.6 |
| NCRCS – වගා ණය 2011 යල | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% | | 7,015 | 28.7 |
| NCRCS – වගා ණය 2010/11 මහ | ශ්‍රී ලංකා මහ බැංකුව | 6% | | 13,258 | 48.3 |
| උප එකතුව | | | | 64,865 | 1,805.8 |
| 2. ප්‍රතිමූල්‍ය | | | | | |
| පිබිදෙන උතුර (චක්‍රීය අරමුදල) | ශ්‍රී ලංකා මහ බැංකුව | 90% | කෘෂිකර්ම හා ආර්ථික ක්‍රියාකාරකම් | 787 | 117.9 |
| පිබිදෙන නැගෙනහිර (චක්‍රීය අරමුදල) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කෘෂිකර්ම හා ආර්ථික ක්‍රියාකාරකම් | 1,109 | 149.6 |
| පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 90% | කෘෂිකර්ම හා ආර්ථික ක්‍රියාකාරකම් | 5,787 | 223.0 |
| පිබිදෙන නැගෙනහිර ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කෘෂිකර්ම හා ආර්ථික ක්‍රියාකාරකම් | 3,521 | 174.3 |
| පළාත් සංවර්ධන යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කෘෂිකර්ම හා ආර්ථික ක්‍රියාකාරකම් | 3,120 | 739.3 |
| විස්කම් ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කෘෂිකර්ම හා පශුසම්පත් | 184 | 372.2 |
| දරිද්‍රතාව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘති චක්‍රීය අරමුදල (PAMP RF) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කුඩා කර්මාන්ත හා කෘෂිකර්මය | 314 | 13.4 |
| දරිද්‍රතාව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය (PAMP - 11) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කුඩා කර්මාන්ත හා කෘෂිකර්මය | 12,160 | 245.4 |
| සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | ක්ෂුද්‍ර හා කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් | 1,549 | 298.3 |
| වියළි කලාප ජීවනෝපාය සහාය හා හවුල්කාරිත්ව වැඩසටහන් ණය යෝජනා ක්‍රමය (භාග්‍යා ණය යෝජනා ක්‍රමය) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කෘෂිකර්ම හා ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාකාරකම් | 1,062 | 28.8 |

| යෝජනා ක්‍රමයේ නම | කොන්දේසි හා ප්‍රදානය කරන්නා | | හිමිකම් ලබන අංශය | 2012 දෙසැම්බර් 31 දින වන විට ප්‍රදානය කර ඇති ණය සංඛ්‍යාව | 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ණය වල සමුච්චිත මුදල රු. මිලියන |
|---|---|---|---|---|---|
| දසුන ණය යෝජනා ක්‍රමය | ජාතික සංවර්ධන බැංකුව | 100% | කෘෂිකර්ම හා ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාකාරකම් | 82 | 12.8 |
| ස්වයං රැකියා සංවර්ධන ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | තමන්ගේම ස්වයං රැකියා ඇති කරගැනීමට පිළිගත් වෘත්තිය පුහුණු ආයතන වලින් පුහුණුව ලැබූ තරුණ තරුණියන් | 237 | 24.9 |
| පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන හා සම්පත් කළමනාකරණ වැඩසටහන (PTCRRMP) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | සුනාමි ව්‍යසනයෙන් හානියට පත් ප්‍රජාවන්ගේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් | 670 | 35.3 |
| SPEnDP ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කෘෂිකර්ම හා ක්ෂුද්‍රමූල්‍ය ක්‍රියාකාරකම් | 149 | 14.2 |
| කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය | පොල් වගා කිරීමේ දෙපාර්තමේන්තුව | 100% | පොල් වගාව හා සංවර්ධනය | 1,074 | 38.8 |
| දරිද්‍රතාව පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘතිය (PAMP) ණය යෝජනා ක්‍රමය (N&E) හා චක්‍රීය අරමුදල | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කුඩා කර්මාන්ත හා කෘෂිකර්මය | 9,699 | 24.6 |
| දරිද්‍රතාව පිටුදැකීමේ කුඩා ව්‍යවසාය සංවර්ධන ණය යෝජනා ක්‍රමය (NDTF ණය යෝජනා ක්‍රමය) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | කුඩා කර්මාන්ත හා කෘෂිකර්මය | 2,041 | 6.8 |
| තේ සංවර්ධන ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 87% | තේ වගාව | 172 | 24.3 |
| විදාතා ණය යෝජනා ක්‍රමය | ජාතික සංවර්ධන භාරකාර අරමුදල | 100% | තමන්ගේම ස්වයං රැකියා ව්‍යාපෘති ඇරඹීම සඳහා විදාතා මධ්‍යස්ථාන වෙතින් පුහුණුව ලැබූ පුද්ගලයින් | 1,889 | 9.6 |
| සබරගමුව පළාත් සමෝධානිත ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (SPIRDPRF) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | සබරගමු පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම | 248 | 3.0 |
| කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය | පොල් වගාකිරීමේ දෙපාර්තමේන්තුව | | පොල් වගාව හා සංවර්ධනය | 25 | 13.6 |
| පරිසර හිතකාමී විසඳුම් චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය | ජාතික සංවර්ධන බැංකුව | 100% | ඕනෑම පරිසර හිතකාමී විසඳුමක් සඳහා | 1 | 0.4 |
| කුසලතා සංවර්ධන ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | තාක්ෂණික කාර්යයන් සඳහා | 84 | 2.4 |
| බහු වාර්ෂික බෝග සංවර්ධන ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | වගාව | 219 | 1.3 |

| යෝජනා ක්‍රමයේ නම | කොන්දේසි හා ප්‍රදානය කරන්නා | | හිමිකම් ලබන අංශය | 2012 දෙසැම්බර් 31 දින වන විට ප්‍රදානය කර ඇති ණය සංඛ්‍යාව | 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ණය වල සමුච්චිත මුදල රු. මිලියන |
|---|---|---|---|---|---|
| ජීවන ශක්ති | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | ක්ෂුද්‍ර මූල්‍ය අංශ | 980 | 2.4 |
| තේ සහන පැකේජය (කාරක ප්‍රාග්ධන ණය) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | තේ වගාව සඳහා | 7 | 22.3 |
| ඉදිකිරීම් අංශ සංවර්ධන ව්‍යාපෘතිය (CSDP) | ශ්‍රී ලංකා මහ බැංකුව | 100% | ඉදිකිරීම් සඳහා | 16 | 44.5 |
| උප එකතුව | | | | 47,186 | 2,642.9 |
| 3. වෙනත් | නැත | | | | |
| මුළු එකතුව | | | | 112,051 | 4,449 |

## සමාජ බලපෑම

අපගේ නමින් හැඟවෙන පරිදි, අපේ පැවැත්ම සඳහා තීරණාත්මක සාධකය වන්නේ ජනතාවයි. එබැවින්, සමාජ තිරසාර බව පිළිබඳ දෘෂ්ටිකෝණයකින් අපගේ ක්‍රියාකාරකම් හා එම ක්‍රියාකාරකම් මගින් ජනතාව මත ඇති කෙරෙන බලපෑම ගොඩනැඟී ඇත්තේ පරාර්ථකාමිත්වය මත නොව ජනතාවගේ හා සංවිධාන වල ධාරිතා වර්ධනය කෙරෙහි අප දක්වන උනන්දුව මතය. අපගේ කණ්ඩායමේ මූලාරම්භයන් හා ව්‍යාපෘතිද ඇතුළුව පාර්ශවකරුවන් විසින් මෙහෙයවන මූලාරම්භයන් හා ව්‍යාපෘති සඳහා පෙළඹවීමේ හා මෙම සමාජ මානයන් තුළට සමාජ සවිඥාණකත්වය සමෝධානය කිරීමේ ක්‍රියාවලියක් අප අරඹා ඇත. තිරසාර බව අපගේ සබැඳි පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගන්නා සියල්ලන්ම ඇතුළත් හා පූර්වාපේක්ෂණ ක්‍රියාවලියක් විය යුතු බව විශ්වාස කරන අප ඒ අනුව කටයුතු කරන්නෙමු. අපගේ සමාජමය වගකීම් තුළට අපගේ කණ්ඩායම හා අප වටා සිටින ප්‍රජාවද ඇතුළත් කර ගැනෙන අතර ඔවුන් කෙරෙහි අපගේ බැඳීම දෙදිශාවට යොමු වූ ක්‍රියාවලියකි. අපගේ පාර්ශ්වකරුවන් වෙනුවෙන් තිරසාර හා සවිබල ගන්වන ලද පදනමක් ගොඩනැඟීම අප අවධාරණය කරන අතර එකී පදනම ජාතියේ දියුණුවට ජවය සපයනු ඇත.

## ශ්‍රම පරිචයන් හා යෝග්‍ය රැකියා

### අපව පෙරට ගෙන යන කණ්ඩායම

මහජන බැංකුවේ අපගේ කණ්ඩායම අපගේ දැක්ම හා මෙහෙවර කෙරෙහි අවධානය කේන්ද්‍රගත කරගෙන සිටින්නකි. එමගින්, ඔවුන් සිය කාර්යයන් ඉටු කරමින් පෙරට යාමේදී තිරසාර බවට අදාළ පරිචයන් එක් කරගනු ඇති බව අපට විශ්වාසය. ඒ හා සමානවම අප, හොඳම සේවකයන් පමණක් බඳවා ගැනීම, සංවර්ධනය කිරීම හා රඳවාගැනීම කෙරෙහි කැපවූ සේව්‍යයෙකු වන අතර අපගේ ජාතික සංවර්ධන සැලැස්ම සාර්ථක කරගත හැකි වන්නේ දක්ෂතම සේවකයන් සමග පමණක්මය යන්න අපගේ ප්‍රතිපත්තිය වේ. එබැවින් අපි ගෝලීය විශිෂ්ට පරිචයන්, සම්මතයන් හා තිරසාරබව සහතික කිරීමට අපගේ පිරිස උත්ප්‍රේරණය කරන්නා වූ ස්ථාවර හා සවිබල ගැන්වූ සේවා පරිසරයක් නිර්මාණය කිරීමට අරමුණු කරගෙන සිටින්නෙමු.

මහජන බැංකුව සතු 10,685 ක ශ්‍රම බලකායක් අතරින් 7,823 ක් ස්ථිර සේවකයෝද, 2,862 ක් බාහිර ආයතන වෙතින් ලබාගත් සේවකයෝ හා විශ්ව විද්‍යාල වලට තේරී සිටින්නෝ වෙති. අපගේ ස්ථිර සේවකයන්ගෙන් 95% ක් සාමූහික කේවල් කිරීමේ ගිවිසුමකින් ආවරණය කරනු ලැබ සිටිති.

### මානව සම්පත් ප්‍රතිපත්ති හා මූලධර්ම

- බැංකුව සමාන අවස්ථා සපයන සේව්‍යයෙකු වේ.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රතිපත්ති, ශ්‍රී ලංකා කම්කරු රෙගුලාසි හා අනෙකුත් ශ්‍රම පරිචයන්ට අනුකූලව බැංකුව කටයුතු කරයි.
- අසාධාරණ සැලකීම හෝ ළමා ශ්‍රමය ලබාගැනීම බැංකුව සිදු නොකරන අතර ප්‍රවර්ධනය නොකරයි.
- ඉහළම දක්ෂතා ඇති තැනැත්තන් පාලනය හා සමානාත්මතාව බැංකුව ප්‍රවර්ධනය කරයි.
- අල්ලස, දූෂණය පිළිකුල් කෙරෙන අතර හිතාමතාම වැළැක්වීම සිදු කෙරේ.
- තෙවන පාර්ශ්ව කොන්ත්‍රාත්කරුවන් අපගේ චින්තනයට අනුව කටයුතු කළ යුතු බවත් කම්කරු රෙගුලාසි වලට හා යහපත් සේව්‍ය පරිචයන්ට අනුකූල විය යුතු බවත් බැංකුව අවධාරණය කරයි.

ඔහු හෝ ඇය දිවයිනේ කවර ස්ථානයක සිටින්නේද යන කරුණ නොසලකා බැංකුව සෑම සාමාජිකයෙකුටම සමාන අවස්ථා ලබාදීමට කැප වී සිටින ආකාරය පහත වගුවෙන් විදහා දැක්වේ:

## 2012 දෙසැම්බර් 31 වැනි දිනට මුළු සේවක සංඛ්‍යාව

| | වර්තමාන පිරිස් බලය |
|---|---|
| **2012 දෙසැම්බර් 31 වැනි දිනට සේවකයින්** | 7,449 |
| **කොන්ත්‍රාත් සේවකයන්** | |
| ආයතනික හා විධායක කළමනාකාරීත්වය | |
| ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී | 1 |
| ආයතනික කළමනාකාරීත්වය | 5 |
| | 6 |
| **අනෙකුත් කොන්ත්‍රාත් සේවකයන්** | |
| වෙළෙඳපොළ බුද්ධි/කළමණාකරණ තොරතුරු පද්ධති සහකාර | 1 |
| සහකාර ඉංජිනේරු | 3 |
| සහකාර නීති නිලධාරී | 13 |
| ජ්‍යෙෂ්ඨ අධිකරණ සහකාර | 1 |
| අධිකරණ ලිපිකරු | 14 |
| විගණන නිලධාරී | 1 |
| මාධ්‍ය සහකාර | 1 |
| යතුරුලේඛක | 50 |
| බහුකාර්ය සහකාර | 37 |
| විදුලි කාර්මික | 9 |
| ජලනල කාර්මික | 1 |
| රියැදුරන් | 10 |
| තාක්ෂණික සහකාර | 3 |
| **කොන්ත්‍රාත් සේවකයන් (ආයතනික, විධායක හා වෙනත්)** | **150** |
| කළමනාකරණ අභ්‍යාසලාභීන් | 210 |
| ගනුදෙනුකාරභවතුන් සඳහා සේවා සහකාර (කොන්ත්‍රාත්) | 14 |
| **මුළු කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව** | **374** |
| **2012 දෙසැම්බර් 31 වැනි දිනට බැංකුවේ මුළු සේවක සංඛ්‍යාව (බාහිර ආයතන වලින් ලබාගත් සේවකයන් රහිතව)** | **7,823** |
| විශ්ව විද්‍යාලයට තේරී සිටින්නන් | **904** |
| බාහිර ආයතනවලින් ලබාගත් සේවකයන් | **1,958** |
| **2012 දෙසැම්බර් 31 වැනි දිනට බැංකුවේ මුළු සේවක සංඛ්‍යාව** | **10,685** |

## පිරිස් බලය - ස්ථිර කාර්ය මණ්ඩල ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව විශ්ලේෂණය

| 2012 දෙසැම්බර් 31 වැනි දිනට | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| ආයතනික කළමනාකාරිත්වය | 12 | 5 | 17 |
| විධායක කළමනාකාරිත්වය | 19 | 10 | 29 |
| නිලධාරීන් (3-III - I ශ්‍රේණිය) | 1,565 | 1,640 | 3,205 |
| මාණ්ඩලික සහකාර ශ්‍රේණිය | 1,191 | 2,078 | 3,269 |
| වෙනත් කාණ්ඩ | 654 | 281 | 935 |
| කළමනාකරණ අභ්‍යාසලාභීන් | 81 | 129 | 210 |
| ගනුදෙනුකාර භවතුන් සඳහා සේවා සහකාරවරුන් | 2 | 12 | 14 |
| වෙනත් කොන්ත්‍රාත් සේවකයන් | 45 | 99 | 144 |
| එකතුව | **3,569** | **4,254** | **7,823** |

## පිරිස් බලය - ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව විශ්ලේෂණය (3 - 1 හා එයට ඉහළ ශ්‍රේණි)

| 2012 දෙසැම්බර් 31 වැනි දිනට | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| ආයතනික කළමනාකාරිත්වය (ස්ථිර හා කොන්ත්‍රාත්) | 12 | 5 | 17 |
| විධායක කළමනාකාරිත්වය (ස්ථිර හා කොන්ත්‍රාත්) | 19 | 10 | 29 |
| ප්‍රධාන කළමනාකරුවන් (I ශ්‍රේණිය) | 45 | 21 | 66 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් (II ශ්‍රේණිය) | 83 | 61 | 144 |
| කළමනාකරුවන් (3-I) | 198 | 140 | 338 |
| එකතුව | **357** | **237** | **594** |

### බඳවාගැනීම

අප අදහන විවිධත්වය තුළ ඒකීයත්වය අපගේ සාර්ථකත්වයට හේතු වූ බව අපි දැඩිව විශ්වාස කරන්නෙමු. බැංකුව තුළ අප සතු කණ්ඩායම් සංස්කෘතිය ඉහළ මට්ටමේ ඉලක්ක සාක්ෂාත් කරගැනීම, ඉවසීම, එක්සත් බව හා ව්‍යවසායකත්වය යන ලක්ෂණ වලින් සැදුම් ලැබුවකි. සෑම සේවකයෙකුම කණ්ඩායමක් ලෙස තනි තනිව තමාට කළ හැකි උපරිමයට වඩා වැඩි දායකත්වයක් ලබා දීම සහතික කෙරෙන සැලසුම් සහගත දැක්මක් තුළ අපගේ බහු සංස්කෘතික හා බහුමානයන්ගෙන් යුතු කණ්ඩායම ප්‍රවේශමෙන් තෝරා ගනු ලැබ ඇත. මෙය කණ්ඩායමේ සෑම සාමාජිකයෙකුම තම වෘත්තිය අභිලාෂයන් සාක්ෂාත් කරගන්නා වූ අනාගත අභියෝග ජය ගැනීම සඳහා කණ්ඩායමක් ලෙස මෙහෙයවනු ලබන, ඉහළ ජයග්‍රහණ අත්කරගන්නා සංස්කෘතියක් තහවුරු කරන පරිසරයක් නිර්මාණය කිරීම පිණිස සම්මිශ්‍රණ සාධකය බව අපි විශ්වාස කරන්නෙමු.

මානව සම්පත් කළමනාකරණයේදී, ඇබෑර්තු විනිවිදභාවයෙන් යුතු ලෙස ප්‍රසිද්ධියට පත් කිරීම හා සම්පූර්ණ තෝරාගැනීමේ ක්‍රියාවලියම ඒ හා සමාන විනිවිදභාවයෙන් යුතු ක්‍රමයකින් සිදුකිරීම අවශ්‍ය කරන රජයේ මෙහෙයුම් නිර්ණායක වලට අපගේ බඳවාගැනීම් ක්‍රියාවලිය අනුකූල වේ. අභ්‍යන්තර වශයෙන්, අපගේ වාර්ෂික අයවැය සැකසීම් ක්‍රියාවලිය හරහා ආයතනයට අවශ්‍ය වන අභ්‍යන්තර හා බාහිර කුසලතා හඳුනාගැනීමේ නිවැරදි ක්‍රමයක් බැංකුව සකස් කරගෙන ඇති අතර අපේක්ෂකයන්ගේ බහුවිධ කුසලතා විමසා බැලීම සිදු කරන සියලු කාර්යාංශ නියෝජනය කරමින් සැදුම්ලත් තේරීම් මණ්ඩලයක් හරහා ශක්තිමත් තේරීම් ක්‍රියාවලියක් ස්ථාපනය කර ඇත.

තෝරාගැනීමෙන් පසු, එක් එක් ප්‍රවේශ මට්ටම මත පදනම් වෙමින් වැඩ පරිසරයට බාධා විරහිතව මාරුවීම සහතික කරන අදාළ ප්‍රවිෂ්ටකරණ වැඩසටහනකට අළුතින් බඳවාගත් සියලු සේවකයින් සහභාගි කරනු ලැබේ.

### ප්‍රතිලාභ හා ත්‍යාග

මූල්‍ය හා මූල්‍ය නොවන පිළිගැනීම හා එක්වූ සාධාරණ හා යුක්ති සහගත පාරිශ්‍රමික, තෘප්තිමත් ශ්‍රම බලකායක් සිටින බව තහවුරු කිරීම සඳහා අනිවාර්ය බව අපි නිසැකවම විශ්වාස කරන්නෙමු. විශේෂයෙන්ම රාජ්‍ය අංශය සඳහා පවතින නීති යටතේ මහජන බැංකුව පවතින නමුත් පෞද්ගලික අංශයේ පවතින විශිෂ්ට පරිචයන්ද ඇතුළත් කරගන්නා බව සැලකූ කල, සැලකිය යුතු ප්‍රතිලාභ හා ත්‍යාග හිමිවන බව සැලකිල්ලට ගත යුතුය.

වර්ධනය හා ප්‍රගතිය හා බැඳුණු අපගේ ආකල්ප අනුව යමින්, සමාජයේ අනිවාර්ය සංරචකයක් ද වන අපගේ සේවකයන්ට අප ලබාදෙන ප්‍රතිලාභ අප ක්‍රියාත්මක වන ආකාරය හා පරස්පර නොවේ. පහත සඳහන් පහසුකම් ඇතුළු පුළුල් පරාසයක වන ප්‍රතිලාභ, මහජන බැංකුවේ ස්ථිර සේවකයන් භුක්ති විඳිති.

- වාර්ෂික ප්‍රසාද දීමනා හා කාර්යසාධන දිරිදීමනා යෝජනා ක්‍රමය
- ආයතනික කළමනාකාරිත්වය වෙනුවෙන් වාහන පහසුකම් හා විධායක කළමනාකාරිත්වය වෙනුවෙන් ප්‍රවාහන දීමනා
- කාර්ය මණ්ඩල නිල නිවාස හා නිවාඩු නිකේතන
- පෞද්ගලික අර්ථසාධක අරමුදලක්
- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය
- පරිපූර්ණ මරණ පාරිතෝෂික යෝජනා ක්‍රමය
- පුද්ගල හදිසි අනතුරු රක්ෂණ ආවරණය
- පරිපූර්ණ වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක්
- කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රම (සහන පොළී අනුපාතික සහිතව)
- වෘත්තික සංගම් දායකත්වය/ප්‍රසාද මුදල් ගෙවීම්

## විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය

රාජ්‍ය අංශයේ සේවය කිරීමේ එක් සුවිශේෂී වාසියක් වන්නේ විශ්‍රාම ගැනීමේදී විශ්‍රාම වැටුපක් පිළිබඳ සහතිකයයි. පෞද්ගලික අංශය සඳහා පුළුල් විශ්‍රාම වැටුප් සැලසුමක් ශ්‍රී ලංකාවේ නොමැති හෙයින් වියපත් වන ජනගහනයට විශ්‍රාම ගැනීමේ දී විශ්‍රාම වැටුපක් සැපයීමේ හැකියාව මගින් රාජ්‍ය අංශය සැලකිය යුතු පිළිගැනීමකට ලක් වේ. කර්මාන්තයේ සිටින දක්ෂතම තැනැත්තන්ට ඔවුන්ගේ වැඩ කරන වර්ෂ වලට ඔබ්බෙන්ද ස්ථිර වේතන ප්‍රතිලාභ සහතික කරමින් ඔවුන්ව ආකර්ෂණය කරගැනීම බැංකුව අඛණ්ඩව සිදු කර ඇති හෙයින් එහි මුළු ඉතිහාසය පුරාම බඳවාගැනීමට හා රඳවාගැනීමට අදාළව සැලකිය යුතු වාසි අත්කර ගෙන ඇත.

### නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්ම

***1996ට පෙර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය***

1996 ජනවාරි 1 වැනි දිනට පෙර බැංකුවේ සේවයට බැඳුණු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයෝ මෙම නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබති. වෙනම පාලනය වන අරමුදලකට දායකත්වයන් යොමු කරනු ලැබේ. ප්‍රක්ෂේපිත ප්‍රතිලාභ ආයුගණක තක්සේරු ක්‍රමය භාවිතා කරමින් මෙම සැලසුම යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය ව්‍යුත්පන්න කෙරේ. අදාළ මූල්‍ය වර්ෂයේ දී ආයුගණක ලාභ හෝ අලාභ ආදායම් හෝ වියදම් ලෙස පූර්ණ ලෙස හඳුනාගනු ලැබේ.

නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකමින්, මෙතෙක් හඳුනා නොගත් අතීත සේවා පිරිවැය, බැඳීම් සෘජුවම පියවීමට භාවිත කළ යුතු සැලසුම් වත්කම් වල සාධාරණ අගය හා මෙතෙක් හඳුනා නොගත් ආයු ගණක අලාභ අඩු කිරීමෙන් ලැබෙන අගයන්වලින් නිශ්චිත ප්‍රතිලාභ වත්කම් හෝ බැරකම් සෑදුම් ලබයි. මෙතෙක් හඳුනා නොගත් කවර හෝ ආයුගණක අලාභ හෝ අතීත සේවා පිරිවැය හා සැලසුමෙන් ආපසු ගෙවීම් ආකාරයෙන් ලැබෙන යම් ආර්ථික ප්‍රතිලාභ වල වර්තමාන අගය හෝ සැලසුමට අනාගත දායකවීම් වල අඩුවීම් වල වර්තමාන අගයේ මුළු එකතුවට කවර හෝ වත්කමක අගය සීමා වේ.

ඇමෙරිකානු ආයුගණක හා උපදේශක ආයුගණක අධ්‍යයන ආයතනයේ සාමාජික පියල් එස් ගුණතිලක මහතා F.S.A. (එ.ජ.) විසින් 2011 ජනවාරි 1 වැනි දින අවසන් වරට ආයුගණක තක්සේරුව සිදු කරන ලදී.

මෙම තක්සේරුවේදී භාවිතා කරන ලද 2011 ජනවාරි 1 වැනි දිනට ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| පොලී/වට්ටම් අනුපාතය | වර්ෂයකට 10% |
| ජීවන වියදම් දීමනාවේ වැඩිවීම | වර්ෂයකට 5% |
| සියළු ශ්‍රේණි සඳහා මූලික වැටුප වැඩිවීම | වර්ෂයකට 7% |

පහත සඳහන් කොන්දේසි මත විශ්‍රාම ලබන්නන්ට විශ්‍රාම වැටුප් සැපයේ:

වසර 10 ක සේවා කාලයකට පසු හා අවුරුදු 55 ක් වන විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමේදී කාර්ය මණ්ඩලය විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ලබයි. සේවා කාලයේ විචල්‍යයන් මත විශ්‍රාම වැටුපේ ප්‍රමාණය රඳා පවතී.

| සේවා කාලය | විශ්‍රාම වැටුප් ප්‍රමාණය |
|---|---|
| i. වසර 10 - 20 | අවසන් වරට ලැබූ වැටුපෙන් 80% |
| ii. වසර 21 - 29 | අවසන් වරට ලැබූ වැටුපෙන් 80% අමතරව වසර 20 ඉක්මවන සෑම වසරක් වෙනුවෙන්ම 1% එකතු කෙරේ. |
| iii. වසර 30 හා ඊට වැඩි | අවසන් වරට ලැබූ වැටුපෙන් 90% |

විශ්‍රාම වැටුප් අරමුදල් එදිනෙදා බැංකුකරණ සේවාවන්ගෙන් වෙන්කොට පවත්වා ගැනෙන අතර, ස්වාධීන බාහිර විගණකයන් විසින් සිදු කරන වාර්ෂික විගණනයකට යටත් වේ. භාරකාර මණ්ඩලය ප්‍රකාශන හා විගණන වාර්තා සමාලෝචනය කරයි. ප්‍රශස්ත මට්ටම් වලින් අරමුදල් සැපයීම සහතික කිරීමට බැංකුව බැඳී සිටින හෙයින් බැංකුවේ හෙළිදරව් කිරීම් සමාලෝචනය සඳහා ද මෙම ලේඛන ඉදිරිපත් කෙරේ. ප්‍රතිලාභියාගේ අභාවය තෙක් මාසිකව විශ්‍රාම වැටුප ගෙවනු ලැබේ.

### පාරිතෝෂිකය

1996 ජනවාරි 1 වැනි දින හෝ ඉන් පසුව බැංකුවේ සේවයට බැඳුණු සේවකයින් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පාරිතෝෂිකයනට හිමිකම් ලබන අතර, පාරිතෝෂිකය වෙනුවෙන් තම අයිතිය අත්හරිමින් යෝජිත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඇතුළු වීම තෝරාගැනීමට ඔවුන්ට අවස්ථාව ඇත. සේවය අවසන් කරනු ලැබූ සේවකයන්ගෙන් වසර පහකට වැඩි කාලයක් සේවය කර ඇත්තවුන් සේවය අවසන් කරන ලද මූල්‍ය වර්ෂයේ අවසාන මාසයට අදාළ වන දළ වැටුපෙන් අඩක් ලෙස අඛණ්ඩ සේවා කාලයේ සෑම වර්ෂයක්ම වෙනුවෙන් සේවාවසාන පාරිතෝෂිකයකට, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම පනත යටතේ හිමිකම් ලබයි.

එබඳු පාරිතෝෂික ගෙවීම් බැරකම් වෙනුවෙන් බැංකුව මාසිකව මුදලක් වෙන් කරන අතර 2007 දෙසැම්බර් 31 වැනි දින දක්වා බැංකුවේ ශේෂ පත්‍ර වල එය පිළිබිඹු වේ. ඉන් අනතුරුව පාරිතෝෂික සූත්‍රය මත මුදල් වෙන් කිරීම සිදු කරන ලදී. 2008 දී බැංකුව පාරිතෝෂික බැරකම පිළිබඳව ආයුගණක තක්සේරුවක් ලබාගත් අතර එය පෙර පැවති පාරිතෝෂික සූත්‍රයට වඩා අඩු අගයක් දැක්වීය. බැංකුවේ අඩු සේවක පිරිවැටුම සැලකූ කල, අප වඩාත්ම විචක්ෂණ පාරිතෝෂික ක්‍රියා පටිපාටිය දිගටම පවත්වාගැනීමට ඉඩ ඇත.

මහජන බැංකුවේ පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම පනත යටතේ පාරිතෝෂික ගෙවයි. ඒ අනුව, මෙම සමාගම් අතරින් කවරක හෝ වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත. මෙම බැරකම් සඳහා බාහිර ලෙස අරමුදල් සැපයීමක් සිදු නොවේ.

**නිශ්චිත දායකත්ව සැලසුම්**

බැංකුව නිෂ්චිත දායකත්ව සැලසුමක්ද පරිපාලනය කරයි. මෙම සැලසුමට කෙරෙන දායකත්වය සේවකයන් විසින් බැංකුවට ලබාදෙන සේවාවන්ට අනුව සිදු කෙරේ. මෙම දායක මුදල් 'පුද්ගල වියදම්' යටතේ වියදම් ලෙස ගිණුම් ගත කෙරේ. නොගෙවූ දායක මුදල් බැරකම් ලෙස සැලකෙන අතර ඒ අනුව ගිණුම් ගත කෙරේ.

> තමන්ගේ ප්‍රගතිය මෙන්ම බැංකුවේ ප්‍රගතිය ද අත්කර ගැනීමේ දී පූර්වාපේක්ෂණ ක්‍රියාකාරිත්වය සහිත වීමට කණ්ඩායම් සාමාජිකයන් පොළඹවමින් සංවර්ධනය පෝෂණය කරන්නා වූ අභියෝගාත්මක පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් අපගේ සමස්ත පුහුණු කිරීම් හා සංවර්ධන ක්‍රියාවලියම ගොඩනැගී තිබේ.

**1996න් පසු විශ්‍රාම වැටුප් සැලැස්ම**

1996 ජනවාරි 1 වැනි දිනෙන් පසු අපගේ සේවයට බැඳුණු ස්ථිර සේවකයින් මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් තුළින් ප්‍රතිලාභ ලැබීමට නියමිතව සිටිති. මෙම නව යෝජනා ක්‍රමය ආරම්භයක් ලෙස බැංකුව, බැංකුවේ පාරිතෝෂික අරමුදලින් රු. මිලියන 198 ක් මාරු කළේය. තවද, අතිරේක රු. මිලියන 854 ක් ද අරමුදලට එක් කර ඇති අතර 2012 දෙසැම්බර් 31 වැනි දිනට මෙම අරමුදලේ රු. බිලියන 1.1ක මුළු මුදලක් තිබිණි. මෙම වැඩසටහනට සුදුසුකම් ලබන 4,187 ක් සේවකයන් අතරින් 3,300ට වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී මෙම අරමුදල් පිළිබඳ උද්යෝගය නොවෙනස්ව පැවතී ඇත. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 2013 දී ක්‍රියාත්මක වීමට නියමිතය.

**වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සැලැස්ම (1996ට පෙර)**

සුදුසුකම් ලත් ආයුගණකවරයෙකුගේ  උපදෙස් මත පදනම්ව බැංකුව අනාගත බැඳීම් වෙනුවෙන් වෙනම අරමුදලක් නඩත්තු කරයි. ජීවත්ව සිටින වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් හා අනාථ දරුවන් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ගෙවීම මෙම අරමුදලින් සිදු කෙරේ.

පහත සඳහන් යෝජනා ක්‍රම වලට බැංකුව දායක වේ.

**සේවක අර්ථසාධක අරමුදල**

අතිකාල දීමනා හැර, සේවකයාගේ මාසික දළ වැටුපෙන්, බැංකුව විසින් 12% ක් ද, සේවකයා විසින් 8% ක් ද වශයෙන් මෙම අරමුදලට දායකත්වය සපයනු ලැබේ. බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල සේවක අරමුදල් පනත යටතේ අනුමත අරමුදලකි. එය අභ්‍යන්තර ලෙස පවත්වාගනු ලැබේ.

**සේවක භාරකාර අරමුදල**

සේවක භාරකාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වා ගෙනයනු ලබන සේවක භාරකාර අරමුදලට, අතිකාල දිමනා හැර, සේවකයාගේ මාසික දළ වැටුපෙන් 3% ක දායකත්වයක් බැංකුව විසින් සපයනු ලබයි.

**පශ්චාත් සේවා නියුක්ති වෛද්‍ය ප්‍රතිලාභ**

බැංකුව විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රම මත පදනම්ව අවශ්‍යතාව පැනනගින පරිදි බැංකුව පශ්චාත් සේවා නියුක්ති වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම සිදු කරයි.  අනාගතයේ දී ගෙවීමට සිදුවිය හැකි අසාමාන්‍ය ලෙස ඉහළ අගයක් ගත් වෛද්‍ය වියදම් වෙනුවෙන් වෙනම වෛද්‍ය අරමුදලක් නඩත්තු කෙරේ. අවශ්‍ය පරිදි හා අවශ්‍ය අවස්ථාවල මෙම අරමුදල උපයෝජනය කළමනාකාරිත්වයෙහි අභිමතය පරිදි සිදු කෙරේ.

## පුහුණු කිරීම හා සංවර්ධනය

ගෝලීයකරණය වූ පරිසරයකට අනුකූල වීමට, ගැලපීමට හා ඒ තුළින් විශිෂ්ටත්වය අත් කර ගැනීමට අපගේ ජනතාව සංවර්ධනය කිරීම අපගේ පුහුණුකිරීම් හා සංවර්ධන න්‍යාය පත්‍රයේ ස්ථාවර පදනමක් සාදයි. එබැවින් තමන්ගේ ප්‍රගතිය මෙන්ම බැංකුවේ ප්‍රගතිය ද අත්කර ගැනීමේ දී පූර්වාපේක්ෂණ ක්‍රියාකාරිත්වය සහිත වීමට කණ්ඩායම් සාමාජිකයන් පොළඹවමින් සංවර්ධනය පෝෂණය කරන්නා වූ අභියෝගාත්මක පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් අපගේ සමස්ත පුහුණු කිරීම් හා සංවර්ධන ක්‍රියාවලියම ගොඩනැගී තිබේ. මේ හේතුවෙන් ගෝලීය වශයෙන් භාවිතා කෙරෙන ක්‍රමවේදයන් භාවිතා කරමින් පුහුණු කිරීම් හා සංවර්ධන සැලසුම් කෙටුම්පත සැකසෙන අතර කණ්ඩායම් හා සාමාජිකයන් වෙතින් යොජනා හා අදහස් ලැබුණු විට අදාළ වන්නේ නම් ඒවාද ඇතුළත් කරගනු ලැබේ.

| | |
|---|---|
| වසරකට පුහුණු කිරීම් පැය ගණන | 142,068 |
| සේවකයන් සංඛ්‍යාව | 7,823 |
| වසරකට සේවකයෙකුට සාමාන්‍ය පුහුණුකිරීම් පැය ගණන | 18 |

## මෙහෙයුම් වෙනස්කම් සම්බන්ධයෙන් දැනුම්දීමේ අවම කාලසීමාව

අපේක්ෂිත මෙහෙයුම් වෙනස්කම් සම්බන්ධයෙන් දැනුම්දීමේ අවම කාලසීමාවක් සාමූහික ගිවිසුම යටතේ නියම කර නොමැත.

කළමනාකරණ ක්‍රියාවලි වල සියලු වෙනස්කම් සේවක සංගම් සමග සාකච්ඡා වලින් පසුව සිදු කෙරෙන අතර එය කර්මාන්තයෙහි සාමය පවත්වාගැනීමට උපකාර වන අතර, බැංකුවේ විනිවිද භාවයට ද දායක වේ.

## අප අපගේ ප්‍රජාව සමග කටයුතු කරන ආකාරය

අපගේ සමාජ තිරසාර බව පිළිබඳ පදනම පැතිරී ඇති සංකල්පය වන්නේ සමාජ හා ආර්ථික වශයෙන් සියල්ලන් ඇතුළත් කරගැනීමයි. තිරසාර සවිබලගැන්වීම සහතික කිරීමේ පදනම මත අප නිපැයුම් සකසා ඇති අතර මහජන බැංකුවේ දැක්මම සමාජ තිරසාර බව සම්බන්ධයෙන් වූවක් බව මෙහිදී සඳහන් කිරීම වැදගත් වේ. එබැවින් ප්‍රජාව සමග අපගේ නියුක්තිකරණය සහතික වශයෙන්ම මෙම අංශය කේන්ද්‍රගත කරගත්තකි.

ශ්‍රී ලංකාවේ උරුමය සුරැකීම, සාක්ෂරතාව සංවර්ධනය කිරීම, කාන්තාවන් සවිබල ගැන්වීම හා ක්‍රීඩා සංවර්ධනය යන අපගේ තිරසාර බව පිළිබඳ මූලික පදනම් හා අනුකූලව අපගේ ශාඛා විසින් ප්‍රාදේශීය වශයෙන් ප්‍රජා ව්‍යාපෘති හඳුනාගැනීම අපගේ ප්‍රජා සත්කාරයේ ආරම්භක පියවර වේ.

මෙය සිදුකර ශාඛා කළමනාකරුගේ අනුමැතිය ලබාගැනීමෙන් පසු, ප්‍රාදේශීය වශයෙන් සිදු කළ හැකි ව්‍යාපෘතියක් සම්බන්ධ මෙහෙයුම් නිර්නායක සමග එම ව්‍යාපෘතිය අනුකූල වන්නේ නම්, ශාඛාව එය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරයි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ප්‍රමාණයෙන් විශාල වූවක් නම්, යෝජනාව අලෙවි කළමනාකරු හා අදාළ කාර්ය ඒකක නියෝජනය කරන කණ්ඩායමට ඉදිරිපත් කෙරෙන අතර ඔවුහු ව්‍යාපෘතිය හා තිරසාර බව සම්බන්ධ බැංකුවේ අරමුණු ඉටුකරගැනීමට එහි වැදගත්කම සාකච්ඡා කරති. අනුමත වුවහොත්, ව්‍යාපෘතිය සැලසුම් කළ තැනැත්තාට එය දැනුම්දීම සිදුවන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මුළුල්ලේම මධ්‍යම ආයතනයෙන් සමීප අධීක්ෂණය සිදු කර ව්‍යාපෘතිය අවසන් වූ පසු අවසන් වාර්තාවක් ඉල්ලීම සිදු කෙරේ. ව්‍යාපෘතියේ සාර්ථකත්වය, බලපෑම හා යම් අඩුපාඩු තිබිනි නම් ඒවාද අවසන් වාර්තාවේ සඳහන් කෙරෙනු ඇති අතර එය ඉදිරි ක්‍රියාකාරකම් සඳහා ඉගෙනුම් මෙවලමක් ලෙස යොදාගැනීමට හැකි වනු ඇත.

### ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය සුරැකීම

සිරිත් පරිදි, ආසියාවේ විශාලතම සංස්කෘතික සංදර්ශනය ලෙස සැලකෙන ශ්‍රී දළදා මාලිගාවේ වාර්ෂික විචිත්‍රවත් උත්සවය වන ඇසළ මහා පෙරහැරට හවුල්කරුවෙකු වීමේදී මහජන බැංකුව පෙරමුණ ගත්තේය. මහේශාක්‍ය ඇඳුමින් සැරසුණු අලි ඇතුන්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන නැටුම් වර්ග හතරම නියෝජනය කරන නැටුම් ශිල්පීන් සමග ශ්‍රී දළදා මාළිගාව සතු මාහැඟි වස්තුව වන බුදුරජාණන්වහන්සේගේ දන්ත ධාතුව ප්‍රදර්ශනය කරමින් කන්ද උඩරට අගනගරය වන මහනුවර නගරයේ වීථි සංචාරය කරන මෙම විචිත්‍රවත් පෙරහැර ශ්‍රී ලංකාවේ සංස්කෘතික දින දර්ශනයේ අතිශයින්ම වැදගත් අංගයක් වන අතර මහනුවර රාජධානි සමයේ සිට පැවත ආ ඉපැරණි සම්ප්‍රදායන් හා උරුමයන් සුරකී.

බෝසත් උපත හා බුදුරජාණන්වහන්සේගේ බුද්ධත්වයට පැමිණීම හා පරිනිර්වාණය සමරමින් ශ්‍රී ලංකාවේ ඉතා විචිත්‍රවත් ලෙස සැමරෙන වෙසක් උත්සවයට හවුල්වීම මහජන බැංකුව දෙහිවල ප්‍රජාවගේ වෙසක් උත්සව සැමරුම් වලට හවුල් වීමෙන් සිදු විය. එමෙන්ම ශ්‍රී ලංකාවට බුදුදහම ගෙන ඒම සැමරෙන පොසොන් පොහෝ දින බුදු දහමේ හදවත වන් අනුරාධපුරයේ පැවති භක්ති ගී වැඩසටහන සමග අපි රැඳී සිටියෙමු.

ශ්‍රී ලංකාවේ දුර බැහැර ගම්මාන වල සිරිත් විරිත් වේගයෙන් මැකී යමින් පවතී. මතු කර දක්වා සුරැකීම සිදු නොවුවහොත් එම සාරධර්ම හා සිරිත් විරිත් එදිනෙදා ජීවිතයෙන් අතුරුදහන් වීමට ඉඩ ඇත. සිරස කඩමණ්ඩිය වැඩසටහන සඳහා කැපිටල් මහරාජා සමූහය සමග හවුල්වීමෙන් ඈත ගම් දනව් වල සංස්කෘතියේ පවතින සුවිශේෂී පිළිවෙත් හා සම්ප්‍රදායන් පිළිබඳව ශ්‍රී ලාංකික ජනතාව දැනුවත් කිරීමට මහජන බැංකුව අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකාවේ පවතින බහු සංස්කෘතික හා බහු ආගමික විසිරීම පිළිබඳව අප සවිඥාණක වන අතර විවිධත්වය තුළ එක්සත්ව දිවි ගෙවීම සඳහා ජාතියේ සියලු කොටස් එක්සත් කිරීමේ පරිසරය නිර්මාණය කිරීමට අපි සෑම ප්‍රයත්නයක්ම දරන්නෙමු. අස්වනු නෙළීමෙන් පසු පැවැත්වෙන හින්දු උත්සවයක් වන තෛපොංගල් උත්සවය, නොකඩවා 34 වෙනි වරටත් පවත්වන ලද මහජන බැංකුවේ ක්‍රිස්තියානි සංගමය මගින් සංවිධානය කරනු ලබන වාර්ෂික සිදුවීමක් වන නත්තල් කැරොල් සඳහා අනුග්‍රාහකත්වය දක්වමින් නත්තල් සමයද ඇතුළු සියලු ආගමික හා සංස්කෘතික උත්සව සැමරීම හා ඒවාට සහාය වීම අප සිදු කරන අතර විශ්‍රාම ශාලාවක් ඉදි කිරීම මගින් තලවිල ශාන්ත ආනා දෙව් මැදුර කරා යන බැතිමතුන්ට සහාය වීමු. මෙම නිවෙස් හයකින් සමන්විත විශ්‍රාම ශාලාව සියලු පහසුකම් සහිත වන අතර හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් පියතුමා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

යාපනය හා වන්නි ප්‍රදේශ වල ශාඛා විසින් යාපනය විශ්ව විද්‍යාල පරිශ්‍රයේදී සංවිධානය කරන ලද කලා උලෙලේදී යාපනයේ සංස්කෘතිය හුවා දක්වන ලද අතර, එය ශ්‍රී ලංකාවේ සැකැස්මෙහි අනිවාර්ය අංගයක් වන සංස්කෘතියක් හා සම්ප්‍රදායක් සම්බන්ධව දැනුවත් බව ඇති කිරීමේ හා අගය කිරීමට සැලැස්වීම අතිශයින්ම සාර්ථක විය.

### සාක්ෂරතාව වර්ධනය කිරීම

වටිනාකම් කාවැද්දීමෙන් පමණක් නොව ඔවුන්ගේ යහපැවැත්ම සඳහා අධ්‍යාපනය මධ්‍ය අක්ෂය බවට පත්වීම සහතික කිරීමෙන් මහජන බැංකුව හැම විටම යොවුන් පරපුරට දායකත්වය ලබා දී ඇත. සිසු උදාන ගිණුම්ත්ව, පාසල් බැංකුකරණ ඒකක හා ජංගම බැංකු ඒකක වැනි සකසන ලද නිපැයුම් හා අගය එකතු කිරීම් සියල්ල ඉලක්ක කර ඇත්තේ සිසුන් බාධාවකින් තොරව සිය අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන යාම තහවුරු කිරීමයි. මේ වසරේ තවත් අගය එකතු කිරීමක් වූයේ අනුරාධපුර දැයට කිරුළ ප්‍රදර්ශනයේ දී යොවුන් සිසු සිසුවියන්ගේ කුසලතා හෙළිදැක්වූ සිසු උදාන දැයට පිපෙන මල් ප්‍රසංගයයි.

### කාන්තාවන් සවිබලගැන්වීම

මහජන බැංකුවට තදින්ම කාවැදී ඇති තවත් අවධානය කේන්ද්‍රගත වන ක්ෂේත්‍රයක් වන්නේ කාන්තාවන් සවිබල ගැන්වීමයි. සෑම වසරකම සිය කළඹෙහි විශේෂයෙන්ම කාන්තාවන් සමාජයේ ඉහළ තලයකට ඔසවා තැබීමේ අරමුණින් ඉදිරිපත් කර ඇති විවිධ නිපැයුම් වලට අනුපූරක වෙමින් බැංකුව

ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහනට බොහෝ සෙයින් සම්බන්ධ වේ. මේ වසරේ ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන ජනකලා කේන්ද්‍රයේදී පැවැත්වුණි. එයට අතිරේකව, විශේෂ වනිතා වාසනා වැඩ-සටහනේ දී ත්‍යාග දිනාගත් කාන්තාවන්ට ප්‍රණාම පුද කරමින් වනිතා වාසනා නැණ ගුණ පිරි ලිය වැඩසටහනේ ජයග්‍රාහිකාවන්ට ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා කළුතර පැවති 2012 සූර්ය මංගල්‍යයට අපි සහභාගි වුණෙමු.

### ක්‍රීඩා සංවර්ධනය

ක්‍රීඩාව, කණ්ඩායම් හැඟීම මුවහත් කරන අතරම ජාතීන්, සංස්කෘතීන් හා ජනතාව මනා ලෙස එක් කරන්නක් ලෙස දැඩිව විශ්වාස කරමින් බැංකුව හැම විටම සිය කණ්ඩායම අතර විෂය බාහිර ක්‍රියාකාරකම් දිරිගන්වා විවිධ ක්‍රීඩාවල ජාතියේ ශක්තියට ආධාරක වී ඇත. මේ වර්ෂයේ දී නෙට්බෝල් ක්‍රීඩාව සංවර්ධනය කිරීම සඳහා බැංකුව ආයෝජනය කළ අතර, කොළඹ දී පැවති ආසියානු කුසලාන නෙට්බෝල් ශූරතාවය සනිටුහන් කිරීමේ උත්සව සංදර්ශනයද එයට ඇතුළත් විය. මිනුවන්ගොඩ මහ නගර සභාව සමග ඒකාබද්ධව මෙහෙයවන ලද ජය ශ්‍රී උදාන පාපැදි තරඟයේ ජයග්‍රාහකයා වූ ජාතික පාපැදි ශූරයාට අපි ත්‍යාගයක් ප්‍රදානය කළෙමු.

## අපගේ පාරිසරික කැපවීම

මෙය අපගේ මුල්ම තිරසාර බව පිළිබඳ වාර්තාව වන හෙයින් අපගේ කාබන් පියසටහන අඩු කිරීම උදෙසා බොහෝ වෙනස්කම් සිදු කර නොමැත. පෙර සඳහන් කරන ලද පරිදි අපගේ මූලික ප්‍රමුඛතාව වන්නේ සමාජය සවිබල ගැන්වීම හා ආර්ථික ශක්තිමත් බව වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය කේන්ද්‍රගත කිරීමයි. එමගින් අපගේ තිරසාර බව පරිචයන් වල කේන්ද්‍රය පරිසරය සුරැකීම කෙරෙහි යොමු වී නොමැත. කෙසේ වෙතත් අපගේ පරිසරය කෙරෙහි අප වගකීමෙන් යුතුව කටයුතු කළ යුතු බව අප දන්නා අතර මෙතෙක් එය අපගේ තිරසාර බව පිළිබඳ සවිඥාණක භාවයෙහි ප්‍රමුඛතාවක් වී නොතිබූ බව පිළිගැනීම අවමානයට හේතුවක් නොවේ.

තිරසාර බව වාර්තා කිරීමේ ක්‍රියාවලියේදී පරිසර කේන්ද්‍රීය වීම කෙරෙහි අවධානය යොමුවී ඇති අතර මෙතැන් සිට ඉදිරියට මෙම ග්‍රහලොවෙහි ජනතාව සඳහා තිරසාර සංවර්ධනයේ එක් තනි වේදිකාවකට ආර්ථිකය සමාජය හා පරිසරය යන ත්‍රිත්වය සංයෝග වන පාරිසරික වශයෙන් ශක්තිමත් ආකාරයකට ජාතියට දියුණුව අත් කර දීමේ ඉලක්කය සපුරා ගැනීමට අපි තිර අදිටනින් යුතුව සිටින්නෙමු.

කුඩා පියවර වුවත් පරිසරය ආරක්ෂා කිරීමට සහාය වීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබ තිබේ. මහජන බැංකුවේ අපි බලශක්තිය පිළිබඳ සවිඥානක වන අතර අපගේ ආයතනය පුරා විහිදී යන පරිදි අපගේ සෑම ශාඛාවකම හා සේවා මධ්‍යස්ථානයකම පාහේ බලශක්තිය ඉතිරි කිරීමේ ක්‍රම ඇතුළත් කර ඇත. උදාහරණයක් ලෙස අපගේ මධ්‍යස්ථ පරිචයන් අතර අප හඳුන්වා දී ඇති පහත සඳහන් මූලාරම්භයන් වේ.

කාට්රිජ් මිලදී ගැනීම අඩු කිරීම - මෙයට පෙර බැංකුව මෙබඳු අවශ්‍යතා සඳහා සැපයුම් අංශය හරහා ටෙන්ඩර් කැඳවීම සිදු කළේය. දැන් අපි වැඩි පිරිවැයක් දරමින් සැබෑම නිපැයුම් (original) මිලදී ගන්නා අතර එය දිගුකාලීන වශයෙන් පරිසරයට යහපත් පියවරකි.

- විදුලි බල්බ නිවා දමන ලෙස ඉල්ලීම
- හැකි සෑම අවස්ථාවකම බලශක්ති ඉතිරි කරන සී එෆ් එල් බල්බ ආදේශ කිරීම
- විධිමත් කාර්යාල දිනයක අවසානයේ වායුසමන යන්ත්‍ර ක්‍රියා විරහිත කිරීම
- අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය සඳහා හැකිතාක් දුරට අන්තර්ජාලය හා විද්‍යුත් තැපෑල භාවිතා කිරීම
- විශේෂයෙන්ම, අනුමත කිරීම්, මානව සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර සන්නිවේදනය හා සමාලෝචනය සඳහා කඩදාසි නාස්තිය හා භාවිතය අඩු කර තොරතුරු තාක්ෂණ පද්ධති හා ක්‍රියාවලි හඳුන්වා දීම

මේවා අප විසින් ගන්නා ලද ළදරු අවස්ථාවේ පියවර වන නමුදු අඩු කරන ලද කාබන් පිය සටහනක් අත් කරගැනීමේ ප්‍රයත්නයේදී මෙම පියවර විශාල වශයෙන් වර්ධනය කිරීමට අප යොමු කරන බව අපි විශ්වාස කරන්නෙමු.

### පාරිසරික නීති/රෙගුලාසි වලට අනුකූල වීම

මහජන බැංකුවේ අපි පාරිසරික සම්මතයන් පවත්වාගැනීමට වෙර දරන්නෙමු. අනුකූල නොවීම පිළිබඳව හෝ පරිසරය නොසලකා හැරීම පිළිබඳ ගැටලු කිසිවක් අපට එරෙහිව එල්ල වී නොමැත. එමෙන්ම නොසැලකිලිමත් පාරිසරික පරිචයන් වල ප්‍රතිඵලයක් ලෙස මුදල්මය දඩයක් ගෙවීමට අපට සිදුවී නොමැත.

# ගෝලීය වාර්තාකරණ මූලාරම්භයන් අන්තර්ගතයේ සුචිය


| සුචි අංකය | විස්තරය | වාර්තාවේ කොටස | පිටුව |
|---|---|---|---|
| **1.** | **උපායමාර්ගික විශ්ලේෂණය** | | |
| 1.1 | ආයතනයේ ජ්‍යෙෂ්ඨතම තීරණ ගන්නාගේ ප්‍රකාශනය | තිරසාර බව පිළිබඳ අතිරේකය | 60 |
| **2.** | **ආයතනික ආකෘතිය** | | |
| 2.1 | ආයතනයේ නම | ආයතනික තොරතුරු | පිට කවරයේ පසුපිට ඇතුළු පැත්ත |
| 2.2 | මූලික සන්නාම, නිපැයුම් හා/හෝ සේවාවන් | ව්‍යාපාර සමාලෝචනය | 36-39 |
| 2.3 | ආයතනයේ මෙහෙයුම් ව්‍යුහය | ආයතනික පාලනය | 87 |
| 2.4 | ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටීම | ආයතනික තොරතුරු | පිට කවරයේ පසුපිට ඇතුළු පැත්ත |
| 2.5 | ආයතනය ක්‍රියාත්මක වන රටවල් සංඛ්‍යාව හා ප්‍රධාන මෙහෙයුම් ඇති රටවල හෝ වාර්තාවේ ආවරණය කෙරෙන තිරසාර බව හා සම්බන්ධ කරුණුවලට නිශ්චිතවම අදාල වන රටවල නම් | කිසිවක් නැත | - |
| 2.6 | හිමිකාරිත්වයේ ස්වභාවය හා නෛතික ආකෘතිය (ස්වරූපය) | ආයතනික තොරතුරු | පිට කවරයේ පසුපිට ඇතුළු පැත්ත |
| 2.7 | සේවා සැපයෙන වෙළෙඳපොළවල් | තිරසාර බව පිළිබඳ අතිරේකය | 57, 58 |
| 2.8 | වාර්තාකරණ ආයතනයේ පරිමාණය | මූල්‍ය සමාලෝචනය<br>තිරසාර බව පිළිබඳ අතිරේකය | 51<br>71 |
| 2.9 | ප්‍රමාණය, ව්‍යුහය හෝ හිමිකාරිත්වය සම්බන්ධයෙන් වාර්තාකරණ කාලය තුළ සිදුවූ වැදගත් වෙනස්වීම් | කිසිවක් නැත | - |
| 2.10 | වාර්තාකරණ කාලය තුළ ලබාගත් සම්මාන | දශකය පිළිබඳ කෙටි විවරණයක් | 263 |
| **3.** | **වාර්තාකරණ පරාමිතීන්** | | |
| 3.1 | වාර්තාකරණ කාලපරිච්ඡේදය | තිරසාරබව අතිරේකය | 59 |
| 3.2 | ආසන්නතම පෙර වාර්තාව නිකුත් කළ දිනය | තිරසාරබව අතිරේකය | 59 |
| 3.3 | වාර්තාකරණ චක්‍රය | තිරසාරබව අතිරේකය | 59 |
| 3.4 | වාර්තාව හෝ එහි අන්තර්ගතයට අදාළ ගැටළු සම්බන්ධයෙන් විමසීම් කළ යුතු ස්ථානය | තිරසාරබව අතිරේකය | 59 |
| 3.5 | වාර්තාවේ අන්තර්ගතය අර්ථ දැක්වීම | තිරසාරබව අතිරේකය | 59 |
| 3.6 | වාර්තා කළ  ප්‍රදේශය | තිරසාරබව අතිරේකය | 59 |
| 3.7 | වාර්තාවේ විෂයපථය හෝ බල ප්‍රදේශය සම්බන්ධ නිශ්චිත සීමාවන් | තිරසාරබව අතිරේකය | 59 |
| 3.8 | හවුල් ව්‍යාපාර, පරිපාලිත සමාගම්, කල්බදු දුන් පහසුකම් බාහිර ආයතන වෙත පවරා ඇති මෙහෙයුම් හා කාලපරිච්ඡේදයෙන් කාලපරිච්ඡේදයට හා/හෝ ආයතන අතර සංසන්දනය කිරීමේ හැකියාවට බලපාන වෙනත් ආයතන පිළිබඳ වාර්තාකරණය සඳහා පදනම | වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති | 164 |

| සුචි අංකය | විස්තරය | වාර්තාවේ කොටස | පිටුව |
|---|---|---|---|
| 3.10 | පෙර වාර්තාවල සපයා ඇති යම් තොරතුරක් නැවත ප්‍රකාශ කිරීමේ බලපෑම පිළිබඳ පැහැදිලි කිරීම | වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති | 163 - 164 |
| 3.11 | වාර්තාවේ විෂයපථයේ බල ප්‍රදේශයේ හෝ යොදාගත් මිනුම් ක්‍රමවල පෙර වාර්තාකරණ කාලපරිච්ඡේදයේ සිට ඇති වූ වැදගත් වෙනස්කම් | කිසිවක් නැත | - |
| 3.12 | GRI අන්තර්ගත සුචිය | තිරසාරබව අතිරේකය | 78-80 |
| **4.** | **පාලනය, බැඳීම් හා නියුක්තිකරණය** | | |
| 4.1 | ආයතනයේ පාලන ව්‍යුහය | ආයතනික පාලනය | 87 |
| 4.2 | ඉහළම පාලන අධිකාරියේ මුලසුන හොබවන්නා විධායක නිලධාරියෙකුද වන්නේ ද යන්න දැක්වීම | ආයතනික පාලනය | 88 |
| 4.3 | ඉහළම පාලන අධිකාරියේ සිටින ස්වාධීන හා/හෝ විධායක නොවන සාමාජික සංඛ්‍යාව | ආයතනික පාලනය | 88 |
| 4.4 | ඉහළම පාලන අධිකාරිය වෙත නිර්දේශ ලබා දීම හෝ මගපෙන්වීම් සැපයීම සඳහා කොටස්හිමියන් හා සේවකයන් වෙනුවෙන් ඇති යාන්ත්‍රණ | තිරසාරබව අතිරේකය | 64 |
| 4.14 | ආයතනය විසින් එහි නිරත කර සිටින පාර්ශ්වකාර කණ්ඩායම් ලැයිස්තුව | තිරසාරබව අතිරේකය | 65, 66 |
| 4.15 | ආයතන කාර්යයන්හි නිරත කරගැනී මෙහිලා පාර්ශ්වකරුවන් හඳුනාගැනීම හා තෝරාගැනීම සඳහා පදනම | තිරසාරබව අතිරේකය | 65, 66 |
| **ආර්ථික කාර්යසාධනය** | | | |
| EC1 | ජනනය කර බෙදා හරිනු ලැබෙන සෘජු ආර්ථික අගය | ඇමුණුම් | 244, 245 |
| EC3 | ආයතනයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැඳීම් ආවරණය | තිරසාරබව අතිරේකය | 74, 75 |
| EC4 | රජය වෙතින් ලද වැදගත් මූල්‍ය සහාය | තිරසාරබව අතිරේකය | 67-71 |
| **පාරිසරික කාර්යසාධනය** | | | |
| EN2 | ප්‍රතිචක්‍රීකරණය කළ යෙදවුම් ද්‍රව්‍ය භාවිතා කිරීමේ ප්‍රතිශතය | තිරසාරබව අතිරේකය | 77 |
| EN28 | පාරිසරික නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම හේතුවෙන් ගෙවීමට සිදු වූ ප්‍රධාන දඩ මුදල්වල මුදල්මය අගය හා මුදල් නොවන සම්බාධක මුළු සංඛ්‍යාව | තිරසාරබව අතිරේකය | 77 |
| **සමාජය** | | | |
| SO2 | දූෂණය හා සබැඳි අවදානම වෙනුවෙන් විශ්ලේෂණය කරන ලද ව්‍යාපාර ඒකක ප්‍රතිශතය හා මුළු සංඛ්‍යාව | තිරසාරබව අතිරේකය | 61 |
| SO3 | ආයතනයේ දූෂණ විරෝධී ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි පිළිබඳව පුහුණුව ලබා දුන් සේවක ප්‍රතිශතය | තිරසාරබව අතිරේකය | 64 |
| SO4 | දූෂණ සිද්ධීන්වලට සිදුවීම් වල ප්‍රතිචාර වශයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග | තිරසාරබව අතිරේකය | 61 |
| SO8 | නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම හේතුවෙන් ගෙවීමට සිදු වූ ප්‍රධාන දඩ මුදල් වල මුදල්මය අගය හා මුදල්මය නොවන මුළු සම්බාධක සංඛ්‍යාව | තිරසාරබව අතිරේකය | 61, 62 |

| සුචි අංකය | විස්තරය | වාර්තාවේ කොටස | පිටුව |
|---|---|---|---|
| **ශ්‍රම පරිචයන් හා යෝග්‍ය රැකියා** | | | |
| LA1 | රැකියා වර්ගය, රැකියා ගිවිසුම හා ප්‍රදේශය අනුව මුළු ශ්‍රම බලකාය ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කර දැක්වීම | තිරසාරබව අතිරේකය | 72 - 73 |
| LA3 | වැදගත් මෙහෙයුම්වල පිහිටීම් අනුව, තාවකාලික හෝ අර්ධකාලීන සේවකයන්ට ලබා නොදෙන, නමුත් පූර්ණකාලීන සේවකයන්ට ලබා දෙන ප්‍රතිලාභ | තිරසාරබව අතිරේකය | 73 |
| LA4 | සාමූහික කේවල් කිරීමේ ගිවිසුම මගින් ආවරණය වන සේවක ප්‍රතිශතය | තිරසාරබව අතිරේකය | 71 |
| LA5 | එය සාමූහික ගිවිසුමේ සඳහන් වන්නේ ද යන්න ඇතුළුව මෙහෙයුම වෙනස්කම් සම්බන්ධයෙන් දැනුම් දිය යුතු අවම කාලසීමාව/න් | තිරසාරබව අතිරේකය | 75 |
| LA10 | සේවක කාණ්ඩය අනුව සේවකයෙකුට වසරකට පුහුණුවීමේ සාමාන්‍ය පැය ගණන | තිරසාරබව අතිරේකය | 75 |
| **නිපැයුම් වගකීම** | | | |
| PR6 | වෙළඳ ප්‍රචාරය, ප්‍රවර්ධනය හා අනුග්‍රාහකත්වය ඇතුළු අලෙවි සන්නිවේදනයන්ට සම්බන්ධ නීති, සම්මතයන් හා ස්වේච්ඡා සංග්‍රහයන්ට අනුකූලවීමේ වැඩසටහන් | තිරසාරබව අතිරේකය | 64 |
| PR7 | වෙළඳ ප්‍රචාරය, ප්‍රවර්ධනය හා අනුග්‍රාහකත්වය ඇතුළුව අලෙවි සන්නිවේදනයන් සම්බන්ධයෙන් රෙගුලාසි හා ස්වේච්ඡා සංග්‍රහයන්ට අනුකූල නොවීමේ සිදුවීම් මුළු සංඛ්‍යාව ප්‍රතිඵල අනුව | තිරසාරබව අතිරේකය | 64 |

## ගෝලීය වාර්තාකරණ දර්ශක යෙදවුම් මට්ටම් වගුව

| වාර්තා යෙදවුම් මට්ටම | | C ✓ | C+ | B | B+ | A | A+ |
|---|---|---|---|---|---|---|---|
| සම්මත හෙළිදරව් කිරීම — පැතිකඩ හෙළිදරවු කිරීම් | නිමැවුම | 1.1<br>2.1-2.10<br>3.1-3.8, 3.10-3.12<br>4.1-4.4 4.14-4.15<br>පිලිබඳ ඉහත සටහන් හි දක්වා ඇත | බාහිර වශයෙන් සහතික කරන ලද වාර්තාව | (වට්ටම සඳහා ලැයිස්තුගත සියළු උපමාන හා (ඉලක්කම්) පිළිබඳ වාර්තාව<br>1.2<br>3.9, 3.13<br>4.5-4.13, 4.16-4.17 | බාහිර වශයෙන් සහතික කරන ලද වාර්තාව | බී මට්ටමේ අවශ්‍යතාවයම වේ | බාහිර වශයෙන් සහතික කරන ලද වාර්තාව |
| කළමනාකරණ ප්‍රවේශය පිළිබඳ හෙළිදරව් කිරීම් | නිමැවුම | අවශ්‍ය නොවේ | | එක් එක් දර්ශක කාණ්ඩය සඳහා කළමනාකරණ ප්‍රවේශය හෙළිදරව් කිරීම | | එක් එක් දරශක කාණ්ඩය සඳහා කළමනාකරණ ප්‍රවේශය හෙළිදරව් කෙරේ | |
| කාර්යසාධන දර්ශක හා අංශ අතිරේක කාර්යසාධන දර්ශක | නිමැවුම | සමාජ, ආර්ථික හා පාරිසරික යන දර්ශක අතරින් අවම වශයෙන් එකක් ඇතුළුව අවම වශයෙන් කවර හෝ කාර්යසාධන දර්ශක 10 පිළිබඳව පූර්ණ ලෙස වාර්තා කරන්න** | | ආර්ථික, පාරිසරික, මානව හිමිකම්, ශ්‍රම, සමාජයීය, නිපැයුම් වගකීම යන දර්ශකවලට අවම වශයෙන් එකක් ඇතුලත් වන පරිදි අවම වශයෙන් කවර හෝ කාර්යසාධක දර්ශක 20 ක් පිළිබඳව පූර්ණ ලෙස වාර්තා කරන්න.*** | | (අ) දර්ශකය පිළිබඳව වාර්තා කිරීම හෝ (ආ) වාර්තා නොකිරීමට හේතුව පැහැදිලි කිරීමෙන් සාපේක්ෂ වැදගත්කම් මූලධර්මය (Materiality Concept) කෙරෙහි නිසි අවධානය දක්වමින් එක් එක් හර හා ආංශික අතිරේක දර්ශක පිළිබඳව ප්‍රතිචාර දක්වන්න. | |

# සේයා රූ තුළින් 2012 දෙස බැලීමක්



අතිගරු ජනාධිපතිතුමා විසින් තංගල්ල ශාඛාව විවෘත කිරීම



ආචාර්ය පී. බී. ජයසුන්දර කුරුණෑගල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මධ්‍යස්ථානයෙහි සමරුඵලකය උත්සවාකාරයෙන් නිරාවරණය කිරීම



බැංකුව සිය නවතම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මධ්‍යස්ථානය මහනුවර දී විවෘත කළේය



ගරු බැසිල් රාජපක්ෂ මහතා අනුරාධපුරයේ ව්‍යාපාර මධ්‍යස්ථානය උත්සවාකාරයෙන් විවෘත කළේය.



බැංකුවේ ක්‍රිස්තියානි සංගමය විසින් පරිත්‍යාග කරන ලද කොට්ටුකච්චි නව රෝහල - අධ්‍යක්ෂ ඩී. ජේ. ඩී. ජයකොඩි මහතා විවෘත කිරීමේ උත්සවයට සහභාගි වෙමින්



බැංකුවේ ක්‍රිස්තියානි සංගමය විසින් පරිත්‍යාග කරන ලද කොටටුකච්චි නව රෝහල - ගොඩනැගිල්ලේ පිටත දර්ශනයක්



සංවත්සර වාසනා දිනුම් ඇදීමෙහි තෙවැනි ත්‍යාගය වන සුබෝපභෝගී නිවසේ ජයග්‍රාහකයාට හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීම



කින්නියාහි ජය ශ්‍රී ජයග්‍රාහකයාට ත්‍යාගය ප්‍රදානය කිරීම



ජය ශ්‍රී වාසනාවන්ත ජයග්‍රාහිකාව මැද පාර ශාඛාවේ දී බැංකු නිලධාරීන් වෙතින් සිය ත්‍යාගය ලබාගනිමින්



නිදහස් දින උත්සව හා සබැඳි 'නිදහසේ උපත' - අළුත උපන් ළදරුවෙකුට අධ්‍යක්ෂිකා එල්. සංගක්කාර මහත්මිය විසින් ප්‍රථම තෑගි වවුචරය ප්‍රදානය කිරීම



නිදහස් දින උත්සව හා සබැඳි 'නිදහසේ උපත' - ප්‍ර. වි. නි./සාමාන්‍යාධිකාරිතුමා අළුත උපන් ළදරුවාට ඉසුරු උදාන ත්‍යාග සහතිකය හා ත්‍යාග පාර්සලයක් පිරිනමයි



නිදහස් දින උත්සව හා සබැඳි 'නිදහසේ උපත' - පෙබරවාරි 4 වැනි දින උපන් තවත් ළදරුවෙකුට ත්‍යාග පිරිනැමේ.




බොරැල්ල, සියළු සාන්තුවරයන්ගේ බාලිකා විද්‍යාලයේ සිසු උදාන ඉතුරුම් ඒකකය



අනුරාධපුරයේ 2012 දැයට කිරුළේදී සිසු උදාන 'දැයට පිපෙන මල්' ප්‍රශ්න විචාරාත්මක තරගය - 'බයි ස්පෙල්' ජයග්‍රාහී ආනන්ද විද්‍යාල සිසුන් ජයග්‍රහණය සමරමින්



අනුරාධපුරයේ 2012 දැයට කිරුළේ දී සිසු උදාන 'දැයට පිපෙන මල්' ප්‍රශ්න විචාරාත්මක තරගය - ප්‍රදර්ශනයේ ජය ශ්‍රී වේදිකාව මත සිසුවියන් විසින් ඉදිරිපත් කල නැටුම් සංදර්ශනය



'පුරවමු වී බිස්ස' - ලෝක සකසුරුවම් දිනය උත්සවාකාරයෙන් සැමරීම සඳහා සංවිධානය කරන ලද ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන - කොළඹ ආරක්ෂක සේවා විදුහලේ වැඩසටහනේ දී සිසු/සිසුවියන්ගේ උද්යෝගිමත් සහභාගිත්වය



'පුරවමු වී බිස්ස' ලෝක සකසුරුවම් දිනය උත්සවාකාරයෙන් සැමරීම සඳහා සංවිධානය කරන ලද ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන - වී ගබඩාවේ ආයෝජනය කිරීමට ගොවීන් ලෙස සැරසී සිටින සිසු/සිසුවියන්



'පුරවමු වී බිස්ස' - ලෝක සකසුරුවම් දිනය උත්සවාකාරයෙන් සැමරීම සඳහා සංවිධානය කරන ලද ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන - ඉතුරුම් ඒකකයේ මුදල් තැන්පත් කිරීමට පෙළ ගැසී සිටින සිසු/සිසුවියන්



දෙමටගොඩ ශාඛාව විසින් පාසල් සිසුවියන්ට සිසු උදාන පාස් පොත් නිකුත් කිරීම



මොණරාගල කලාපීය කළමනකාරු හා තණමල්විල ශාඛා කළමනකාරු, වී අස්වැන්න අලෙවි කිරීමට අදාල ගැටළු පිළිබඳව ගොවීන් සමග සාකච්ඡා කරමින්




බැංකුව විසින් අනුරාධපුරයේ සංවිධානය කරන ලද පොසොන් භක්ති ගී



අභාවප්‍රාප්ත හිටපු සභාපති ඩබ්ලිව්. කරුණාජීව මහතා ගේ සභාපතිත්වයෙන් අනුරාධපුරයේ පොසොන් පොහෝ දින දානමය පිංකම



හලාවත බිෂොප්තුමන් මහජන බැංකුව විසින් ඉදි කරන ලද තලවිල විශ්‍රාම ශාලාව විවෘත කරමින්



කොටහේන ශාඛාවේ දී තෛපොංගල් උත්සවය පැවැත්වීම



ලෝක ළමා දින උත්සව - වඩුවාවල ළදරු පාසලේ දරු/දැරියන් ලැබුණු තෑගි වලින් උද්දාමයට පත්ව



ලෝක ළමා දින උත්සව - මෙම අවස්ථාව සැමරීම සඳහා මොණරාගල කලාපීය කළමනාකාරතුමා පාසලක් වෙත ගියේය.



අළුත් අවුරුදු උත්සව - මොණරාගල කලාපයෙහි කාර්ය මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ප්‍රථම බක්මහ උළෙලේ දී ළමුන්ගේ ඉසව්වක්



ලෝක ළමා දින උත්සව - හෙම්මාතගම ශාඛාවේ දී දරු/දැරියන්ට සංග්‍රහ හා ත්‍යාග ලබා දීම



බැංකුවේ කලා කවය විසින් සංවිධානය කරන ලද කලා උළෙලේ දී හිටපු සභාපතිතුමා ජයග්‍රාහී කණ්ඩායම සමග




යාපනයේ මහජන බැංකු කලා උළෙලේ දී රංගනයක්



ප්‍ර. වි. නි./සාමාන්‍යාධිකාරී එන්. වසන්ත කුමාර් මහතා 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ තලාතුඔය සිසුවියකට සහතික පත්‍රයක් හා ත්‍යාගයක් ලබා දෙමින්



'පරිණත' ගිණුම්හිමියන් සඳහා දිනුම් ඇදීමේ ජයග්‍රාහකයන් වී දඹදිව වන්දනාවට සහභාගි වූ පිරිස



2012 ජනවාරි 1 වැනි දින බැංකු ප්‍රධාන කාර්යාලයේ දී පවත්වන ලද ආගමික උත්සව



රාමසාන් ඉෆ්තාර් සැමරීම සඳහා ග්‍රෑන්ඩ්පාස් ශාඛාවේ පවත්වන ලද උත්සවය

# අනුකූලතා වාර්තාව

බැංකුව අත් විඳින්නා වූ විශිෂ්ට කීර්තිනාමය බැංකුවේ ව්‍යාපාර සාර්ථකත්වය රඳා පවතින එක් ප්‍රධාන කුළුණක් වේ. ස්ථාවර කීර්තිනාමයක් බැංකුව විසින් ඉදිරිපත් කෙරෙන සේවාවන් කෙරෙහි ගනුදෙනුකාර භවතුන්ගේ විශ්වාසය සඳහා පදනම තනයි. මෙම විශ්වාසය බැංකුවේ සේවකයන්ගේ අවංකභාවය හා විශේෂඥ භාවය මෙන්ම අපගේ නිපැයුම් වල උසස් ගුණාත්මක බව පිළිබඳ විශ්වාසය හා සමග බැඳී පවතී. මේ හේතුව නිසා බැංකුවක ප්‍රධාන අනුකූලතා මූලධර්ම වන්නේ සේවක අවංකභාවය සහතික කිරීම හා සේවා හා නිපැයුම් වල ගුණාත්මක බව පවත්වා ගැනීමයි. අනුකූලතාව මූලික වශයෙන්ම බැංකුවේ කීර්තිනාමය රඳවා ගැනීම හා එය අඛණ්ඩ වැඩි දියුණු කිරීම අරමුණු කරයි. අනුකූලතාව සඳහා අදාල වන නීති පද්ධති දැඩිව අනුගමනය කිරීම මගින් බැංකුවේ හා එහි සේවකයන්ගේ අවංකභාවය තහවුරු කිරීම සාක්ෂාත් කර ගැනේ. දැඩිව පිලිපැදිය යුතු අනුකූලතා නීති පද්ධති පිළිබඳව ප්‍රමාණවත් දැනුම ලබාදීම මෙන්ම එහි ප්‍රතිඵලයක් ලෙස ඇති කෙරෙන අනුකූලතා මෙහෙයුම් නිර්ණායක හා මූලධර්ම අධීක්ෂණය මගින්ද මෙය සාක්ෂාත් කරගැනීම සිදු වේ.

නීති හා රෙගුලාසි වල නිරන්තර වෙනස්කිරීම් හා සංශෝධන සමග බැංකුවක වගකීම් වලට අදාල වන වර්තමාන නීතිය අවධානයෙන් මගහැරීමට හෝ මතකයෙන් ගිලිහී යාමට ඇති ඉඩකඩ බොහෝ වැඩි බැවින් පහත සඳහන් විෂයපථය ආවරණය කරන අනුකූලතා අංශයක් ආයතනය තුළ ස්ථාපනය කර ඇත.

- කර්මාන්තයට අදාල වන නීති හා රෙගුලාසි සමග අනුකූලව බැංකුවේ ව්‍යාපාර ක්‍රියාකාරකම් සිදු කෙරෙන්නේ ද යන්න විමර්ශනය කිරීම හා පරීක්ෂා කිරීම සඳහා නිදහස
- මාණ්ඩලීය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව හෝ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමේ නිදහස
- නීතිවල හරය උල්ලංඝනය හෝ එහි නියාමකයන් තුළ බැංකුව කෙරෙහි ප්‍රසාදය පලුදු වීම සිදු නොවන පරිදි ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීමට හිතකර ආකාරයට රෙගුලාසි අර්ථ දැක්වීමේ හැකියාව

නීති හා රෙගුලාසි උල්ලංඝනය කිරීම, සම්බාධක පනවනු ලැබීමට හා බැංකුවේ කීර්තිනාමයට හානි වීමට හේතු වන බැවින් මූල්‍ය සේවා කර්මාන්තයට විශේෂිත හා බැංකුවේ ව්‍යාපාරයට අදාල ව්‍යවස්ථාදායක හා නියාමන ආයතන මගින් නිකුත් කෙරෙන නීති රෙගුලාසි හා සම්මතයන් මතින් පැන නගින අවදානම් තත්ත්වයන් කළමනාකරණය කිරීම කෙරෙහි අනුකූලතා අංශයෙහි අවධානය කේන්ද්‍රගත කරයි.මුදල් විශුද්ධිකරණය විරෝධී බැඳියා පිළිගැටුම්, අලෙවි හා වෙළඳ කටයුතු මෙහෙයවීම, ගනුදෙනුකාර භවතුන්ගේ බැඳියා ආරක්ෂා කිරීම හා ත්‍රස්තවාදීන් වෙනුවෙන් අරමුදල් සම්පාදනය වැනි ක්ෂේත්‍ර කළමනාකරණයේදී අනුකූලතා අංශය සක්‍රිය ලෙස ව්‍යාපාරය දැනුවත් කර එයට සහාය වෙයි.




## අනුකූලතා අංශයේ වගකීම්

- බැංකුවේ ව්‍යාපාර කටයුතු කර්මාන්තයට අදාල වන නීති හා රෙගුලාසි වලට අනුකූලව සිදුවෙන බවට වග බලාගැනීම
- බැංකුවේ සියලුම සේවකයන් ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේදී පිළිගත් ආචාරධර්ම සම්මතයන් අනුගමනය කරන බව සහතික කිරීම
- නීති, රෙගුලාසි වල හරය උල්ලංඝනය වීම හෝ බැංකුවේ කිර්තිනාමය පලුදු වීම සිදු නොවන පරිදි ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීම පිණිස හිතකර ආකාරයට නීති හා රෙගුලාසි අර්ථකථනය කිරීම
- බැංකුවේ ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය වත්කම් ව්‍යාපාරයේ මූල්‍යමය ආරක්ෂාව හා වඩාත්ම වැදගත් වන බැංකුවේ කීර්තිනාමය ආරක්ෂා කිරීම
- බැංකු ව්‍යාපාරයට අදාල වන නීති පද්ධති හෝ රෙගුලාසි වලට වෙනස් කම් සිදු කරනු ලැබූ විට කාර්යමණ්ඩලයට ඒ සම්බන්ධ නිරන්තර දැනුම යාවත්කාලීන කරවීම හා සෑමකල්හිම අනුකූලතා සවිඥාණක බව රඳවා ගැනීම සහතික කිරීම පිණිස ශාඛා ජාලය මුලුල්ලේම පුහුණුව ලබා දීම සිදු කිරීම

- බැංකුවේ සියලු මට්ටම් වල ඵලදායක ආයතනික පාලන සංස්කෘතියක් පවතින බව තහවුරු කිරීම
- මහජනතාවගේ විශ්වාසය රැකගනිමින් ආරක්ෂාකාරී හා ශක්තිමත් ආකාරයට ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම පිණිස බැංකුවේ ආයතනික ක්‍රියාකාරකම් හා චර්යාව පෙලගැස්වීම
- ශාඛා ජාලය කර්මාන්තයේ නීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම උදෙසා ශාඛා තක්සේරු කිරීම
- අදාල අංශ වෙතින් අනුකූලතා තහවුරු කිරීමේ ක්‍රියාවලිය වාරික පදනමින් සිදු කිරීම හා යම් උල්ලංඝනය කිරීම් නිරීක්ෂණය කරන ලද්දේ නම් ඒවා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරවීම
- ශ්‍රී ලංකා මහ බැංකු නියෝග සමග අනුකූලතාව තහවුරු කිරීමේ වාර්තාවක් බැංකු අධීක්ෂණ අංශයට භාර දීම

## මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම මර්ධනය කිරීම

වර්තමානයේ බැංකුකරණ හා මූල්‍ය කර්මාන්තයට සුවිසල් තර්ජනයක් නිර්මාණය කරමින් මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සම්පාදනය කිරීම ලොව පුරා බරපතල ගැටලුවක් බවට පත් ව ඇත. දඩ ගැසීම හෝ බන්ධනාගාරගත කිරීම මගින් දඬුවම් පැමිණවිය හැකි අපරාධ ලෙසට මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සම්පාදනය හඳුනාගනිමින් ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සම්පාදනයට අදාල නීති පනවා ඇත.

ශාඛා 345 ක් හා සේවා මධ්‍යස්ථාන 381 ක් ද සහිතව මිලියන 12 ක ගනුදෙනුකාර භවතුන්ගේ ගිණුම් මගින් හා දිනකට ගනුදෙනු දහස් ගණනක් සිදු කරන ලංකාවේ විශාලතම රාජ්‍ය බැංකු අතරින් එකක් වන මහජන බැංකුව හැම විටම මුදල් විශුද්ධිකරණයේ යෙදෙන්නන්ගේ ඉලක්කයක් වීමට ඉඩ ඇත. එබැවින් බැංකුව මුදල් විශුද්ධිකරණ ගනුදෙනු සඳහා යොදා ගනු ලැබීමේ අවදානම අඩු කිරීම සඳහා පහත සඳහන් ඵලදායක මුදල් විශුද්ධිකරණ විරෝධී ක්‍රියාමාර්ග අභ්‍යන්තර වශයෙන් බැංකුව තුළ සකස් කර තිබේ.

- අසාමාන්‍ය ලෙස විශාල හා අසාමාන්‍ය රටාවන් සහිත පැහැදිලිව පෙනෙන කිසිදු ආර්ථික හෝ නීතිමය පදනමක් නොමැති ගනුදෙනු අධීක්ෂණය කිරීම, කාර්යමණ්ඩලය වෙතින් අභ්‍යන්තර සැක සහිත ගනුදෙනු වාර්තා ලබා ගැනීම හා ඒවා විශ්ලේෂණය කර විමර්ශනය කිරීම
- සැක සහිත ගනුදෙනු වහාම කළමනාකාරිත්වයට හා මූල්‍ය බුද්ධි ඒකකයට (FIU) වාර්තා කිරීම

මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සම්පාදනය පිළිබඳව දැනුවත් බව වැඩි දියුණු කර බැංකුව තුළ යහපාලන සංස්කෘතියක් ඇති කරගැනීම සඳහා බැංකුව තුළ පහත සඳහන් පියවර ගනු ලැබ ඇත:

- මුදල් විශුද්ධිකරණ විරෝධී/ඔබේ ගනුදෙනුකරු හඳුනා ගන්න, ගනුදෙනුකරු කෙරෙහි නිසි අනලස්බව හා අවදානම කාණ්ඩගත කිරීම පිළිබඳව ශාඛා ජාලය මුළුල්ලේම පුහුණු වැඩසටහන් මෙහෙයවනු ලැබේ.
- මුදල් විශුද්ධිකරණ විරෝධී/ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න හා වෙස්ටර්න් යුනියන් ගනුදෙනු පිළිබඳ විද්‍යුත් ඉගෙනුම් මොඩියුල සකස් කරනු ලැබ ඇත.
- ආයතනික පාලනයේ විශිෂ්ට පරිචයන් සංග්‍රහයක්, මුදල් විශුද්ධිකරණ විරෝධී හා ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න ප්‍රතිපත්ති, චර්යා සංග්‍රහයක්, අනුකූලතා ප්‍රතිපත්තියක් හා ගනුදෙනුකාර භවතුන්ගේ ප්‍රඥප්තියක් බැංකුව තුළ ක්‍රියාත්මක වේ.

මහජන බැංකුව රටේ අනුකූලතා අවශ්‍යතාවන්ට පූර්ණ වශයෙන් අනුගත වී ඇති අතර මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සම්පාදනයට විරුද්ධව සටන් කිරීමට අවශ්‍ය උපරිම සහාය ලබා දීම සඳහා පද්ධති සහ ක්‍රියා පටිපාටි සකස් කර ඇත. එමෙන්ම රාජ්‍ය බැංකුවක් ලෙස ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථාවර බව සහතික කිරීම සඳහා නියාමන නිලධාරීන්ට සහාය ලබා දීමට සෑම පියවරක්ම ගනු ලැබ ඇත.

# ආයතනික පාලනය

යහපත් ආයතනික පාලනය යම් ආයතනයක තරඟකාරිත්වය, වර්ධනය හා තිරසාර බව සඳහා මූලික වන බව ගෝලීය වශයෙන් පිළිගත් කරුණකි. යහපාලන පරිචයන් කෙරෙහි සිය කැපවීමේ දී ඉහළ සදාචාර වටිනාකම් හා වගවීම සහිතව සිය වගකීම් ඉටු කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය දැඩි අවධානය යොමු කරයි. ශක්තිමත් ව්‍යාපාර ආචාර ධර්ම, අචල ප්‍රතිපත්ති හා පිළිවෙත් සහ ඵලදායක හා කාර්යක්ෂම අධීක්ෂණ පද්ධති යහපත් ආයතනික පාලන පද්ධතියක් සැදුම් ලබන අංග ලෙස සැලකේ.

ව්‍යාපාරයක දීර්ඝකාලීන සාර්ථකත්වයට දායක වන, සමාගම් හා ඔවුන්ගේ පාර්ශ්වකරුවන් අතර විශ්වාසය හා නියුක්තිකරණය ඇති කිරීම සඳහා යහපත් ආයතනික පාලනය අත්‍යවශ්‍ය වේ. මෙම සන්දර්භය තුළ, 1995 කැඩ්බරි වාර්තාව, 2.5 අනුව ආයතනික පාලය 'සමාගම් මෙහෙයවනු හා පාලනය කරනු ලබන පද්ධතිය' ලෙස නිර්වචනය කළ හැකි වේ. සමාගම් තාර්කීකරණය  කරන, මෙහෙයවන, පාලනය කෙරෙන හා අධීක්ෂණය කරන යාන්ත්‍රණය ආයතනික පාලනයයි. ආයතනික කාර්යසාධනය සහ යහපැවැත්ම වැඩි දියුණු කිරීම පොදු ඉලක්කයක් ලෙස සලකා ආයතනික පාලනය කොටස්හිමියන්, අධ්‍යක්ෂවරුන්, කළමනාකරුවන්, සේවකයන්, ණයකරුවන්, ගනුදෙනුකාර හවතුන්, ගෝලීය පරිසරය හා සෙසු සමාජය වැනි විවිධාකාර පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කරයි.

ආයතනික පාලන පද්ධතියක දී සලකා බැලෙන ප්‍රධාන කරුණු වන්නේ,

- සමාගම් කොතෙක් දුරට සාර්ථකව පැවැත්මට මූලික හේතුව සකසන්නේද, පැවැත්මට හේතුව හා අනාගත දිශානතිය කුමක්ද,
- ආයතනික තීරණ කොතෙක් දුරට සඵලදායක ලෙස ගනු ලැබෙන්නේද, මෙහෙයුම් නිර්ණායක හා ක්‍රියා පටිපාටි කවරේද,
- කොටස්හිමියන් වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය කොතරම් හොඳින් කළමනාකරුවන්ගේ තීරණ ගැනීම ඇගයීම හා එම තීරණ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සිදු කරන්නේද,
- ඉලක්ක සපුරා ගැනීම සඳහා කොතෙක් ඵලදායක අයුරින් විවිධ පාර්ශ්වකරුවන්ට පහසුකම් සැපයෙන්නේද, යනාදියයි.

ප්‍රධාන වශයෙන් ම ණය අර්බුදය හේතුවෙන් පසුගිය දශක කිහිපය තුළ ආයතනික පාලනය පිළිබඳ උනන්දුව සීඝ්‍රයෙන් වර්ධනය වී ඇති  අතර, එහි ප්‍රතිඵලය ලෙස එය ව්‍යාපාරයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා සමාජය තුළ වැදගත් කොටසක් බවට පත්ව ඇත. යහපත් ආයතනික පුරවැසියාගේ භූමිකාව රඟ දක්වමින් පසුගිය වසර 51 මුළුල්ලේ මහජන බැංකුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා මහ බැංකුව වැනි විවිධ නියාමක ආයතන විසින් නිර්දේශිත ආයතනික පාලන පරිචයන් ආදේශ කර ගැනීමට ස්වේච්ඡාවෙන්ම පියවර ගෙන තිබේ.

සේවකයන්ගෙන් හා  බැංකුවේ ගනුදෙනුකාර හවතුන්ගෙන්  ඇරඹී අනෙකුත් සියලුම පාර්ශවකරුවන්ගේ දායකත්වය සහිතව බැංකුවේ යහපත් ආයතනික පාලනය පවත්වා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ වගකීම වේ.



## ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආයතකනික පාලනයේ විශිෂ්ට පරිචයන්ට බැංකුවේ අනුකූලතාව -

| විෂයය | ආයතනික පාලන මූලධර්මය | ශ්‍රී ලං.සු.වි.කො.ස. හා ශ්‍රී ලං.ව.ග.ආ. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| **(අ) පොදු** | | | |
| සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි එකම තැනැත්තකු වන්නේ නම්, සභාපති/ප්‍ර.වි.නි. ගේ සහ පත් කරන ලද ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයාගේ නම හා එම තනතුරු ඒකාබද්ධ කිරීමට සාධාරණ හේතු හෙළිදරව් කිරීම. | A.2.1 & A.5.6 | සභාපති සහ ප්‍ර.වි.නි./ සාමාන්‍යාධිකාරී වෙන් වෙන් තනතුරු වන අතර, පුද්ගලයන් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. |
| අධ්‍යක්‍ෂ මණ්ඩල තුලනය | • ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හැඳින්විය යුතුය.<br>• විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු 'ස්වාධීන' ලෙස හඳුනාගනු ලැබේ නම්, පහත සඳහන් සාධක කවරක් පැවතියේ වුවද, එබඳු තීරණයක් ගැනීමට හේතු හෙළිදරව් කළ යුතුය.<br>• යම් අධ්‍යක්‍ෂකවරයෙක්/වරියක් -<br>○ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට ආසන්නතම පූර්ව වර්ෂ දෙකක කාලසීමාව තුළ සමාගමේ සේවය කර තිබේ නම්;<br>○ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලැබීමට ආසන්නතම පූර්ව වර්ෂ දෙකක කාල සීමාව තුළ සෘජුව හෝ වක්‍රව සමාගම සමග වැදගත් ව්‍යාපාරික සබඳතාවක් පවත්වා තිබේ නම්;<br>○ සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ප්‍රධාන විධායක නිලධාරි වන (හා/හෝ සමාන තනතුරක් දරන) පවුලේ සමීප සාමාජිකයෙකු සිටී නම්;<br>○ සමාගමේ සැලකිය යුතු කොටස් ප්‍රමාණයක හිමිකාරිත්වය තිබේ නම්;<br>○ පළමු පත්වීමේ දින සිට වසර නවයක් ඉක්මවන කාල පරිච්ඡේදයක් තුළ අඛණ්ඩව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කර තිබේ නම්;<br>○ වෙනත් සමාගමක් හෝ ව්‍යාපාරයක සේවය කරයි නම් -<br>■ සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරය සේවය කරන හෝ අධ්‍යක්ෂවරුන් වන හෝ<br>■ සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගේ බහුතරයට සැලකිය යුතු කොටස්හිමිකම හෝ වාස්තවික ව්‍යාපාරික සබඳතා සහිත හෝ<br>■ සමාගමේ සැලකිය යුතු කොටස්හිමිකම හෝ සමාගම සමග ව්‍යාපාරික සබඳතාවක් ඇති වෙනත් සමාගමක හෝ ව්‍යාපාරයක සේවය කරයි නම්; | A.5.5 | 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ, අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීමේ බලය මුදල් අමාත්‍යවරයාට පවරනු ලැබ ඇත. පනත යටතේ පත් කරන ලද සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන තත්ත්වයේ වන අතර, ඔවුන් බැංකුවේ කළමනාකාරිත්වයේ කොටසක් නොවන හෙයින් ස්වාධීන මතයක් ගොඩනගාගැනීමේ හැකියාව ඇත. |

| විෂයය | ආයතනික පාලන මූලධර්මය | ශ්‍රී ලං.සු.වි.කො.ස. හා ශ්‍රී ලං.ව.ග.ආ. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| | • වෙනත් සමාගමක අධ්‍යක්ෂවරයෙකු වන්නේ නම්; -<br>○ සමාගමේ අධ්‍යක්ෂවරුන් බහුතරය සේවය කරන හෝ අධ්‍යක්ෂවරුන් වන හෝ<br>○ සමාගමේ ව්‍යාපාරික සබඳතාවක් හෝ සැලකිය යුතු කොටස්හිමිකමක් ඇති,<br>• වෙනත් සමාගමක හෝ ව්‍යාපාරයක වාස්තවික, ව්‍යාපාරික සබඳතා හෝ සැලකිය යුතු කොටස්හිමිකම තිබේ නම් -<br>○ සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් බහුතරය සේවය කරන හෝ අධ්‍යක්ෂවරුන් වන හා/හෝ<br>○ සමාගම සමග ව්‍යාපාරික සබඳතාවක් හෝ එහි සැලකිය යුතු කොටස්හිමිකාරිත්වයක් සහිත. | | |
| නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම | නව අධ්‍යක්ෂවරුන් පත් කළ විට පහත සඳහන් තොරතුරු හෙළිදරව් කළ යුතුය:<br>• එබඳු එක් එක් අධ්‍යක්ෂවරයා පිළිබඳ කෙටි විස්තරයක්;<br>• අදාළ කාර්ය ක්ෂේත්‍රයන්හි ඔහුගේ විශේෂඥභාවයෙහි ස්වභාවය;<br>• එම අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ තනතුරු හෝ මාණ්ඩලික කමිටුවල සාමාජිකත්වය දරන සමාගම්වල නම්; හා<br>• එබඳු අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන ලෙස සැලකිය හැකිද යන්න | A.7.3 | අනුකූලව කටයුතු කෙරේ. මහජන බැංකු පනතේ විධිවිධාන යටතේ අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබේ. |
| නාම යෝජනා කමිටුව | නාම යෝජනා කමිටුවේ සභාපති හා සාමාජිකයන් හඳුනාගත යුතුය. | A.7.1 | අනුකූලතාව දක්වා ඇත. |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය තහවුරු කිරීම | කාර්යසාධනය ඇගයීම සිදු කරන ලද්දේ කෙසේද යන්න අනාවරණය කළ යුතුය. | A.9.3 | අධ්‍යක්ෂ මණ්ඩලය සමස්තයක් වශයෙන් කාර්යසාධනය සහ ඵලදායීබව තක්සේරු කිරීමට වාර්ෂික ඇගැයීම සිදු කරයි. |
| අධ්‍යක්ෂ මණ්ඩලය හා සම්බන්ධිත අනාවරණය කිරීම | එක් එක් අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර අනාවරණය කළ යුතුය:<br>• නම, සුදුසුකම් හා සේවා පළපුරුද්ද ආශ්‍රිත කෙටි විස්තරයක්;<br>• අදාළ ක්ෂේත්‍රයන්හි ඔහුගේ/ඇයගේ විශේෂඥභාවයේ ස්වභාවය;<br>• බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සමග ඇති ආසන්නතම පවුල් සබඳතාව හා/හෝ සැලකිය යුතු ව්‍යාපාර සබඳතා;<br>• අදාළ අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන ශ්‍රී ලංකාවේ අනෙකුත් ලැයිස්තුගත සමාගම්වල නම්;<br>• අදාළ අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන සමාගම්වල නම් හා/හෝ සමූහ ව්‍යාපාරයේ අනෙකුත් සමාගම්වල අධ්‍යක්ෂ තොරතුරු දරන්නේ ද යන වග; | A.10.1 | අනුකූලතාව දක්වා ඇත. 2012 වාර්ෂික වාර්තාවේ මේ සම්බන්ධයෙන් පරිපූර්ණ තොරතුරු අඩංගු වේ. |

| විෂයය | ආයතනික පාලන මූලධර්මය | ශ්‍රී ලං.සු.වි.කො.ස. හා ශ්‍රී ලං.ව.ග.ආ. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| | • වර්ෂය තුළ දී සහභාගි වූ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව/ප්‍රතිශතය;<br>• අදාළ අධ්‍යක්ෂවරයා සභාපති හෝ සාමාජිකයෙකු ලෙස සේවය කරන කමිටුවල නම්;<br>• වර්ෂය තුළ දී සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව/ප්‍රතිශතය. | | |
| පාරිශ්‍රමික අනාවරණය කිරීම | • පාරිශ්‍රමික ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රකාශනයක් හා සමස්තයක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික පිළිබඳ විස්තර;<br>• විධායක අධ්‍යක්ෂවරුන්ගේ මුළු වැටුප හා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ මුළු වැටුප. | B.3 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය අධ්‍යක්ෂවරුන්ට ගෙවිය යුතු දීමනා තීරණය කරයි. |
| ප්‍රධාන ගනුදෙනු | බැංකුව විසින් සිදු කරන ලද සියලු ප්‍රධාන ගනුදෙනු අනාවරණය කළ යුතුය. | C.2 | අනුකූලතාව දක්වා ඇත. |
| විගණන කමිටුව | • විගණන කමිටුවේ සාමාජිකයන්ගේ නම් අනාවරණය කළ යුතුය.<br>• විගණන නිලධාරීන්ගේ ස්වාධීනත්වය තීරණය කිරීමේ පදනම. | D.3.4 | විගණන කමිටු සාමාජිකයන්ගේ නම් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ පිටු අංක 117 හි දක්වා ඉදිරිපත් කර ඇත. බැංකුවේ විගණන නිලධාරි වන්නේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි විගණකාධිපතිවරයාය. විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර තිබේ. විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණනය සඳහා KPMG විගණන සමාගම පත කර ඇත. |
| ව්‍යාපාර චර්යා හා ආචාර ධර්ම සංග්‍රහය | • අධ්‍යක්ෂවරුන් හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම වෙනුවෙන් ව්‍යාපාර චර්යා හා ආචාර ධර්ම සංග්‍රහයක් බැංකුව සතුව තිබේ ද යන වග හෙළිදරව් කළ යුතුය.<br>• ඔවුන් එබඳු සංග්‍රහයකට අනුකූලව ඇති බව තහවුරු කරන ප්‍රකාශනයක්ද හෙළිදරව් කළ යුතුය.<br>• මෙම සංග්‍රහයේ විධිවිධාන කිසිවක් කවර හෝ ආකාරයකින් උල්ලංඝනය කර ඇති බවක් ඔහු/ඇය නොදන්නා බවට සභාපතිවරයා සහතික කළ යුතුය. | D.4.1 & D.4.2 | අනුකූලතාව දක්වා ඇත. සේවකයන් වෙනුවෙන් ව්‍යාපාර චර්යා හා ආචාර ධර්ම සංග්‍රහයක් බැංකුව සතුව තිබේ. |
| අඛණ්ඩ පැවැත්ම | • අවශ්‍ය පරිදි ආධාරක උපකල්පනයන් හා සීමා කිරීම් සහිතව බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව වාර්තා කළ යුතුය. | D.1.5 | බැංකුව අඛණ්ඩ පැවැත්ම සහිතය. |

| විෂයය | ආයතනික පාලන මූලධර්මය | ශ්‍රී ලං.සු.වි.කො.ස. හා ශ්‍රී ලං.ව.ග.ආ. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| **ආ. පාරිශ්‍රමික කමිටු වාර්තාව** | | | |
| පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයන් | • පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයන්ගේ නම්, පාරිශ්‍රමික කමිටු වාර්තාවේ හෙළිදරව් කළ යුතුය. | B.1.3 | අනුකූලතාව දක්වා ඇත. පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයන්ගේ නම්, මෙම වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ පිටු අංක 117 හි අනාවරණය කර ඇත. |
| **ඇ. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව** | | | |
| අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්තාව | අධ්‍යක්ෂවරුන් විසින් කරන ලද පහත සඳහන් ප්‍රකාශන අඩංගු විය යුතුය:<br>• නීති හා රෙගුලාසි උල්ලංඝනය කරන කවර හෝ ආකාරයේ ක්‍රියාකාරකම්වල බැංකුව යෙදී නොමැත;<br>• බැංකුව සම්බන්ධවන කොන්ත්‍රාත්තුවල සියලු වාස්තවික බැඳියාවන් අධ්‍යක්ෂවරුන් හෙළිදරව් කර ඇති අතර; ඔවුන්ට වාස්තවික බැඳියාවන් ඇති කරුණු සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිට ඇත;<br>• කොටස්හිමියන්ට සාධාරණ ලෙස සැලකීම තහවුරු කිරීමට බැංකුව සියලු ප්‍රයත්නයන් දරා ඇත;<br>• අවශ්‍ය පරිදි ආධාරක උපකල්පනයන් හා සීමාකිරීම් සහිතව බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව; සහ<br>• මූල්‍ය මෙහෙයුම් හා අනුකූලතා පාලන සහ අවදානම කළමනාකරණය ආවරණය කරමින් ඔවුන් අභ්‍යන්තර පාලන පිළිබඳව සමාලෝචනයක් සිදු කර ඇති බව සහ ඒවායේ ඵලදායි බව හා සාර්ථකව පිළිපැදීම සම්බන්ධයෙන් සාධාරණ සහතික වීම ලබාගෙන ඇති බව. | D.1.2 | අනුකූලතාව දක්වා ඇත. |
| **ඈ. මූල්‍ය ප්‍රකාශන** | | | |
| මූල්‍ය ප්‍රකාශන | • මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීමේ ප්‍රකාශනයක් අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළත් කළ යුතුය.<br>• විගණන නිලධාරීන් ද ඔවුන්ගේ වාර්තාකරණ වගකීම සම්බන්ධ ප්‍රකාශනයක් ඇතුළු කළ යුතුය. | D.1.3 | අනුකූලතාව දක්වා ඇත. |
| **ඉ. කළමනාකරණ වාර්තාව** | | | |
| කළමනාකරණ වාර්තාව | අවම වශයෙන් පහත සඳහන් කරුණු සාකච්ඡා කරමින් කළමනාකරණ විවරණයක් සහ විශ්ලේෂණ වාර්තාවක් ඇතුළත් කළ යුතුය:<br>• කර්මාන්තයේ ව්‍යුහය හා නව තත්ත්වයන්;<br>• අවස්ථා හා තර්ජන;<br>• අවදානම් හා පරීක්ෂාකාරී බව අවශ්‍ය තත්ත්වයන්;<br>• අභ්‍යන්තර පාලන ක්‍රම හා ඒවායේ ප්‍රමාණවත් බව; | D.1.4 | අනුකූලතාව දක්වා ඇත. |

| විෂයය | ආයතනික පාලන මූලධර්මය | ශ්‍රී ලං.සු.වි.කො.ස. හා ශ්‍රී ලං.වි.ග.ආ. විසින් නිකුත් කරන ලද විශිෂ්ට පරිචයන් සංග්‍රහයට යොමුව | අනුකූලතා මට්ටම |
|---|---|---|---|
| | • බැංකුව විසින් සිදු කෙරෙන සමාජ හා පරිසර ආරක්ෂණ ක්‍රියාකාරකම්;<br>• මූල්‍ය කාර්යසාධනය;<br>• මානව සම්පත්/කාර්මික සබඳතාවල සැලකිය යුතු සංවර්ධනයන්; හා<br>• අනාගතය වෙනුවෙන් අවස්ථා. | | |
| **ඊ. ආයතනික පාලන වාර්තාව** | | | |
| ආයතනික පාලන වාර්තාව | සංග්‍රහයේ මූලධර්ම හා විධිවිධාන අනුව බැංකුව අනුකූලව වී ඇති ආකාරය හා ප්‍රමාණය හෙළිදරව් කළ යුතුය. | D.5.1 | අනුකූලතාව දක්වා ඇත. |
| **උ. විගණන කමිටු වාර්තාව** | | | |
| විගණන කමිටු වාර්තාව | කමිටුව විසින් සිදු කරන ලද කාර්යයන් දැක්විය යුතුය. | D.3.3 | අනුකූලතාව දක්වා ඇත. |

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 11 දරන බැංකු පනත් විධානයෙහි අවශ්‍යවන පරිදි බැංකුව ආයතනික පාලන නීති පිළිපැදීම

මෙම නියෝගවල අවශ්‍යතා සමඟ අනුකූලතා මට්ටම පිළිබඳව විගණකාධිපති විසින් හෙළිදරව් කරගත් සත්‍ය තොරතුරු වාර්තාවක් නිකුත් කරන ලදී නියෝග සමඟ අනුකූල නොවීමක් එහි වාර්තා වී නොමැත. ආයතනික පාලන සහතිකය හා හෙළිදරව් කරගත් සත්‍ය තොරතුරු පිටු අංක 124 සිට 153 දක්වා ඇත.

## 2012 වර්ෂය තුළ දී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල හා අනුකමිටු රැස්වීම් සංඛ්‍යාව

| කමිටුවේ නම | රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල | 18 |
| මාණ්ඩලීය විගණන කමිටු (මා.වි.ක.) | 10 |
| මාණ්ඩලික විධායක ණය කමිටු (මා.වි.ණ.ක.) | 24 |
| මාණ්ඩලීය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (මා.මා.ස.පා.ක.) | 11 |
| මාණ්ඩලීය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටු (මා.ස.අ.ක.ක.) | 4 |
| මාණ්ඩලීය නාමයෝජනා කමිටු (මා.නා.ක.) | 1 |
| මාණ්ඩලීය ආයෝජන බැංකුකරණ කමිටු (මා.ආ.බැ.ක.) | 1 |
| මාණ්ඩලීය තොරතුරු තාක්ෂණ කමිටු (මා.තො.තා.ක.) | 7 |

## 2012 වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩල හා අනුකමිටු රැස්වීම්වලට පැමිණීම

| අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ මණ්ඩල | මා.වි.ක | මා.වි.ණ.ක | මා.මා.ස.පා.ක. | මා.ස.අ.ක.ක. | මා.නා.ක. | මා.ආ.බැ.ක. | මා.තො.තා.ක. |
|---|---|---|---|---|---|---|---|---|
| ඩබ්ලිව්. කරුණාජීව මහතා | 18 | සා. නො. | 22 | 11 | සා. නො. | සා. නො. | සා. නො. | සා. නො. |
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි | 18 | සා. නො. | 23 | 11 | 4 | 1 | 1 | 7 |
| ජෙහාන් පී. අමරතුංග මහතා | 16 | 10 | සා. නො. | සා. නො. | 4 | 1 | 1 | 7 |
| අජිත් පණ්ඩිතරත්න මහතා | 15 | සා. නො. | සා. නො. | 10 | සා. නො. | 1 | සා. නො. | සා. නො. |
| ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය | 17 | සා. නො. | 22 | සා. නො. | සා. නො. | 1 | සා. නො. | සා. නො. |
| ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය | 15 | 9 | සා. නො. | සා. නො. | 4 | 1 | සා. නො. | සා. නො. |
| විසාඛා අමරසේකර මෙනවිය | 16 | 9 | සා. නො. | සා. නො. | 4 | 1 | 1 | සා. නො. |
| ප්‍රියන්ත මායාදුන්න මහතා | 16 | සා. නො. | සා. නො. | 10 | සා. නො. | 1 | සා. නො. | 7 |
| පවර දසනායක මහතා | 17 | සා. නො. | 19 | සා. නො. | සා. නො. | 1 | සා. නො. | සා. නො. |

*සටහන: සාමාජික නොවේ. (සා. නො.)*






**රජය සතු බැංකුවක් ලෙස**, අපගේ පාර්ශ්වකරුවන් වෙනුවෙන් අප උත්පාදනය කරන ප්‍රමාණවත් ලාභ ආපසු සමාජය වෙත ගමන් කරන බව අපි දන්නෙමු. ශ්‍රී ලංකාවේ සංවර්ධනය තුළ භූමිකාවක් රඟ දැක්වීම බැංකුවට අභිමානයකි. අපගේ නමින්ම සියලු දේ කියවේ...
මන්ද එහි හරය ජනතාව වන බැවිනි.



අක්‍රිය ණය අනුපාතය
2.8%
මුළු වත්කම්
රු. බිලියන
873
2008
2009
2010
2011
2012
ප්‍රාග්ධන ප්‍රමාණාත්ම බව
අනුපාතය
14.0%
ණය තත්ත්වාගණනය ස්ථාවර -
ෆිච් රේටින්ස් විසින්
AA+

# අවදානම් කළමනාකරණය

## පසුබිම හා පාදක මූලධර්ම

ගනුදෙනුකාර භවතුන්ට හා ප්‍රතිපාර්ශ්වයනට විවිධ මූල්‍ය පහසුකම් සැපයීම, විවිධ ආකාරයේ අවදානම්වලට බැංකුව නිරාකරණය බවත් ඒවා කළමනාකරණය කිරීම බැංකුවේ දිගුකාලීන වර්ධන හැකියාව සඳහා තීරණාත්මක වන බවත් බැංකුව පිළිගනී.

බැංකුව හඳුනාගෙන ඇති ප්‍රධාන අවදානම් අතරින් කිහිපයක් පහත දැක්වේ:

i. ණය අවදානම
ii. වෙළඳපළ අවදානම
iii. සාන්ද්‍රණ අවදානම
iv. ද්‍රවශීලතා අවදානම
v. මෙහෙයුම් අවදානම
vi. පොළී අනුපාතික අවදානම
vii. නීතිමය අවදානම

ණය දීම හා ණය ගැනීම යන අපගේ ප්‍රධාන ක්‍රියාකාරකම් තුළින් පැන නගින අවදානම් බොහොමයක බලපෑම අඩු කිරීම, ඒවා තුරන් කිරීම හෝ මාරු කිරීම සැලකිල්ලෙන් සැලසුම් කරන ලද ව්‍යාපාර පරිචයන් මගින් හෝ නිපැයුම් මිල නියම කිරීම හෝ සැලසුම් කිරීම මගින් සිදු කෙරේ.

බැංකුව විසින් මුහුණ දෙනු ලබන අවදානම් එකිනෙකට වෙනස් වර්ග දෙකකට කාණ්ඩගත කරනු ලැබේ:

i. නිසි ව්‍යාපාර පරිචයන් මගින් තුරන් කළ හැකි හෝ මාරු කළ හැකි හෝ වැළැක්විය හැකි අවදානම්,
ii. බැංකුව විසින් අවශෝෂණය කර ගෙන සක්‍රිය ලෙස කළමනාකරණය කරනු ලබන අවදානම්.

## පහත සඳහන් දේ සිදු කිරීම මගින් අපි අවදානම තුරන් කිරීම, වැළැක්වීම හෝ මාරු කිරීම සිදු කරන්නෙමු:

i. දැඩි අවදානම් නැඹුරුවක් තීරණය කර එය තදින් අනුගමනය කරයි.
ii. අකාර්යක්ෂම හෝ වැරදි සහගත මූල්‍ය තීරණ වැළැක්වීම සඳහා ක්‍රියාවලි, ගිවිසුම් හා ක්‍රියා පටිපාටි ප්‍රමිතිකරණය කිරීම.
iii. අනවශ්‍ය අවදානම් සාන්ද්‍රණයන් අඩු කිරීම සඳහා දැඩි විවිධාංගීකරණ ඉලක්ක සහිතව කළඹ සකස් කිරීම.
iv. නිපැයුම් මිල නියම කිරීම හා සැලසුම් කිරීම.

ආවේණික අවදානම් කළමනාකරණය කිරීමේ දී අප අපගේම සම්පත් හා විශේෂඥභාවය භාවිතා කරන්නෙමු. ස්ථිර හා ප්‍රමාණවත් ලාභ සහතික කරන්නා වූ ස්ථාවරත්වය හා වර්ධනය තහවුරු කිරීමේදී මෙබඳු අවදානම් තත්ත්වයන් නිසි ලෙස කළමනාකරණය කිරීම වැදගත් අංශයක් බව අපි විශ්වාස කරන්නෙමු.

## අපගේ අවදානම් කළමනාකරණ පද්ධතිය පහත සඳහන් පියවර අනුක්‍රමණයන්/ශිල්පීය ක්‍රමවලින් සමන්විත වේ:

### අ. පහත දක්වා ඇති කරුණු පිළිබඳ පැහැදිලි ප්‍රතිපත්ති නියමයන්:

i. අවදානම් ප්‍රතිරක්ෂණ ප්‍රමිති (අවදානම් නැඹුරුව).
ii. අවදානම කාණ්ඩගත කිරීම.
iii. සමාලෝචනයේ ප්‍රමිතිය.

### ආ. ආයෝජන, ණය හා වෙළඳ ක්‍රියාකාරකම් වෙනුවෙන් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, මෙහෙයුම් නිර්ණායක හා උපාය මාර්ග ස්ථාපනය කිරීම -

වෙළඳපොළේ යම් නිශ්චිත වර්ග හෝ ක්ෂේත්‍ර කෙරෙහි බැඳීම අනුව ප්‍රතිපත්ති හා උපායමාර්ග පැහැදිලි කෙරේ. දැරිය හැකි සාන්ද්‍රණ මට්ටම් හා දැරිය හැකි වත්කම් බැරකම් නොගැලපීම (නිරාවරණය) තීරණය කරනු ලැබේ.

### ඇ. අවදානම් තත්ත්ව සීමා, බලාධිකාරී මට්ටම් හා නීති ස්ථාපනය කිරීම -

i. කලින් නියම කරන ලද තත්ත්ව මට්ටම් සහිත අවසර ලත් වත්කම් පංති/හෝ ප්‍රතිපාර්ශ්වවලට පමණක් අවදානම ගැනීම සීමා කරනු ලැබේ.
ii. යෝග්‍ය වත්කම් හා ප්‍රතිපාර්ශ්ව නිරාවරණයන් පිළිබඳව සීමා නියම කිරීම එක් පුද්ගලයෙකු විසින් හෝ කමිටුවක් විසින් ගත හැකි අවදානම් ද මනා ලෙස නිර්ණය කරන ලද පාලන මට්ටම් මගින් සීමා කරනු ලැබ ඇත.

භාණ්ඩාගාර වෙළඳ අංශයට මෙන්ම ණය රේඛාවේ නිලධාරීන්ට ද මෙය අදාළ වේ.

## වර්ෂය තුළ ගන්නා ලද මූලාරම්භයන්

සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ අපගේ අවදානම් කළමනාකරණ රාමුව තහවුරු කර ශක්තිමත් කිරීම අපි අඛණ්ඩව සිදු කළෙමු. බාසල් 11 රාමුවේ 2 ස්ථම්භය යටතේ අවශ්‍ය වන පරිදි පරිපූර්ණ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත් බව තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම තහවුරු කිරීමේ අරමුණින් යුතුව, අවදානම මැනීම, අධීක්ෂණය සහ කළමනාකරණය සඳහා නව ක්‍රියා පටිපාටි හා ක්‍රියාවලි හඳුන්වා දෙන ලදී. අලාභ දත්ත රැස් කිරීම හා සම්බන්ධ කාර්ය ක්‍රියාවලි තවදුරටත් ශක්තිමත් කෙරිණි. මෙහෙයුම් අවදානම් කළමනාකරණය සඳහා විධායක කමිටුවක් ද ස්ථාපනය කෙරිණි.

ප්‍රවර්තන වර්ෂය තුළ ණය පොතේ කර්මාන්ත සාන්ද්‍රණයට සහ තනි පුද්ගල/සමූහ ණය ගන්නන් සාන්ද්‍රණයට අදාළ නව ප්‍රතිපත්ති බැංකුව හඳුන්වා දුන්නේය.

භාණ්ඩාගාර කටයුතු පාලනයන් තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් භාණ්ඩාගාර වෙළඳ නිමැවුම් බොහොමයක් සඳහා අලාභ නැවැත්වීමේ සීමා හඳුන්වා දීම.

## මහජන බැංකුවේ සමෝධානික අවදානම් කළමනාකරණය

අපගේ ප්‍රාග්ධන සම්පත් හා තැන්පතුකරුවන්ගේ අරමුදල් මත බහු විධ අවදානම් නිරාවරණයන් මගින් ඇති වන අහිතකර බලපෑම් මගින් බැංකුව අවදානමට පත්වීම සම්බන්ධයෙන් අපි මූලික වශයෙන් අවධානයෙන් සිටින්නෙමු. ශක්තිමත් හා පූර්වාපේක්ෂණ ලෙස සක්‍රිය ආවදානම් පාලන ව්‍යුහ වේදිකාවක් මත ආයතනය තුළ ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා අප කටයුතු කර ඇත. අවදානම් උපාය මාර්ග සැකසීම හා ප්‍රාග්ධන වෙන් කිරීම අපගේ උපාය මාර්ගික හා ව්‍යාපාර සැලසුම් කිරීමේ ක්‍රියාවලියේ අනිවාර්ය කොටසකි.



## ණය අවදානම් කළමනාකරණය

ණය අවදානම අපගේ සම්පත් පදනම මත ඉහළම බලපෑම් ඇති කරන අවදානම් කාණ්ඩය ලෙස අපි සලකන්නෙමු. ණය ගන්නෙකු හෝ ප්‍රතිපාර්ශ්වයක් ගිවිසගත් ආකාරයට සිය වගකීම ඉටු කිරීමට අසමත් වීම ලෙස ණය අවදානම නිර්වචනය කළ හැකිය. තනි නිරාවරණ මට්ටමේ දී මෙන්ම කළඹ මට්ටමේ දී ද බැංකුව ණය අවදානම කළමනාකරණය කරයි. බැංකුවේ ණය අංශය ක්‍රියාත්මක වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මනා ලෙස නිශ්චය කොට දක්වා ඇති ණය අවදානම් උපායමාර්ග/ප්‍රතිපත්ති මත පදනම්ව වේ.

පහත සඳහන් අංශ ආවරණය කරමින් ලිඛිත ප්‍රතිපත්ති/ක්‍රියා පටිපාටි සපයා ඇත:

i. ඉලක්ක වෙළඳපොළවල්, අවදානම භාරගැනීමේ උපමාන, ණය අනුමත කිරීමේ බලධාරී ව්‍යුහය හා අදාළ නීති පැහැදිලිව නිශ්චය කිරීම.

ii. ණය උත්පාදන හා නඩත්තු ක්‍රියා පටිපාටිය.

iii. එක් එක් කර්මාන්ත අංශ හා තනි පුද්ගල ණය ගන්නන් වෙනුවෙන් උපරිම නිරාවරණ සීමා වැනි කළඹ කළමනාකරණ මගපෙන්වීම් නිර්ණායක.

iv. ප්‍රතිකර්ම/පුනරුත්ථාපන කළමනාකරණ මග පෙන්වීම් නිර්ණායකය.

v. ණය සමාලෝචන ප්‍රතිපත්තිය.

vi. සෝදිසියෙන් සිටීම සඳහා අවදානම් විභවය සහිත ණය ගන්නන්ගේ ලැයිස්තුවක් සැකසීම හා මෙම ණය ගන්නන් අධීක්ෂණය කිරීම.

vii. ණය රේඛාවේ ධුරාවලිය මත පදනම්ව ණය දීමේ බලය පැවරීම.

viii. නිශ්චිත ප්‍රමාණයක් ඉක්මවූ නිරාවරණයන් වෙනුවෙන් ණය අවදානම් කළමනාකරණ අංශයේ නිලධාරියෙකු ද ඇතුළුව ණය නිලධාරීන් අවම වශයෙන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් ණය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය දීම සිදු කෙරේ.

ix. වගකීමෙන් බැඳී ඇති සෑම අයෙකුටම අවදානම් තත්ත්වාගණනයක් පැවරීම සඳහා අභ්‍යන්තර ණය අවදානම් තත්ත්වාගණන ක්‍රමය.

x. අප ණය සමාලෝචන යාන්ත්‍රණයක් පිහිටුවා ඇත. ශාඛා/ප්‍රාදේශීය/කලාපීය බල මට්ටමේ දී කාර්තුමය වශයෙන් නිදහස් කළ ණයවලින් යම් ප්‍රතිශතයක් අහඹු පදනමින් තෝරාගෙන එම ණය තීරණවල ගුණාත්මක බව අධීක්ෂණය කර සහතික කිරීම හා කලට වේලාවට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම ද පිණිස ප්‍රාදේශීය මෙන්ම ප්‍රධාන කාර්යාල මට්ටමේ දී ණය ලබා දීමෙන් පසු සමාලෝචනයන්ට ලක් කෙරේ.

xi. නියම කර ඇති ණය අවදානම් සහ මෙහෙයුම් අවදානම් සම්මතයන් අනුගමනය කිරීමේ මට්ටම මැන බැලීම සඳහාත් පාලන ක්‍රමවල ප්‍රමාණවත් බව තීරණය කිරීම හා වැඩි දියුණු කළයුතු යැයි අවශ්‍ය කරන ක්ෂේත්‍ර තීරණය කිරීම පිණිස අපගේ අභ්‍යන්තර විගණන අංශය විසින් අහඹු ණය විගණන සිදු කෙරේ.

xii. තනි ණය පදනමින් මෙන්ම කළඹ පදනමින් ණය පැහැර හැරීම අධීක්ෂණය කරනු ලැබේ. පැහැර හරින ලද සියලු ණය ශ්‍රී ලංකා මහ බැංකු මෙහෙයුම් නිර්නායකවලට අනුව කාණ්ඩගත කෙරේ. මෙය දැඩි ලෙස පිළිපැදීම සහතික කරමින් මෙම ක්‍රියාවලිය පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය කර ඇත. අක්‍රීය ණය අනුපාතය 3% ට අඩුවෙන් පවත්වාගැනීමට අපට හැකි වී තිබේ.

xiii. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව ණය අලාභ වෙනුවෙන් ප්‍රතිපාදන සිදු කරනු ලැබේ.

xiv. බැංකුව දැනටමත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති 37 ආදේශ කරගෙන ඇති අතර, ඒ අනුව අලාභ ලේඛනගත කර අලාභ හඳුනාගැනීම, අත්විඳින ලද අලාභවල වාස්තවික සාක්ෂි මත පදනම්ව සිදු කරයි.




**අක්‍රීය ණය හා ප්‍රතිපාදන ආවරණය කිරීම**

### ණය කළඹේ සාන්ද්‍රණ අවදානම

කර්මාන්ත හා ණය ගන්නන් වෙනුවෙන් නිරාවරණ සීමා පිළිබඳව බැංකුව මෑතක දී ප්‍රතිපත්තියක් සම්මත කරගත්තේය. කර්මාන්ත නිරාවරණයවීම් හා තනි පුද්ගල/සමූහ නිරාවරණයවීම් (නාම සාන්ද්‍රණයන්) ආවරණය කරමින් නිරාවරණ සීමා පනවා ඇත. මෙබඳු නිරාවරණයන් අවදානම් කළමනාකරණ අංශය මගින් අධීක්ෂණයකර මාණ්ඩලික සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ.




**කර්මාන්තය අනුව ණය හා අත්තිකාරම්**

නියාමන උපරිමයට වඩා දැඩි තනි ණය ගන්නා නිරාවරණ සීමාවක් බැංකුව සතුව ඇත. ඉහළම ගනුදෙනුකාර භවතුන් 10 හා ඉහළම ගනුදෙනු කාර භවතුන් 20 හි සමාහාර නිරාවරණය බැංකුවේ මුළු කළඹට එරෙහිව මනිනු ලැබේ.

රුපියල් මිලියන 100 ට වැඩි නිරාවරණයන් වෙනුවෙන් තනි ගනුදෙනුකාර භවතුන් හා කර්මාන්ත කාණ්ඩ යන දෙවර්ගයේම සාන්ද්‍රණ අවදානම නිරන්තරයෙන් අධීක්ෂණය කෙරෙන අතර හර්ෆින්ඩල් - හර්ෂ්මන් දර්ශකය (හ. හ. ද.) භාවිතා කරමින් බෙදීයාමේ මට්ටම මනිනු ලැබේ.

| තනි ගනුදෙනුකාර භවතෙකු | හ. හ. ද. HHI |
|---|---|
| ශ්‍රී ලංකා රජය සමග | 0.25 |
| ශ්‍රී ලංකා රජය නොමැතිව | 0.08 |

| කර්මාන්ත කාණ්ඩය | හ. හ. ද. HHI |
|---|---|
| ශ්‍රී ලංකා රජය සමග | 0.28 |
| ශ්‍රී ලංකා රජය නොමැතිව | 0.12 |

හ. හ. ද. < 0.15 - නම් අඩු සාන්ද්‍රණය

හ. හ. ද. - 0.15 - 0.25 - නම් මධ්‍යස්ථ සාන්ද්‍රණය

හ. හ. ද. > 0.25 - නම් ඉහළ සාන්ද්‍රණය

ශ්‍රී ලංකා රජයේ නිරාවරණයන් නොමැතිව කළඹ සතුව අඩු සාන්ද්‍රණ මට්ටමක් ඇත.

ශ්‍රී ලංකා රජය වෙත ඉහළ නිරාවරණ මට්ටමට හේතු වී ඇත්තේ අප රාජ්‍ය බැංකුවක් වීම වුවත්, ව්‍යුහයට අන්තර්ගත කර ඇති විවිධ බලපෑම් අඩු කිරීමේ මාර්ග හා ණය වැඩි දියුණු කිරීම් ගත් කල මෙය අනවශ්‍ය කනස්සල්ල ඇති කරගත යුතු තත්ත්වයක් නොවේ.

## කළඹ විශ්ලේෂණය

පහත සඳහන් කරුණු අනුව අවදානම් කළමනාකරණ අංශය මගින් කළඹ විශ්ලේෂණය සිදු කෙරේ.

අ. නිපැයුම
ආ. අංශ
ඇ. ව්‍යාපාර වර්ග
ඈ. අතිරේක ඇපය
ඉ. ණයගන්නාගේ ණය අවදානම් තත්ත්වාගණනය

කලට වේලාවට අහිතකර ප්‍රවණතා හඳුනා ගැනීම පිණිස හානි සම්බන්ධයෙන් දැඩි ලෙස අධීක්ෂණය කරනු ලැබේ.

## ණය අවදානම සඳහා ආතති පරීක්ෂණය

අවදානම් කළමනාකරණ අංශය මගින් සකසන ලද ආකෘති මත කළඹ මට්ටමේ දී ආතති පරීක්ෂණය සිදු කෙරේ. ණය වත්කම්වල හානි වීම් මගින් වන අහිතකර ප්‍රවණතා හෝ වෙනස්වීම් බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත් බව මත ඇති කරන බලපෑම් පරීක්ෂා කර පහත දක්වා ඇත:




**අක්‍රිය ණය ඉහළ යාම ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතිකය මත බලපෑම**




**අක්‍රිය ණය කාණ්ඩ වල නිශේධාත්මක වෙනස්වීම් ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතිකය මත බලපෑම**




**උකස් කරන ලද අතිරේක ඇප වල විකුණුම් අගය අඩු වීම ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත බලපෑම**




**අක්‍රිය ණය වර්ධනය (සක්‍රිය තත්ත්වයෙන් අක්‍රිය තත්ත්වයට මාරු කිරීම හේතුවෙන්) ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත බලපෑම**




**ඉහළම ණයගන්නන් 10 දෙනා අක්‍රිය ණය තත්ත්වයට පහත වැටීමෙන් ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත බලපෑම**

## වෙළෙඳපොළ අවදානම් කළමනාකරණය

පොළී අනුපාතික, විදේශ විනිමය අනුපාතික, සාමාන්‍ය කොටස් මිල ගණන් හා වෙළඳ භාණ්ඩ මිල ගණන්වල අහිතකර වෙනස්වීම් මගින් වෙළඳපල අවදානම පැන නගී.

අපගේ වෙළඳ පොත හා බැංකුකරණ පොත යන දෙකෙහිම මෙබඳු අවදානමට නිරාවරණය වීම් පවතී. වෙළඳපොළ අවදානම කළමනාකරණය කිරීම සඳහා පරිපූර්ණ ප්‍රතිපත්ති හා සීමා සමූහයක් යොදාගෙන ඇත. විශිෂ්ට පරිචයන් අනුගමනය කරන අතරම, මෙම ප්‍රතිපත්ති/ක්‍රියා පටිපාටි ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට ද අනුකූල වේ.

වත්කම් හා බැරකම් කමිටුව, වෙළෙඳපොළ අවදානම කළමනාකරණය කිරීමේ වගකීම උසුලයි. වෙළඳ අවදානම් තත්ත්වයන්හි සියලු භෞතික මූලාශ්‍ර හඳුනාගෙන අවදානම් සීමා නියම කිරීම වත්කම් හා බැරකම් කමිටුව මගින් සිදු කෙරේ. විවිධ වෙළඳපොළ අවදානමට නිරාවරණය වීම් භාණ්ඩාගාර මැදපෙළ කාර්යාලය විසින් සමීපව අධීක්ෂණය කර යෝග්‍ය ක්‍රියාමාර්ග ඇරඹීම සඳහා ප්‍රධාන අවදානම් නිලධාරී හා වත්කම් හා බැරකම් කමිටුව වෙත වාර්තා කරනු ලැබේ. කෙසේ වෙතත් වෙළඳපොළ අවදානම කළමනාකරණය (වෙළඳ/ආයෝජන පොත) සඳහා ඉදිරි පෙළ වගකීම භාණ්ඩාගාර වෙළඳ අංශයට පැවරී ඇත. භාණ්ඩාගාර ඉදිරිපෙළ කාර්යාලය, මැද පෙළ කාර්යාලය හා පසුපෙළ කාර්යාලය පැහැදිළි හා මනාව නිශ්චය කරන ලද වගකීම් සහිතව වෙනස් වාර්තාකරණ මාර්ග තුනකට පැහැදිලිව වෙන් කර ඇත.

### විදේශ විනිමය අවදානම් කළමනාකරණය

බැංකුව විවෘත පිහිටීමක පවතින කාල පරිච්ඡේදයක් තුළ විනිමය අනුපාතික අහිතකර ලෙස සංචලනය වීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුව අලාභ අත්විඳිය හැකිවීමේ අවදානම විදේශ විනිමය අවදානම වේ. අවදානමෙහි බලපෑම අවම කිරීමේ මූලික ක්‍රියාමාර්ග යක් ලෙස අවදානම් විවෘත තත්ත්වය මත පහත දැක්වෙන සීමාවන් පනවා ඇත:

i. මුදල් ඒකක/වෙළඳ ආයතනය අනුව පරිමා සීමාවන්.
ii. අන්තඃ දිවා හා රාත්‍රී ශුද්ධ විවෘත පිහිටීම යන දෙකටම සමස්ත අවකාශ සීමාවන්.
iii. මුදල් ඒකකය/හා වෙළඳ ආයතනය අනුව අලාභ නැවැත්වීමේ සීමා.

විදේශ විනිමය අවදානම මැනීම සඳහා අපි පහත සඳහන් මෙවලම් ද භාවිතා කරන්නෙමු:

i. විදේශ මුදල් අගයන් ඇති වත්කම් හා බැරකම් කල් පිරීම් පරතර විශ්ලේෂණය.
ii. අවදානමෙහි ඇති දෛනික වටිනාකම 99% විශ්වාසය මට්ටමේදී. 99% විශ්වාසය මට්ටමේදී නිරාවරණ තත්ත්වයක් මත පැන නැගිය හැකි උපරිම අලාභය මැනීමට මෙම ක්‍රමය යොදාගනු ලැබේ. එබැවින් එය වෙළෙඳපොළ අවදානම් සාධක පිළිබඳ ඓතිහාසික දත්ත පුළුල් ලෙස යොදාගැනීම මත රඳා පවතී.
iii. අවදානමෙහි ඇති දෛනික වටිනාකම ක්‍රමයට අනුපූරක ලෙස, විනිමය අනුපාතිකවල සීමාන්තික සංචලණයන් (5% සිට 15% දක්වා සංචලනයන්) මගින් ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතිකය මත ඇති කරන බලපෑම මැනීම සඳහා ආතති පරීක්ෂණ සිදු කරනු ලැබේ.




**මාසය අවසානයේ විදේශ මුදල් ශුද්ධ විවෘත පිහිටීම NOP හා දෛනික අගය - 2012**




විනිමය අනුපාතික වල අහිතකර සංචලනය මගින් ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත බලපෑම

විදේශ විනිමය අනුපාතිකවල 15% ප්‍රමාණයක අහිතකර සංචලනයක් පවා බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතිකය මත ඇති කරන්නේ නොසලකා හැරිය හැකි බලපෑමකි.

විනිමය අවදානම මනා ලෙස කළමනාකරණය කරනු ලැබ ඇති අතර, විනිමය අනුපාතිකවල කවර හෝ අහිතකර සංචලනයක් බැංකුවේ ප්‍රාග්ධන අනුපාතය මත විශාල බලපෑමක් ඇති නොකරයි.

පොළී අනුපාතික අවදානම, වෙළෙඳපොළ අවදානම කළමනාකරණයේ තීරණාත්මක සංරචකයක් වේ. පොළී අනුපාතිවකල යම් අහිතකර වෙනස්වීමක් බැංකුවේ ශුද්ධ පොළී ආන්තික මත බලපෑමක් ඇති කළ හැකිය. වෙළඳ පොත හා බැංකුකරණ පොත යන දෙකෙහිදීම පොළී අනුපාත අවදානම නියම කර සීමාවන් අනුව ප්‍රමාණකර අධීක්ෂණය කෙරෙන බවට බැංකුව වගබලා ගනී.

පොළී අනුපාතවල අසතුටුදායක වෙනස්වීමක් මගින් වෙළඳ කාර්යයන් සඳහා බැංකුව අතැතිව සිටින ස්ථිර ආදායම් සුරැකුම්පත්වල වෙළෙඳපොළ වටිනාකම මත බලපෑමක් ඇති විය හැකිය. අප මෑතකදී අපගේ වෙළඳාම් කළඹ මත අලාභ නැවැත්වීමේ සීමාවක් පනවා ඇත. මෙම කළඹ දෛනික පදනමින් වෙළඳපොළට ගැලපීම කෙරෙන අතර, අලාභ නැවැත්වීමේ සීමාවන්ට අනුව අධීක්ෂණය කරනු ලැබේ.

අපි 99% විශ්වාසයේ දී දෛනික අවදානම් අගය ආකෘතිය භාවිතා කරන්නේ වෙළඳ කළඹෙහි නිරාවරණ අවදානම ප්‍රමාණනය කිරීම සඳහා වේ. භාණ්ඩාගාර මැද පෙළ කාර්යාලය අපගේ වෙළඳ කළඹ මත අවදානමට පත් අගය (විභව අලාභය) දෛනික පදනමින් අධීක්ෂණය කරයි.

ශේෂ පත්‍රයේ කල්පිරීමේ පරතර ප්‍රතිමිලකරණය බැංකුකරණ පොතේ පොළී අනුපාතික අවදානමේ ප්‍රධාන මූලාශ්‍රය වේ. වත්කම් හා බැරකම්වල ප්‍රතිමිලකරණ පරතර ප්‍රකාශය (කල්පිරීමේ පරතර විශ්ලේෂණය) භාවිතා කරමින් මෙය ප්‍රමාණ කිරීම සිදු කෙරේ.

ප්‍රති මිලකරණ නොගැලපීම විශ්ලේෂණය කිරීමේ දී එක් ප්‍රධාන අභියෝගයක් පැන නගින්නේ නිවාස ණය, ස්ථිර පොළී අනුපාත ණය, ඉතුරුම් හා ස්ථිර තැන්පතු වැනි ඇතැම් නිපැයුම්වල ආවේණික විකල්පයන් සම්බන්ධ උපකල්පනවල ගුණාත්මක බව හේතුවෙනි. වර්ෂය තුළ දී, චර්යාමය පරතර විශ්ලේෂණය ප්‍රකාශනය හා කාලසීමා පරතර විශ්ලේෂණ, චර්යාමය දත්ත භාවිතය මගින් තවදුරටත් පිරිපහදන ලදී.

ආතති පරීක්ෂණය : පොළී අනුපාතිකවල අහිතකර වෙනස්වීම් හේතුවෙන් 'එහි සාමාන්‍ය කොටස්වල වෙළෙඳපොළ අගය' මත බලපෑම බැංකුව අධීක්ෂණය කරයි. මෙය මනිනු ලබන්නේ කාලසීමා පරතර විශ්ලේෂණ ක්‍රමය භාවිතා කරමින් හා බැංකුවේ ප්‍රාග්ධනය මත බලපෑම තීරණය කිරීම පිණිස 1% ක අහිතකර පොළී අනුපාතික කම්පනය ආදේශ කරමිනි.




අහිතකර පොළී අනුපාතික වෙනස හේතුවෙන් සාමාන්‍ය කොටස් වල වෙළෙඳපොළ අගය මත බලපෑම, කාලසීමා පරතර විශ්ලේෂණය භාවිතයෙන්




1% පොළී අනුපාතික වැඩිවීම, ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත බලපෑම

පොළී අනුපාතික අවදානම මනාව කළමනාකරණය කර ඇති අතර පොළී අනුපාතිකවල කවර හෝ අහිතකර සංචලනයක් බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත කිසිදු විශාල බලපෑමක් ඇති කිරීමට ඉඩ නොතිබිණි.

## සාමාන්‍ය කොටස් අවදානම

බැංකුව අඛණ්ඩව කුඩා සහ විවිධාංගකරණයක් සහිතව ලැයිස්තුගත කොටස් විකිණීමේ කාර්යය කරනු ලබයි. පහත සඳහන් කරුණු නිශ්චිතව දක්වමින් දැඩි සීමාවන් තුළ කළඹ නඩත්තු කිරීම හා වෙළඳ ක්‍රියාකාරම් සිදු කරන ලදී:

i. සමස්ත නිරාවරණ සීමාවන්
ii. කළඹෙහි විවිධාංගීකරණ මට්ටම
iii. දැඩි ආයෝජන සුදුසුකම් නිර්ණායක
iv. තනි නිරාවරණ වීම් මත අලාභ සීමා

භාණ්ඩාගාර මැදපෙළ කාර්යාලය විසින් දෛනික පදනමින් කළඹ වෙළෙඳපොළට ගැලපීම සිදු කර සීමාවන්ට අනුව නිරාවරණයවීම් අධීක්ෂණය කරනු ලැබේ.

## සාමාන්‍ය කොටස් මිළ සංචලනය වෙනුවෙන් ආතති පරීක්ෂණය




**සාමාන්‍ය කොටස්වල මිලෙහි අහිතකර සංචලනය ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය මත බලපෑම**

## ද්‍රවශීලතා අවදානම

කෙටිකාලීන බැරකම් වලින් දිගුකාලීන වත්කම් සඳහා අරමුදල් සම්පාදනය හේතුවෙන් ද්‍රවශීලතා අවදානම ප්‍රධාන වශයෙන් පැන නගී. මූල්‍ය අතරමැදියෙකු ලෙස එහි මූලික කාර්යභාරයේ දී බැංකුවට මගහැරිය නොහැකි අවදානමකි. සාමාන්‍ය වෙළෙඳපොළ තත්ත්වයකදී, කෙටි කාලීන බැරකම් යොදාගනිමින් මෙය කළමනාකරණය කෙරේ.

ද්‍රවශීලතා සැලසුම් කිරීම අවම වශයෙන්, අභ්‍යන්තර හා බාහිර යන දෙආකාරයෙන්ම උපදින සීමාන්තික ආතතිය සහිත තත්ත්වයන් තුළ පවා බැංකුවට එහි වගකීම් සඳහා අරමුදල් සම්පාදනය කිරීමේ හැකියා තහවුරු කළ යුතුය.

එක් බැංකුවක සාමාන්‍ය ද්‍රවශීලතා අර්බුදයක් රටේ සමස්ත බැංකුකරණ ජාලය මත ඇති කළ හැකි බලපෑම සැලකූ කල, ඵලදායක ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය අතිශයින්ම වැදගත් වේ.

ද්‍රවශීලතාව හා ලාභදායක බව අතර නොවැළැක්විය හැකි හිලව් කිරීම බැංකුව පිළිගන්නා අතර, බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා මෙහෙයුම් නිර්ණායක තුළට එය ඒකාබද්ධ කරගෙන ඇත.

සාමාන්‍ය ජනතාව අතර හා මූල්‍ය වෙළඳපොලවල් තුළ බැංකුවේ කීර්තිනාමය, තරඟකාරී මිල ගණන් යටතේ අරමුදල් ආකර්ෂණය කරගැනීම දිගින් දිගටම සිදු කිරීමට බැංකුව සතු හැකියාව මත කැපී පෙනෙන බලපෑමක් එල්ල කරන බව පැහැදිලි කරුණකි. අපගේ කීර්තිනාමය කවර හෝ ආකාරයකින් පළුදු වීම, ගනුදෙනුකාර භවතුන්ගේ අවශ්‍යතා ඉටු කරීම සඳහා අරමුදල් පැවතීමේ හා එම අරමුදල්වල පිරිවැය කෙරෙහි නිෂේධාත්මක ලෙස බලපානු ඇත.

ශක්තිමත් ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ උපාය මාර්ගයක්, බැංකුවේ කීර්තිනාමය වැඩි දියුණු කරමින් ස්ථාවරභාවය එක් කරන බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. තරඟකාරී මිල ගණන් යටතේ සිල්ලර හා තොග අරමුදල් ලබාගැනීම සඳහා බැංකුව සතු හැකියාව මෙමගින් වර්ධනය කෙරේ.

ද්‍රවශීලතා කළමනාකරණය මූලික වශයෙන්ම බැංකුවේ වත්කම් හා බැරකම් කමිටුවේ වගකීම වේ. ද්‍රවශීලතාවය එදිනෙදා කළමනාකරණය වෙනුවෙන් වගකීම භාණ්ඩාගාර අංශය සතුවන අතර, භාණ්ඩාගාර මැද පෙළ කාර්යාලය ද්‍රවශීලතාව අධීක්ෂණය කිරීමේ වගකීම උසුලයි.

එබැවින්, ද්‍රවශීල වත්කම් කළඹක් පවත්වා ගැනීම සහ මනා ලෙස සැලසුම් කරන ලද නිපැයුම් හඳුන්වා දීම හා අදාළ මූලාශ්‍ර සමග ඵලදායක සබඳතා කළමනාකරණය හරහා බැංකුව වෙත ආකර්ෂණය කරගන්නා ලද විවිධාංගිකෘත සිල්ලර තැන්පතු කළඹක් පවත්වා ගැනීම ද මත අපගේ ද්‍රවශීලතා කළමනාකරණ උපාය මාර්ගය මූලික වශයෙන් පදනම් වේ. පුළුල් විසිරීමක් සහිත ශාඛා ජාලය හා සිල්ලර ගනුදෙනුකාර භවතුන්ගේ විශාල පදනමත් කරා ප්‍රවේශය, අපගේ ද්‍රවශීලතා උපායමාර්ගයේ අතිශයින් වැදගත් සංඝටකව පවතී.

විදේශීය හා දේශීය බාහිර මූලාශ්‍ර වෙතින් ලැබෙන කැපවූ ණය වැඩසටහන් ගණනාවකින් ශක්තිමත් කරන ලද පරිපූර්ණ, අසම්භාව්‍ය අරමුදල් සම්පාදන සැලැස්මක් ද බැංකුව සකස් කර ඇත.

## ද්‍රවශීලතා අවදානම අධීක්ෂණය හා කළමනාකරණය සඳහා බැංකුව පහත සඳහන් මෙවලම් භාවිතා කරයි:

- වත්කම් බැරකම්වල මුදල් ප්‍රවාහ කල්පිරීමේ පරතර ප්‍රකාශන හා ඒවා නියම කර ඇති සීමාවන් අනුව අධීක්ෂණය කිරීම.
- ගනුදෙනුකාර භවතුන්ගේ තැන්පතුවලට ණය අනුපාතය, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය, උපයෝජනය නොකරන ලද අන්තර් බැංකු ණය ගැනීමේ මාර්ග හා ගනුදෙනකාර භවතුන්ට ලබාදෙන උපයෝජනය නොකරන ලද සීමා වැනි ද්‍රවශීලතා දර්ශක අධීක්ෂණය.
- සැලකිය යුතු උණුසුම් මුදල් බැහැරවීම හෝ ඉහළ ද්‍රවශීලතා පිරිවැයකට මග පාදන තත්ත්වාගණන පහළ දැමීමක් යනාදී සීමාන්තික තත්ත්වයන් වෙනුවෙන් ද්‍රවශීලතා තත්ත්වයන් ආතති පරීක්ෂණයට ලක් කිරීම.

| ද්‍රවශීලතා දර්ශක | 2011 % | 2012 % | මෙහෙයුම් නිර්ණායක % |
|---|---|---|---|
| ණය/ගනුදෙනුකාර හවතුන්ගේ තැන්පතු | 92.4 | 96.6 | <83 |
| උපයෝජනය නොකරන ලද අන්තර් බැංක ණය ගැනීම් මාර්ග | 48 | 44 | <100 |
| මධ්‍ය කාලීන අරමුදල් සම්පාදනය | 101 | 102 | >15 |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය - DBU | 21.5 | 21.8 | >20 |
| - FCBU | 24.0 | 21.8 | >20 |

### ආතති පරීක්ෂණය




**'1 මසක් දක්වා' කාල පථය මත උණුසුම් මුදල්/ සිල්ලර අරමුදල් ආපසු ගැනීම් වල බලපෑම**

*උණුසුම් මුදල් - ආපසු ගැනීමේ ඉහළම අවදානම ඇති අරමුදල් රු. මි. 50 වැඩි ඉතුරුම්, ඉල්ලුම් තැන්පතු හා කාල තැන්පතු ගිණුම් උණුසුම් මුදල් ලෙස සැලකේ.*

*සිල්ලර අරමුදල් - ආපසු ගැනීමේ අවදානම අඩු අරමුදල්*

*1 සිදුවීම් පෙළ - උණුසුම් මුදල් 5% හා සිල්ලර අරමුදල් 5% ආපසුගැනීම්.*

*2 සිදුවීම් පෙළ - උණුසුම් මුදල් 10% හා සිල්ලර අරමුදල් 5% ආපසු ගැනීම්.*

*3 සිදුවීම් පෙළ - උණුසුම් මුදල් 10% හා සිල්ලර අරමුදල් 10% ආපසු ගැනීම්.*

## මෙහෙයුම් අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම අපගේ සියළු ක්‍රියාවලි හා ක්‍රියාකාරකම්වලට ආවේණික වේ. අප, පුළුල් පරාසයක විවිධ සේවාදායකයන්ට බැංකුකරණ පහසුකම් විශාල සංඛ්‍යාවක් සපයන ශ්‍රී ලංකාවේ විශාලතම බැංකු අතරින් එකක් වීම අනුව ගත් කල, මෙහෙයුම් අවදානම කළමනාකරණය හා පාලනය අතිශය වැදගත්කමක් ගනී. බැංකුවේ නියෝජිතයන් ලෙස ක්‍රියා කරන, රට පුරා විසිරි ඇති දේපල හිමිකාරිත්වය දරන හා ඒවායේ පදිංචිව සිටින හා රඳවාගන්නා සහ අපට හා අපගේ ගනුදෙනුකාර හවතුන්ට අයත් තොරතුරු ඇතුළු වත්කම් වල භාරකරුවන් වන පුද්ගලයන් අපි සේවයෙහි යොදවාගන්නෙමු.

මෙහෙයුම් අවදානම බැංකුවේ ක්‍රියාකාරකම් වලදී භාවිතා කෙරෙන ක්‍රියාවලි හා ගිනි, සොරකම්, ලේඛනගත කිරීමේ දෝෂ, වැරදි සහගත ගිණුම් වැනි සිතාමතා සිදු කෙරෙන, අහම්බෙන් සිදුවන හෝ ස්වාභාවික බාහිර සිදුවීම් මත දුර්වල පාලනයන් හෝ පාලනයන් නොමැති වීමේ ප්‍රතිඵලයකි.

බැංකුව මනා ලෙස නිශ්චය කරන ලද මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කර ඇත. පහත සඳහන් දේ සහතික කිරීම මෙම ප්‍රතිපත්තියේ මුඛ්‍ය පරමාර්ථ වේ.

i. කැපී පෙනෙන මෙහෙයුම් අලාභ වලින් බැංකුවේ ප්‍රාග්ධන හා ඉපයීම් ආරක්ෂා කිරීම.

ii. සමස්ත බැංකුවේම මෙහෙයුම් අවදානම කළමනාකරණය සඳහා මනාව නිශ්චය කරන ලද, පැහැදිලිව අවබෝධ කරගත හැකි හා ඒකාකාර ක්‍රියාවලිය.

iii. සේවා සැපයුම් ප්‍රමිති හා අපගේ කීර්තිනාමය මෙහෙයුම් ගැටළු වල ප්‍රතිඵලයක් ලෙස පලුදු නොවන බව සහතික කිරීම.

### කාර්යභාරයන් හා වගකීම්

ප්‍රමාණවත් වගකීම් බෙදා දීමක්, පරිපූර්ණ අවදානම් ආවරණයක් හා පැහැදිලි වගවීම පවතින බව සියලු අංශවලට සාමූහිකව සහතික විය හැකි පරිදි සියලු අංශ වෙනුවෙන් ඒවායේ කාර්යභාරයන් හා වගකීම් තීරණය කිරීම මෙහෙයුම් අවදානම කළමනාකරණ රාමුවේ පදනම වේ.




## මෙහෙයුම් අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම් තත්ත්වයන් හඳුනාගැනීම හා තක්සේරු කිරීම මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ අත්‍යවශ්‍ය අංගයක් වේ. මෙම කාර්යය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රමවේද මත පදනම් වූ මෙවලම් ගණනාවක් භාවිතා කෙරේ. මෙම ක්‍රම මගින් රැස් කර ගැනෙන තොරතුරු සමස්ත බැංකුවේ අවදානම් බලපෑම අඩු කිරීම පිණිස යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ දී භාවිතා කෙරේ.

අපි දැනට පහත සඳහන් මෙවලම් භාවිතා කරන්නෙමු:

i. අලාභ සිද්වීම් පිළිබඳ තොරතුරු: අතීතයේ සිදුවූ අලාභ හා හානි පිළිබඳව දත්ත පදනමක් සකස් කෙරෙමින් පවතී. ව්‍යාපාරයෙහි හා මෙහෙයුම් පරිසරයේ කිසිදු වැදගත් වෙනසක් නොමැති තත්ත්වයක් පැවතුනහොත් අනාගතයේදී ඇතිවිය හැකි අවදානම් තත්ත්වයන් හඳුනාගෙන තක්සේරු කිරීම සඳහා මෙම දත්ත සැලකිල්ලෙන් විශ්ලේෂණය කිරීම අපට සහාය වනු ඇත.

ii. ස්වයං තක්සේරුව සෑම ශාඛාවක්ම, ව්‍යාපාර ඒකකයක්ම හෝ මෙහෙයුම් අංශයක්ම වාර්ෂික පදනමින් එක් එක් කාර්ය සවිමත්ව ක්‍රියාවලිය සඳහා අවදානම් සාධක තක්සේරු කරයි. මෙම ක්‍රියාවලිය අතරතුර දී අභ්‍යන්තර පාලන පද්ධති වල ප්‍රමාණවත් බව, අවදානම් සාධක, ලේඛන, පරිගණක පද්ධති හා වගකීම දරන පිරිස් ඇගැයීම කෙරෙන අතර, නිවැරදි කිරීම සඳහා දුර්වල ක්ෂේත්‍ර හුවාදැක්වීම සිදු වේ.

iii. ප්‍රධාන අවදානම් දර්ශක: අවදානම් දර්ශක යනු යම් අවදානම් කාණ්ඩයක් වෙනුවෙන් යම් ව්‍යාපාර ක්ෂේත්‍රයක පාලන පරිසරයේ ක්‍රියාකාරකම් හා තත්ත්වය අධීක්ෂණය කිරීම සඳහා භාවිතා කෙරෙන ක්‍රියාමාර්ගවල පුළුල් කාණ්ඩයක් වන අතර, පාලන තක්සේරු ක්‍රියාවලිය වාරික පදනමින් (වාර්ෂිකව) සිදු කෙරෙද්දී අවදානම් දර්ශක අධීක්ෂණ එයට වඩා නිරන්තර පදනමින් (උදා: දෛනිකව, සතිපතා, මාසිකව, කාර්තුවකට වරක්) සිදු කෙරේ.

අවදානම් තක්සේරුව: ඉහත සඳහන් පරිදි මෙහෙයුම් අවදානම් හඳුනාගැනීමෙන් පසුව, බැංකුව මෙහෙයුම් අවදානම් අලාභ සිදුවීමක් සඳහා හැකියාව ද එබඳු සිදුවීමකින් බැංකුව මත සිදුවිය හැකි උපරිම අලාභය ද තක්සේරු කරයි. මේ අවස්ථාවේ දී, අවදානම් කළමනාකරණය පිණිස මෙහෙයුම් පාලන හා ක්‍රියා පටිපාටි ප්‍රමාණවත් බව හා එම පාලන පවත්වා ගැනීම් පිරිවැය සාධාරණීකරණය වන්නේ ද හා අඩු කළ හැකිද යන කරුණු ද පිළිබඳව තීරණයකට එළඹීම සිදු වේ. ඉන් අනතුරුව බැංකුව බැංකුවේ සමස්ත අවදානම් නැඹුරුව අනුව මේවායේ වැදගත්කම හා බරපතලකම තක්සේරු කරයි.

## අවදානම් ප්‍රතිකාරය

බැංකුවේ මෙහෙයුම් අවදානම් නිරාවරණයන්වලින් බැංකුව මත පැනනගින මූල්‍ය බලපෑම තීරණය කරන ලදුව, යම් අවදානම් සිදුවීමක තීව්‍රතාව අඩු කිරීම සඳහා භාවිතා කළ හැකි ක්‍රම බැංකුව තීරණය කරනු ඇත.

මෙහිදී පහත ක්‍රියාමාර්ග ගනු ලැබේ:

i. **රක්ෂණය**
සිදුවීමේ අඩු සම්භාවිතාවක් ඇති එනමුත් මූල්‍යමය බලපෑම ඉහළ බවට හඳුනාගත් අවදානම් තත්ත්වයන්ට අදාල ව යම් අලාභයක් අවම කිරීම පිණිස බැංකුව එබඳු අවදානමට එරෙහිව රක්ෂණය වනු ඇත. බැංකුවේ වත්කම්වලට වන හානි, වංචා, කාර්ය මණ්ඩල නොසැලකිල්ල ආදිය රක්ෂණය මගින් ආවරණය කෙරෙන අවදානම් තත්ත්වයන් අතරින් සමහරක් වේ.

ii. **ව්‍යාපාර අඛණ්ඩතාවය සැලසුම් කිරීම**
එය අපගේ තොරතුරු තාක්ෂණ යටිතලයට වන බාධාවක් හෝ ශාඛා පරිශ්‍රයන්ට වන බාධාවක් වේවා, මෙහෙයුම්වලට සිදුවන විශාල බාධාවන් මගින් ඇතිවන අලාභ අවම කිරීම සඳහා සෑම ශාඛාවකටම/ව්‍යාපාර ඒකකයකටම ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක් (BCP) හා ආපදාවන්ගෙන් යථා තත්ත්වයට පත් වීමේ සැලසුමක් (DRP) ඇත. ස්වාභාවික ආපදා තොරතුරු තාක්ෂණ දෘඩාංග අක්‍රියවීම ආදී හදිසි අවස්ථාවන් ඇතිවුවහොත් ව්‍යාපාර මෙහෙයුම් බාධා විරහිතව ක්‍රියාත්මක වීම සහතික කිරීම පිණිස විකල්ප ස්ථාන පිහිටුවනු ලැබ ඇත.

iii. **නව නිපැයුම් හා සේවා**
නව නිපැයුම් හා සේවා හඳුන්වා දීමට පෙර ඒවා විචාරශීලී ලෙස පරීක්ෂා කර බැලීම සිදු කෙරේ. නව නිපැයුම් හා සේවාවන්ට ආවේණික සියලු අවදානම් පැහැදිලිව හඳුනාගෙන හැකිතාක් දුරට ඒවායේ බලපෑම අඩු කිරීම මෙමගින් සහතික කරනු ලැබේ. ශේෂ වන යම් අවදානමක් වේ නම් එය බැංකුවේ අවදානම දැරීමේ මට්ටම තුළට ගැනෙන්නක් විය යුතුය.

iv. **බාහිර පාර්ශ්ව යොදවා ගැනීම**
ක්‍රියාකාරකම් වෙනුවෙන් බාහිර පාර්ශ්ව යොදවා ගැනීම හා සබැඳි අවදානම පිළිබඳ දැනුවත්ව සිටින බැංකුව, එබඳු ක්‍රියාකාරකම් හා සබැඳි අවදානම් කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති මෙහෙයුම් නිර්ණායක ස්ථාපනය කර ඇත.

v. **වලංගු කිරීම හා අඛණ්ඩ ස්වාධීන සමාලෝචනය**
අවම වශයෙන් වසරකට වරක් හෝ එයට වැඩි වාර ගණනක් අභ්‍යන්තර විගණන අංශය විසින් බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලි හා තක්සේරු කිරීමේ ක්‍රම විධිමත්ව ස්වාධීන සමාලෝචනයට ලක් කරනු ලැබේ. මෙම විගණන, සියළුම මෙහෙයුම් ඒකක මෙන්ම මෙහෙයුම් අවදානම් කළමනාකරණ අංශයේ ක්‍රියාකාරකම්ද ආවරණය කරයි.




T&S - විකුණුම් හා අලෙවි (භාණ්ඩාගාරය)
P&S - ගෙවීම් හා නිරවුල් කිරීම් (clg, RTGS ආදී)
RB - සිල්ලර බැංකුකරණය
CB - වාණිජ බැංකුකරණය

**ව්‍යාපාර මාර්ග අනුව මෙහෙයුම් අලාභ**




**මෙහෙයුම් අලාභ - 2012 (අලාභ හත කාණ්ඩය මත පදනම්ව)**

වර්ෂය සඳහා මෙහෙයුම් අලාභය මෙහෙයුම් වියදම් ප්‍රතිශතයක් ලෙස 0.93% කි. මෙය අභ්‍යන්තර දරාගැනීමේ සීමාව වන 1.0% සීමාවට යටත්ව පවතී.




**මෙහෙයුම් අලාභවලට එරෙහිව දරාගැනීම (2010 - 2012**

## නීතිමය අවදානම

මහජන බැංකුව දේශීය හා විදේශීය ගනුදෙනුකාර භවතුන්, සැපයුම්කරුවන් හා සේවා සපයන්නන් සමග නීතිමය බැඳීමට එළඹෙන ගනුදෙනු හා ගිවිසුම් විශාල සංඛ්‍යාවකට සම්බන්ධ වන හෙයින් එය නීතිමය අවදානම කළමනාකරණයට හා පාලනයට අදාලව ප්‍රතිපත්ති ක්‍රියා පටිපාටි හා මෙහෙයුම් නිර්ණායක ක්‍රියාත්මක කර ඇත.

නීතිමය අවදානම, ගිවිසුම් අවදානම, ව්‍යවස්ථාදායක අවදානම සහ නඩු කටයුතු අවදානම ආවරණය කරයි. නීතිමය අවදානමට ඇතුළත් වන්නේ -

1. බැංකුවට එරෙහිව කරන ලද හිමිකම් ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් යෝග්‍ය හෝ ක්‍රියාශූර ලෙස ක්‍රියා කිරීමට අපොහොසත් වීම.
2. බැංකුවට එරෙහිව ගෙන එන ලද හිමිකම් ඉල්ලීමක් සාර්ථක ලෙස විත්තිවාචකය කිරීමට නොහැකියාව.
3. අධිකරණ මගින් බැංකුවේ අයිතිවාසිකම් බලාත්මක කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නොහැකියාව.
4. බැංකුවට එරෙහිව අහිතකර හිමිකම් ඉල්ලීමක් සාර්ථකව සිදු කිරීමට ඇති ඉඩකඩ අවම කිරීමට අපොහොසත් වීම හෝ නොහැකියාව.

නීතිමය අවදානම කළමනාකරණය හා සමනය කිරීමේ වගකීම දරන්නේ නීති අංශයයි. හිමිකම් ඉල්ලීම්වලට හා බැංකුවට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග වලට ප්‍රතිරෝධය දැක්වීම සඳහා නීතිමය උපදෙස් හා සහාය සැපයීම, නීතිමය ගැටළු විශ්ලේෂණය කිරීම, ගිවිසුම් සහ අනෙකුත් නීතිමය ලියකියවිලි කෙටුම්පත් කිරීම, නඩු කටයුතු කළමනාකරණය, ණය ආපසු අය කර ගැනීම් හා තෙවන පාර්ශ්වයන්ට එරෙහි අනෙකුත් නඩු කටයුතුවලින් මෙය සමන්විත වේ. අපගේ අභ්‍යන්තර නීතිමය සම්පත්වලට අනුපූරක වන පරිදි බාහිර උපදේශකයන් විචක්ෂණ ලෙස යොදා ගැනේ. අපගේ අධිකරණ ක්‍රමය තුළ ඉලෙක්ට්‍රොනික ලේඛන සඳහා නීතිමය පිළිගැනීම ස්ථාපනය කරනු ලැබ ඇති හෙයින්, බැංකුව එහි ගනුදෙනුකාර භවතුන් වෙනුවෙන් ඊ-බැංකුකරණ හා අන්තර්ජාල බැංකුකරණ පහසුකම් ඇරඹුවේය. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකු කර්මාන්තය තුළ සයිබර් අපරාධ සුලභ තත්ත්වයට පත් වී ඇත. තුන්වැනි පාර්ශ්ව සමග එකගතා ගිවිසුම්වලට ඇතුළත් වීම, ගනුදෙනුකරුවන්ගේ දැනුවත් බව ඉහළ නැංවීම හා දත්ත සංකේතවලට හැරවීමේ වැඩි දියුණු කළ ප්‍රමිති යන ආකාරයෙන් මෙම අවදානම් සමනය කිරීම පිණිස ප්‍රවේශම් සහගත හා ආරක්ෂක පියවර බැංකුව ගෙන ඇත.

වෙනස්වන නීති පිළිබඳව දැනුවත් බව වැඩි දියුණු කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා නීති අංශ සේවක පිරිස්වලට නිරන්තර පුහුණුව ලබා දීම, නීතියේ අවදානම කළමනාකරණය කිරීම සඳහා බැංකුව විසින් යොදාගෙන ඇති තවත් ක්‍රියාමාර්ගයකි.

අන්තර් ජාලය හරහා නීතිමය ගැටළුවල තත්ත්වය නිරීක්ෂණය කිරීම උදෙසා මධ්‍යගත දත්ත පදනමක් පිහිටුවීමේ ව්‍යාපෘතියක් ද 2011 දී අරඹන ලදී. මෙම ව්‍යාපෘතිය 2012 දී අවසන් කරන ලද අතර නඩු කටයුතුවලට අදාළ කරුණු හා ලේඛනගත කිරීම් ගැටළු වඩාත් වේගවත්ව හා ඵලදායකව අධීක්ෂණය හා පසුවිපරම් කිරීම මෙමගින් සහතික කෙරෙනු ඇත.

## ප්‍රාග්ධන කළමනාකරණය - අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත් බව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP):

### ICAAP කරා සංක්‍රමණය වීම

2013 දී සිදු කිරීමට නියමිත ICAAP හි ආධිපත්‍යය යටතට සංක්‍රමණය වීම වෙනුවෙන් බැංකුව අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත -

1. සියළු වැදගත් අවදානම් වර්ගයන් හඳුනාගෙන අවදානම ප්‍රමාණ කිරීම හා අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් පිළිබඳව අවසන් තීරණයකට එළඹීම සිදු කර තිබේ.
2. දත්ත රැස් කිරීම හා විශ්ලේෂණ සඳහා කාර්ය ප්‍රවාහය හා ක්‍රියාවලිය ස්ථාපනය කර ඇත.

එක් එක් බැංකුවට සුවිශේෂී වූ අවදානම් පැතිකඩට අදාළව ඔවුන්ගේ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් බව තක්සේරු කිරීම හා ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගැනීම පිණිස උපායමාර්ග සැකසීම සඳහා ඔවුන්ගේම ක්‍රියාවලි හා සම්පත් සකසා ගැනීමට බැංකුවට බලතල පවරමින් ශ්‍රී. ලං. ම. බැ. නියෝග නිකුත් කර තිබේ.

අවදානම මැනීම සඳහා සිදුවීමට වැඩිම සම්භාවිතාව ඇති ප්‍රතිඵල මත පදනම්ව ප්‍රාග්ධන ප්‍රමාණවත් බව ගණනය කිරීමේ ප්‍රමාණාත්මක ප්‍රවේශය තවදුරටත් වැඩි දියුණු කෙරෙමින් පවතී. අභ්‍යන්තර වශයෙන් ජනිත වන හා වෙළඳපොළෙන් ජනිත වන වඩාත් සීමාන්තික හානි සිදුවීමේ හැකියාව අවම සිද්ධිවලට අදාලව බැංකුව සතු ප්‍රත්‍යාස්ථ ගුණය මැනීම පිණිස අප නව ප්‍රවේශයන් සකස් කර තිබෙන්නේ එබඳු ප්‍රතිඵල බැංකුවේ ප්‍රාග්ධන ව්‍යාපාර සැලසුම් කිරීමේ උපායමාර්ග සැකසීමේදී භාවිතා කිරීමේ අරමුණින් යුතුව වේ.

## ප්‍රාග්ධන කළමනාකරණය

බැංකුකරණ හා මූල්‍ය, රක්ෂණ, සංචාර හා දේපළ සංවර්ධන යන කාණ්ඩවලට වෙන් කළ හැකි ව්‍යාපාර කටයුතු ගණනාවක බැංකුව හා එහි පරිපාලිත සමාගම් යෙදී සිටී. එක් එක් සමාගම්වල අවදානම් පැතිකඩ අධීක්ෂණය හා සමාලෝචනය කරන තමන්ගේ අධ්‍යක්ෂ මණ්ඩල මෙම සෑම ආයතනයක්ම සතු වන අතර, අවම වශයෙන් කාර්තුවකට වරක් මහජන බැංකුවේ සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව විසින් ඒවා යළි සමාලෝචනය කෙරෙන්නේ ඒවා නියම කරන ලද පරාමිතීන් තුළ පිහිටන්නේ ද යන කරුණු සහතික කරගැනීම පිණිසය.

බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස, මෙම අවදානම් සමස්ත සමූහය හරහා ඒකරාශී කරනු ලැබේ.

ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රියාවලියෙහි අරමුණ වන්නේ සියළු අවදානම් නිරාවරණය වීම්වලට ප්‍රමාණවත් ප්‍රාග්ධනය මගින් සහාය සැපයෙන බවට වග බලාගැනීමයි.

ශ්‍රී. ලං. ම. බැ. විසින් නිකුත් කරන ලද මෙහෙයුම් නිර්ණායකවලට අනුකූලව ප්‍රාග්ධන ප්‍රමාණවත් බව ගණනය කෙරේ -

1 ස්ථම්භයේ අවදානම් සඳහා අවදානම් බර තැබූ වත්කම් ගණනය කිරීම පිණිස මහජන බැංකුව පහත සඳහන් ක්‍රම භාවිතා කරයි.

i. ණය අවදානම - ප්‍රමිතිකරණය කළ ප්‍රවේශය
ii. මෙහෙයුම් අවදානම - මූලික දර්ශක ප්‍රවේශය
iii. වෙළෙඳපොළ අවදානම - ප්‍රමිතිකරණය කළ ප්‍රවේශය

1 ස්ථම්භය යටතේ ඇතුළත් කර නොමැති වෙනත් අවදානම් අපගේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත් බව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) සැලකිල්ලට ගනී. එම අවදානම් නම් -

i. ද්‍රවශීලතා අවදානම
ii. බැංකුකරණ පොත මත පොලී අනුපාතික අවදානම
iii. උපාය මාර්ගික අවදානම

# ප්‍රධාන කාර්යසාධන දර්ශක

| ප්‍රධාන කාර්යසාධන දර්ශක | එයින් පෙන්නුම් කරන්නේ කුමක්ද? අප සාක්ෂාත් කරගෙන ඇත්තේ හා අත් කරගැනීමට සැලසුම් කරන්නේ මොනවාද? |
|---|---|
| මෙහෙයුම් ආදායම | ශුද්ධ පොළී ආදායම හා අරමුදල් නොවන ආදායම |
| මෙහෙයුම් පිරිවැය | මෙහෙයුම් ලාභය අත් කර ගැනීම සඳහා දරන ලද සෘජු හා වක්‍ර පිරිවැය |
| පිරිවැය ආදායම් අනුපාතය | මෙහෙයුම් පිරිවැය/මෙහෙයුම් ආදායම |




**මෙහෙයුම් ආදායම**

2012 කර්මාන්තය - රු. බිලියන 275.4
2012 මහජන බැංකු වෙළෙඳපොළ කොටස - 15.7%




**මෙහෙයුම් පිරිවැය**

2012 කර්මාන්තය - රු. බිලියන 135.2
2012 මහජන බැංකු වෙළෙඳපොළ කොටස - 17.9%




**පිරිවැය ආදායම් අනුපාතය**

2012 කර්මාන්තය - 53.4%
2012 මහජන බැංකුව - 55.8%

කලට වේලාවට සිදු කරන ලද මිල ගැලපීම් හා ණය සහ ගාස්තු පාදක ආදායමේ වර්ධනයත් සමග බැංකුව මෙහෙයුම් ආදායමේ අඛණ්ඩ වර්ධනයක් වාර්තා කර ඇත.

2012 මූල්‍ය වර්ෂය 2012-14 සාමූහික ගිවිසුම් වර්ෂය සලකුණු කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සියලු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන්ට වැටුප් ගැලපීම් සිදු කරන ලදී. අනෙකුත් සියලු විචල්‍ය පොදු කාර්ය පිරිවැය 2011 වර්ෂයට වඩා ආන්තික වර්ධනයක් සහිතව කළමනාකරණය කෙරිණි.

2012 මූල්‍ය වර්ෂයේ පෙර සඳහන් කළ වැටුප් වැඩිවීම තිබියදීත්, බැංකුව තවදුරටත් සිය පිරිවැය ආදායම් අනුපාතය අඩු කර ගත්තේය. ආදායමේ වර්ධනය මගින්ද එයට සහාය ලැබිණි.

| ප්‍රධාන කාර්යසාධන දර්ශක | එයින් පෙන්නුම් කරන්නේ කුමක්ද? අප සාක්ෂාත් කරගෙන ඇත්තේ හා අත් කරගැනීමට සැලසුම් කරන්නේ මොනවාද? |
|---|---|
| දළ ආදායම | බැංකුවේ මුළු පිරිවැටුම හෝ පොළී හා ගාස්තු පාදක ආදායම |
| මෙහෙයුම් ආදායම | ශුද්ධ පොළී ආදායම (ශුද්ධ ආදායමෙන් පොළී පිරිවැය අඩුකර) හා අරමුදල් නොවන ආදායම |
| බදුවලට පෙර ලාභය (PBT) | ශුද්ධ ආදායම පොදු කාර්ය හා ප්‍රතිපාදන අඩුකර |




**දළ ආදායම**

2012 කර්මාන්තය - රු. බිලියන 573.5
2012 මහජන බැංකු වෙළෙඳපොළ කොටස - 16.5%




**මෙහෙයුම් ආදායම**

2012 කර්මාන්තය - රු. බිලියන 275.4
2012 මහජන බැංකු වෙළෙඳපොළ කොටස - 15.7%




**බදු වලට පෙර ලාභය**

2012 කර්මාන්තය - රු. බිලියන 116.3
2012 මහජන බැංකු වෙළෙඳපොළ කොටස - 13.1%

කර්මාන්තයේ වර්ධනය හා සමානව 2011 මූල්‍ය වර්ෂයට වඩා 38.8% කින් බැංකුවේ දළ ආදායම ඉහළ නැංගේය. මෙය ප්‍රධාන වශයෙන් ණය වර්ධනය හා වැඩි වූ ණය දීම් අනුපාතික මගින් මෙහෙයවනු ලැබිණි.

ශුද්ධ පොළී ආදායම හා අරමුදල් නොවන ආදායම ඇතුළත්වන මෙහෙයුම් ආදායම පෙර වර්ෂයට වඩා 18.9% කින් වර්ධනය වූයේ බැංකුකරණ අංශයේ අත්දකින ලද 22.1% ප්‍රතිවිරුද්ධ ලෙසිනි.

2011 මූල්‍ය වර්ෂය හා සැසඳූ කල පොළී පිරිවැය වැඩිවීම්, වැටුප් සංශෝධන හා වැඩි ණය අලාභ ප්‍රතිපාදන හේතුවෙන් 2012 මූල්‍ය වර්ෂයේ දී ආන්තික අඩුවීමක් සිදු විය.

| ප්‍රධාන කාර්යසාධන දර්ශක | එයින් පෙන්නුම් කරන්නේ කුමක්ද? අප සාක්ෂාත් කරගෙන ඇත්තේ හා අත් කරගැනීමට සැලසුම් කරන්නේ මොනවාද? |
|---|---|
| අක්‍රිය ණය (NPL) | මහ බැංකු මෙහෙයුම් නිර්ණායක අනුව පියවීමේ ගැටළු සහිත ණය |
| ශුද්ධ ණය සහ අත්තිකාරම් | අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වලට අඩු කිරීම් වලට පෙර මුළු ණය හා අත්තිකාරම් |
| අක්‍රිය ණය අනුපාතය | අක්‍රිය ණය/මුළු ණය හා අත්තිකාරම් |










2011 මූල්‍ය වර්ෂයට පෙර ප්‍රදානය කරන ලද රු. මිලියන 7 ක පැරණි දැඩි ලෙස අක්‍රිය ණය තවමත් බැංකුව වෙත ඇති අතර ඒ වෙනුවෙන් පූර්ණ ලෙස ප්‍රසම්පාදනය කර ඇත. එබැවින් අක්‍රිය ණය අනුපාතය පහත වැටීම (2001 පසු) 3% ට අඩුව පවතී. කර්මාන්තයේ ප්‍රමාණය හා බැංකුවේ වෙළෙඳපොළ කොටස අනුව ගත් කළ මෙය සුවිශේෂී ජයග්‍රහණයකි. කෙසේ වෙතත්, ණය පොතේ 80% අධික ප්‍රමාණයකට ප්‍රතිපාදන සලසා ඇත. මෙම ආවරණය බැංකු අතරින් ඉහළම අගය ගනී.

2012 මූල්‍ය වර්ෂයේ ණය වර්ධනය හා සැසඳූ කල අක්‍රිය ණය වල වර්ධන ආන්තික වේ.

දළ ණය හා අත්තිකාරම් 2011 මූල්‍ය වර්ෂයට වඩා 30% කින් වර්ධනය විය. ණය වර්ධන අගයෙන් 29% ක් රජය සතු ව්‍යවසාය වෙත වේ.

2011 දී 3.4% ක් වූ බැංකුවේ දළ අක්‍රිය ණය අනුපාතය 2012 දී 2.8% දක්වා අඩු වූ අතර දැඩි ණය පාලන හා අය කර ගැනීම් ක්‍රියාමාර්ග හා සමග ගුණාත්මක ණයදීම් සබඳතා මගින් මෙම තත්ත්වය ඇති කෙරිණි.

*Note: Based on previous SLAS

| ප්‍රධාන කාර්යසාධන දර්ශක | එයින් පෙන්නුම් කරන්නේ කුමක්ද? අප සාක්ෂාත් කරගෙන ඇත්තේ හා අත් කරගැනීමට සැලසුම් කරන්නේ මොනවාද? |
|---|---|
| බදුවලට පෙර ලාභය (PBT) | මෙහෙයුම් වලින් ඉපයීම්, පොදු කාර්යය හා ප්‍රතිපාදන අඩු කර |
| වත්කම් සාමාන්‍යය | මූළු ණය හා අත්තිකාරම් ආයෝජන හා භාණ්ඩාගාර උපකරණ යනාදිය |
| සාමාන්‍ය වත්කම් මත ලාභය (බදුවලට පෙර) | සාමාන්‍ය වත්කම් මත බදුවලට පෙර ලාභයේ ප්‍රතිශතය |










2011 මූල්‍ය වර්ෂය හා සැසඳූ කල පොළී පිරිවැය වැඩිවීම්, වැටුප් සංශෝධන හා වඩා ඉහළ ණය අලාභ ප්‍රතිපාදන හේතුවෙන් 2012 මූල්‍ය වර්ෂයේදී ආන්තික පහත බැසීමක් අත් දකින ලදී.

කර්මාන්තයේ දෙවැනි විශාලතම වත්කම් පදනම මහජන බැංකුව සතුව ඇත. බැංකුව වසර ගණනක් පුරා ගුණාත්මක වත්කම් වර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර එය යහපත් ප්‍රතිඵල ලබා දී තිබේ.

2012 මූල්‍ය වර්ෂය 2011 වර්ෂයට වඩා 31.9% වර්ධනය වූ රු. බිලියන 873.1 ක අගයක් ගත් වත්කම් වාර්තා කළේය. මෙය බැංකුකරණ කර්මාන්තයේ 17.1% ක වර්ධනය හා සංසන්දනාත්මකව වේ.

බදුවලට පෙර ලාභයේ ආන්තික පහත බැසීම හේතුවෙන් වර්ෂයෙන් වර්ෂයට වත්කම්වල 31.9% වර්ධනය හා සැසඳූ විට බැංකුව මෙම ප්‍රධාන කාර්යසාධන දර්ශකයේ පහත බැසීමක් අත් දුටුවේය.

| ප්‍රධාන කාර්යසාධන දර්ශක | එයින් පෙන්නුම් කරන්නේ කුමක්ද? අප සාක්ෂාත් කරගෙන ඇත්තේ හා අත් කරගැනීමට සැලසුම් කරන්නේ මොනවාද? |
|---|---|
| ප්‍රාග්ධන පදනම | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති පරිදි ප්‍රාග්ධන ස්ථර 1 හා ස්ථර 11 හි සංකලනයකි. |
| අවදානම් මත බර තැබූ වත්කම් | ශ්‍රී ලංකා මහ බැංකුව මෙහෙයුම් නිර්ණායක මත පදනම්ව සියලු වත්කම් මත පවරා ඇති අවදානම් අනුපාතය. |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය | ඉහත විචල්‍යයන් භාවිතා කරමින් ගණනය කෙරෙන අනුපාතයකි. දේශීය බැංකුකරණ කර්මාන්තය සඳහා අවශ්‍යතාව 10% ඉහළින් පවතී. |




**ප්‍රාග්ධන පදනම**




**අවදානම් බර තැබූ වත්කම්**




**ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය**

2012 කර්මාන්තය - 15.0%
2012 මහජන බැංකුව - 14.0%

උපරිම ඉපයීම් හා ණයකර (11 ස්ථරය) සමග බැංකුව අඛණ්ඩව එහි ප්‍රාග්ධන පදනම වර්ධනය කරගෙන ඇත. 2001 මූල්‍ය වර්ෂයේ නිෂේධාත්මක රු. බිලියන 7 ට සාපේක්ෂව මුළු ප්‍රාග්ධන පදනම රු. බිලියන 37.4 තෙක් වර්ධනය වී ඇත.

බැංකුවේ අවදානම් බරතැබූ වත්කම් 2011 මූල්‍ය වර්ෂයේ වූ බිලියන 212.6 සිට රු. බිලියන 267.2 දක්වා වර්ධනය වූයේ මහජන බැංකුව සතු විශාල ශුද්ධ ආදායම් පදනමක් ඇති බැවින් ප්‍රධාන වශයෙන් වඩා ඉහළ මෙහෙයුම් අවදානම අය කිරීමක් මගින් මෙයෙවනු ලැබීමෙනි.

බැංකුව 2012 මූල්‍ය වර්ෂය වෙනුවෙන් 14.0% ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයක් වාර්තා කළේය. 2001 මූල්‍ය වර්ෂයේ සිට 2004 දක්වා මෙම අගය නිෂේධාත්මකව තිබීම හා 2005 මූල්‍ය වර්ෂයේ සිට 2007 මූල්‍ය වර්ෂය දක්වා 10% අඩුවෙන් තිබීම සැලකූ කල මෙය විශිෂ්ට ජයග්‍රහණයකි.

ප්‍රගතිය අත් කර ගැනීමේදී මෙම අනුපාතිකය තිරසාරව පවත්වා ගැනීම ප්‍රධාන වශයෙන් අවධානයට ලක් වන කරුණකි.

| ප්‍රධාන කාර්යසාධන දර්ශක | එයින් පෙන්නුම් කරන්නේ කුමක්ද? අප සාක්ෂාත් කරගෙන ඇත්තේ හා අත් කරගැනීමට සැලසුම් කරන්නේ මොනවාද? |
|---|---|
| බදුවලට පසු ලාභය (PAT) | බදු බැරකම අඩු කර බදු වලට පෙර ලාභය |
| සේවක සංඛ්‍යාව | වර්ෂය අවසානයේදී ස්ථිර සේවක සංඛ්‍යාව |
| එක් සේවකයෙකුට ලාභය | එක් ස්ථිර සේවකයෙකුට ගණනය කරන ලද බදුවලට පසු ලාභය |




**බදු වලට පසු ලාභය**

2012 කර්මාන්තය - රු. බිලියන 82.3
2012 මහජන බැංකු වෙළෙඳපොළ කොටස - 13.2%




**සේවක සංඛ්‍යාව**




**සේවකයකුට ලාභය**

2012 මූල්‍ය වර්ෂයේදී බැංකුව බදුවලට පසු ලාභයෙහි ප්‍රමාණවත් වර්ධනයක් වාර්තා කළේය.

මෙයට මූලික වශයෙන් හේතු වූයේ 2011 මුදල් වර්ෂය සංසන්දනාත්මකව අඩු බදු අය කිරීම හා 2011 මුදල් වර්ෂය බදු සඳහා අධි ප්‍රතිපාදන සැලසීම් හා විලම්බිත බදු ප්‍රතිවර්තනයන්ය.

2012 වසරේදී 400 වැඩි ස්ථිර සේවකයන් සංඛ්‍යාවක් විශ්‍රාම ලැබූ අතර සේවක සංඛ්‍යාවේ කැපී පෙනෙන අඩුවීමට මෙය හේතු විය. රාජ්‍ය බැංකුවක් ලෙස අප අපගේ ගනුදෙනුකාර භවතුන්ට අගය එකතු කළ නොමිලේ සේවා ද සපයන අතර එබැවින් පෞද්ගලික අංශයේ සමාන ආයතනයක් හා සැසඳූ කල වඩා වැඩි ශ්‍රම බලකායක් නඩත්තු කරන්නෙමු.

මෙබඳු සමාජ වගකීම් ඉටු කිරීමට හා විශාල ශාඛා ජාලයට සෑහෙන පරිදි සේවක සංඛ්‍යාවක් බැංකුව විසින් නඩත්තු කිරීම අවශ්‍ය වේ.

සේවකයෙකුට ලාභය පෙර වර්ෂයට වඩා 10%ක වර්ධනයක් වාර්තා කළේය. අවසාන වර්ධනය මත බලපෑම අනුව ගණනය කළ නොහැකි සේවාවන්ද මහජන බැංකුව සපයන බවද අපගේ අවධානයට ලක් වේ. රජයේ සේවකයන්ගේ වැටුප් සන්නද්ධ සේවා වැටුප් ගුරු වැටුප් ගෙවීම, විදුලි බිල්පත් නිරවුල් කිරීම, ජල බිල්පත් නිරවුල් කිරීම, රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීම හා රජයේ සේවකයන්ට නිවාස ණය ගෙවීම ඒ අතරින් කිහිපයකි. බැංකුවේ ඉහළ පිරිස් පිරිවැය සහ රටේ විශාලතම ශාඛා ජාලය සඳහා විශාල සේවක අවශ්‍යතාව මෙම ප්‍රධාන කාර්යය සාධන දර්ශකය මත පීඩනයක් ඇති කරයි.

*සැ.යු. 2011 හා 2012 වෙනුවෙන් ඉහත වාර්තා කර ඇති ප්‍රතිඵල 2012 ජනවාරි 1 වැනි දින සිට බලාත්මක වූ නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS හා LKAS) මත පදනම්ව පිළියෙල කරන ලද බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් උපුටා ගෙන ඇත. 2008 - 2010 සඳහා වාර්තා කර ඇති ප්‍රතිඵල, 2011 දෙසැම්බර් 31 වැනි දින තෙක් බලාත්මකව පැවති, පෙර පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) මත පදනම්ව සකස් කරන ලද බැංකුවේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ ප්‍රකාශන වලින් උපුටා ගෙන ඇත. නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS හා LKAS) සමග අනුකූලව බැංකුව 2011 වෙනුවෙන් සිය මූල්‍ය ප්‍රකාශන නිසි ලෙස නැවත සඳහන් කර ඇත.*

# මූල්‍ය වාර්තා


අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා ......... 116

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ......... 119

අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය ......... 120

ස්වාධීන සහතික කිරීමේ වාර්තාව ......... 122

තථ්‍ය සොයාගැනීම් හා ආයතනික පාලනය පිළිබඳ වාර්තාව ......... 124

මාණ්ඩලික විගණන කමිටු වාර්තාව ......... 154

විගණකාධිපතිගේ වාර්තාව ......... 155

ආදායම් ප්‍රකාශනය ......... 157

පරිපූර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශනය ......... 158

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ......... 159

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ......... 160

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය ......... 161

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන ......... 163

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා

## අධ්‍යක්ෂවරුන්

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, මුදල් අමාත්‍යවරයා විසින් පත්කරන ලද අධ්‍යක්ෂවරුන් නව දෙනෙකුගෙන් සමන්විත වන අතර, එයින් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සම්බන්ධයෙන්, 1961 අංක 29 දරන මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පතෙහි විධිවිධාන ප්‍රකාරව, සමුපකාර කටයුතු භාර අමාත්‍යවරයා විසින් නාමයෝජනා කරනු ලැබ ඇත. මසකට යටත් පිරිසෙයින් එක්වරක්වත් මණ්ඩලය රැස්විය යුතු අතර, 2012 වසරේදී 18 වාරයක් එම රැස්වීම් පවත්වන ලදී. මණ්ඩල රැස්වීමක ගණපූරණය පස්දෙනෙකි. 2012 වසර තුළ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වෙන පරිදි විය:

| නම |
|---|
| අභාවප්‍රාප්ත ඩබ්ලිව්. කරුණාජීව මහතා (2013 ජනවාරි 28 දක්වා) |
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි |
| ජෙහාන් පී. අමරතුංග මහතා |
| අජිත් පණ්ඩිතරත්න මහතා |
| ලක්ෂ්මී කේ. සංගක්කාර මහත්මිය |
| ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය |
| එම්. ටී. අයි. විසාඛා අමරසේකර මෙනවිය |
| එම්. එම්. ප්‍රියන්ත කේ මායාදුන්නේ මහතා |
| ඩී. එම්. පවර දසනායක මහතා |

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම

2012 වසරේ දී පවත්වනලද රැස්වීම් සංඛ්‍යාව - 18

| නම | පවත්වනලද රැස්වීම් සංඛ්‍යාව | සහභාගිවූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| අභාවප්‍රාප්ත ඩබ්ලිව්. කරුණාජීව මහතා (2013 ජනවාරි 28 දක්වා) | 18 | 18 |
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි | 18 | 18 |
| ජෙහාන් පී. අමරතුංග මහතා | 18 | 16 |
| අජිත් පණ්ඩිතරත්න මහතා | 18 | 15 |
| ලක්ෂ්මී කේ. සංගක්කාර මහත්මිය | 18 | 17 |
| ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය | 18 | 15 |
| විසාඛා අමරසේකර මෙනවිය | 18 | 16 |
| ප්‍රියන්ත මායාදුන්නේ මහතා | 18 | 16 |
| පවර දසනායක මහතා | 18 | 17 |

## පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්

බැංකුවේ පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් පහත දක්වා ඇත:

### (අ) පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් පොදු සමාගම

බැංකුවේ කොටස්හිමිකාරිත්වය - 75%

සමාගමේ ප්‍රධාන කාර්යයන් වන්නේ මූල්‍ය හා මෙහෙයුම් කල්බදු, වාරික කුලී විකිණුම්, වත්කම් මූල්‍යනය හා ඉස්ලාමීය මූල්‍ය තැන්පතු හා ඉතුරුම් පිළිබඳ කටයුතු කිරීමය.

**අධ්‍යක්ෂවරුන්ගේ නියෝජනය පහත සඳහන් වේ:**

| | |
|---|---|
| අභාවප්‍රාප්ත ඩබ්ලිව්. කරුණාජීව මහතා (2013 ජනවාරි 28 දක්වා) | - සභාපති |
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි | - අධ්‍යක්ෂ |
| එන්. වසන්ත කුමාර මහතා | - අධ්‍යක්ෂ |

### (ආ) සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම

බැංකුවේ කොටස්හිමිකාරිත්වය - 99%

සමාගමේ ප්‍රධාන කාර්යයන් වන්නේ ගුවන් ටිකට්පත් අලෙවිය සහ චාරිකා සංවිධානය කිරීමයි.

**අධ්‍යක්ෂවරුන්ගේ නියෝජනය පහත සඳහන් වේ:**

| | |
|---|---|
| ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය | - සභාපතිනිය |
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි | - අධ්‍යක්ෂ |
| එන්. වසන්ත කුමාර මහතා | - අධ්‍යක්ෂ |

### (ඇ) පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පොදු සමාගම

බැංකුවේ කොටස්හිමිකාරිත්වය - 26.1%

බැංකුවේ ප්‍රධාන කාර්යයන් වන්නේ කල්බදු මූල්‍යනය, වාණිජ මූල්‍යනය, ආයතනික මූල්‍යනය සහ ඒ හා අදාළ උපදේශන සේවා සැපයීම, ආයෝජන බැංකු කටයුතු හා නිශ්චල දේපල සංවර්ධන කටයුතු ය.

**අධ්‍යක්ෂවරුන්ගේ නියෝජනය පහත සඳහන් වේ:**

| | |
|---|---|
| පී. ඒ. අජිත් පණ්ඩිතරත්න මහතා | - සභාපති |
| ජෙහාන් පී. අමරතුංග මහතා | - අධ්‍යක්ෂ |
| එල්. කේ. සංගක්කාර මහත්මිය (2012 නොවැම්බර් මාසයේ පත්කරන ලදී) | - අධ්‍යක්ෂ |
| සබ්රි ඉබ්‍රාහිම් මහතා (2012 නොවැම්බර් මාසයේ ඉල්ලා අස්විය) | - අධ්‍යක්ෂ |

## ආයතනික පාලනය

බැංකුව විසින් ස්වේච්ඡාවෙන්ම යහපත් පරිචය විධිවිධාන මාලාවක් සම්මත කරගනු ලැබූ අතර, නිවැරදි ආයතනික පාලනයක් තහවුරුකරනු සඳහා අවශ්‍යකරන පද්ධතීන් සහ ක්‍රියාපිළිවෙත් ස්ථාපනය කර ඇත.

සවිස්තර වාර්තාවක් 87 සිට 93 පිටුවල පළ වේ.

## අනුකූලතා වාර්තාකරණය

බැංකුව තුළ වෙනම ම අනුකූලතා කාර්යසාධන ඒකකයක් පිහිටුවා ඇත. ප්‍රධාන විධායක නිලධාරී සහ අනුකූලතා නිලධාරී විසින් සහතික කරන ලද මාසික අනුකූලතා වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාසිකව ඉදිරිපත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ද අනුකූලතා වාර්තා ඉදිරිපත් කෙරේ. කාර්ය මණ්ඩලය සඳහා චර්යා ධර්ම පද්ධතියක් නිර්මාණය කර ඇති අතර, එය සෑම කාර්ය මණ්ඩල සාමාජිකයකු වෙතම ලබා දී තිබේ.

සවිස්තර වාර්තාවක් 85 සහ 86 යන පිටුවල පළ වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටු

2012 දෙසැම්බර් මස 31 දිනට, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටු මෙසේ පැවතිණි.

### මාණ්ඩලීය විගණන කමිටුව

| | |
|---|---|
| ජෙහාන් පී. අමරතුංග මහතා (සභාපතිලෙස කටයුතු කළේ ය.) | - අධ්‍යක්ෂ |
| විසාඛා අමරසේකර මෙනෙවිය | - අධ්‍යක්ෂ |
| ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය | - අධ්‍යක්ෂ |

කමිටුවේ ප්‍රධාන කාර්යය වන්නේ. මෙහෙයවුම් කාර්යයන්හි දී බැංකුව මුහුණ දෙන අවදානම් තත්ත්වයන් හඳුනාගෙන, එවැනි අවදානම් තත්ත්ව මගින් ඇති විය හැකි බලපෑම් වළක්වාලීම හෝ අවම කිරීම සහ සමස්ත බැංකු ජාලය තුළම, යහපත් පරිචයන් සහ මනා තත්ත්ව ආරක්ෂණයන් පවත්වා ගැනීම සඳහා, සන්නිවේදනය කිරීම හා දිරිගැන්වීමයි.

### මාණ්ඩලීය විධායක ණය කමිටුව

| | |
|---|---|
| අභාවප්‍රාප්ත ඩබ්ලිව් කරුණාජීව මහතා (2013 ජනවාරි 28 දක්වා) | - සභාපති |
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි | - අධ්‍යක්ෂ |
| ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය | - අධ්‍යක්ෂ |
| පවර දසනායක මහතා | - අධ්‍යක්ෂ |
| එන්. වසන්ත කුමාර මහතා | - ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී |
| සබ්රි ඉබ්‍රාහිම් මහතා | - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) |
| රසිත ගුණවර්ධන මහතා | - වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය පාලන හා අවදානම) |

ප්‍රධාන කාර්යය වන්නේ බැංකුවේ ණය ප්‍රතිපත්තිය සකස් කිරීම හා කලින්කල එය සමාලෝචනය කිරීමයි. විශේෂිත වාර්ගිකයන් සඳහා, නියමිත සීමාවන් ඉක්මවා ණය පහසුකම් සඳහා අවසරය ලබාදීම ද මෙහි කාර්යයකි.

### මාණ්ඩලීය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

| | |
|---|---|
| අභාවප්‍රාප්ත ඩබ්ලිව් කරුණාජීව මහතා (2013 ජනවාරි 28 දක්වා) | - සභාපති |
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි | - අධ්‍යක්ෂ |
| අජිත් පණ්ඩිතරත්න මහතා | - අධ්‍යක්ෂ |
| ප්‍රියන්ත මායාදුන්න මහතා | - අධ්‍යක්ෂ |
| එන්. වසන්ත කුමාර මහතා | - ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී |

මෙම කමිටුවේ ප්‍රධාන කාර්යයන් වන්නේ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්තීන් හා ක්‍රියාපටිපාටීන් සැකසීම, බැංකුවේ ව්‍යාපාරික අවශ්‍යතා අනුව සේවා යෙදවුම් මට්ටම් සමාලෝචනය හා සැකසීම, බඳවා ගැනීම් අනුමත කිරීම, සේවක සුභසාධනය, සේවා දිගුකිරීම් ලබා දීම සහ ආයතනික හා විධායක කළමනාකරුවන් සඳහා සේවා ගිවිසුම් සැකසීම ය.

### මාණ්ඩලීය සමෝධානිත අවදානම් කළමනාකරණ කමිටුව

| | |
|---|---|
| ජෙහාන් පී. අමරතුංග මහතා | - සභාපති |
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි | - අධ්‍යක්ෂ |
| ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය | - අධ්‍යක්ෂ |
| විසාඛා අමරසේකර මෙනෙවිය | - අධ්‍යක්ෂ |
| එන්. වසන්ත කුමාර මහතා | - ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී |

සමෝධානිත අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් සමාලෝචනය සිදුකොට, ඒ හා අදාළ බැංකුව පාර්ශ්වයීය ප්‍රයත්නයන්ට යෙදවුම් නිර්දේශ සකස් කිරීමට මෙම අනුකමිටුව පිහිටුවන ලදී.

වත්කම් හා වගකීම් කමිටු වාර්තා හා රැස්වීම්වලින් ද, ණය අවදානම හා අදාළ කරුණු කාරණා හා වාර්තා මගින් ද, අවදානම් කළමනාකරණ මෙහෙයවුම් කාර්යරාමු ස්ථාපන ප්‍රයත්නයන් ඔස්සේ ද උද්ගතවන ක්‍රියාපිළිවෙත් හි හා සාධකයන් හි සාරාංශයන් විශේෂිත වශයෙන් විමසා බැලීම, සමෝධානිත අවදානම් කළමනාකරණ අනුකමිටුව සිදුකරයි.

බැංකුවේ සමෝධානිත අවදානම් කළමනාකරණය සම්බන්ධ වැඩිමනත් විස්තර මෙම වාර්තාවේ අංක 96 සිට 107 දක්වා පිටුවල දැක්වෙන මෙකී විෂයය හා සම්බන්ධ තවත් කොටසක පළ වේ.

### මාණ්ඩලීය නාමයෝජනා කමිටුව

| | |
|---|---|
| අභාවප්‍රාප්ත ඩබ්ලිව් කරුණාජීව මහතා (2013 ජනවාරි 28 දක්වා) | - සභාපති |
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි | - අධ්‍යක්ෂ |
| ජෙහාන් පී. අමරතුංග මහතා | - අධ්‍යක්ෂ |
| ධර්මා එන්. ගම්මන්පිල මහත්මිය | - අධ්‍යක්ෂ |
| පී. ඒ. අජිත් පණ්ඩිතරත්න මහතා | - අධ්‍යක්ෂ |
| ලක්ෂ්මි කේ. සංගක්කාර මහත්මිය | - අධ්‍යක්ෂ |
| විසාඛා අමරසේකර මෙනෙවිය | - අධ්‍යක්ෂ |
| ප්‍රියන්ත මායාදුන්න මහතා | - අධ්‍යක්ෂ |
| පවර දසනායක මහතා | - අධ්‍යක්ෂ |

මෙම කමිටුවේ ප්‍රධාන කාර්යයන් වන්නේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී තනතුරට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට පුද්ගලයන් තෝරාගැනීම/පත්කිරීම සඳහා සුදුසු ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කිරීම, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී තනතුර සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ තනතුරු සඳහා පුද්ගලයන් පත්කිරීම හෝ උසස් කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් ප්‍රධාන කුසලතා නිර්ණය කිරීම සහ බැංකුවේ ප්‍රගතිය සඳහා කලින් කලට අවශ්‍ය කරනු ලබන අතිරේක/නව විශේෂඥයන්ගේ අවශ්‍යතාව පිළිබඳ සලකා බැලීම හා ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම ය.

## මාණ්ඩලීය ආයෝජන බැංකුකරණ කමිටුව

| | | |
|---|---|---|
| ජෙහාන් පී. අමරතුංග මහතා | - | සභාපති |
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි | - | අධ්‍යක්‍ෂ |
| විසාඛා අමරසේකර මෙනෙවිය | - | අධ්‍යක්‍ෂ |

මාණ්ඩලික ආයෝජන බැංකුකරණ කමිටුව පිහිටුවීමේ අරමුණ වූයේ, ආයෝජන බැංකු ඒකකයට උපායමාර්ගික විධානයන් හා මාර්ගෝපදේශයන් සම්පාදනය කිරීම සහ බැංකුවේ ආයෝජන බැංකු ඒකකයේ ක්‍රියාකාරිත්වය සමාලෝචනයට භාජනය කිරීම යි.

මාණ්ඩලීය ආයෝජන බැංකුකරණ කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වශයෙන් බැංකුවේ ආයෝජන බැංකු ආකෘතිය නිරන්තර සමාලෝචනයට භාජනය කිරීමත්, කොටස් වෙළෙඳ සීමාවන් අනුමත කිරීමත්, නව ආයෝජන නිපැයුම් අනුමත කිරීමත්, ආයෝජන බැංකු ඒකකයේ මෙහෙයවුම් සමාලෝචනයට භාජනය කිරීමත්, ව්‍යාපාර කොටස් තැරැව්කරුවන් ද, වෙළෙඳ ප්‍රතිපත්තීන් හා තොරතුරු තාක්ෂණ පද්ධතීන් ද භාවිතය සඳහා අනුමැතිය ලබාදීමත් සඳහන් කළ හැකි ය.

## මාණ්ඩලීය තොරතුරු තාක්ෂණ කමිටුව

| | | |
|---|---|---|
| ආචාර්ය ඩී. ජේ. ඩී. ජයකොඩි | - | සභාපති |
| ජෙහාන් පී. අමරතුංග මහතා | - | අධ්‍යක්‍ෂ |
| ප්‍රියන්ත මායාදුන්න මහතා | - | අධ්‍යක්‍ෂ |
| එන්. වසන්ත කුමාර මහතා | - | ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී |

මාණ්ඩලීය තොරතුරු තාක්ෂණ කමිටුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ, අභියෝග හා තරගකාරිත්වය මැඩ පැවැත්වීම පිණිස දුරදක්නා උපායමාර්ග සකස් කිරීමත්, තරගකාරී ව්‍යාපාරික පරිසරය තුළ, බැංකුවේ තොරතුරු තාක්ෂණය සාර්ථකව ඉදිරියට රැගෙනයාම සඳහා ප්‍රතිපත්තිමය විධානයන් සම්පාදනය කිරීමත් ය.



**රෝහාන් පතිරගේ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
*අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්*

2013 ජනවාරි 29 දින

# මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

බැංකුව විසින් සිදුකරනු ලබන සියළුම ගනුදෙනු සම්බන්ධයෙන්, විධිමත් ලෙස ගිණුම්පොත් පවත්වා ගෙන යාම, සහ අදළ වර්ෂය තුළ බැංකුවේ ලාභ/අලාභ පිළිබඳව හා කාර්යයන් පිළිබඳව, සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ වගකීම, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

ඒ අනුව, විගණන කමිටුව තුළින් සහ නිතිපතා පවත්වනු ලබන රැස්වීම්වල සමාලෝචනයන් තුළින්, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ කළමනාකාරිත්වයේ වගකීම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලබයි. මාණ්ඩලීය විගණන කමිටු වාර්තාව 154 වන පිටුවෙහි දැක්වේ.

අභ්‍යන්තර පාලනය හා අදාළවන ඵලදායී හා පරිපූර්ණ පද්ධතීන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථානගත කර තිබේ. අභ්‍යන්තර පිරික්සුම්, අභ්‍යන්තර විගණනය, බැංකුවේ ව්‍යාපාරික කටයුතු විධිමත් ලෙස පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සමස්ත මූල්‍ය පද්ධතීන් හා සෙසු පාලනයන්, වත්කම් ආරක්ෂණය සහ හැකිතාක් දුරට ප්‍රායෝගිකව වාර්තාවල නිරවද්‍යතාව හා විශ්වසනීයත්වය පවත්වා ගෙන යාම යනාදිය ඊට අන්තර්ගත වෙයි. පිටු අංක 157 සිට 242 දක්වා වාර්තාකර ඇති පරිදි, 2012 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී, සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් හා ඇස්තමේන්තු පදනම් කරගනිමින්, සංගත පදනමක් මත තමන් විසින් නිසි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කරනලද බව අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසය යි.

මෙම වාර්තාව මගින් පිළියෙළකොට ඉදිරිපත් කර ඇති, 2012 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා අදාළ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1998 අංක 30 දරන බැංකු පනත හා ඊට අදාළ සංශෝධන සමග අනුකූල වේ. බැංකුවේ සහ එහි සමාගම් සමූහයෙහි කාර්යයන් පිළිබඳ සත්‍ය හා යථාවාදී දර්ශනයක් මෙම මූල්‍ය ප්‍රකාශන තුළින් පිළිබිඹු කෙරේ.



**රොහාන් පතිරගේ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
*අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්*

2013 ජනවාරි 29 දින

# අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

## වගකීම

2007 අංක 11 දරන බැංකු පනත් විධානයන්හි 3(8)(II)(ආ) වගන්තියට අනුකූලව, මහජන බැංකුවේ (බැංකුවේ) අභ්‍යන්තර පාලනය පිළිබඳ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

බැංකුවේ අභ්‍යන්තර පාලනය සඳහා පවත්නා පද්ධතියෙහි ප්‍රමාණවත්භාවය හා ඵලදායකත්වය පිළිබඳ ව අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) වගකීම භාරගනි. කෙසේවුව ද, බැංකුවේ ප්‍රතිපත්තීන් හා ව්‍යාපාරික අරමුණු ඉටුකර ගැනීමේ දී, අසාර්ථකවීමේ අවදානම ඉවත්කිරීමට වඩා, පිළිගතහැකි අවදානම් පැතිකඩක් තුළ බැංකුවේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍රයන් කළමනාකර ගැනීමට හැකිවනු පිණිස මෙම පද්ධතිය සැලසුම් කරනු ලැබ ඇත. ඒ අනුව, අභ්‍යන්තර පාලනය හා අදාළවන පද්ධතිය, සාධාරණ මට්ටමේ සහතිකයක් පිණිස මිස, කළමනාකරණය සහ මූල්‍ය තොරතුරු සහ වාර්තා හෝ මූල්‍ය අලාභයන්ට හෝ වංචාවන්ට විරුද්ධව හෝ සිදුකෙරෙන භෞතික සාවද්‍ය ප්‍රකාශනයන්ට එදිරිවූ පරිපූර්ණ සහතිකයක් පිණිස නොවන්නේ ය.

බැංකුව මුහුණදෙන සුවිශේෂ අවදානම් හඳුනාගැනීමට, ඇගැයීමට හා කළමනාකරණයට දිගටම පවත්නා ක්‍රියාවලියක් බැංකුව විසින් ස්ථාපනයකර ඇති අතර, ව්‍යාපාරික පරිසරයෙහි හෝ නියාමන මාර්ගෝපදේශයන්හි හෝ වෙනස්කම් සිදුවන කල්හි, අභ්‍යන්තර පාලන පද්ධතියෙහි වර්ධනයන් සිදුකිරීම ද මෙම ක්‍රියාවලියට ඇතුළත් වෙයි. මණ්ඩලය විසින් මෙම ක්‍රියාවලිය නිතිපතා සමාලෝචනයට භාජනය කරනු ලැබේ. අභ්‍යන්තර පාලනය පිළිබඳ  අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය හා අදාළ ව, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත්කර ඇති බැංකු අධ්‍යක්ෂවරුන්ගේ මාර්ගෝපදේශයන්ට අනුකූල ව එය සිදුකෙරේ. එම මාර්ගෝපදේශයන්හි දක්වා ඇති අන්දමට අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීමේ දී නියමිත ප්‍රතිපත්තීන් පිළිබඳ අවධානයෙන් යුක්ත ව. බැංකුව විසින් අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කර තිබේ.

මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයත්වය පිළිබඳ ව සහ බාහිර අවශ්‍යතාවන් සඳහා මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම ද සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීමට දැනට පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය යහපත් හා ප්‍රමාණවත් යයි ද, ගිණුම් හා අදාළ ප්‍රතිපත්තීන්ට හා නියාමන අවශ්‍යතාවන්ට ඒවා අනුකූල යයි ද මණ්ඩලය විශ්වාස කරයි.

උද්ගතවන්නාවූ අවදානම් හඳුනාගැනීමෙන් හා තක්සේරුකිරීමෙන් ද, එම අවදානම් විසඳාගැනිමට හා පාලනය කිරීමට ගැලපෙන අභ්‍යන්තර පාලන පද්ධති සැලසුම් කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරිම තුළින් ද, අවදානම හා පාලනය පිළිබඳ මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත් ක්‍රියාත්මක කිරීමේ දී කළමනාකාරීත්වය මණ්ඩලයට සහායවෙයි.

## මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සැලැස්ම හා ඵලදායකත්වය සම්බන්ධයෙන් අදාළ කරගැනීමට හා සමාලෝචනය සඳහා යොදාගත හැකි ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය හා අදාළවන අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණවත් බව හා ගැලපීම සමාලෝචනය කිරීමෙහිලා ස්ථාපනයකර ඇති ප්‍රධාන ක්‍රියාවලීන්ට, පහත සඳහන් කරුණු ඇතුළත්වෙයි:

- බැංකුව ඇතුළත ඵලදායී අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුකමිටු පත් කරනු  ලැබ ඇත. ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීතැන ගේ ප්‍රධානත්වයෙන් ආයතනික කළමනාකාරීත්වයක් පත්කිරීම මගින් මණ්ඩලයේ සිට අනෙක් ස්තරයන් වෙත බලතල පවරාදීමට හැකියාව ලැබී ඇත. උද්ගතවන්නා වූ අවදානම් හඳුනා ගැනීමෙන් හා තක්සේරු කිරීමෙන් ද, එම අවදානම් විසඳාගැනීමට හා පාලනය කිරීමට ගැලපෙන අභ්‍යන්තර පාලන පද්ධති සැලසුම් කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරිම තුළින් ද, අවදානම හා පාලනය පිළිබඳ මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත් ක්‍රියාත්මක කිරීමේ දී කළමනාකරණ අංශය මණ්ඩලයට සහායවෙයි.

- ණය, වෙළඳපළ සහ මෙහෙයුම් අවදානම් ඇතුළු ප්‍රධාන අවදානම් හඳුනාගැනීමට, පාලනයට සහ වාර්තාකරණයට, පද්ධති සහ ක්‍රියාපිළිවෙත් සූදානම්ව තිබේ. මෙම අවදානම්වලට පාත්‍රවීම මාණ්ඩලීය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අධීක්ෂණය කරනු ලැබේ. කමිටුව විසින් බැංකුව පාත්‍ර වියහැකි සියලුම අවදානම්වල ස්වභාවයන්,  සුදුසු අවදානම් දර්ශකයන් සහ කළමනාකරණ තොරතුරු හරහා කලින් කලට තක්සේරු කරන අතර, නිශ්චිත අවදානම් ආමන්ත්‍රණය සඳහා මෙන් ම, ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාතුළ එම අවදානම් කළමනාකරණය කිරීම සඳහා, සියලුම කළමනාකරණ මට්ටම්වල කමිටු සතු ප්‍රමාණාත්මක භාවය සහ කාර්යක්ෂමතාවය ද සමාලෝචනය කරනු ලැබේ. ආතති පරීක්ෂණය සහ අවදානම්වල ගතිලක්ෂණ  සමාලෝචනය ද මෙයට ඇතුළත් වේ. මාණ්ඩලීය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන විචක්ෂණ සීමාවන් ඉක්මවන මට්ටමේ අවදානම් ඇති අවස්ථාවල දී, නිශ්චිත අවදානම්වල ප්‍රතිවිපාක අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ද ගනු ලැබේ.

- මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීමේ දී, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන වැදගත් ගිණුම්වලට හා අනාවරණයන්ට සම්බන්ධ සියලු ක්‍රියාපිළිවෙත් හා පාලනයන්, බැංකුව විසින් සමාලෝචනය කරනු ලබයි. ඒ හා සමගම, දිගින් දිගටම සිදුකෙරෙන පදනම මත, සැලසුමේ හා ඵලදායකත්වයේ යෝග්‍යතාව සහතික කරනුවස්, අභ්‍යන්තර විගණන අංශය විසින් ඒවා නිරීක්ෂණයට හා විමර්ෂනයට භාජනය කරනු ලැබී ය. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සොයාගැනීම්, බාහිර විගණන කමිටුවේ කාලීන රැස්වීම්වලදී සමාලෝචනය කරනු පිණිස එම කමිටුවට ඉදිරිපත් කෙරේ. බැංකුව විසින් පමණක් ක්‍රියාත්මක කරනලද පද්ධතිය තක්සේරුවෙන් ආවරණය වූ අතර, එහි පරිපාලිතයින් හා ආශ්‍රිතයින් විසින් ක්‍රියාත්මක කරනලද පද්ධතීන් ඊට අන්තර්ගත නොවී ය.

- මාණ්ඩලීය විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සමස්ත ඵලදායකත්වය අධීක්ෂණය කරනු ලබන අතර, ඒ පිළිබඳ ව නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලැබ ඇත. කමිටුව මගින් භාවිත කරන ලද ප්‍රධාන ක්‍රියාදාමයන් අතර, නිරන්තර ව්‍යාපාර සහ මෙහෙයුම් අවදානම් තක්සේරු කිරීම, අභ්‍යන්තර විගණනය සහ අනුකූලතාවය ඇතුළු ප්‍රධාන අවදානම් කාර්යයන්හි ප්‍රධානීන්ගෙන් නිතිපතා වාර්තා ලබා ගැනීම, අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන වාර්තා, විචක්ෂණ විමර්ශන සහ නියාමන වාර්තා පිළිබඳ සමාලෝචන හා පසු විපරම් සිදුකිරීම ද ඇතුළත් වේ. මාණ්ඩලීය විගණන කමිටුව විසින් බැංකුවට බලපාන ප්‍රධාන අවදානම් ස්වභාවයන්හි තත්ත්වයන් විමර්ශනය කරනු ලබන අතර, ක්‍රියාත්මක කෙරෙන අවදානම් බැහැරලීමේ ක්‍රියාමාර්ගවල යෝග්‍යතාවය ද විමසා බැලේ.

- වාර්ෂික ගිණුම් සකස් කිරීම පිළිබඳ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පාලනය කෙරෙනුයේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති වාර්තාකරණ ආකෘතීන් හා වාර්තාකරණ අවශ්‍යතාවන් පිළිබඳ උපදෙස් ද පදනම්කර සකස් කරන ලද ලේඛනගත ගිණුම් ප්‍රතිපත්ති භාවිත කරමිනි. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ පිළිවෙත් අන්තර්ගත නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිත කෙරෙන ප්‍රථම වර්ෂය වර්තන වර්ෂය හෙයින්, හඳුනාගැනීම, මැනගැනීම, වර්ගීකරණය සහ අනාවරණය හා අදාළ නව අවශ්‍යතාවලට අනුකූලවීමේ ක්‍රියාපිළිවෙත සම්පූර්ණ කරනු ලැබී ය.

## තහවුරුව

ඉහත සඳහන් ක්‍රියාවලීන් පදනම් කරගනිමින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවනසේ, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයවත්වය සහ බාහිර අභිමතාර්ථයන් සඳහා මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීම යන කරුණු හා අදාළ ව, සාධාරණ සහතිකයක් ලබාදිය හැකිවනසේ, බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය පිළිබඳ අභ්‍යන්තර පාලනය සැලසුම්ගතව ඇතිබව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරුකරයි.

## බාහිර විගණක නිලධාරීන් ගේ ප්‍රකාශන සමාලෝචනය

2012 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වසර හා අදාළ වාර්ෂික වාර්තාව තුළ අන්තර්ගත අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය, බාහිර විගණක නිලධාරීන් විසින් සමාලෝචනය කර ඇති අතර, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම හා ඵලදායිත්වය සමාලෝචනය කිරීමේ දී, ඒ සඳහා බැංකුව විසින් අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් ඔවුන් ලත් අවබෝධය අනුව, ඉහත කී ප්‍රකාශයට අනුකූල නොවන්නා වූ කිසිවක් ඇති බව විශ්වාස කරන්නට තරම් සාධක ඔවුන් ගේ අවධානයට යොමුවූයේ නැතැ යි ඔවුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර ඇත.

මණ්ඩලය වෙනුවෙන්,



**ජෙහාන් පී. අමරතුංග**
*විගණන කමිටු සභාපති*



**විසාඛා අමරසේකර**
*අධ්‍යක්ෂ*



**ධර්මා එන්. ගම්මන්පිල**
*අධ්‍යක්ෂ*

2013 මාර්තු 15 දින

# ස්වාධීන සහතික කිරීමේ වාර්තාව


**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No. FB/G/PB/FA/2012(02)

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2013 මාර්තු 22


## මහජන බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණකාධිපති ගේ සහතික කිරීමේ වාර්තාව

### හැඳින්වීම

2012 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ප්‍රකාශිත, මහජන බැංකුවේ වාර්ෂික වාර්තාවේ අන්තර්ගත කරන ලද, එම බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය (ප්‍රකාශනය) පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් සහතිකයක් ලබාදීම, මෙම වාර්තාව විසින් සිදුකෙරේ.

### කළමනාකාරීත්වයෙහි වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2007 අංක 11 දරන බැංකු පනතෙහි 3(8)(ii)(ආ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව නිකුත්කරන ලද, 'අභ්‍යන්තර පාලන පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා මාර්ගෝපදේශ' වලට අනුකූලව මෙම ප්‍රකාශනය පිළියෙළ කොට ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරීත්වය වගකීම දරයි.

### මගේ වගකීම් සහ SLSAE 3050 සමග අනුකූලතාවය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ ප්‍රකාශය පදනම් කරගනිමින් එම මණ්ඩලයට වාර්තාවක් නිකුත් කිරීම මගේ වගකීම වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද 'අභ්‍යන්තර පාලන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සඳහා වන සහතික කිරීමේ වාර්තාවට' - එනම් SLSAE 3050 ට අනුකූලව මා විසින් මෙම කාර්යය ඉටු කරන ලදී.

### සිදුකරන ලද කාර්යයන් පිළිබඳ සම්පිණ්ඩනයක්

මෙම කාර්යය සිදුකරන ලද්දේ, අධ්‍යක්ෂවරුන් විසින් හා අධ්‍යක්ෂවරුන් සඳහා පිළියෙළ කරන ලද ලේඛන දෙ වර්ගය සමගම ප්‍රකාශය අනුගත වේ ද යන බව තක්සේරු කිරීම සඳහා සහ බැංකුවේ අභ්‍යන්තර පාලන සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය නිසි ලෙස නිරූපනය වේ ද යන්න තක්සේරු කිරීම සඳහා ය. (උපලේඛන අංක 1 බලන්න)

සිදුකරන ලද කාර්යයන්, මූලික වශයෙන් ම බැංකු නිලධාරින් සමග කෙරෙන විමසීම්වලට සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදවන ලද ක්‍රියාවලිය හා අනුගතවන, සරල පදනමකින් යුත් පවත්නා ලිපිලේඛනවලට සීමාවන්නේ ය.

ප්‍රකාශය විසින් සියලුම අවදානම් තත්ත්ව හා පාලන පද්ධති ආවරණය කරනු ලැබේ ද යන්න සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් තත්ත්වයන්හි සහ පාලන විධි පිළිවෙත්වල ඵලදායිතාව පිළිබඳ මතයක් ගොඩනැගීම හෝ SLSAE 3050 මා කෙරෙන් අපේක්ෂා නොකෙරේ. එසේ ම, වාර්ෂික වාර්තාව විසින් අනාවරණය කරන ලද කිසියම් සුවිශේෂී ගැටලුවල, විෂයාතික්‍රාන්ත අභ්‍යන්තර පාලන පද්ධතියට අදාළ වන බලපෑම් සම්බන්ධයෙන්, කටයුතු කිරීමට යොදා ගනු ඇතැයි විස්තර කරන ලද ක්‍රියාවලීන් මගින්, සත්‍ය වශයෙන්ම, අදාළ ගැටලුවලට විසඳුම් ලබා දෙන්නේ ද යන්න සලකා බැලීම ද, SLSAE 3050 මා වෙතින් අපේක්ෂා නොකෙරේ.

### නිගමනය

ක්‍රියාත්මක කරන ලද විධිපිළිවෙත් අනුව, බැංකුවේ අභ්‍යන්තර පාලන සැලසුම හා ඵලදායිත්වය සමාලෝචනය කිරීමේ දී, බැංකු අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කරන ලද ක්‍රියාපිළිවෙත සම්බන්ධයෙන් මා ලත් අවබෝධය අනුව, වාර්ෂික වාර්තාවේ අන්තර්ගත එම ප්‍රකාශයට අනුකූල නොවන්නාවූ කිසිවක් ඇති බව විශ්වාස කිරීමට මා හට හේතුවන කිසිදු සාධකයක් මාගේ අවධානයට යොමුවූයේ නැත.

**එච්. ඒ. එස්. සමරවීර**
විගණකාධිපති


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

## ස්වාධීන සහතික කිරීමේ වාර්තාව ඇමුණුම් 1

1. අධ්‍යක්‍ෂවරුන් විසින් නිකුත් කිරීමට අදහස් කරන ලද ප්‍රකාශය තහවුරු කිරීම සඳහා අධ්‍යක්‍ෂවරුන් විසින් හෝ අධ්‍යක්‍ෂවරුන් සඳහා පිළියෙළ කරන ලද ලිපිලේඛන සමාලෝචනයට භාජනය කරන ලදී.

2. ප්‍රධාන කාර්යාල මට්ටමේ සහ නියැදි වශයෙන් ශාඛා මට්ටමේ පාලනයන් සම්බන්ධයෙන් පිරික්සුම් ස්වාධීන ලෙස සිදුකරනු ලැබීය.

3. අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්වල හා අදාළ මාණ්ඩලීය කමිටුවල වාර්තා සමාලෝචනයට භාජනය කරනු ලැබී ය.

4. අභ්‍යන්තර පාලන පිළිබඳ අධ්‍යක්‍ෂවරුන්ගේ ප්‍රකාශය මගින් සමාලෝචිත වර්ෂය ආවරණය කරනු ලබන්නේ ද යන බව සහ කිසියම් සුවිශේෂී ගැටලුවක් ඉස්මතුවන්නේ නම්, එය හඳුනාගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ඒ තුළ දක්නට ලැබේ ද යන බව ද සලකා බලන ලදී.

5 ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂ්‍ය පවතින්නේය යි සාධාරණ ලෙස අපේක්ෂා කළ නොහැකි අවස්ථාවල දී, අභ්‍යන්තර පාලනයට අදාළවන්නාවූ විෂයයන් සම්බන්ධයෙන්, අධ්‍යක්ෂවරුන්ගෙන් ලිඛිත ඉදිරිපත්කිරීම් ලබාගන්නා ලදී.

# තථ්‍ය සොයාගැනීම් හා ආයතනික පාලනය පිළිබඳ වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No. FB/G/PB/FA/2012(02)
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2013 මාර්තු 22

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කරන ලද, ආයතනික පාලන විධාන හා අදාළ අනුකූලත්ව අවශ්‍යතා සම්බන්ධයෙන් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත්කරන ලද මහජන බැංකුවේ සිද්ධිවාචක තීරණයන් පිළිබඳ විගණකාධිපති ගේ වාර්තාව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කරන ලද, ආයතනික පාලන විධාන හා අදාළ අනුකූලත්ව අවශ්‍යතා සපුරාලනු පිණිස, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙළකොට ඉදිරිපත් කරන ලද පාලන වාර්තාව හා අදාළ ව, මෙම වාර්තාවෙහි උපලේඛන අංක 1 යටතේ දක්වා ඇති ක්‍රියාපිළිවෙත් මා විසින් ඉටුකරන ලදී. මෙම කාර්යය සිදුකරන ලද්දේ, එකඟතාවයටපත් ක්‍රියාකාරී පිළිවෙත් අනුව, සබැඳි සේවාවන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ 4400 (SLSRS 4400) තුළ අන්තර්ගත ප්‍රතිපත්තීන්ට අනුකූලව ය. ආයතනික පාලන විධාන අවශ්‍යතා සපුරාලීමේ දී හුදෙක් ඔබට සහායවීම පිණිස ම, එකී ක්‍රියාපිළිවෙත් ඉටුකරනු ලැබී ය. මෙම ක්‍රියාවලිය ඉටුකිරීමේ දී, පොදුජන සේවයෙහි නියුක්ත වන්නා වූ වරලත් ගණකාධිකාරී ආයතනයක සහාය මා විසින් උපයෝගීකරගන්නා ලදී.

මෙම වාර්තාවට අමුණා ඇති උපලේඛනය මගින් මගේ තීරණයන් වාර්තා කරමි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හෝ සමාලෝචන ක්‍රියාවලීන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතීන් හා අනුකූලවන්නාවූ පරිදි, විගණනයක් හෝ සමාලෝචනයක් යථෝක්ත ක්‍රියාපිළිවෙත් අනුව සිදුනොවූ හෙයින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද, ආයතනික පාලන විධාන සමග අනුකූලවීම පිළිබඳ ආරක්ෂණයක් මා විසින් ප්‍රකාශකරනු නොලැබේ.

මා විසින් අතිරේක ක්‍රියාපිළිවෙත් ඉටුකරනු ලැබුවේ නම් හෝ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හෝ සමාලෝචන ක්‍රියාවලීන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතීන් හා අනුකූලවන්නාවූ පරිදි, විගණනයක් හෝ සමාලෝචනයක්, යථෝක්ත ක්‍රියාපිළිවෙත් අනුව සිදුකරනු ලැබුවේ නම්, ඔබට වාර්තා කළ යුතු වන්නාවූ වෙනත් කරුණු මගේ අවධානයට යොමුවන්නට ඉඩ තිබිණි.

මගේ වාර්තාව වනා හී හුදෙක් ම මෙම වාර්තාවේ පළමුවන ඡේදයෙහි දැක්වෙන අභිමතාර්ථය හා ඔබගේ දැනගැනීම පිණිස පමණක් ම වන අතර, අන් කවර හෝ අරමුණක් සඳහාවත් භාවිත නොවිය යුතු වාක් සේ ම, වෙනත් පාර්ශ්වයන් අතර බෙදාහැරීමක් සඳහා ද නොවන්නේ ය.

ඉහතින් නිශ්චිත ව දක්වා ඇති අයිතමයන්ට පමණක් මෙම වාර්තාව අදාළ වන අතර, සමස්තයක් වශයෙන් සැලකෙන මහජන බැංකුවේ සෙසු මූල්‍ය ප්‍රකාශනයන් එ මගින් ආවරණය නොවේ.

**එච්. ඒ. එස්. සමරවීර**
විගණකාධිපති

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

# තථ්‍ය සොයාගැනීම් පිළිබඳ වාර්තාවේ ඇමුණුම

සටහන: ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද, 2007 අංක 11 දරන බැංකු පනත් විධානයෙහි '3 වන වගන්තියට' ට අනුව පහත සඳහන් අංක ක්‍රමය දක්වා තිබේ. වගන්ති අංක 1 සහ 2 මෙම ලියවිල්ලට අදාළ නොවේ.

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| **3 (1)** | **අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්** | | | | |
| *3 (1) (i)* | **බැංකුවේ සුරක්ෂිතභාවය හා පැවැත්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශක්තිමත් කළ බව තහවුරු කිරීම සඳහා එකඟවූ ක්‍රියා පිළිවෙත් ඉටුකර තිබේ.** | | | | |
| | ■ මාණ්ඩලික අනුමැතිය, බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මණ්ඩලය අනුමත කළ උපාය මාර්ගික සැලැස්ම නිරීක්ෂණය කරන ලදී. මාණ්ඩලික පත්‍රිකා අංක 372/2012 සහ මාණ්ඩලික වාර්තා අංක 3/2012 මගින් එය අනුමතකර ඇත. |
| | ■ බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම්, සමස්ත බැංකුව තුළම බැංකුව විසින් සන්නිවේදනය කර තිබේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | චක්‍රලේඛ මගින් අදාළ ශාඛා කළමනාකරුවන්ට උපායමාර්ග සන්නිවේදනයකර තිබේ. 'උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ ඒකකය' මෙම ක්‍රියා පිළිවෙත ඉටුකරයි. |
| | ■ බැංකුවේ සමස්ත ව්‍යාපාරික අරමුණු සඳහා මාණ්ඩලික අනුමැතිය පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මණ්ඩලය විසින් අනුමත කරන ලද උපාය මාර්ගික සැලැස්ම නිරීක්ෂණය කරන ලදී. මාණ්ඩලික පත්‍රිකා අංක 372/2012 සහ මාණ්ඩලික වාර්තා අංක 15/2012 මගින් එය අනුමත කර ඇත. |
| | ■ සමස්ත ව්‍යාපාරික අරමුණු තුළ, සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියා පිළිවෙත් සහ යාන්ත්‍රණයන් අන්තර්ගතවීම හා එම කරුණු ලේඛනගතකිරීම පිළිබඳ ව පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | අනුමත කරන ලද උපාය මාර්ගික සැලැස්ම තුළ මෙම කරුණු ආමන්ත්‍රණය කරනු ලැබ ඇත. |
| | ■ සමස්ත ව්‍යාපාරික උපාය මාර්ගය තුළ, යටත් පිරිසෙයින් ඉදිරි තුන්වසර සඳහාවත් මිනියහැකි ඉලක්කයන් පවත්නා බවට පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | උපාය මාර්ගික සැලැස්ම තුළ මැනිය හැකි ඉලක්කයන් අන්තර්ගත කරනු ලැබ ඇත. |
| | ■ මණ්ඩලය විසින් හඳුනා ගන්නා ලද, හා අනුකූලතාව දක්වා ඇති අවදානම් කළමනාකරණය සඳහා යෝග්‍ය පද්ධතීන් නිසිපරිදි ක්‍රියාත්මක කරනු ලැබ ඇත්තේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මෙම කරුණු විසඳාගැනීම සඳහා 'මාණ්ඩලීය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව' විසින් වරින්වර අවශ්‍ය පියවර ගනුලැබ ඇත. තවද, මේ හා අදාළ වාර්තාවන්ට යොමුවීම තුළින් මේ බව නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, මේ හා අදාළ ව විධිමත් පද්ධතියක් පවත්නා බැව් අපට තහවුරු කළ හැකි ය. (මාණ්ඩලික පත්‍රිකා අංක 142/2012 හා 363/2012 සහ වාර්තා අංක 9 හා 13) |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ මණ්ඩලය විසින් සියලුම තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස්හිමියන් සහ ණයගැතියන් සඳහා සන්නිවේදන ප්‍රතිපත්තියක් අනුමතකර ක්‍රියාත්මක කරනු ලැබේ දැයි පරීක්ෂාකරන ලදී | අනුකූලතාව දක්වා ඇත | | | සන්නිවේදනය පිළිබඳ උපාය මාර්ගික ප්‍රතිපත්තිය නිරීක්ෂණය කරන ලදී. අනුපිළිවෙළින් මාණ්ඩලීය පත්‍රිකා අංක 194/2012 හා 148/2012, සහ මාණ්ඩලීය සටහන් අංක 6 හා 3 මගින් එය අනුමතකර ඇත. |
| | ■ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ හා කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණවත්භාවය හා ඍජුබව, බැංකුව විසින් සමාලෝචනයට භාජනය කරන ලද්දේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | අභ්‍යන්තර පාලන පද්ධතියේ හා කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණවත්භාවය හා ඍජුබව, බැංකුව විසින් සමාලෝචනයට භාජනය කර ඇත. (අදාළ මාණ්ඩලීය පත්‍රිකා නිරීක්ෂණය කරන ලදී. උදා: මාණ්ඩලීය පත්‍රිකා අංක 391/2012) |
| | ■ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි දක්වා ඇති පරිදි,<br>(*i*) ප්‍රතිපත්ති පිළිබඳ ව සැලකිය යුතු ලෙස බලපෑම් සිදුකළ හැකි,<br>(*ii*) ක්‍රියාකාරකම් මෙහෙයවන සහ<br>(*iii*) ව්‍යාපාර කටයුතු, මෙහෙයුම් හා අවදානම් කළමනාකරණය මත පාලනය කරන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනාගෙන පත්වීම් සිදුකර ඇත්තේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 'නාමයෝජනා කමිටු' වාර්තා නිරීක්ෂණය කරන ලදී. සටහන් අංක 7/2012. |
| | ■ බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූලවන පරිදි එහි ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ගේ කාර්යයන් පිළිබඳ ව බැංකුව විසින් විධිමත් ලෙස අධීක්ෂණය කරනු ලැබ ඇත්තේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මූල්‍ය කාර්යසාධන සමාලෝචනය හා අභ්‍යන්තර විගණන කමිටුව මගින් මෙය ආමන්ත්‍රණය කරන ලදී. මාණ්ඩලික පත්‍රිකා හා සටහන් අපි නිරීක්ෂණය කළෙමු. (මාණ්ඩලික පත්‍රිකා අංක 50/2012 හා 1/2012, සහ සටහන් අංක 1 හා 2) |
| | ■ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා, බැංකුව විසින් ඔවුන්ගේ බලාධිපත්‍යය යෙදිය හැකි කරුණු සහ ප්‍රධාන වගකීම් නිගමනය කර තිබේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | අප විසින් නිරීක්ෂණය කරන ලද පරිදි, එක් එක් අධ්‍යක්ෂවරයා සතු වගකීම් ලිඛිත ව දක්නට නැත. එහෙත් අධ්‍යක්ෂවරුන් අනුකමිටුවලට අනුයුක්ත කර තිබේ. එසේ වුව ද, ඔවුන් ගේ ශක්තීන් අනුව ඔවුන් ට තවදුරටත් ප්‍රධාන වගකීම් පවත්නා අතර, එම ප්‍රධාන වගකීම් හා ඔවුන් ගේ බලාධිපත්‍යය පිළිබඳ ව මහජන බැංකු පනතේ 7.1 ඡේදය යටතේ දක්වා ඇත. |
| | ■(i) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරාගැනීම, නාම යෝජනා කිරීම සහ පත්කර ගැනීම,<br>(ii) බැඳියා පිළිගැටුම් කළමනාකරණය, සහ<br>(iii) දුබලතා හඳුනාගැනීම හා අවශ්‍ය වූ විට වෙනස්කම් සිදුකිරීම ඇතුළු ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තමන්ගේ ම පාලන පරිචයන් හි අනුකූලතා ඵලදායකත්වය, මණ්ඩලය විසින් වරින්වර තක්සේරුකරන ලද්දේ දැ යි පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | තෝරාගැනීම, යෝජනාකිරීම සහ පත්කරගැනීම සිදුකරනු ලබනුයේ, මහජන බැංකු පනත අනුව මුදල් ඇමතිවරයා විසිනි. මාණ්ඩලික පත්‍රිකා අංක 49/2012 සහ සටහන් අංක 1 යටතේ, පාලන පරිචයන් තක්සේරුකිරීම පිළිබඳ ව සටහන්කර තිබේ. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හා අදාළ ව අනුප්‍රාප්තික සැලැස්මක් මණ්ඩලය වෙත තිබේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | බොහෝ ප්‍රධාන තනතුරු සඳහා යෝග්‍ය පුද්ගලයින් හඳුනාගෙන ඇති අතර, බැංකුව දැනට අනුප්‍රාප්තික සැලැස්මක් සකස්කිරීමෙහි නිරතව සිටී. මාණ්ඩලික පත්‍රිකා අංක 279/2012 සහ වාර්තා අංක 9. |
| | ■ ප්‍රතිපත්ති සමාලෝචනය, සන්නිවේදන මාර්ග ස්ථාපනය සහ ආයතනික අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය අධීක්ෂණය පිණිස ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග, උපලේඛනයක් අනුව, නිතිපතා රැස්වීම් පවත්වනු ලබන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | එවැනි උපලේඛනයක් පවත්වාගනු ලබන අතර, එයට අනුකූල ව රැස්වීම් පවත්වා ඇති බව අපට පෙනී ගියේය. |
| | ■ නියාමන පරිසරය අවබෝධ කරගැනීමට පියවර හා ක්‍රියාවලීන් බැංකුව විසින් ගෙන ඇති බව හා බැංකුව නියාමකයින් සමග එළඳායී සබඳතාවක් පවත්වා ගන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 'මාණ්ඩලීය විගණන කමිටුව' මේ කරුණ සම්බන්ධයෙන් බැංකුවට සහායවෙයි.<br>උදා: මාණ්ඩලික පත්‍රිකා අංක 66/2012 සහ වාර්තා අංක 2.<br>තවද, මේ සම්බන්ධයෙන් බැංකුව නියෝජනය කරන අනුකූලතා නිලධාරියෙක් වෙනම ම බැංකුව තුළ සිටී. |
| | ■ බාහිර විගණන නිලධාරීන්ගේ සේවය ලබාගැනීමේ දී හා අධීක්ෂණයේ දී බැංකුව සතු ක්‍රියාවලියක් පවත්නා බැව් පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත | 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ දක්වා ඇති අවශ්‍යතාව අනුව මෙම ක්‍රියාවලිය සිදුවෙයි. |
| *3 (1) (ii)* | මණ්ඩලය විසින් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා පත්කරනු ලැබ ඇත්තේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | සභාපතිවරයා පත්කරනු ලැබ ඇත්තේ මුදල් ඇමතිවරයා විසිනි.<br>නාම යෝජනා කමිටුව ඔස්සේ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරිවරයා පත්කරනු ලැබ ඇත. මාණ්ඩලික වාර්තා අංක 05/2011 අනුව වර්තමාන විධායක නිලධාරිවරයා පත්කරන ලදී. |
| | මෙම විධානයන්හි අංක 3 (5) දරන වගන්තියට අනුව, සභාපතිවරයා ගේ සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා ගේ කාර්යභාරයන් හා වගකීම් අනුකූල වන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | කරුණාකර වගන්ති අංක 3 (5) යටතේ නිරීක්ෂණයකර ඇති ප්‍රතිඵලය බලන්න. |
| *3 (1) (iii)* | මණ්ඩලය නිතිපතා රැස්වීම් පැවැත්වූයේ ද, සාමාන්‍ය වශයෙන් මාසික විරාමයන් සහිතව වසරකට දොළොස් වාරයක්වත් මාණ්ඩලික රැස්වීම් පවත්වන ලද්දේ ද යන බව පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මාණ්ඩලික වාර්තා පරීක්ෂා කරන ලද අතර, 2012 වර්ෂය තුළ මණ්ඩලය 18 වාරයක් රැස්ව ඇති බව දක්නට ලැබුණු අතර, 'අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමේ ලේඛනය' ද නිරීක්ෂණය කරන ලදී. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (1) (iv)* | ව්‍යාපාර ප්‍රවර්ධනය හා බැංකුවේ අවදානම් තත්ත්වයන් කළමනාකරණය කරනු පිණිස අදාල වන්නා වූ, කරුණු කාරණා හා යෝජනා මාණ්ඩලික රැස්වීම්වලදී අධ්‍යක්ෂවරුන්ට සාකච්ඡා කළ හැකි වනසේ රැස්වීම් න්‍යාය පත්‍රය තුළ ඒ සඳහා ක්‍රියාපිළිවෙත් සකසා තිබේ දැයි පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | ව්‍යාපාර ප්‍රවර්ධනය හා අදාළ කරුණු කාරණා හා යෝජනා, මාණ්ඩලික පත්‍රිකා මගින් මණ්ඩලයට ඉදිරිපත් කිරීම පිළිබඳ ව මාණ්ඩලික පත්‍රිකා පරීක්ෂා කරන ලදී. |
| *3 (1) (v)* | සෑම අධ්‍යක්ෂවරයෙකුට ම මාණ්ඩලික රැස්වීම්වලට නිතිපතා සහභාගිවීමට හැකි වනසේ, රැස්වීම් පැවැත්වීම පිළිබඳ ව යටත් පිරිසෙයින් දින හතකවත් පූර්ව දැනුම්දීමක් සිදුකරන ලද්දේ දැයි පරීක්ෂා කරන ලදී. සෙසු සෑම මාණ්ඩලික රැස්වීමක් සඳහා ම පූර්ව දැනුම් දීම් සිදුකර තිබේ. | අනුකූලතාව දක්වා ඇත | | | මණ්ඩලයේ ලේකම්වරයා විසින් අත්සන්කරනු ලබන ලිපියක් මගින් මෙය සිදු කරනු ලැබේ. |
| *3 (1) (vi)* | දොළොස්මසකට පූර්ව රැස්වීම් අතරින් යටත් පිරිසෙයින් රැස්වීම් තුනෙන් දෙකකටවත් නො පැමිණි හෝ පිට පිට තුන්වතාවක් රැස්වීම්වලට සහභාගි නොවූ හෝ අධ්‍යක්ෂකවරුන් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගනු ලැබුවේ දැයි පරීක්ෂා කරන ලදී.<br><br>අධ්‍යක්ෂවරුන් ගේ රැස්වීම්වලට විකල්ප අධ්‍යක්ෂවරුන් ගේ මාර්ගයෙන් සහභාගිත්වය ලබාදීම වුව ද සහභාගි වීම වශයෙන් සැලකේ. | අනුකූලතාව දක්වා ඇත | | | අවශ්‍ය පරිදි අධ්‍යක්ෂවරුන් මාණ්ඩලික රැස්වීම්වලට සහභාගිවී ඇත.<br><br>'අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමේ පත්‍රිකා' ද නිරීක්ෂණය කරන ලදී. |
| *3 (1) (vii)* | මණ්ඩලයේ සහ කොටස්හිමියන්ගේ රැස්වීම් හා අදාළ ව ලේකම් පදවියේ කටයුතුකිරීම සහ ව්‍යවස්ථානුකූල වූ මෙන්ම සෙසු රෙකුලාසිවල නිශ්චිත ව අන්තර්ගතවූ ද ක්‍රියාකාරකම් ඉටුකිරීම ප්‍රාථමික වගකීම වශයෙන් උසුලන්නාවූ සමාගම් ලේකම්වරයෙකු, 1988 අංක 30 දරන බැංකු පනතේ 43 වන වගන්තියේ ප්‍රතිපාදනයන් අනුව මණ්ඩලය විසින් පත්කරනු ලැබ ඇත්තේදැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | එසේ පත් කරන ලද තැනැත්තා, වෘත්තියෙන් නීතිඥයෙකු වන රෝහාන් පතිරගේ මහතා ය. |
| *3 (1) (viii)* | සමාගම් ලේකම්වරයාගේ උපදෙස් හා සේවාවන් අධ්‍යක්ෂවරුන්ට ලබාගැනීම සඳහා පවත්නා ප්‍රවේශයන් පිළිබඳ ක්‍රියාවලිය පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | සමාගම් ලේකම්වරයා ගේ උපදෙස් හා සේවාවන් අධ්‍යක්ෂවරුන්ට අසීමිත ව ලබාගැනීම සඳහා ප්‍රවේශයන් පවතියි. |
| *3 (1) (ix)* | සමාගම් ලේකම්වරයා මාණ්ඩලික රැස්වීම්වල වාර්තා පවත්වා ගන්නේ ද යන බව සහ අධ්‍යක්ෂවරුන්ට එම වාර්තා පරීක්ෂා කිරීමට ක්‍රියාපිළිවෙළක් තිබෙන්නේ ද යන බව පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | රැස්වීම් සටහන් පොත නිරීක්ෂණය කරන ලදී. අවශ්‍ය පිරික්සුම් සඳහා එය සමාගම් ලේකම්වරයා වෙත තබා ඇත. |
| *3 (1) (x)* | මාණ්ඩලික රැස්වීමක සටහන්වල පහත සඳහන් කරුණු අන්තර්ගතව තිබේ දැයි යන බව හෝ එම කරුණුවලට යොමුකර තිබේ දැයි යන බව පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මෙම රෙකුලාසිය අනුව අවශ්‍ය කරන තොරතුරු, පවත්වා ගනු ලබන රැස්වීම් වාර්තාවල අන්තර්ගත ය. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ මණ්ඩලයේ සාකච්ඡාවලදී භාවිත කෙරෙන දත්ත හා තොරතුරුවල සාරාංශයක් | | | | |
| | ■ මණ්ඩලය විසින් සලකා බලනු ලබන කරුණු | | | | |
| | ■ මණ්ඩලයේ වගකීම් සැලකිලිමත්ව හා විචක්ෂණශීලීව ඉටුකරනු ලැබේදැයි යන්න පැහැදිළි කෙරෙන, තොරතුරු විමර්ශණ සාකච්ඡා සහ එකඟතා සහිත හෝ එසේ නොමැති කරුණු | | | | |
| | ■ මණ්ඩලයේ උපායමාර්ග හා ප්‍රතිපත්තීන් සමග අනුකූලවන්නාවූ සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුගතවූ කරුණු කාරණා | | | | |
| | ■ බැංකුව විවෘත ව ඇති අවදානම් පිළිබඳ අවබෝධයක් සහ ඒවාට පිළියම් වශයෙන් යෙදිය හැකි අවදානම් කළමනාකරණ පියවර. සහ | | | | |
| | ■ තීරණයන් හා මාණ්ඩලික යෝජනාවන් | | | | |
| *3 (1) (xi)* | යෝග්‍ය පරිදි අවස්ථානුකූලව, සාධාරණ ඉල්ලීමක් මත, ස්වාධීන වෘත්තීයමය උපදෙස්, බැංකුවේ වියදමින් අධ්‍යක්ෂ වරුන්ට ලබාගත හැකි වනසේ, මණ්ඩලය විසින් එකඟතාවට පත් ක්‍රියා පිළිවෙතක් පවත්නේද යනබව පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | අධ්‍යක්ෂවරුන්ට ස්වාධීන වෘත්තීයමය උපදෙස් ලබාගත හැකි වනසේ ක්‍රියා පිළිවෙතක් පවතී. (මාණ්ඩලික පත්‍රිකා අංක 343/2011 නිරීක්ෂණය කරන ලදී.) |
| *3 (1) (xii)* | අධ්‍යක්ෂවරුන් ගේ බැඳියා පිළිගැටුම් හෝ බැඳියා පිළිගැටුම් ලෙස පෙනී යන අවස්ථා වැළැක්වීම හා අදාළව, නිගමන වලට එළැඹීමට, වාර්තාකිරීමට, නිරාකරණයට හා ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට ක්‍රියා පිළිවෙතක් පවතින්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මෙම කරුණ සම්බන්ධයෙන් මණ්ඩලය ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් සහ මහජන බැංකුවේ ආයතන පාලනයෙහි අඩංගු යහපරිචයන් පිළිබඳ ආචාරධර්ම පද්ධතිය අනුගමනය කළේ ය. |
| | අධ්‍යක්ෂවරයෙකු ගේ/වරියක ගේ හෝ එවැනි කෙනෙකු ගේ ඥාතියෙකුගේ හෝ ව්‍යාපාරයක හෝ ප්‍රමාණවත් සම්බන්ධතාවක් පවත්නා කරුණක් හා අදාළ වන්නාවූ මාණ්ඩලික යෝජනාවක දී සිය ඡන්දය භාවිතා කිරීමෙන් වැළකීසිටීමට අධ්‍යක්ෂවරයෙකු/වරියක පියවර ගෙන තිබේදැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මණ්ඩලයේ රැස්වීමක් හා අදාළ ව එවන් කෙනෙකු ගැන සඳහන්වීමක් නැත. |
| | මාණ්ඩලික රැස්වීමක එවැනි අයිතමයක් න්‍යාය පත්‍රයට අඩංගුවූ අවස්ථාවක දී එවන් අධ්‍යක්ෂවරයෙකු/වරියක රැස්වීමට සහභාගි වූයේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මණ්ඩලයේ රැස්වීමක් හා අදාළ ව එවන් කෙනෙකු ගැන සඳහන්වීමක් නැත. |
| *3 (1) (xiii)* | බැංකුවේ ගමන් මග හා පාලනය ස්ථිර වශයෙන් ම එහි බලාධිපත්‍යය යටතේ පවත්නා බැව් හැඳින ගැනීම තීරණය කිරීම සඳහා, කරුණු අඩංගු නිශ්චිත ලෙස වෙන් කරන ලද විධිමත් උප ලේඛනයක් බැංකුව සතුව පවතින්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මණ්ඩලය විසින් පවත්වාගනු ලබන විධිමත් උපලේඛනයක් තිබේ.<br>මාණ්ඩලික වාර්තා පරීක්ෂා කරන ලදී. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (1) (xiv)* | බැංකුවට සිය වගකීම් ඉටුකිරිමට නොහැකි තත්ත්වයකට පත්ව ඇතැයි ද, නැතහොත් එසේ පත්වන බව පෙනෙන්නට ඇතැයි ද, එසේත් නැතහොත් වස්තුභංගත්වයට පත්වන්නට ඉඩ ඇතැයි ද, එසේත් නැතහොත් ස්වකීය තැන්පත්කරුවන්ට හා ණයහිමියන්ට සිදුකළයුතු ගෙවීම් අත්හිටුවන්නට සිදුවනු ඇතැයි ද ආදී වශයෙන් හැඟෙන්නේනම්, තමන් විසින් අන් කවර හෝ නිගමනයකට එළැඹෙන්නට පෙරාතුව, එම තත්ත්වය පිළිබඳ ව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට නොපමාව ම දැනුම් දී තිබේ දැයි පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත | මාණ්ඩලික රැස්වීම් වාර්තා අනුව, එවැනි තත්ත්වයක් උද්ගතවී නොමැති බව අපි නිරික්ෂණය කළෙමු. |
| *3 (1) (xv)* | මුදල් මණ්ඩලය විසින් අවශ්‍ය කරන මට්ටම අනුව බැංකුවට ප්‍රාග්ධනය සපයනු ලැබීම මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත හා අදාළ ව මෙම අනුකූලතාව සිදුව තිබේ. |
| *3 (1) (xvi)* | මෙම විධානයන්හි තුන්වන විධානයට අනුකූලවෙමින්, මණ්ඩලය විසින් වාර්ෂික ආයතනික පාලන වාර්තාවක්, බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත්තේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | ආයතනික පාලන වාර්තාවක් 2011 බැංකු වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත. එම පරිචය ම 2012 වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් ද ඉටුකරනු ඇත. |
| *3 (1) (xvii)* | වාර්ෂික ව, එක් එක් අධ්‍යක්ෂවරයා විසින් ස්වයංතක්සේරුවක් සිදුකිරීමේ හා එවැනි තක්සේරුවල වාර්තා පවත්වාගැනීමේ ද වැඩ පිළිවෙළක් බැංකුව විසින් ක්‍රියාත්මක කරන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 2012 සඳහා අධ්‍යක්ෂවරුන් විසින් සිදු කරන ලද ස්වයංතක්සේරුකිරීම් පිරික්සනු ලැබීය. මාණ්ඩලික පත්‍රිකා අංක 49/2012 සහ වාර්තා අංක 1 යටතේ පරීක්ෂා කරන ලදී. |
| **3 (2)** | **මණ්ඩලයේ සංයුතිය** | | | | |
| *3 (2) (i)* | අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 7 දෙනෙකුට නොඅඩු හා 13 දෙනෙකුට නොවැඩි වන පරිදි සංයුක්ත වන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මණ්ඩලය 9 දෙනෙකුගෙන් සමන්විත වන අතර, සමස්ත කාලය තුළම එම තත්ත්වය එසේ පැවතිණි. මාණ්ඩලික වාර්තා හා 2011 වාර්ෂික වාර්තාව නිරීක්ෂණය කරන ලදී. '(පිටු අංක 20 - 22) |
| *3 (2) (ii)* | (අ) ප්‍රධාන විධායක නිලධාරිවරයා හැර, සෙසු අධ්‍යක්ෂවරයෙකු ගේ සම්පූර්ණ සේවා කාලය වසර 9 කට වැඩි නොවන බවට පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | අධ්‍යක්ෂවරුන් විසින් ස්වකීය අධ්‍යක්ෂ තනතුරේ සේවාකාලය වසර 9 ඉක්මවනු ලැබ නොමැතිබව අපි නිරීක්ෂණය කෙළෙමු. අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං ඇගයීම් ආකෘතිපත් ද අප විසින් නිරීක්ෂණය කරනලදී.<br>(සියලුම අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබ ඇත්තේ 2007 න් පසුව ය.)<br>මාණ්ඩලික පත්‍රිකා අංක 49/2012 |
| | (ආ) යම් අධ්‍යක්ෂවරයෙකු වසර 9 කට වැඩි කාලයක් සේවය කර තිබේ නම්, සංක්‍රාමික ප්‍රතිපාදනයන් භාවිත කර තිබේදැයි පරීක්ෂා කළයුතු වෙයි. | | | අදාළ නැත. | මෙහි ඉහළ අප සඳහන්කර ඇති පරිදි කිසිදු අධ්‍යක්ෂවරයෙකු වසර 9 කට වැඩි කාලයක් සේවය කර නැත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (2) (iii)* | ප්‍රධාන විධායක නිලධාරීවරයා ඇතුළු විධායක නිලධාරීන්ගේ සංඛ්‍යාව, මණ්ඩලයේ සම්පූර්ණ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් නොඉක්මවන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | සියලු අධ්‍යක්ෂවරුන් විධායක නොවන අතර, 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් ඔවුන් පත්කරනු ලැබ ඇත. |
| *3 (2) (iv)* | මණ්ඩලය තුළ යටත් පිරිසෙයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හෝ සම්පූර්ණ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් හෝ යන දෙකෙන් වඩා වැඩි සංඛ්‍යාව සිටින්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | සියලු අධ්‍යක්ෂවරුන් විධායක නොවන අතර, දෙන ලද නියෝජනත්වය අනුව අධ්‍යක්ෂවරුන් ස්වාධීනය. |
| | විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු හෝ අධ්‍යක්ෂවරියක පහත සඳහන් කරුණුවලට අනුකූලවේනම්, ඔහු/ඇය ස්වාධීනලෙස සැලකියහැකිදැයි පරීක්ෂාකරන ලදී. | | | | |
| | ■ සෘජු හෝ වක්‍රලෙස බැංකුවේ 1% ක ට වැඩි ප්‍රමාණයක කොටස්හිමියෙකුවීම | | | අදාළ නැත | 2011 වාර්ෂික වාර්තාව අනුව කිසිදු අධ්‍යක්ෂ වරයෙකුට කොටස් අයිති නැත |
| | ■ අධ්‍යක්ෂවරයෙකු හෝ අධ්‍යක්ෂවරියක වශයෙන් පත්වීම ලබන්නට පෙර දෙවසර තුළ දී දැනට හෝ, මෑතක දී හෝ ඊට්ත් පෙර, මෙහි විධාන අංක 3 (7) යටතේ සඳහන්වන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ක් ඉක්මවූ වටිනාකම සහිත ගනුදෙනුවක බැංකුව සමග නිරතව සිටීම | | | අදාළ නැත | අධ්‍යක්ෂවරුන් පත්කරනලද්දේ මුදල් අමාත්‍යවරයා විසිනි.<br>2011 වාර්ෂික වාර්තාව අනුව කිසිදු අධ්‍යක්ෂවරයෙකු හෝ අධ්‍යක්ෂවරියක එවැනි ගනුදෙනුවකට සම්බන්ධ නැත. |
| | ■ අධ්‍යක්ෂවරයෙකු හෝ අධ්‍යක්ෂවරියක වශයෙන් පත්වීම ලබන්නට පෙර දෙවසර තුළ දී, බැංකුවේ සේවයෙහි නිරතව සිටීම | | | අදාළ නැත | අධ්‍යක්ෂවරුන් පත්කරනලද්දේ මුදල් අමාත්‍යවරයා විසිනි. |
| | ■ අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරීවරයෙකු, ප්‍රධාන කළමනාකරණ තනතුරක සාමාජිකයෙකු, මෙම බැංකුවෙහි හෝ වෙනත් බැංකුවක කොටස්හිමියෙකු වශයෙන් සමීප ඥාතියෙකු කටයුතුකර තිබීම (මෙහිදී වශයෙන් සමීප ඥාතියෙකු යනු කලත්‍රයා හෝ මූල්‍ය යැපීමක් සහිත දරුවෙකි.) | | | අදාළ නැත | 1961 අංක 29 දරන පනතේ 8 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන්නේ මුදල් අමාත්‍යවරයා විසිනි. |
| | ■ බැකුංවේ කිසියම් නිශ්චිත පාර්ශ්වකරුවෙකු නියෝජනය කිරීම | | | අදාළ නැත | අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන්නේ මුදල් අමාත්‍යවරයා විසිනි. |
| | ■ සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක සේවකයකු හෝ අධ්‍යක්ෂවරයෙකුගේ වාස්තවික කොටස් හිමියකු වීම. මෙම විධානයන්හි වගන්ති අංක 3 (7) යටතේ විස්තර කර ඇති පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ක් ඉක්මවන ප්‍රමාණයක ගනුදෙනුවක බැංකුව සමග නිරතවන හෝ - | | | අදාළ නැත | 2011 වාර්ෂික වාර්තාව අනුව එබඳු කිසිදු කරුණක් අනාවරණය කරගෙන නොමැත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ බැංකුවේ සෙසු අධ්‍යක්ෂවරුන් සේවකයින් ලෙස හෝ අධ්‍යක්ෂවරුන් ලෙස හෝ කොටස්හිමියන් ලෙස හෝ කටයුතු කරන, හෝ | | | | 2011 වාර්ෂික වාර්තාව පරීක්ෂා කළ අතර, විධානයෙන් පැහැදිලි කර ඇති පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ක් ඉක්මවන ප්‍රමාණයක ගනුදෙනුවක් සිදුවී නොමැති බව පෙණිනි. |
| | ■ බැංකුවේ සෙසු අධ්‍යක්ෂවරුන්, මෙම විධානයන්හි විධාන අංක 3 (7) යටතේ විස්තර කර ඇති පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ක් ඉක්මවන ප්‍රමාණයක ගනුදෙනුවක නිරත වන | | | | |
| *3 (2) (v)* | ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත්කළ විට, ස්වාධීන අධ්‍යක්ෂවරයාට අදාළ සුදුසුකම් එම විකල්ප අධ්‍යක්ෂවරයාටද තිබෙන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත | අදාළ වසර තුළ විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත්කළ අවස්ථාවක් නොවී ය. |
| *3 (2) (vi)* | ස්වාධීන අධ්‍යක්ෂවරයින් පත්කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් බැංකුව තුළ තිබේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයින් පත්කරනු ලැබ ඇත. |
| *3 (2) (vii)* | මණ්ඩල රැස්වීමක නියමිත ගණපූරණය පත්ව සිටින අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් 50% ක් වුව ද, එම 50% න් 50% ක් විධායක අධ්‍යක්ෂවරුන් නොවන පිරිසක් වූයේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මණ්ඩල රැස්වීමක නියමිත ගණපූරණය පස්දෙනෙකි. එම පස්දෙනාම විධායක අධ්‍යක්ෂවරුන් නොවන ගණයට අයත්වේ. |
| *3 (2) (viii)* | සභාපති, විධායක අධ්‍යක්ෂවරුන්, විධායක නොවන අධ්‍යක්ෂවරුන්, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් ආදී වශයෙන් වර්ග කරනු ලැබ, මණ්ඩලයේ සංයුතිය වාර්ෂික ආයතනික පාලන මගින් අනාවරණය කරනුලැබ ඇත්තේදැයි පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 2011 වාර්ෂික වාර්තාව පරීක්ෂා කරන ලදුව, මණ්ඩලයේ සංයුතිය අනාවරණය කරනු ලැබ ඇතිබව දක්නා ලදී. (පිටු අංක 20-22) |
| *3 (2) (ix)* | මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ පිළිවෙත පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන ජේදය යටතේ අධ්‍යක්ෂවරයින් පත්කරනු ලබනුයේ මුදල් අමාත්‍යවරයා විසිනි. |
| *3 (2) (x)* | හදිසි පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කරනු ලබන අධ්‍යක්ෂවරයෙකුගේ එම පත්වීම, එකී පත්වීමෙන් පසු එළැඹෙන කොටස්හිමියන්ගේ ප්‍රථම මහ සභා රැස්වීමේ දී අනුමත කරන ලද්දේ දැයි පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත | 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන අතර, අදාළ කාලය තුළ එවැනි පත්වීමක් සිදුකර නොමැත. |
| *3 (2) (xi)* | අධ්‍යක්ෂවරයෙකු ඉල්ලා අස්වුයේනම් හෝ ඉවත් කරනු ලැබුයේ වී නම්, පහත සඳහන් පරිදි මණ්ඩලයේ වගකීම් ඉටුකරන ලද්දේ දැයි පරීක්ෂා කරන ලදී. | | | | |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | එහිදී මණ්ඩලය,<br>■ අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත්කරනු ලැබීම, සහ බැංකුව සමග එම අධ්‍යක්ෂවරයා ප්‍රතිවිරෝධතාවක් දැක්වූයේනම් එය හා වෙනත් කරුණු ද ඇතුළුව එසේ ඉල්ලා අස්වීමට හෝ ඉවත්කරනු ලැබීමට හේතු මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කිරීම, සහ | | | අදාළ නැත | අදාළ වසරතුළ අධ්‍යක්ෂවරයෙකු ඉල්ලා අස්වී හෝ ඉවත්කරනුලැබ නොමැත. |
| | ■ කොටස්හිමියන්ගේ අවධානයට යොමුකළයුතු කරුණු කිසිවක් තිබේ ද, නැති ද යන බව තහවුරුකරමින් ප්‍රකාශයක් නිකුත්කිරීම | | | අදාළ නැත | අදාළ වසරතුළ අධ්‍යක්ෂවරයෙකු ඉල්ලා අස්වී හෝ ඉවත්කරනුලැබ නොමැත. |
| *3 (2) (xii)* | බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරනලද්දේ ද, තෝරාගන්නා ලද්දේ ද, නැතහොත් එවැන්නක් සඳහා නාම යෝජනාකර තිබේ දැයි යනබව හඳුනාගැනීම සඳහා විධිපිළිවෙළක් බැංකුව සතුව තිබේ දැයි පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | යහපරිචයන් පිළිබඳ ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති මාර්ගෝපදේශ බැංකුව අනුගමනය කරයි.<br>මහජන බැංකුවේ ආයතනික පාලනයෙහි යහපරිචයන් පිළිබඳ ව පවත්නා ආචාරධර්ම පද්ධතිය අප විසින් නිරීක්ෂණය කරනලදී. |
| **3 (3)** | **අධ්‍යක්ෂවරුන් ගේ යෝග්‍යතාව හා සුදුසුකම් පිළිබඳව තක්සේරුකිරීමේ නිර්නායකයන්** | | | | |
| *3 (3) (i)* | අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සේවයකරන අයගේ වයස අවුරුදු 70 ට නොවැඩි බව පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 2012 වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන් විසින් කරනලද ස්වයං-තක්සේරු අප විසින් පිරික්සනු ලැබිය. අවුරුදු 70 ඉක්මවූ කිසිදු අධ්‍යක්ෂවරයෙකු නොමැතිබව පෙනී ගියේ ය. තවද, 2012 ජූලි 27 දින පවත්වනලද මාණ්ඩලික රැස්වීමේ පත්‍රිකා අංක 11/2012 ඡේද අංක 9.2 අනුව මණ්ඩලය විසින් මේ බව සනාථකර තිබේ. |
| | (අ) සංක්‍රාමික ප්‍රතිපාදනයන්ට අනුකූල ව ක්‍රියාකර තිබේදැයි පරීක්ෂාකරන ලදී. | | | අදාළ නැත | ඉහත ප්‍රතිඵලය පදනම්කරගත්කළ, එවැනි අධ්‍යක්ෂවරයෙකු නොමැත. |
| *3 (3) (ii)* | බැංකුවේ පාලිත හෝ ආශ්‍රිත සමාගම් ඇතුළු සමාගම්, ව්‍යාපාරයන්, ආයතන 20 කට අධික සංඛ්‍යාවක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් තනතුරු දරන්නේ දැයි පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 2012 වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන් විසින් කරනලද ස්වයං තක්සේරු අප විසින් පිරික්සනු ලැබී ය. |
| **3 (4)** | **මණ්ඩලය විසින් පවරන ලද කළමනාකරණ ක්‍රියාකාරකම්** | | | | |
| *3 (4) (i)* | මණ්ඩලය විසින් නියෝජන ක්‍රියාපිළිවෙළ අනුමතකර තිබේදැයි පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 2012 පෙබරවාරි 19 දින හා මා.වි.ණ.ක. අංක 0085/2012 අනුව මණ්ඩලය විසින් නියෝජන ක්‍රියාපිළිවෙළ අනුමතකර තිබේ. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (4) (ii)* | මෙහි අංක 3(1)(ස) යටතේ දැක්වෙන කරුණු නියෝජනය කෙරෙන අවස්ථාවලදී වුව ද, බැංකුව වගකීම ගන්නේදැයි පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මණ්ඩලය විසින් වගකීමෙන් යුක්තව අදාළ කරුණු සාකච්ඡාකර ඇතිබව සටහන් සමාලෝචනය කිරීමේ දී පෙණිනි. |
| *3 (4) (iii)* | ක්‍රියාකාරකම් පැවරීම බැංකුවේ අවශ්‍යතාවන්හිදී අදාළ කරගතහැකිවීම තහවුරුකරගනු පිණිස, පවත්නා එම ක්‍රියාපිළිවෙළ මණ්ඩලය විසින් වරින්වර සමාලෝචනයකට භාජනයකරනු ලබන බව පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මණ්ඩලය විසින් නියෝජන ක්‍රියාපිළිවෙළ සමාලෝචනයකට භාජනය කරනු ලැබ ඇත. |
| **3 (5)** | **සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා** | | | | |
| *3 (5) (i)* | සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ භූමිකාවන් එකිනෙකට වෙනස්බවත් එකම කාර්යය ඔවුන් දෙදෙනාම සිදුනොකරන බවත් පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ භූමිකාවන් එකිනෙකට වෙනස්බවත්, එකම කාර්යය ඔවුන් දෙදෙනාම සිදු නොකරන බවත් පැහැදිළි ය.<br><br>මහජන බැංකුවේ ආයතනික පාලනයෙහි යහපරිචයන් පිළිබඳ ව පවත්නා ආචාරධර්ම පද්ධතිය (2.23 වගන්තිය) අප විසින් නිරීක්ෂණය කරනලද අතර, එය යහපරිචයන් පිළිබඳ ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති මාර්ගෝපදේශ වලට අනුකූල වෙයි. |
| *3 (5) (ii)* | සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | සභාපතිවරයා විධායක අධ්‍යක්ෂවරයෙකු නොවන අතර, මහජන බැංකු පනත යටතේ මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයෙකු ලෙස ඔහු පත්කරනු ලැබ ඇත. |
| | සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන්නේනම්, යෝග්‍ය පරිදි ලිඛිතව මණ්ඩලය විසින් එක් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු සේ නියෝජනත්වය ලබාදී ඇත්තේ දැයි පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත. | |
| | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ නියෝජනත්වය බැංකුවේ වාර්ෂික වාර්තාවෙන් අනාවරණය කර තිබේ දැයි පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත. | |
| *3 (5) (iii)* | සභාපතිවරයා සහ විධායක අධ්‍යක්ෂවරයාද, සෙසු අධ්‍යක්ෂවරුන් ද අතර (මූල්‍ය, ව්‍යාපාරික, පවුල් හෝ වෙනත් කවර හෝ ආකාරයේ) සබඳතාවන් තිබේනම්, එය හඳුනාගෙන, ඒ පිළිබඳ ව වාර්ෂික වාර්තාවේ කොටසක්වන ආයතනික පාලන වාර්තාව මගින් අනාවරණය කිරීමට කිසියම් ක්‍රියාපිළිවෙතක් මණ්ඩලය සතුව තිබේ දැයි පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මේ හා අදාළව සුවිශේෂ ක්‍රියා පිළිවෙතක් මණ්ඩලය සතුව නොමැතිවුව ද, ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති මාර්ගෝපදේශයන් මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබයි. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (5) (iv)* | සභාපතිවරයා ලවා පහත සඳහන් කරුණු ඉටුකරගැනීම පිණිස, මණ්ඩලය සතුව ස්වයං ඇගයීම් පිළිවෙළක් තිබේ දැයි පරීක්ෂාකරන ලදී.<br>■ මණ්ඩලයට නායකත්වය ලබාදීම<br>■ මණ්ඩලය ඵලදායකත්වයෙන් යුතුව කටයුතුකරමින් ස්වකීය වගකීම් ඉටුකරන බව තහවුරුකිරීම, සහ<br>■ ප්‍රධාන මෙන්ම යෝග්‍ය කරුණු-කාරණා කාලීන වැදගත්කමින් යුක්තව මණ්ඩලය විසින් සාකච්ඡා කරනු ලබන බව තහවුරුකිරීම | අනුකූලතාව දක්වා ඇත | | | එසේය, එවැන්නක් තිබේ.<br><br>2012 වසර සඳහා අදාළවන, වාර්ෂික ස්වයං ඇගයීම් පිළිවෙළ, වාර්තා අංක 01/2012 මගින් සහ මාණ්ඩලික පත්‍රිකා අංක 49/2012 මගින් ක්‍රියාත්මක කර ඇත. |
| *3 (5) (v)* | සභාපතිවරයා විසින් අනුමත කරන ලද විධිමත් න්‍යාය පත්‍රයක් සමාගම් ලේකම්වරයා විසින් සංසරණය කෙරේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | සෑම මාණ්ඩලික රැස්වීමක් සඳහා ම ප්‍රධාන කරුණු සහිත ව විධිමත් න්‍යාය පත්‍රයක් තිබේ. අධ්‍යක්ෂවරුන් ට සිය යෝජනා ඊට ඇතුළත් කළහැකි විධික්‍රමයක් මණ්ඩලය විසින් අනුමතකර තිබේ. |
| *3 (5) (vi)* | මාණ්ඩලික රැස්වීම්වල දී උද්ගතවන කරුණු පිළිබඳ ව සභාපතිවරයා විසින් කාලීනව අධ්‍යක්ෂවරුන් නිසිපරිදි දැනුවත්කිරීම සහතික කරනුයේ දැයි පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මාණ්ඩලික පත්‍රිකා සහ මාණ්ඩලික සටහන් පිරික්සන ලදී.<br><br>රැස්වීම්වල දී උද්ගතවන කරුණු පිළිබඳ ව අධ්‍යක්ෂවරුන් නිසිපරිදි දැනුවත්කර තිබේ. |
| *3 (5) (vii)* | මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් සියලු අධ්‍යක්ෂවරුන් විසින් පූර්ණ හා කාර්යශීලී දායකත්වයක් ලබාදීම දිරිගන්වනු පිණිස ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් පවත්නේ ද යනබව හා බැංකුවේ අභිවෘද්ධිය සඳහා සභාපතිවරයා සියලු කාර්යයන්ට නායකත්වය ලබාදෙන්නේ ද යනබව පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | එසේය. 2012 වසර සඳහා අදාළවන, වාර්ෂික ස්වයං ඇගයීම් පිළිවෙළ, වාර්තා අංක 01/2012 මගින් සහ මාණ්ඩලික පත්‍රිකා අංක 49/2012 මගින් ක්‍රියාත්මක කර ඇත. |
| *3 (5) (viii)* | විධායක නොවන අධ්‍යක්ෂවරුන් ගේ දායකත්වය තක්සේරු කිරීම උදෙසා ස්වයං ඇගයීම් පිළිවෙළක් මණ්ඩලය තුළ පවත්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | එසේය. 2012 වසර සඳහා අදාළවන, වාර්ෂික ස්වයං ඇගයීම් පිළිවෙළ, වාර්තා අංක 01/2012 මගින් සහ මාණ්ඩලික පත්‍රිකා අංක 49/2012 මගින් ක්‍රියාත්මක කර ඇත.<br>(එක් එක් අධ්‍යක්ෂවරයා විසින් සම්පූර්ණ කරනලද ස්වයං ඇගයීම් ආකෘති පත්‍රිකා පිරික්සනු ලැබී ය.) |
| *3 (5) (ix)* | ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ගේ කාර්යයන් ඍජුව අධීක්ෂණය හෝ වෙනත් ආකාරයක විධායක ක්‍රියාකාරකම්හි හෝ සභාපතිවරයා නිරත නොවනබව පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ගේ කාර්යයන් ඍජුව අධීක්ෂණය හෝ වෙනත් ආකාරයක විධායක ක්‍රියාකාරකම් හි සභාපතිවරයා නිරත නොවේ. |
| *3 (5) (x)* | කොටස්හිමියන් සමග ඵලදායක ලෙස සන්නිවේදනයෙහි නිරතවීමේ ක්‍රියාවලියක් පවත්නාබව හා ඔවුන්ගේ අදහස් මණ්ඩලයට සන්නිවේදනය වනබවත් පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | අපගේ නිරීක්ෂණ අනුව, කොටස්හිමියන් බැංකුවෙහි නියෝජනය කරන අය (රජයේ නියෝජිත විසාඛා අමරසේකර මෙනෙවිය) සෑම මාණ්ඩලික රැස්වීමකට ම සහභාගිවන්නී ය. මාණ්ඩලික වාර්තා මගින් මෙය නිරීක්ෂණය කරන ලදී. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (5) (xi)* | බැංකුවේ මෙහෙයවුම් හා ව්‍යාපාරික කටයුතු කළමනාකරණයේ දී, දෛනික කාර්යයන්ට වගකියන ඉහළ ම තනතුර දරන අය වශයෙන් ප්‍රධාන විධායක නිලධාරියා ක්‍රියාකරන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මහජන බැංකුවේ ආයතනික පාලනයෙ හි යහපැවැත්ම පිළිබඳ ව පවත්නා ආචාරධර්ම පද්ධතියේ 3 වන වගන්තිය අනුව ප්‍රධාන විධායක නිලධාරියා, බැංකුවේ දෛනික කාර්යයන් පිළිබඳ දෛනික කාර්යයන්ට වගකියන ඉහළ ම තනතුර දරයි. |
| **3 (6)** | **මණ්ඩලය විසින් පත්කරනු ලබන කමිටු** | | | | |
| *3 (6) (i)* | විධානයන් හි, විධාන අංක 3(6)(ii), 3(6))(iii), 3(6))(iv), 3(6)(v) අනුව මණ්ඩලය විසින් යටත් පිරිසෙයින් කමිටු හතරක්වත් ස්ථාපනයකර තිබේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 2011 වසරේ වාර්ෂික වාර්තාව පරීක්ෂා කළ අතර, ඒ අනුව පහත සඳහන්වන පරිදි මාණ්ඩලික අනුකමිටු 6 ක් පත්කරනු ලැබ ඇත:<br>■ මාණ්ඩලීය විගණන කමිටුව<br>■ මාණ්ඩලීය විධායක ණය කමිටුව<br>■ මාණ්ඩලීය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව<br>■ මාණ්ඩලීය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව<br>■ මාණ්ඩලීය නාමයෝජනා කමිටුව<br>■ මාණ්ඩලීය ආයෝජන බැංකුකරණ කමිටුව<br>■ මාණ්ඩලීය තොරතුරු තාක්ෂණ කමිටුව (පිටු අංක 155 - 156) |
| | එක් එක් මාණ්ඩලීය කමිටු වාර්තාව කෙළින් ම මණ්ඩලය ආමන්ත්‍රණය කරන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | එක් එක් මාණ්ඩලීය අනු කමිටු වාර්තාව කෙළින් ම මණ්ඩලය ආමන්ත්‍රණය කරතිබේ.<br>එවැනි අනුකමිටු වාර්තාවන් අප විසින් නිරීක්ෂණය කරන ලදී. |
| | එක් එක් කමිටුවක වගකීම්, භූමිකාවන් හා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තාවන් මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාව ඔස්සේ ඉදිරිපත්කරන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 2011 වසරේ මහජන බැංකුවේ වාර්ෂික වාර්තාවේ පිටු අංක 155 සහ 156 අනුව, මණ්ඩලය විසින් මෙම අවශ්‍යතාව සපුරා ඇත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (6) (ii)* | විගණන කමිටුව<br>■ මෙම කමිටුවෙහි සභාපතිවරයා, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු බවත්, සුදුසුකම් හා අදාළ ක්ෂේත්‍රයීය පළපුරුද්ද ඇති අයෙකු බවත් පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | සභාපතිවරයා, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.<br>විගණන කමිටු සභාපතිවරයා ලෙස ක්‍රියාකරන්නට සුදුසුකම් හා පළපුරුද්ද ඇති අයෙකි.<br>(ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන ඔහුට මූල්‍ය හා කළමනාකරණය පිළිබඳ 24 වසරක පළපුරුද්ද තිබේ.) (2011 වසරේ වාර්ෂික වාර්තාවේ පිටු අංක 20) |
| | ■ කමිටුවෙහි සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | බැංකුවේ සියලුම අධ්‍යක්ෂවරුන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර, 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් එම අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබී ය. |
| | ■ පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන්, කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබුවේ දැයි පරීක්ෂා කරන ලදී. | | | | |
| | ■ අදාළ තත්ත්වයන්ට අනුකූලවන පරිදි විගණන සේවාවන් සඳහා බාහිර විගණන නිලධාරියෙකු පත්කිරීමග | | | අදාළ නැත. | 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 34 වන වගන්තිය යටතේ ඇති ප්‍රතිපාදනයන් අනුව විගණන නිලධාරියා පත්කර ඇත. එම ප්‍රතිපාදනයන් අනුව, විගණකාධිපතිවරයා විගණන නිලධාරියා වන්නේය. |
| | ■ වරින් වර විගණන නිලධාරින් සඳහා නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම | අනුකූලතාව දක්වා ඇත | | | 'නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අනුකූලතා)' යන තනතුර දරන නිලධාරියෙකු බැංකුවෙහි වෙනම ම සිටී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම එම නිලධාරියාගේ වගකීම වෙයි. |
| | ■ අදාළ ගිණුම්කරන ප්‍රමිතීන් ට අනුගතවීම, සහ | අනුකූලතාව දක්වා ඇත | | | ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ මූල්‍ය අංශයේ ප්‍රධානියා මේ සම්බන්ධයෙන් වගකියනු ඇත. |
| | ■ විගණකගේ සේවාකාලය, විගණන ගාස්තු, විගණකගේ ඉල්ලා අස්වීමක් හෝ සේවයෙන් පහකරනු ලැබීමක්; මෙය අදාළවනුයේ විගණක හවුල්කරු සේවයෙහි යොදාගැනීම පස්වසරක් නොඉක්මවීමත්, පෙර සේවාකාලය සම්පූර්ණ වූ දිනසිට තුන්වසරක් ඉක්මවීමට පෙරාතුව විගණන කටයුතු සඳහා යලි බඳවා නොගැනීමත් මත ය. | අනුකූලතාව දක්වා ඇත | | | 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 34 වන වගන්තිය යටතේ ඇති ප්‍රතිපාදනයන් අනුව විගණන නිලධාරියා පත්කර ඇත. එම ප්‍රතිපාදනයන් අනුව, විගණකාධිපතිවරයා විගණන නිලධාරියා වන්නේය. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ ස්වකීය ස්වාධීනත්වය පිළිබඳ කරුණු බාහිර විගණන නිලධාරින්ගෙන් කමිටුව ලබාගත්තේ ද යන බවත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව විගණන කටයුතු සිදුකරන ලද්දේ ද යන බවත් පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත | 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 34 වන වගන්තිය යටතේ ඇති ප්‍රතිපාදනයන් අනුව විගණන නිලධාරියා පත්කර ඇත.<br>මේ හා අදාළ ව, 'ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරියා' හා 'මූල්‍ය කටයුතු පිලීබඳ ප්‍රධානියා' වගකියනු ඇත |
| | ■ අදාළ රෙගුලාසි අනුව, විගණන නොවන සේවාවන් සැපයීම සඳහා බාහිර විගණන නිලධාරියෙකු යොදවා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් කමිටුව විසින් ක්‍රියාත්මක කරන ලද්දේ දැයි පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත | 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 34 වන වගන්තිය යටතේ ඇති ප්‍රතිපාදනයන් අනුව විගණන නිලධාරියා පත්කර ඇත. |
| | ■ විගණන කාර්යය ආරම්භවීමට පෙරාතුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව, බාහිර විගණන නිලධාරියා සමග විගණන කාර්ය යේ ස්වභාවය හා පරිමාණයන් කමිටුව විසින් සාකච්ඡා කළේ ද යන බව පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත | 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 34 වන ඡේදය යටතේ ඇති ප්‍රතිපාදනයන් අනුව විගණන නිලධාරියා පත්කර ඇත. |
| | ■ බැංකුවේ මූල්‍ය ප්‍රකාශණ, වාර්ෂික වාර්තාව, ගිණුම් සහ තොරතුරු හෙළිකිරීම පිණිස සකස්කරනු ලබන ත්‍රෛමාසික වාර්තා ආදියෙ හි පූර්ණත්වය අධීක්ෂණය සඳහා බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය ට ක්‍රියාදාමයක් මෙන්ම, පහත දැක්වෙන කරුණු ප්‍රධාන මූල්‍ය නිලධාරියාගෙන් ලබාගැනීමේ විධිපිළිවෙළක් ද කමිටුව තුළ පවත්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 'මාණ්ඩලීය විගණන කමිටුව' මගින්<br>බැංකුව විසින් මූල්‍ය තොරතුරු සමාලෝචනයට භාජනය කරන ලදී.<br>මූල්‍ය තොරතුරු සමාලෝචනය කෙරෙන පහත සඳහන් 'මාණ්ඩලීය විගණන කමිටු' පත්‍රිකා හා සටහන් අප විසින් පරීක්ෂා කරන ලදී. |
| | ■ ප්‍රධාන තීරණාත්මක කරුණු කාරණා | | | | මාණ්ඩලීය විගණන කමිටු අංක 12/2012 |
| | ■ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හි හා පරිචයන් හි සිදුවූ වෙනස්කම් | | | | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම අංක 03/2012 |
| | ■ ප්‍රවර්වතන කාර්යයන් පිළිබඳ උපකල්පනයන් | | | | මාණ්ඩලීය විගණන කමිටු අංක 46/2012<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම අංක 09/2012 |
| | ■ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ වෙනත් නෛතික අවශ්‍යතාවන් සමග අනුකූලවීම, සහ | | | | |
| | ■ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන්, විගණනය අනුව උද්ගතවන වැදගත් වෙනස්කම් | | | | |
| | ■ විගණනය සම්බන්ධයෙන් විධායක කළමනාකරණය නොමැතිවීමෙන්, කිසියම් කරුණක් හා අදාළ ව කමිටුව විසින් බාහිර විගණකයින් හමුවන ලද්දේ දැයි පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත. | ඉදිරිපත් කරන ලද පැහැදිලි කිරීම අනුව, වසර පුරා එවැනි කරුණක් පැන නොනැගුණු හෙයින්<br>'මාණ්ඩලීය විගණන කමිටුව' බාහිර විගණකයින් හමුවී නැත. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ බාහිර විගණකයින් ගේ කළමනාකරණය ලිපිය සහ ඊට කළමනාකරණය දැක්වූ ප්‍රතිචාරය කමිටුව විසින් සමාලෝචනයට භාජනය කරනු ලැබුවේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | ඉදිරිපත් කරන ලද පැහැදිළි කිරීම අනුව, 2011 වර්ෂය සඳහා කළමනාකරණය ආමන්ත්‍රිත ලිපිය බාහිර විගණකයින් විසින් 2012 දෙසැම්බරයේ දී ඉදිරිපත්කරන ලදී. ඒ අනුව, මෙම කළමනාකරණ ලිපිය පත්‍රිකා අංක මාණ්ඩලීය විගණන කමිටුව 09/2013 යටතේ මණ්ඩලයට ඉදිරිපත් කරනු ඇත. එය 'මාණ්ඩලීය විගණන කමිටුව' විසින් 2013 පෙබරවාරි 15 දින සාකච්ඡා කරනු ලැබේ. |
| | ■ බැංකුවේ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත සඳහන් පියවර කමිටුව විසින් ගනු ලැබේදැයි පරීක්ෂාකරන ලදී. | | | | |
| | ○ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, ක්‍රියාකාරකම් සහ සම්පත් ආදියෙ හි ප්‍රමාණවත් බව සමාලෝචනය කරන අතර, ස්වකීය කාර්යභාරයන් මනාව ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවට අවශ්‍ය අධිකාරී බලය තිබේ දැයි සෑහීමට පත්වීම | අනුකූලතාව දක්වා ඇත | | | පත්‍රිකා මාණ්ඩලීය විගණන කමිටු අංක 57/2012 යටතේ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන මහජන බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සැලසුම අප විසින් නිරීක්ෂණය කරන ලදී.<br>අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, ක්‍රියාකාරකම් සහ සම්පත් ගැන සැලසුමෙහි අන්තර්ගත වෙයි.<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම අංක 10/2012<br>තවද, 'මාණ්ඩලීය විගණන කමිටුව' හා අදාළ නිර්ණෝය විෂයයන් ද අප විසින් පරීක්ෂාකරන ලදී. |
| | ○ අභ්‍යන්තර විගණන වැඩ සටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කරන අතර, අවශ්‍ය තන්හි දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත යෝග්‍ය පියවර ගැනීම සහතික කිරීම. | අනුකූලතාව දක්වා ඇත | | | පත්‍රිකා මාණ්ඩලීය විගණන කමිටු අංක 57/2012 යටතේ මණ්ඩලයට ඉදිරිපත්කරනු ලබන මහජන බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සැලසුම අප විසින් නිරීක්ෂණය කරන ලදී.<br>අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, ක්‍රියාකාරකම් සහ සම්පත් ගැන සැලසුමෙහි අන්තර්ගත වෙයි.<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම අංක 10/2012<br>තවද, අදාළ නිර්ණෝය විෂයයන් ද අප විසින් පරීක්ෂාකරන ලදී. |
| | ○ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරින් ගේ කාර්ය සාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම සමාලෝචනය | අනුකූලතාව දක්වා ඇත | | | ප්‍රධානියාගේ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ කාර්ය සාධන තක්සේරු කිරීම පිළිබඳ මාණ්ඩලික වාර්තා අප විසින් නිරීක්ෂණය කරන ලදී.<br>උදා: මාණ්ඩලීය විගණන කමිටු අංක 06.0483 |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ○ ප්‍රධානියා, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය ට බාහිර සේවා සපයන්නන් පත්කිරීම හෝ සේවය නවතාදැමීම නිර්දේශ කිරීම | | | අදාළ නැත | අදාළ වර්ෂය තුළ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පත්කිරීම හෝ සේවය නවතාදැමීම සඳහා මණ්ඩලයෙන් කිසිදු නිර්දේශ කිරීමක් නොවී ය. |
| | ○ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ප්‍රධානියා සහ බාහිර සේවා සපයන්නන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ගේ ඉල්ලා අස්වීම් පිළිබඳ ව කමිටුව දැනුවත්වීම සහ එසේ ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ට සහ බාහිර සේවා සපයන්නන් ට තමන් ඉල්ලා අස්වීමට හේතු දන්වාසිටීමට අවස්ථාවක් ලබාදීම පරීක්ෂාකරන ලදී. | | | අදාළ නැත | අදාළ වර්ෂයතුළ මණ්ඩලය විසින් එවැනි කිසිදු දන්වා සිටීමක් සිදු නොවී ය. |
| | ○ අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම්, එය විසින් විගණනය කරනුලබන කාර්යයන්ගෙන් ස්වාධීන ව සිදුවෙයි. | අනුකූලතාව දක්වා ඇත | | | 'මාණ්ඩලීය විගණන කමිටුව' හා අදාළ නිර්ණෝය විෂයයන් ට අනුව අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය ස්වාධීන බව සටහන් කෙරිණි. |
| | ■ අභ්‍යන්තර විමර්ශකයින්ගේ ප්‍රධාන සොයාගැනීම් සහ ඒවාට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර කෙරෙහි කමිටුව සලකා බැලුයේ ද යන්න නිගමනය සඳහා සටහන් පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | අභ්‍යන්තර විමර්ශනයන්හි ප්‍රධාන සොයාගැනීම් සහ මාණ්ඩලික විගණන කමිටුවේ අදාළ ලිපි ලේඛන, මණ්ඩලය විසින් සලකාබලන ලද අතර, ඒ පිළිබඳ වාර්තා පහත දැක්වෙන පරිදි ය.<br>මාණ්ඩලීය විගණන කමිටු අංක 05/2012<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම අංක 01/2012<br>මාණ්ඩලීය විගණන කමිටු අංක 29/2012<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම අංක 04/2012<br>මාණ්ඩලීය විගණන කමිටු අංක 58/2012<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම අංක 10/2012 |
| | ■ විධායක අධ්‍යක්ෂවරුන්ගෙන් තොරව කමිටුව බාහිර විගණකයින් සමග යටත් පිරිසෙයින් රැස්වීම් දෙකක්වත් පැවැත්වූයේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 2012 වර්ෂය තුළ පවත්වනලද විගණක කමිටු රැස්වීම් 7 කට විගණකාධිපතිවරයා වෙනුවෙන් විගණන අධිකාරී ජී. එච්. ඩී. ධර්මපාල මහතා සහභාගි විය. |
| | ■ පහත සඳහන්කරුණු සහතික කිරීම සඳහා කමිටුවේ නිර්ණෝය විෂයයන් පරීක්ෂා කරන ලදී:<br>○ එහි නිර්ණෝය විෂයයන් ඇතුළත ඕනෑම කරුණක් විමර්ශනය සඳහා ඒකායන අධිකාරී බලය<br>○ ඒ සඳහා අවශ්‍යවන සම්පත්<br>○ තොරතුරු වලට පූර්ණ ප්‍රවේශය<br>○ අවශ්‍යවන්නේනම්, බාහිර වෘත්තීයමය උපදෙස් ලබාගැනීමට හා අදාළ පළපුරුද්ද සහිත බාහිර පුද්ගලයින් සහභාගි කරගැනීමට බලය | අනුකූලතාව දක්වා ඇත | | | විගණන කමිටුවේ නිර්ණෝය විෂයයන් පරීක්ෂාකරන ලද අතර, මෙකී ප්‍රතිපාදනයන් පවත්නා බැව් සහතික කරන ලදී. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ කමිටුව යටත් පිරිසෙයින් රැස්වීම් 4 ක් වත් පවත්වා සටහන් තබාගත්තේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 'මාණ්ඩලික විගණන කමිටු' වාර්තා, 2012 කාලය තුළ 'මාණ්ඩලික විගණන කමිටුව' 10 වතාවක් රැස්වීම් පවත්වා ඇත. |
| | ■ පහත සඳහන් කරුණු මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවෙන් අනාවරණය කරන ලද්දේ දැයි පරීක්ෂා කරන ලදී. | | | | 'මාණ්ඩලික විගණන කමිටු' ක්‍රියාකාරකම්වල විස්තර 2011 මහජන බැංකු වාර්ෂික වාර්තාවේ 155 වන පිටුවේ අනාවරණයකර තිබේ. |
| | ○ විගණන කමිටුවේ ක්‍රියාකාරකම් වල විස්තර | අනුකූලතාව දක්වා ඇත | | | |
| | ○ වර්ෂය තුළ පවත්වනලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව | අනුකූලතාව දක්වා ඇත | | | |
| | ○ එම රැස්වීම්වලට එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගිත්වය පිළිබඳ විස්තර | අනුකූලතාව දක්වා ඇත | | | 2011 වර්ෂය තුළ පවත්වන ලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව සහ එම රැස්වීම්වලට එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගිත්වය පිළිබඳ විස්තර 2011 මහජන බැංකු වාර්ෂික වාර්තාවේ 121 වන පිටුවේ අනාවරණයකර තිබේ. (2011 වසරේ දී රැස්වීම් 8 ක් පවත්වා තිබේ.) |
| | ■ කමිටුවේ ලේකම් වනාහී සමාගම් ලේකම් හෝ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රධානියා දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 'මාණ්ඩලික විගණන කමිටු' ලේකම් වන රොහාන් පතිරගේ මහතා සමාගම් ලේකම්වරයා ද වෙයි.<br><br>'මාණ්ඩලික විගණන කමිටු' වාර්තා පරීක්ෂා කරන ලදී. |
| | ■ 'අනතුරු හැඟවීමේ' ප්‍රතිපත්තිය අනුව පහත සඳහන් කාර්යයන් ආවරණයවූයේදැයි පරීක්ෂා කරන ලදී. | | | | |
| | ○ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය සහ වෙනත් කරුණු හා අදාළ වැරදි සහිත කටයුතු | අනුකූලතාව දක්වා ඇත | | | මහජන බැංකුවේ 'අනතුරු හැඟවීමේ' ප්‍රතිපත්තිය 'මාණ්ඩලික විගණන කමිටු' අංක 54/2012 යටතේ මණ්ඩලයට ඉදිරිපත්කර ඇතිබව අපි නිරීක්ෂණය කළෙමු.<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම අංක 10/2012 |
| | ○ (i) හා අදාළ ව එවැනි කරුණු කාරණා සම්බන්ධයෙන් සාධාරණ හා ස්වාධීන පරීක්ෂණ පැවැත්වීමට යෝග්‍ය වැඩපිළිවෙළ ස්ථානගතව ඇති බවට කමිටුව විසින් සහතික කරනුලැබීම සහ | අනුකූලතාව දක්වා ඇත | | | සාධාරණ හා ස්වාධීන පරීක්ෂණ පැවැත්වීමට යෝග්‍ය වැඩ පිළිවෙළ ස්ථානගතව ඇතිබවට කමිටුව සහතික කර ඇති අතර ඒ බව 'අනතුරු හැඟවීමේ' ප්‍රතිපත්තිය යටතේ දක්වා ඇත. |
| | ○ නිසි පසුවිපරම් ක්‍රියාවලියක් | අනුකූලතාව දක්වා ඇත | | | තවද, විගණන කමිටුවේ නිර්ණේය විෂයයන් අප නිරීක්ෂණය කළ අතර, මේ සම්බන්ධයෙන් බැංකුව ක්‍රියාකළයුතු ආකාරය එහි විස්තර වෙයි. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (6) (iii)* | මානව සම්පත් හා වේතන කමිටුවට පහත සඳහන් නියමයන් අදාළවන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | | | | |
| | ■ අදාළ නිර්ණේය විෂයයන් හා සටහන් සමාලෝචනය කිරීම මගින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සම්බන්ධයෙන් ඔවුන්ගේ වේතනයන් (වැටුප්, දීමනා, සහ වෙනත් මූල්‍යමය ගෙවීම්) නිගමනය කිරීම සඳහා කමිටුව විසින් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලද්දේ දැයි පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත | අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හා අදාළ ව ඔවුන්ගේ වේතනයන්, මුදල් අමාත්‍යංශයේ චක්‍රලේඛ මගින් තීරණය කරනු ලැබ තිබේ.<br>මානව සම්පත් සහ වේතන කමිටුව හා අදාළ නිර්ණේය විෂයයන් සමාලෝචනයට භාජනය කරන ලදී. |
| | ■ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හා අදාළ ව ඔවුන්ගේ අපේක්ෂාවන් හා ඉලක්කයන් ලේඛනගතකර තිබේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | බැංකුවේ දැක්ම, අපේක්ෂාවන්, ඉලක්කයන් සහ බැංකුවේ දැක්ම සාක්ෂ්‍යාත්කරගැනීම සඳහා මණ්ඩලයේ හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ගේ ප්‍රධාන වගකීම් බැංකුවේ (2011-2016) පස්අවුරුදු සැලැස්මේ සඳහන්වෙයි. |
| | ■ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ගේ කාර්ය සාධනයන්, අපේක්ෂාවන් හා ඉලක්කයන් අනුව වරින්වර ඇගයීම්වලට භාජනය කිරීම හා ඒ අනුව ඔවුන්ගේ වේතන, ප්‍රතිලාභ හා කාර්ය සාධනය පදනම්කරගත් වෙනත් දිරිගැන්වීම් හා ගෙවීම් ප්‍රතිශෝධනය කිරීම ද කෙරෙහි කමිටුව සැලකිලිමත්වීම සම්බන්ධයෙන් ද පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මාණ්ඩලික සටහන් අංක 07/2012 යටතේ, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ගේ ඇගයීම් හා උසස්කිරීම්, මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කරන ලදී.<br>මාණ්ඩලික විගණන කමිටු අංක - 156/2012 |
| | ■ සටහන් සමාලෝචනයට භාජනය කරමින් ප්‍රධාන විධායක නිලධාරියා හා අදාළ කරුණු කාරණා සාකච්ඡාවන අවස්ථාවල දී, එම කමිටු රැස්වීම්වලට සහභාගිනොවීම පිළිබඳව නිර්ණේය විෂයයන් හි සඳහන්වන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මානව සම්පත් හා වේතන කමිටුවේ නිර්ණේය විෂයයන් අනුව ප්‍රධාන විධායක නිලධාරියා හා අදාළ කරුණු-කාරණා සාකච්ඡාවන අවස්ථාවල දී, එම කමිටු රැස්වීම්වලට එම නිලධාරියා සහභාගි නොවන්නේ ය. |
| *3 (6) (iv)* | 'නාම යෝජනා කමිටුව' සම්බන්ධයෙන් පහත සඳහන් නියමයන් අදාළ වන්නේ ද?: | | | | |
| | ■ නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරාගැනීමට/පත්කර ගැනීමට කමිටුව විසින් ක්‍රියාපිළිවෙතක් අනුගමනය කරන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මාණ්ඩලික නාම යෝජනා කමිටුව විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ගේ නම් යෝජනාකරනු ලබන අතර, 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තිය යටතේ ඇති ප්‍රතිපාදනයන් අනුව මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබේ.<br>මහජන බැංකුවේ 2011 ආයතනික පාලනයෙහි යහපරිචයන් පිළිබඳ ව පවත්නා ආචාරධර්ම පද්ධතිය අනුව බැංකුව මෙම අවශ්‍යතාවට අනුකූලව ක්‍රියාකර ඇතැයි සඳහන් වේ. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ ප්‍රවර්තන අධ්‍යක්ෂවරුන්ගේ නැවත පත්කරනු ලැබීම, කමිටුව විසින් සලකා බලා, නිර්දේශ කිරීම (හෝ නිර්දේශ නොකිරීම) පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත. | 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තිය අනුව මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබේ. |
| | ■ තනතුරු අවශ්‍යතා විස්තර සමාලෝචනය අනුව, ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වශයෙන් තෝරාගැනීමේ දී හෝ උසස්වීම් සිදුකිරීමේ දී, ඒ සඳහා සලකා බැලීමේ අවශ්‍යතා වශයෙන්, කමිටුව විසින් සුදුසුකම, පළපුරුද්ද සහ වෙනත් හැකියාවන් වැනි සාධකයන් අඩංගු නිර්නායකයන් යොදාගෙන තිබේ දැයි පරීක්ෂාකරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත්කිරීම සිදුකරනුයේ මාණ්ඩලික නාම යෝජනා කමිටුව යි.<br>මාණ්ඩලික සටහන් අංක 07/2012 යටතේ මණ්ඩලය විසින් ඇගයීම් සිදුකර ප්‍රධාන විධායක නිලධාරි තනතුරුවලට උසස්වීම් ලබා දී ඇත.<br>මාණ්ඩලික විගණන කමිටු අංක 156/2012.<br>මහජන බැංකුවේ 2011 ආයතනික පාලනයෙහි යහපරිචයන් පිළිබඳ ව පවත්නා ආචාරධර්ම පද්ධතිය අනුව බැංකුව මෙම අවශ්‍යතාවට අනුකූලව ක්‍රියාකර ඇතැයි සඳහන් වේ. |
| | ■ විධාන අංක 3 (3) හි සහ ව්‍යවස්ථාවන්හි නිර්නායකයන් ඔස්සේ දක්වා ඇති පරිදි, නිල තනතුරු ඉසිලීම සඳහා තමන් ගැලපෙන හා සුදුසු පුද්ගලයින් බවට, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් අත්සන් සහිතව දෙන ලද ප්‍රකාශයන්, කමිටුව විසින් ලබාගන්නා ලද්දේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මාණ්ඩලික පත්‍රිකා අංක 49/2012 යටතේ අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරි විසින් ඉදිරිපත් කරනලද ස්වයං තක්සේරුව පරීක්ෂා කරන ලදී.<br>මාණ්ඩලික වාර්තා අංක 05/2012 යටතේ වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබ ඇත.<br>මාණ්ඩලික පත්‍රිකා අංක 195/2012 |
| | ■ විශ්‍රාමගන්නා අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙනුවෙන් විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් පිළිබඳ ව කමිටුව සලකා බලන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මාණ්ඩලික පත්‍රිකා අංක 279/2012 යටතේ විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර, මාණ්ඩලික සටහන් අංක 10/2012 යටතේ මණ්ඩලය විසින් එය සමාලෝචනයට භාජනය කරනු ලැබී ය. |
| | ■ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ගේ ප්‍රධානත්වයෙන් හා හැකිතරම් දුරට ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයකින් කමිටුව සමන්විත වන්නේ දැයි පරීක්ෂා කරන ලදී. ප්‍රධාන විධායක නිලධාරියාට ආරාධනයක් අනුව කමිටුවට සහභාගිවිය හැකි ය. | අනුකූලතාව දක්වා ඇත | | | සියලුම අධ්‍යක්ෂවරුන් ස්වාධීන ය. විධායක නොවන අධ්‍යක්ෂවරුන් පත්කරනුයේ මුදල් අමාත්‍යංශය යි. විධායක නිලධාරියා ආරාධනයක් අනුව කමිටුවට සහභාගිවෙයි. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (6) (v)* | මාණ්ඩලික සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුවට (මා.ස.අ.ක.ක.) පහත සඳහන් නියමයන් අදාළවන්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිවු දෙනෙකුගෙන් ද, ප්‍රධාන විධායක නිලධාරියාගෙන් හා ආරාධනයෙන් සහභාගිවන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් ද මෙම මා.ස.අ.ක.ක. සමන්විතවෙයි. 2011 මහජන බැංකු වාර්ෂික වාර්තාවේ 156 වන පිටුවේ ද, මා.ස.අ.ක.ක. කමිටුවේ නිර්ණෝය විෂයයන්හි ද ඒ බව සඳහන් විය.<br><br>වැඩිමනත් සහතිකයක් වශයෙන් මා.ස.අ.ක.ක. සටහන් අංක 01/2012 සහ 03/2011 අප විසින් නිරික්ෂණය කරන ලදී. |
| | ■ යෝග්‍ය අවදානම් දර්ශකයන් සහ කළමනාකරණ තොරතුරු මගින් මාසික පදනමක් මත, බැංකුවට ඉලක්කවන ණය, වෙළෙඳපොළ, ද්‍රවතාව, මෙහෙයවුම් සහ උපායමාර්ගික ආදී සියලුම අවදානම් තක්සේරු කිරීම සඳහා ක්‍රියාපිළිවෙතක් කමිටුවට තිබේ දැයි පරීක්ෂා කරන ලදී.<br><br>පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් බැංකු පදනමින් හා සමූහ පදනමින් අවදානම් කළමනාකරණය සිදු කෙරේ. | අනුකූලතාව දක්වා ඇත | | | මා.ස.අ.ක.ක. විසින් සකස් කරන ලෙද 'ආතති පිරික්සුම් වාර්තාව' මගින්, මෙහි සඳහන් කරන ලද සියලුම අවදානම් වර්ගයන් තක්සේරු කරනු ලැබේ.<br><br>පහත සඳහන් මාණ්ඩලික පත්‍රිකා සහ මාණ්ඩලික සටහන් යටතේ 'ආතති පිරික්සුම් වාර්තාව' මා.ස.අ.ක.ක. හි මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.<br><br>මා.ස.අ.ක.ක. අංක - 10/2012<br>අ.ම.රැ. අංක - 01/2012<br><br>මා.ස.අ.ක.ක. අංක - 19/2012<br>අ.ම.රැ. අංක - 02/2012<br><br>මා.ස.අ.ක.ක. අංක - 28/2012<br>අ.ම.රැ. අංක - 03/2012<br>මා.ස.අ.ක.ක. අංක - 04/2012 |
| | ■ ණය කමිටුව සහ වත්කම් වගකීම් කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටු සම්බන්ධයෙන් නිශ්චිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් මට්ටම් කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබුවේ ද හා වරින් වර යම් අවදානම් දර්ශකයන් වාර්තාකරනු ලැබුවේ ද යන බව පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | පහත සඳහන් මාණ්ඩලික සටහන් යටතේ සියලුම කළමනාකරණ මට්ටමේ කමිටු සම්බන්ධයෙන් නිශ්චිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් මට්ටම් මා.ස.අ.ක.ක. විසින් සමාලෝචනය කරන ලදී:<br><br>වාර්තා අංක - 01/2012<br>වාර්තා අංක - 02/2012<br>වාර්තා අංක - 03/2012 |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ නිශ්චිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් මට්ටම්වලින් ඔබ්බට ගොස් ඇති සියලුම අවදානම් දර්ශකයන් කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබ සලකා බලන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මෙම මා.ස.අ.ක.ක. වාර්තා පරීක්ෂා කරන ලදී.<br><br>වාර්තා අංක - 02/2012<br>වාර්තා අංක - 03/2012<br>මා.ස.අ.ක.ක. අංක - 28/2012<br><br>මාණ්ඩලික සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුවේ (මා.ස.අ.ක.ක.) නිර්ණෝය විෂයයන් පරීක්ෂා කරනු ලැබී ය.<br><br>අවදානම් සමාලෝචන වාර්තාව පරීක්ෂා කරන ලදී. කමිටුව විසින් මෙම වාර්තාව මාසිකව සකස් කරනු ලබන අතර, සාමාන්‍යාධිකාරී වෙත ඉදිරිපත් කෙරේ. තවද, එය කාර්තු පදනමින් මා.ස.අ.ක.ක. වෙත ද යවනු ලැබේ. |
| | ■ යටත් පිරිසෙයින් කාර්තු පදනමින් කමිටුව කී වාරයක් රැස්වී ඇත්තේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | පහත සඳහන් පරිදි, කමිටුව කාර්තු පදනමින් වසරතුළ 4 වාරයක් රැස්ව ඇත.<br>29.03.2012<br>20.06.2012<br>03.09.2012<br>15.12.2012<br><br>(රැස්වීම්වල වාර්තා පරීක්ෂා කරනු ලැබී ය.) |
| | ■ නිශ්චිත අවදානම් හඳුනාගැනීමට අපොහොසත්වීම සම්බන්ධයන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව, සමාලෝචන පවත්වා විධිමත් ලිඛිත විනයානුකූල ක්‍රියා පිළිවෙතක් කමිටුව විසින් අනුගමනය කරනු ලැබුවේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මාණ්ඩලික වාර්තා අංක 03/2012 යටතේ, විධිමත් ලිඛිත විනයානුකූල ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීම සඳහා, මාණ්ඩලික සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමාලෝචන පවත්වා නිර්දේශ කිරීම් සිදු කරන ලදී. |
| | ■ මණ්ඩලයේ අදහස්, අනුමැතිය සහ/හෝ නිශ්චිත විධානයන් අපේක්ෂා කරමින් එක් එක් රැස්වීම පවත්වා සතියක් ඇතුළත කමිටුව විසින් අවදානම් තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කරන ලද්දේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | පහත සඳහන් පරිදි අවදානම් කළමනාකරණ වාර්තා මා.ස.අ.ක.ක. වෙත යවා ඇතः<br><br>මා.ස.අ.ක.ක. අංක - 28/2012<br>මා.ස.අ.ක.ක. අංක - 19/2012 |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ බැංකුවේ සියලුම මෙහෙයවුම් ක්‍රියාකාරකම් හා අදාළ ව, නීතිරීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්තීන් සමග පවත්නා අනුකූලතාව තක්සේරු කිරීම සඳහා කමිටුව විසින් අනුකූලතා ක්‍රියාවලියක් ස්ථාපනයකර ඇත්තේ ද යන බවත්, එකී අනුකූලතා ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පිණිස ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අතරින් පූර්ණකාලීන අනුකූලතා නිලධාරියෙකු පත්කරනු ලැබ, එම නිලධාරියා විසින් කමිටුවට වරින් වර වාර්තා කරනු ලබන්නේ ද යන බවත් පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | අනුකූලතා ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම පිණිස, පූර්ණකාලීන අනුකූලතා නිලධාරියෙකු කටයුතු කරයි. (එස්. සේනානායක මහත්මිය)<br><br>එම අනුකූලතා නිලධාරියා විසින් අනුකූලතා වාර්තාවක් සෑම දෙමාසයකට ම වරක් කමිටුවට ඉදිරිපත්කර තිබේ.<br><br>අනුකූලතා වාර්තාව කමිටුව විසින් සමාලෝචනයට භාජනය කරනු ලැබ ඇති බව පහත දැක්වෙන මාණ්ඩලික පත්‍රිකා සහ මාණ්ඩලික සටහන්වලින් නිරීක්ෂණය කරන ලදී:<br><br>අ.ම.රැ. අංක - 01/2012<br>මා.ස.අ.ක.ක. අංක - 02/2012 |
| **3 (7)** | **සබැඳි පාර්ශ්ව ගනුදෙනු** | | | | |
| *3 (7) (i)* | කිසියම් පුද්ගලයෙකු, විශේෂයෙන් ම මෙම විධානය හා අදාළ ව සබඳතා සහිත පාර්ශ්ව වශයෙන් සැලකෙන, පහතින් වාර්ගීකරණය කරඇති පාර්ශ්වයන් සමග බැංකුව සිදුකරන ගනුදෙනුවකින් උද්ගතවිය හැකි බැඳියා පිළිගැටුම් වළක්වා ගැනීම පිණිස මණ්ඩලය විසින් සංස්ථාපනය කරනු ලැබ, ලේඛනගත කරන ලද ක්‍රියාවලියක් පවත්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මාණ්ඩලික චක්‍රලේඛ අංක 584/2004 අනුව හඳුනාගන්නා ලද හා අනුමත කරන ලද, 'ණය සංග්‍රහය' යනුවෙන් මනාව ස්ථාපනය වූ ක්‍රියාවලියක්, පවත්නා බවත්, ඊට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් බැංකුව අනුගමනය කරන බවත් අප විසින් නිරීක්ෂණය කරනු ලැබීය. |
| | ■ බැංකුවේ කවර හෝ පරිපාලිත සමාගමක් | | | | |
| | ■ බැංකුවේ කවර හෝ ආශ්‍රිත සමාගමක් | | | | |
| | ■ බැංකුවේ කවර හෝ අධ්‍යක්ෂවරයෙකු | | | | |
| | ■ බැංකුවේ කවර හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු | | | | |
| | ■ බැංකුවේ කවර හෝ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරියකුගේ සමීප ඥාතියෙකු | | | | |
| | ■ බැංකුවේ වාස්තවික සබඳතාවක් සහිත කොටස්හිමියෙකු | | | | |
| | ■ බැංකුවේ කවර හෝ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතියෙකුගේ හෝ කවර හෝ කොටස්හිමියෙකුගේ හෝ සබඳතාවක් සහිත ආයතනයක් | | | | |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (7) (ii)* | මෙම විධානයෙන් ආවරණයවන්නා වූ සබඳතා සහිත පාර්ශ්වයන් සමග සිදුකෙරෙන ගනුදෙනු ලෙස හඳුනාගනු ලබන, පහත දැක්වෙන ආකාරයේ ගනුදෙනු, හඳුනාගැනීමට හා ඒ පිළිබඳ ව වාර්තා කිරීමට විධිපිළිවෙතක් පවත්නේ දැයි පරීක්ෂා කරන ලදී. | | | | |
| | ■ උපරිම මට්ටමේ පිළිසරණ පිළිබඳව මුදල් මණ්ඩලයේ විධානයන්හි අර්ථකථනය කර ඇති ආකාරයට, කවර හෝ ආකාරයක පිළිසරණක් ලබාදීම. | අනුකූලතාව දක්වා ඇත | | | ණය සංග්‍රහයේ 5 වන වගන්තිය අනුව, උපරිම පිළිසරණ ප්‍රමාණය රු. 500,000/- කි.<br><br>සාමාන්‍යයෙන් සබඳතා සහිත පාර්ශ්ව ගනුදෙනු හඳුනාගනු ලබන්නේ 'සිල්වර්ලේක් සමෝධානික බැංකු පද්ධතිය' (SIBS) නමැති සාමාන්‍ය භාවිතයක් සහිත දත්ත සමුදායෙනි. මෙකී SIBS විසින් සකස් කරන ලද සබැඳි පාර්ශ්ව ගනුදෙනු වාර්තාව අප විසින් නිරීක්ෂණය කරන ලදී.<br><br>සබැඳි පාර්ශ්ව ගනුදෙනු ක්‍රියාවලිය සිදුකරනු ලබන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර ණය) කේ. බී. රාජපක්ෂ මහතා විසිනි.<br><br>ත්‍රෛමාසික වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුවට යවනු ලැබේ. |
| | ■ තැන්පතු, ණයට ගැනීම් සහ ආයෝජන වශයෙන් කිසියම් වගකීම් බැංකුවෙහි නිර්මාණය කිරීම. | | | | සබඳතා සහිත පාර්ශ්වයන් සමග සිදුකෙරෙන සියලුම ගනුදෙනු මාණ්ඩලික පත්‍රිකා මගින් මණ්ඩලයට වාර්තා කෙරෙන අතර, ණය සංග්‍රහය සමග ද එය අනුකූල වෙයි. |
| | ■ බැංකුවට සපයනු ලබන හෝ බැංකුවෙන් ලබා ගැනෙන මූල්‍ය හෝ මූල්‍ය නොවන ආකාරයේ කවර හෝ සේවාවන් සැපයීම. | | | | |
| | ■ සබඳතා සහිත පාර්ශ්වයන්ට ප්‍රතිලාභ ලැබිය හැකි, එළදායී සම්පත් ලෙස උරුමකරගත හැකිවූ ත්, රහස්‍යවූත්, නැතහොත් වෙනත් ආකාරයකින් සංවේදීවූ ත් තොරතුරු බෙදාහදා ගැනීමට ඉවහල්විය හැකි, වාර්තාකරණ මංපෙත් හා තොරතුරු ප්‍රවාහ මාර්ග, බැංකුව හා සබඳතා සහිත පාර්ශ්වයන් අතර නිර්මාණය හා පවත්වා ගැනීම. | | | | තවද, ශ්‍රී ලංකා මහ බැංකුවට යවනු ලබන වාර්තාව ද අප විසින් නිරීක්ෂණය කරන ලදී. |
| *3 (7) (iii)* | බැංකුව සමග සමාන ව්‍යාපාර කටයුතුවල නිරතවන සෙසු පාරිභෝගිකයින්ට ලැබෙන පහසුකම්වලට වඩා වැඩි පහසුකම් සබඳතා සහිත පාර්ශ්වයන්ට භුක්තිවිඳීමට ඉඩ ලැබෙනසේ, ඉහත 3 (7) (i) දැක්වෙන විධානයන් හි විස්තර කරඇති ආකාරයට එකී පාර්ශ්වයන් සමග ගනුදෙනුවල නිරතවීමේ දී බැංකුව විසින් ක්‍රියා නොකරනු ලැබීම සහතික කෙරෙන විධිපිළිවෙළක් තිබේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | ණය සංග්‍රහය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් බැංකුව අනුගමනය කරයි.<br><br>බැංකුවේ ප්‍රතිපත්තිය අනුව අඩු ගාස්තු ගනුදෙනු ක්‍රමයක් නැත. තවද, ණය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු විසින් මෙය වරින් වර තක්සේරු කරනු ලැබේ. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ● මණ්ඩලය විසින් නිගමනය කරනු ලබන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි විචක්ෂණ ප්‍රතිශතයක් ඉක්මවන 'පූර්ණ ශුද්ධ පිළිසරණ' සබඳතා සහිත පාර්ශ්වයන් ට ලබාදීම.<br><br>මේ සම්බන්ධයෙන්, අනු විධානයන් පහත පළ වේ. | | | | ණය සංග්‍රහය ද අනුගමනය කරමින්, සබඳතා සහිත පාර්ශ්වයන්ට ණය ලබාදීමේ දී, සාමාන්‍ය වතාපිළිවෙත බැංකුව විසින් අනුගමනය කරන ලදී. |
| | ■ 'පිළිසරණ' යනුවෙන් අදහස් කෙරෙනුයේ, පිළිසරණ උපරිම ප්‍රමාණය පිළිබඳ 2007 අංක 07 දරන බැංකු පනතේ විධානයන්හි පිළිසරණ යන්න අර්ථකථනය කර ඇති ආකාරය යි. | | | | ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් පොළී අනුපාතිකයන්හි නිරවද්‍යතාව විමර්ශනය කරනු ලැබේ. ණය ලබාදීමේ දී බැංකුව ණය සංග්‍රහය අනුගමනය කරයි. |
| | ■ 'පූර්ණ ශුද්ධ පිළිසරණ' ගණනය කෙරෙනුයේ, පූර්ණ පිළිසරණෙන්, මුදල් සමායනය සහ බැංකුවේ කොටස් ප්‍රාග්ධනයතුළ එම සබඳතා සහිත පාර්ශ්වයන් විසින් සිදු කරන ලද ආයෝජනයන් හා පස්වසරක හෝ ඊට වැඩි කාලයක කල්පිරීමක් සහිත ණය සාධනපත්‍රවල අගය අඩුකිරීමෙනි. | | | | ණය සංග්‍රහයේ 5 වන වගන්තිය සමග මෙම ප්‍රතිපාදනය අනුගතවන බව අපට පෙනී ගියේ ය. |
| | ■ බැංකුවේ ප්‍රශස්ත ම ණය පොළී අනුපාතිකයට වඩා අඩු පොළී අනුපාතිකයක් අයකිරීම හෝ සබඳතා රහිත වෙනත් පාර්ශ්වයන් සමග, සමාන ලෙස සැසඳිය හැකි ගනුදෙනුවක් සිදුකිරීමේදී ට වඩා බැංකුවේ තැන්පතු අනුපාතිකය ට වැඩිපුර ගෙවීම. | | | | ණය සංග්‍රහයේ 5 වන වගන්තිය අනුව සබඳතා සහිත පාර්ශ්වයන්ට ණය ලබා දීමේ දී ද සාමාන්‍ය පොළී අනුපාතිකයම භාවිත කළ යුතුවේ. |
| | ■ සබඳතා රහිත පාර්ශ්වයන් සමග සාමාන්‍ය පරිදි ව්‍යාපාර කටයුතු, සිදු කිරීමේ දී භාවිතවන නියමයන් ඉක්මවායන, වඩා වාසිදායක කොන්දේසි, වෙළෙඳ පාඩු සහ/හෝ ගාස්තු/කොමිස් ආවරණය වැනි වරණීය සැලකිලි පිරිනැමීම. | | | | විශේෂ අනුපාතිකයක් භාවිත කරන්නේ නම්, ඒ සඳහා මාණ්ඩලික අනුමැතිය ලබාගත යුතුවෙයි. |
| | ■ ඇගයීම් ක්‍රියාපිළිවෙතකින් තොරව, සබඳතා සහිත පාර්ශ්වයක ට සේවාවන් සැපයීම හෝ එවැනි පාර්ශ්වයකින් සේවාවන් ලබා ගැනීම. | | | | ත්‍රෛමාසික වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුවට යවනු ලැබේ. |
| | ■ නීත්‍යානුකූල වගකීම් හා ක්‍රියාකාරකම් ඉටුකිරීම හා බැඳුණු අවශ්‍යතාවන්හි දී හැර, සබඳතා සහිත පාර්ශ්වයන් ට ප්‍රතිලාභ ලැබිය හැකි, එළදායී සම්පත් ලෙස උරුමකරගත හැකි වුත්, රහස්‍ය වුත්, නැතහොත් වෙනත් ආකාරයකින් සංවේදී වුත් තොරතුරු බෙදාහදා ගැනීමට ඉවහල්වියහැකි, වාර්තාකරණ මංපෙත් හා තොරතුරු ප්‍රවාහ මාර්ග, බැංකුව හා සබඳතා සහිත පාර්ශ්වයන් අතර නිර්මාණය හා පවත්වා ගැනීම. | | | | |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (7) (iv)* | බැංකුවේ කිසියම් අධ්‍යක්ෂවරයෙකු ට හෝ ප්‍රධාන කළමනාකාර නිලධාරියෙකු ට පිළිසරණ ලබාදීමේ විධිපිළිවෙළක් බැංකුව තුළ පවතින්නේ ද යන බවත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී, එම කරුණට අදාළ අධ්‍යක්ෂවරයා හැර සෙසු අධ්‍යක්ෂවරුන්ගෙන් තුනෙන් දෙකක ඡන්දය එසේ පිළිසරණ ලබාදිම අනුමත කිරීම සඳහා ලැබීමෙන් පසුව පමණක් ඒ සඳහා අවසරය ලැබීමට නියමිතවන්නේ ද යන බවත්, මෙම පිළිසරණ හා අදාළ එම ඇපයේ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් වරින් වර නිගමනයන් සිදුකරන්නේ ද යන බවත් පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මෙම ක්‍රියා පිළිවෙත සම්බන්ධයෙන් ණය සංග්‍රහයේ 5 වන වගන්තිය අනුව බැංකුව කටයුතු කරයි. |
| *3 (7) (v)* | ■ බැංකුව විසින් කිසියම් පුද්ගලයෙකුට හෝ එම පුද්ගලයා ගේ සමීප ඥාතියෙකු ට හෝ එම පුද්ගලයා ට වැදගත් සම්බන්ධතා පවත්නා ආයතනයක ට හෝ කිසියම් පිළිසරණක් ලබා දෙන ලද්දේ ද, එම පුද්ගලයා පසුව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරන ලද්දේ ද, එම පත්කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ඇපයක් ලබාගැනීමක් වශයෙන්, එසේ පත්කරනු ලැබීමේ දින සිට අවුරුද්දක් ඇතුළත දී මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබාගන්නා ලද්දේද යන කරුණු නිගමනය කිරීමේ වැඩ පිළිවෙළක් බැංකුව සතුව පවතින්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් බැංකුව ණය සංග්‍රහයට අනුගතවන අතර, මහජන බැංකු පනතේ විධානයන් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් ද අනුගමනය කරයි.<br><br>එවැනි අවස්ථාවක් මෙතෙක් නිරීක්ෂණය කර නොමැත. |
| | ■ ඉහත අංක 3 (7) (v) (අ) යටතේ දැක්වෙන විධානයන් අනුව, අදාළ කාලසීමාව තුළ දී ඇපයක් සපයනු ලැබ නොමැත්තේ නම්, එම පිළිසරණ ලබාදෙන අවස්ථාවේ දී නියම කරන ලද කාල පරාසය තුළ දී හෝ අදාළ අධ්‍යක්ෂවරයා පත් කරන ලද දින සිට මාස 18 ක කාලය පිරුණ දින හෝ, යන දින වකවානු දෙකෙන් කලින් හමාරවන කාල පරාසය තුළ දී, එකී පිළිසරණ සම්බන්ධයෙන් ලැබිය යුතු මුදල්, පොළිය ද සමග අයකර ගැනීමට බැංකුව විසින් පියවර ගනුලැබ ඇත්තේ දැයි පරීක්ෂා කරන ලදී. | | | අදාළ නැත | එවැනි අවස්ථාවක් මෙතෙක් නිරීක්ෂණය කර නොමැත.<br><br>ණය සංග්‍රහයේ 5.2 දරන වගන්තිය අනුව බැංකුව කටයුතු කර ඇත. |
| | ■ ඉහත දැක්වෙන අනුවිධානයන් සමග අනුගතවන්නට අපොහොසත් වන්නා වූ කිසියම් අධ්‍යක්ෂවරයෙකු වේනම්, එම අධ්‍යක්ෂවරයා සිය අධ්‍යක්ෂ තනතුර හැරගිය කෙනෙකු වශයෙන් සලකා, එම කරුණ ජනතාව හමුවේ ප්‍රකාශයට පත්කරන්නට ඉඩ සැලසෙන ක්‍රියාපිළිවෙතක් පවත්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් බැංකුව ණය සංග්‍රහයට අනුගතවන අතර, මහජන බැංකු පනතේ විධානයන් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් ද අනුගමනය කරයි. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ පිළිසරණ ලබාදෙන අවස්ථාවේ දී බැංකු සේවයේ නියුතු අධ්‍යක්ෂවරයෙකුට ඉහත 3 (7) (v) (ඇ) යටතේ දැක්වෙන අනු විධාන අදාළ නොවන අතර, පිළිසරණ එසේ ලබාදෙන ලද්දේ සියලු බැංකු සේවකයින් ට පොදු යෝජනාක්‍රමයක් අනුව බව සහතික කෙරෙන දැනට පවත්නා ක්‍රියාවලිය පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් බැංකුව ණය සංග්‍රහය ට අනුගතවන අතර, මහජන බැංකු පනතේ විධානයන් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් ද අනුගමනය කරයි. |
| *3 (7) (vi)* | කිසියම් බැංකු සේවකයෙකුට අදාළ වන යෝජනාක්‍රමයක් පදනම්කර ගනිමින් හෝ ඉහතින් සඳහන් 3 (7) (v) විධානයන් අනුව ලබාදෙන ලද පිළිසරණ සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඇපය අනුව සුරක්ෂිතභාවයේ පැවැත්ම හැරුණුකොට, කවර සේවකයෙකු ට හෝ සේවකයෙකුගේ සමීප ඥාතියෙකුට හෝ සේවකයාගේ හෝ සමීප ඥාතියාගේ දැඩි සබඳතාවක් සහිත ව්‍යාපාරයකට අදාළවන්නා වූ ගාස්තුවක් සහ/හෝ කොමිස් මුදලක් අයකිරීම අතහැර දැමීමක් හා බැඳුණු පිළිසරණ හෝ වැඩි වාසි සහිත සැලකිල්ලක් බැංකුව විසින් පිරිනමනු ලබන අවස්ථාවන්හි දී ඒවා හඳුනාගැනීමේ විධිපිළිවෙළක් පවත්නේ දැයි පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් බැංකුව ණය සංග්‍රහයට අනුගතවන අතර, මහජන බැංකු පනතේ විධානයන් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් ද අනුගමනය කරයි. |
| *3 (7) (vii)* | ඉහත දැක්වෙන 3 (7) (v) සහ 3 (7) (vi) යටතේ ඇති විධානයන් අනුව ලබාදෙන පිළිසරණ සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයෙන් පූර්ව අනුමැතිය ලබාගැනීමටත්, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියෙන් තොරව, එකී පිළිසරණෙන් කොටසක් හෝ ඒ සඳහා ලබාගන්නා පොලියක් හෝ ප්‍රේෂණය කළ නොහැකි අතර, එවැනි අනුමැතියෙන් තොර ප්‍රේෂණය ශූන්‍යභාවයෙන් යුක්ත හා අගයෙන් තොර එකක් බව තීරණයකිරීමටත් හැකිවන ක්‍රියාවලියක් පවත්නා බැව් පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් බැංකුව ණය සංග්‍රහයට අනුගතවන අතර, මහජන බැංකු පනතේ විධානයන් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් ද අනුගමනය කරයි. |
| **3 (8)** | **අනාවරණයන්** | | | | |
| *3 (8) (i)* | **පහත සඳහන් කරුණු මණ්ඩලය විසින් අනාවරණය කර ඇති බව පරීක්ෂා කරන ලදී.** | | | | |
| | ■ අධීක්ෂණ හා නියාමන බලධාරීන් විසින් නියමකරනු ලැබ ඇති හා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වූ ආකෘතීන් අනුව වාර්ෂික විගණික ප්‍රකාශන සකස්කර ප්‍රකාශයට පත් කරන ලද බව සහ එම ප්‍රකාශන සාරාංශ වශයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල පළ කරන ලද බව | අනුකූලතාව දක්වා ඇත | | | 2011 වාර්ෂික වාර්තාව නිරීක්ෂණය කරන ලදී. තවද, එම ප්‍රකාශයන් පුවත්පත් හි පළකර තිබේ. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති අතර, සාරාංශගතකර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල පළකර ඇත. | අනුකූලතාව දක්වා ඇත | | | ප්‍රකාශන සාරාංශ වශයෙන් පුවත්පත්වල ප්‍රසිද්ධකර තිබේ. (මූල්‍ය ප්‍රකාශනවල මූල්‍යමය කරුණු නිරීක්ෂණය කරන ලදී.) |
| *3 (8) (ii)* | **මණ්ඩලය විසින් මෙම අවම අනාවරණයන් වාර්ෂික වාර්තාවෙහි සිදුකර ඇති බව පරීක්ෂා කරන ලදී.** | | | | |
| | ■ නිශ්චිත අනාවරණයන් ඇතුළත් ව, අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් ට සහ නියාමන අවශ්‍යතාවන් ට අනුකූලව වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශනයන් සකස්කර ඇති බවට ප්‍රකාශය. | අනුකූලතාව දක්වා ඇත | | | |
| | ■ මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයත්වය පිළිබඳ සාධාරණ ආරක්ෂණයක් ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම්කර ඇති බව සහ අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන අවශ්‍යතාවන් ට අනුකූලව බාහිර පරමාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති බව තහවුරු කෙරෙන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්තාව. | අනුකූලතාව දක්වා ඇත | | | |
| | ■ මෙහි ඉහතින් 3 (8) (ii) විධානයෙහි සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි ඵලදායකත්වය පිළිබඳ ව බාහිර විගණකගේ වාර්තාව මණ්ඩලය විසින් ලබාගන්නා ලද බව පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා අදාළව මෙම කරුණු පරීක්ෂා කරනු ලැබී ය. |
| | ■ නම, සුදුසුකම්, වයස, නිර්මිත ආවශ්‍යතා සපුරාලන යෝග්‍යතාව හා ගැලපීම ද විස්තරවන පළපුරුද්ද, බැංකුව සමග පවත්නා ගනුදෙනු, බැංකුව විසින් ගෙවන ලද ගාස්තු/වේතනය ද අන්තර්ගත ව අධ්‍යක්ෂවරුන්ගේ විස්තර. | අනුකූලතාව දක්වා ඇත | | | |
| | ■ මෙහි 3 (7) (iii) හි විස්තරකර ඇති පරිදි, සබඳතා සහිත පාර්ශ්වයන්ට එක් එක් වාර්ගීකරණය අනුව ලබා දී ඇති සම්පූර්ණ දළ පිළිසරණ ප්‍රමාණය. සබඳතා සහිත පාර්ශ්ව යන්ට එක් එක් වාර්ගීකරණය අනුව ලබා දී ඇති සම්පූර්ණ දළ පිළිසරණ ප්‍රමාණය බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් වශයෙන් ද අනාවරණය කළ යුතුවෙයි. | අනුකූලතාව දක්වා ඇත | | | |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| | ■ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවන ලද වේතන, පිරිනමන ලද පිළිසරණ සහ බැංකුවේ තැන්පතු හෝ ආයෝජන ආදී වශයෙන් පුථල් වාර්ගීකරණයන් අනුව සකස් කරන ලදුව, බැංකුව විසින් එම නිලධාරීන්ට ගෙවන ලද වේතනයන්හි සමස්ත අගය සහ එම නිලධාරීන් සමග බැංකුව සිදුකළ ගනුදෙනුවල සමස්ත අගය. | අනුකූලතාව දක්වා ඇත | | | |
| | ■ ආයතන පාලන විධානයන් සමග අනුකූලවීම පිළිබඳව බාහිර විගණකගේ වාර්තාව මණ්ඩලය විසින් ලබාගන්නා ලද බවට පරීක්ෂා කරන ලදී. | අනුකූලතාව දක්වා ඇත | | | 2011 වාර්ෂික වාර්තාවෙහි අන්තර්ගත අනුලකූතා වාර්තාව අනුව, නීතිමය රෙකුලාසි හා අවශ්‍යතා ආදිය සමග අනුකූලවීම පිළිබඳ විස්තර දක්වා තිබේ. |
| | ■ විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීතිරීති හා අභ්‍යන්තර පාලනයන් සහ කිසියම් හෝ වාස්තවික අනුකූල නොවීම් නිවැරදි කිරීම සඳහා ගන්නාලද පියවර ද සමග අනුකූලවීම පිළිබඳ විස්තර දැක්වෙන වාර්තාවක්. | අනුකූලතාව දක්වා ඇත | | | |
| | ■ බැංකුවේ අවදානම් කළමනාකරණය හා අදාළ ප්‍රමාද දෝෂයන් කෙරෙහි හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පෙන්වාදෙන ලද විධානයන් සමග අනුකූල නොවීම කෙරෙහි නියාමන හා අධීක්ෂණ අවධානය පිළිබඳ ප්‍රකාශනයක්. එසේ වීනම්, මුදල් මණ්ඩලයේ විධානය අනුව එවැනි අවධානයන් ආමන්ත්‍රණය කිරීම සඳහා ගන්නා ලද පියවර ද සමග ජනතාවට එය අනාවරණය කිරීම. | | | අදාළ නැත | එවන් අනුකූල නොවීමක් ගැන වාර්තාවී නොමැත. |
| **3 (9)** | **සංක්‍රාන්තික හා වෙනත් සාමාන්‍ය ප්‍රතිපාදනයන්** | | | | |
| ***3 (9) (i)*** | මෙම විධානයන්ට අනුගතවීම 2008 ජනවාරි 01 දින සිට ඉදිරියට සිදුවන අතර, මෙම විධානයෙහි සුවිශේෂ වශයෙන් සඳහන්කර ඇති දීර්ඝ කරන ලද අනුකූලතා දින සම්බන්ධයෙන් හැරෙන්නට, සියලුම අවසරලත් වාණිජ බැංකු විසින් 2009 ජනවාරි 01 දිනට හෝ ඊට පෙර මෙම විධානයෙහි විධිවිධානයන් ට අනුකූල විය යුතුය. | අනුකූලතාව දක්වා ඇත | | | මහජන බැංකු පනතේ සඳහන් විධානයන්ට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන්ට බැංකුව අනුකූලව කටයුතු කරයි. |

| වගන්තිය | ඉටුකළ ක්‍රියා පිළිවෙත | අනුකූලතාවය | අනුකූලතාව නොමැත | අදාළ නැත | යොමුව |
|---|---|---|---|---|---|
| *3 (9) (ii)* | ශ්‍රී ලංකාව තුළ සුවිශේෂ ව්‍යවස්ථාවන් අනුව ස්ථාපිත බැංකු සම්බන්ධයෙන්, එම ව්‍යවස්ථාවන්හි දැක්වෙන විධිවිධානයන් ට අනුකූල නොවන මෙම විධානයන්හි පවත්නා සියලු විධිවිධානයන් අනුව කටයුතු කිරීමට පියවර ගන්නා අතර, එම සුවිශේෂ ව්‍යවස්ථාව අනුව ද ක්‍රියා කළයුතු වෙයි. | අනුකූලතාව දක්වා ඇත | | | මහජන බැංකු පනතේ සඳහන් විධානයන්ට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන්ට බැංකුව අනුකූලව කටයුතු කරයි. |
| *3 (9) (iii)* | ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකවන විදේශ බැංකුවල ශාඛාවන්ට ද මෙම විධානයන් අනුකූල වනුයේ, එම බැංකු අයත් දේශය හා අදාළ රෙගුලාසිවලට හා නීතිරීතීන්ට අනුකූල නොවන පරිමාණයන්ට ය. එම දේශීය ශාඛා ද ශ්‍රී ලංකාවේ මෙහෙයුම් හා අදාළ ව වාර්ෂික වාර්තා සහ ගිණුම් ඉදිරිපත් කරන විට ඒ හා සමගම සිය මව්බැංකුවේ වාර්ෂික ආයතනික පාලන වාර්තාවද ප්‍රකාශයට පත් කළ යුතුවෙයි. | අනුකූලතාව දක්වා ඇත | | | මහජන බැංකු පනතේ සඳහන් විධානයන්ට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන්ට බැංකුව අනුකූලව කටයුතු කරයි. |
| *3 (9) (iv)* | යම් හෙයකින් මෙම විධානයෙහි දැක්වෙන විධිවිධාන හා සමග වෙනත් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය (හෝ අභ්‍යන්තර නීතිරීති) ගැටුම් සහිත අවස්ථාවන්හි දී මෙම විධානයන්හි විධිවිධාන පිළිගතයුතු වන්නේය. එසේවුවද, එවැනි කිසියම් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය අනුව මෙම විධානයන්ට දැඩි විෂමතා පවතින්නේ නම්, එම සාංගමික ව්‍යවස්ථාවලිය පරිදි ක්‍රියාකළ හැකි ය. | අනුකූලතාව දක්වා ඇත | | | මහජන බැංකු පනතේ සඳහන් විධානයන්ට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන්ට බැංකුව අනුකූලව කටයුතු කරයි. |
| *3 (9) (v)* | බැංකු පනතේ දක්වා ඇති ආකාරයට යම් පුද්ගලයෙකුගේ රෝගීතත්ත්වයක් හෝ කිසියම් දුබලතාවක් පවතින්නේ නම්, විධාන අංක 3 (2) (ii) ආ සහ 3 (3) (ii) අ තුළ සඳහන් විධිවිධානයන්ගෙන් නිදහස්කිරීම සිදුකළ නොහැකිය යි මුදල් මණ්ඩලය අදහස් කරයි. ඒ බව මුදල් මණ්ඩලය අදාළ පුද්ගලයාට දැන්වූ පසුව ලැබෙන ප්‍රතිචාරය අනුව නිදහස්කිරීමේ කාලය සීමාකිරීම මුදල් මණ්ඩලයට කළ හැකි ය. | | | | |

# මාණ්ඩලීය විගණන කමිටු වාර්තාව

මාණ්ඩලීය විගණන කමිටුවේ ක්‍රියාකාරකම් සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගත් ප්‍රඥප්තිය මත, කමිටුවේ කාර්යයන් පදනම් විය.

පහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රගතිය, ප්‍රමාණවත්භාවය, කාර්යක්ෂමතාව සහ පාලනයන්හි ඵලදායිත්වය සමාලෝචනය පිණිස, 2012 වර්ෂය තුළ මාණ්ඩලීය විගණන කමිටුවේ නිත්‍ය රැස්වීම් 10 ක් පවත්වන ලදී:

- බැංකුව මුහුණපාන විවිධ අවදානම් හඳුනාගැනීමට සහ විගණන පූර්ව අවදානම් තක්සේරුව සහ විගණන සැලසුම හා අදාළ පරිපූර්ණ විගණන ක්‍රමවේදය කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් නිසි අවදානම් කළමනාකරණය සහතික කිරීම සඳහා අවදානම් පාදක අභ්‍යන්තර විගණන ප්‍රවේශය තවදුරටත් ශක්තිමත් කිරීම.
- විගණනය සිදුකෙරුණු කාලය තුළ හඳුනා-ගන්නා ලද ඌනතා කලින් ම නිවැරදි කිරීම සහ විගණන සොයාගැනීම් පිළිබඳව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් නිතිපතා පසු විපරම් සිදුකිරීම සහතික කිරීම.
- බැංකු ශාඛාවන්හි විගණන ශ්‍රේණි / කාර්යසාධනය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අභ්‍යන්තර පාලන පද්ධතිය සහ ව්‍යාපාර අවදානම් කළමනාකරණය පරීක්ෂා කිරීම.
- බාහිර හා අභ්‍යන්තර විගණන ක්‍රියාදාමයන් සමාලෝචනයට භාජනය කිරීම.
- නීතිරීතීන්, රෙගුලාසි, සහ විශේෂයෙන් ම ශ්‍රී ලංකා මහ බැංකුවේ මර්ගෝපදේශ සහ ව්‍යවස්ථාදායී මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සමග අනුගතවීම අධීක්ෂණය කරනු වෙනුවට, දැනට පවත්නා මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය හා විධිපිළිවෙත් සමාලෝචනය කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාදායකත්ව පරීක්ෂණ වාර්තාව, කළමනාකරණ ලිපිය, විගණකාධිපතිගේ වාර්තාව, සහ රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ කමිටු වාර්තාවන් සමාලෝචනය සහ මෙම වාර්තාවන් තුළින් ඉස්මතු කරන ලද කරුණු කාරණා සම්බන්ධයෙන් 2012 වසර තුළදී කළමනාකාරිත්වය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ පියවරවල් පිළිබඳ පසුවිපරම් සිදුකිරීම.
- ප්‍රධාන ගිණුම්කරණ හා පාලනමය කරුණු කාරණා හඳුනාගැනීමට සහ ප්‍රමාණවත් පාලන පරිසරයක් ස්ථාපනය කිරීමේ හා බැංකුවේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සැබෑ හා සාධාරණ අදහසක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම සහතික කිරීමේ මුඛ්‍ය පරමාර්ථය සහිතව, එම කරුණු කාරණා නිරවුල් කරගැනීමට වෙනත් කාර්යයන් හි නිරතවන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග සමාලෝචනයෙහි යෙදීම.
- බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය නිකුත් කිරීමට පෙර, අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම.
- ශාඛා ජාලයන් හි මෙහෙයවීම් අධීක්ෂණය කිරීමට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවට හැකිවනු පිණිස, එම දෙපාර්තමේන්තුව තුළ මෘදුකාංග විගණන මෙවලමක් ක්‍රියාත්මක කිරීම.
- අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් මෙහෙයවනු ලැබුවේ බැංකුව මුහුණදුන් විවිධ අවදානම් හඳුනාගැනීම පිණිස සහ එවැනි අවදානම්වල ප්‍රතිඵල ලිහිල් කිරීම වැළැක්වීම ට මෙන්ම, ශාඛා ජාලය පුරාම යහපරිචයන් දිරිමත් කිරීමට හා ධනාත්මක ප්‍රමිතීන් සහතික කරනු සඳහා ය.
- අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව හා එහි ක්‍රියාකාරකම්වල ඵලදායකත්වය වර්ධනය සඳහා අඛණ්ඩව ප්‍රගතිගාමීවනු පිණිස දරණ ප්‍රබල කැපවීම කමිටුව දුටී. 2012 සඳහා විගණක ක්‍රියාකාරකම් 751 ක් එම දෙපාර්තමේන්තුව සපුරා තිබේ.

විගණනය සඳහා සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කිරීම පිණිස, විගණකාධිපතිවරයාට අවශ්‍ය වූ සියලුම තොරතුරු හා ලිපිලේඛන ලබාදීම, මාණ්ඩලීය විගණන කමිටුව විසින් සහතික කරන ලදී. ප්‍රමාණවත් පාලනයන් හා විධිපිළිවෙත් දැනට ක්‍රියාත්මකව පවත්නා බවත්, සියලු වැදගත් අංශයන්ගෙන් ම මාණ්ඩලික විගණන කමිටුව හා අදාළ ප්‍රඥප්තිය මත කමිටුව ක්‍රියාකර ඇති බවත් මාණ්ඩලික විගණන කමිටුවේ මතය යි.



**ජෙහාන් පී. අමරතුංග**
සභාපති
මාණ්ඩලීය විගණන කමිටුව

2013 ජනවාරි 08

# විගණකාධිපතිගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. FB/G/PB/FA/2012

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2013 මාර්තු 27

## 2012 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මහජන බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, 2012 දෙසැම්බර් 31 දින ට, මහජන බැංකුවේ (බැංකුව) සහ එහි පරිපාලිතයන් ගේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයන්, ආදායම් ප්‍රකාශයන්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන්, හිමිකමේ වෙනස්වීම් දක්වන ප්‍රකාශයන් හා එම වසර අවසානය දක්වා මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්, සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරුවලින් සමන්විත, බැංකුවේ සහ එහි පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය මගේ විධානය යටතේ සිදුකරන ලදී. මෙම විගණනය සිදුකිරීමේ දී ප්‍රසිද්ධ වෘත්තීය වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශ විගණනය, එම පරිපාලිතයන් හා අදාළ සාමාජිකයන් විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තීය වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදී.

### මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණ යේ වගකීම වන අතර, වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළහැකිවනු පිණිස අභ්‍යන්තර පාලනයන් සිදුකිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකිව යුතු වේ.

### විගණකගේ වගකීම

මාගේ විගණන පරීක්ෂණ මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මා විසින් මෙම විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳව සාධාරණව සහතික කළ හැකිවන පරිදි විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු බවට ප්‍රමිතීන්ගෙන් කියැවේ. එකී මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන්ට සහ අනාවරණයන් පිළිබඳ විගණන සාක්ෂි පරීක්ෂා කිරීම විගණනය සිදුකරන ක්‍රියාවලියට ඇතුළත් වේ. වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ගේ අවදානම තක්සේරු කිරීම ඇතුළු විගණක ගේ විනිශ්චය මත, විගණනය සඳහා තෝරාගන්නා ක්‍රියාපිළිවෙත පදනම් වන්නේ ය. මෙම අවදානම් තක්සේරු කිරීමේ දී, බැංකුවේ සූදානම ට හා අවස්ථානුකූල ව විගණන ක්‍රියාපිළිවෙත් සැලසුම් කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සාධාරණ ව ඉදිරිපත් කිරීම ට අභ්‍යන්තර පාලනය අදාළවන බැව් විගණක අදහස් කරයි. එහෙත් එය බැංකුවේ අභ්‍යන්තර පාලනයේ ඵලදායකත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා නොවේ. භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ කළමනාකරණය විසින් සකස් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම, මූල්‍ය ප්‍රකාශනයන් හි සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීමත් විගණනයකට අන්තර්ගත වේ.

ඒ අනුව මා ගේ විගණන මතය සඳහා පදනමක් සපයාගැනීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා යෝග්‍යවන බව මාගේ විශ්වාසයයි.

### මතය - බැංකුව

මාගේ මතය අනුව, 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මූල්‍ය ප්‍රවාහය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දර්ශනයක්, මූල්‍ය ප්‍රකාශන මගින් පෙන්නුම් කරනු ලබයි.

### සීමිත මතය සඳහා පදනම - සමූහය

2010 දෙසැම්බර් මස 31 සහ 2011 දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසාන වූ වර්ෂයන් සඳහා බැංකුව විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කර තිබුණේ, එහි පරිපාලිතයන් ගේ විගණනය නොකරන

ලද මූල්‍ය ප්‍රකාශනයන් පදනම් කරගෙන ය. ඒ නිසා, 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් හි භාවිත කරඇති ආරම්භක ශේෂයන් හි පූර්ණත්ව ය හා නිරවද්‍යතාව සම්බන්ධයෙන් සෑහිම ට පත්වීම ට මට නුපුලුවන.

**සීමිත මතය - සමූහය**

මගේ මතය අනුව, සීමිත මතය සඳහා පදනම - සමූහය යටතේ ඉහත විස්තර කළ බලපෑම හැරුණුවිට, 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව බැංකුවේ සහ එහි පරිපාලිතයන් ගේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මූල්‍ය ප්‍රවාහය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දර්ශනයක්, මූල්‍ය ප්‍රකාශන මගින් පෙන්නුම් කෙරේ.

**අනෙකුත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

1988 අංක 30 දරන බැංකු පනත හා පසුකාලීන සංශෝධනයන් මගින් අවශ්‍ය කෙරෙන තොරතුරු මෙම මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් කර තිබුණි.

2011 වර්ෂය අවසාන වනවිට පූර්ණ නොපිය වූ ණයෙන් 18% ක් හෝ මිලියන 800 ක් හෝ යන දෙකෙන් වැඩි ප්‍රමාණය නොඉක්මවන සේ 2012 වර්ෂය තුළ දී සියලුම අවසරලත් බැංකු විසින් බැංකුවේ ණය වර්ධනය පවත්වාගත යුතු බව ට 2012 මාර්තු 12 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 'අවසරලත් බැංකුවල ණය වර්ධනය පිළිබඳ උපරිමය' යන හිසින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. එසේ වුව ද, එම කාලය තුළ දී බැංකුව මෙම අවශ්‍යතාව ට අනුකූල නොවූ අතර, 18% ක ට වැඩි ප්‍රමාණයේ පිළිසරණ නිකුත් කළේ ය.

**නිදහස් කිරීම්**

1971 අංක 38 දරන මුදල් පනතේ 5(1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එවක මුදල් අමාත්‍යවරයා විසින් 1992 මැයි 14 දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද නියෝගයක් මගින්, බැංකුව එකී මුදල් පනතේ 11 වන කොටසේ විධිවිධානවලින් නිදහස් කර ඇත.

**පාර්ලිමේන්තුව ට වාර්තා කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව, යථාකාලයේ දී සභාගත කෙරෙනු ඇත.

**එච්. ඒ. එස්. සමරවීර**
*විගණකාධිපති*

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

# ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා | සටහන | බැංකුව 2012 රු. '000 | බැංකුව 2011 රු. '000 | බැංකුව වෙනස % | සමූහය 2012 රු. '000 | සමූහය 2011 රු. '000 | සමූහය වෙනස % |
|---|---|---|---|---|---|---|---|
| දළ ආදායම් | 6 | 94,777,398 | 68,298,254 | 38.8 | 109,973,739 | 79,899,674 | 37.6 |
| පොළී ආදායම් | | 85,241,301 | 61,788,438 | 38.0 | 100,844,385 | 73,617,879 | 37.0 |
| පොළී වියදම් | | (51,323,506) | (31,470,220) | 63.1 | (60,211,285) | (37,339,887) | 61.3 |
| **ශුද්ධ පොළී ආදායම්** | 7 | 33,917,795 | 30,318,218 | 11.9 | 40,633,099 | 36,277,991 | 12.0 |
| ගාස්තු හා කොමිස් ආදායම් | | 3,541,589 | 2,929,812 | 20.9 | 4,289,051 | 3,188,365 | 34.5 |
| ගාස්තු හා කොමිස් වියදම් | | (144,364) | (396,912) | (63.6) | (144,364) | (396,912) | (63.6) |
| ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම | 8 | 3,397,225 | 2,532,900 | 34.1 | 4,144,688 | 2,791,453 | 48.5 |
| වෙළෙඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ලාභය | 9 | 2,072,563 | 922,329 | 124.7 | 2,095,881 | 896,741 | 133.7 |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 10 | 3,921,946 | 2,657,675 | 47.6 | 2,744,423 | 2,196,689 | 24.9 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | 43,309,529 | 36,431,122 | 18.9 | 49,618,091 | 42,162,875 | 17.7 |
| ණය හානිය හා වෙනත් අලාභයන් | 11 | (3,874,383) | (410,443) | 844.0 | (4,575,378) | (684,539) | 568.4 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | | 39,435,146 | 36,020,679 | 9.5 | 45,042,713 | 41,478,335 | 8.6 |
| සේවක මණ්ඩල වියදම් | 12 | (13,818,647) | (10,547,583) | 31.0 | (14,932,771) | (11,418,120) | 30.8 |
| වෙනත් වියදම් | 13 | (7,902,154) | (7,439,042) | 6.2 | (9,626,216) | (8,516,509) | 13.0 |
| එකතුකළ අගය මත බද්දට පෙර මෙහෙයුම් ලාභය | | 17,714,345 | 18,034,054 | (1.8) | 20,483,725 | 21,543,707 | (4.9) |
| මූල්‍ය සේවාවන් මත එකතුකළ අගය මත බද්ද | | (2,464,963) | (2,434,052) | 1.3 | (2,745,109) | (2,734,448) | 0.4 |
| එකතුකළ අගය මත බද්දට පසු මෙහෙයුම් ලාභය | | 15,249,382 | 15,600,001 | (2.2) | 17,738,616 | 18,809,259 | (5.7) |
| ආශ්‍රිත සමාගම්වල ලාභ/(අලාභ) කොටස | | – | – | | (67,207) | 33,663 | |
| **බදු වලට පෙර ලාභය** | | 15,249,382 | 15,600,001 | (2.2) | 17,671,409 | 18,842,921 | (6.2) |
| බදු වියදම් | 14 | (4,355,390) | (5,153,628) | (15.5) | (5,774,717) | (6,319,383) | (8.6) |
| **වසර සඳහා ලාභය** | | 10,893,992 | 10,446,373 | 4.3 | 11,896,692 | 12,523,538 | (5.0) |
| ලාභය බෙදී යන ආකාරය - | | | | | | | |
| බැංකුවේ ස්කන්ධ හිමියන් | | 10,893,992 | 10,446,373 | 4.3 | 11,230,199 | 12,117,411 | (7.3) |
| පාලනයට යටත් නොවන හිමිකම් | | – | – | – | 666,494 | 406,127 | 64.1 |
| වසර සඳහා ලාභය | | 10,893,992 | 10,446,373 | 4.3 | 11,896,692 | 12,523,538 | (5.0) |
| **ලාභය මත කොටසක ඉපයීම්** | 15 | | | | | | |
| සාමාන්‍ය කොටසක් වෙනුවෙන් මූලික ඉපයීම් | 15.1 | 10,894 | 10,446 | 4.3 | 11,230 | 12,117 | (7.3) |
| සාමාන්‍ය කොටසක් වෙනුවෙන් තනුක ඉපයීම් | 15.2 | 76 | 73 | 4.3 | 78 | 84 | (7.3) |

පිටු අංක 163 සිට 242 දක්වා දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ කොටස් වශයෙන් සැලකේ.

# විස්තීර්ණ ආදායම ප්‍රකාශය

| *දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා* | බැංකුව 2012 රු. '000 | බැංකුව 2011 රු. '000 | සමූහය 2012 රු. '000 | සමූහය 2011 රු. '000 |
|---|---|---|---|---|
| **වසර සඳහා ලාභය** | 10,893,992 | 10,446,373 | 11,896,692 | 12,523,538 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්, බදු ගෙවූපසු** | | | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ සහ අලාභ | (57,966) | (2,170,391) | (57,748) | (2,169,308) |
| විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් ප්‍රති-මිනුම් මත ලාභ සහ අලාභ | (18,489) | (96,671) | (38,609) | (93,090) |
| **අඩුකළා** | | | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් කොටස් හා අදාළවන බදු වියදම්/(ආදායම්) | – | – | – | – |
| **වර්ෂයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම** | (76,455) | (2,267,062) | (96,357) | (2,262,398) |
| **වර්ෂයට අදාළ සමස්ත විස්තීර්ණ ආදායම** | 10,817,537 | 8,179,311 | 11,800,335 | 10,261,139 |
| **ලාභය බෙදීයන ආකාරය -** | | | | |
| බැංකුවේ ස්කන්ධ හිමියන් | 10,817,537 | 8,179,311 | 11,138,781 | 9,853,846 |
| පාලනයට යටත් නොවන හිමිකම් | – | – | 661,554 | 407,293 |
| | 10,817,537 | 8,179,311 | 11,800,335 | 10,261,139 |

පිටු අංක 163 සිට 242 දක්වා දක්වා ඇති සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශයන් ට අදාළ කොටස් වශයෙන් සැලකේ.

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | බැංකුව | | | | සමූහය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| *දෙසැම්බර් 31 වැනි දිනට* | සටහන | 2012 රු. '000 | 2011 රු. '000 | වෙනස % | 2010 රු. '000 | 2012 රු. '000 | 2011 රු. '000 | වෙනස % | 2010 රු. '000 |
| **වත්කම්** | | | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 17 | 24,401,979 | 16,792,665 | 45.3 | 17,268,510 | 26,102,723 | 18,866,425 | 38.4 | 19,518,151 |
| ශ්‍රීලංකා මහ බැංකුව සමග පවත්නා ශේෂය | 18 | 43,412,048 | 35,717,033 | 21.5 | 26,739,341 | 43,412,048 | 35,717,033 | 21.5 | 26,739,341 |
| බැංකුවල ඇති තැන්පතු | 19 | 13,341,252 | 16,893,327 | (21.0) | – | 13,341,252 | 16,893,327 | (21.0) | – |
| වෙළෙඳාමට රඳවන ලද වෙනත් මූල්‍ය වත්කම් | 20 | 18,772,710 | 23,891,041 | (21.4) | 20,975,857 | 19,002,137 | 23,984,207 | (20.8) | 21,033,924 |
| ණය සහ ලැබිය යුතු දෑ - බැංකු | 21 | 35,350,098 | 31,731,952 | 11.4 | 53,268,853 | 35,350,098 | 31,731,952 | 11.4 | 53,268,853 |
| ණය සහ ලැබිය යුතු දෑ - අනෙකුත් ගනුදෙනුකරුවන් | 22 | 611,414,267 | 461,655,759 | 32.4 | 358,593,640 | 690,197,310 | 534,875,220 | 29.0 | 407,049,791 |
| මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින | 23 | 27,977,489 | 9,464,211 | 195.6 | 561,431 | 27,982,839 | 9,497,534 | 194.6 | 600,341 |
| මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරාසිටින | 24 | 78,522,570 | 46,303,056 | 69.6 | 50,210,126 | 80,151,886 | 47,798,436 | 67.7 | 50,953,273 |
| පරිපාලිතයින් තුළ ආයෝජන | 25 | 1,253,434 | 1,419,950 | (11.7) | 1,519,950 | – | – | – | – |
| ආශ්‍රිතයින් තුළ ආයෝජන | 26 | 273,100 | 273,100 | – | 155,500 | 309,989 | 427,196 | (27.4) | 248,830 |
| කීර්තිනාමය සහ අස්පෘෂ්‍ය වත්කම් | 27 | 44,352 | 100,807 | (56.0) | 196,636 | 405,768 | 460,807 | (11.9) | 559,203 |
| දේපල, පිරියත හා උපකරණ | 28 | 8,234,565 | 7,522,702 | 9.5 | 6,866,152 | 10,923,098 | 9,932,841 | 10.0 | 8,226,965 |
| දේපල ආයෝජන | 29 | 398,508 | 406,165 | (1.9) | 414,403 | 398,508 | 406,165 | (1.9) | 414,403 |
| පෙරගෙවුම් කල්බදු | 30 | 291,866 | 325,224 | (10.3) | 326,517 | 291,866 | 325,224 | (10.3) | 326,517 |
| විලම්බිත බදු වත්කම් | 31 | 501,587 | 186,884 | 168.4 | 62,455 | 501,997 | 195,734 | 156.5 | 76,035 |
| වෙනත් වත්කම් | 32 | 8,916,779 | 9,392,788 | (5.1) | 9,947,673 | 12,488,561 | 13,277,350 | (5.9) | 14,448,992 |
| **මුළු වත්කම්** | | 873,106,604 | 662,076,663 | 31.9 | 547,107,045 | 960,860,079 | 744,389,451 | 29.1 | 603,464,618 |
| **වගකීම්** | | | | | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 33 | 94,124,713 | 43,351,641 | 117.1 | 6,155,237 | 133,987,864 | 81,133,645 | 65.1 | 36,723,268 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ | 34 | 683,950,837 | 550,226,448 | 24.3 | 470,969,729 | 708,896,611 | 572,721,654 | 23.8 | 481,093,664 |
| වෙනත් ණය ගැනීම් | 35 | 41,024,958 | 20,700,940 | 98.2 | 32,992,294 | 40,740,098 | 19,894,126 | 104.8 | 32,992,294 |
| ප්‍රවර්තන බදු වගකීම් | | 1,860,689 | 2,806,539 | (33.7) | 1,527,448 | 1,933,576 | 3,307,218 | (41.5) | 2,244,303 |
| විලම්බිත බදු වගකීම් | 31 | – | – | – | – | 864,461 | 337,537 | 156.1 | 551,991 |
| වෙනත් වගකීම් | 36 | 12,940,620 | 11,902,462 | 8.7 | 11,053,014 | 18,688,304 | 18,261,498 | 2.3 | 18,721,475 |
| ණයකර | 37 | 10,000,000 | 10,000,000 | – | 5,000,000 | 10,000,000 | 10,000,000 | – | 5,000,000 |
| **මුළු වගකීම්** | | 843,901,816 | 638,988,030 | 32.1 | 527,697,722 | 915,110,913 | 705,655,679 | 29.7 | 577,326,995 |
| **හිමිකම්** | | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරුණු ප්‍රාග්ධනය | 38 | 7,201,998 | 7,201,998 | – | 7,201,998 | 7,201,998 | 7,201,998 | – | 7,201,998 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 39 | 2,437,291 | 1,892,591 | 28.8 | 49,998 | 2,437,291 | 1,892,591 | 28.8 | 49,998 |
| වෙනත් සංචිතයන් | 40 | 15,585,914 | 11,174,731 | 39.5 | 7,829,431 | 16,394,908 | 11,507,929 | 42.5 | 7,829,431 |
| රඳවාගත් ඉපයීම් | 41 | 3,979,585 | 2,819,313 | 41.2 | 4,327,895 | 15,135,134 | 13,708,652 | 10.4 | 10,972,971 |
| අයිතිකරුවන්ගේ මුළු හිමිකම් | | 29,204,788 | 23,088,633 | 26.5 | 19,409,322 | 41,169,330 | 34,311,169 | 20.0 | 26,054,398 |
| පාලනයට යටත් නොවන හිමිකම් | 42 | – | – | – | – | 4,579,836 | 4,422,603 | 3.6 | 83,225 |
| **මුළු හිමිකම්** | | 29,204,788 | 23,088,633 | 26.5 | 19,409,322 | 45,749,166 | 38,733,772 | 18.1 | 26,137,623 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 873,106,604 | 662,076,663 | 31.9 | 547,107,045 | 960,860,079 | 744,389,451 | 29.1 | 603,464,618 |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | 43 | 207,021,384 | 190,732,157 | 8.5 | 131,397,539 | 208,570,110 | 191,045,197 | 9.2 | 131,397,539 |

පිටු අංක 163 සිට 242 දක්වා දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන් ට අදාළ කොටස් වශයෙන් සැලකේ.

මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළකර ඉදිරිපත්කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශයන් අනුමත කරනුලැබ, එම මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් තබා ඇත.

**යොහාන් ඒ. සෝසා**
*මුදල් ප්‍රධානී*

**එන්. වසන්ත කුමාර්**
*ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි*

**ගාමිණී එස්. සෙනරත්**
*සභාපති*

2013 මාර්තු 27, කොළඹ

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා | සටහන | බැංකුව 2012 රු. '000 | බැංකුව 2011 රු. '000 | සමූහය 2012 රු. '000 | සමූහය 2011 රු. '000 |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහයන්** | | | | | |
| බදු පෙර ලාභය | | 15,249,382 | 15,600,001 | 17,671,409 | 18,842,921 |
| ගැලපීම් - | | | | | |
| බදු පෙර ලාභවල අඩංගු මුදල් නොවන අයිතමයන් | 44 | 3,431,840 | 1,983,405 | 4,515,991 | 2,442,779 |
| මෙහෙයුම් වත්කම්වල වෙනස්කම් | 45 | (173,144,405) | (79,981,135) | (188,289,730) | (105,811,595) |
| මෙහෙයුම් වගකීම්වල වෙනස්කම් | 46 | 204,656,120 | 101,831,444 | 217,986,736 | 121,421,930 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් ශුද්ධ ලාභ | | – | – | – | – |
| ආශ්‍රිතයින් හා ඒකාබද්ධ ව්‍යාපාරවල ලාභ කොටස් | | – | – | 67,207 | (33,663) |
| පරිපාලිතයින් සහ ආශ්‍රිතයින්ගෙන් ලාභාංශ ආදායම | | (1,622,503) | (833,250) | (1,622,503) | (833,250) |
| උපකාරක ණය මත පොළී වියදම් | | 1,337,500 | 737,500 | 1,337,500 | 737,500 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ගෙවූ දායක මුදල් | | 1,108,383 | 992,261 | 1,108,384 | 992,261 |
| බදු ගෙවීම් | | (5,608,101) | (3,998,966) | (6,919,856) | (5,590,621) |
| **මෙහෙයුම් කටයුතුවලින් ලත් ශුද්ධ මුදල්** | | 45,408,216 | 36,331,260 | 45,855,138 | 32,168,262 |
| **ආයෝජන කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහයන්** | | | | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | | (1,327,807) | (1,600,826) | (2,190,339) | (2,871,908) |
| දේපල, පිරියත සහ උපකරණ විකුණුම් ඉපයුම් | | 23,879 | 37,150 | 383,938 | 42,758 |
| මූල්‍ය ආයෝජන මිලදී ගැනීම් | | (32,245,111) | (35,821,579) | (32,379,047) | (36,573,812) |
| මූල්‍ය ආයෝජන විකුණුමෙන් හා කල්පිරුමෙන් ලත් ඉපයුම් | | – | – | – | – |
| ශුද්ධ අස්පෘෂ්‍ය වත්කම් මිලට ගැනුම් | | – | – | (18,557) | (12,173) |
| පරිපාලිතයින්ගේ සහ ආශ්‍රිතයින්ගේ ආයෝජන පවරා ගැනීමෙන් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | – | – | – | (144,703) |
| පරිපාලිතයින් ඉවත්කිරීමෙන් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය | | 166,516 | 100,000 | – | – |
| ආශ්‍රිතයින් හා ඒකාබද්ධ ව්‍යාපාර ඉවත්කිරීමෙන් ලත් ඉපයුම් | | – | (117,600) | 50,000 | – |
| පරිපාලිතයින් සහ ආශ්‍රිතයින් තුළ ආයෝජනය කිරීමෙන් ලත් ලාභාංශ | | 1,622,503 | 833,250 | 1,622,503 | 833,250 |
| **ආයෝජන කටයුතු (වලට යොදවන ලද)/වලින් ලත් ශුද්ධ මුදල** | | (31,760,020) | (36,569,605) | (32,531,502) | (38,726,588) |
| **මූල්‍යකරණ කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහයන්** | | | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන නිකුතුවෙන් ලත් ශුද්ධ ඉපයුම් | | – | – | – | 6,362,902 |
| සෙසු ස්කන්ධ සාධනපත්‍ර නිකුතුවෙන් ලත් ශුද්ධ ඉපයුම් | | – | – | – | – |
| උපකාරක ණය නිකුතුවෙන් ලත් ශුද්ධ ඉපයුම් | | – | 5,000,000 | – | 5,000,000 |
| උපකාරක ණය ආපසු ගෙවීම් | | – | – | – | – |
| උපකාරක ණය මත ගෙවන ලද පොළිය | | (1,337,500) | (737,500) | (1,337,500) | (737,500) |
| පාලනය-නොමැති පොලිය මත ගෙවන ලද ලාභාංශ | | – | – | (34,027) | 21,750 |
| මව් සමාගමේ කොටස්හිමියන්ට ගෙවන ලද ලාභාංශ | | – | – | – | – |
| සෙසු ස්කන්ධ සාධනපත්‍ර හිමියන්ට ගෙවන ලද ලාභාංශ | | (4,701,382) | (4,500,000) | (4,701,382) | (4,500,000) |
| කොටස් නිකුතුවේ වියදම් | | – | – | (14,429) | (211,190) |
| දේපල වෙනස්කම් ඉවත්කිරීම | | – | – | – | (29,362) |
| **මූල්‍යකරණ කටයුතුවලින් ලත් ශුද්ධ මුදල්** | | (6,038,882) | (237,500) | (6,087,338) | 5,906,600 |
| **මුදල් හා මුදල් සමානයන්හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | 7,609,314 | (475,845) | 7,236,296 | (651,726) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමානයන් | | 16,792,665 | 17,268,510 | 18,866,425 | 19,518,151 |
| මුදල් සහ මුදල් සමානයන් හා අදාළ විනිමය වෙනස | | – | – | – | – |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානයන් | 17 | 24,401,979 | 16,792,665 | 26,102,723 | 18,866,425 |

පිටු අංක 163 සිට 242 දක්වා දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන් ට අදාළ කොටස් වශයෙන් සැලකේ.

# හිමිකමේ වෙනස්වීම දක්වන ප්‍රකාශය

| *දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා* | ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පැවරූ ප්‍රාග්ධනය | | සංචිතයන් | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | සාමාන්‍ය කොටස් රු. '000 | පැවරූ ප්‍රාග්ධනය රු. '000 | සංචිත අරමුදල් රු. '000 | ප්‍රත්‍යාගණන සංචිතය රු. '000 | සෙසු සංචිත රු. '000 | ආයෝජන අරමුදල රු. '000 | රඳවාගත් ඉපයුම් රු. '000 | රු. '000 |
| බැංකුව | | | | | | | | |
| **2010.12.31 දිනට ශේෂය** | 49,998 | 7,152,000 | 49,998 | 5,630,460 | 2,198,971 | – | 5,175,883 | 20,257,310 |
| ආරම්භක රඳවාගත් ඉපයුම්වලට තැන්පතුවල සඵල පොළී අනුපාතිකය ගැලපීම | – | – | – | – | – | – | 581,573 | 581,573 |
| විකිණීම සඳහා පවතින ආයෝජන හා අදාළ සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | 116,925 | 116,925 |
| ශේෂපත්‍ර බාහිර අයිතමයන් පිළිබඳ හානිකරණ අයකිරීම් | – | – | – | – | – | – | (212,595) | (212,595) |
| ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් | – | – | – | – | – | – | (1,333,891) | (1,333,891) |
| **2011.01.01 දිනට ශේෂය** | 49,998 | 7,152,000 | 49,998 | 5,630,460 | 2,198,971 | – | 4,327,895 | 19,409,322 |
| වර්ෂය සඳහා ලාභය | – | – | – | – | – | – | 10,446,373 | 10,446,373 |
| විකිණීම සඳහා පවතින ආයෝජන හා අදාළ සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | (96,671) | (96,671) |
| ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් | – | – | – | – | – | – | (2,170,391) | (2,170,391) |
| කාලය ඇතුළත සංචිතයට මාරු කිරීම් | – | – | 1,842,593 | – | 1,447,598 | 1,897,702 | (5,187,893) | – |
| මහා භාණ්ඩාගාරයට ගෙවියයුතු විශේෂ ගෙවීම | – | – | – | – | – | – | (4,500,000) | (4,500,000) |
| **2011.12.31 දිනට ශේෂය** | 49,998 | 7,152,000 | 1,892,591 | 5,630,460 | 3,646,569 | 1,897,702 | 2,819,313 | 23,088,633 |
| වර්ෂය සඳහා ලාභය | – | – | – | – | – | – | 10,893,992 | 10,893,992 |
| විකිණීම සඳහා පවතින ආයෝජන හා අදාළ සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | (18,489) | (18,489) |
| ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් | – | – | – | – | – | – | (57,966) | (57,966) |
| දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය මත වාසි / (අවාසි) | – | – | – | – | – | – | – | – |
| කාලය ඇතුළත සංචිතයට මාරුකිරීම් | – | – | 544,700 | (166,964) | 1,432,304 | 3,145,843 | (4,955,882) | – |
| ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ | – | – | – | – | – | – | (201,382) | (201,382) |
| මහා භාණ්ඩාගාරයට ගෙවියයුතු විශේෂ ගෙවීම | – | – | – | – | – | – | (4,500,000) | (4,500,000) |
| 2012. 12. 31 දිනට ශේෂය | 49,998 | 7,152,000 | 2,437,291 | 5,463,496 | 5,078,873 | 5,043,545 | 3,979,585 | 29,204,788 |

| *දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා* | ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පැවරූ ප්‍රාග්ධනය | | සංචිතයන් | | | | | එකතුව | පාලනයට යටත් නොවන හිමිකම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සාමාන්‍ය කොටස් රු. '000 | පැවරූ ප්‍රාග්ධනය රු. '000 | සංචිත අරමුදල් රු. '000 | ප්‍රත්‍යාගණන සංචිතය රු. '000 | සෙසු සංචිත රු. '000 | ආයෝජන අරමුදල රු. '000 | රඳවාගත් ඉපැයුම් රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **සමූහය** | | | | | | | | | | |
| **2010.12.31 දිනට ශේෂය** | 49,998 | 7,152,000 | 49,998 | 5,630,460 | 2,198,971 | – | 11,820,958 | 26,902,385 | 83,225 | 26,985,610 |
| ආරම්භක රඳවා ගත් ඉපයීම්වලට තැන්පතු සඵල පොළී අනුපාතිකය ගැලපීම | – | – | – | – | – | – | 581,573 | 581,573 | – | 581,573 |
| විකිණීම සඳහා පවතින ආයෝජන හා අදාළ සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | 116,925 | 116,925 | – | 116,925 |
| බාහිර ශේෂපත්‍ර අයිතමයන් පිළිබඳ හානිකරණ අයකිරීම් | – | – | – | – | – | – | (212,595) | (212,595) | – | (212,595) |
| ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් | – | – | – | – | – | – | (1,333,891) | (1,333,891) | – | (1,333,891) |
| **2011.01.01 දිනට ශේෂය** | 49,998 | 7,152,000 | 49,998 | 5,630,460 | 2,198,971 | – | 10,972,971 | 26,054,398 | 83,225 | 26,137,623 |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | – | – | – | – | – | – | 12,117,411 | 12,117,411 | 406,127 | 12,523,538 |
| විකිණීම සඳහා පවතින ආයෝජන හා අදාළ සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | (93,985) | (93,985) | 895 | (93,090) |
| ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් | – | – | – | – | – | – | (2,169,579) | (2,169,579) | 271 | (2,169,308) |
| කාලය ඇතුළත සංචිතයට මාරුකිරීම් | – | – | 1,842,593 | – | 1,447,598 | 2,230,900 | (5,521,091) | – | – | – |
| ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ | – | – | – | – | – | – | (3,580) | (3,580) | – | (3,580) |
| මහා භාණ්ඩාගාරයට ගෙවියයුතු විශේෂ ගෙවීම | – | – | – | – | – | – | (4,500,000) | (4,500,000) | – | (4,500,000) |
| අපේක්ෂිත ලාභ බෙදීම | – | – | – | – | – | – | 3,150,026 | 3,150,026 | – | 3,150,026 |
| කොටස් නිකුතු වියදම් | – | – | – | – | – | – | (211,190) | (211,190) | – | (211,190) |
| කීර්තිනාමය වෙනුවෙන් ගැලපීම් | – | – | – | – | – | – | (2,969) | (2,969) | – | (2,969) |
| දේපල වෙනස්කම් ඉවත්කිරීම | – | – | – | – | – | – | (29,362) | (29,362) | – | (29,362) |
| වර්ෂයතුළ අත්පත්කරගැනීම් | – | – | – | – | – | – | – | – | 3,932,085 | 3,932,085 |
| **2011.12.31 දිනට ශේෂය** | 49,998 | 7,152,000 | 1,892,591 | 5,630,460 | 3,646,569 | 2,230,900 | 13,708,652 | 34,311,169 | 4,422,603 | 38,733,772 |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | – | – | – | – | – | – | 11,230,199 | 11,230,199 | 666,494 | 11,896,692 |
| විකිණීම සඳහා පවතින ආයෝජන හා අදාළ සාධාරණ අගයෙහි වෙනස | – | – | – | – | – | – | (57,802) | (57,802) | 54 | (57,748) |
| ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම් | – | – | – | – | – | – | (33,616) | (33,616) | (4,994) | (38,609) |
| කාලය ඇතුළත සංචිතයට මාරුකිරීම් | – | – | 544,700 | (166,964) | 1,432,304 | 3,621,639 | (5,431,679) | – | – | – |
| ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ | – | – | – | – | – | – | (201,382) | (201,382) | – | (201,382) |
| මහා භාණ්ඩාගාරයට ගෙවියයුතු විශේෂ ගෙවීම | – | – | – | – | – | – | (4,500,000) | (4,500,000) | – | (4,500,000) |
| අපේක්ෂිත ලාභ බෙදීම පිළිබඳ සංචලනය | – | – | – | – | – | – | 435,191 | 435,191 | – | 435,191 |
| කොටස් නිකුතු වියදම් | – | – | – | – | – | – | (14,429) | (14,429) | (504,322) | (518,751) |
| 2012.12.31 දිනට ශේෂය | 49,998 | 7,152,000 | 2,437,291 | 5,463,496 | 5,078,873 | 5,852,539 | 15,135,134 | 41,169,330 | 4,579,835 | 45,749,166 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## 1. පසුබිම් වාර්තාකරණය

### 1.1 ආයතනික තොරතුරු

1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ, රජයට අයත් බැංකුවක් වශයෙන්, 1961 ජුලි මස 01 දින මහජන බැංකුව (බැංකුව) පිහිටුවන ලදී. එහි මූලස්ථානය ශ්‍රී ලංකාවේ පිහිටා ඇත. 2012 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය තුළ, බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල තොරතුරු අන්තර්ගතවෙයි. එම පරිපාලිත සමාගම් වනාහී, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හා පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම, සහ උප පරිපාලිත සමාගම් වන සීමාසහිත පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම, සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම, සීමාසහිත පීපල්ස් ලීසිං ඉන්ෂුවරන්ස් සමාගම, පීපල්ස් ලීසිං ෆයිනෑන්ස් පීඑල්සී, සීමාසහිත පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් සමාගම, සීමාසහිත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම සහ ආශ්‍රිත සමාගම වන පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම යි.

2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන නිකුත්කිරීම සඳහා, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, 2012 මාර්තු මස 27 දින දෙනු ලැබී ය.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

**බැංකුව**

බැංකුවේ ව්‍යාපාරික කටයුතු අතරට තැන්පතු භාරගැනීම, ණය පහසුකම් ලබාදීම, පුද්ගලික බැංකු කටයුතු, සංවර්ධන බැංකු කටයුතු, උකස් ගැනීම, ජාත්‍යන්තර වෙළඳාම, රජයේ සුරැකුම්පත් හා අදාළ ගනුදෙනු, ක්‍රෙඩිට් කාඩ් මෙහෙයවුම්, විදේශ මුදල් ගනුදෙනු හා සම්බන්ධ බැංකු කටයුතු ආදිය ඇතුළත් වේ.

**පරිපාලිත සමාගම්**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමට අදාළ ප්‍රධානම ක්‍රියාකාරකම් වනුයේ කල්බදු පහසුකම් ලබාදීම, වාරික කුළී විකුණුම් වත්කම් කටයුතු, ඉස්ලාමීය මූල්‍ය සේවා මූල්‍යකරණය සහ තැන්පතු භාරගැනීමයි. සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් සමාගමට අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ සංචාර සංවිධානය සහ ගුවන් ටිකට්පත් ලබා දීම වේ.

**උප පරිපාලිත සමාගම්**

බැංකුවේ උප පරිපාලිත සමාගම් පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම්වල නිරතවෙයි.

| සමාගමේ නම | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|
| සීමාසහිත පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම | කල්බදු පහසුකම් පිළිබඳ මෙහෙයවුම් |
| සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම | දේපල සංවර්ධනය සහ ඉදිකිරීම් |
| සීමාසහිත පීපල්ස් ලීසිං ඉන්ෂුවරන්ස් සමාගම | ජීවිත රක්ෂණ හැර සෙසු රක්ෂණ සේවා ලබා දීම |
| පීපල්ස් ලීසිං ෆයිනෑන්ස් පීඑල්සී | මූල්‍ය කල්බදු ලබාදීම, කල්බදු මෙහෙයවුම්, වාරික කුළී විකුණුම් වත්කම් කටයුතු, මූල්‍යකරණය සහ තැන්පතු භාර ගැනීම |
| සීමාසහිත පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් සමාගම | ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබාදිම |
| සීමාසහිත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම | හැව්ලොක් දේපල සංවර්ධනය |

**ආශ්‍රිත සමාගම්**

පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සමාගමේ ප්‍රධාන කාර්යයන් නම් වෙළඳ මූල්‍ය පහසුකම් සැපයීම, කල්බදු, වාරික කුළී විකුණුම්, නිශ්චල දේපල වෙළෙඳාම්, කෙටිකාලීන ආයෝජන සහ ආයතනික මූල්‍ය සේවා සම්පාදනය යි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන කෙරෙහි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට (SLFRS සහ LKAS) අනුකූලව, බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1 මිනුම් පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම දක්වන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් අන්තර්ගතකරමින් බැංකුවේ සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස්කර තිබෙනුයේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත්කරන ලද ගිනුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සහ, පහත දැක්වෙන කරුණු හැරෙන්නට, ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය පදනම්කරගෙන ය.

- ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගයක් සහිත මූල්‍ය සාධන පත්‍ර මිනුම්ගතකර ඇත්තේ සාධාරණ අගයක් අනුවය.
- ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර මිනුම්ගතකර ඇත්තේ සාධාරණ අගයක් අනුවය.
- විකිණීමට සූදානම් මූල්‍ය වත්කම් මිනුම්ගතකර ඇත්තේ සාධාරණ අගයක් අනුවය.
- නිශ්චිත ප්‍රතිලාභ සඳහා වගකීම් ආයුගණකත්වය මත අගයකර හඳුනාගෙන ඇත්තේ, සැලසුම් වත්කම්වල ශුද්ධ එකතුව, නිශ්චිත ප්‍රතිලාභ සඳහා වගකීම්වල ප්‍රවර්තන අගයෙන් අඩුකරනු ලැබීමෙනි.

උද්ධමනීය සාධක වෙනුවෙන් ගැලපීම් සිදුකර නොමැත.

### 2.2 අනුකූලතා ප්‍රකාශය

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව ය.

2011 දෙසැම්බර් 31 දක්වා සහ එම වසර අවසානය තෙක් සියලු කාලයන් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLAS) අනුකූලව සමූහය විසින් ස්වකීය

මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදී. 2012 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව බැංකුව සහ සමූහය විසින් පිළියෙළ කරන ලද ප්‍රථම මූල්‍ය ප්‍රකාශයන් ලෙස මෙම මූල්‍ය ප්‍රකාශන සලකනු ලැබේ.

නව SLFRS/LKAS සහ SLFRS 1 අනුව බැංකුව සහ සමූහය විසින් පිළියෙළ කරන ලද ප්‍රථම මූල්‍ය ප්‍රකාශයන් ද මෙය යි.

නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) සංක්‍රමණයවීමේ දී, බැංකුවේ කලින් වාර්තා කරන ලද මූල්‍ය තත්ත්වයට හා මූල්‍ය කාර්යසාධනයට කෙබඳු බලපෑම් සිදුකරන ලද්දේ ද යන්න සටහන් අංක 5 යටතේ දක්වා ඇත.

## 2.3 මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත්කිරීම

බැංකුව සහ සමූහය ස්වකීය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන් ඉදිරිපත් කරනුයේ ද්‍රවශීලතාවය පදනම් කරගෙනය. වාර්තාකළ දිනයට පසු 12 මසක් ඇතුළත (ප්‍රවර්තන) සහ වාර්තාකළ දිනයට පසු 12 මසක් ගතවූ පසු (ප්‍රවර්තන නොවන) පියවීම් හෝ සමථයකට පත්කිරීම පිළිබඳ ව විග්‍රහයක් සටහන් අංක 50 යටතේ ඇත.

## 2.4 ඒකාබද්ධකිරීමේ පදනම

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශයන්ට අයත්වනුයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය හා අදාළ වන්නාවූ බැංකුවේ සහ පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශයන් ය. ඒකාබද්ධකරණය සඳහා බැංකුවේ පරිපාලිතයින්ගේ මූල්‍ය ප්‍රකාශයන් ද පිළියෙළ කරනු ලබනුයේ මහජන බැංකුවේ වාර්තා කරන වර්ෂයම පාදක කරගනිමින් හා එකම ආකාරයේ ප්‍රතිපත්තීන් ද අනුගමනය කරනු ලබමිනි.

**2012 ජනවාරි 1 දින හෝ ඉන් පසු පවරා ගැනීම**

2012 ජනවාරි 1 දින හෝ ඉන් පසු පවරා ගැනීම සම්බන්ධයෙන්, පවරාගනුලබන්නාගේ පාලනයට යටත් නොවන හිමිකම් වේනම් එම අගය ද ඇතුළත්ව ගනුදෙනුවේ සාධාරණ අගයෙන්, පවරාගැනීමට යෝජිත වත්කම් හා වගකීම්වල ශුද්ධ නියමිත අගය (සාමාන්‍යයෙන් සාධාරණ අගය) අඩුකරනු ලැබීමෙන් සමූහය විසින් කීර්තිය මනිනු ලැබේ.

**2012 ජනවාරි 1 දිනට පෙර පවරා ගැනීම**

SLFRS ක්‍රමයට පරිවර්තනය වීමත් සමගම, 2012 ජනවාරි 1 දින හෝ එම දිනට පසු සිදුවූ ව්‍යාපාර සබඳතා යළි ස්ථාපනය නොකරන්නට සමූහය විසින් තීරණය කරන ලදී. ඊට පෙර සිදුවූ පවරාගැනීම් සම්බන්ධයෙන්, සමූහයේ කලින් පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව පිළිගන්නා ලද ප්‍රමාණයන්ට අනුකූලව කීර්තිනාමය අගයකෙරේ.

## 2.5 පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගම් යනු සමූහය විසින් පාලනය කරනු ලබන ආයතනයන් ය. පාලනය ආරම්භවන දින සිට පාලනය අවසානවන දිනය දක්වා පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශයන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් හි ඇතුළත්වේ. සමාන අවස්ථාවන්හිදී සිදුකෙරෙන සමාන ගනුදෙනු සම්බන්ධව හා සමාන සිද්ධීන් ද සම්බන්ධයෙන් පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පදනම්කර මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලැබේ.

මුදල් ලාභාංශ වශයෙන් හෝ ණය හෝ අත්තිකාරම් ආපසු ගෙවීමක් වශයෙන් හෝ මව් සමාගමට අරමුදල් පැවරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත්ලෙස සැලකිය හැකි තහංචි නොමැත්තේ ය. බැංකුවේ සියලුම පරිපාලිත සමාගම් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත ව ඇත.

## 2.6 ආශ්‍රිත සමාගම්

ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් සමූහය සතු බලපෑම් සැලකියයුතු මට්ටමකට ඇති අතර, මූල්‍ය හා ප්‍රතිපත්ති මෙහෙයවීම මත සමූහයේ පාලනයක් නැත. සමූහය වෙනත් ආයතනයක 20% - 50% අතර ඡන්ද බලයක් සමූහයට හිමි වූවිට එයින් සැලකිය යුතු බලපෑමක් සිදුකළ හැකිලෙස සැලකේ. ස්කන්ධ ක්‍රමය (ස්කන්ධ ගිණුම් සහිත ආයෝජිතයින්) භාවිතකරමින් ආශ්‍රිත ආයතනවල ආයෝජන ගිණුම්ගතකෙරෙන අතර, ආරම්භයේ දී ඒවා හඳුනාගනු ලබනුයේ පවත්නා පිරිවැය අනුව ය. ගනුදෙනු සඳහා අදාළ පිරිවැය ද, ආයෝජන පිරිවැය තුළ අන්තර්ගත වේ.

සමූහය විසින් ආශ්‍රිත සමාගම් මත සැලකියයුතු බලපෑමක් ක්‍රියාත්මක කළ දින සිට එය නතර වූ දිනය දක්වා, සමූහයේ ප්‍රතිපත්ති සමග ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙළගස්වා ගැලපීම් සිදුකළ පසුව, ලාභ හෝ අලාභ වශයෙන් බැංකුවේ කොටස හා වෙනත් විස්තීර්ණ ආදායම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයට අන්තර්ගත කෙරේ.

බැංකුවේ අලාභ කොටස, හිමිකම් ගිණුම් සහිත ආයෝජිතයින්ගේ පොළියට වඩා අධිකවූවිට, කිසියම් දිගුකාලීන ආයෝජනයන් ද ඇතුළුව එම පොළියේ ධාරිත මුදල් ප්‍රමාණය, 'ශුන්‍ය' ලෙස වාර්තාවන අතර, එම ආයෝජිතයින් වෙනුවෙන් ගෙවීමක් සිදුකළ බවට හෝ ඒ සඳහා සමූහයේ වගකීමක් ඇති ප්‍රමාණයට හැරෙන්නට තවදුරටත් ඇතිවන අලාභ විසන්ධිකරනු ලැබේ. ආශ්‍රිතයින් පසුකලෙක ලාභයන් පිළිබඳව වාර්තා කළහොත්, බැංකුවේ ලාභ කොටස හඳුනා නොගත් අලාභ කොටසට සමානවේනම්, එම ලාභවලින් තමන්ගේ කොටස හඳුනාගැනීමට බැංකුව ආරම්භකරයි.

## 2.7 ව්‍යාපාර සංයෝජනයන්

ගිණුම්කරණයේ දී මිලදීගැනීමේ ක්‍රමය භාවිතකරමින් ව්‍යාපාර සංයෝජනයන් ගිණුම්ගතකරනු ලබයි. සාධාරණ අගයන්ට අත්පත්කර ගත්තාවූ ව්‍යාපාරයන්හි (පූර්වයේදී හඳුනා නොගත් අස්පෘෂ්‍ය වත්කම්ද ඇතුළුව) හඳුනාගතහැකි වත්කම් හා (අනාගතයේ ප්‍රතිව්‍යුහගත කිරීමෙන් ඉවත් කළ හැකි අසම්භාව්‍ය වගකීම් ඇතුළුව) වගකීම් ද මෙහිදී අදාළවෙයි. හඳුනාගතහැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගයට වැඩිවූ අත්පත් කරගැනීමේ පිරිවැයෙහි අතිරික්තය කීර්තිනාමය ලෙස හැඳින්වෙයි. අත්පත්කරගත් හඳුනාගතහැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගයට වඩා අත්පත්කරගැනීමේ පිරිවැය අඩුවන්නේනම්, අත්පත්කරගැනීම හා අදාළ වෙනස, එය සිදුකළ වර්ෂයේ ආදායම් ප්‍රකාශයතුළ සෘජුවම හඳුනාගැණේ.

## 2.8 පාලනයට යටත් නොවන හිමිකම් අත්පත්කර ගැනීම

පාලනයට යටත් නොවන හිමිකම් අත්පත්කර ගැනීම, ස්කන්ධ හිමියන්ගේ පරිමාව තුළ ඔවුන් සමග සිදුකරන ගනුදෙනු ලෙස ගිණුම්ගතකරනු ලැබේ. ඒ නිසා, එවැනි ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස කීර්තිනාමය හඳුනාගනු ලබන්නේ නැත.

## 2.9 ඒකාබද්ධකිරීම මත ගනුදෙනු බැහැරකිරීම

ඒකාබද්ධකිරීමේ දී, (විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු ලාභ හෝ අලාභ හැර) සියලුම අන්තර්-සමූහ ගනුදෙනු, ශේෂයන්, ආදායම් හා වියදම බැහැරකරනු ලැබේ. ආශ්‍රිත සමාගම් පිළිබඳ ව සමූහයේ උනන්දුව පවත්නා පමණට ම, සමූහය හා එහි ආශ්‍රිත සමාගම් අතර සිදුකෙරෙන ගනුදෙනුවල ප්‍රතිඵලයක් වශයෙන්, උපලබ්ධ නොවූ ලාභ හෝ අලාභ ද බැහැර කෙරේ.

උපලබ්ධ නොවූ ලාභ බැහැරකරන ක්‍රමයටම උපලබ්ධ නොවූ අලාභ ද බැහැරකරනු ලැබුව ද, එය සිදුවන්නේ හානිකරණය පිළිබඳ සාක්ෂ්‍ය නොමැති නම් පමණි.

## 2.10 සැලකිය යුතු ලාභ හෝ අලාභ, ප්‍රතිපාදන අගයන් හෝ වැරදි නිවරදකිරීම්

පූර්ව අවධිවල සිදුවූ ව්‍යාපාරික සංයෝජනයන් හා අදාළ ව වර්ෂයතුළ හඳුනාගත් වැදගත් වාසි හෝ අවාසි, ප්‍රතිපාදන අගයන් හෝ වරද නිවරදකිරීම් නොතිබිණි.

# 3. සැලකියයුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තුගතකිරීම් සහ උපකල්පනයන්

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය යොදාගැනීමේ ක්‍රියාවලියේ දී, මූල්‍ය ප්‍රකාශනතුළ හඳුනාගත් අගයන් නිශ්චයකරගැනීම පිණිස, කළමනාකාරිත්වය විසින් විනිශ්චයන්, ඇස්තමේන්තුගතකිරීම් සහ උපකල්පනයන් භාවිතයටගෙන ඇත. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුගතකිරීම්වලින් වෙනස්වීමට ඉඩතිබේ.

ඇස්තමේන්තුගතකිරීම් හා පාදක වූ උපකල්පනයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. සංස්කරණය කරන ලද කාල පරිච්ඡේදයතුළ හා බලපෑම් සිදුවිය හැකි ඕනෑම කාල පරිච්ඡේදයක්තුළ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සිදුකෙරෙන සංස්කරණයන් හඳුනාගෙන ඇත. බහුලව භාවිතා වන විනිශ්චයන් හා ඇස්තමේන්තුගත කිරීම් පහත දැක්වේ.

## 3.1 අඛණ්ඩ පැවැත්ම

බැංකුව ක්‍රියාකාරී ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙනයාමට ඇති හැකියාව පිළිබඳ ව කළමනාකාරිත්වය ඇස්තමේන්තුකර ඇති අතර, කල්තියා අනාගතය දැකියහැකි ව්‍යාපාරයක් ලෙස එය පවත්වාගන්නට ප්‍රමාණවත් සම්පත් තමන් සතුව ඇතිබවට සෑහීමට පත්ව සිටී. තවද, ක්‍රියාකරී ව්‍යාපාරයක් ලෙසට දිගින් දිගටම පවත්වා ගන්නට ඇති හැකියාව පිළිබඳ ව සාධාරණ සැකයක් ජනිතවියහැකි කිසියම් වූ මූලසාධක අවිනිශ්චිතතාවන් පිළිබඳ ව බැංකුව දැන නොසිටියි. එහෙයින් අඛණ්ඩ පැවැත්ම පදනමක පිහිටා මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම නොකඩවා සිදුවෙයි.

## 3.2 මූල්‍ය උපකරණවල සාධාරණ අගයන්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තාවී ඇති මූල්‍ය වත්කම්වල හා මූල්‍ය වගකීම්වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳපොළ වෙතින් නිගමනය කරගත නොහැකි තන්හි, ගණිතමය ආකෘතීන් ඇතුළත් තක්සේරු ශිල්පීය විවිධාංගයන් භාවිතකරමින් ඒ ගැන තීරණය කරනුලබයි. හැකි අවස්ථාවල දී නිරීක්ෂණය කළහැකි වෙළඳෙපොළ දත්තයන් ඇසුරින් මෙම ආකෘතියට අවශ්‍ය යෙදවුම් නිගමනයකරනු ලැබේ. කෙසේවුවද, එය කළ නොහැකිවූවිට සාධාරණ අගය නිගමනය කිරීමට විනිශ්චයන් සිදුකිරීම අවශ්‍ය වේ. මූල්‍ය උපකරණවල තක්සේරුව, 49 දරන සටහනෙහි වඩාත් විස්තරාත්මක ව දක්වා ඇත.

## 3.3 ණය හා අත්තිකාරම් මත සිදුවන හානිකරණ අලාභයන්

බැංකුවේ ආදායම් ප්‍රකාශනවල හානිකරණ අලාභයන් වාර්තාකළයුතුව ඇත්තේදැයි තක්සේරු කරගැනීම සඳහා, සෑම මූල්‍ය තත්ත්ව දිනයන් හා අදාළ ව, ප්‍රකාශයට පත්කර ඇති සැලකියයුතු අත්තිකාරම් හා ණය ප්‍රමාණයන් වෙන වෙනම ගෙන බැංකුව සමාලෝචනයකරයි. විශේෂයෙන් ම, හානිකරණ අලාභයන් තීරණය කරන අවස්ථාවන්හිදී, ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට සහ අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි කාල ගණනය සඳහා කළමනාකාරිත්වයේ විනිශ්චය අවශ්‍යවන්නේ ය. සාධක කිහිපයක්ම පිළිබඳ උපකල්පනයන් මත මෙම ඇස්තමේන්තු පදනම්වන අතර, සැබෑ ප්‍රතිඵල වෙනස්විය හැකි ය.

වෙන් වෙන්ව සිදුකරන තක්සේරු පදනම්කර ගනිමින් හානිකරණය අවශ්‍ය නොවේනම්, සමාන අවදානම් ගතිලක්ෂණයන්ගෙන් සමන්විත වත්කම් සමූහ වශයෙන් ගෙන, එවැනි වෙන් වශයෙන් වැදගත්වන ණය සහ අත්තිකාරම්, සමූහයක් ලෙස ඇස්තමේන්තුගතකරනු ලැබේ. මෙය අවශ්‍යවනුයේ, වාස්තවික සාක්ෂ්‍ය සහිත වුව ද එතෙක් එහි ප්‍රතිඵල පැහැදිලි නොමැති, අලාභදායක සිදුවීම් අත්විඳීම නිසා ප්‍රතිපාදනයන් සැලසිය යුතුදැයි නිගමනය කරගැනීම සඳහා ය. සාමූහික තක්සේරුව විසින්, (ණය හිමිකරු වර්ගය, ණය හිඟ මට්ටම්, කර්මාන්ත ආදී) ණය කළඹ වෙතින් සහ අවදානම් හා ආර්ථික දත්ත ඒකරාශිකිරීමේ ප්‍රතිඵලය තුළින් ලබාගන්නා දත්ත කෙරෙහි සැලකිල්ල යොමුකරනු ලබයි. ණය හා අත්තිකාරම් මත සිදුවන හානිකරණ අලාභයන් පිළිබඳ ව සටහන් අංක 22 හි විස්තරකර තිබේ.

හානිකරණය පිළිබඳ තක්සේරුකිරීමේ දී සටහන් අංක 49 හි අනාවරණය කර ඇති පරාමිතීන් බැංකුව භාවිතකරයි.

## 3.4 විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජනයන් හි හානිකරණය

විකිණීම සඳහා පවතින ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇති සුරැකුම්පත් තවදුරටත් හානිකරණයන් ලෙස සැලකියයුතුදැයි තක්සේරුකිරීම උදෙසා, සෑම වාර්තාකරන දිනයකදීම බැංකුව විසින් සමාලෝචනය කරනු ලබයි. අත්තිකාරම් හා ණය වෙන් වෙන් වශයෙන් තක්සේරුකිරීම සඳහා යොදාගන්නා හා සමාන විනිශ්චයක් මේ සඳහාද අපේක්ෂා කෙරේ. විකිණීම සඳහා පවතින ස්කන්ධ ආයෝජනයන්හි සාධාරණ අගය පිරිවැයට වඩා සැලකියයුතු හෝ දිගුකාලීන අඩුවීමක් දක්නට ලැබුණු කල්හි, එම ආයෝජන මත හානිකරනය හා අදාළ අයකිරීමක් බැංකුව විසින් වාර්තාකරනු ලැබේ. ‘සැලකියයුතු’ හා ‘දිගුකාලීන’ යන්න නිගමනයකිරීම සඳහා විනිශ්චයක් අවශ්‍යවන්නේ ය.

විකිණීම සඳහා පවතින ආයෝජන මත හානිකරණ අලාභය වඩාත් විස්තර සහිතව සටහන් අංක 23 යටතේ දැක්වෙයි.

## 3.5 විලම්බිත බදු වත්කම්

අනාගතයේ දී ලැබියහැකි බදුලාභවලට පටහැනිව ප්‍රයෝජනයටගතහැකි සම්භාව්‍යතාවක් ඇති බදු අලාභ ප්‍රමාණයට පමණක් අදාළව විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබේ. කාල නියමය හා අනාගත බදු සැපසුම් උපායමාර්ග සමග අනාගත බදු අයකළ හැකි ලාභ මට්ටම්වල පදනම මත හඳුනාගතහැකි විලම්බිත බදු වත්කම්වල ප්‍රමාණය නිගමනයකිරීම සඳහා විනිශ්චයක් අවශ්‍ය වේ.

## 3.6 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

(1996 ට පෙර සේවයේ සිටි කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් සැකසුනු) නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම ආයුගණක තක්සේරුවක් භාවිතකරමින් නිගමනය කෙරේ. වට්ටම් අනුපාතිකයන්, වත්කම් ප්‍රතිලාභ මත අපේක්ෂිත අනුපාතිකයන්, අනාගත වැටුප් වැඩිකිරීම්, මරණ අනුපාතිකය සහ අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකිරීම ආයුගණක තක්සේරුවට අදාළ වෙයි. මෙම සියලු උපකල්පනයන් එක් එක් වාර්තාකරණ දිනයකදී සමාලෝචනයට භාජනය කරනු ලැබේ. මෙම සැලසුම්වල දීර්ඝකාලීන ස්වභාවය නිසා, එම ඇස්තමේන්තු සැලකියයුතු අවිනිශ්චිතතාවන්ට භාජනයවෙයි. භාවිතකළ උපකල්පනයන්ගැන දැනගැනීම සඳහා සටහන් අංක 36.1 බලන්න.

# 4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයි

## 4.1 විදේශ විනිමය පරිවර්තනය

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන, බැංකුවේ සහ සියලුම පරිපාලිත සමාගම්වල භාවිතවන මුදල් වර්ගයවන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත්කර තිබේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් සිදුකෙරෙන ගනුදෙනු, එම ගනුදෙනු සිදුකෙරෙන දින හා බලපවත්නා ක්ෂණික අනුපාතිකය අනුව වාර්තා කෙරේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් දක්වා ඇති මූල්‍යමය වත්කම් හා වගකීම් ද වාර්තාවන දිනයේ හා බලපවත්නා ක්ෂණික අනුපාතිකය අනුව ප්‍රතිපරිවර්තනය කරනු ලැබේ. වෙළෙඳ නොවන ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සියලු පරතරයන් ආදායම් ප්‍රකාශයෙහි 'වෙනත් මෙහෙයුම් ආදායම්' ලෙස ගැණේ. විදේශ ව්‍යවහාර මුදලේ ඓතිහාසික පිරිවැය අනුව මිනිනු ලබන මූල්‍යමය නොවන අයිතමයන්, හඳුනාගනු ලබන දිනයේ පවත්නා ක්ෂණික විනිමය අනුපාතිකයන් භාවිතකරමින් පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලක සාධාරණ අගය මත මිනිනු ලබන මූල්‍යමය නොවන අයිතමයන්, එම සාධාරණ අගය නිගමනය කෙරෙන දින පවත්නා ක්ෂණික විනිමය අනුපාතිකයන් භාවිතකරමින් පරිවර්තනය කරනු ලබයි.

## 4.2 මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම, වාර්ගීකරණය සහ පසුකාරක මැනීම

### 4.2.1 හඳුනාගැනීමේ දිනය

විධිමත් ලෙස වෙළෙඳාම් කරනු ලබන මූල්‍ය වත්කම්වල මිලදී ගැනීම්, නිරාකරණ දින ගිණුම්කරණයන් භාවිතකරමින් හඳුනාගනු ලැබේ. නිරාකරණ දිනය යනු කිසියම් වත්කමක් අස්තිත්වයකට භාරදෙන දිනයයි. නිරාකරණ දින ගිණුම්කරණයන් යනුවෙන් අදහස් කෙරෙනුයේ අස්තිත්වයක් විසින් භාරගන්නා දිනයේ වත්කමක් හඳුනාගැනීම යි. නිරාකරණ දින ගිණුම්කරණය භාවිතකරනවිට, වෙළෙඳ දිනය හා නිරාකරණ දිනය අතර කාලය තුළ ලැබීමට නියමිත වත්කමේ සාධාරණ අගයෙහි කිසියම් වෙනසක් සඳහා අස්තිත්වය ගණනයකරයි.

මූල්‍ය වත්කම් හා වගකීම්, විධිමත් නොවන ලෙස මිලදී ගැනීම් වෙළෙඳ දිනයේ දී හඳුනාගනු ලැබේ. එනම්, උපකරණයේ ගිවිසුම්ගත ප්‍රතිපාදනයන්ට බැංකුව පාර්ශ්වයක්වන දිනය යි. විධිමත් මිලදී ගැනීමක් යනු ගිවිසුමක් යටතේ මූල්‍ය වත්කමක් මිලදී ගැනීමක්වන අතර, එම ගිවිසුමේ කොන්දේසි අනුව, අදාළ වෙළෙඳපොළ තුළ පවත්නා නියාමනයන් හෝ සම්ප්‍රදායට අනුකූලව ස්ථාපනය කර ඇති කාල පරාසය තුළ එම වත්කම භාරදීම අවශ්‍ය වෙයි.

### 4.2.2 මූල්‍ය උපකරණවල ප්‍රාරම්භක මැනගැනීම

ප්‍රාරම්භක හඳුනාගැනීමක දී මූල්‍ය උපකරණ වර්ගීකරණය පදනම් වනුයේ ඒවායේ අරමුණ හා ගති ලක්ෂණ ද, ඒවා අත්පත්කරගැනීමට කළමනාකරණයේ ඇති අභිප්‍රාය ද මතය. ලාභාලාභ මගින් සාධාරණ අගය මත වාර්තාකර ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් හැර, සාධාරණ අගයට අමතරව සැලකියයුතු ගනුදෙනු පිරිවැය ද එකතුව ප්‍රාරම්භයේ දී ම සියලු මූල්‍ය උපකරණ මැනගනු ලබයි.

### 4.2.3 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වර්ගීකරණය හා අනතුරුව මැනගැනීම

*මූල්‍ය වත්කම්*

මූලාරම්භයේ දී ම මූල්‍ය වත්කමක් පහත සඳහන් ප්‍රභේදයන්ගෙන් එකකට වර්ගකරනු ලබයි.

- සාධාරණ අගය මත, ලාභ හෝ අලාභ අනුව වෙළෙඳාම සඳහා රඳවාගනු ලැබූ, හෝ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මත නම්කරනු ලැබූ
- විකිණීම සඳහා පවතින
- ණය හා ලැබිය යුතු දෑ
- කල්පිරෙනතුරු (පරිණත වනතුරු) රඳවාගත්

මූල්‍ය වත්කම් හා අදාළ ව අනතුරුව සිදුකරනු ලබන මැනගැනීම්, ඒවායේ වර්ගීකරණය මත යැපේ.

*මූල්‍ය වගකීම්*

සමූහය විසින් සියලුම මූල්‍ය වගකීම් ආරම්භවූ දිනය මත ඒවා හඳුනාගනු ලබන අතර, හිලව්කිරීමේ පිරිවැය අනුව හෝ ලාභාලාභ මගින් සාධාරණ අගය අනුව හෝ එම මූල්‍ය වගකීම් වර්ගීකරණය කෙරෙනු ඇත.

මූල්‍ය වගකීම් හා අදාළ ව අනතුරුව සිදුකරනු ලබන මැනගැනීම්, ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

**4.2.4 වෙළෙඳාම සඳහා රඳවාගන්නා ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්**

වෙළෙඳාම සඳහා රඳවාගන්නා ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්, සාධාරණ අගය අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරනුලැබ ඇත. 'ශුද්ධ වෙළෙඳ ආදායම' තුළ සාධාරණ අගයේ වෙනස්කම් හඳුනාගනු ලැබේ. පොළිය සහ ලාභාංශ ආදායම හෝ වියදම ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව හෝ ගෙවීම් අයිතිය ස්ථාපනය කළ පසුව, 'ශුද්ධ වෙළෙඳ ආදායම' තුළ වාර්තා කෙරේ. කෙටිකාලීනව වෙළෙඳාම්කිරීමේ ප්‍රධාන පරමාර්ථය ඇතිව අත්පත්කරගන්නා ලද ණය සුරැකුම්පත් හා ස්කන්ධයන් ද මෙම වර්ගීකරණයට අන්තර්ගතව ඇත.

**4.2.5 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය අනුව වාර්තාවන ව්‍යුත්පන්නයන්**

ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වැනි ව්‍යුත්පන්නයන් බැංකුව විසින් භාවිත කරනු ලබයි. ව්‍යුත්පන්නයන් සාධාරණ අගය අනුව වාර්තාගතවන අතර, ඒවායේ සාධාරණ අගය ධනාත්මකවනවිට වත්කම් ලෙසටත්, සාධාරණ අගය ඍණාත්මකවනවිට වගකීම් ලෙසටත් ඉදිරියට ගෙනයනු ලැබේ. ව්‍යුත්පන්නයන් හි සාධාරණ අගයෙහි වෙනස්කම් 'ශුද්ධ වෙළෙඳ ආදායම' තුළ අන්තර්ගත වෙයි.

**4.2.6 මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින**

විකිණීම සඳහා පවතින ලෙස නම්කරන ලද, ව්‍යුත්පන්න නොවන හා අන් වර්ගීකරණයකට වර්ග නොකරන ලද මූල්‍ය වත්කම් විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ස්කන්ධ සුරැකුම්පත්වල හා ඇතැම් ණය සුරැකුම්පත්වල සිදුකරඇති සමූහයේ ආයෝජනයන් විකිණීමට සූදානම් මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. ප්‍රාරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව, සාධාරණ අගය හා අදාළ වෙනස්කම් ද අනුව මනිනු ලැබේ.

උපලබ්ධ නොවූ ලාභ හා අලාභ, වෙනත් විස්තීර්ණ ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. එවැනි ආයෝජනයක් බැහැරකරන අවස්ථාවේදී, ස්කන්ධයන්හි පෙර හඳුනාගන්නා ලද සමුච්චිත වාසි හෝ අවාසි ආදායම් ප්‍රකාශනයේ 'වෙනත් මෙහෙයුම් ආදායම්' යටතේ හඳුනාගැණේ. තවද, විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන රඳවාගන්නා අතරතුර උපයාගන්නා ලාභාංශ, ආයෝජනය කරනු ලබන සමාගම විසින් ප්‍රකාශයට පත්කරනු ලබන දිනයේ 'වෙනත් මෙහෙයුම් ආදායම්' ලෙස ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබයි. එවැනි ආයෝජනයන් හානිකරණයවීම තුළින් උද්ගතවන අවාසි, 'මූල්‍ය ආයෝජනයන්ගෙන් සිදුවන ශුද්ධ වාසි/(අවාසි)' යටතේ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගන්නා අතර, 'මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය' තුළ එය අදාළ වත්කම්/වගකීම් ගිණුමෙන් ඉවත්කර ඇත.

**4.2.7 මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින**

කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන යනු ස්ථාවර හෝ නිගමනයකළයුතු ගෙවීම් හා ස්ථිර පරිණතවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්වන අතර, එම වත්කම් කල්පිරෙනතුරු රඳවාගැනීමේ අභිමතය සහ හැකියාව බැංකුවට තිබේ. එම ආයෝජන ප්‍රධාන වශයෙන් ම මහ භාණ්ඩාගාර බැඳුම්කරයන් ය. ප්‍රාරම්භක මැන ගැනීමෙන් අනතුරුව, කල්පිරීමට රඳවනලද මූල්‍ය ආයෝජනයන්, සඵල පොළී අනුපාතිකයෙන් (EIR) හානිකරණය අඩුකොට ඉතිරි ශේෂය භාවිතකරමින් ක්‍රමක්ෂය පදනම අනුව මිනුම්ගතකරනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබනුයේ, සඵල පොළී අනුපාතිකයේ සමෝධානික කොටස්වන, අත්පත්කරගැනීම් වට්ටම් හෝ අතිරික්තයන් සහ සැලකියයුතු ගාස්තු ද ගණනයකරනු ලැබීමෙනි. ආදායම් ප්‍රකාශනයේ 'පොළී ආදායම' යටතේ ක්‍රමක්ෂය ඇතුළත්කර ඇත. එවැනි ආයෝජනවල හානිකරණයන්ගෙන් උද්ගතවන අවාසි 'මූල්‍ය ආයෝජනවලින් ලැබෙන ශුද්ධ වාසිය/(අවාසිය)' යටතේ ආදායම් ප්‍රකාශනයේ අන්තර්ගතවෙයි. කල් පිරෙන තෙක් රඳවන ලද මූල්‍ය ආයෝජන පරිණතවීමට පෙරාතුව (ඇතැම් විශේෂ අවස්ථාවන්හිදී හැර) එයින් සැලකියයුතු කොටසක් විකිණීමට හෝ ප්‍රති වර්ගීකරණයකිරීමට බැංකුව අදහස් කරන්නේනම්, සමස්ත වර්ගයම දෝශසහිතවන අතර, එය විකිණීම සඳහා පවතින වර්ගය යටතේ ප්‍රතිවර්ගීකරණය කළයුතු වන්නේ ය. තවද, එය සිදුවන්නේ නම්, කිසිදු මූල්‍ය වත්කමක් කල්පිරෙන තෙක් දරා සිටින වර්ගය ලෙස නම්කිරීම ඉක්බිතිව එන දෙවර්ෂය පුරා බැංකුවට තහනම් වනු ඇත.

**4.2.8 ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ග කරන ලද මූල්‍යමය වත්කම්**

පහත සඳහන් ඒවා හැර, ක්‍රියාකාරී වෙළෙඳපොළක මිල නියම නොවූ, නිශ්චිත හෝ නිගමනයකළ හැකි ගෙවීම් සමග ව්‍යුත්පන්න නොවන මූල්‍යමය වත්කම්, ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ග කරන ලද මූල්‍ය වත්කම්වල අන්තර්ගතවේ.

- වහාම හෝ සමීප කාලයක දී බැංකුව විසින් විකිණීමට අදහස් කරන ඒවා සහ මූලික හඳුනාගැනීම මත ලාභ හෝ අලාභය මගින් සාධාරණ අගය ලෙස නම් කරන ලද ඒවා.
- බැංකුව මූලික හඳුනාගැනීම මත විකිණීම සඳහා පවතින ලෙස නම් කරන ලද ඒවා.
- ණය පිරිහීමක් නිසා හැර බැංකුවට මූලික ආයෝජනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ආපසු අයකර ගැනීමට නොහැකි ඒවා.

මූලික මැනගැනීමෙන් පසු බැංකුවලින් හා වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය හා ලැබිය යුතු දෑ යටතේ පවත්නා ප්‍රමාණයන්, හානිකරණ දීමනා අඩුකරන ලද සඵල පොළී අනුපාතය (EIR) භාවිතා කරමින්, ක්‍රමක්ෂය යටතේ අනතුරුව මනිනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ, අත්පත් කර ගැනීම මත ඕනෑම වට්ටමක් හෝ අතිරික්තයක් සහ සඵල පොළී අනුපාතිකයේ සමෝධානික කොටසක්වන ගාස්තු හා පිරිවැය ද සැලකිල්ලට ගනුලැබීමෙනි. ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම් යටතේ ක්‍රමක්ෂය ඇතුළත් වේ. හානිකරණයෙන් උද්ගතවන අලාභ, ආදායම් ප්‍රකාශයේ හානිකරණ පිරිවැය යටතේ ඉදිරිපත් කර ඇත.

**4.2.9 මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය**

ප්‍රතිවර්ගීකරණය සිදුවන දිනයේ දී ප්‍රතිවර්ගීකරණයන් සාධාරණ අගය මත වාර්තාගතකෙරෙන අතර, එය නව හිලව්කරන ලද පිරිවැය බවට පත්වෙයි.

'විකිණීම සඳහා පවතින' ප්‍රවර්ගයේ ප්‍රතිවර්ගීකරණය කරන ලද මූල්‍යමය වත්කමක් සඳහා, හිමිකම් තුළ හඳුනාගෙන ඇති, ඕනෑම පෙර ලද වාසිය හෝ අවාසිය ඵලදායී පොළී අනුපාතිකය භාවිතා කරමින්, ආයෝජනයේ ඉදිරියට පවත්නා කාලය මත ලාභය

හෝ අලාභයට හිලව් කෙරේ. නව ක්‍රමක්‍ෂය කරනු ලැබූ අගයත්, අපේක්‍ෂිත මුදල් ප්‍රවාහයත් අතර ඇති ඕනෑම වෙනසක් ද සඵල පොළී අනුපාතය යොදාගනිමින් වත්කමෙහි ඉතිරිව ඇති කාලය අනුව කපා හරිනු ලැබේ. වත්කම හානිකරණය වන බවට පසුකාලීනව නිගමනය කරනු ලබයිනම්, හිමිකම් තුළ වාර්තා වී ඇති ප්‍රමාණය ආදායම් ප්‍රකාශයට ප්‍රතිචක්‍රීය වෙයි.

ව්‍යුත්පන්න නොවන වෙළෙඳ වත්කමක් ණය හා ලැබිය යුතු දෑ යන නිර්වචනයට සමාන නම් සහ පැහැදිලි අනාගතයක් හෝ පරිණතභාවය දක්වා එම මූල්‍ය වත්කම රඳවාගැනීමට බැංකුවට අභිමතය හා හැකියාව තිබේනම්, වෙළෙඳාම සඳහා රඳවාගත් වර්ගයේ සිට 'ණය හා ලැබිය යුතු' වර්ගයට බැංකුව විසින් එම වෙළෙඳ වත්කම ප්‍රතිවර්ගීකරණය කරනු ඇත.

මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කර ඇත්නම් සහ මුදල් ලැබීම් නැවත අයකර ගැනීමේ හැකියාව වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුව ඇස්තමේන්තුගත මුදල් ලැබීම් වැඩිකර ගනී නම්, ඇස්තමේන්තුව වෙනස් වූ දිනයේ සිට වැඩිවීමේ බලපෑම සඵල පොළී අනුපාතයට ගැලපීමක් ලෙස හඳුනාගනු ලබයි.

ප්‍රතිවර්ගීකරණය කිරීම බැංකුවේ අභිමතය මත රැඳී ඇති අතර එය උපකරණයෙන් උපකරණයට යන පදනම මත නිගමනය වෙයි. මූලික හඳුනාගැනීමෙන් පසු ලාභ හෝ අලාභ ප්‍රවර්ගය ඔස්සේ බැංකුව ඕනෑම මූල්‍යමය උපකරණයක් සාධාරණ අගයට නැවත වර්ගීකරණය නොකරයි.

**4.2.10 කාර්ය මණ්ඩල ණය සඳහා සංක්‍රමණික දින වෙනස**

සියලු සේවක ණය ලබාදීම්, වෙළඳපොළ පොළී අනුපාතිකයට පහත අනුපාතිකයකින් ප්‍රදානය කෙරෙන අතර, ඒවා සාධාරණ අගය පදනම් කරගෙන හඳුනාගනු ලැබේ. සාධාරණ අගය හා මුදල් වියදම් කළ ප්‍රමාණය අතර වෙනස සංක්‍රමණික දින වෙනස ලෙස සලකනු ලබයි. එසේම සඵල පොළී අනුපාතය යොදාගෙන ණය මුදලේ ඉතිරි කාලය තුළ ආදායම් ප්‍රකාශනයෙහි සේවක වැය ලෙස ක්‍රමක්‍ෂය කෙරේ. මෙම ප්‍රමාණය පොළී ආදායමක් ලෙසද පෙන්වනු ලබයි. එබැවින් ආදායම් ප්‍රකාශනයේ ශුද්ධ ප්‍රතිඵලය නම් ශූන්‍ය වේ.

**4.2.11 වෙනත් මූල්‍ය වගකීම්**

ලාභ අලාභ මගින් සාධාරණ අගය වශයෙන් නම් නොකළ, බැංකුව විසින් නිකුත් කළ මූල්‍ය උපකරණ වෙනත් මූල්‍ය වගකීම් ලෙස වර්ග කරනු ලබයි. එහිදී මුදල් වත්කම් අයිතිකරුට භාරදීමට හෝ මුදල්වල නිශ්චය කළ ප්‍රමාණය හුවමාරුවක් මගින් හැරුණු කොට බැඳීම් ඉෂ්ට කිරීමට හෝ තමන්ගේ ම ව්‍යාපාර වස්තුකොටස් වල නිශ්චිත සංඛ්‍යාවක් සඳහා වෙනත් මූල්‍යමය වත්කමක් හෝ භාරදීමට බැඳීමක් ඇතිව බැංකුව තුළ ගිවිසුම්ගත විධිවිධානයන්හි විෂයාර්ථ ප්‍රතිඵල ඇති කරයි.

වෙනත් මූල්‍ය වගකීම් ලෙස ගනුදෙනුකරුවන්ගෙන් ලද තැන්පත් බැංකුවෙන් ගෙවීමට ඇති ප්‍රමාණයන් බැංකුවලින් හා වෙනත් අයගෙන් ලබාගත් ණය හා ණයකරයන් ඇතුළත්වේ.

මූලික අගය කිරීමෙන් පසු වෙනත් මූල්‍ය වගකීම් සඵල පොළී අනුපාතිකය යොදාගෙන පසුව සිදුවන ලෙසට ක්‍රමක්‍ෂය පිරිවැයට අගය කරනු ලබයි. සඵල පොළී අනුක්තයේ සමෝධානික කොටස් වන නිකුත් කිරීමේ වට්ටම් හෝ අතිරික්ත සහ පිරිවැය, ක්‍රමක්‍ෂය පිරිවැය ගණනය කිරීමේදී සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

## 4.3 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනා නොගැනීම

**4.3.1 මූල්‍ය වත්කම්**

පහත සඳහන් තත්ත්වයන් යටතේ මූල්‍ය වත්කමක් (නැතහොත්, අදාළ වන පරිදි, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම්වල එකතුවක කොටසක්) හඳුනාගනු නොලබයි.

- වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය අවසාන වූ විට
- වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය බැංකුව අන් අයට පවරා තිබීම. නැතහොත් පැවරීමේ විධිවිධාන යටතේ, ලැබුණු මුදල් ප්‍රවාහයන් සැලකියයුතු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශ්වයකට සම්පූර්ණයෙන් ම ගෙවීමට බැඳීමක් උපකල්පනය කර තිබීම. එසේත් නැතහොත්,

  බැංකුව වත්කමෙහි සියලු අවදානම් හා පාරිතෝෂිකයන් නිත්‍ය ලෙස අන් අයට පවරා තිබීම.

  හෝ

  බැංකුව වත්කමෙහි අවදානම් හා පාරිතෝෂිකයන් සැලකියයුතු ප්‍රමාණයක් පවරා නැතිවිට හෝ තමන් වෙත රඳවාගෙන නොමැතිවිට වුවද, වත්කමෙහි පාලනය අන් අයට පවරා තිබීම.

**4.3.2 මූල්‍ය වගකීම්**

වගකීම යටතේ පවත්නා බැඳීම අත්හල විට හෝ අවලංගු වූ විට හෝ අදාළ කාලය අවසාන වූ විට මූල්‍ය වගකීම හඳුනාගනු නොලබයි.

එකම ණයගැනුම්කාර පුද්ගලයකු සතුව පවත්නා මූල්‍ය වගකීමක්, ප්‍රමාණවත්වූ වෙනත් කොන්දේසි මත හෝ පවත්නා වගකීමක බොහෝ සෙයින් නවීකරණය කරන ලද කොන්දේසි මත හෝ ආදේශ කරනු ලැබුකල්හි, එවන් වූ හුවමාරු කිරීමක් හෝ නවීකරණයකිරීමක් නිසා මුල් වගකීම හඳුනා නොගත් ලෙසටත්, නව වගකීමක් හඳුනා ගත් ලෙසටත් සැලකේ.

මුල් මූල්‍ය වගකීමෙහි ධාරිත වටිනාකම හා ගෙවීම් කළ ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභාලාභය තුළ හඳුනා ගැනෙයි.

## 4.4 ප්‍රතිමිලදීගැනීම් හා ප්‍රතිවර්තිත ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම්

විශේෂිත අනාගත දිනයක දී ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ, විකුණූ සුරැකුම් හිමිකාරිත්වයක සියලු අවදානම් හා පාරිතෝෂිකයන් බැංකුව නිත්‍ය ලෙස රඳවා ගන්නා විට, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන් වෙතින් හඳුනා නොගැනීම සිදු නොවේ. ලැබී ඇති හුවමාරුවන මුදල් ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් තුළ, වගකීමක් ලෙසින් එක් රැස් වූ පොලිය ද ඇතුළත් කරගනිමින් හා බැංකුවට ණයක් ලෙසින් ගනුදෙනුවේ ආර්ථික යථාව පිළිබිඹු කරමින්, එකී මුදල් ආපසු දීමට හුවමාරුවන වගකීමක් සමග වන වත්කමක්

ලෙසින්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලබයි. විකුණුම් හා ප්‍රතිමිලදී ගැනීම් මිල අතර වෙනස පොළී වියදමක් ලෙස සැලකෙන අතර, එය ඵලදායී පොළී අනුපාතය භාවිතා කරමින් ගිවිසුමෙහි ආයු කාලය සඳහා එකතු කෙරේ.

## 4.5 සාධාරණ අගය නිගමනය කිරීම

වාර්තා කරන දිනයේ දී සක්‍රීය වෙළෙඳපොළෙහි වෙළඳාම් කරනු ලබන මූල්‍යමය උපකරණ සඳහා සාධාරණ අගය, ගනුදෙනු කිරීමේ ඵලය සඳහා කිසිම අඩු කිරීමක් නැතිව, වෙළෙඳපොළ වෙත පදනම් වෙයි.

සක්‍රීය වෙළෙඳපොළෙහි වෙළඳාම් නොවන වෙනත් මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය, අනුයෝජන තක්සේරු ශිල්පීය ක්‍රම භාවිතා කිරීම මඟින් නිගමනය කෙරේ. වට්ටම් කළ මූල්‍ය පාලන ක්‍රම, වෙළෙඳපොළ නිරීක්‍ෂණය කළහැකි මිල ගණන් විද්‍යාමාන වන සමාන උපකරණ සමග සැසැඳීම් හා වෙනත් අදාළ තක්සේරු ක්‍රම ආදිය තක්සේරු කිරීමේ ශිල්පීය ක්‍රමවලට ඇතුළත්වේ .

ඒ තුළ, ප්‍රවර්ධන වෙළෙඳපොළ ගනුදෙනු හෝ නිරීක්‍ෂණය කළ හැකි වෙළෙඳ පොළ දත්ත නොමැති තක්සේරු ශිල්පීය ක්‍රම භාවිතකරමින්, ඇතැම් මූල්‍ය උපකරණ සාධාරණ අගය අනුව භාවිතා වෙයි. ඒවායේ සාධාරණ අගය, සැබෑ ගණන්වලට එරෙහිව අත්හදා බලනු ලැබ ඇති අතර, එය තක්සේරු ආකෘති භාවිතාකිරීමෙන් සහ අතිශය අනුයෝජන ආකෘති උපකල්පනයන්හි බැංකුවේ ප්‍රශස්ථ තක්සේරු භාවිතා කරමින් නිගමනය කරනු ලබයි.

මූල්‍යමය උපකරණවල සාධාරණ අගයන්ගේ විශ්ලේෂණයක් හා ඒවා අගය කළේ කෙසේදැයි පැහැදිලි කෙරෙන වැඩිදුර විස්තර අංක 49 සටහනෙහි සපයා ඇත.

## 4.6 මූල්‍යම වත්කම් හානිකරණය

මූල්‍යමය වත්කමක් හෝ මූල්‍යමය වත්කම් සමූහයක් හානිකරණය වී ඇතිබවට විෂයානුබද්ධ සාක්‍ෂ්‍ය පවතින්නේදැයි බැංකුව සෑම වාර්තාකරණ දිනයක දීම තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වේයැයි හැඟෙනු ලබයි නම්, හා තවද වත්කම්වල මූලික හඳුනා ගැනීමෙන් පසු පාඩුවිඳි අලාභ අවස්ථා සිදුවී ඇති සිදුවීම් එකක් හෝ ඊට වැඩි ගණනක ප්‍රතිඵල ලෙස හානිකරණය පිළිබඳ විෂයානුබද්ධ සාක්‍ෂ්‍ය වේ නම්, එසේම ඒ අලාභ සිදුවීම (හෝ සිදුවීම්) මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක් තක්සේරු කළ ආනාගත මුදල් ප්‍රවාහයන් කෙරෙහි තද බල පෑමක් තිබේ නම්, එය විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකිවන්නේ ය.

හානිකරණ අලාභය ගණනය කිරීමේ සාක්‍ෂ්‍ය මෙසේ ඇතුළත් කරනු ඇත. එනම්, ණයකරු හෝ ණයකරු සමූහය සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳිමින් සිටින්නේ යයි පෙන්වීම, ඔවුන් බංකොලොත් භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රති-සංවිධානයකට පිවිසෙනු ඇතැයි යන සම්භාව්‍යතාවය පොළී හෝ මුල් මුදලේ ආපසු ගෙවීම් පැහැර හැරම හෝ අතපසු කිරීම. එසේම එහි පැහැර හැරීම සමග සහ සම්බන්ධවන ආර්ථික තත්ත්වය හෝ හිඟ මුදල්වල වෙනස්වීම් වැනි ඇස්තමේන්තු කළ අනාගත මුදල් පාලනයන්හි කණගාටුදායක අඩුවීමක් ඇති බව නිරීක්ෂණය කළ දත්ත මඟින් පෙන්වා දීම ආදිය යි.

### 4.6.1 ක්‍රමක්‍ෂය පිරිවැයට මූල්‍ය වත්කම් පවත්වා ගෙන යාම

ක්‍රමක්‍ෂය පිරිවැයට පවත්වාගනු ලැබූ මූල්‍ය වත්කම් [බැංකුවලින් ලැබිය යුතු දෑ හා ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ] විෂයානුබද්ධ සාක්‍ෂ්‍ය පවතින්නේදැයි පළමුව තනි තනිව තක්සේරු කරනු ලැබේ. නැතහොත් තනි තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහිකව තක්සේරු කරනු ලැබේ. තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් පිළිබඳව හානිකරණය සිදුවන බවට විෂයානුබද්ධ සාක්‍ෂ්‍ය නැතැයි බැංකුව තීරණය කරයි නම්, සමාන ණය අවදානම් ලක්‍ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක එය අන්තර්ගත කරනු ලැබේ. හානිකරණය සම්බන්ධව තනි තනිව පරීක්‍ෂා කරනු ලැබූ වත්කම්වල යම් හානිකරණ අලාභයක් තිබේ නම් හෝ එසේ සිදුවෙමින් තිබෙන බව හඳුනාගතහොත් ඒ වත්කම් හානිකරණය සම්බන්ධව සාමූහික තක්සේරුවට ඇතුළත් කරගනු නොලබයි.

හානිකරණ අලාභයක් සිදුවී ඇති බවට විෂයානුබද්ධ සාක්‍ෂ්‍ය තිබේනම් වත්කම ධාරණය කරන ගණනත් තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහයෙහි ප්‍රවර්තන වටිනාකමත් අතර වෙනස ලෙසින් අලාභ වු ගණන මනිනු ලබයි. (දැනට අත්විඳිනු නොලබන අනාගත අපේක්ෂිත ණය අලාභ බැහැර කොට) වත්කමෙහි ධාරිත වටිනාකම දීමනා ගිණුමක් භාවිතකරමින් අඩු කරනු ලබන අතර, අලාභ ගණන ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබයි. මූල්‍ය වත්කම්වලට හානිකරණ අරමුණ සඳහා අනාගත මුදල් ප්‍රවාහය වට්ටම් කිරීමට භාවිතා කළ පොළී අනුපාතය යොදා ගනිමින් බැංකුව විසින් උපචිත කරනු ලබයි. අනාගත ප්‍රතිඅයවීම්වල යථාරූපී අපේක්‍ෂාව නොමැතිවිට ආශ්‍රිත දීමනා සමග ණය කපා හරිනු ලබන අතර, සියලු අතිරේකයන් උපලබ්ධි කර ගෙන තිබෙනු හෝ බැංකුවට මාරුකරනු ලැබ ඇත. හානිකරණය හඳුනා ගැනීමට පසුව සිදුවන සිදුවීමක් නිසා තක්සේරු කළ හානිකරණයෙහි පාඩුව වසරක දී අඩුවන්නේ හෝ වැඩිවන්නේ නම් හෝ දීමනා ගිණුම ගැලපීම මඟින් මුලින් හඳුනාගත් හානිකරණ පාඩුව වැඩි කරනු හෝ අඩු කරනු ලබයි. අනාගත කපා හැරීමක් පසුව අවශ්‍ය වෙයි නම් අයවීම ආදායමක් ලෙස බැර කරනු ලබයි.

තක්සේරු කරන ලද අනාගත මුදල් ප්‍රවාහය හෝ ප්‍රවර්තන අගයන් මුල් වත්කමේ මුල් සඵල පොළී අනුපාතය මත වට්ටම් කරනු ලබයි. ණය මුදලට විචල්‍ය පොළී අනුපාතයක් තිබේ නම්, ඕනෑම හානිකරණ අලාභයක් මැනීම සඳහා වට්ටම් අනුපාතය ප්‍රවර්තන ඵලදායී පොළී අනුපාතය වෙයි. සම පාර්ශ්වීය මූල්‍ය වත්කමක තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම ගණනය කිරීම පිළිබිඹු කරන්නේ අවුරා තැබීම විය හැකි වුවත් නැතත්, සම පාර්ශ්වීය වත්කම් ලබා ගැනීම හෝ විකිණීම සඳහා වැය අඩුකොට අහුරා තැබීමෙන් ප්‍රතිඵල ඇති කළ හැකි මුදල් ප්‍රවාහයන් ය.

හානිකරණයෙහි සාමූහික ගණනය කිරීමක අරමුණ සඳහා මූල්‍ය වත්කම් ණය අවදානම් ලක්‍ෂණවල පදනම මත මූල්‍ය වත්කම් කාණ්ඩගත කරනු ලබයි. එනම් වත්කම් ස්වභාවය, කර්මාන්ත අයිතියේ ස්වභාවය, කල්පසු වූ තත්ත්වයන් හා අනෙකුත් අදාළ සාධකයි.

හානිකරණය සඳහා සාමූහිකව ගණනය කළ මූල්‍ය වත්කම් සමූහයක් මත අනාගත මූල්‍ය ප්‍රවාහයන් තක්සේරු කරනු ලබන්නේ සමූහයේ තිබෙන ණය අවදානම් ගති ලක්‍ෂණවලට සමාන ගති ලක්‍ෂණ

සමග වත්කම් වෙනුවෙන් අතීත අලාභ අත්දැකීම් පදනම මතයි. අතීත අලාභ අත්දැකීම් පදනම් වී ඇති ප්‍රවර්ථන තත්ත්වයන්හි ප්‍රතිඵල පිළිබිඹු කිරීමට නිරීක්‍ෂණය කළ හැකි ප්‍රවර්තන දත්තවල පදනම මත ඓතිහාසික අලාභ අත්දැකීම සලකනු ලබන අතර, එසේම ප්‍රවර්තනයේ නොපවත්නා අතීත කාල පරිච්ඡේදයේ පැවති තත්ත්වයන්හි ප්‍රතිඵල ඉවත් කිරීමට ද එසේ කරනු ලබයි.

අනාගත මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීම සඳහා භාවිතා කළ ක්‍රමවේදය හා උපකල්පනය නොකඩවා සමාලෝචනය කරන්නේ අලාභ ඇස්තමේන්තු හා සැබෑ අලාභ අත්දැකීම් අතර ඇති ඕනෑම වෙනසක් අඩුකිරීම සඳහා යි.

#### 4.6.2 විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍යමය ආයෝජන සඳහා යම් ආයෝජනයක් හානිකරණය වී ඇති බවට විෂයානු බද්ධ සාක්‍ෂ්‍ය පවතින්නේදැයි දැනගැනීමට සෑම වාර්තා කරන දිනයකදීම බැංකුව විසින් තක්සේරු කරනු ලබයි.

'විකිණීම සඳහා පවතින' යනුවෙන් වර්ග කළ ස්කන්ධයන් ආයෝජන සම්බන්ධයෙන් ගත්කල්හි විෂයානුබද්ධ සාක්‍ෂ්‍ය, ආයෝජනවල මිලට පහතින් ආයෝජනවල සාධාරණ අගය තුළ හීනවීම 'සැලකිය යුතු' හෝ 'අඛණ්ඩ' ස්වභාවයක් ද අන්තර්ගත කරයි. යම්තැනක ඕනෑම හානිකරණ අලාභයක් පිළිබඳ සාක්‍ෂ්‍ය ඇතිවීම ආදායම් ප්‍රකාශනයේ කලින් හඳුනාගත් ආයෝජන මත ඕනෑම හානිකරණ පාඩුවක් අඩුකොට ප්‍රවර්තන සාධාරණ අගයක් අත්පත්කරගත් මිලත් අතර වෙනස වශයෙන් මනින ලද එක් රැස්වූ අලාභය ව්‍යාපාර වස්තුවේ අගයෙන් ඉවත් කරනු ලබන අතර, ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබයි. ව්‍යාපාර වස්තු ආයෝජනයන් මත හානිකරණ අලාභයන් ආදායම් ප්‍රකාශන ප්‍රතිවර්තනය කරනු නොලබයි. හානිකරණයන්ගෙන් පසු සාධාරණ අගයෙහි වැඩිවීම් වෙනත් විස්තීර්ණ අදායමක් ලෙස හඳුනාගනු ලබයි. විකිණීම සඳහා පවතින මූල්‍යමය ආයෝජන මත හානිකරණ අලාභයන් පිළිබඳ විස්තර සඳහා අංක 23 දරණ සටහන බලන්න.

#### 4.6.3 ප්‍රතිකථිකාකරණයකළ ණය

හැකි සෑම අවස්ථාවකදීම බැංකුව ඇප අත්පත් කරගැනීමට වඩා ණය ප්‍රතිව්‍යුහගත කිරීමට බලාපොරොත්තුවේ. මෙහි දළ ගෙවීම් විධිවිධාන විස්තීරණය කිරීම හා නව අත්තිකාරම් කොන්දේසි ගිවිසුම ඇතුළත් වේ. කොන්දේසි සංශෝධනය කිරීමට පෙර ගණනය කර මුල් සඵල පොළී අනුපාතයට හානිකරණය අගය කරනු ලැබේ. කළමනාකරණ අවබෝධ විමර්ෂණය තුළින් නැවත සලකා බැලූ අත්තිකාරම්හි අනාගත ගෙවීම් නිසි ආකාරයෙන් සිදුවේදැයි හා සියලු උපමානනයන් සපුරා ඇද්දැයි තහවුරු කර ගනි. අත්තිකාරම් අනාගත ගෙවීම් සිදුවීම හා උපමානනයක් සපුරාලීමට යටත්වේ. අත්තිකාරම් මුල් සඵල පොළී අනුපාතයන් ගණනය කළ තනිව හා සාමූහික හානිකරණයන් තක්සේරුවට යටත් වේ.

#### 4.6.4 ණය ඇප තක්සේරුව

හැකි සෑම අවස්ථාවක ම මූල්‍ය වත්කම් මත අවදානම් අඩුකර ගැනීමට, බැංකුව ඇප භාවිතා කිරීමට බලාපොරොත්තුවේ. මුදල් සුරැකුම්පත්, ණයවර ලිපි, ඇප සහතික, දේපල ලැබීම්, තොග, වෙනත් මූල්‍ය නොවන වත්කම්, සහ හිලව් ගිවිසුම් ආදී ණය වැඩි කිරීම වැනි විවිධ ආකෘතිවලින් ඇප ඉදිරිපත් කෙරේ.

#### 4.6.5 ප්‍රතිබුක්තියලැබූ ණය ඇප හෝ බැංකුවට දේපල පවරා ඇතිවිට

ගෙවීම් පැහැර හැරී ගනුදෙනුකරුවන් වෙතින් ලද ඇප ආවරණය කිරීම මගින් අත්පත් කරගත් නිශ්චල දේපල නැතහොත් ණය පියවීමට කොටසක් ලෙසින් බැංකුවට පවරා ඇති එවැනි දේපල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති විධානයන් අනුව බැංකුවේ වත්කම්වල කොටසක් වශයෙන් හෝ දේපල ආයෝජනයක් ලෙසින් හෝ ගිණුම් ගත කර නැත.

### 4.7 හිලව්වන මූල්‍ය උපකරණ

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව්වන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ශුද්ධ වටිනාකම වාර්තාවෙයි නම්, එසේ පමණක් හඳුනාගත් වටිනාකම් හිලව් කිරීමට ප්‍රවර්තන ලෙස බලගැන්විය හැකි නීතිමය අයිතියක් ඇති අතර, ශුද්ධ වූ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධිකර ගැනීමට හා සමගාමීව වගකීම් අවසන් කිරීමට උවමනාවක් ඇත. මෙය සාමාන්‍යයෙන් ප්‍රවීණ ශිල්පීය අවුරාලීමේ ගිවිසුම් සමග යෙදෙන කරුණක් නොවේ. එනිසා අදාළ වත්කම් හා වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දළ වශයෙන් ඉදිරිපත් කරනු ලබයි.

### 4.8 කල්බදු

ගිවිසුමක් කල්බදු උපකරණයක් ලෙස හෝ එහි කල්බදු ඇතුළත්වී ඇති බව හෝ නිගමනය කිරීම ගිවිසුමේ අන්තර්ගතය මත රැඳී ඇති අතර, එම ගිවිසුම ඉෂ්ට සිද්ධිකිරීම, නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිතය මත යැපෙන්නේදැයි යන්න පිළිබඳ ව හා ගිවිසුම අනුව වත්කම භාවිතකිරීමට අයිතියක් තිබේද යන්න පිළිබඳ ව තක්සේරුවක් අවශ්‍ය වෙයි.

#### 4.8.1 බැංකුව බදු ගැනුම්කරු ලෙස

***කල්බදු මෙහෙයවීම***

මෙහෙයුම් කල්බදු යනු, බදු දුන් අයිතමයන්හි හිමිකාරත්වයට අනියම් ලෙසින් වගකියන, හා සියලු අවදානම් හා ප්‍රතිලාභ නිත්‍ය ලෙස බැංකුවට පවරන්නේ නැති කල්බදු පාලනය යි. කල්බදු කාලය හා අදාළ ව සෘජු රේඛා පදනමක් ලෙස ආදායම් ප්‍රකාශනයෙහි වැයක් ලෙසින් මෙහෙයුම් කල්බදු ගෙවීම් හඳුනාගනු ලැබේ. අදාළ කාලය තුළ අලාභ සිදුවූ ලෙසට, එම කාලයේ වියදමක් ලෙසින් ගෙවීමට ඇති ආවස්ථිත කුලිය හඳුනාගනු ලබයි.

***මූල්‍ය කල්බදු***

බදු දුන් අයිතමයන්හි හිමිකාරත්වයට අනියම් ලෙස වග කියන සියලු අවදානම් හා ප්‍රතිලාභ නිත්‍ය ලෙසින් කණ්ඩායමට පවරන මූල්‍යමය කල්බදු බදු දුන් දේපලවලට සාධාරණ අගයට බදුකරය ක්‍රියාවට නැංවූ අවස්ථාවේ දී ප්‍රාග්ධන බවට පත්වෙයි. නැතහොත් සාධාරණ අගයට අඩුනම්, අවට කල්බදු ගෙවීම්වල වර්තමාන අගයට එය සිදුවෙයි. වගකීමෙහි පවත්නා ශේෂය මත පොලියෙහි අඛණ්ඩ අනුපාතිකයක් ඉටුකර ගැනීමේ තරමට කල්බදු වගකීම අඩුවීම හා මූල්‍යමය ගාස්තු අතර බෙදීයන ලෙස කල්බදු ගෙවීම් පංගු කෙරේ. මූල්‍යමය ගාස්තු ආදායම් ප්‍රකාශනයෙහි මූල්‍ය වියදම් තුළ හඳුනාගනී. බදු තැබූ වත්කමක් එම වත්කමෙහි ඵලදායී ජීවකාලය මත අවප්‍රමාණය කරනු ලබයි. කෙසේ නමුත් කල්බදු කාල පරිච්ඡේදය

අවසානයේදි සමූහය හිමිකාරීත්වය ලබා ගන්නා බවට සාධාරණ නියතතාවයක් නොමැති නම් වත්කමෙහි ඇස්තමේන්තු කළ ඵලදායී ජීවකාලයට අඩුවෙන් හා කල්බදු කාලය අනුව වත්කම අවප්‍රමාණය කරනු ලබයි.

### 4.8.2 බැංකුව බදු දීමනාකරු ලෙස

**මූල්‍ය කල්බදු**

නීතිමය හිමිකම් හැර හිමිකාරත්වය සමග සම්බන්ධිත පාරිතෝෂිකයන් හා සියලු අවදානම් නිත්‍ය ලෙස පවරන ගනුදෙනුකරුවන්ට බදු දුන් වත්කම් මූල්‍ය කල්බදු ලෙස වර්ග කරනු ලබයි. ලැබීමට ඇති කල්බදු කුලී, හානිකරණයන් සඳහා වෙන් කිරීම්වල මූල්‍ය තත්ත්ව ජාලයෙහි සඳහන් කරනු ලැබේ.

## 4.9 මුදල් හා මුදල් සමානයන්

මුදල් හා කෙටිකාලීන අරමුදල්වලට අන්තර්ගත වන්නේ අතැති මුදල්, බැංකු සමග ඇති ශේෂ. බැංකු සමග ස්ථාපනයන්, ඒක්ෂණ මුදල්, කෙටි දැනුම් දීමෙන් ලැබෙන මුදල් ආදිය යි. මෙම මුදල් හා කෙටිකාලීන අරමුදල් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයට අදාළ අංක 17 සටහනෙහි දැක්වේ.

## 4.10 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ, සමුච්චිත ක්‍ෂයවීම හා වටිනාකමෙහි හානිකරණයන් අඩුකොට දෛනිකව සේවා වියදම් බැහැර කරමින් ලද වටිනාකම හෝ මිල අනුව සඳහන් කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙසින් සලකන ලද  හා අදාළ ලෙසින් අවප්‍රමාණය කළ හා ක්‍රමය වෙනස් කරමින් අපේක්‍ෂා කරන ඵලදායී ජීවකාලයෙහි වෙනස් කිරීම් සැලකීමට ගනිමින් ගිණුම්ගත කිරීම සිදු කරයි.

**වියදම් ආකෘතිය**

පිරියත හා උපකරණ වටිනාකමෙහි එක් රැස්වූ හානිකරණයන් හා එක්රැස්වූ අව ප්‍රමාණයන් අඩුකොට දෛනිකව සේවා වියදම් සඳහන් කරනු ලබයි. එවැනි වියදම් හඳුනාගැනීමේ උපඨානයක් ලද්දේ නම් වියදම අත්විඳින්නට සිදු වූ විට පිරියත හා උපකරණවල කොටස් යළි සවිකිරීමට දැරූ වැය ඇතුළත් කරුනු ලබයි.

**ප්‍රත්‍යාගණන ආකෘතිය**

බැංකුව, පූර්ණ අයිතිය සහිත ඉඩම් හා ගොඩනැගිලිවල සමස්ත වර්ගයන් වෙනුවෙන් ප්‍රත්‍යාගණනය කිරීමේ ආකෘතිය භාවිතා කරයි. ප්‍රත්‍යාගණන කළ දිනට අය කළ හානිකරණයන් හා පසුව එක්රැස්වූ ඕනෑම අවප්‍රමාණයන් අඩුකොට, ප්‍රත්‍යාගණන කරන දිනයේ ඒවායේ සාධාරණ අගය බවට පත්වෙමින්, එවැනි දේපල ප්‍රත්‍යාගණන කරගත් ගණන් රඳවා ගනී.

වත්කමෙහි ධාරිතාවට වඩා ප්‍රත්‍යාගණන වත්කමෙහි සාධාරණ අගය සෑහෙන පමණකින් වෙනස් නොවන බව තහවුරු කරගැනීමට ප්‍රත්‍යාගණන කිරීම සෑම වසර 7 කට වරක් ඉටු කරනු ලබයි. ලාභය ලෙස හෝ අලාභය ලෙස කලින් හඳුනාගත් එම වත්කමෙහි යළි තක්සේරුවේ පහළ වැටීම, ප්‍රවර්තනය කරන ප්‍රමාණයට හැර ශේෂ පත්‍රයේ ස්කන්ධ කොටස තුළ ඇතුළත් කර ඇති, ප්‍රත්‍යාගණන සංචිතයට ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් බැර කරනු ලබයි.

**අපරාපරිය පිරිවැය**

දේපල, පිරියත හා උපකරණවල යම් අයිතමයක කොටසක් අලුත් කිරීමට යන වියදම අයිතමෙහි ධාරිත වටිනාකම තුළ හඳුනාගනු ලබයි. එය වියහැකි නම් එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලායනු ඇත. එසේම එහි අගය විශ්වාස ලෙස මැනිය හැකිය.

**පිළිසකර වියදම්**

අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ නඩත්තුකිරීම හෝ පිළිසකර කිරීම, දේපල, පිරියත හා උපකරණ අලුත් වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම මත දරන වියදම්, පාඩුවිදීම් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කෙරේ.

**ප්‍රාග්ධන නොනිම් වැඩ**

මේවා ගොඩනැගිලි, ප්‍රධාන කම්හල් හා යන්ත්‍රෝපකරණ නිර්මාණය කිරීම හා පද්ධති සංවර්ධනය, ප්‍රාග්ධනකරණ අපේක්‍ෂා යන අංශ තුළ ඍජු වියදම් වන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් ය. මේවා වැය අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් වේ.

**ක්‍ෂයවීම්**

තක්සේරු කළ ඵලදායී ජීවකාලය මත වත්කමෙහි අවශේෂ වටිනාකමට යන්ත්‍ර සූත්‍රවලද, දේපලවලද නාමික අගය අඩුකිරීමට ක්‍ෂයවීම් සඳහා වෙන්කිරීම ගණනය කරනු ලබන්නේ ප්‍රත්‍යාගණන අගයමත සරල මාර්ග ක්‍ෂය ක්‍රමය භාවිතකරමින් ක්‍ෂයවීම් ගණනය කිරීමෙනි.

ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවකාලය පහත දැක්වේ:

| වත්කමේ ප්‍රවර්ගය | ක්‍ෂයවීමේ කාලය |
|---|---|
| බදුකර ගොඩනැගිලි | බදු කාල පරිච්ඡේදය පුරාවට |
| සින්නක්කර ගොඩනැගිලි | වර්ෂයකට 2% |
| ගෘහභාණ්ඩ, උපකරණ හා යන්ත්‍ර සූත්‍ර | වර්ෂයකට 20% |
| සින්නක්කර සහ බදුකර මොටර් රථ | වර්ෂයකට 25% |
| පෙරගෙවූ කල්බදු | බදු කාල පරිච්ඡේදය පුරාවට |

**අගයන් හඳුනා නොගැනීම**

විකිණීමෙන් සහ දේපල හා උපකරණ භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොලැබෙන අවස්ථාවක ඒවා හඳුනාගනු නොලැබේ. එවැනි අවස්ථාවක දී සිදුවන ලාභ හෝ අලාභ (වත්කමේ වටිනාකම ලෙස ධාරණයවන ප්‍රමාණය සහ ඒවා විකිණීමෙන් ලත් ශුද්ධ ආදායම අතර ගණනය කරන ලද වෙනස) එකී වත්කම මුළුමනින් ම නොසලකා හරින ලද වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් තුළ ඇතුළත්කරනු ලැබේ.

## 4.11 ආයෝජන දේපල

ආයෝජන දේපල යනු, බදු ආදායම් උපයාගැනීමට හෝ ප්‍රාග්ධන ඇගයීම හෝ ඒ දෙක ම සඳහා රඳවාගනුලබන්නාවූ නමුත්, සාමාන්‍ය ව්‍යාපාරකරණයේ දී භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හා අලෙවිය හෝ පරිපාලන අරමුණු හෝ සඳහා විකිණීමට භාවිත නොකෙරෙන දේපල ය.

**හඳුනාගැනීමේ පදනම**

ආයෝජන දේපල හා ආශ්‍රිත, අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙන ගලායාමට පවත්නා හැකියාව අපේක්ෂා කළහැකි තත්ත්වයක පවතීනම්, ආයෝජන දේපල හඳුනාගත හැකි අතර, ආයෝජන දේපලවල පිරිවැය විශ්වසනීයලෙස මැනිය හැකි ය.

**මිණුම්කරණය**

ආයෝජන දේපලක් එහි පිරිවැය අනුව මූලික වශයෙන් මනිනු ලැබේ. මිලදී ගනුලැබූ ආයෝජන දේපලක පිරිවැය තුළ, එහි මිල දී ගන්නා මිල හා ඕනෑම සෘජු ආරෝපණය කළ හැකි වියදමක් අඩංගුවෙයි. ස්වයංනිර්මාණිත ආයෝජන දේපලක පිරිවැය නම්, එහි නිර්මාණකයා හෝ එය නිර්මාණය කළ සංවිධානය එය නිමාකළ දිනය දක්වා සිදුකළ වියදම යි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතී අංක 40 (LKAS 40) හි, 'ආයෝජන දේපල' යන ප්‍රමිතියට අනුකූලව සමූහය විසින් ආයෝජන දේපල සඳහා මිල ආකෘතිය යොදා ගනුලබයි. ඒ අනුව ආයෝජන දේපල ලෙසට වර්ගකළ ඉඩම්, ඕනෑම උපචිත හානිකරණ අලාභයක් අඩුකොට ලැබෙන මිල අනුව සඳහන්කර ඇති අතර, ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කර ඇති ගොඩනැගිලි පිළිබඳ ව සඳහන්කර ඇත්තේ ඒවායේ මිලෙන් උපචිත ක්ෂයවීම් හා උපචිත හානිකරණ අලාභයන් අඩුකරනුලැබූ පසුව ය.

## 4.12 අස්පෘෂ්‍ය වත්කම්

**හඳුනාගැනීමේ පදනම**

බැංකුවේ වෙනත් අස්පෘෂ්‍ය වත්කම් ලෙස පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුළත් කෙරේ. අස්පෘෂ්‍ය වටිනාකම් හඳුනාගනු ලබන්නේ විශ්වසනීය ලෙස එහි මිල මිනියහැකිවිට පමණක්වන අතර, එයට ආරෝපණය කළහැකි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලනයවීමේ සම්භාව්‍යතාවන් තිබිය හැකි ය.

**මැනීම**

වෙන් වශයෙන් අත්පත්කරගත් අස්පෘෂ්‍ය වත්කම්. මිල අනුව මූලික ව හඳුනාගැනීම මත මනිනු ලබයි. ව්‍යාපාරික සංයෝජනයක දී, අත්පත් කරගත් අස්පෘෂ්‍ය වත්කම්වල පිරිවැය, එසේ අත්පත් කරගත් දින පවත්නා ඒවායේ සාධාරණ අගය යි. මූලික හඳුනාගැනීම්වලින් පසුව, කිසියම් උපචිත හිලව්කිරීමක් හා කිසියම් උපචිත හානිකරණ අලාභයක් තිබේනම් ඒවා අඩුකොට ඉදිරියට ගෙනයනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කම්වල ඵලදායී ආයුකාලය පරිමිත හෝ අපරිමිත ලෙසට තක්සේරුකර ඇත. පරිමිත ආයුකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම්, ඵලදායී ආර්ථික ආයුකාලයක් මත ක්‍රමක්ෂය කර ඇත. පරිමිත ආයුකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම්, ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය හා කාලය අවම වශයෙන් මුදල් වර්ෂය අවසානයේ දී සමාලෝචනය කරනු ලබයි. එම අපේක්ෂිත ආයුකාලයෙහි වෙනස්වීම නැතහොත් වත්කමෙහි අන්තර්ගතවූ අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව අදාලවන පරිදි ක්‍රමක්ෂය කිරීම, කාලයෙහි හා ක්‍රමයෙහි වෙනස්වීම මගින් හේතු දක්වනු ලබන අතර, ඒවා ගිණුම්කරණ ඇස්තමේන්තුතුළ වෙනස්වීම් ලෙස සැලකිල්ලට ගනු ලැබේ. පරිමිත ආයුකාල සහිත අස්පෘෂ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය වියදම එම වත්කම්වල ක්‍රියාකාරිත්වය සමග සමානුයෝගී ලෙසින් ආදායම් ප්‍රකාශනයෙහි වියදම් ප්‍රවර්ගයෙහි හඳුනාගනු ලබයි.

අස්පෘෂ්‍ය වත්කම්වල ඇස්තමේන්තුකළ ඵලදායී ආයුකාලයන් මත, ඒවායේ අවශේෂ වටිනාකම්වලට අනුකූලව එම වත්කම්වල සරල රේඛීය ක්‍රමය භාවිත කරමින් පහත දැක්වෙන සේ ක්ෂයකිරීම ගණනය කෙරේ.

| අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රවර්ගය | ඵලදායී ආයුකාලය | ක්ෂයකිරීමේ ක්‍රමය |
|---|---|---|
| තොරතුරු තාක්ෂණය - සම්බන්ධ ප්‍රාග්ධන අයිතම | වසර අවුරුදු 5 | සරල රේඛීය ක්‍රමය |

## 4.13 මූල්‍ය නොවන වත්කම්වල හානිකරණය

**හඳුනාගැනීමේ පදනම**

ඕනෑම වත්කමක් හානිකරණය වියහැකිදැයි යන්න දැක්වෙන හැඟවීමක් තිබෙන්නේදැයි යනබව දැනගැනීමට, බැංකුව සෑම වාර්තාකරණ දිනයකදීම වත්කම් තක්සේරුවක් සිදුකරයි. යම් හැඟවීමක් තිබෙන්නේදැයි, නැතහොත්, වත්කම සඳහා වාර්ෂික හානිකරන පරීක්ෂණ අවශ්‍යවන්නේනම්, බැංකුව වත්කමේ අයකරගතහැකි වටිනාකම තක්සේරුකරයි. වත්කමක අයකරගතහැකි වත්කමෙහි ඉහළ ම හෝ එහි විකුණුම් මිලට සහ භාවිත මිලට අඩු, මුදල් උත්පාදන ඒකකයෙහි සාධාරණ අගය යි. වත්කමෙහි ධාරිත වටිනාකම හෝ මුදල් උත්පාදන ඒකකයෙහි අගයකළහැකි වටිනාකම ඉක්මවන තන්හි, වත්කම හානිකරණයවී ඇතැයි සැලකෙන අතර, අයකරගත හැකි ප්‍රමාණයට එහි නාමික වටිනාකම අඩුකෙරේ. භාවිත වටිනාකම තක්සේරුකිරීමේදී, අනාගත ඇස්තමේන්තුගත මූල්‍ය පාලනයන්, වත්කමට විශේෂිත අවදානම් හා මුදලේ කාලීන අගයේ ප්‍රවර්තන වෙළෙඳපොළ තක්සේරුකිරීම පිළිබිඹු කරන බදුවලට පෙර වට්ටම් බදු අනුපාතය භාවිතකරමින්, ප්‍රවර්තන වටිනාකම තක්සේරුකොට අනාගත මූල්‍ය පාලනයන් වට්ටම්කරනු ලබයි. විකිණීමේ මිලට අඩු සාධාරණ අගය නිගමනයකිරීමේ දී, අදාළ තක්සේරුකිරීමේ ආකෘතිය යොදාගනු ලැබේ. මෙම ගණනය කරනු ලැබීමේ තක්සේරු ගුණිතයන් පොදු වෙළෙඳ පාලිත සමාගම් සඳහාවූ මිල කළ කොටස් මිල ගණන් හෝ වෙනත් පවත්නා සාධාරණ මිල දර්ශකයන් මගින් සනාථකරනු ලබයි.

**මිණුම්කරණය**

කීර්තිනාමය ඇතුළත් වත්කම් සම්බන්ධයෙන් සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරුකරනු ලබයි. එසේ කරනුයේ, මීට පෙර හඳුනාගන්නාලද හානිකරණ අලාභයන් තවදුරටත් නොපවතිනු ඇතැයි හෝ අඩුවනු ඇතැයි හෝ යනුවෙන් හඳුනාගතහැකි හැඟවීමක් ඇත්තේදැයි යනබව දැනගැනීමට ය. එවැනි හැඟවීම් පවතීනම්, බැංකුව වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි අයකරගතහැකි ප්‍රමාණය තක්සේරුකරයි. කලින් හඳුනාගත් හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කරනු ලබන්නේ,

අවසාන හානිකරණ අලාභය හඳුනාගත් දින පටන් වත්කමෙහි අයකළ ප්‍රමාණය නිශ්චයකරගැනීමට භාවිතකළ උපකල්පනයන් තුළ, යම් වෙනසක් ඇතිවී තිබේනම් පමණි. ප්‍රතිවර්තන පරිමිත ය. ඒ අරමුණ සමග වත්කමෙහි ධාරිත වටිනාකම එහි අයකළ හැකි ප්‍රමාණය ඉක්මවා නොයයි. එසේම නිගමනය කරනුලබන්නට ඉඩ ඇති ශුද්ධ අවප්‍රමාණයවීම ධාරිත ප්‍රමාණය ද ඉක්මවා නොයනු ඇත. ඒ පෙර වර්ෂවල වත්කම වෙනුවෙන් හඳුනාගෙන තිබූ හානිකරණයන් නො පැවැති ලෙසට ය. එවැනි ප්‍රතිවර්තනයන් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබයි.

කීර්තිනාමයට අදාළ හානිකරණ අලාභයන් අනාගත කාල පරිච්ඡේදයේ දී ප්‍රතිවර්තනය නොවනු ඇත.

හානිකරණයන් පිළිබඳ විමසා බැලීම සඳහා වාර්ෂිකව නොහොත් නිරන්තරව කීර්තිනාමය සමාලෝචනය කෙරේ. යම් යම් අවස්ථාවලදී හෝ එවැනි තත්ත්වයන් තුළ දී එබඳු සිදුවීම් හෝ වෙනස්වීම් පෙන්වා දෙනු ලබයි නම්, ධාරිත අගය හානිකරණයවනු ඇත. හානිකරණය විමසා බැලීමේ අරමුණු සඳහා ව්‍යාපාර සංයෝජනයේ දී අත්පත් කරගන්නා ලද කීර්තිනාමය අත්පත්කරගත් දින පටන් බැංකුවේ මුදල් උත්පාදන ඒකකය හෝ ඒකක සමූහය වෙන්කරනු ලබයි. එම ඒකකවලට අත්පත්කරගනු ලැබූ අයගේ වෙනත් වත්කම් හා වගකීම් පවරනුලැබූව ද යනබව නොතකා, සංයෝජනයේ බැංකු ඒකක වෙතින් ඉහතකී ඒකක ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂාකෙරේ. කීර්තිනාමය වෙන්කර දෙනු ලැබූ සෑම ඒකකයක්ම, බැංකු තුළ පහළ ම තලයක් නියෝජනය කරයි. එහිදී කීර්තිනාමය අභ්‍යන්තර කළමනාකරණ අරමුණු සඳහා අධීක්ෂණය කරනු ලැබේ. එසේ ම, SLFRS හි 'මෙහෙයුම් ඛණ්ඩ' යන්නට අනුකූලව එම මෙහෙයුම් ඛණ්ඩ වඩා විශාල නොවේ.

කීර්තිනාමය මුදල් උත්පාදන ඒකකයක් (හෝ ඒකක සමූහයක්) ලෙස සැකසෙන අතර, එය ඒකකය තුළ මෙහෙයවුම් කොටසක් බවට පත්වේ. මෙහෙයවුම් කටයුතු සමග හවුල්වන කීර්තිනාමය මෙහෙයවුම් ධාරිත ප්‍රමාණයතුළ අන්තර්ගතවෙයි. එය සිදුවන්නේ මෙහෙයවුම් කළමනාකරණය මත ලාභය හෝ අලාභය නිගමනය කිරීමේ දී ය. මෙම අවස්ථාවේ කීර්තිනාමය ක්‍රියාත්මකවීම මනිනු ලබන්නේ ක්‍රියාවට නැගුණු මෙහෙයවුමේ යෙදුණු මුදල් උත්පාදන ඒකකවල කොටසේ සාපේක්ෂ වටිනාකම මතයි.

පාලිත සමාගම් විකුණනවිට විකුණන මිලත් ශුද්ධ වත්කම් අතරත් වෙනස උපචිත පරිවර්තන වෙනස්කම් වැඩිකරන අතර, කීර්ති නාමය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගැණේ.

## 4.14 මූල්‍ය ඇප සහතික

**හඳුනාගැනීමේ පදනම**

සාමාන්‍ය ව්‍යාපාරික පරිසරය තුළ දී ණයවර, ඇප සහතික සහ ප්‍රතිග්‍රහණය හා අදාළ ලිපි වලින් සමන්විත මූල්‍ය ඇප සහතික බැංකුව විසින් දෙනු ලබයි. මූල්‍ය ඇප සහතික ආරම්භයේ දී ලද ආධික්‍යයන් ලෙස සාධාරණ අගය මත මූල්‍ය ප්‍රකාශනවල (අනෙකුත් වගකීම් ඇතුළත) හඳුනාගනු ලබයි. ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, සෑම ඇප සහතිකයක් ම යටතේ බැංකුවේ වගකිමෙන්, ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් සමුච්චිත ක්‍රමක්ෂය කිරීම අඩුකර, ආරම්භයේදී හඳුනාගත් අගය සහ ඇප සහතිකවල ප්‍රතිඵලයක් වශයෙන් පවත්නා මූල්‍ය වගකීම් නිසා, ගෙවීමට අවශ්‍යවන වියදම්වල ප්‍රශස්ත ඇස්තමේන්තු අගයන් යන දෙකෙන් වඩා වැඩි වටිනාකම මත අගය කෙරේ.

**මිණුම්කරණය**

මූල්‍ය ඇප සහතික හා සම්බන්ධ වගකීම්වල වැඩිවීම්, ණය අලාභ වියදම් යටතේ ආදායම් ප්‍රකාශනය තුළ වාර්තාකරනු ලැබේ. ලැබී ඇති ආධික්‍යයන්, ඇප සහතිකයේ ජීව කාලය මත සරල මාර්ග ක්‍රමයට ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශනයතුළ හඳුනාගනු ලබයි.

## 4.15 විශ්‍රාම ප්‍රතිලාභ

### 4.15.1 නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම

***4.15.1.1 1996 පෙර සේවයට බඳවාගත් සේවකයින් සඳහා විශ්‍රාම සැලැස්ම***

1996 ජනවාරි 1 දිනට පෙර සේවයට බැඳුණු ස්ථිර සේවකයින් වෙනුවෙන්, බැංකුව නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මක් ක්‍රියාත්මක කරයි. ඒ සඳහා වෙනම ම පරිපාලනය කරනු ලබන අරමුදලකට මූල්‍ය දායකත්වය ලබාදීම අවශ්‍යවේ. මෙම විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම යටතේ, ප්‍රතිපාදනය කරනු ලබන ප්‍රතිලාභවල වියදම, ප්‍රක්ෂේපිත ප්‍රතිලාභ ආයුගණනක ක්‍රමයක් භාවිතකරමින් වෙනම ම නිගමනය කරනු ලැබේ. ආයුගණක ලාභ හෝ අලාභ, මුදල් වර්ෂයතුළ ආදායම හෝ වියදම ලෙස මුලින් ම හඳුනාගනු ලබයි.

නිශ්චිත ප්‍රතිලාභ වත්කම් හෝ වගකීම් අඩුකිරීම් සහිත ව නිශ්චිත බැඳීම්වල වර්තමාන අගය අඩංගු කරන අතර, මෙතෙක් හඳුනාගෙන නැති ආයුගණක අලාභ, වත්කම්වල අගය හෝ මෙතෙක් හඳුනාගෙන නැති අතීත සේවා මිල හා සැලසුම, ප්‍රති බැරකිරීම් ලෙස ඇති කිසියම් ආර්ථික ප්‍රතිලාභයක, වර්තමාන මිල හෝ සැලැස්ම මගින් ඉදිරි දායකත්වය තුළ දී අඩුකිරීම්වලට සීමාවෙයි.

අවසානවරට ආයුගණක තක්සේරුව සිදුකර ඇත්තේ 2011 ජනවාරි 10 දින ඇමරිකානු ආයුගණක ඇකඩමියේ සාමාජික හා ආයුගණනය පිළිබඳ උපදේශක පියල් එස්. ගුණතිලක FSA (U S A) මහතා විසිනි. ඒ සඳහා භාවිත කරන ලද මූලික මූල්‍යමය උප කල්පනයන් පහත සඳහන් වේ.

| | |
|---|---|
| පොළිය/වට්ටම් අනුපාතය | වසරකට 10% |
| ජීවනාධාර දීමනාවේ වැඩිවීම | වසරකට 5% |
| සියලු ශ්‍රේණි සඳහා මූලික වැටුප් වැඩිවීම | වසරකට 7% |

පහත දැක්වෙන පදනම මත විශ්‍රාමගන්නා සේවකයින් සඳහා බැංකුව විශ්‍රාම වැටුප් ක්‍රමයක් සම්පාදනයකරයි.

විශ්‍රාම වැටුප් ලැබීමට සේවකයෙක් වසර 10 ක සේවය සම්පූර්ණ කළපසු සුදුසුකම් ලබයි.

සාමාන්‍ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 55 සම්පූර්ණවීම ය.

ඒ සඳහා ගෙවනු ලබන විශ්‍රාම වැටුප සේවා කාලය මත පහත සඳහන් පරිදි ගණනය කෙරේ.

| සේවා කාලය | නියමිත විශ්‍රාම වැටුප |
|---|---|
| i. වසර 10 සිට 20 දක්වා | අවසන්වරට ලද වැටුපෙන් 80% |
| ii. වසර 21 සිට 29 දක්වා | 80% + වසර 20 කට අධික එක් සේවා වසරක් සඳහා, අවසාන වරට ලත් වැටුපෙන් 1% ක් බැගින් |
| iii. වසර 30 සහ ඊට වැඩි | අවසන්වරට ලද වැටුපෙන් 90% |

විශ්‍රාම වැටුප් අරමුදලේ ගිණුම් වෙනම පවත්වාගෙන යනුලබන අතර, එය ස්වාධීන බාහිර විගණකයින් විසින් කරනු ලබන වාර්ෂික විගණනයට යටත්වේ. ගිණුම් ප්‍රකාශන මෙන් ම, විගණක වාර්තාද ඉදිරිපත්කරනු ලබන අතර, භාරකාර මණ්ඩලය විසින් ඒවා සමාලෝචනය කරනු ලබයි. මෙම ගිණුම්වල ප්‍රකාශන හා විගණක වාර්තා බැංකුවේ නිරාවරණ සමාලෝචනය සඳහාද ඉදිරිපත් කරනුලබයි. ඊට හේතුවනුයේ, අපේක්ෂිත මට්ටම්වලට එහි අරමුදල් සැපයීම සහතිකකිරීමේ බැඳීම බැංකුවට ඇති හෙයිනි. විශ්‍රාමිකයා ජීවත්වනතාක් විශ්‍රාම වැටුප් මාසිකව ගෙවීමට නියමිත ය.

#### *4.15.1.2 පාරිතෝෂිකය*

1996 ජනවාරි 1 දිනෙන් පසුව බැංකුවට බැඳුනු සේවකයින්, සේවයෙන් ඉවත්වූ පසු, 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත යටතේ පාරිතෝෂික ලැබීමට සුදුසුකම් ලබති. එසේ නැතහොත්, යෝජිත පශ්චාත් 1996 නව විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයට එක්වීමට මනාපය පළකළ හැකි අතර, එසේ වූ විට පාරිතෝෂිකයට ඇති අයිතිය අහෝසිවෙයි.

විශ්‍රාම ගැනිම හැරුණුවිට, අන් ආකාරයකින් සේවය අවසන්කළ සෙසු සේවකයින්, 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත යටතේ, සේවකයෙකු සිය සේවය අත්හිටවූ වර්ෂයේ අවසාන මාසයට අදාළ දළ වැටුපෙන් එක් අර්ධයක අනුපාතය මත, එක දිගට සේවයකළ සෑම වසරකට ම, වසර 5 කට වැඩිකාලයක් සේවය කරඇති සේවකයින් සඳහාවූ අත්හැරයාමේ දී ලබාදෙන පාරිතෝෂිකය ලැබීමට සුදුසුකම්ලබති.

බැංකුව එවැනි පාරිතෝෂික ගෙවීමේ වගකීම් වෙනුවෙන්, මාසික ව වෙන්කිරීම් සිදුකරන අතර, මෙම වටිනාකම බැංකුවේ ශේෂ පත්‍රයේ පිළිබිඹුවෙයි. 2007 දෙසැම්බර් 31 දින දක්වා බැංකුව පාරිතෝෂික සූත්‍රය මත මුදල් වෙන්කිරීම් සිදුකර තිබේ. එසේවුව ද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව, බැංකුව විසින් ආයුගණක තක්සේරුවක් මත පාරිතෝෂික බැඳීම් වෙනුවෙන් ප්‍රමාණවත් සම්පාදන සිදුකරනු ලැබ ඇත.

බැංකුවේ පාලිත හා ආශ්‍රිත සමාගම් ද 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත යටතේ, පාරිතෝෂික දීමනා සම්පාදනය කරයි. එම සමාගම්වල වසරකට වැඩිකාලයක් සේවය සම්පූර්ණකළ සේවකයින් වෙනුවෙන් අවශ්‍ය පාරිතෝෂික වෙන්කිරීම් සිදුකරනු ලැබ තිබේ. මෙම වගකීම් වෙනුවෙන්, බාහිර ලෙස මුදල් යෙදවීමක් සිදු නොවේ.

### 4.15.2 නිශ්චිත දායකත්ව සැලසුම

බැංකුව නිශ්චිත දායකත්ව සැලසුමක්ද පරිපාලනය කරයි. මෙම සැලසුමට කෙරෙන දායකත්වය සේවකයන් විසින් බැංකුවට ලබාදෙන සේවාවන්ට අනුව සිදු කෙරේ. මෙම දායක මුදල් 'පුද්ගල වියදම්' යටතේ වියදම් ලෙස ගිණුම් ගත කෙරේ. නොගෙවූ දායක මුදල් බැරකම් ලෙස සැලකෙන අතර ඒ අනුව ගිණුම් ගත කෙරේ. මේ යටතේ බැංකුව පහත යෝජනා ක්‍රම සඳහා දායකත්වය ලබාදෙයි.

#### *4.15.2.1 සේවක අර්ථසාධක අරමුදල*

අතිකාල දීමනා හැර, සේවකයාගේ මාසික දළ වැටුපෙන් බැංකුව විසින් 12% ක් ද, සේවකයා විසින් 8% ක් ද වශයෙන් මෙම අරමුදලට දායකත්වය සපයනු ලැබේ. බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල සේවක අරමුදල් පනත යටතේ අනුමත අරමුදලකි. එය අභ්‍යන්තර ලෙස පවත්වාගනු ලැබේ.

#### *4.15.2.2 සේවක භාරකාර අරමුදල*

සේවක භාරකාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වාගෙනයනු ලබන සේවක භාරකාර අරමුදලට, අතිකාල දීමනා හැර, සේවකයාගේ මාසික දළ වැටුපෙන් 3% ක දායකත්වයක් බැංකුව විසින් සපයනු ලබයි.

### 4.15.3 1996 පසු සේවයට බඳවා ගත් සේවකයින් සඳහා විශ්‍රාම සැලසුම

මුදල් අමාත්‍යංශය විසින් අනුමතකරනලද පරිදි, බැංකුව 1996 ජනවාරි 1 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුණු ස්ථිර සේවකයින් සඳහා, නව විශ්‍රාම දීමනා යෝජනා ක්‍රමයක් සැලසුම්කිරීම බොහෝදුරට අවසන්කර ඇත. මේ නව යෝජනාක්‍රමය සඳහා ආරම්භක නැතහොත් බීජමය මුදල් ලෙස රුපියල් මිලියන 198 ක පාරිතෝෂික මුදලක් වෙන්කර තිබේ. ඊට අමතරව රුපියල් මිලියන 854 ක් මේ අරමුදලට එකතුකර ඇති අතර, 2012 දෙසැම්බර් 31 දිනට එහි එකතුව රුපියල් මිලියන 1,052 කි. මෙම ප්‍රමාණය ආයු ගණනක තක්සේරුවක් භාවිතකරමින් රැස්කර තිබේ. මෙම විශ්‍රාම දීමනා යෝජනාක්‍රමයට සුදුසුකම් ලැබූ සේවකයින් 4,187 දෙනාගෙන් 3,300 කට ආසන්න ඉල්ලුම්පත් සංඛ්‍යාවක් බැංකුව වෙත ලැබී ඇත.

### 4.15.4 වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය (පූර්ව 1996)

මෙම යෝජනාක්‍රමය යටතේ අනාගත බැඳීම් සපුරාලීමට අරමුදලක්, බැංකුව විසින් වෙනම ම පවත්වාගෙන යනු ලබයි. එය සුදුසුකම් ලත් ආයුගණක විශේෂඥයින්ගේ උපදෙස්මත ක්‍රියාත්මකවෙයි.

### 4.15.5 පශ්චාත් සේවා වෛද්‍ය ප්‍රතිලාභ

බැංකුව විසින් අනුමතකරනලද යෝජනාක්‍රමයක් පදනම්කරගනිමින්, අවශ්‍යතා උද්ගතවන පරිදි භාවිතයට ගතහැකි ආකාරයේ, පශ්චාත් සේවා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් සඳහා බැංකුව වැය කරයි. අනාගත අසාමාන්‍ය වෛද්‍ය වියදම් සපුරාලීම මෙම වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයේ අරමුණ යි. අවස්ථානෝචිතව හා කළමනාකාරිත්වයේ අභිමතය අනුව මෙම අරමුදල භාවිතයට ගැණේ.

## 4.16 ප්‍රතිපාදන

අතීතයේ සිදුවූ (නෛතික හා අර්ථවත්) සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන්, වර්තමානයේ දී බැංකුවට වගකීමක් උද්ගතවූවිට ප්‍රතිපාදන හඳුනාගැනීමට සිදුවෙයි. එවැනි බැඳීම් නිරාකරණයකිරීමට යාමේ දී ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් සම්භාරයක ගලනයක් අත්දැකීමේ සම්භාව්‍යතාවක් එමගින් ඇතිවිය හැකි අතර, වගකීමේ ප්‍රමාණය අනුව විශ්වාසවන්ත ඇස්තමේන්තු ද සකස්කළ

හැකිවනු ඇත. ප්‍රතිපාදනයක් හා අදාළ වියදම්, ප්‍රතිපූරණයන්ගෙන් තොර ව, ආදායම් ප්‍රකාශයෙහි දැක්වෙනු ඇත.

## 4.17 බැඳීම් සහ අසම්භාව්‍යතා

සම්පූර්ණ වශයෙන් පැහැදිලිව තිබෙන වගකීම් නිගමනයකිරීමේ දී, ප්‍රත්‍යක්ෂ වශයෙන් පවත්නා අවදානම් ද ඊට ගණනය කෙරේ. වෙන් වශයෙන් හෝ අන් ආකාරයකින් හෝ බැංකුවේ වගකීම් සහිත පාලිත හෝ ආශ්‍රිත සමාගමක අවිනිශ්චිතතාවන්හි සහ ප්‍රාග්ධන වගකීම්වල බැංකුවේ කොටස ද, සුදුසු අනාවරණයන් සමග අන්තර්ගතකර ඇත.

අසම්භාව්‍යතා යනු අවිනිශ්චිත අනාගත වගකීම් ය. ඒවායේ ආර්ථික ප්‍රතිලාභ අසම්භාව්‍යවනවිට හෝ විශ්වසනීය ලෙස මැනියනොහැකි තැන්හි, වර්තමාන බැඳීම් නැතහොත් අවිනිශ්චිත අනාගත සිදුවීම් මගින් පමණක් ඒවායේ පැවැත්ම තහවුරුවනු ඇත. අවිනිශ්චිතතා පාදක බැඳීම්, මූල්‍ය තත්ත්ව වාර්තාවේ හඳුනාගනු නොලබන නමුත්, ඒවා දුරස්ථ නොවේනම් නිරාවරණය කරනු ලබයි.

## 4.18 බදු

### 4.18.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බදු වත්කම් හෝ වගකීම්වලට ඇතුළත්වනුයේ අදාළ මූල්‍ය වර්ෂය සහ පෙර වර්ෂ වෙනුවෙන් ආදායම් බදු කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් ලැබියයුතු හෝ එම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් ය. මෙම ප්‍රමාණයන් ගණනය සඳහා යොදා ගැණෙනුයේ, ශේෂ පත්‍ර දිනට පෙර වර්ෂවල බලපැවැත්වූ හෝ එම දිනට බලපැවැත්වෙන බදු නීතිය යි. ඒ අනුව, 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන හා ඒ හා අදාළව සිදුකර ඇති සංශෝධන සමග අනුකූලවන පරිදි, බදුකරණ අරමුණු ගලපා, වර්ෂයේ ලාභ පදනම මත බදුකරණ ප්‍රතිපාදන සකස්කර ඇති අතර, නිශ්චිත අනුපාතිකයන් අනුව මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 14 යටතේ දක්වා ඇත.

### 4.18.2 විලම්බිත බදුකරණය

මූල්‍ය වාර්තාකරණය සඳහා යොදාගත් වත්කම්වල ඉදිරියට ගෙන එනු ලැබූ වටිනාකම් සහ ශේෂ පත්‍ර දිනට බදු පදනම මත ගණනයකළ වත්කම් සහ වගකීම්වල වටිනාකම අතර උද්ගතවන තාවකාලික අසමානතාවන් වෙනුවෙන් විලම්බිත බදු ප්‍රතිපාදනයන් සිදුකරනු ලබයි.

#### *4.18.2.1 විලම්බිත බදු වගකීම්*

පහත දැක්වෙන අවස්ථා කිහිපයකදී හැර, අනෙක් සෑම අවස්ථාවකදී ම උද්ගතවන තාවකාලික අසමානතාවන් සඳහා විලම්බිත බදු වගකීම හඳුනාගනු ලැබේ.

- ව්‍යාපාර සංයෝජනයක් නොවන අවස්ථාවකදී සිදුවන ගනුදෙනුවක් තුළින් උද්ගතවන, වත්කම් හෝ වගකීම් හා මූලිකව හඳුනාගත් කීර්තිනාමයක් නිසා, එම ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම්කරන ලාභයට හෝ බදු අයකළහැකි ලාභයට හෝ අලාභයට බලපෑමක් සිදු නොවන්නේනම්, සහ
- බදු අයකළහැකි තාවකාලික අසමානතාව උද්ගතවනුයේ, පාලිත හා ආශ්‍රිත සමාගමක ආයෝජනයේ ප්‍රතිඵලයක් සහ එම අඩුකළහැකි තාවකාලික අසමානතාව නැවත සිදුවීම පාලනයකළ හැකිවනසේනම්, නැතහොත්, නුදුරු අනාගතයේ දී එම තාවකාලික අසමානතාව නැවත සිදුනොවනබවට නිගමනය කළහැකිනම්, සහ එම බදු අයකළහැකි ලාභය තාවකාලික අසමානතාවන්ට එරෙහිව යොදාගත හැකිවන්නේ නම්

#### *4.18.2.2 විලම්බිත බදු වත්කම්*

සියලුම අඩුකළහැකි ශේෂයන් සඳහා විලම්බිත බදු වත්කම් හඳුනා ගැණේ. ඉදිරියට ගෙනයනලද භාවිත නොකළ බදු ලාභ සහ අලාභ හා බදුඅයකළ හැකි ලාභ තිබෙන්නේයයි නිගමනය වන්නේ නම්, පහත දැක්වෙන අවස්ථා කිහිපයකදී හැර, අනෙක් සෑම අවස්ථාවකදී ම, එම බදු අඩුකළ හැකි තාවකාලික අසමානතාවන් සහ ඉදිරියට ගෙන එනු ලැබූ භාවිත නොකළ බදු බැර හා බදු අලාභ සඳහා යොදාගතහැකිනම්, ඒවා විලම්බිත බදු වත්කම්ලෙස හඳුනා ගැණේ.

- ව්‍යාපාර සංයෝජනයක් නොවන අවස්ථාවකදී වත්කම් හෝ වගකීම් මූලිකව හඳුනාගැනීමට, අදාළ ගනුදෙනුවකදී උද්ගතවන, අඩුකළ හැකි තාවකාලික අසමානතාවක් එම ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයකළහැකි ලාභයට හෝ අලාභයට බලපෑමක් සිදු නොවන්නේනම්, සහ
- පාලිත හා ආශ්‍රිත සමාගමක ආයෝජන සමග අදාළවන බදුඅයකළ හැකි අසමානතාවන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර සලකාබලනවිට, නුදුරු අනාගතයේ දී ප්‍රතිවර්තනයවීමේ සම්භාව්‍යතාව සහිත තාවකාලික අසමානතාවන්වියහැකි ප්‍රමාණයට පමණක් විලම්බිත බදු වත්කම්ලෙස හඳුනා ගන්නේනම්

සෑම වාර්තාකරන දිනයකදීම, වත්කම් මත විලම්බිත බදුවල ධාරණ අගය සමාලෝචනය කරන අතර, විලම්බිත බදු වත්කම් සම්පූර්ණයෙන් ම හෝ කොටසක්ලෙස භාවිතකිරීමට හැකි, සැලකියයුතු බදු සහිත ලාභ ප්‍රමාණයක් තිබෙන බවට විශ්වසනීය ලෙස තීරණයකළ හැකිවිට, අදාළ ප්‍රමාණය දක්වා අගය අඩුකරනු ලැබේ. සෑම ශේෂ පත්‍ර දිනයකදිම හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් නැවත තක්සේරුකරන අතර, අනාගත බදු සහිත ලාභවලින් විලම්බිත බදු වත්කම් අයකරගතහැකි ප්‍රමාණයට ඒවා හඳුනා ගැණේ.

විලම්බිත බදු වත්කම් හා වගකීම් ගණනයේදී යොදාගනු ලබන්නේ, වත්කම් විකුණන හෝ වගකීම් නිදහස්කරන වසරට අදාළ බදු අනුපාතිකයන් ය. මේ සඳහා පදනම්වන්නේ ශේෂ පත්‍ර දිනට නීත්‍යානුකූල ලෙස ක්‍රියාත්මකවන හෝ කාල පරිච්ඡේදයට අදාළ බදු නීතිය හා බදු අනුපාතිකය යි.

### 4.18.3 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත (VAT)

2002 අංක 14 දරන වටිනාකම එකතුකළ බදු (VAT) පනතේ 25 (අ) ඡේදයට හා එහි සංශෝධනයන්ට අනුකූලව, බැංකුවේ සම්පූර්ණ වටිනාකම් එකතුව 12% ක බද්දකට යටත්විය.

### 4.18.4 ආර්ථික සේවා ගාස්තු (ESC)

2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතෙහි විධිවිධානයන්ට අනුව, වගකීමට යටත් පිරිවැටුම මත, විශේෂිත අනුපාතයන් අනුගමනයකරමින්

ආර්ථික සේවා ගාස්තු ගෙවීමට බැඳේ. ගෙවා ඇති එම ගාස්තු ආදායම් බදු වගකීම්වලින් අඩුකළ හැකි ය. ආදේශ නොකළ ඕනෑම වගකීමක්, පසුව එළැඹෙන වසර හතර තුළ ඉදිරියට රැගෙන ඒමටත්, ඉදිරියේ දී ගෙවීමට ඇති ආදායම් බදුවලට එරෙහිව හිලව්කිරීමටත් පිළිවන.

**4.18.5 ලාභාංශ මත රඳවාගැනීමේ බදු (WHT)**

දේශීය පාලිත සමාගම්වල බදු අයකළහැකි ලාභයෙන් බෙදාහල ලාභාංශ, ආරම්භයේ දී 10% ක අඩුකිරීමක් ආකර්ෂණය කරන අතර, එය බැංකුවේ බදු වගකීම්වලට එරෙහිව හිලව්කිරීමට භාවිතකළ නොහැකි ය. ඒ අනුව ආරම්භයේ දී අඩුකළ රඳවාගැනීමේ බදු ඒකාබද්ධ ගැලපීම්ලෙස ඒකාබද්ධ මූල්‍ය වාර්තාවේ පාලිත සමාගම්වල බදු වියදමට එකතුකරනු ලබයි.

## 4.19 ආදායම් හා වියදම් හඳුනාගැනීම

අනාගත ආර්ථික ලාභ බැංකුවට ගලා එන බවට සම්භාව්‍යතාවක් ඇත්නම්, සහ ආදායම් විශ්වසනීය ලෙස අගය කළහැකිතරමට පමණක් ආදායම් හඳුනාගනු ලැබේ. ආදායම් හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන නිශ්චිත හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරා තිබිය යුතු ය.

**4.19.1 පොළී සහ ඒ හා සමාන ආදායම් හා වියදම්**

හිලව්කරන පිරිවැය මත අගයකරනලද සියලුම මූල්‍ය උපකරණ සඳහා 'විකිණීම සඳහා පවතින' ලෙස වර්ගකර ඇති, පොළී සහිත මූල්‍ය වත්කම් සහ සාධාරණ අගය මගින් ලාභ අලාභ වනලෙස නම්කරන ලද මූල්‍ය උපකරණ, සඵල පොළී අනුපාතිකය භාවිතකරමින් වාර්තාකරනු ලැබේ. සුදුසු පරිදි මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයුකාලය හෝ කෙටිකාලයක් මගින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම්, මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වගකීමේ ශුද්ධ ධාරණ අගයට වට්ටම්කරනුලබන අනුපාතිකය, එලදායී පොළී අනුපාතිකය වේ. මූල්‍ය උපකරණවල සියලුම ගිවිසුම්ගත කොන්දේසි (උදාහරණ: පෙරගෙවුම් උපකල්පන) මෙම ගණනයකිරීම සැලකිල්ලට ගනුලබන අතර, උපකරණයට සෘජුව ආරෝපනය කළහැකි සහ ඵලදායී පොළී අනුපාතිකයෙහි අවශ්‍ය කොටසක්වන, එහෙත් අනාගත ණය අලාභ නොවන, කිසියම් ගාස්තු හෝ වැඩිවන පිරිවැය මෙයට ඇතුළත්වේ.

හානිකරණ අලාභයක් හේතුකොටගෙන මූල්‍ය වත්කම් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක වාර්තාකරන ලද අගය වරක් අඩුකළහොත්, හානිකරණ අලාභ අගය සඳහා මුදල් ප්‍රවාහ වට්ටම්කිරීමට භාවිත කළ පොළී අනුපාතිකයවන පොළී ආදායම්, දිගටම හඳුනාගනු ලැබේ.

**4.19.2 ගාස්තු හා කොමිස් ආදායම**

ගනුදෙනුකරුවන්ට සපයන්නාවූ විවිධ පරාසයන්වල සේවාවන්ගෙන් බැංකුව ගාස්තු හා කොමිස් ආදායම් උපය යි. සේවය ඉටුකරනවිට ගාස්තු හා කොමිස් ආදායම හඳුනාගනී. යම් කාල පරිච්ඡේදයක් තිස්සේ සිදුකරන සේවා සැපයුම වෙනුවෙන් උපයන ගාස්තු ඒ කාලවකවානුව පුරා උපචිත වෙයි.

**4.19.3 ලාභාංශ ආදායම**

අදාළ ගෙවීම ලැබීමට ඇති අයිතිය තහවුරුවන අවස්ථාවේ ලාභාංශ ආදායම හඳුනාගනී.

**4.19.4 ශුද්ධ වෙළඳ ආදායම**

වෙළඳ කටයුතුවලින් ලද ප්‍රතිඵලවලට සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම් නිසා ඇතිවන සියලුම ලාභ සහ අලාභ සහ 'විකිණීම සඳහා රඳ සිටින' මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හා බැඳුනු ලාභාංශ ඇතුළත්වේ.

## 4.20 දේපල, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අලෙවියෙන් ලාභ/අලාභ

දේපල, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අලෙවියෙන් ලැබෙන ලාභ හෝ අලාභ, වෙළෙඳාම සිදුවූ කාල පරිච්ඡේදයේ දී හඳුනාගන්නා අතර, එය වෙනත් ආදායම් ලෙස වර්ගකරනු ලබයි.

## 4.21 ආංශික තොරතුරු වාර්තාකරණය

බැංකුවේ ආංශික තොරතුරු වාර්තාකරණය පහත සඳහන් මෙහෙයුම් ඛණ්ඩ මත පදනම්වෙයි.

බැංකු කටයුතු,

කල්බදු

සංචාරක හා

වෙනත්

ඒ හා අදාළ තොරතුරු අංක 47 දරන සටහනෙහි දක්වා ඇත.

## 4.22 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල (LKAS 7) 'මුදල් ප්‍රවාහ ප්‍රකාශන' යටතේ, මුදල් ප්‍රවාහ සැකසීමේ 'වක්‍ර ක්‍රමය' භාවිතකරමින් සිදුකෙරේ. මුදල්වල හඳුනාගත් ගණන්වලට බාධාවකින් තොරව පරිවර්තනය කළහැකි ඉහළ ද්‍රවශීලතා ආයෝජන, කෙටිකාලීනව සකස්වී ඇති මුදල් හා මුදල් සමාන දේ සහ මුදල් වටිනාකම වෙනස්වීමේ අල්ප අවදානමකට යටත්වෙයි, මුදල් හා මුදල් සමාන දේ ලෙස අන්තර්ගතවන්නේ අතැති මුදල්, බැංකුවල ඇති ශේෂ සහ ඉල්ලූවිට ලැබෙන හා කෙටි දැනුම්දීමකින් ලැබෙන මුදල් ය.

## 4.23 තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය

බැංකු කටයුතු පනතේ මග පෙන්වීම් අනුව, 2010 සැප්තැම්බර් 27 දින නිකුත්කළ පරිශිෂ්ට උපදෙස් වලට අනුකූලව, ලියාපදිංචියලත් සියලුම වාණිජ බැංකු, 2010 ඔක්තෝබර් 1 දින සිට ක්‍රියාත්මකවනපරිදි, මූල්‍ය නීති පනතෙහි 32 - A සිට 33 - E දක්වා ඇති ඡේද යටතේ නිකුත්කර තිබෙන 2010 අංක 1 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රම නීතිරීති යටතේ ක්‍රියාත්මකවන ලෙසට, මුදල් මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමයතුළ, තැන්පතු රක්ෂණයකිරීමේ අවශ්‍යතාවට යටත්වේ. රක්ෂණය කිරීමට අවශ්‍ය

තැන්පතු ලෙස, ඉල්ලුම්, කාලීන හා ඉතුරුම් තැන්පතු, බැඳීම් ඇතුළත්වන අතර, පහත සඳහන් අංශ බැහැරකරනු ලබයි.

- සාමාජික ආයතනයන්ට ඇති තැන්පතු වගකීම්
- ශ්‍රී ලංකා ආණ්ඩුව සතු තැන්පතු වගකීම්

බලපත්‍රලත් වාණිජ බැංකුවල ආයතනික පාලනවිධි පිළිබඳ ව 2007 අංක 11 දරන බැංකු පනත් මගපෙන්වීම්වල නිගමනයකර ඇති පරිදි අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට හා අදාළ වෙනත් පාර්ශ්වයන්ට ඇති -

- ප්‍රදානිත සෑම පහසුකම්වලටම එරෙහි සමපාර්ශ්වියලෙස රඳවාගත් තැන්පතුවල වගකීම

බැංකු පනතේ දැක්වෙන පරිදි, අත්හැරලන දේපල යන අර්ථයතුළට ගැණෙන තැන්පතු වගකීම් සහ මූල්‍ය සමාගම් පනතෙහි සඳහන් අයුරු අක්‍රීය තැන්පතු - මේවායේ අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකර ඇත.

ලියාපදිංචිය ලත් වාණිජ බැංකු, ක්‍රියාත්මකවන මුදල්වර්ෂයේ කටයුතුවල අවසානයට ඉතා ඉක්මණින් සිදුවන ලෙසට, බැංකු ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (CAR) 14% හෝ ඊට ඉහළින් බැංකුව පවත්වාගෙන යන්නේනම්, යෝග්‍ය තැන්පතු වගකීම් මත 0.10% ක කොටස් මුදලක් (වාරිකයක්) ගෙවීමට අවශ්‍යවේ. තවද අනෙක් සියලු ලියාපදිංචියලත් (ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය 14% ට අඩු) බැංකු යෝග්‍ය වගකීම්වල සම්පූර්ණ සංඛ්‍යාවෙන් 0.125% ක ආධික්‍යයක් සෑම කාර්තුවක් ම අවසානයේ ගණනයකර කාර්තුව අවසානයෙන් දින 15 ක් ඇතුළත ගෙවීමට අවශ්‍යවෙයි.

## 4.24 ආයෝජන අරමුදල් ගිණුම

2011 වසරේ අයවැය යෝජනා අනුව, බැංකු ව්‍යාපාරයේ හෝ මූල්‍ය සේවාවන්හි නිරත සෑම පුද්ගලයෙකු හෝ කොටස්කරුවෙකු ආයෝජන අරමුදල් ගිණුමක් (IFA) ස්ථාපිතකොට පවත්වාගතයුතු ය.

2011 ජනවාරි 01 දිනෙන් පසු නිසිපරිදි හා වේලාවට බදුගෙවනු ලබනවිට බලපත්‍රලත් වාණිජ බැංකු පහත දැක්වෙන අරමුදල් ආයෝජන අරමුදල් ගිණුමට මාරුකිරීමටත් බැංකුව තුළ එවන් අරමුදලක් ගොඩනැගීමටත් ක්‍රියාකිරීම අවශ්‍ය වෙයි.

- එකතුකළ වටිනාකම මත බදු ගෙවීම සඳහා එම බදු පනතෙහි විශේෂිතව දක්වා ඇති නියමිත දිනවලදී ආදායම් බදු ගෙවීම සඳහා ගණනයකළ ලාභයෙන් 8% ක්
- බදුවල ස්වයං තක්සේරු ගෙවීම සඳහා දේශීය ආදායම්බදු පනතෙහි 113 දරණ ඡේදයේ විශේෂිතව දක්වා ඇති දිනවලදී ආදායම්බදු ගෙවීම සඳහා බදු ගණනයකිරීමට පෙර ලාභයෙන් 5% ක්

ඉහත ගිණුමේ ඇති මුදල්, දීර්ඝකාලීන (වසර 5 කට වැඩි) යෝජනාක්‍රම සඳහා සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායක ණය සඳහා වරණීය පොළී අනුපාතය මත භාවිතකළ යුතු ය.

## 4.25 සංසන්දනාත්මක තොරතුරු

වඩාත් ගුණාත්මක ඉදිරිපත්කිරීමක් සම්පාදනයකිරීමේ අරමුණෙන් ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත්කිරීම් තහවුරුකිරීමට යම් තැනෙක අවශ්‍යවන්නේ ද, ඒ අරමුණෙන් සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කර ඇත.

## 5. නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs සහ LKASs) සංක්‍රමණයවීම පිළිබඳ පැහැදිලිකිරීම්

සටහන් අංක 2.2 යටතේ සඳහන් ව ඇති පරිදි, මූල්‍ය ප්‍රකාශ දැන් සකස් කරනු ලබනුයේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති, නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs සහ LKASs යන දෙකට ම) අනුකූලව ය. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය පිළිබඳ සංසන්දනාත්මක තොරතුරු සහ 2011 ජනවාරි 01 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ආරම්භක ප්‍රකාශය පිළියෙළ කිරීමේ දී, සටහන් අංක 4 යටතේ සඳහන් වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් උපයෝගී කරගනු ලැබ තිබේ. SLFRS සහ LKAS යොදාගැනීමෙන් (කලින් පැවති SLAS අනුව සකස් කරන ලද) පෙර වසරවල වාර්තා කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශයන්හි වෙනස්කම්/ගැලපීම් කරන්නට සිදුවිණි. පහත දැක්වෙන සටහන් හා වගුවලින් එම සංක්‍රමණයේ බලපෑම් හෝ ප්‍රථමවරට උපයෝගී කරගැනීමේ බලපෑම් පැහැදිලි කෙරේ.

### 2011.01.01 දිනට හිමිකම් වෙනස්වීම සැසඳීම

රු. '000

| 2011 ජනවාරි 01 දක්වා | සටහන | බැංකුව<br>පෙර පැවති SLASs | බැංකුව<br>SLAS ක්‍රමයට සංක්‍රමණයේ ප්‍රතිඵල | බැංකුව<br>නව SLASs | සමූහය<br>පෙර පැවති SLASs | සමූහය<br>SLAS ක්‍රමයට සංක්‍රමණයේ ප්‍රතිඵල | සමූහය<br>නව SLASs |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | අ | 46,356,928 | (29,088,418) | 17,268,510 | 48,848,408 | (29,330,257) | 19,518,151 |
| ශ්‍රී.ල.ම.බැ. සමග පවත්නා ශේෂය | | 26,739,341 | – | 26,739,341 | 26,739,341 | – | 26,739,341 |
| බැංකු වල පවතින තැන්පතු | | – | – | – | – | – | – |
| වෙළඳාම සඳහා රඳවාගෙන ඇති වෙනත් මූල්‍ය වත්කම් | | 20,975,857 | – | 20,975,857 | 21,033,924 | – | 21,033,924 |
| ණය හා ලැබිය යුතු දෑ - බැංකු | ආ | – | 53,268,853 | 53,268,853 | – | 53,268,853 | 53,268,853 |
| ණය හා ලැබිය යුතු දෑ - අනෙකුත් ගනුදෙනුකරුවන් | ඇ | 357,336,421 | 1,257,219 | 358,593,640 | 398,600,386 | 8,449,405 | 407,049,791 |
| මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින | ඈ | 444,506 | 116,924 | 561,430 | 544,516 | 55,824 | 600,340 |
| මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින | ඉ | 48,978,998 | 1,231,128 | 50,210,126 | 48,978,998 | 1,974,275 | 50,953,273 |
| පරිපාලිතයින් තුළ ආයෝජන | | 1,519,950 | – | 1,519,950 | – | – | – |
| ආශ්‍රිතයින් තුළ ආයෝජන | | 155,500 | – | 155,500 | 248,830 | – | 248,830 |
| ශ්‍රී ලංකා රජය - ප්‍රතිව්‍යුහගත කිරීම් බැඳුම්කර | ඊ | 7,323,000 | (7,323,000) | – | 7,323,000 | (7,323,000) | – |
| ඇමරිකානු ඩොලර් - සංවර්ධන බැඳුම්කර | උ | 17,256,725 | (17,256,725) | – | 17,256,725 | (17,256,725) | – |
| කීර්තිනාමය සහ අස්පෘෂ්‍ය වත්කම් | | 196,636 | – | 196,636 | 559,203 | – | 559,203 |
| දේපළ, පිරියත හා උපකරණ | | 7,861,555 | (995,403) | 6,866,152 | 9,223,575 | (996,610) | 8,226,965 |
| ආයෝජන දේපළ | | – | 414,403 | 414,403 | – | 414,403 | 414,403 |
| පෙරගෙවුම් කල්බදු | | 326,517 | – | 326,517 | 326,517 | – | 326,517 |
| විලම්බිත බදු වත්කම් | | 62,455 | – | 62,455 | 73,381 | 2,654 | 76,035 |
| වෙනත් වත්කම් | ඌ | 12,081,440 | (2,133,767) | 9,947,673 | 16,059,671 | (1,610,679) | 14,448,992 |
| **මුළු වත්කම්** | | 547,615,829 | (508,785) | 547,107,045 | 595,816,475 | 7,648,142 | 603,464,618 |

රු. '000

| *2011 ජනවාරි 01 දක්වා* | සටහන | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පෙර පැවති SLASs | SLAS ක්‍රමයට සංක්‍රමණයේ ප්‍රතිඵල | නව SLASs | පෙර පැවති SLASs | SLAS ක්‍රමයට සංක්‍රමණයේ ප්‍රතිඵල | නව SLASs |
| **බැංකුවලට ගෙවීම්** | | | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | එ | 2,454,883 | 3,700,354 | 6,155,237 | 2,454,883 | 34,268,386 | 36,723,268 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | ඒ | 462,140,255 | 8,829,474 | 470,969,729 | 463,727,842 | 17,365,822 | 481,093,664 |
| වෙනත් ණයගැනීම් | ඔ | 36,677,163 | (3,684,869) | 32,992,294 | 67,459,886 | (34,467,592) | 32,992,294 |
| ප්‍රවර්තන බදු වගකීම් | | 1,527,448 | – | 1,527,448 | 2,133,133 | 111,170 | 2,244,303 |
| විලම්බිත බදු වගකීම් | | – | – | – | 36,564 | 515,427 | 551,991 |
| වෙනත් වගකීම් | ඕ | 18,977,772 | (7,924,758) | 11,053,014 | 27,233,541 | (8,512,066) | 18,721,475 |
| ණයකර | | 5,000,000 | – | 5,000,000 | 6,170,530 | (1,170,530) | 5,000,000 |
| **මුළු වගකීම්** | | 526,777,521 | 920,201 | 527,697,722 | 569,216,379 | 8,110,617 | 577,326,995 |
| **ස්කන්ධය** | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරුණු ප්‍රාග්ධනය | | 7,201,998 | – | 7,201,998 | 7,201,998 | – | 7,201,998 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | | 49,998 | – | 49,998 | 49,998 | – | 49,998 |
| රඳවාගත් ඉපයුම් | අඅ | 5,756,881 | (1,428,985) | 4,327,895 | 11,435,444 | (462,474) | 10,972,971 |
| වෙනත් සංචිතයන් | | 7,829,431 | – | 7,829,431 | 7,829,431 | – | 7,829,431 |
| අයිතිකරුවන්ගේ මුළු හිමිකම් | | 20,838,308 | (1,428,985) | 19,409,322 | 26,516,871 | (462,474) | 26,054,398 |
| පාලනයට යටත් නොවන | | – | – | – | 83,225 | – | 83,225 |
| **මුළු ස්කන්ධය** | | 20,838,308 | (1,428,985) | 19,409,322 | 26,600,096 | (462,474) | 26,137,623 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | 547,615,829 | (508,785) | 547,107,045 | 595,816,475 | 7,648,142 | 603,464,618 |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | | 131,397,539 | – | 131,397,539 | 131,397,539 | – | 131,397,539 |

## 2011.12.31 දිනට හිමිකම් වෙනස්වීම සැසඳීම

රු. '000

| *2011 දෙසැම්බර් 31 දක්වා* | සටහන | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පෙර පැවති SLASs | SLAS ක්‍රමයට සංක්‍රමණයේ ප්‍රතිඵල | නව SLASs | පෙර පැවති SLASs | SLAS ක්‍රමයට සංක්‍රමණයේ ප්‍රතිඵල | නව SLASs |
| **වත්කම්** | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | අ | 25,431,645 | (8,638,980) | 16,792,665 | 30,383,489 | (11,517,064) | 18,866,425 |
| ශ්‍රී.ල.ම.බැ. සමග පවත්නා ශේෂය | | 35,717,033 | – | 35,717,033 | 35,717,033 | – | 35,717,033 |
| බැංකු වල පවතින තැන්පතු | | 9,592,720 | 7,300,607 | 16,893,327 | 9,592,720 | 7,300,607 | 16,893,327 |
| වෙළඳාම සඳහා රඳවාගෙන ඇති වෙනත් මූල්‍ය වත්කම් | | 23,891,041 | – | 23,891,041 | 24,313,670 | (329,463) | 23,984,207 |
| ණය හා ලැබිය යුතු දෑ - බැංකු | ආ | – | 31,731,952 | 31,731,952 | – | 31,731,952 | 31,731,952 |
| ණය හා ලැබිය යුතු දෑ - අනෙකුත් ගනුදෙනුකරුවන් | ඇ | 464,812,240 | (3,156,481) | 461,655,759 | 540,307,612 | (5,432,393) | 534,875,219 |
| මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින | ඈ | 412,546 | 9,051,665 | 9,464,211 | 562,556 | 8,934,978 | 9,497,534 |
| මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින | ඉ | 45,461,567 | 841,489 | 46,303,056 | 45,461,567 | 2,336,869 | 47,798,436 |
| පරිපාලිතයින් තුළ ආයෝජන | | 1,419,950 | – | 1,419,950 | – | – | – |
| ආශ්‍රිතයින් තුළ ආයෝජන | | 273,100 | – | 273,100 | 377,196 | 50,000 | 427,196 |
| ශ්‍රී ලංකා රජය - ප්‍රතිව්‍යුහගත කිරීම් බැඳුම්කර | ඊ | 7,323,000 | (7,323,000) | – | 7,323,000 | (7,323,000) | – |
| ඇමරිකානු ඩොලර් - සංවර්ධන බැඳුම්කර | උ | 24,368,558 | (24,368,558) | – | 24,368,558 | (24,368,558) | – |
| කීර්තිනාමය සහ අස්පෘෂ්‍ය වත්කම් | | 100,807 | – | 100,807 | 450,412 | 10,395 | 460,807 |
| දේපළ, පිරියත හා උපකරණ | | 8,103,702 | (581,000) | 7,522,702 | 10,329,118 | (396,277) | 9,932,841 |
| ආයෝජන දේපළ | | 406,165 | – | 406,165 | 406,165 | – | 406,165 |
| පෙරගෙවුම් කල්බදු | | 325,224 | – | 325,224 | 325,224 | – | 325,224 |
| විලම්බිත බදු වත්කම් | | 186,884 | – | 186,884 | 248,787 | (53,053) | 195,734 |
| වෙනත් වත්කම් | ඌ | 15,250,971 | (5,858,183) | 9,392,788 | 18,411,268 | (5,133,918) | 13,277,350 |
| **මුළු වත්කම්** | | 663,077,154 | (1,000,491) | 662,076,663 | 748,578,376 | (4,188,925) | 744,389,451 |
| **වගකීම්** | | | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | ඔ | 72,799 | 43,278,842 | 43,351,641 | 72,799 | 81,060,845 | 81,133,645 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | ඔ | 539,861,539 | 10,364,909 | 550,226,448 | 548,033,399 | 24,688,255 | 572,721,654 |
| වෙනත් ණයගැනීම් | අඅ | 62,747,794 | (42,046,854) | 20,700,940 | 112,484,623 | (92,590,497) | 19,894,126 |
| ප්‍රවර්තන බදු වගකීම් | | 2,806,539 | – | 2,806,539 | 3,427,708 | (120,490) | 3,307,218 |
| විලම්බිත බදු වගකීම් | | – | – | – | 410,382 | (72,845) | 337,537 |
| වෙනත් වගකීම් | ආආ | 21,093,137 | (9,190,675) | 11,902,462 | 29,391,165 | (11,129,667) | 18,261,498 |
| ණයකර | | 10,000,000 | – | 10,000,000 | 12,072,830 | (2,072,830) | 10,000,000 |
| **මුළු වගකීම්** | | 636,581,808 | 2,406,222 | 638,988,030 | 705,892,906 | (237,227) | 705,655,679 |
| **ස්කන්ධය** | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරුණු ප්‍රාග්ධනය | | 7,201,998 | – | 7,201,998 | 7,201,998 | – | 7,201,998 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | | 1,892,591 | – | 1,892,591 | 1,892,591 | – | 1,892,591 |
| රඳවාගත් ඉපයුම් | ඇඇ | 6,226,025 | (3,406,712) | 2,819,313 | 17,525,519 | (3,816,867) | 13,708,652 |
| වෙනත් සංචිතයන් | | 11,174,731 | – | 11,174,731 | 11,507,929 | – | 11,507,929 |
| අයිතිකරුවන්ගේ මුළු හිමිකම් | | 26,495,346 | (3,406,712) | 23,088,633 | 38,128,037 | (3,816,867) | 34,311,170 |
| පාලනයට යටත් නොවන | | – | – | – | 4,557,433 | (134,830) | 4,422,603 |
| **මුළු ස්කන්ධය** | | 26,495,346 | (3,406,712) | 23,088,633 | 42,685,470 | (3,951,697) | 38,733,773 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | 663,077,154 | (1,000,491) | 662,076,663 | 748,578,376 | (4,188,925) | 744,389,451 |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | | 190,732,157 | – | 190,732,157 | 191,045,197 | – | 191,045,197 |

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය වෙනස්වීම සැසඳීම

රු. '000

| 2011 දෙසැම්බර් මස 31 දක්වා | සටහන | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පෙර පැවති SLASs | SLAS ක්‍රමයට සංක්‍රමණයේ ප්‍රතිඵල | නව SLASs | පෙර පැවති SLASs | SLAS ක්‍රමයට සංක්‍රමණයේ ප්‍රතිඵල | නව SLASs |
| පොළී ආදායම් | ඇ, ආආ | 61,822,469 | (34,031) | 61,788,438 | 74,115,009 | (467,978) | 73,647,031 |
| පොළී වියදම් | ඒ | (31,703,406) | 233,186 | (31,470,220) | (37,454,263) | 114,376 | (37,339,887) |
| **ශුද්ධ පොළී ආදායම** | | 30,119,063 | 199,155 | 30,318,218 | 36,660,746 | (353,602) | 36,307,144 |
| ගාස්තු හා කොමිස් ආදායම් | | 3,822,017 | (892,205) | 2,929,812 | 3,846,053 | (657,688) | 3,188,365 |
| ගාස්තු හා කොමිස් වියදම් | | (30,194) | (366,718) | (396,912) | (30,194) | (366,718) | (396,912) |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** | | 3,791,823 | (1,258,923) | 2,532,900 | 3,815,859 | (1,024,406) | 2,791,453 |
| වෙළෙඳාම් කටයුතු වලින් ලද ලාභය | ඇඇ | 714,765 | 207,564 | 922,329 | 714,765 | 181,976 | 896,741 |
| මූල්‍ය ආයෝජනයන්ගෙන් ශුද්ධ ලාභය/(අලාභය) | ඈඈ | (59,824) | 59,824 | – | (59,824) | 59,824 | – |
| සෙසු මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | | 2,037,184 | 620,491 | 2,657,675 | 1,832,379 | 364,310 | 2,196,689 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | 36,603,011 | (171,889) | 36,431,122 | 42,963,925 | (771,898) | 42,192,027 |
| ණය හානිය හා වෙනත් අලාභයන් | | (970,919) | 560,476 | (410,443) | 965,624 | (1,679,315) | (713,691) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | | 35,632,092 | 388,587 | 36,020,679 | 43,929,549 | (2,451,213) | 41,478,336 |
| සේවක මණ්ඩල වියදම් | ඇ, ඉඉ | (10,110,026) | (437,557) | (10,547,583) | (10,962,776) | (455,344) | (11,418,120) |
| වෙනත් වියදම් | | (7,777,348) | 338,306 | (7,439,042) | (9,169,288) | 652,779 | (8,516,509) |
| **එකතුකළ අගය මත බද්දට පෙර මෙහෙයුම් ලාභය** | | 17,744,718 | 289,336 | 18,034,054 | 23,797,486 | (2,253,778) | 21,543,707 |
| මූල්‍ය සේවාවන් මත එකතුකළ අගය මත බද්ද | | (2,434,052) | – | (2,434,052) | (2,828,053) | 93,605 | (2,734,448) |
| **එකතුකළ අගය මත බද්දට පසු මෙහෙයුම් ලාභය** | | 15,310,666 | 289,335 | 15,600,001 | 20,969,432 | (2,160,173) | 18,809,259 |
| ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස | | – | – | – | 33,663 | – | 33,663 |
| බදු වලට පෙර ලාභය | | 15,310,666 | 289,335 | 15,600,001 | 21,003,095 | (2,160,173) | 18,842,921 |
| බදු වියදම් | | (5,153,628) | – | (5,153,628) | (7,068,024) | 748,641 | (6,319,383) |
| **වසර සඳහා ලාභය** | | 10,157,038 | 289,335 | 10,446,373 | 13,935,071 | (1,411,533) | 12,523,538 |

## නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs සහ LKASs) සංක්‍රමණයවීම පිළිබඳ පැහැදිලිකිරීම්

2011 ජනවාරි 01, 2011 දෙසැම්බර් 31 දින වලට ස්කන්ධ ප්‍රතිසන්ධානගත කිරීම පිළිබඳ සහ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය පිළිබඳ සටහන්

### වත්කම්

**අ. මුදල් සහ මුදල් සමානයන්**

'මුදල් සහ කෙටිකාලීන අරමුදල්' ලෙස කලින් වාර්තා කරන ලද, ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත්වල සිදුකරනලද ආයෝජන, 'ණය සහ ලැබිය යුතු දෑ'- බැංකු යටතේ දැන් වාර්ගීකරණය කර ඇත.

**ආ. ණය සහ ලැබිය යුතු දෑ - බැංකු**

ශ්‍රී ලංකා රජයේ ප්‍රතිව්‍යුහගත කිරීම් බැඳුම්කරයන් හි සහ ඇමරිකානු ඩොලර් සංවර්ධන බැඳුම්කරයන් හි යොදන ලද ආයෝජනයන්, මෙම වර්ගය යටතේ දැන් වර්ගකරනු ලැබ තිබේ.

**ඇ. ණය සහ ලැබිය යුතු දෑ - අනෙකුත් ගනුදෙනුකරුවන්**

පෙර පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව, සිදුවූ අලාභ සඳහා නිශ්චිත ප්‍රමාණයක් ද, අනාගතයේ දී අපේක්ෂිත අලාභ සඳහා සාමාන්‍ය ප්‍රමාණයක් ද වශයෙන් ලැබීම් හානිකරයන් වෙනුවෙන් ප්‍රතිපාදන සැලසීම අවශ්‍ය විය. නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව, අනාගතයේ දී අපේක්ෂිත අලාභ හා අදාළ හානිකරයන් සාධකය පිළිගැනීමට අවසර නොමැති අතර, ඒ වෙනුවට, සිදුව ඇති අලාභයන් සම්බන්ධයෙන් වෛෂයික සාක්ෂ්‍ය මත සාමූහික මෙන්ම පුද්ගල පදනමින් ද සිදුකෙරෙන තක්සේරුකිරීම් අවශ්‍ය වන්නේ ය.

බැංකුවේ සියලුම නිලධාරීන්ට සහන පොළී අනුපාතිකයෙන් දෙනු ලබන සෑම ණයක් ම, නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව, ප්‍රාථමික වශයෙන් සාධාරණ අගය හා අදාළ ව හඳුනාගනු ලැබේ. ඒ මත ඉන් පසුව යෙදෙන පොලිය 'සඵල පොළී අනුපාතිකය' ලෙස හැඳින්වේ. සංක්‍රමනික දිනට ඇතිවන වෙනස පෙර ගෙවූ කාර්‍ය මණ්ඩල පිරිවැය ලෙස සලකන අතර, එය සේවක ණය ගෙවීමේ ඉතිරි කාලය පුරා ක්‍රමක්‍ෂය කරනු ලබයි.

**ඈ. මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින**

මිළ සඳහන් නොවූ කොටස් හා ණය සුරැකුම්පත් මත බැංකුව ආයෝජනය කරන අතර, මෙම වත්කම් දැන් 'මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින' යටතේ වර්ගීකරණය කර, වෙළඳපොළ අගය මත මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබ ඇත. පිරිවැය හා සාධාරණ අගය අතර වෙනස 'විස්තීර්ණ ආදායම්' ප්‍රකාශයෙහි සඳහන් වේ.

**ඉ. මූල්‍ය ආයෝජන - කල්පිරෙනතුරු දරා සිටින**

කල්පිරෙනතුරු රඳවාගැනීමට බැංකුවට හැකියාව හා අභිලාෂය ඇති මූල්‍ය වත්කම්, කල්පිරෙනතුරු රැඳවීම් ලෙස වර්ගකරනු ලබන අතර, සඵල පොළී අනුපාතික ක්‍රමය උපයෝගී කරගනිමින් ක්‍රමක්‍ෂය පිරිවැය මත මනිනු ලැබේ.

**ඊ. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිව්‍යුහගතකිරීමේ බැඳුම්කර**

කලින් ආයෝජන යටතට ගැණුනු ශ්‍රී ලංකා රජයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ බැඳුම්කර හා අදාළ ආයෝජන, 'ණය හා ලැබිය යුතු දෑ'- බැංකු යටතේ දැන් වර්ගීකරණය කරනු ලැබ ඇත.

**උ. ඇමරිකානු ඩොලර් සංවර්ධන බැඳුම්කර**

'ඇමරිකානු ඩොලර් සංවර්ධන බැඳුම්කර' ලෙස සිදුකරන ලද ආයෝජන, දැන් 'ණය හා ලැබිය යුතු දෑ'- බැංකු යටතේ වර්ගීකරණය කරනු ලැබ තිබේ.

**ඌ. වෙනත් වත්කම්**

කලින් වෙනත් වත්කම් ලෙස වාර්තාගතව තිබූ ණය, ලැබීම් හා ආයෝජන මත පොලිය ලැබීම්, දැන් 'ණය සහ ලැබිය යුතු දෑ'-අනෙකුත් ගනුදෙනුකරුවන් ලෙස වාර්ගීකරණය කරනු ලැබ ඇත.

**වගකීම්**

**ඒ. බැංකුවලට ගෙවියයුතු**

කලින් 'ණය ලබාගැනීම' ලෙස වාර්තාගතව තිබූ අන්තර්බැංකු වෙළෙඳපොළෙන් 'එක්ෂණ ණය ලබාගැනීම', දැන් 'බැංකුවලට ගෙවියයුතු' වශයෙන් වර්ගීකරණය කර ඇත.

**ඒ්. වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ**

සෙසු වගකීම් යටතේ කලින් වර්ග කර තිබූ පාරිභෝගිකයින්ට ගෙවියයුතු පොළිය, දැන් හිලව්කිරීමේ පිරිවැය කොටසක් වශයෙන් සෙසු පාරිභෝගිකයින්ට අයවියයුතු යන්නට එකතුකරනු ලැබ තිබේ. තවද, දීර්ඝකාලීන කල්පිරීමක් සහිත (අවුරුද්දකින් කල්පිරෙන ස්ථාවර තැන්පතු) තැන්පතු මත ලැබෙන පොළිය 'සඵල පොළී අනුපාතිකය' ක්‍රමවේදය මත හඳුනාගැණේ.

**ඔ. වෙනත් ණය ගැනීම්**

කලින් 'ණය ලබාගැනීම' ලෙස වාර්තාගතව තිබූ අන්තර්බැංකු වෙළෙඳපොළෙන් 'ඒක්ෂණ ණය ලබාගැනීම', දැන් 'බැංකුවලට ගෙවියයුතු' වශයෙන් වාර්ගීකරණය කර ඇත.

**ඕ. වෙනත් වගකීම්**

'වෙනත් වගකීම්' යටතේ හඳුනාගෙන තිබූ, තැන්පතු හා සෙසු ණයගැනීම් මත ගෙවියයුතු පොළිය, දැන් වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ සහ 'වෙනත් ණයගැනීම්' යටතේ ප්‍රතිවර්ගීකරණය කර තිබේ.

**අඅ. රඳවාගනුලැබූ ඉපයුම්**

සංක්‍රමණික දිනයවන 2011 ජනවාරි 01 දින නව (SLFRSs සහ LKASs) යොදාගැනීමේ ශුද්ධ ප්‍රතිඵලය 'රඳවාගනු ලැබූ ඉපයුම්' මගින් වාර්තාකෙරේ.

**ආදායම් ප්‍රකාශය**

**ආආ. පොළී ආදායම**

සහන පොළිය මත කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ලබාදෙන ලද ණය වෙනුවෙන් මුල් දින වෙනස ක්‍රමක්‍ෂය කිරීම මත ගෙවියයුතු පොලිය දැන් ගිණුම්ගත කෙරේ.

**ඇඇ. වෙළෙඳාම් කටයුතු වලින් ලද ලාභ/අලාභ**

භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත ප්‍රාග්ධන වාසියේ ප්‍රතිඵලය වන වෙනස කල්පිරීමතෙක් රඳවාගනු ලබන අතර, 'වෙනත් මෙහෙයුම් ආදායම්' යටතේ වර්ගීකරණය වී ඇත.

**ඈඈ. මූල්‍ය ආයෝජනයන්ගෙන් ශුද්ධ ලාභ/අලාභ**

මිල සඳහන් නොවූ ආයෝජනයන් සඳහා සාධාරණ අගය ගැලපීම් නිසා අගය අඩුවීම/වැඩිවීම දැන් විස්තීර්ණ ආදායම යටතේ වාර්තාවෙයි.

**ඉඉ. සේවක මණ්ඩල වියදම්**

සහන පොළිය මත කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ලබාදෙන ලද ණය වෙනුවෙන් සංක්‍රමණික වෙනස ක්‍රමක්‍ෂය කිරීම මත උද්ගතවන කාර්ය මණ්ඩල වියදම් පොළී ආදායම ලෙස දැක්වේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2012 රු. '000** | 2011 රු. '000 | **2012 රු. '000** | 2011 රු. '000 |

## 6. දළ ආදායම

| | **2012 රු. '000** | 2011 රු. '000 | **2012 රු. '000** | 2011 රු. '000 |
|---|---|---|---|---|
| පොළී ආදායම් | 85,241,301 | 61,788,438 | 100,844,385 | 73,617,879 |
| ගාස්තු හා කොමිස් ආදායම් | 3,541,589 | 2,929,812 | 4,289,051 | 3,188,365 |
| වෙළෙඳාමෙන් ශුද්ධ වාසිය | 2,072,563 | 922,329 | 2,095,881 | 896,741 |
| සෙසු මෙහෙයුම් ආදායම (ශුද්ධ) | 3,921,946 | 2,657,675 | 2,744,423 | 2,196,689 |
| මුළු දළ ආදායම | 94,777,398 | 68,298,254 | 109,973,739 | 79,899,674 |

## 7. ශුද්ධ පොළී ආදායම

| | **2012 රු. '000** | 2011 රු. '000 | **2012 රු. '000** | 2011 රු. '000 |
|---|---|---|---|---|
| **පොළී ආදායම** | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 162,947 | 185,504 | 162,947 | 185,504 |
| බැංකු වල ඇති තැන්පතු | 88,077 | 84,468 | 88,077 | 84,468 |
| වෙළෙඳාමට රඳවන ලද වෙනත් මූල්‍ය වත්කම් | 1,993,291 | 1,788,608 | 1,993,291 | 1,788,608 |
| ණය සහ ලැබිය යුතු දෑ - බැංකු | 2,098,733 | 2,602,479 | 2,098,733 | 2,602,479 |
| ණය සහ ලැබිය යුතු දෑ - අනෙකුත් ගනුදෙනුකරුවන් | 73,486,157 | 49,059,393 | 89,089,241 | 60,888,834 |
| මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින | 6,659,250 | 7,351,104 | 6,659,250 | 7,351,104 |
| මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින | 39,274 | – | 39,274 | – |
| කාර්ය මණ්ඩල ණය මත සංක්‍රමණික දින වෙනස | 713,573 | 705,296 | 713,573 | 705,296 |
| වෙනත් | – | 11,587 | – | 11,587 |
| **මුළු පොළී ආදායම** | 85,241,301 | 61,788,438 | 100,844,385 | 73,617,879 |
| **පොළී වියදම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | (2,811,482) | (588,892) | (2,811,482) | (588,892) |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ | (43,798,066) | (27,340,788) | (45,201,363) | (28,215,558) |
| වෙනත් ණයගැනීම් | (3,376,458) | (2,803,040) | (10,860,941) | (7,797,938) |
| නිකුත්කරන ලද ණය සුරැකුම්පත් | (1,337,500) | (737,500) | (1,337,500) | (737,500) |
| **මුළු පොළී වියදම්** | (51,323,506) | (31,470,220) | (60,211,285) | (37,339,887) |
| **ශුද්ධ පොළී ආදායම** | 33,917,795 | 30,318,218 | 40,633,099 | 36,277,991 |

## 8. ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම

| | බැංකුව 2012 රු. '000 | බැංකුව 2011 රු. '000 | සමූහය 2012 රු. '000 | සමූහය 2011 රු. '000 |
|---|---|---|---|---|
| **ගාස්තු හා කොමිස් ආදායම** | | | | |
| ණය | 2,433 | 3,145 | 554,795 | 133,172 |
| කාඩ්පත් | 219,283 | 171,950 | 219,283 | 171,950 |
| වෙළෙඳ හා සම්ප්‍රේෂණ | 1,374,740 | 1,135,972 | 1,374,742 | 1,135,972 |
| ආයෝජන බැංකුකරණය | 16,110 | 3,324 | 16,110 | 3,324 |
| තැන්පතු | 1,408,209 | 1,164,211 | 1,408,209 | 1,164,211 |
| ඇපකර | 418,318 | 370,920 | 418,318 | 370,920 |
| වෙනත් | 102,495 | 80,291 | 297,595 | 208,816 |
| | 3,541,589 | 2,929,812 | 4,289,051 | 3,188,365 |
| **ගාස්තු හා කොමිස් වියදම** | | | | |
| ණය | (578) | (8,639) | (578) | (8,639) |
| ආයෝජන බැංකුකරණය | (24,948) | (23,355) | (24,948) | (23,355) |
| ඇපකර | (8,953) | (6,041) | (8,953) | (6,041) |
| වෙනත් | (109,884) | (358,877) | (109,884) | (358,877) |
| | (144,364) | (396,912) | (144,364) | (396,912) |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** | 3,397,225 | 2,532,900 | 4,144,688 | 2,791,453 |

## 9. වෙළෙඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ලාභය/(අලාභය)

| | බැංකුව 2012 රු. '000 | බැංකුව 2011 රු. '000 | සමූහය 2012 රු. '000 | සමූහය 2011 රු. '000 |
|---|---|---|---|---|
| විදේශ විනිමය | 2,126,109 | 1,207,902 | 2,126,109 | 1,207,902 |
| ස්කන්ධ | (75,733) | (108,850) | (52,415) | (134,438) |
| වෙනත් | | | – | |
| මහ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රාග්ධන ලාභය | 127,795 | 133,486 | 127,795 | 133,486 |
| මහ භාණ්ඩාගාර බිල්පත් ප්‍රත්‍යාගණන ලාභය/(අලාභය) | 71,973 | (55,011) | 71,973 | (55,011) |
| මහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රත්‍යාගණන ලාභය/(අලාභය) | (177,580) | (255,197) | (177,580) | (255,197) |
| එකතුව | 2,072,563 | 922,329 | 2,095,881 | 896,741 |

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2012** | 2011 | **2012** | 2011 |
| | **රු. '000** | රු. '000 | **රු. '000** | රු. '000 |

## 10. වෙනත් මෙහෙයුම් ආදායම

| | බැංකුව 2012 | බැංකුව 2011 | සමූහය 2012 | සමූහය 2011 |
|---|---|---|---|---|
| ආයෝජන දේපළ මත ලාභය/(අලාභය) | | | | |
| දේපළ, පිරියත හා උපකරණ මත ලාභය/(අලාභය) | 22,566 | 7,353 | 80,878 | 24,302 |
| විදේශ විනිමය මත ප්‍රත්‍යාගණන ලාභය/(අලාභය) | 1,076 | (234,278) | 1,076 | (234,278) |
| ආයෝජනවලින් ලාභාංශ | | | | |
| - මිල සඳහන් නොවූ | 17,850 | 23,301 | 17,850 | 23,301 |
| - පරිපාලිතයින් හා ආශ්‍රිත සමාගම් | 1,622,503 | 833,250 | – | – |
| අත්හැරදැමූ බොල් ණය අයකර ගැනීම හා ප්‍රතිපාදන ප්‍රතිවර්තනය | 1,314,985 | 1,026,434 | 1,368,585 | 1,048,931 |
| වෙනත් | 942,966 | 1,001,615 | 1,276,033 | 1,334,433 |
| **එකතුව** | 3,921,946 | 2,657,675 | 2,744,423 | 2,196,689 |

## 11. ණය හා සෙසු අලාභයන් සඳහා හානිකරණය අයකිරීම්

| | බැංකුව 2012 | බැංකුව 2011 | සමූහය 2012 | සමූහය 2011 |
|---|---|---|---|---|
| ණය හා ලැබීම් | | | | |
| සෙසු පාරිභෝගිකයින්ට {සටහන් අංක 22 (ආ)} | (3,874,383) | (410,443) | (4,535,386) | (612,746) |
| මූල්‍ය ආයෝජන | | | | |
| | තංගල්ලසේවා මධ්‍යස්ථානය | 774 |
| | ලුණුගම්වෙහෙර | 941 |
| යාපනය | පුත්තූර් | 970 |
| | පන්ඩතිරිප්පු | 957 |
| | කොඩිකාමම් | 904 |
| | කෝපායි | 966 |
| | අලවෙඩ්ඩි | 744 |
| | ඉනුවිල් | 905 |
| | උරුම්පිරෙයි | 865 |
| | මනිපායි | 837 |
| | යාපනය නාවල පාර | 956 |
| | තිරුනෙල්වේලි | 855 |
| | කල්වියන්කාඩු | 964 |
| | මල්ලාකම් | 899 |
| | පුලෝලි | 963 |
| | උඩුප්පිඩි | 971 |
| කළුතර | ධර්ගා නගරය | 451 |
| | අළුබෝමුල්ල | 568 |
| | මොරගහහේන | 567 |
| | මිල්ලනිය | 588 |
| | ගෝනාපොල | 871 |
| | පොකුණුවිට | 989 |
| | හඳපාන්ගොඩ | 981 |
| | කළුතර මැද හන්දිය | 458 |
| | කළුතර උතුර | 476 |
| | කළුතර රෝහල් හන්දිය | 929 |
| | කටුකුරුන්ද | 749 |
| | අගලවත්ත | 447 |
| | දොඩම්ගොඩ | 968 |
| | පානදුර කෙසෙල්වත්ත | 462 |
| | එළුවිල | 591 |
| | මෝදරවිල | 811 |
| | මීගහතැන්න | 975 |
| | මොරොන්තුඩුව | 534 |

| කලාපය/ප්‍රදේශය | අනුබද්ධ සේවා මධ්‍යස්ථානය | සේවා මධ්‍යස්ථාන කේතය |
|---|---|---|
| මහනුවර | අඹතැන්න | 882 |
| | වෙලම්බොඩ | 894 |
| | ගලහ | 877 |
| | පල්ලේගම | 988 |
| | ගෙලිඔය | 491 |
| | ගම්පොල | 492 |
| | කුරුදුවත්ත | 493 |
| | කොළොන්ගොඩ | 490 |
| | මහයියාව | 885 |
| | මහනුවර අධිකරණ පරිශ්‍රය | 903 |
| | කුණ්ඩසාලෙ | 927 |
| | මහනුවර නීතිඥ සංකීර්ණය | 773 |
| | දිස්ත්‍රික් ලේකම් කාර්යාල සේවා මධ්‍යස්ථානය මහනුවර | 777 |
| | හේදෙනිය | 584 |
| | පොල්ගොල්ල | 984 |
| | දිගන | 455 |
| | හුළුගඟ | 920 |
| | මුරුතලාව | 583 |
| | පේරාදෙනිය විශ්ව විද්‍යාල සේවා මධ්‍යස්ථානය | 801 |
| | පොත්තපිටිය | 915 |
| | තලාතුඔය | 454 |
| | මාරස්සන | 858 |
| | මැදමහනුවර | 456 |
| | උඩුදුම්බර | 854 |
| | මඩවල කඩවීදිය | 898 |
| කෑගල්ල | නෙළුන්දෙනිය | 873 |
| | අම්තිරිගල | 943 |
| | මොරන්තොට | 435 |
| | දේවලගම | 489 |
| | මාවනැල්ල | 436 |
| | අළුත්නුවර | 946 |
| | පත්තම්පිටිය | 592 |
| | කරවනැල්ල | 936 |
| | ගලපිටමඩ | 488 |
| | හොරගස්මංකඩ | 518 |
| | අල්ගම | 935 |
| | කිතුල්ගල | 519 |
| කුරුණෑගල | බෝයවලාන | 851 |
| | වීර පොකුණ | 577 |
| | අඹන්පොල | 433 |
| | දඹදෙනිය | 474 |
| | කම්මාන | 985 |
| | බණ්ඩාර කොස්වත්ත | 848 |
| | කුඹුක්ගැටේ | 473 |
| | බොරළුවැව | 544 |
| | හිරිපිටිය | 850 |
| | මල්ලවපිටිය | 736 |
| | පිදුරුවැල්ල | 503 |
| | කුරු/මලියදේව | 737 |
| | දුම්මලසූරිය | 504 |
| | බිහල්පොල | 545 |
| | කඳානෙගෙදර | 566 |
| | උඩුබද්දාව | 868 |
| | කුරුණෑගල රයේ රෝහල් පරිශ්‍රය | 816 |
| | කුරුණෑගල නගර සභා පරිශ්‍රය | 947 |
| | පොල්පිතිගම | 414 |
| | නාගොල්ලාගම | 573 |
| | පන්නල | 475 |
| | පරගහදෙනිය | 432 |
| | කටුපොත | 405 |
| | නිකවැරටිය | 574 |
| | ගිරිඋල්ල | 886 |
| | රස්නායකපුර | 743 |
| | ගොඩවෙල | 502 |
| | මාතව | 735 |
| | පනාගමුව | 543 |
| | දොඩම්ගස්ලන්ද | 849 |
| | මාස්පොත | 878 |
| මාතලේ | ඉනාමළුව (සීගිරිය) | 499 |
| | මතුගම | 852 |
| | දේවහුව | 509 |
| | මාතලේ - ත්‍රිකුණාමල වීදිය | 406 |
| | මාතලේ ගොංගාවෙල | 559 |
| | පෝසිලේන් කම්හල් පරිශ්‍රය | 802 |
| | මඩවල උල්පොත | 853 |
| | යටවත්ත | 558 |

| කලාපය/ප්‍රදේශය | අනුබද්ධ සේවා මධ්‍යස්ථානය | සේවා මධ්‍යස්ථාන කේතය |
|---|---|---|
| | කයිකාවල | 887 |
| | වරකාමුර | 585 |
| | ලග්ගල - පල්ලෙගම | 466 |
| මාතර | තෙලිජ්ජවිල | 463 |
| | පල්ලෙගම | 918 |
| | කෝට්ටෙගොඩ | 487 |
| | කැකනදුර | 921 |
| | දෙයියන්දර | 459 |
| | කිරින්ද - පුහුල්වැල්ල | 930 |
| | මාකඳුර | 440 |
| | වල්ගම | 578 |
| | කොටුවේගොඩ | 408 |
| | යටියන | 443 |
| | රුහුණු විශ්ව විද්‍යාල ඒකකය | 825 |
| | මාතර රෝහල් පරිශ්‍රය | 945 |
| | පිටබැද්දර | 417 |
| | ඕපාත | 942 |
| | මාවරල | 579 |
| | මිරිස්ස | 468 |
| මොණරාගල | ඔක්කම්පිටිය | 857 |
| | මොනරාගල | 569 |
| | දඹගල්ල | 867 |
| | සියඹලාණ්ඩුව | 977 |
| | හම්බෙගමුව | 596 |
| | ඇතිලිවෙල | 976 |
| නුවරඑළිය | වටවල | 540 |
| | කොටගල | 427 |
| | දික්ඔය | 541 |
| | අෂ්කොට් | 552 |
| | වලපනේ | 581 |
| | කඳපොල | 516 |
| | නානුඔය | 582 |
| | තවලතැන්න | 876 |
| | හපුගස්තලාව | 913 |
| | රාගල | 495 |
| | අගරපතන | 496 |
| | තලවාකැලේ | 517 |
| | අදිකාරිගම | 739 |
| | පදියපැලැල්ල | 470 |
| | හේවාහැට | 471 |
| රත්නපුර | වැලිගෙපොල | 480 |
| | පඹහින්න | 562 |
| | ඇහැලියගොඩ | 430 |
| | පදලංගල | 453 |
| | කොළොන්න | 537 |
| | සෙවනගල සීනි සංස්ථා පරිශ්‍රය | 813 |
| | වැලිඔය | 771 |
| | අයගම | 477 |
| | කරවිට | 478 |
| | ඕපනායක | 479 |
| | රත්නපුර නව නගරය | 810 |
| | වෑවලවත්ත | 940 |
| පොළොන්නරුව | දියබෙදුම | 563 |
| | ශ්‍රී පුර | 965 |
| | සඳුන්පුර | 733 |
| | දියසෙන්පුර | 939 |
| | කදුරුවෙල | 835 |
| | ලංකාපුර | 580 |
| | ජයන්තිපුර | 734 |
| | සෙවනපිටිය | 933 |
| ත්‍රිකුණාමලය | මුල්ලිපොතාන | 842 |
| | කච්චකොඩිතිවු | 959 |
| | තොප්පූර් | 958 |
| | එච්චිලම්පතෙයි | 594 |
| | පාලඋෟතු | 841 |
| | උප්පුවේලි (නිලාවේලි) | 881 |
| | කුච්චුවේලි | 593 |
| | මධ්‍යම මාවත SPC | 501 |
| වන්නි | කිලිනොච්චි නගරය | 732 |
| | මල්ලවි සේවා මධ්‍යස්ථානය | 978 |
| | කනගරාජන් කුලම් | 731 |
| | ඔඩ්ඩුසුඩාන් | 599 |
| | පලෙයි | 979 |
| | නානත්තන් | 967 |
| | සිලාවතුර | 742 |
| | පේසාලේ | 955 |
| | වවුනියාව නගරය | 983 |
| | නෙදුන්කර්නි | 595 |

# ලොව පුරා විහිදුනු හවුල්කරුවන්




1. යුරෝපය
2. උතුරු ඇමරිකාව
3. දකුණු ඇමරිකාව
4. අප්‍රිකාව
5. ආසියාව
6. ඕෂනියාව
7. මැද පෙරදිග

**යුරෝපය**

Banca Nationale del Lavoro SpA, (BNL) Rome
Bank of Ceylon, London
Bank of Cyprus Public Company Ltd., Nicosia
Barclays Bank PLC, London
BHF Bank Aktiengesellsschaft, Frankfurt am Main
BNP Paribas SA, Paris
Budapest Bank RT, Budapest
Commerzbank AG, Frankfurt am Main
Credit Suisse, Zurich
Czekoslovenka Obchodna Banca AS, Bratislava
Danske Bank A/S, Copenhagen
Deutsche Bank AG, Frankfurt am Main
Gorengska Banka DD, Ljubljana
HSBC Bank PLC, London
ING Bank NV, Amsterdam
ING Belgium SA/NV, Brussels
Intesa Sanpaolo SpA, Milano
Komercni Bank NA, Prague
MKB Bank ZET, Budapest
National Westminster Bank PLC, London
Natixis, Paris
Nordea Bank AB (Publ), Stockholm
Nordea Bank Norge ASA, Oslo
Raifaizen Bank, Vienna
SEB Bank, Tallinn
SEB Bank, Vilnius
Skandinaviska Enskilda Banken AB (Publ), Stockholm
Societe Generale, Paris
Sparkasse Kolnbonn, Cologne
Svenska Handelsbanken AB (Publ), Stockholm
The Royal Bank of Scotland NV, Amsterdam
The Royal Bank of Scotland, Athens
UBAE SPA, Italy

UBS AG, Zurich
Ukrexim Bank, Kiev
Unicredit Bank Austria AG, Vienna
Unicredit Bank, Sofia
UniCredito Italiano SpA, Milan
Portigon AG, Dusseldorf
Zagrebacka Banka DD, Zagreb

**උතුරු ඇමරිකාව**

Bank of Montreal, Montreal
Bank of Nova Scotia, Canada
Canadian Imperial Bank of Commerce, Toronto
Citibank NA, New York
Deutsche Bank Trust Company Americas, New York
HSBC Bank USA NA, New York
JP Morgan Chase Bank NA, New York
MashreqBank PSC, New York
Standard Chartered Bank, New York
The Royal Bank of Scotland NV, New York
Wells Fargo Bank NA, USA

**දකුණු ඇමරිකාව**

Banco de Chile, Santiago
Banco Santander Brazil SA, Sao Paulo
BBVA Banco Continental, Lima
Deutsche Bank, Sao Paulo

**අප්‍රිකාව**

ABSA Bank Ltd., Johannesburg
Bank Misr, Cairo
Barclays Bank of Kenya Ltd., Nairobi
Citi Bank - Ivory Coast
Mauritius Commercial Bank Ltd. - Port Louis
National Bank of Egypt, Cairo
Nedbank Ltd., Johannesburg

**ආසියාව**

Axis Bank Ltd., Mumbai
Bank for Foreign Trade - Hanoi
Bank of Ceylon, Chennai
Bank of China, China
Bank of Communications Co. Ltd.
Bank of Maldives, Male
Bank of Tokyo Mitsubishi UFJ Ltd., Tokyo
China Construction Bank, Beijing
China Development Bank
CIMB Bank Ltd., Kuala Lumpur
DBS Bank Ltd., Singapore
Exim Bank of Korea
Export Import Bank of China, Beijing
HSBC Bank, Hong Kong
ICICI Bank Ltd., Mumbai
Korea Exchange Bank, Seoul
MashreqBank PSC, Mumbai
MCB Bank Ltd., Karachi
Mizuho Corporate Bank Ltd., Tokyo
Myanmar Foreign Trade Bank, Yangon
Nepal Bank Ltd., Katmandu
Oversea-Chinese Banking Corp. Ltd., Hong Kong
Oversea-Chinese Banking Corp. Ltd., Kuala Lumpur
Oversea-Chinese Banking Corp. Ltd., Singapore
Pubali Bank Ltd., Dhaka
Rupali Bank Ltd., Dhaka
Standard Chartered Bank, Afghanistan
Standard Chartered Bank (Pakistan) Ltd., Karachi
Standard Chartered Bank, Bangladesh
Standard Chartered Bank, Nepal
Standard Chartered Bank, Tokyo
State Bank of India, Chennai
Sumitomo Mitsui Banking Corporation, Tokyo
UBAF, Singapore
Woori Bank, Hanoi

**ඕෂනියාව**

ANZ National Bank Ltd., Wellington
Australia & New Zealand Banking Group Ltd., Melbourne
National Australia Bank Ltd., Melbourne
Westpac Bank PNG Ltd., Port Moresby
Westpac Banking Corporation, Suwa

**මැද පෙරදිග**

Ahli United Bank, Kuwait
Al Rajhi Banking & Investment Corporation, Riyadh
Bank Dhofar, Ruwi
Bank of Bahrain and Kuwait, Manama
BankMuscat SAOG, Ruwi
Byblos Bank SAL, Beirut
Commercial Bank of Dubai PSC, Dubai
Jordan Islamic Bank, Amman
MashreqBank PSC, Dubai
National Bank of Abu Dhabi, Abu Dhabi
National Bank of Oman SAOG, Muscat
UBAE S.P.A., Dubai

# දශක පිළිබඳ කෙටි විවරණයක්

**1961**

1961 ජූලි 1 වැනි දින මහජන බැංකුව ආරම්භ කරන ලදී. පළමු ශාඛාව කොළඹ ඩියුක් වීදියේ විවෘත කෙරිණි. වර්ෂය තුළ කොළඹ විදේශීය ශාඛාවට අමතරව පොළොන්නරුව, හිඟුරක්ගොඩ, හම්බන්තොට, අනුරාධපුර, පුත්තලම, මාතලේ හා මහනුවර යන නගර වල තවත් ශාඛා අටක් විවෘත කරන ලදී. මුළු සේවක සංඛ්‍යාව 169 ක් විය.

**1962**

ප්‍රධාන කාර්යාලය කොළඹ 2 යුනියන් පෙදෙසේ රත්නම් ගොඩනැගිල්ලට ගෙන යන ලද අතර තවත් ශාඛා 17 ක් විවෘත කරන ලදී.

**1963**

බැංකුව සිය උකස් සේවාවන් ආරම්භ කළේය.

**1964**

සමුපකාර ග්‍රාමීය බැංකුකරණ යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී.

**1965**

බැංකුවේ අංශ කිහිපයක් කොළඹ 2 විත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ රජයේ ලිපිකරු සේවා සංගමයේ ගොඩනැගිල්ලට නැවත ගෙන යන ලදී. මුළු ශාඛා සංඛ්‍යාව 48 දක්වා වර්ධනය වූ අතර හොරණ, කැකිරාව, පදවිය, මන්නාරම, ඇඹිලිපිටිය, කහටගස්දිගිලිය, රාගල හා තලවාකැලේ යන ස්ථානවල නව ශාඛා ද මේ අතරට අයත් විය.

**1967**

කුඩා ගොවිපල අංශයේ පුරෝගාමී ණය දෙන්නා බවට පත්වෙමින් බැංකුව නව කෘෂිකර්ම ණය යෝජනා ක්‍රමය ඇරඹුවේය.

**1970**

අවිධිමත් අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය සම්පාදනය සඳහා 'අතමාරු' ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. විධිමත් ඉතිරි කරන්නන් ආකර්ෂණය කරගැනීම සඳහා ණය හා සම්බන්ධ ඉතිරි කිරීම් යෝජනා ක්‍රමයක් වන ආයෝජන ඉතිරි කිරීම් යෝජනා ක්‍රමය දියත් කෙරිණි.

**1971**

බැංකුවේ සියවැනි ශාඛාව මරදගහමුලදී විවෘත කරන ලදී.

**1973**

නිෂ්පාදන හා පරිභෝජන යන දෙවර්ගයේම ණය පහසුකම් සැපයීම පිණිස පරිපූර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයක් දියත් කරන ලදී. සිංහල හා දෙමළ අළුත් අවුරුදු චාරිත්‍ර තම අනන්‍යතාවට එක් කර ගනිමින් හා නැකැත් වේලාවට බැංකුව සමග ගනුදෙනු කිරීමට ගනුදෙනුකාරභවතුන් දිරිගැන්වීම පිණිස බැංකුව 'ගනුදෙනු' පිළිවෙත ආරම්භ කළේය.

**1975**

ආක්‍රමණශීලී බැංකු ව්‍යාප්ති වැඩසටහනක් අපගේ මුළු ශාඛා සංඛ්‍යාව 158 දක්වා ගෙන ආවේය.

**1977**

අපගේ දෙසියවැනි ශාඛාව කොල්ලුපිටියේ විවෘත විය. ප්‍රධාන කාර්යාලය කොළඹ කොටුවේ ගොඩනැගිල්ලකට නැවත ගෙන යන ලදී. මුළු සේවක සංඛ්‍යාව 5,000 ක් විය. ප්‍රථම ධීවර බැංකුව කොරලවැල්ලේදී විවෘත කරන ලදී.

**1981**

අපගේ ශාඛා ජාලය ශාඛා 290 දක්වා වර්ධනය විය. විස්තෘත බාලවයස්කාර ඉතුරුම් යෝජනාක්‍රමය දියත් කරන ලදී.

**1982**

බැංකුවේ තුන්සියවැනි ශාඛාව ඉංගිරියේ දී විවෘත විය. මුළු සේවක සංඛ්‍යාව 10,000 තෙක් ළඟා විය.

**1984**

බැංකුවේ පරිපාලිතයක් වන පීපල්ස් මර්චන්ට් බැංකුව ස්ථාපනය කරන ලදී. කොම්පඤ්ඤවීදියේ අපගේ ශාඛාව, ජාත්‍යන්තර අංශය හා කොටුව විදේශීය ශාඛාව සමග ඒකාබද්ධ කරන ලදී.

**1986**

පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය අපගේ මධ්‍යම ප්‍රධාන කාර්යාලයේ දී හා තෝරාගත් නගර ශාඛාවල ඇරඹුණු අතර 'බිලැක් ලයිට්' ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ගනුදෙකාර භවතුන් වෙනුවෙන් මෙමගින් කාලය විශාල වශයෙන් ඉතිරි කිරීම සිදු විය.

**1987**

අපගේ මූලස්ථාන ශාඛාව බැංකුවේ පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය ශාඛාව බවට පත් විය. ග්‍රාමීය විදුලි සැපයුම සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් විදුලිබල මණ්ඩලය සමග සහයෝගිතාවයෙන් ක්‍රියාත්මක කෙරිණි.

**1989**

සේවක අර්ථසාධක අරමුදලේ ශේෂය ඇප ලෙස තබා නිවාස ණය සැපයීම සඳහා කම්කරු අමාත්‍යාංශය අනුග්‍රාහකත්වය දක්වන ලද ණය යෝජනා ක්‍රමයකට බැංකුව සහභාගි විය. විදේශ රැකියා අපේක්ෂා කරන්නන් වෙනුවෙන් ණය සැපයීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ඒකාබද්ධව ණය යෝජනා ක්‍රමයක් දියත් කරන ලදී. 1983 සිවිල් ගැටුමෙන් හානියට පත් වූවන්ට ණය සැපයීම සඳහා වූ REPIA විසින් දියත් කරන ලද ණය යෝජනා ක්‍රමයකට බැංකුව සහභාගි වූයේය. වර්ෂය තුළදී ජනසවිය ආශ්‍රිත ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ගනුදෙනු කළ හැකි ඉතුරුම් සහතික නිකුත් කිරීමද බැංකුව මෙම වර්ෂය තුළදී ආරම්භ කළේය.

**1990**

දායාද ඉතුරුම් තැන්පතු යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. වීසා ඉන්ටනැෂනල් සමග ඒකාබද්ධව පීපල්ස් වීසා කාඩ්පත හඳුන්වා දෙන ලද අතර ශාඛා 24 ක් පූර්ණ වශයෙන් පරිගණකගත කරන ලදී.

**1991**

ප්‍රථම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය අපගේ මූලස්ථාන ශාඛාවේ පිහිටුවන ලදී.

**1992**

රජයේ ඇඟලුම් කම්හල් 200 වැඩසටහනට බැංකුව සහාය විය. පීපල්ස් ස්වයංක්‍රීය බැංකුකරණ පද්ධතිය (PABS) නම් බැංකුව විසින්ම සකසන ලද බැංකුකරණ යෙදවුම ජීවී මෙහෙයුම් ආරම්භ කළේය.

**1993**

රට පුරා බැංකු ශාඛා 330 ක් ක්‍රියාත්මක වෙමින් තිබූ අතර ප්‍රධාන ශාඛා 35 ක් පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය කර තිබිණි. කාන්තාවන් සඳහා ඉතුරුම් යෝජනා ක්‍රමයක් වන 'වනිතා වාසනා' හඳුන්වා දෙන ලදී.

**1994**

නව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර අටක් සවි කරන ලද අතර ස්වයංක්‍රීයකරණ වැඩසටහන යටතේ ශාඛා 160 ක් පරිගණකගත කරන ලදී.

**1995**

රජයේ ගුරුවරුන්ගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා නව තැන්පතු ඒකරාශී කිරීමේ හා ණය යෝජනා ක්‍රමයක් වූ 'ගුරු සෙත' අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව දියත් කරන ලදී.

**1996**

රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවක පිරිස් සඳහා ණය පැකේජයක් වන 'සුව සෙවන' දියත් කෙරිණි. පාසල් සිසුන් සඳහා නව තැන්පතු යෝජනා ක්‍රමයක් වූ 'සිසු උදාන' හඳුන්වා දෙන ලදී. කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය හා වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය නම් ආසියානු සංවර්ධන අරමුදල් ලබන ණය යෝජනා ක්‍රම දෙකකට බැංකුව සහභාගි විය. සී/ස පීපල්ස් ලීසිං සමාගම හා සී/ස පීපල්ස් ට්‍රැවල්ස් සමාගම යන බැංකුව පූර්ණ හිමිකාරිත්වය ඇති පරිපාලිත සමාගම් මෙහෙයුම් ආරම්භ කළේය. විමධ්‍යගත පාලනය ශක්තිමත් කිරීම හා ගනුදෙනුකාර භවතුන්ට වඩා හොඳ සේවා සැපයීම උදෙසා කලාප කාර්යාල විවෘත කරන ලදී.

**1997**

ස්වයං රැකියා ව්‍යාපෘති වලට සහාය වීම පිණිස 'සුරතුර' ණය යෝජනා ක්‍රමය දියත් කරන ලදී. ජාතික සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහායක ව්‍යාපෘති (SMEAP). යටතේ බැංකුව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් හා කර්මාන්ත වෙත සිය ණය පහසුකම් ව්‍යාප්ත කළේය.

**1998**

කාඩ්පත් හිමියන් 125,000 ට සේවා සපයමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 36 දක්වා වැඩි විය. ශාඛා 175 ක් පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය තත්ත්වයට පත් කර තිබූ අතර උකස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 188 දක්වා වැඩි විය. විගමනික ශ්‍රමිකයන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග හවුල්ව 'විදේශිකා' නමින් හැඳින්වෙන විශේෂ ණය හා ඉතුරුම් යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

**1999**

තමා භාරයේ සිටින ලාබාලයන්ට ප්‍රතිලාභ සඳහා ඉතිරි කිරීමට දෙමව්පියන් හා භාරකරුවන් දිරිගන්වන තැන්පතු යෝජනා ක්‍රමයක් වන 'ඉසුරු උදාන' බැංකුව දියත් කළේය.

**2000**

ජන ජය ඉතුරුම් හා ණය යෝජනා ක්‍රමය දියත් කරන ලදී. අළුතින් හඳුන්වා දෙන ලද 'ජය ශ්‍රී' දිනුම් ඇදීම තැන්පත්කරුවන්ට ආකර්ෂණීය ත්‍යාග පිරිනැමුවේය. රට පුරා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය 74 තෙක් ව්‍යාප්ත විය. PABS ශාඛා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සම්බන්ධ කිරීම සඳහා මධ්‍යම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හුවමාරුව හඳුන්වා දෙන ලදී.

### 2001

පෞද්ගලික බැංකු අංශයෙන් ඇතැම් අංශ ප්‍රධානීන් බඳවාගැනීම මගින් බැංකුවේ ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායම ශක්තිමත් කරන ලදී. උපාය මාර්ගික සැලැස්මක් දියත් කිරීම හරහා බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමට මුලපුරන ලදී. මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 90 තෙක් වර්ධනය විය.

### 2002

PABS හි ස්වයංක්‍රීයකරණය කරන ලද ශාඛා සංඛ්‍යාව 218 තෙක් ඉහළ නැංග අතර ශාඛා 119 ක් මධ්‍යම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මාරුවට සම්බන්ධ කෙරිණි. භාණ්ඩාගාර ස්වයංක්‍රියකරණ පැකේජය ක්‍රියාත්මක කරන ලදී.

### 2003

බැංකුවේ 11 වන ප්‍රධාන විධායක නිලධාරී /සාමාන්‍යාධිකාරී අශෝක ද සිල්වා මහතා 2003 පෙබරවාරි 1 වැනි දින වැඩ භාරගත්තේය. යොවුන් විධායක ඉතිරිකරන්නන්ගේ (YES) ගිණුම දියත් කරන ලදී. ප්‍රධාන කාර්යාල ඇතුළු තෝරාගත් ශාඛා 60 ක මූලික වශයෙන් ක්‍රියාත්මක වූ අති නවීන බැංකුකරණ පැකේජයක් හා වෙළඳ සේවා විසඳුම් ස්ථාපනය කිරීම සඳහා බැංකුව මලයාසියාවේ සිල්වර් ලේක් සිස්ටම් SDV BUD සමග ගිවිසුමක් අත්සන් කළේය.

### 2004

ශ්‍රී ලංකා රජය විසින් අනුමත කර දියත් කරන ලද 2004 - 2008 සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මේ දෙවැනි අදියර ආසියානු සංවර්ධන බැංකුවේ යළි මුදල් ආයෝජන සහාය මත පදනම් විය. බැංකුව ප්‍රථම වතාවට BBB + පොදු තත්ත්වාගණනය ෆිච් රේටිංස් ලංකා වෙතින් ලබා ගත්තේය. හර බැංකුකරණ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

### 2005

බැංකුවේ 15 වැනි සභාපති වශයෙන් ආචාර්ය පී. ඒ. කිරිවන්දෙනිය මහතා 2005 දෙසැම්බර් මස මුලදී වැඩ භාරගත්තේය. ඉන් සුළු කාලයකට පසුව රජය, ආසියානු සංවර්ධන බැංකුවේ සහ මහජන බැංකුව අතර අත්සන් තබන ලද ගිවිසුමකට අනුකූලව ශ්‍රී ලංකා රජය විසින් බැංකුවේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ආයෝජන ප්‍රථම වාරිකය ලෙස රු. බිලියන 2 ක් ලැබිණි. හර බැංකුකරණ ව්‍යාපෘතිය ශාඛා ජාලය හරහා තවදුරටත් ව්‍යාප්ත කෙරිණි.

2004 දෙසැම්බර් මස සුනාමියේ බලපෑමට ලක්වූවන්ගේ ජීවිත, නිවෙස් හා ව්‍යාපාර ගොඩනැගීම සඳහා රජයෙන් ප්‍රදානය කරන ලද මූල්‍ය සහාය නෙ ඒමේදී බැංකුව ප්‍රධාන අතරමැදියෙකු විය.

### 2006

සිය පෙර තත්ත්වාගණන මට්ටමේ සිට ප්‍රගතියක් දක්වමින්, බැංකුව සී/ස ෆිච් රේටිංස් ලංකා වෙතින් A තත්ත්වාගණනයක් ලබා ගත්තේය.

ශ්‍රී ලංකා අලෙවි ආයතනය විසින් සිදු කරන ලද සම්මාන ප්‍රදානයේදී බැංකුකරණ හා මූල්‍ය සේවා අංශයේ 2006 POP සම්මානයෙන් මහජන බැංකුව පිදුම් ලැබුවේය. ශ්‍රී ලංකා රජයෙන් ලද දෙවැනි ප්‍රාග්ධන වාරිකය වූ රු. බිලියනය ලැබිණි.

### 2007

බැංකුවේ 16 වැනි සභාපතිවරයා වූ ඩබ්ලිව්. කරුණාජීව මහතා 2007 මැයි මස දී වැඩ භාරගත්තේය. ෆිච් රේටිංස් වෙතින් ලද A තත්ත්වාගණන මට්ටම වර්ෂය තුළ පවත්වා ගන්නා ලදී. ශ්‍රී ලංකා රජය තෙවැනි ප්‍රාග්ධන වාරිකය වූ රු. බිලියන 1.5 බැංකුවට ලබා දුන්නේය. පිට පිට දෙවැනි වසරටත් වසරේ බැංකුකරණ හා මූල්‍ය සේවා සන්නාමය වෙනුවෙන් ජනතා සම්මානය මහජන බැංකුව විසින් දිනාගන්නා ලදී. 2007 වර්ෂයේදී බැංකුව මුළු තැන්පතු වල රු. බිලියන 300 සීමාව බැංකුව විසින් ඉක්මවන ලදී.

### 2008

බැංකුවේ 12 වන ප්‍රධාන විධායක නිලධාරී /සාමාන්‍යාධිකාරී වශයෙන් එච්. වික්‍රමසිංහ මහතා වැඩ භාරගත්තේය.

ශ්‍රී ලංකා රජය හතරවැනි ප්‍රාග්ධන වාරිකය නිදහස් කළේය. වර්ෂයේ අවසානය වන විට බැංකුව 10.5% ප්‍රාග්ධන ප්‍රමාණවත් බව මට්ටමට ළඟා විය. තවද, රු. බිලියන 2.5 ක ක බැංකුවේ ප්‍රථම ණයකර නිකුතුව මෙම වර්ෂයේදී සිදු කරන ලදී.

විදේශයන්හි සිට මිනිත්තු ගණනකින් මුදල් ප්‍රේෂණය කිරීම සඳහා, නවතම තාක්ෂණයේ සහාය ඇති වෙබ් අඩවි පාදක ප්‍රේෂණ නිපැයුමක් වූ 'පීපල්ස් ඊ රෙමිටන්ස්' හඳුන්වා දීමත් සමග, බැංකුවේ ප්‍රේෂණ සේවාවෙහි කැපී පෙනෙන දියුණුවක් ඇති විය. නව විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු නිපැයුම් දෙකක්, එනම් ළමුන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු නිපැයුමක් වන 'දූ දරු එතෙර ඉසුර' හා 'විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම' [SFIDA]. දියත් කෙරිණි.

### 2009

බැංකුවේ 13 වැනි ප්‍රධාන විධායක නිලධාරී /සාමාන්‍යාධිකාරී පී. වී. පතිරණ මහතා 2009 ජනවාරි මසදී වැඩ භාරගත්තේය.

රු. බිලියන 2.5 ක් සඳහා සිය දෙවැනි ණයකර නිකුතුව බැංකුව මෙම වර්ෂයේ දී සිදු කළේය.

ශාඛා 214 ක් හා සේවා මධ්‍යස්ථාන 236 ක් අන්තර් ජාලය මගින් සම්බන්ධ කරනු ලැබිණි. බැංකුව දිවයින පුරා ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 300 ක් උපායමාර්ගික ලෙස ස්ථානගත කළේය.

මුළු තැන්පතු රු. බිලියන 400 ක් විය.

බදුවලට පෙර ඉහළම ලාභය වූ රු. මිලියන 6.1 සාක්ෂාත් කරගන්නා ලදී. බැංකුවේ ඉතිහාසයේ ප්‍රථම වතාවට 2008 වාර්ෂික වාර්තාව වෙනුවෙන් දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) සම්මානයක් ලැබිණි.

### 2010

2010 ඔක්තෝබර් මසදී එච්. එස්. ධර්මසිරි මහතා බැංකුවේ 14 වැනි ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ලෙස වැඩ භාර ගත්තේය.

ශාඛා ජාලය හා සේවා මධ්‍යස්ථාන 679 දක්වා පුළුල් විය. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 330 දක්වා වර්ධනය විය.

2010 ජුලි මාසයේදී පීපල්ස් ඉන්ටනැෂනල් වීසා හර කාඩ්පත දියත් කරන ලදී.

බැංකුව, සී/ස ෆිච් රේටිංස් ලංකා වෙතින් AA- හා රැම් රේටිංස් වෙතින් AAA තත්ත්වාගණනයක් ලබා ගත්තේය.

2010 වර්ෂය තුළදී මුළු තැන්පතු අගය රු. බිලියන 462 ඉක්මවූයේය.

බදුවලට පෙර ඉහළම ලාභය වූ රු. මිලියන 8.7 අත් කරගන්නා ලදී.

නිව්යෝක් නගරයේ පැවති සම්මාන උළෙලේදී මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් ARC ස්වර්ණ සම්මාන දෙකක් පිරිනමන ලදී.

2009 වාර්ෂික වාර්තාව වෙනුවෙන් රාජ්‍ය අංශය කාණ්ඩයේ ප්‍රථම ස්ථානය සඳහා SAFA සම්මානය දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනය වෙතින් බැංකුවට ලැබිණි.

### 2011

බැංකුවේ 15 වැනි ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී වශයෙන් එන්. වසන්ත කුමාර් මහතා 2011 පෙබරවාරි මස 22 වැනි දින එම ධූරයට පත් විය.

2011 ජුලි 1 වැනි දින බැංකුව සිය ස්වර්ණ ජුබිලිය උත්සවාකාරයෙන් සැමරුවේය.

මුළු ශාඛා ජාලය 714 ක් වූ අතර දිවයිනේ සියලු පෙදෙස් ආවරණය කරමින් ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර පිහිටීම් 382 දක්වා වර්ධනය විය.

AA (ස්ථාවර) උත්ශ්‍රේණිගත තත්ත්වාග ණනයක් සී/ස ෆිච් රේටිංස් ලංකා වෙතින් බැංකුවට ලැබිණි.

බැංකුවේ මුළු වත්කම්, මුළු තැන්පතු සහ මුළු ණය හා අත්තිකාරම් පිළිවෙළින් රු. බිලියන 663, රු. බිලියන 539 හා රු. බිලියන 478 ඉක්මවීය. බදුවලට පෙර ඉහළම ලාභය වූ රු. බිලියන 15.3 ක් හා බදුවලට පසු ලාභය රු. බිලියන 10.2 ක් අත් කරගන්නා ලදී.

බැංකුකරණ හා මූල්‍ය සේවා අංශයේ ශ්‍රී ලංකාවේ වඩාත්ම ජනප්‍රිය බැංකුව ස්ලිම් නීල්සන් ජනතා සම්මානය, වසරේ සේවා සන්නාමය - ස්ලිම් නීල්සන් ජනතා සම්මානය දිනාගත් මහජන බැංකුව සේවා කාණ්ඩයේ ලෝකඩ සමමානයද 2011 ස්ලිම් සන්නාම විශිෂ්ටත්ව සම්මාන උළෙලේදී දිනාගත්තේය.

### 2012

මුළු ශාඛා ජාලය 728 දක්වා ළඟා වූ අතර දිවයිනේ සියලු පෙදෙස් ආවරණය කරමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිහිටීම් 420 තෙක් වර්ධනය විය. සී. ෆිච් රේටිංස් ලංකා වෙතින් AA + (ස්ථාවර) උත්ශ්‍රේණිගත තත්ත්වාග ණනයක් බැංකුව ලබා ගත්තේය. බැංකුවේ මුළු වත්කම්, මුළු තැන්පතු සහ මුළු ණය හා අත්තිකාරම් පිළිවෙලින් රු. බිලියන 873, රු. බිලියන 683 හා රු. බිලියන 660 ඉක්මවීය.

2012 ජාත්‍යන්තර වාර්ෂික වාර්තා සමාගම් (ARC) සම්මාන උළෙලේදී බැංකුවේ 2011 වාර්ෂික වාර්තාව සඳහා එක් සුපිරි සම්මානයක් (Grand Award) හා ස්වර්ණ සම්මාන තුනක් දිනා ගත්තේය.

# කාර්යසාධන සමාලෝචනය 1999-2012

*නව ශ්‍රී ලං.ගි.ප්‍ර. මත පදනම්ව*

| | 1999 | 2000 | 2001 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | **2012** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ***ශ්‍රී ලංකා රුපියල් මිලියන*** | | | | | | | | | | | |
| ප්‍රාග්ධන හා සංචිත | (4,635) | (6,474) | (6,166) | 4,017 | 10,271 | 12,895 | 15,880 | 17,800 | 20,838 | 23,089 | 29,205 |
| **වගකීම්** | | | | | | | | | | | |
| ගනුදෙනුකාර හවතුන්ගේ තැන්පතු | 104,688 | 115,007 | 127,543 | 225,600 | 269,947 | 300,956 | 324,489 | 396,158 | 462,140 | 550,226 | 683,951 |
| බැංකු හා වෙනත් ආයතන වලින් ණය ගැනීම් | 12,405 | 39,744 | 28,369 | 29,134 | 35,840 | 49,063 | 33,714 | 36,884 | 39,132 | 64,053 | 135,150 |
| වෙනත් වගකීම් | 14,458 | 18,677 | 17,851 | 16,512 | 22,496 | 17,670 | 20,965 | 20,404 | 20,505 | 14,709 | 14,801 |
| ණයකර | – | – | – | – | – | – | 2,500 | 5,000 | 5,000 | 10,000 | 10,000 |
| | 131,551 | 173,428 | 173,763 | 271,246 | 328,283 | 367,689 | 381,668 | 458,445 | 526,778 | 638,988 | 843,902 |
| **මුළු වගකීම්** | 126,916 | 166,954 | 167,597 | 275,262 | 338,555 | 380,584 | 397,548 | 476,245 | 547,616 | 662,077 | 873,107 |
| **වත්කම්** | | | | | | | | | | | |
| මුදල් හා කෙටි කාලීන අරමුදල් | 25,260 | 35,147 | 24,818 | 65,592 | 47,191 | 57,090 | 39,663 | 83,973 | 87,062 | 52,510 | 67,814 |
| ආයෝජන | 23,066 | 32,079 | 25,636 | 50,583 | 62,682 | 61,095 | 80,109 | 84,807 | 82,688 | 129,977 | 175,491 |
| ණය හා ලැබිය යුතු දෑ (ශුද්ධ) | 66,944 | 87,087 | 106,142 | 142,497 | 207,138 | 238,293 | 248,626 | 283,760 | 357,336 | 461,656 | 611,414 |
| දේපල, පිරියත හා උපකරණ | 2,945 | 2,930 | 2,834 | 4,862 | 8,936 | 8,414 | 8,362 | 7,939 | 8,385 | 7,523 | 8,235 |
| වෙනත් වත්කම් | 8,701 | 9,711 | 8,167 | 11,727 | 12,608 | 15,691 | 20,787 | 15,766 | 12,144 | 10,412 | 10,153 |
| මුළු වත්කම් | 126,916 | 166,954 | 167,597 | 275,262 | 338,555 | 380,584 | 397,547 | 476,245 | 547,616 | 662,077 | 873,107 |
| බැඳීම් හා අසම්භාව්‍යයන් | 19,051 | 26,365 | 26,726 | 45,177 | 39,450 | 74,222 | 138,989 | 100,867 | 131,751 | 190,732 | 207,021 |
| **මෙහෙයුම්** | | | | | | | | | | | |
| දළ ඉපයීම් | 14,262 | 18,450 | 25,198 | 27,202 | 35,131 | 47,984 | 58,948 | 69,050 | 62,532 | 68,298 | 94,777 |
| ශුද්ධ ආදායම | 5,705 | 8,512 | 10,513 | 14,784 | 19,509 | 21,442 | 24,456 | 30,635 | 31,897 | 36,431 | 43,310 |
| මුළු පොදු කාර්ය | 5,459 | 8,160 | 8,867 | 11,070 | 15,038 | 15,736 | 17,159 | 19,719 | 21,305 | 20,421 | 24,186 |
| බදු වලට පෙර ලාභය | (6,671) | (1,268) | 880 | 4,035 | 4,079 | 5,002 | 5,664 | 6,076 | 8,771 | 15,600 | 15,249 |
| බදු ගෙවීමට ප්‍රතිපාදන | 98 | – | – | 1,263 | 922 | 2,628 | 2,959 | 2,755 | 3,565 | 5,154 | 4,355 |
| බදු වල පසු ලාභය | (6,573) | (1,268) | 880 | 2,772 | 3,157 | 2,374 | 2,705 | 3,320 | 5,206 | 10,446 | 10,894 |
| **කාර්යසාධන දර්ශක** | | | | | | | | | | | |
| සේවක සංඛ්‍යාව (ස්ථිර) | 11,623 | 11,577 | 11,401 | 9,531 | 9,645 | 8,416 | 8,587 | 8,863 | 8,399 | 8,249 | 7,823 |

*නව ශ්‍රී ලං.ගි.ප්‍ර. මත පදනම්ව*

| | 1999 | 2000 | 2001 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | **2012** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ***(ශ්‍රී ලංකා රුපියල් '000)*** | | | | | | | | | | | |
| **සේවකයෙකුට** | | | | | | | | | | | |
| තැන්පතු | 9,007 | 9,934 | 11,187 | 23,670 | 27,988 | 35,760 | 37,788 | 44,698 | 55,023 | 66,702 | 87,428 |
| අත්තිකාරම් | 5,760 | 7,522 | 9,310 | 14,951 | 21,476 | 28,314 | 28,954 | 32,016 | 42,545 | 55,965 | 78,156 |
| දළ ඉපයීම් | 1,227 | 1,594 | 2,210 | 2,854 | 3,642 | 5,702 | 6,865 | 7,791 | 7,445 | 8,280 | 12,115 |
| බදු වලට පසු ලාභය | (566) | (110) | 77 | 291 | 327 | 282 | 315 | 375 | 620 | 1,266 | 1,393 |
| ***(ශ්‍රී ලංකා රුපියල්)*** | | | | | | | | | | | |
| **කොටසකට** | | | | | | | | | | | |
| බදු වලට පසු ලාභය | (6,573) | (1,268) | 880 | 2,772 | 3,157 | 2,374 | 2,705 | 3,320 | 5,206 | 10,446 | 10,894 |
| මුළු වත්කම් | 126,916 | 166,954 | 167,597 | 275,262 | 338,555 | 380,584 | 397,547 | 476,245 | 547,616 | 662,077 | 873,107 |
| ශුද්ධ වටිනාකම | (4,635) | (6,474) | (6,166) | 4,017 | 10,271 | 12,895 | 15,880 | 17,800 | 20,838 | 23,089 | 29,205 |
| **ප්‍රධාන කාර්ය සාධන දර්ශක** | | | | | | | | | | | |
| වත්කම් මත ප්‍රතිලාභ (%) (බදුවලට පෙර) | (5.4) | (0.9) | 0.5 | 1.6 | 1.3 | 1.4 | 1.5 | 1.4 | 1.7 | 2.6 | 2.0 |
| හිමිකම් මත ප්‍රතිලාභ (%) | 2,319.1 | 22.8 | (13.9) | 139.2 | 44.2 | 20.5 | 18.8 | 19.7 | 26.9 | 49.2 | 41.7 |
| පිරිවැය/ආදායම් අනුපාතය (%) | 146.0 | 102.8 | 89.2 | 72.7 | 73.8 | 68.7 | 65.4 | 60.6 | 60.2 | 56.1 | 55.8 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය | – | (11.3) | (10.5) | 1.9 | 5.6 | 6.9 | 10.5 | 13.4 | 12.8 | 14.8 | 14.0 |
| **පෙර පැවති ශ්‍රී ලං.ගි.ප්‍ර. මත පදනම්ව** | | | | | | | | | | | |
| අක්‍රිය ණය අනුපාතය (දළ) (%) | 22.2 | 18.9 | 20.9 | 11.0 | 7.1 | 5.9 | 6.8 | 6.7 | 5.0 | 3.4 | 2.8 |
| අක්‍රිය ණය අනුපාතය (ශුද්ධ) | 6.2 | 4.4 | 8.2 | 1.8 | 0.9 | 0.7 | 1.6 | 2.0 | 1.3 | 0.5 | 0.4 |
| අක්‍රිය ණය ආවරණ අනුපාතය (%) | 72.3 | 76.9 | 61.0 | 83.9 | 87.1 | 88.0 | 75.7 | 70.6 | 73.6 | 81.5 | 84.0 |
| ෆිච් (Fitch) ශ්‍රේණිගත කිරීම් | | | | BBB+ | A- | A- | A- | A | AA- | AA | AA+ |
| රැම් (RAM) ශ්‍රේණිගත කිරීම් | | | | | | | | | AAA | AAA | AAA |

# මූල්‍ය/බැංකුකරණ යෙදුම් පාරිභාෂික ශබ්ද මාලාව

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**
ආයතනයක මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ දී හා වාර්තා කිරීමේ දී, එහි කළමනාකරුවන් විසින් තෝරාගෙන, නොවෙනස්ව අනුගමනය කළයුතු ප්‍රතිපත්ති, රීති හා පිළිවෙත්ය.

**උපචිත පදනම**
ගනුදෙනු හා වෙනත් සිදුවීම් සිදු වූ කල්හි, මුදල් හෝ ඊට සමාන යමක් ලැබීමක් හෝ ගෙවීමක් ගැන නොසලකා, එම ගනුදෙනුවෙහි ප්‍රතිඵලය කෙරෙහි සැලකිල්ල දැක්වීමයි.

**ක්‍රමක්ෂය**
අස්පෘෂ්‍ය වත්කමක ප්‍රයෝජනවත් ආයුකාලය මතට, ක්ෂයවිය හැකි අගයක් ක්‍රමාණුකූලව වෙන්කිරීමයි. ක්ෂයකිරීම හා හිලව් කිරීම යන දෙකෙහිම ඇත්තේ එකම තේරුමකි.

**ක්‍රමක්ෂය කරන ලද පිරිවැය**
ප්‍රධාන ආපසු ගෙවීම් අඩු කළ මුලු මුදල් ප්‍රමාණය හා කල් පිරීමේදී මුදල් ප්‍රමාණය අතර යම් වෙනසකට ඵලදායක පොළී ක්‍රමය භාවිතා කරමින් සමුච්චිත ක්‍රමක්ෂය එකතු කළ හෝ අඩු කළ හා අක්‍රිය වීම හෝ ලබා ගත නොහැකි වීම හේතුවෙන් යම් අඩු කිරීමක් (සෘජුව හෝ දීමනා ගිණුමක් භාවිතා කිරීමෙන්) වේ නම් එය අඩු කළ මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය බැරකමක් මුල් හඳුනාගැනීමේදී මනිනු ලබන ප්‍රමාණය

**ආශ්‍රිත සමාගම්**
ප්‍රධාන හෝ පාලක සමාගමක ආධාරක සමාගමක් නොවූව ද, එහි කාර්යයන්ට සහභාගිවීමට අයිතියක් ඇතිවාක් මෙන්ම, එහි මෙහෙයවුම් හා මූල්‍ය ප්‍රතිපත්ති කෙරෙහි ප්‍රමාණවත් බලපෑමක් සිදුකළ හැකි සමාගමකි.

**අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම්**
අලෙවිය සඳහා ඇති යනුවෙන් නම් කර ඇති මූල්‍ය වත්කම් (අ) ණය හා ලැබිය යුතු (ආ) කල්පිරීම තෙක් රඳවාගන්නා ආයෝජන හෝ (ඇ) ලාභය හෝ අලාභ මගින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් යන කාණ්ඩ සමග නොගැනේ.

**වට්ටම්කරණ ලද බිල්පත**
පොරොන්දු සටහන් පතක හෝ විනිමය බිල්පතක, මුහුණත වටිනාකමට අඩුවෙන්, එම බිල්පත හෝ සටහන්පත මිලදී ගන්නා අතර, එම මිල වෙනස, බිල්පතෙහි වලංගු කාලය මත පොළිය ලෙස සැලකේ. පරිණත වූ කල්හි, එම බිල්පතෙහි මුහුණත අගය, එහි හිමිකරුට සිය ගිණුමට හරකළ හැකි වෙයි.

**විනිමය බිල්පත**
කෙනෙකු විසින්, වෙනත් කෙනෙකුට කිසියම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස, අත්සන සහිතව මෙන්ම ලිඛිතව හා කොන්දේසි විරහිතව, තවත් කෙනෙකු ආමන්ත්‍රිත නියමයකි. විනිමය බිල්පත් හා අණකර යන වාග් මාලා බොහෝවිට එකිනෙක මාරුකරමින් භාවිත කෙරේ.

**ඉල්ලුම් තැන්පතු හෝ ඉල්ලුම් මුදල්**
ඉල්ලා සිටිනවිට ආපසු ලබාදිය යුතු, තාවකාලික වශයෙන් දෙනුලැබූ, තැන්පතු හෝ අරමුදල්ය.

**ප්‍රාග්ධන ප්‍රමාණවත් බව**
කිසියම් බැංකුවක පවත්නා අරමුදල් ප්‍රමාණය අනුව, තමන්ගේ තැන්පත් කරුවන්ගේ හා සෙසු ණය හිමියන්ගේ අවශ්‍යතා ඉටුකිරීමට ඇති හැකියාවයි. ජාත්‍යන්තර සමතකරණය සඳහා වන බැංකුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතා පරිදි, දේශීය බැංකු විසින්, නියමිත අවම ප්‍රාග්ධනයක් පවත්වාගත යුතුය.

**ණය අවදානම**
මූල්‍ය උපකරණයක එක් පාර්ශ්වයක් බැඳීම අනුව කටයුතු කිරීමට අපොහොසත් වීමෙන් අනෙක් පාර්ශ්වයට මූල්‍යමය අලාභයක් ඇති කිරීමේ අවදානම

**ප්‍රාග්ධන 1 වන ස්ථරය (හර ප්‍රාග්ධනය)**
ප්‍රාග්ධන අරමුදල්වල තෝරාගත් අයිතමයන්, හර ප්‍රාග්ධනයට අයත්වෙයි. ප්‍රධාන හර ප්‍රාග්ධන අයිතමයන් නම්, කොටස් ප්‍රාග්ධනය, කොටස් මුදල, ව්‍යවස්ථාපිත සංචිත අරමුදල, රඳවාගනු ලැබූ ලාභයන්, සාමාන්‍ය සංචිතයන්, ස්ථාවර හා දිගුකාලීන ආයෝජන විකුණා බදු ගෙවූ පසු ඉතිරිවන අතිරික්තය/අලාභය ආදියයි.

**ප්‍රාග්ධන 2 වන ස්ථරය (අතිරේක ප්‍රාග්ධනය)**
අතිරේක ප්‍රාග්ධනයට අයත්වනුයේ, අනුමත කරන ලද ප්‍රතිඇගයීම් සංචිතයන්, සාමාන්‍ය ප්‍රතිපාදනයන්, දෙමුහුන් (ණය/හිමිකම්) ප්‍රාග්ධන අයිතමයන් සහ අනුමත කරන ලද උපකාරක කාල ණය ආදියයි.

**මුදල් සමානයන්**
යම් නියමිත මුදල් ප්‍රමාණයක් බවට පහසුවෙන් පරිවර්තනය කරගත හැකිවන්නා වූ ද, අගය වෙනස්වීමේ අවදානමට ඉතා මඳ වශයෙන් භාජනය විය හැකි වූ ද, කෙටිකාලීන මෙන්ම, බෙහෙවින් ද්‍රවශීලී වූ ද ආයෝජනයන්ය.

**තැන්පතු සහතික**
තැන්පතු අරමුදලක් සඳහා ගෙවියයුතු පොළී අනුපාතිකයන් ද, එම අරමුදල නැවත තැන්පත්කරුට ගෙවීමට නියමිත දිනය ද සඳහන්ව, බැංකුවක් විසින් තැන්පත්කරුවකුට නිකුත්කරනු ලබන සහතිකයයි. මෙම සහතික බොහෝවිට ගනුදෙනු කළහැකිය.

**වාණිජ පත්‍රය**
බැංකු මගින් සහ ණය වටිනාකම සහිත ආයතනික ණය ලබාගන්නන් විසින් නිකුත් කෙරෙන, සුරක්ෂිතභාවයෙන් තොර, කෙටිකාලීන පොරොන්දු සටහන් පතකි.

**බැඳීම්**
සේවාලාභියකු වෙනුවෙන් අනුමත කරන ලද නමුත්, ශේෂ පත්‍ර දිනය වනවිට, ප්‍රයෝජනයට නොගන්නාලද ණය පහසුකම්ය.

**අසම්භව්‍යතාවන්**
කිසියම් අවිනිශ්චිත අනාගත සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක්, සිදුවීම හෝ නොසිදුවීම තුළින් පමණක් තහවුරු කළහැකි, ලාභය හෝ පාඩුව අවසාන ප්‍රතිඵලයසේ ගැනෙන තත්ත්වයක් නැතහොත් අවස්ථාවකි.

**ආයතනික පාලනය**
ආයතනික ඒකකයන් පාලනය කිරීමේ ක්‍රියාවලියයි. ආයතනයක කළමනාකරණය හා ගමන් මග මෙන්ම, එහි විධායක කාර්යයන් හා එහි හිමිකරුවන් සහ වෙනත් අය කෙරෙහි පවත්නා වගකීම අධීක්ෂණය කිරීම ද සම්බන්ධයෙන් බලතල භාවිත කිරීමේ ක්‍රමවේදය මේ හා අදාළ වන්නේය.

**අනුරූප බැංකුව**
වෙනත් බැංකුවක නියෝජිතයකු ලෙස ක්‍රියාකරන බැංකුවකි. සමරූපී බැංකුවක් පිහිටා තිබෙන ප්‍රදේශයේ, සෙසු බැංකු වෙනුවෙන් පුළුල් හා විවිධත්වයෙන් යුත් බැංකු සේවාවන් සාමාන්‍ය වශයෙන් සම්පාදනය කිරීමේ කාර්යයෙහි එය නිරත වන්නේය.

**පිරිවැය ආදායම අනුපාතය**
ශුද්ධ ආදායමෙහි ප්‍රතිශතය ලෙස ගැනෙන මෙහෙයවුම් වියදම්ය.

**ප්‍රතිපාර්ශ්වය**
කිසියම් ගනුදෙනුවක් සිදුකරන හෝ පියවන (බැංකුවක් වුව ද ඇතුළුව) දෙවන පාර්ශ්වයයි.

**දේශයික අවදානම**
කිසියම් දේශයක්/රටක් තුළ, ණය ලබාගන්නන්ට ණය ලබාදීමේ දී අදාළ වන ණය අවදානමයි. ඇතැම්විට, ස්වෛරීයත්ව අවදානම ද මෙයට ඇතුළත්විය හැකිය.

**හරස් අනුපාතය**
එකම ව්‍යවහාර මුදලක් හා අදාළව, එකිනෙකට වෙනස් මිල කැඳවීම් දෙකක් අතරින් ගණනය කරනු ලබන, විදේශ විනිමය අනුපාතිකයයි.

**ව්‍යවහාර මුදල් හුවමාරුව**
කිසියම් ව්‍යවහාර මුදල් දෙවර්ගයක ප්‍රධාන ප්‍රමාණයන් ප්‍රවර්තනව මාරුකිරීමේ දී, ඒ හා අදාළවන්නා වූ ගිවිසුමෙහි, නැවත පසුදිනෙක එම මාරුව හැරගැනීමටත්, එසේ මාරුව හැරගන්නා දිනය දක්වා නියමිත පොළිය ගෙවීමටත් සඳහන් කරනු ලැබීම මෙයින් අදහස් කෙරේ.

**විලම්බිත බදු**
වෙනත් ඉදිරි වර්ෂයක ගෙවීමට සිදුවන බදු මුදල්, ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි වෙන්කර තැබීමයි.

**ක්ෂය වීම**
වත්කමක ක්ෂය වන ප්‍රමාණය එහි ප්‍රයෝජනවත් ආයු කාලය මත ක්‍රමානුකූල විභජනය

**ව්‍යුත්පන්නය**
නිශ්චිත භාණ්ඩයක්, බැඳුම්කරයක්, ස්කන්ධයක් හෝ ව්‍යවහාර මුදල් විශේෂයක් හා සමග දැඩි සබඳතාවක් සහිත මිලක් හා අදාළ මූල්‍ය උපකරණයකි.

**අතරමැදිහරණය**
මෙය බහුල ලෙස භාවිතවනුයේ, ණය ලබාගන්නන් බැංකු ක්ෂේත්‍රයෙන් ණය ලබාගනු වෙනුවට, ප්‍රාග්ධන වෙළඳපොළෙන් සෘජුව ම අරමුදල් සපයාගැනීම විස්තර කිරීමටය. මෙය සාමාන්‍යයෙන් සිදුකරනු ලබනුයේ, ණය ලබාගැනීමට ඉතා ශක්තිමත් පසුබිමක් ඇත්තවුන් විසිනි.

**ලේඛනගත බිල්පත්**
බඩු පැටවුම්පත, ඉන්වොයිසිය සහ රක්ෂණ සහතිකය වැනි විවිධ ලේඛන සමග ඉදිරිපත් කෙරෙන විනිමය බිල්පතයි.

**ලේඛනගත ණය**
ගෙවීම් සිදුකිරීම සඳහා ඉදිරිපත් කළයුතු ලිපි ලේඛන නියමකෙරෙන, ණයවර ලිපියයි.

**අණකරය**
විනිමය බිල්පත් සමග මෙය නිරන්තරයෙන් සඳහන් කරනු ලැබුව ද, ඇතැම්විට හා වඩාත් නිශ්චිතව මෙය භාවිතවනුයේ, අන්තර් බැංකු බිල්පත් සම්බන්ධයෙනි.

**ඵලදායක පොළී ක්‍රමය**
මූල්‍ය වත්කමක හෝ මූල්‍ය බැරකමක ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කර අදාළ කාලපරිච්ඡේදය පුරා පොළී ආදායම හෝ පොළී වියදම විභජනය කිරීම

**සාමාන්‍ය කොටස් උපකරණය**
යම් ආයතනයක බැරකම් සියල්ල අඩු කිරීමෙන් පසුව ද වත්කම් වල ශේෂ බැඳියාවක් දක්වන යම් ගිවිසුමක්

**සාධාරණ අගය**
දැනුමක් හා කැමැත්තක් ඇති, පාර්ශ්ව දෙකක් අතර අතේ දුරින් සිදුවන ගනුදෙනුවක දී වත්කමක් හුවමාරු කළ හැකි හෝ බැරකමක් නිරවුල් කළ හැකි පාදක මුදල

**ස්ථාවර අය කිරීම්**
නිශ්චිත දේපලක් - සාමාන්‍ය වශයෙන් සින්නක්කර හෝ බදු දේපලක්, හෝ පිරියත හා යන්ත්‍රසූත්‍ර ආදිය හෝ සම්බන්ධ නිත්‍යානුකූල උකසක් වෙනුවෙන් කරනු ලබන අය කිරීමයි.

**මූල්‍ය උපකරණය**
එක් ආයතනයක මූල්‍ය වත්කමක් හා තවත් ආයතනයක මූල්‍ය බැරකමක් හෝ සාමාන්‍ය කොටස් උපකරණයක් පැන නැගීමට හේතු වන යම් ගිවිසුමක්

**චංචල අය කිරීම්**
කෙනෙකුගේ යම් තොගයක්, හෝ ණයකරුවන් නැතහොත් මුදල් වැනි දේපලක් හෝ සම්බන්ධ අත්තිකාරමක සුරක්ෂිතභාවය වෙනුවෙන්, ණය දෙන සමාගමක් විසින් කරනු ලබන අය කිරීම මෙයින් හැඳින්වෙන අතර, ඒ අනුව, එම සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක වශයෙන්, එම වත්කම් භාවිත කිරීමට හෝ සුදුසු පරිදි යොදාගැනීමට හෝ අදාළ සමාගමට අවසරය ඇත.

**විදේශ විනිමය ආදායම**
ශේෂ පත්‍රයක විදේශ ව්‍යවහාර මුදලින් වාර්තා වී ඇති වත්කම් හා වගකීම්, එම ශේෂ පත්‍රයේ දැක්වෙන දිනයේ පැවති අනුපාතය අනුව, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ දි ලැබෙන ආර්ථික වාසිය මෙහිලා ගැනෙන අතර, මෙකී අනුපාතය ආරම්භයේ දී හෝ පෙර ශේෂ පත්‍රයේ සඳහන් දිනයේ දී හෝ පැවති අනුපාතයට වඩා වෙනස් විය හැකි ය. විදේශ ව්‍යවහාර මුදල් විකිණීමෙන් ද විදේශ විනිමය ආදායම උපයාගැනීමට පිළිවන.

**ඉදිරි ගිවිසුම් (කොන්ත්‍රාත්තු)**
මෙම ගිවිසුමේ සඳහන් කොන්දේසි වලට අනුකූලව, අදාළ පාර්ශ්වයන් විසින් නිශ්චිත ඉදිරි දිනක දී, කිසියම් හුවමාරුවක් සිදුකිරීම සඳහා බැඳීසිටීමේ පොරොන්දුවයි.

**ඉදිරි අනුපාතයන්**
තත්කාලීන දිනයෙන් ඔබ්බෙහි දිනයක දී පරිණත වූ විට, ව්‍යවහාර මුදලෙහි මිල මෙයින් අදහස් කෙරේ. ඉදිරි අනුපාතයන්, තත්කාලීන දිනයෙහි අනුපාතයට සමාන හෝ අසමාන විය හැකි ය. සමාන වූ කල්හි, ඉදිරි අනුපාතය ඒකාන්තවන අතර, අසමාන වූ කල්හි, මුල් මුදලට වඩා මිල වැඩිවීම හෝ වට්ටමක් සේ මිල අඩුවීම සිදුවන්නේය.

**ඉදිරි අනුපාත ගිවිසුම්**
(ලන්ඩන් හි අන්තර් බැංකු පිරිනැමූ අනුපාතිකයන් වැනි) කිසියම් පොළී අනුපාතික සුචියක් සහ එකඟ වූ ස්ථාවර අනුපාතිකයක් අතර වෙනස පදනම් කරගනිමින්, නිශ්චිත ඉදිරි දිනයක දී ගෙවීම් හුවමාරු කරගැනීමේ ගිවිසුමයි.

**සමූහ ව්‍යාපාරය**
මව් ව්‍යාපාරය සහ සෙසු සියලු ආධාරක ආයතන සමූහ ව්‍යාපාරය ලෙස ගැනේ.

**මිල අවදානම් සුරක්ෂිතය**
(පොළී අනුපාතිකයන්, මිල, භාණ්ඩ ආදියෙහි) අවාසිදායක ලෙස අගය සංචලනයවීමේ ඉදිරි අවදානම්වල දී ආවරණයවනු පිණිස භාවිතයෙහි යෙදෙන ක්‍රමෝපායයකි.

**කල්පිරීම තෙක් දරනු ලැබෙන ආයෝජන**
වෙළඳාම සඳහා දරා සිටින හෝ අලෙවිය සඳහා තිබෙන ලෙස හැඳින්වීමට මූලික හඳුනාගැනීමේ දී තෝරා ගැනෙන හෝ ණය හා ලැබිය යුතු යන නිර්වචනයට ඇතුළත් වන මූල්‍ය වත්කම් හැරුණු කොට කල්පිරීම තෙක් බලා සිටීමට සාධනීය අභිප්‍රාය හා හැකියාව ආයතනය සතු ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් හා ස්ථිර කල්පිරීමක් ඇති මූල්‍ය වත්කම්

**හානිකරණය**
උපකරණයක ධාරණ අගයට වඩා අයකර ගතහැකි මුදල අඩුවීම, හානිකරණය ලෙස ගැනේ.

**හානි ආවරණය**
කිසියම් ගිවිසුමක/කොන්ත්‍රාත්තුවක පාර්ශ්වකරුවකුට සිදුවිය හැකි අලාභයෙන් උද්ගතවන හානිය දරාගැනීමට, ගිවිසුමේ පාර්ශ්වකරුවකු නොවන කෙනෙකුගේ එකඟතාවට අනුමැතිය ලැබීමයි. එසේ එකඟතාව පිරිනැමීමේ දී, ගිවිසුමක ද්විතීයික වගකීම දරන ඇපකරුවකු මෙන් නොව, එම පිරිනැමීම සිදුකරන තැනැත්තා ප්‍රාථමික වගකීම ම දැරියයුතු වෙයි.

**පොළී අනුපාතික අවදානම**
වෙළඳපොල පොළී අනුපාතික වෙනස්වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහ වල සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානම

**ප්‍රධාන කළමනාකරණ පිරිස**
ආයතනයක ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ හා පාලනය කිරීමේ බලතල මෙන්ම වගකීම දරන කණ්ඩායම මෙසේ හැඳින්වේ.

**ණයවර ලිපිය**
අදාළ නියමයන් හා කොන්දේසිවලින් සමන්විතව, බැංකුවක් විසින් තුන්වන තැනැත්තෙකුට කිසියම් මුදලක් ලබාදෙන ලෙස ඉල්ලාසිටිමින්, වෙනත් බැංකුවකට නිකුත්කරන ලියවිල්ලයි.

**ද්‍රවශීලතා අවදානම**
මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් සැපයීම මගින් නිරවුල් කෙරෙන මූල්‍ය වගකීම් හා සබැඳි වගකීම් ඉටුකිරීමේ දී ආයතනයක් අසීරුතාවට පත්වීමේ අවදානම

**වෙළඳපොළට ගැලපීම**
ප්‍රවර්තන වෙළෙඳපොළ හෝ සාධාරණ අගය අනුව, පිහිටීම ඉහළ හෝ පහළ යන පරිදි වරින්වර ප්‍රතිඇගයීමේ පිළිවෙතයි.

**වෙළඳපොළ අවදානම**
වෙළඳපොළ මිල ගණන් වල වෙනස්වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක සාධාරණ අගය හෝ අනාගත මුදල් ප්‍රවාහ උච්චාවචනය වීමේ අවදානම

**සුළු කොටස්හිමියන්ගේ අයිතිය**
මව් සමාගමකට, ස්වකීය ආධාරක ආයතන මගින් සෘජුව හෝ වක්‍රව අයිතියක් පෑමට අවසරයක් නොමැති හිමිකම් පොළිය සේ සැලකෙන, ආධාරක ආයතනික ලාභ හෝ අලාභ සහ ශුද්ධ වත්කම්වල සමානුපාතය මෙයින් හැඳින්වෙයි.

**උකස්කිරීම**
ණයක් ලබාගැනීම පිණිස සුරැකුමක් ලෙස යොදාගනුලබන නිශ්චල දෙපලක් හා අදාළ අයිතිකාර බලයයි.

**ගනුදෙනු කළහැකි උපකරණය**
තුන්වැනි පාර්ශ්වයකට (ගනුදෙනුවක් තුළින්) ගැටලුවකින් තොරව විකිණිය හැකි සුරැකුම් පතක් හෝ වෙනත් මූල්‍ය උපකරණයකි. බැංකු නෝට්ටුවක්, නියමිත බැඳුම්කරයක්, විනිමය බිල්පතක් සහ චෙක්පතක් සාමාන්‍යයෙන් ගනුදෙනු කළහැකි උපකරණ ලෙස සැලකේ.

**ශුද්ධ පොළී ආන්තිකය**
මෙයින් අදහස්වනුයේ, සාමාන්‍ය පොළිය උපයන වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ගැනෙන පොළී ආදායමයි.

**අක්‍රීය ණය**
නියමිත දිනයේ දී මුල් මුදල හෝ පොළිය නොගෙවනු ලබන අවස්ථා සහිත ණය හෝ ණය හා අදාළ වෙනත් නියමිතයන් හෝ කොන්දේසි පිළිපැදීමට ණයගත් තැනැත්තා අසමත්වන්නා වූ අවස්ථා සහිත ණය මේ යටතට ගැනේ. අක්‍රීය ණය නිරන්තරයෙන්ම නිරුපචිත තත්ත්වයෙහිලා සලකනු ලබයි.

**'නොස්ට්‍රෝ' (NOSTRO) ගිණුම**
මෙය සාමාන්‍යයෙන් භාවිත කරනුයේ, වෙනත් බැංකුවක් සමග පවත්වා ගන්නා විදේශ ව්‍යවහාර මුදල් සහිත ජංගම ගිණුමක් සඳහාය. එසේ වුව ද, එම බැංකුව විදේශ සමරූපී බැංකුවක්වීම අවශ්‍යම නොවේ. අදාළ බැංකුවේ තැන්පතුව 'නොස්ට්‍රෝ' (NOSTRO) ගිණුම ලෙස හැඳින්වේ.

**වාස්තවික සාක්ෂි**
විශ්ලේෂණය, මැනීම, නිරීක්ෂණය හා වෙනත් එබඳු පර්යේෂණ ක්‍රම මගින් ඔප්පු කළ හැකි කරුණු මත පදනම් වූ තොරතුරු.

**ශේෂ පත්‍ර බාහිර ගනුදෙනු**
ශේෂ පත්‍රය අනුව, වත්කම් හෝ වගකීම් ලෙස හඳුනා නොගත්ත ද, අනිශ්චිතතා හා බැඳීම්වලට තුඩුදෙන ගනුදෙනු මේ යටතට එයි.

**පිහිටීම**

නියමිත ව්‍යවහාර මුදලක් හෝ පොළී අනුපාතිකයක් හා අදාළව, ඒකරාශිගත කරන ලද පූර්ණ බැඳීම්, මෙනයින් හැඳින්වේ. පිහිටීමක් ඒකාන්ත හෝ සමසතරැස් (විවරත්වයකින් තොර), නැතහොත් දිගු (එනම්, ව්‍යවහාර මුදල් විකුණුවාට වඩා මිල දී ගන්නාලද, නොහොත් අධි මිලදී ගැනුම්) හෝ කෙටි (එනම්, ව්‍යවහාර මුදල් මිල දී ගත්තාට වඩා විකුණනලද නොහොත් අධි විකුණුම්) විය හැකිය.

**ප්‍රාථමික අනුපාතය**

බැංකුවක් විසින් ස්වකීය අතිශය ප්‍රශස්ත මට්ටමේ ණය ලබාගන්නන් සඳහා භාවිතකරන පොළී අනුපාතය මෙයින් අදහස් වෙයි.

**පොරොන්දු පත්‍රය**

කෙනෙකු (පළමුවැන්නා) පොරොන්දුකරුවකු වශයෙන්, තවත් කෙනෙකු (දෙවැන්නකු) ඉල්ලීමක් කළ විටක හෝ, නිශ්චිත නැතහොත් නියමකරනු ලබන ඉදිරි දිනයක දී, එම දෙවන තැනැත්තාට, එසේත් නැතහොත් දෙවන තැනැත්තා විසින් නම නියම කරනු ලබන තුන්වන තැනැත්තෙකුට, නිශ්චිත මුදල් ප්‍රමාණයක් ආපසු ගෙවන බවට, අත්සන් සහිතව දෙනුලබන, කොන්දේසි විරහිත, ලිඛිත පොරොන්දුවකි.

**සම්බන්ධිත පාර්ශ්වයන්**

මූල්‍ය හෝ මෙහෙයවුම් තීරණ ගැනීමේ දී, එක් පාර්ශ්වයක් පාලනය කිරීමේ හෝ එම පාර්ශ්වය කෙරෙහි ප්‍රමාණවත් බලපෑමක් සිදුකිරීමේ හෝ හැකියාව සහිත තවත් පාර්ශ්වයක් ආදී වශයෙන් සැලකෙන පාර්ශ්වයන්ය.

**'රෙපෝ'** (Repo)

විකිණුම් හා ප්‍රතිමිලදීගැනීම් ගිවිසුම් සඳහා භාවිත කෙරෙන සංකේතාත්මක හැඳින්වීමයි.

**සංචිත වත්කම්**

ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවලට අනුකූල ව, මූල්‍ය ආයතනයක් විසින් යොදනු ලබන සංචිතවලින් කොටසක්වන එම ආයතනයේ වත්කම් මෙයින් කියැවේ.

**ප්‍රති විකුණුම්** (Reverse Repo)

'රෙපෝ' යන්නෙහි විරුද්ධාර්ථය යි. එනම්, මිලදීගැනීම් හා ප්‍රතිවිකිණුම් ගිවිසුම යි.

**චක්‍රීය ණය**

ණය ලබාගන්නාගේ රුචිය අනුව, අඛණ්ඩව ණය ලබාගැනීමට හා ආපසු ගෙවීමට අවසරය ලැබෙන නියමයන් සහිත ණය ක්‍රමයකි. මුල් මුදල ආපසු ගෙවීම මගින්, ණය අරමුදල ප්‍රතිසංස්ථාපනය වේ.

**සුරක්ෂිතකරණය**

වාහනයක් මිලදී ගැනීමේ දී, එහි මූල්‍ය අවශ්‍යතා ණය නිකුතුවක් මගින් පියවා ගැනීම සඳහා, ආදායම් උත්පාදිත වත්කම් ගොන්නක් ඉදිරිපත් කිරීම මෙයින් කියැවේ.

**ඛණ්ඩනීය විශ්ලේෂණය**

ආයතනයක් මෙහෙයවුම් සිදුකරන විවිධ භූගෝලීය ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින්, ඛණ්ඩ වශයෙන් ගෙන, මූල්‍ය තොරතුරු විශ්ලේෂණය කරනු ලැබීමයි.

**ඛණ්ඩ වාර්තාකරණය**

ඛණ්ඩ වාර්තාකරණයෙන් කියැවෙනුයේ, බැංකුකරණය, කල්බදු මෙහෙයවුම, කොටස් තැරැව්කරණය, සුරැකුම් වෙළෙඳාම, දේපල හා රක්ෂණය වැනි ව්‍යාපාර ඛණ්ඩයන්ගෙන් ආදායමට ලැබෙන දායකත්වය ප්‍රකාශවීමයි.

**සමථකරණ දාතම**

මුදලට සිදුකෙරෙන සැබෑ සුරැකුම් හුවමාරුවක් මගින්, සුරැකුම් ගනුදෙනුවක් සම්පූර්ණ කරනු ලැබීමේ දිනය මෙයින් හැඳින්වේ.

**ඌන ප්‍රවණතාව**

වත්කම් (සහ/හෝ ඉදිරි මිලට ගැනුම් ගිවිසුම්) වලට වඩා වගකීම් (සහ/හෝ ඉදිරි විකිණුම් ගිවිසුම්) වල අතිරික්තයයි. ශුද්ධ මිලදී ගැනුම් හා විකිණුම්වලින්, ශුද්ධ විකුණන ලද හා වැඩිපුර විකුණන ලද ප්‍රවණතාවක් ඉතිරි වනවිට වෙළෙන්දෙකුගේ තත්ත්වය මෙයින් අනාවරණය වෙයි.

**පරිපාලිත සමාගම්**

(මව් සමාගම ලෙස හැඳින්වෙන) එක් ව්‍යවසායක් විසින් පාලනය කරනු ලබන තවත් ව්‍යවසායක් ආධාරක සමාගම ලෙස හැඳින්වේ.

**අවිනිශ්චිත ගිණුම**

පැහැදිලි කිරීමක් පොරොත්තුවෙන් හා නිසි ගිණුමට යොමු කරනතුරු අයිතමයන් තාවකාලිකව රඳවා තබාගන්නා ගිණුමයි.

**හවුල්පාදක ණය**

බැංකු කිහිපයක් විසින් එකලාව ණයක් සැපයීමට කැමති නොවන හෝ හැකි නොවන කල්හි, එම බැංකු ඒකාබද්ධව, බද්ධ කාර්යයක් වශයෙන් කටයුතු කිරීමට යොදාගන්නා ණය වැඩ පිළිවෙළයි. හවුල්පාදක ණය ක්‍රමය ක්‍රියාත්මක කෙරෙනුයේ, තනි බැංකුවක් විසින් පමණක් ණය නිකුත් කිරීමේදී, ස්වකීය ණය සමුච්චයට හානි සිදු නොවනු පිණිස හා මහා පරිමාණයේ ණය ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතා ඉටුකරනු පිණිසය.

**කාලීන තැන්පතු**

නිශ්චිත කාලපරාසයකට පසුව ආපසු ලබාගතහැකි, පොළියක් ගෙවනු ලබන තැන්පතු ගිණුමකි.

**සමස්ත ප්‍රාග්ධනය**

1 වන ස්ථරයේ (කේන්ද්‍රිය) ප්‍රාග්ධනයේ හා 2 වන ස්ථරයේ (අතිරේක) ප්‍රාග්ධනයේ එකතුවයි.

**වෙළඳ මූල්‍ය වත්කම් හා බැරකම්**

(අ) ප්‍රධාන වශයෙන්ම නුදුරු කාලසීමාවකදී විකිණීම හෝ ප්‍රතිමිලදී ගැනීම සඳහා අත් කරගනු ලැබූවක් හෝ සිදු කරනු ලැබූවක්:

(ආ) එක්ව කළමනාකරණය කෙරෙන හා කෙටිකාලීන ලාභ ඉපැයීමේ තථ්‍ය රටාවක් මෑතකාලීනව පැවතීම සම්බන්ධ සාක්ෂි සහිත හඳුනාගත් මූල්‍ය උපකරණ කළඹක කොටසක්

(ඇ) ව්‍යුත්පන්නයක් (නිශ්චය කරන ලද හා ඵලදායක මිල අවදානම් සුරක්ෂිත උපකරණයක ව්‍යුත්පන්නයන් හැරුණු කොට) මත මූල්‍ය වත්කමක් හෝ බැරකමක් වෙළඳාම සඳහා දරනු ලැබෙන ලෙස කාණ්ඩගත කෙරේ.

**ගනුදෙනු පිරිවැය**

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය බැරකමක් අත් කරගැනීම, නිකුත් කිරීම හෝ බැහැර කිරීම කෙරෙහි සෘජුවම පැවරිය හැකි වෘද්ධියමය පිරිවැය

**මහාභාණ්ඩාගාර බැඳුම්කර**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන, දිගු දාතමක් සහිත සුරැකුමකි. එයට ලැබෙනුයේ කූපන පොළී අනුපාතයකි.

**එකතුකළ අගය**

බැංකු සේවාවන් සැපයීමේ පිරිවැය, එසේ බැංකු සේවාවන් සැපයීමෙන් ලැබූ සම්පූර්ණ ආදායමින් අඩුකළ පසු ඉතිරිවන ශේෂය, එකතුකළ අගය ලෙස ගැනේ. එම එකතුකළ අගය, සේවා නියුක්තිකයින්ට ද, බදු වශයෙන් රජයට ප්‍රාග්ධනය සැපයූවන්ට ද වෙන් කෙරෙන අතර, ව්‍යාප්තිය හා වර්ධනය පිණිස රඳවාගනු ලැබේ.

**අවදානම් පාදක අගය**

නිශ්චිත කාල වකවානුවක් තුළ, වෙළෙඳපොළ පොළියේ හෝ විනිමය අනුපාතිකයේ හෝ අහිතකර සංචලනයන් නිසා සිදුවිය හැකි පාඩුව ඇස්තමේන්තු කළහැකි, අවදානම් කළමනාකරණ ක්‍රමවේදයකි.

**'වොස්ට්‍රෝ' ගිණුම** (Vostro)

එක් බැංකුවක් වෙනත් බැංකුවක් සමග පවත්වාගන්නා, දේශීය ව්‍යවහාර මුදල් ජංගම ගිණුමකි. (නොස්ට්‍රෝ ගිණුම සමග සංසන්දනය කරන්න.)

**ඵලදා චක්‍රය**

පරිණතවීමේ කාර්යයක් ලෙස වෙළෙඳපොළ පොළී අනුපාතිකය විදහා දක්වන ප්‍රස්තාරයකි. සාමාන්‍යයෙන්, ඵලදා චක්‍රය ඉහළට ඇලව තිබෙන්නකි: උපකරණයේ නියමයන් අනුව පොළී අනුපාතිකය ඉහළ යයි.

# ආයතනික තොරතුරු

## බැංකුවේ නම
මහජන බැංකුව

## නීතිමය තත්ත්වය
1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් සංස්ථාගත කරන ලද 1988 අංක 30 දරන බැංකුකරණ පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවකි

## ප්‍රධාන කාර්යාලය (ලියාපදිංචි කාර්යාලය)
නො. 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 2, ශ්‍රී ලංකාව
කේබල් JANABANK
දුරකථන: +94 112327841 (රැහැන් 6),
+94 112446316 (රැහැන් 15), +94 112481481
විද්‍යුත් තැපෑල : info@peoplesbank.lk
වෙබ් www.peoplesbank.lk
VAT ලියාපදිංචි අංකය: 409000037-7000

## විගණක
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව

KPMG,
(වරලත් ගණකාධිකාරින්)
32A, ශ්‍රීමත් මොහොමඩ් මාකන් මාර්කාර් මාවත,
තැ. පෙ. 186,
කොළඹ 0300,
ශ්‍රී ලංකාව

## ලේකම්
රොහාන් පතිරගේ මහතා, LLB,
බැංකුකරණය පිළිබඳ MMgt.
නීතිඥ

## ආයතනික බැංකු අංශය
තැ. පෙ. 437,
ANCL : (ලේක් හවුස් ගොඩනැගිල්ල)
අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන: +94 112320651-6, +94 112437239-41,
+94 112392101-3
විද්‍යුත් තැපැල් : inter@peoplesbank.lk
SWIFT PSBKLKLX

## අක්වෙරළ බැංකුකරණ ඒකකය
මහජන බැකුව, පළමු මහල
මූලස්ථාන ගොඩනැගිල්ල, අංක 75,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02, ශ්‍රී ලංකාව
දුරකථන : +94 112206703, +94 112206704
ෆැක්ස්: +94 112458752/2458821
ටෙලෙක්ස්: 21500 (PBSWTCE)
විද්‍යුත් තැපැල්: fcbu@peoplesbank.lk
SWIFT PSBKLKLX

## එතෙර ගනුදෙනු සේවාව
අංක 59, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන: +94 112332746, +94 112334278,
+94 112446409
ටෙලෙක්ස්: 21486 PBKFMS CE
විද්‍යුත් තැපැල්: fastcash@peoplesbank.lk
nrfc@peoplesbank.lk,
teletran@peoplesbank.lk
SWIFT PSBKLKLX

## මහජන බැංකුවේ පරිපාලිත සමාගම්
සී/ස පීපල්ස් ට්‍රැවල්ස්
නො. 59, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන: +94 112470190, +94 112478385,
+94 112396296
ෆැක්ස්: 2434530
විද්‍යුත් තැපැල්: ptravel@peoplesbank.lk
Web: www.peoplestravels.com

## පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගම
1161, මරදාන පාර, බොරැල්ල,
කොළඹ 08
දුරකථන +94 112631631
ෆැක්ස් : +94 112631000

## මහජන බැංකුවේ උප පරිපාලිත සමාගම්
(පීපල්ස් ලීසිං සහ ෆයිනෑන්ස් පොදු සමාගමේ පරිපාලිත සමාගම්)
පීපල්ස් ෆයිනෑන්ස් පොදු සමාගම
අංක 385, ගාලු පාර, කොළඹ 03.
දුරකථන : +94 112376476
ෆැක්ස්: +94 112376477
සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස්
අංක 53, ධර්මපාල මාවත, කොළඹ 03
දුරකථන +94 112206406
ෆැක්ස්: +94 112206399

සී/ස පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම
1161, මරදාන පාර, බොරැල්ල, කොළඹ 08.
දුරකථන : +94 112631631
ෆැක්ස්: +94 112631000

සී/ස පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම
1161, මරදාන පාර, බොරැල්ල, කොළඹ 08.
දුරකථන: +94 112631631
ෆැක්ස්: +94 112631000

සී/ස පීපල්ස් මයික්‍රොෆයිනෑන්ස් සමාගම
1161, මරදාන පාර, බොරැල්ල, කොළඹ 08.
දුරකථන: +94 112631631
ෆැක්ස් +94 112631000

සී/ස පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම
1161, මරදනා පාර, බොරැල්ල, කොළඹ 08
දුරකථන: +94 112631631
ෆැක්ස් +94 112631000

## මහජන බැංකුවේ ආශ්‍රිත සමාගම්
පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පොදු සමාගම
නො. 21, නවම් මාවත, කොළඹ 02.
ශ්‍රී ලංකාව
දුරකථන: +94 112300191-4
ෆැක්ස් : +94 112300190

Produced by **Smart Media** The Annual Report Company © Copyright Reserved

මහජන බැංකුව

අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02, ශ්‍රී ලංකාව
දුරකථනය: 2327841 (මාර්ග 6),
2446316 (මාර්ග 15), 2481481
විද්‍යුත් තැපෑල: info@peoplesbank.lk
වෙබ්: www.peoplesbank.lk

★

මෙම වාර්ෂික වාර්තාව
කාබන් නිෂ්ක්‍රිය වාර්තාවකි

සහතික ලත් කාබන් නිෂ්ක්‍රිය සංවිධානයක් වන ස්මාර්ට් මීඩියා වාර්ෂික වාර්තා සමාගම විසින් මෙම මහජන බැංකු වාර්ෂික වාර්තාව නිමවා ඇත. තවද, මෙම වාර්ෂික වාර්තාව නිමැවීමේදී කඩදාසි භාවිතය හා මුද්‍රණය ඇතුළුව ස්මාට් මීඩියා විසින් බාහිර සේවා සපයන්නන්ගෙන් ඉටු කරගන්නා ලද ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස මුදාහැරෙන හරිතාගාර වායු විමෝචනය, ස්ථිර කරන ලද මූලාශ්‍ර මගින් හිලවු කරනු ලැබේ.

SMART MEDIA
The ANNUAL REPORT Company

www.smart.lk

PARTNER Carbonfree Carbonfund.org

www.carbonfund.org